ප්‍රෙතවස්තු වණ්ණනාව

Non-commercial distribution

පටුන

ප්‍රාරම්භය 01

ක්ෂත්‍රොපම ප්‍රෙතවස්තු වණ්ණනාව 20

සූකරමුඛ ප්‍රෙතවස්තු වණ්ණනාව 28

පූතිමුඛ ප්‍රෙතවස්තු වණ්ණනාව 31

පිට්ඨධිතලිකා ප්‍රෙතවස්තු වණ්ණනාව 35

තිරොකුඩ්ඩ ප්‍රෙතවස්තු වණ්ණනාව 41

පඤ්චපුත්‍රඛාදක ප්‍රෙතවස්තු වණ්ණනාව 53

සප්තපුත්‍රඛාදක ප්‍රෙතවස්තු වණ්ණනාව 61

ගොන ප්‍රෙතවස්තු වණ්ණනාව 64

මහාපෙසකාර ප්‍රෙතවස්තු වණ්ණනාව 69

බල්ලාටිය ප්‍රෙතවස්තු වණ්ණනාව 73

නාග ප්‍රෙතවස්තු වණ්ණනාව 85

උරගජාතක ප්‍රෙතවස්තු වණ්ණනාව 97

සංසාරමොචක ප්‍රෙතවස්තු වණ්ණනාව 100

ශාරීපුත්‍ර ස්ථවිර මාතෘ ප්‍රෙතවස්තු වණ්ණනාව 115

මත්තා ප්‍රෙතවස්තු වණ්ණනාව 121

නන්ද ප්‍රෙතවස්තු වණ්ණනාව 131

මට්ටකුණ්ඩලී ප්‍රෙතවස්තු වණ්ණනාව 137

කෘෂ්ණ ප්‍රෙතවස්ත වණ්ණනාව 146

ධනපාල ප්‍රෙතවස්තු වණ්ණනාව 156

චුල්ලසෙට්ඨී ප්‍රෙතවස්තු වණ්ණනාව 164

අඩකුර ප්‍රෙතවස්තු වණ්ණනාව 171

උත්තරමාතෘ ප්‍රෙතවස්තුව වණ්ණනාව 205

සූත්ත ප්‍රෙතවස්තු වණ්ණනාව 211

කර්ණමුණ්ඩ ප්‍රෙතවස්තු වණ්ණනාව 217

උබ්බරී ප්‍රෙතවස්තු වණ්ණනාව 229

Non-commercial distribution

අහිජ්ජමාන ප්‍රෙතවස්තු වණ්ණනාව 238
සානුවාසි ප්‍රෙතවස්තු වණ්ණනාව 248
රථකාර ප්‍රෙතවස්තු වණ්ණනාව 259
භූත ප්‍රෙතවස්තු වණ්ණනාව 264
කුමාර ප්‍රෙතවස්තු වණ්ණනාව 268
සෙරීණී ප්‍රෙතවස්තු වණ්ණනාව 275
මිගලුද්දක ප්‍රෙතවස්තු වණ්ණනාව 281
ද්විතිය මිගලූද්දක ප්‍රෙතවස්තු වණ්ණනාව 286
කූටවිනිශ්චයික ප්‍රෙතවස්තු වණ්ණනාව 289
ධාතුවිවර්ණක ප්‍රෙතවස්තු වණ්ණනාව 293
අම්බසක්ඛර ප්‍රෙතවස්තු වණ්ණනාව 298
සෙරිස්සක ප්‍රෙතවස්තු වණ්ණනාව 351
නන්දක ප්‍රෙතවස්තු වණ්ණනාව 361
රෙවතී ප්‍රෙතවස්තු වණ්ණනාව 379
උච්ඡු ප්‍රෙතවස්තු වණ්ණනාව 391
කුමාර ප්‍රෙතවස්තු වණ්ණනාව 397
රාජපුත්‍ර ප්‍රෙතවස්තු වණ්ණනාව 400
ගූථඛාදක ප්‍රෙතවස්තු වණ්ණනාව 405
ගණප්‍රෙත ප්‍රෙතවස්තු වණ්ණනාව 409
පාටලීපුත්‍ර ප්‍රෙතවස්තු වණ්ණනාව 412
ආම්‍රප්‍රෙත ප්‍රෙතවස්තු වණ්ණනාව 415
අක්ඛදයක ප්‍රෙතවස්තු වණ්ණනාව 420
භොගසංහරණ ප්‍රෙතවස්තු වණ්ණනාව 421
සෙට්ඨීපුත්ත ප්‍රෙතවස්තු වණ්ණනාව 423
සට්ඨිකූටසහස්ස ප්‍රෙතවස්තු වණ්ණනාව 426

Non-commercial distribution

ප්‍රෙතවස්තු වණ්ණනාව

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

ශ්‍රී ශ්‍රීසනං ඥනකෘපෙකසින්ධුං
භක්ත්‍යා නමස්කෘත්‍ය සධර්මසංඝම්,
අනූද්‍යතෙ සිංහලභාෂයෙදං
පරෙතවස්තූර්ථකථානුරූපම්.

ප්‍රාරම්භය

මහාකාරුණිකං නාථං – ඤෙය්‍යසාගරපාරගූං,
වන්දෙ නිපුණ ගම්භීර – විචිත්තනයදෙශනං.

ශ්‍රීසද්ධර්මවර චක්‍රවර්ති ස්වාමී වූ ශාක්‍යවංශෙක සිංහයමානවූ ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ කරුණා මෛත්‍රීනිවාස වූ ප්‍රඥා වල්ලභවූ සර්වලොක ශිවඞ්කර ශ්‍රීසන සුගත තථාගත වූ අප භගවත් අර්හත් සම්‍යක් සම්බුධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ විසින් සකල සත්වකරුණාවෙන් දෙශනාකර වදළාවූ ප්‍රෙතවස්තු නම් ලද අනගි ධර්මප්‍රකරණයට පාලාර්ත්ථ කථාව ලියූ ත්‍රිපිටකධාරී ආචාර්‍ය්‍ය ධර්මපාල මහාස්ථවිරයන් වහන්සේ විසින් ඉෂ්ටදෙවතානුස්මරණය සඳහා ග්‍රන්ථාරම්භයෙහි පළමුකොට වදළ ගාථාවෙන් ''සකල ලොකවාසී සත්ව සමූහයා කෙරෙහි පතළ මහා කරුණා ඇති විනෙයජනයා කෙරෙහි කරනලද කරුණා සිතින් දිවාකරාදයමාණ දීපඞ්කර තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ හමුවෙහිදී සිය අතට පත් නිවන් සිරිසැප හැරපියා භව දුඃඛයට වැද සම්ත්‍රිංශත් පාරමීධර්ම පුරා මාර පරාජය කොට බුදුවැ සකලඥෙය සාගරයාගේ පරතෙරට පැමිණියාවූ නානා නයනිපුණ ගම්භීර විචිත්‍රදෙශනා ඇති සර්වලොකෙක ස්වාමිවූ බුදු රජාණන් වහන්සේ මම වඳිමි''යි කියා විශ්වජන හෘදයානන්දකර ත්‍රෛලොක්‍යාචාර්‍ය්‍ය බුදුරජාණන් වහන්සේට නමස්කාර කරනලදි. **එම් ගාථායෙහි ජන්දුලක්ඛණාදි ශාස්ත්‍ර යුක්ති එකසේද යත්:–**

Non-commercial distribution

''ප්‍රස්තාරෝ නෂ්ටමුද්දිෂ්ට මෙකව්‍යාදිලගක්‍රියා,
සඩ්ඛ්‍යානමධිවයොගශ්ච ෂඩෙතෙ ප්‍රත්‍යයාඃ ස්මෘතාඃ.

යනු කී හෙයින් ප්‍රස්තාරය, නෂ්ටය, උද්දිෂ්ටය, එකව්‍යාදි ලගක්‍රියාය, වෘත්තසඩ්ඛ්‍යාය, අධිවයොගය යන ෂට්විධ ප්‍රත්‍යය කින් ව්‍යාප්ත ඡන්දොලක්ෂණය සකල ශාස්ත්‍රයෙහි අන්තර්ගත හෙයින් මෙහිදු විතරින් පසලොස් අඟලක් හා අයමින් පන්සිය එකොලොස් අඟුලක් පමණ භූමිප්‍රදෙශයෙහි ප්‍රස්තාර කටයුතුවූ සර්ගුරුවෘත්ත එකක් හා එකක් ලඝු සතක් ගුරුවෘත්ත අටක්ද දෙකක් ලඝු සයක් ගුරුවෘත්ත විසිඅටක් හා තුනක් ලඝු පසක් ගුරුවෘත්ත පනස් සයක්ද සතරක් ලඝු සතරක් ගුරුවෘත්ත සැත්තෑවක් හා පසක් ලඝු තුනක් ගුරුවෘත්ත පනස් සයක්ද සයක් ලඝු දෙකක් ගුරුවෘත්ත විසිඅටක් හා සතක් ලඝු එකක් ගුරුවෘත්ත අටක්ද ප්‍රස්තාරයාගේ කෙළවර දක්නා සර්ලඝුවෘත්ත එකත් ඇතුළුව දෙසිය පණස් සයක් පමණ වෘත්ත සංඛ්‍යාවක් ඇති ''උක්තාන්‍යුක්තා'' යනාදීන් නිර්දිෂ්ට එකාක්ෂරයෙහි පටන් ෂඩ්විංශතිඅක්ෂරය දක්වා සවිස්සක් පමණ ඡන්දස් අතුරෙන් අනුෂ්ටුප්නම් ඡන්දසෙහි ෂට්විංශතිසථානයෙන් ප්‍රථම විෂමපාදය හා එකානූවන තැනින් ද්විතීය සමපාදයද එක්සිය සත්පනස් වන තැනින් තෘතීය විෂමපාදය හා සිව් අනූවන තැනින් සතරවන සමපාදයද මෙසේ සිවිතැනකින් පාදවතුෂ්කය සමුද්ධරණය කොටගෙන ''යුජොජේන සරිද්භර්තුඃ පථ්‍යා වක්ත්‍රං ප්‍රකීර්ත්ති-තම්''යි කීහෙයින් සමපාද යුග්මයෙහි සතර අකුරකින් ජගණය කරණකොටගෙන පථ්‍යාවක්ත්‍රනම්වූ විෂම වෘත්තයට නගා යගණ සගණවය ගුරුවයකින් පළමුවන පාදය හා ආද්‍යන්ත ගුරු දෙකක් හා ජගණවයකින් දෙවන පාදයද තගණ සගණවය ගුරුලඝුවයකින් තුන්වන පාදය හා ආද්‍යන්ත ලඝුගුරුවය හා භගණ ජගණවයකින් සතරවන පාදයද පාදවතුෂ්කය සම්පත්තිවූ ගණ අටකින් හා අකුරු දෙතිසකින්ද මාත්‍රා අටසාලිසකින් හා ගුරුසොළොසකින්ද ලඝුසොළොසකින් හා විශ්‍රාම සතරකින්ද වර්ණාක්ෂර එක් විස්සකින් හා අවර්ණාක්ෂර එකොළොසකින්ද අසොෂාක්ෂර නවයකින් හා සොෂාක්ෂර තෙවිස්සකින්ද කණ්ඨ්‍යාක්ෂර සයකින් හා තාලව්‍යාක්ෂර සතරකින්ද මූර්ධන්‍යාක්ෂර සයකින් හා දන්ත්‍යාක්ෂර දශයකින්ද ඔෂ්ඨ්‍යාක්ෂර සතරකින් හා දන්ත්‍යෞෂ්ඨ්‍යාක්ෂර දෙකකින්දැයි මෙසේ වර්ණ විශෙෂයෙන්

Non-commercial distribution

සම්මිශ්‍රවූ විෂම මාත්‍රා විෂම වෘත්ත විෂමගුරු විෂමලඝු විෂමපාද චතුෂ්කයක් අඩුවැඩි නැතුව ලැබෙන්නාහ. මෙසේ රචිත මේ ගාථාවෙන් ත්‍රිලොකෙක ප්‍රදීපායමාන සර්ඥයන් වහන්සේට නමස්කාරය දක්වා තුණුරුවන් සමවාය රත්න බැවින් මෙයින්ම ඉතර රත්නවයත් ගැණෙන නමුදු වෙන්වෙන් වශයෙන් ඒ රත්න දෙකටද නමස්කාර කරන්නාවූ ආචාර්‍ය්‍ය පාදයෝ–

''විජ්ජාචරණ සම්පන්නෝ-යෙන නීයන්ති ලොකතෝ,
වන්දෙ තමුත්තමං ධම්මං–සම්මා සම්බුධ පූජිතං.
සීලාදිගුණ සම්පන්නෝ-යීතෝ මග්ගඵලෙසු යෝ,
වන්දෙ අරියසඞ්ඝං තං–පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං''යි කීහ.

යම්බඳු ධර්ම මාර්ගයක් විසින් ලෞකික ලොකයා කෙරෙන් පහකොට අෂ්ටවිද්‍ය පසළොස්වරණ ධර්මයන්ගෙන් යුක්තවූ ආර්‍ය්‍ය පුද්ගලයෝ නිවන්පුර පමුණුවනු ලැබෙද්ද, සම්මා සම්බුදුන් විසිනුත් පුදන ලද්දවූ ඒ උතුම් නවලොකොත්තර ශ්‍රී සඞ්ඝරත්නය මම වඳිමි.

ශීල සමාධි ප්‍රඥාදි නිර්මලගුණයෙන් යුක්තවූ යම් සංඝරත්නයක් සතරමග සතරඵලයෙහි පිහිටියේ වේද ලොකත්‍රයවාසීන්ට උතුම් පුණ්‍යක්ෂෙත්‍රවූ ඒ ආර්‍ය්‍ය සඞ්ඝයා වහන්සේ නමස්කාර කරමි යනු මේ ගාථාවයා ගේ භාවයයි.

මෙසේ ග්‍රන්ථාරම්භයෙහි පිළිවෙළින් ත්‍රිවිධරත්නයට නමස්කාරකොට තදනන්තරව එහි ප්‍රයොජනාදිය දැක්වීම් වශයෙන් ''වන්දනා ජනිතං පුඤ්ඤං,' යනාදිය කීහු. මෙසේ තුන් ලෝවාසීන්ට අසහාය පුණ්‍යක්ෂෙත්‍රවූ ශ්‍රී රත්නත්‍රය විෂයේහි ශ්‍රද්ධා භක්ති භාරාවනත චිත්තයෙන් කරනලද වන්දනාවෙන් ජනිත යම් පුණ්‍යඵලයක් වේද, ඒ හේතුවෙන් හා රත්නත්‍රායානුභාවයෙනුත් සියලුතන්හි නසන ලද සර්‍වාන්තරායොපද්‍රව ඇතිව–ප්‍රේතයන් විසින් පෙරජාතිවලදී ප්‍රේත භාවයට පමුණුවන්නාවූ යම් යම් අකුශල කර්ම කරන ලද ද, ඒ ඒ අකුශල කර්ම හා විපාක විශෙෂයන් ප්‍රකාශ කරන්නාවූ සංවේග උපදවන්නාවූ කර්මඵලය ප්‍රත්‍යක්ෂ කරන්නාවූ විශෙෂ වශයෙන් බුදුවරයන්ගේ යම් ධර්ම දේශනාවක් පැවැත්තේද, එය ප්‍රේතවස්තු යන නමින් ප්‍රකටවූ වස්තු වෙයි. එය සර්ඥයන් වහන්සේ අනුපධිශෙෂ නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ වදළාට පසු ධර්මසංගායනා කළ මහා

Non-commercial distribution

කාශ්‍යපාදි මහොත්තමයෝ සූත්‍රපිටකයෙහි කුදුගොත්සඟියට ඇතුළත්කොට සංගායනා කළාහුය. ඒ ප්‍රෙතවස්තු දෙශනාව සම්බන්ධ පෞරාණික අර්ත්ථකථාක්‍රමයෙහි මනාව එල්බගෙන විශෙෂ වශයෙන් ගම්භීර ගාථාපදර්ත්ථයන්ගේ විනිශ්චය විස්තර කරමින් මහාවිහාර වාසීන් ගේ සුවිසුඩ අසම්මිශ්‍රසමය නොනසා යහපත්කොට ශක්ති පමණින් පරමාර්ත්ථදීපනී නම්වූ අර්ත්ථ වණ්ණනාව කරන්නෙමි. එසේ කියන්නා වූ මාගේ ඒ ධම්‍ම විස්තරය සත්පුරුෂයෙනි සකස්ව අසව්. මෙතෙකින් ප්‍රාරම්භ ගාථාවන්ගේ සංක්ෂේප අදහස දතයුතුයි.

• මෙසේ ආචාය්‍ය ධම්පාල මහාස්ථවිරයන් වහන්සේ සව්ජඟ දනඳුකර හද්‍රසටායමාන වූ තුනුරුවන්ට පළමුකොට ගෞරවාදර නමස්කාර පවත්වා ප්‍රෙතවස්තු දෙශනාවට මහාශ්‍රාවකයන්ගේ අර්ත්ථකථානුසාරයෙන් සකලද්වීප වාසීන්ට වැඩපිණිස ඒ ඒ වස්තූන්ගේ නිදානාදිය විස්තර කිරීම් වශයෙන් පාලිභාෂාමය අර්ත්ථ වණ්ණනාව කළසේක. ඒ මේ ධම්ප්‍රකරණය සිංහලභාෂාවට පරිවර්තනය කොට ලිවීම පාලිභාෂාව නොදත් සිංහල බෞද්ධ ජනතාවගේ හිත වැඩ පිණිස වන්නේයයි සැලකූ අප විසිනුදු මෙහි මූලස්ථානයෙහි යොදනලද සංස්කෘත ශ්ලොකයෙන් ත්‍රිවිධ රත්නයට ප්‍රණාමකොට මේ සිංහල වණ්ණනාව කරනු ලැබේ.

මේ ප්‍රෙතවස්තු දෙශනා ව වනාහි මහාසාගරයේ ගම්භීර දෙශනාක්‍රම ඇත්තේය. හේ කෙසේද යත්:- යම් සේ ගඞ්ගා යමුනා ආදි නානා ගඞ්ගා ජලප්‍රවාහය අනුක්‍රමයෙන් ගැඹුරුව ගැඹුරුව ගොස් මහාසමුද්‍රයට පැමිණ අතිගම්භීරත්වයෙන් කිසි වෙකුහටත් අවිෂයව සිටීද, එසේම මේ ධම්දෙශනාවද නාරද සථවිරාදි ශ්‍රාවක භාෂිත හා එක්ව ගම්භීරත්වයට පැමිණ ලොකත්‍රයවාසි කිසිකෙනෙකුන්හටත් අවිෂයවූ අතිගම්භීරවූ සව්ඥ භාෂිතයට පැමිණ ඉතා ගැඹුරු දෙශනාර්ත්ථ ඇත්තේය. එබඳු දෙශනාවක් අප වැන්නන් විස්තර කොට ලියමැයි සිතීම පවා මදුරු දළින් මෙර විදිනට තැත්කිරීමක් වැනි වෙයි. එතකුදු වුවත් මහත් රත්නාකරයකින් එකරුවනක්වත් උකාගැනීමද හිතවැඩ පිණිස පවත්නේය. එමෙන් මේ ධම්දෙශනාව විස්තර වශයෙන් ප්‍රකාශකොට ලියනොහැකි නමුදු එක ගාථාපදයකින් වත් ධම් දෙශනාකිරීම හෝ බණ ඇසීම නිවන් සම්පත් අවසන් කොට ඓහලෞකික පාරලෞකිකාර්ත්ථසිද්ධියට අසහාය කාරණ

Non-commercial distribution

වන්නේය. එසේ හෙයින් අපගේ භවනිස්සරණය පිණිසත් සිංහල භාෂාවදත් ශ්‍රද්ධාවත් සත්පුරුෂයන්හට වැඩ පිණිසත් **ප්‍රෙතවස්තුව** අර්ත්ථකථානුරූපව සිංහල භාෂාවට නගා **සංක්ෂෙපයෙන් මේ** වණ්නාව කරනු ලැබේ. හේ ලසුකොට නොයිතා තුනුරුවන් කෙරෙහි මහත් ගෞරවාදර භක්තිය උපද වාගෙන වික්ෂිප්ත නොව එකඟසිතින් අසා බලා ස්වර්ගමොක්ෂ සම්පත් ප්‍රතිලාභයට නිතර උත්සාහවත් විය යුතු.

තවද අප තිලෝගුරු භගවත් අර්හත් සම්‍යක් සම්බුඩ සර්ව්ඥ රාජොත්තමයාණන් වහන්සේ ශ්‍රී සඩම්මෘත දනයෙන් සත්‍වයන් නිවන්පුර පැමිණවීම සඳහා කෙතෙක්කල් පාරමීධර්ම රැස්කළා හුද යනු **සංක්ෂෙපයෙන්** මෙහිදී දක්වනු ලැබේ. හේ කෙසේද යත්:-

ත්‍රිභුවනෛකතිලක සකලඥෙය සාගර පාරගතාශෙෂ ගුණ රත්න රත්නාකරායමාණවූ අප ගෞතම බුදුරජාණන් වහන්සේ මේ මහාභද්‍රකල්පයට විසිඅසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් යට පළමු වන නන්දනම් අසඞ්ඛ්‍යයෙහි ලෝ පහළවූ බ්‍රහ්ම දෙවනම් බුදුන් දවස කාරකණ්ටක නම් නුවර අතිදෙවනම් රජව රජසිරිසැප වළඳන කල්හි බුදුන්දුටු කෙණෙහි හටගත් ප්‍රීතියෙන් මත්ව මතු මහල් තලයෙන් බිමට බැස පෙති දහසකින්යුත් රථ චක්‍රයක් සමාන පියුමක් පැනනැගී පාපියුම් පිළිගත්කළ සුවසේ බුදුන් වෙත එළඹ විසිතුරු මහපියුම් තුනක් හා සමග නොයෙක් රුව නින් පූජා සත්කාර කොට පසඟ පිහිටුවා වැඳ ලොවුතුරා බුදු වෙම්වයි සිතින් පතා එතැන් පටන් මනොපණිධිය පිරීමෙන් සප්තා සඞ්ඛ්‍යය ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂ පස්විසිදහසක් බුදුවරයන් දැක මනොපණිධානය මස්තක ප්‍රාප්ත කළසේක.

එයින් කීහ:-

> ''නෙසු සත්තඅසඞ්ඛෙසු-ජාතා ලොකෙක නායකා,
> පඤ්චවීසසහස්සා ච-ලක්ඛමෙකං භවෙකතො.
> එත්තකානං මහෙසීනං-මනසා පත්ථිතො තදා,
> දනෙන මේ සමෝ නත්ථි-එසා මේ දනපාරමී''ති.

මීට අනතුරුව මේ කල්පයට තෙළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට පළමුවන සර්වභද්‍රනම් අසඞ්ඛ්‍යකල්පයෙහි ධඤ්ඤවතී නම් නුවර සාගරන නම් සක්විති රජා රක්සඳුන් හරින් ප්‍රාසාද

Non-commercial distribution

ලක්ෂයක් කරවා පුරාණ ගෞතම නම් බුදුන්ට පිළිගන්වා ස්වාමිනි නුඹ වහන්සේ මෙන් මමත් ශාක්‍ය රාජවංශයෙහි ඉපිද ගෞතම නම් බුදුව සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් භවබන්ධන යෙන් මුදවන්නෙමැයි වචනයෙන් කියා ප්‍රාර්ත්ථනාකොට එතැන්පටන් නවාංසංඛ්‍යය ඇතුළත ලොවැ පහළවූ තුන්ලක්ෂ සත්අසූදහසක් බුදුවරයන් දැක මහදන් පවත්වා වාක්ප්‍රභෙද ප්‍රාර්ත්ථනාව මුදුන්පත් කළ සේක. වදළේමැනෝ:-

''තෙසු නවඅසඞ්ඛ්‍යෙසු-ජාතා ලොකෙකනායකා,
තීණි සතසහස්සානි--සත්තාසීති සහස්සව.
එත්තකානං මහෙසීනං-වචසා පත්ථිතෝ තද,
දනෙන මෙ සමෝ නත්ථි-එසා මෙ දනපාරමී''ති.

මෙසේ මනොවාක් ප්‍රණිධීන් පිරිමෙන් සොළසාසඞ්ඛ්‍යය ඇතුළත පහළවූ පස්ලක්ෂ දෙළොස් දහසක් බුදුවරයන්ට මහ දන් පවත්වා පූරිත මනොවාක් පාරමී ඇති මහබෝසතාණෝ මේ කල්පයට සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයකින් යට සාරමණ්ඩනම් කප දෙවියන් ගේ අමරවතී නම් රාජධානියසේ සකල සම්පත්ති යෙන් හා නගරාඞ්ගශ්‍රීයෙන් සමෘද්ධව බබළන්නාවූ අමරවතී නුවර සත් කුල පරම්පරාව දක්වාම කිසිවෙකු විසිනුදු ජාතිසටා බිණීමෙන් නොදූමිය හැකිවූ උභයකුල පරිශුද්ධවූ නොයෙක් කෙළගණන් මුක්තාමාණික්‍යාදි අනල්ප ධන ධාන්‍යයෙන් ආඪ්‍යවූ අසූකෙළක් නිධන්ගත වස්තුවෙන් හා කර්ෂාපණ දස මුණක් දවසකට වියදම් වන්නාවූ බමුණු මහසල්කුලයෙක්හි ඉපිද ස්ථිරවජ්‍රායුධයසේ තීක්ෂණප්‍රඥ ඇතිහෙයින් සුමෙධ යන අන්වර්තථනාමයෙන් යුක්තව වෙදත්‍රයෙහි හා සකල ශාස්ත්‍ර සාගරයෙහි පාරප්‍රාප්තව දිසාපාමොක් ආචාර්‍යවැ විසූසේක. සුමෙධ පණ්ඩිතයන් වහන්සේ ගේ මව්පියන් පරලොව ගිය කල්හි රාසිවඩ්ඪක නම් ඇමතියා අවුත් ස්වාමිනි ඔබ මව්පියන්-ගේ උභයකුල පරම්පරාවෙන් පැවත ආ ධනරාශිය බලා වදළ මැනවැයි නොයෙක් රත්නයෙන් පිරුණු දහස්ගණන් ගබඩාවල දොරවල් හැර පෙන්වූකල මාගේ මව්පියාදීහු ධනරැස් කොට ගියාහු මෙයින් කිසිවක් නොගෙනම ගියාහුය, මාවිසින් මේ ධනසම්පත් දන්දීම් වශයෙන් කැටුව ගෙනයන්ට වටනේයයි සිතා ධනයෙන් ප්‍රයෝජනවත් අය සුමෙධ පණ්ඩිතයන් ගේ ගෙදරට එත්වයි සියලු නුවර බෙර හසුරුවා හෙරිනාද නමැති

Non-commercial distribution

සුගන්ධාස්‍රාණයෙන් යාචක නමැති භෘඩගසමූහයා අවුත් රැස්වූ විට රුවන් නමැති මුවරදයෙන් යාචකයන් ගේ සිත්ලෙසම සන්තර්පණය කරමින් සත්දවසක් රුවන්පිරූ ගබඩාවල හරින ලද දෙරවල් නොවසාම දන්දුන්සේක. මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත භොගසම්පත් දුගීමගී යාචකාදීන්ට දන්දී වස්තුකාම ක්ලෙශ කාමය හැරපියා අමරවතී නුවරින් නික්ම හුදකළාවම හිමවත ධම්මික නම් පර්‍වතය නිසා සක්දෙව් රජ විසින් නිර්මිමිත කරවන ලද පන්සලට පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව—

''ඉද්ධි පරචිත්තඤ්ඤණං ච-පුරිමං ජාතිඅනුස්සති,
දිබ්බඤ්ච චක්ඛුසොතඤ්ච-පඤ්චාභිඤ්ඤා ඉමා මතා''යි.

දක්වනලද සෘද්ධිය, පරසිත් දන්නා නුවණ, පෙරළුපන් කඳපිළි වෙළ දන්නා පූර්වෙනිවෙස්සානුමෘතිය, දිවඇස, දිවකන යන ෂඤ්චාභිඥා හා රූපාදි අෂ්ට සමාපත්ද සත්දිනක් තුළදීම උපදවා ගන ධ්‍යාන සුවයෙන් හිමාලයෙහි වාසය කරනසේක. ඒකල්හි දීපඞ්කර බුදුරජාණන් වහන්සේ ලොව පහළවී කෙලෙස් ගින් නෙන් තැවුණු සත්ව සමූහයා ගේ සිත් ධර්‍මකථා නමැති අමෘත ජලධාරාවෙන් සිහිල්බවට පමුණුවමින් සුදර්ශන මහාවිහාරයෙහි වැඩවාසයකර වදරන බව ඇසූ රඹගම් නුවරවාසි මහාජනයා බුදුන්වෙත පැමිණ සෙටදවසට දන් ඉවසා වදරන සේක්වයි ආරාධනා කොට පසුදින මහදන් සරසා නුවර අලඞ්කෘත කොට නැවත බුදුන් වඩනා මාර්ගය සරසමින් සිටිකල යටකී සුමෙධ තාපසයෝ තමන්ගේ ආශ්‍රම පදයෙන් අහසට නැගී මාර්ගය සරසමින් සිටි මනුෂ්‍යයන්ගේ මතුභාගයෙන් වඩනාසේක් ''බුදුන්ගේ වැඩමවීම සඳහා මාර්ගය සරසම්හ''යි යනු ඔවුන් ගෙන් අසා සිතන්නාහු කල්පශතසහස්‍රයකිනුත් බුද්ධ යන ශබ්ද මාත්‍රය පවා ඇසීම ඉතා දුර්ලභය ඒ උතුමන් වහන්සේ නොබෝ වෙලාවකින් දක්නට ලැබෙයි ප්‍රීතියෙන් පිනාගිය සිත් ඇතිව මේ මාර්ගයෙන් එක්ප්‍රදෙශයක් මාවිසිනුත් සැරසිය යුතුයයි සිතා මටත් මෙයින් එක්ප්‍රදෙශයක් දෙවයි ඉල්වූසේක. ඔහුද සුමෙධ තාපසයන් මහත් සෘද්ධිමත් බැව් දැන තමන් විසින් වහා සරසා ගත නොහැකිවූ සිහිල් දියෙන් පිරුණු ගැඹුරු කඳුරැලියක් දුන්නා හුය. එකල තාපසයෝද බුද්ධාරම්බණ ප්‍රීති උපදවා සිතනසේක් මම මේ ස්ථානය සෘද්ධියෙන් සරසන්ට සමර්ත්ථවෙමි, එසේ සැරසීම වනාහි මාගේ සිත සතුටු කරන්නේ නොවෙයි, අද මා

Non-commercial distribution

විසින් ඒ සර්වඥයන් වහන්සේ උදෙසා කය වෙහෙසවා වත් කටයුතුයයි සිතා උන්වහන්සේ කෙරෙහි මහත් ගෞරවය උපදවා මෘදු කොමල හස්තයෙන් පස්ගෙනවුත් එ කඳුරැලිය පුරවන්ට පටන් ගත්තෝය. එය නොනිමිකල්හිම දීපඞ්කර සර්වඥයන්වහන්සේ මහානුභාව සම්පන්න ෂඩභිඥලාභි සාර ලක්ෂයක් පමණ මහරහත් භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලදුව අසදෘශ බුද්ධලීලාවෙන් වැඩිසේක. එකල සුමේධ තාපසයෝ ඇස් ඇර බලා අලඞ්කෘත මාර්ගයෙන් වඩනාවූ දශබලධාරී සර්වඥයන් වහන්සේ ගේ සුප්‍රතිෂ්ඨිත පාදදි දෙසිස් මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් සැදුම්ලත් අශීති අනුබ්‍යඤ්ජනයෙන් රඤ්ජිතවූ බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සම්පූර්ණවූ අහස්තලෙහි දසදික් දිවන නොයෙක් දහස්ගණන් විදුලිය සෙයින් යුගල යුගලවූ නීල පීත ලොහිතාවදත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර යන ෂඩ්වර්ණයන බුද්ධරශ්මී මාලාවන් විහිදුවමින් කණමැදිරියන් නිෂ්ප්‍රභකොට දිලිසෙන ලාභිරුමඩල සේ දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ ශරීරප්‍රභා නිෂ්ප්‍රභාකොට දිලිසෙන රූපයෙන් අගතැන්පත් ආත්මභාවය දැක අද මා විසින් මේ උතුමන් වහන්සේට දිවි පුදන්ට වටනේයයි සිතා උන්වහන්සේ ගේ දෙසිය සොළසක් මඞ්ගල ලක්ෂණයෙන් පවිත්‍රවූ ශ්‍රීපාදයුග්මය කලල් මතුයෙහි නොතබා මිණිපෝරුවෙන් කළ හෙයක් මැඩ වඩනා කලක් මෙන් සාරලක්ෂයක් රහතන් වහන්සේලා සමග මාගේ පිට මැඩගෙන වඩනා සේක්වායි එසේ වැඩමවීම මට බොහෝ කාලයකට හිත සැප පිණිස වන්නේයයි මණිඵලක හෙයක් මෙන් වී මඩමතුයෙහි වැදහොත් සේක. මෙසේ කලල් මතුයෙහි වැදහොත් ඒ සුමේධ තාපසයෝ නිලුපුල්පෙතිවැනි නෙත්‍ර-යුග්මය දල්වා අප්‍රමාණ බුද්ධශ්‍රී බලන සේක් සතුටුව මෙසේ සිතූහ. කෙසේදයත්:- ''ඉදින් මට අභිප්‍රායචීනම් මුන්වහන්සේ කෙරෙහි ලොභාදි සකලක්ලෙශයන් නසා අග්‍රදක්ෂිණාර්හ බවට පැමිණ සාරලක්ෂයක් මහරහතන් වහන්සේලාට සංඝනවකව මුන් වහන්සේ පිරිවරා රඹගම් නුවරට යාමට පොහොසත්වෙමි, එසේ කිරීම අපවැනි වීර්‍යාධික පුරුෂයන්ට ප්‍රයෝජන නැත, දීපඞ්කර සර්වඥයන් වහන්සේ මෙන් සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණ ලොකවාසීන් සද්ධර්ම නමැති නැවට නංවා සංසාර නමැති සාගරයෙන් එතරකොට නිවන් නමැති අමාරසයෙන් සන්තර්ප-ණය කොට නැවත පිරිනිවන් පෑම ම සුදුසුය'' යි මෙසේ සිතා අෂ්ටධර්මසමොධානයෙන් යෙදී බුද්ධත්වය ප්‍රාර්ත්ථනාකොට වැදහොත් සේක.

Non-commercial distribution

එකල්හි දීපඞ්කර සම්බුදුරජාණන් වහන්සේද සුමේධ තාපසයාණන්ගේ සිරොභාගයෙහි ස්වර්ණමෙරු රාජයා සේ දිලිහී දිලිහී වැඩසිට තමන් නෙත් සහල දල්වා කලල්පිට වැදහොත් තාපසයාණන් බලාවදරා මේ උග්‍රතාපසයා බුද්ධත්වය කැමතිව වැද හොත්තේය. මොහුගේ ප්‍රාර්ත්ථනාව සිදුවේදෝ නොවේදෝ–හෝයි අනාගතඥානයෙන් බලනසේක් මෙයින් කල්පලක්ෂයක් අධික කොට ඇති කල්ප අසඞ්ඛ්‍යතරක් ඉකුත්කොට ගෞතම නම් බුදුවන්නේයයි දැන භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට ''මහණෙනි උග්‍රතපස් ඇති මේ සුමේධතාපසයාණන් බලව්, මේ තෙම අවශෙෂයෙක් නොවෙයි, මෙයින් සාරාසඞ්ඛ්‍යකල්ප ලක්ෂයකින් මත්තෙහි දඹදිව සකල වස්තුවෙන් විපුලවූ කපිල වස්තු පුරයෙහි සිද්ධාර්ත්ථකුමාරව ඉපිද අශ්වත්ථනම් බොධි වෘක්ෂ මූලයෙහිදී බුදුවන්නේ''යි යනාදීන් මේ බුදුවූ කාලයෙහි පැවති සියලු ප්‍රවෘත්තියම එහි සිව්වණක් පිරිස් මැද ප්‍රකාශකොට වදරා බුද්ධත්වය පිණිස විවරණ ශ්‍රී දනය කොට මහුල්වඩා ඉක්බිති රඹගම් නුවරට වැඩිසේක. උන් වහන්සේ විසින් දෑසමන් මල් අටමිටකින්ද පුද ප්‍රදක්ෂිණා කොට වැඩිය කල්හි සාරලක්ෂයක් පමණ මහරහතන් වහන්සේලාද ගඳමල් ආදීන් පුද ප්‍රදක්ෂිණා කොට වැඩි සේක. ඉක්බිති දසදහසක් සක්වළ දෙවියෝ හා එතනට රැස්වූ මනුෂ්‍යයෝද සුවඳ මල් වස්ත්‍රාභරණාදීන් පුද බෝසතුන් වැඳ ප්‍රදක්ෂිණා කොට ''ස්වාමිනි යම් පුරුෂයෙකු සෘජුවූ තොටින් එතරවෙන්ට උත්සාහකොට වැර දුණහොත් යටිතොටින් එතරවන්නා සේ අපිද මේ දිවකුරු බුදුන්ගේ සස්නෙහිදී නිවන් නොගිය හොත් ඔබ වහන්සේ බුදුවන කාලයෙහි ඔබකරා පැමිණ නිවන් අමාරස බොමහ''යි ප්‍රාර්ත්ථනා කොට ගියෝය. එකල්හි සුමේධ තාපසයාණෝද වැද හොත් තැනින් නැගීසිට බුඩත්වය පිණිස පාරමී ධර්මයන් සොයමියි මල්ගොඩ මතුයෙහි පලක් බැඳ වැඩහිඳ දිව්‍ය බ්‍රහ්මාදීන් ලවා සාධුකාර දෙවමින් දශපාරමී ධර්මයන් සිහිකර වදළසේක.

හේ කෙසේදයත්:– තමන්ගේ ඇස් ලේ මස් ආදි අඞ්ගපරිත්‍යාගය දනපාරමිතා නම් වෙයි. අඞ්ග පරිත්‍යාගයට ආසන්නවූ පුත්‍රදර ග්‍රාමක්ෂෙත්‍ර මුතු මැණික් ආදි බාහිරවස්තු පරිත්‍යාගය දන උපපාරමිතා නම් වෙයි. අඞ්ගපරිත්‍යාගයට අධිකවූ හෙයින් දිවිපිදීම දනපරමාර්ත්ථ පාරමිතා නම් වෙයි. මෙසේ ත්‍රිවිධාකාර

Non-commercial distribution

යෙන් පිරිය යුතු දන පාරමිතාවද, එසේම ත්‍රිවිධාකාරයෙන් පිරිය යුතු ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා සංඛ්‍යාත සමත්‍රිංශත් පාරමී ධර්මයන්ම සමාදන් වීමෙන් සිහිකොට වීර්‍ය්‍ය උපදවා හුනස්නෙන් නැගිසිටි කල්හි දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මාදීහු උන්වහන්සේ වෙත එළඹ දිවමල් දිව සුවඳ ආදීන් පුදු සුමෙධ තාපසයාණන් වහන්ස ඔබ විසින් දීපඞ්කර සර්ව්ඥපාද මූලයෙහිදී මහත් ප්‍රාර්ත්ථනාවක් කරන ලද්දේය. ඒ ප්‍රාර්ත්ථනා ව අන්තරායක් නොමවේවයි භයක් හෝ තැති ගැන්මක් හෝ ශරීරයෙහි ස්වල්පවූද රොගයක් හෝ ඔබට නොවේවයි වහාම පාරමී ධර්මයන් පුරා සම්‍යක් සම්බොධිය අවබොධ කරන සේක්වයි යම් සේ මල්ඵලගන්නා වෘක්ෂයේ ඒ ඒ කාල නොයික්මවා මල්ඵල ගනිත්ද එමෙන් ඔබ වහන්සේද කාලය නොයික්මවා බුඩත්වයට පැමිණෙන සේක්වයි නානාප්‍රකාරයෙන් ස්තුතිකොට දහස්ගණන් මඞ්ගල වචනයෙන් සතුටුකොට තම තමන්ගේ දෙව්ලෝ ගියාහුය. එකල්හි බෝ සත්ත්වයාණෝද දශපාරමී ධර්මයන් පුරා සාරාසඞ්ඛ්‍යකප්ලක්ෂයක්හු ගේ ඇවෑමෙන් බුඩත්වයට පැමිණෙමියි දෘඪතර වීර්‍ය්‍යාධිෂ්ඨානය කොට අහසට නැඟී හිමාලය වනයට වැඩි සේක.

මෙසේ අපගේ ශ්‍රී මහා බොධිසත්ත්වයන් වහන්සේ ඉතා මිහිරි රසවත් භොජනයක් ලැබ බොහෝ කලක් ක්ෂුධාවෙන් පීඩිත මහාජනයා බල බලා සිටියදී අඳුරු ගේකට වැද තනිව ඒ අනුභව නොකොට කනු කැමැත්තවුන්ටත් ඒ මිහිරි රස බොජුන් බෙදදී වලඳනු කැමැති සත්පුරුෂයෙකු මෙන්ද තමාසේම සා පිපාසායෙන් පෙළෙන දරුවන්ට තමාලත් අමාරස බෙදදී වළඳනු කැමැති මෑණියන්දෑ කෙනෙකුන්මෙන්ද ගිනි ඇවිලගත් ගෙයි හඬමින් සිටින දරුවන් දැක ගින්නට වැද ඔවුන් ඇකයටගෙන එයින් බැහැර දිවයනු කැමැති ප්‍රියතර පියාණෑ කෙනෙකුන් මෙන්ද තමන් වහන්සේ අතටපත් නිවන් සැප සසරදුක මෙන් හැරපියා සමස්ත සත්වයා සංසාර බන්ධනයෙන් මුදු ඔවුන්ටද නිවන් සැප පසක්කර දෙමැයි ලෝවැසි ජනයා කෙරෙහි මහා කරුණාවෙන් යුක්තව දීපඞ්කර සර්ව්ඥ පාදමූලයෙහිදී සම්බුඩ රාජ්‍යය පිණිස පළමු නියත විවරණ ශ්‍රී ලත් සේකැයි දතයුතු.

මෙසේ අප මහබෝසතාණෝ දීපඞ්කර තථාගතයන් වහන්සේට පසුව කල්ප අසඞ්ඛ්‍යයක් බුඩශූන්‍යව ගියකල්හි

Non-commercial distribution

විජිතාවී නම් සක්විති රජව චක්‍රවර්ත්ති රාජ්‍යය පුදු කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේගෙන්ද, ඊටපසු කල්ප අසඞ්ඛ්‍යයක් බුඩ ශූන්‍යව ගියකල්හි සුරුචිනම් බ්‍රාහ්මණව ඉපිද මහදන්දී මඞ්ගල බුදුන් වහන්සේ ගෙන්ද, තදනන්තර ව එම කප දෙවන අතුරු කල්පයෙහි අතුල නම් නා රජව ඉපද මහදන් පවත්වා සුමන නම් දශබලධාරින් වහන්සේ ගෙන්ද, එම කප තුන්වන අතුරුකප අතිදෙව නම් බ්‍රාහ්මණව ඉපිද උතුරු සළුව පුදු රෙවත ශාස්තෘන් වහන්සේ ගෙන්ද, එම කල්පයෙහි සතරවන අතුරුකප අජිත නම් බ්‍රාහ්මණව ඉපිද මහදන්දී සොභිත මුනීන්ද්‍රයන් වහන්සේගෙන්ද, ඊට ඉක්බිතිව කප් අසඞ්ඛ්‍යයක් බුඩශූන්‍යව ගියකල!යක්ෂසෙනා ධිපතියෙක්ව මහදන් දී අනවමදර්ශී සර්ව්ඥයන් වහන්සේගෙන්ද, එම කප දෙවන අතුරු කල්පයෙහි සිංහ රාජන්ව ඉපිද දිවිපුදු පදුම තථාගතයන් වහන්සේගෙන්ද, එම කල්පයෙහි තුන්වන අතුරු කප අෂ්ටසමාපත්තිලාභී උග්‍රතාපසයෙක්ව මහදන් පවත්වා නාරද බුදුන් වහන්සේගෙන්ද, ඊට මෑත කල්ප අසඞ්ඛ්‍යයක් බුඩ ශූන්‍යව ගියකල මේ මහාභද්‍රකල්පයට ලක්ෂයක් වන කල්පයෙහි ජටිලනම් මහාරාෂ්ට්‍රව මහදන්දී පදුමුත්තර දශ බලධාරින් වහන්සේගෙන්ද, ඉක්බිතිව තිස්දහසක් කප බුඩශූන්‍යව ගිය කල්හි මෙකපට හැත්තෑදහස්වන කල්පයෙහි උත්තරනම් මාණවකව මහදන්දී සුමෙධ සර්ව්ඥයන් වහන්සේ ගෙන්ද, එම කප දෙවන අතුරුකප සක්විතිරජව චක්‍රවර්ත්තිරාජ්‍යය පුදු සුජාත දශබලධාරින් වහන්සේගෙන්ද, ඊටපසු කප් හැටඅටදස් දෙසීයක් බුඩශූන්‍යව ගියකල්හි මෙකපට කල්ප එක්දස් අටසීයයකට මතු මණ්ඩනම් කල්පයෙහි කාශ්‍යප නම් මාණවකව කෙළලක්ෂයක් ධනවියදමින් සඞ්ඝාරාමයක් කරවා පුදු පියදස්සී සර්ව්ඥයන්වහන් සේගෙන්ද, එම කල්පයෙහි දෙවන අතුරුකප සුසීම නම් තාපසව මදරාමල් ඡත්‍රයක් පුදු අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ ගෙන්ද, එම කප තුන්වන අතුරුකප සක්දෙව් රජව ඉපිද දිවසුවඳ ආදීන් පුදු ධම්මදස්සී තථාගතයන් වහන්සේ ගෙන්ද. ඊට පසුව කල්ප එක්දස් හත්සිය හයක් බුඩ ශූන්‍යව ගියකල මෙකපට අනුසතර වන කල්පයෙහි මඞ්ගල නම් තාපසව මහඹපල පුදු සිද්ධාර්ත්ථ බුදුන් වහන්සේගෙන්ද, තදනන්තරව කප්දෙකක් බුඩ ශූන්‍යව ගියකල මෙකපට අනුදෙවන කල්පයෙහි සුජාතනම් තාපසව දිව මදරාමල් ආදිය පුදු තිස්ස සර්ව්ඥයන් වහන්සේගෙන්ද, එම

Non-commercial distribution

මණ්ඩ නම් කල්පයෙහි දෙවන අතුරුකප විජිතාවී නම් රජව ඉපිද රාජ්‍යශ්‍රීය හැරදමා මහණව ඵුස්ස නම් දශබලධාරීන් වහන්සේගෙන්ද, මේ කපට අනූඑක්වන කල්පයෙහි අතුලනම් නාග රාජන්ව ඉපිද සප්තරත්නයෙන් විසිතුරු රත්නපීඨයක් පුද විපස්සී සර්ව්ඥයන් වහන්සේ ගෙන්ද, ඉන්පසු එකුන්සැට කපක් බුඩශූන්‍යව ගියකල්හි මීට තිස්එක්වන කප අරිඤ්ජම නම් රජව මහදන්දී සිබී නම් බුදුරජාණන් වහන්සේගෙන්ද, එම කල්පයෙහි දෙවන අතුරුකප සුදර්ශන නම් මහරජව මහදන් පවත්වා වෙස්සභූ බුදුන් වහන්සේගෙන්ද, ඊට අනතුරුව එක්තිස් කපක් බුඩශූන්‍යව ගියකල මේ කල්පයෙහි පළමුවන අතුරුකප කකුසඳ බුදුන් වහන්සේගෙන්ද, මෙම කල්පයෙහි දෙවන අතුරුකප පර්ීත නම් මහරජව මහදන්දී කොනාගම බුදුන් වහන්සේ ගෙන්ද, මෙම කල්පයෙහි තුන්වන අතුරුකප ජොතිපාල නම් මාණවකව මහණව කාශ්‍යප සර්ව්ඥයන් වහන්සේගෙන්ද නියත විවරණශ්‍රී ලත්සේක.

මෙසේ දීපඩිකරාදී සුවිසි බුදුවරයන් වහන්සේලා වෙතින් ලබන ලද සුවිසි විවරණ ඇති අප මහබෝසතාණන් වහන්සේ සමතිස් පාරමී ධර්මයන් සම්පූර්ණකොට වෙසතුරු මහරජව පොළොව ගුගුරුවා සප්තශතක මහදන්දී එම විශ්වන්තරාත්ම භාවයෙන් චුතව තුසිපුර පැමිණ මහත් දිවසැප විඳිමින් සිටිසද දසදහසක් සක්වළ ශක්‍ර බ්‍රහ්මාදී දෙවියෝ උන්වහන්සේ වෙත පැමිණ–

''කාලොයං තෙ මහාවීර – උප්පජ්ජ මාතු කුච්ඡියං.
සදෙවකං තාරයන්තො – බුජ්ඣස්සු අමතං පදං.''

යන්නෙන් ''මහාවීරයන්වහන්ස! ඔබට බුදුවීමට මේ කාලය වන්නේය''යි ආරාධනා කළාහුය. ඉක්බිති අප මහාබෝසතාණෝ–

''කාලං දීපං ච දෙසං ච – කුලං මාතරමෙවච,
එතෙ පඤ්ච විලොකෙත්වා – උප්පජ්ජන්ති තථාගතා''යි

කාල, දීප, දෙස, කුල, ජනෙත්ති යන පඤ්ච මහා විලොකනය බලා බුදුවීමට කල්බව දැන දෙවියන්ට ප්‍රතිඥාදී ඔවුන් යවා තුසිපුර දෙවියන් විසින් පිරිවරණලදුව නන්දනොද්‍යානයෙහි ඇවිදිමින් සිට දෙව්ලොවින් චුතව ඇසළ මස මැදිපොහෝ ලත්

Non-commercial distribution

උතුරුසළේ නකතින් අළුයම් කාලයෙහි සුඩොදන මහරජුන් නිසා මහමායා දෙවින් කුස ප්‍රතිසන්ධිග්‍රහණය කළසේක. මහා මායා දෙවියද දසමස් ඉක්මීමෙන් පිරුණු ගැබ ඇතිව තමන් ජාත භූමියවූ දෙව්දහනුවරට යනු කැමතිව සුඩොදන මහරජාණන්ට දැන්වූ කල්හි රජතෙමේද යහපතැයි සතුටුව කපිලවස්තු පුරයෙහි පටන් දෙව්දහනුවර දක්වා මාර්ගය නොයෙක් ලෙසින් අලඞ්කාර කොට සරසවා දෙවිය රන්සිවි ගෙයක හිඳුවා ඇමතියන් දහසක් සමග මහත් පිරිවරින් නික්මවිය. ඒ කිඹුල්වත් පුරයටද දෙව්දහ නුවරටද අතරෙහි වන්‍දනාදි නානා වෘක්ෂ පඞ්ක්තීන් සැදුම්ලත් ලුම්බිනී නම් මගුල් සල්ලයනෙක් ඇත්තේය. ඒ උයන දුටු දෙවි තොමෝ එම සල්ලයනෙහි උයන් ක්‍රීඩා කරනු කැමැති විය. එබවදත් ඇමතියෝද අදහස් ලෙස මඟුල් උයනට දෙවීන් වඩාලූහ. එකල්හි මහාමායාදෙවී සුපුෂ්පිත සල්රුකක් මුලට පැමිණ අත්තක් අල්වනු කැමතිවූ කල්හි සිත්ලෙසම ශාඛාව නැමී දෙවින් ගේ හස්තයට පැමිණියාය. එසල් අත්ත දකුනුතින් ගෙන නැගෙනහිර දිසාව බලා සිටියදීම අප මහා බොධිසත්වයෝ ධර්මාසනයකින් බස්නා මහා ධර්මකථිකයෙකු සේ දිගුකරනලද අත් පා ඇතුව කසීවස්ත්‍රයෙක්හි වසා තබන ලද ජාතිරඞ්ග මාණික්‍යයක් මෙන් පිරිසිදු ශරීර ඇතිව වෙසක් මස මැදිපෝය ලත් කුජදින විසානකතින් දෙතිස්පෙර නිමිති පහළවෙමින් සිටියදී මවුකුසින් බිහිවූ සේක. එසේ බිහිව පිළිවෙළින් පෘථිවියට වැඩ සමපාදයෙන් වැඩසිට සහම්පතී නම් මහාබ්‍රහ්මයා විසින් ධවලච්ඡත්‍ර දරණ ලදුව සුයමා නම් දිව්‍යරාජයා විසින් වල්විදුනා සලන ලදුව ඒ ඒ දිව්‍ය රාජයන් විසින් රත්නකර්ණ්ඩකයෙන් සොභනවූ මඟුල් කඩුව හා රන්මිරිවැඩි සහළ නළල්පට ගත්අත් ඇතිව දිව බඹුන් විසින් පරිවරණලදුව උතුරු දිගට අභිමුඛව පියුම්මතුයෙන් සප්තපදවීතිහාරාවසානකොට සත්වනවූ සත්බුමු මහ පියුම් මතුයෙහි වැඩ සිට කෙළලක්ෂයක් සක්වළ බලනුයේ ''බැලූ බැලූ දිශාවෙහි දිව්‍ය බ්‍රහ්මයන් විසින් ස්වාමීනි මේ දිශාවෙහි ඔබ වහන්සේ හා සමාන කෙනෙකුත් නැත, ඔබ වහන්සේට වැඩි කෙනෙකුත් නැත, එබැවින් මේ දිශාව බැලීමෙන් ප්‍රයොජන නැතැ''යි කීකල මනොඥවූ මුඛ සුගන්ධයෙන් භුවනත්‍රය සුගන්ධකොට මහත්වූ බ්‍රහ්මසොභාවන්-

Non-commercial distribution

''අග්ගොහමස්මි ලොකස්ස
ජෙට්ඨොහමස්මි ලොකස්ස
සෙට්ඨොහමස්මි ලොකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවොහි.''

යන්නෙන් ''දෙවිමිනිසුන් සහිත සියලු ලොකයාට මම දැන් අග්‍ර වූයේ වෙමි, ප්‍රධාන වූයේ වෙමි, ශ්‍රේෂ්ඨ වූයේ වෙමි, මෙ මාගේ කෙළවර උත්පත්තිය වන්නේය, නැවත උත්පත්තියෙක් නම් නැතැ''යි මේ උත්තම සිංහනාදය උපන් ඇසිල්ලකම කර වදළ සේක. පූර්ව දක්ෂිණ පශ්චිම යන තුන්දිශාවටද සප්තපද වීතිහාරය කොට අභීත සිංහනාද පැවැත්වූසේක. මෙසේ සිංහනාද කළ ඉක්බිති දෙනුවර වාසිහු අපමණ පූජා පෙළහර පවත්වමින් ප්‍රමාණාතික්‍රාන්ත ශ්‍රී සමෘද්ධින් බොධිසත්වයන් වහන්සේ කිඹුල්වත්පුරයට වැඩමවාගන ගියහ. මහබෝසතාණන් උපන් පස් දවසින් නම් තබන මහුල් දිනයෙහි සුද්ධොදන මහරජාණෝ කුමරුවන් සුවඳ පැනින් නහවා මලින් සරසා රාජ භවනයද සඳුන්, කපුරු, කොකුම්, තුවරලා යන සිව් දෑ ගඳින් පිරිබඩ ගන්වා චතුර්වෙදයෙහි නිපුණ බ්‍රාහ්මණයන් අටෝරාසියක් ගෙන්වා පණවනලද අසුන්වල හිඳුවා පැන් නුමුසු කිරිබත් රන් තලි සමග දන්දී මහත් සත්කාරකොට ''බ්‍රාහ්මණයෙනි, මාගේ පුත්‍රවූ මේ කුමාරයාණන් ගේ පුණ්‍යලක්ෂණ බලා සුදුසු නමක් තබා මතු සිදුවනදේද තත්වූපරිද්දෙන් කියව්''යයි අණකළෝය. ඔවුනතුරෙන් රාමය, ධජය, ලක්ඛණය, මන්තිය, කොණ්ඩඤ්ඤය, භෝජය, සුයාමය, සුදත්තය යන මේ ප්‍රධාන බ්‍රාහ්මණයන් අටදෙන අතුරෙන් වැඩි මහලු සත්දෙන ඇඟිලි දෙකක් ඔසවා කියන්නාහු ''දෙවයන්වහන්ස, සතුටුවුව මැනව්, යමෙකුගේ කුලයක මෙවැනි පුත්‍රරත්නයක් පහළවී නම් ඔවුන්ට වූයේ මහත් ලාභයක, දෙවයන්වහන්ස මේ ළදරුතෙම දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්තය, එහෙයින් කුමාරයාණන්ට දෙගතියක් වන්නේය. ඉදින් මේ කුමරු ගිහිගෙයි විසුයේ නම් කොදෙව් දෙදහසක් පිරිවරකොට ඇති සතර මහාද්වීපයට අධිපතිවූ චක්‍රවර්ති රාජන්ව අහසින් ඇවිද ලොකයාට අනුශාසනා කරමින් රජසිරි විඳිනේය. ඉදින් ගිහිගේ හැර පැවිදිවූයේ නම් රාග, වෙෂ, මොහ, මාන, දෘෂ්ඨි ආදි ආවරණයන් අනාවරණයකොට ලොකොත්තර බුද්ධ රාජ්‍යයට පැමිණ දිව්‍ය බ්‍රහ්මාදී සියල්ලන්

Non-commercial distribution

ගෙන් වැඳුම් ගන්නා මහ පින් ඇතිසේකැ''යි කීවාහුය. මෙසේ ඔවුන් දෙගතියක් ප්‍රකාශකළ කල්හි ඒ සියලු දෙනාටම වයසින් බාලවූ කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණාචාර්‍යතෙම බොධිසත්ව යන්ගේ පුණ්‍ය ලක්ෂණයන් යහපත්සේ ශාස්ත්‍රඥනයෙන් බලන්නේ – ''අරුණුවන්වූ ගගන තලයෙහි බබලන ඔෂධි තාරකාවමෙන් දක්ෂිණාවර්ත්තව පිහිටි ඌර්ණ රොම ධාතුහුගේ ශ්වෙතවර්ණ නියාවදැක චක්‍රවර්ති වේ නම් මේ රොමය ස්වර්ණ තිලකයක්සේ රක්තවර්ණ ඇතිවෙයි, බුදුවන මහතාණන්ට වූකලි මකුළුතිලකයක්සේ සුදුපැහැ ඇතිවේයයි දැන, මෙබඳු උත්තම-යන් ගිහිගෙයි විසීමෙක් නම් නැත. ඒකාන්තයෙන් මුන් වහන්සේ බුදු වනසේක්මය''යි ස්ථිරකොට එක ඇඟිල්ලක් ඔසවා එකක්ම කීයේය. මෙසේද කියා නම් තබන්නාහු ''මේ කුමරු මතු ලොවට වැඩ සිදුකෙරෙයි, එහෙයින් ''**සිද්ධාර්ත්ථ කුමාර**''යයි නම් කළාහුය. මෙසේ සිද්ධාර්ත්ථ කුමාරයාණන් වහන්සේ ශ්‍රී සෞභාග්‍යයෙන් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයස්වූ කල්හි සුදවුන් මහ රජතුමාණෝ බුද්ධාඞ්කුරයාණන්හට වස්සාන, හෙමන්ත, ගිම්හාන යන ඍතුත්‍රයට සුදුසු **රම්ම, සුරම්ම, සුභ** යන තුන්පහයක් කරවූහ. නැවත පිය මහ රජතුමා මපුතණුවන් රාජ්‍යාභිෂේකයට පත්කොට රාජ්‍ය ශ්‍රී දකිමියි සිතා ''මපුතණුවන් සම්පූර්ණ වයස් ඇති බැවින් ඕහට රාජ්‍යය දෙමි, සියල්ලෝම තම තමන්ගේ ගෘහයන්හි සිටින වයස් සම්පූර්ණ කුමාරිකාවරුන් අපගේ රජගෙට එවත්ව''යි ඥාති ශාක්‍යයන්ට හසුන් යැවීය. එවිට ඔවුන් තුළ ඇතිවූ සැකය දුරුකරනු සඳහා සිද්ධාර්ත්ථ කුමාරයාණෝ මහජනයා මධ්‍යයෙහි ලෝකයෙහි ඇතිතාක් සකල ශිල්පයන් දක්වා සැක දුරුකොට සක්දෙව් රජු සෙයින් සතළිස් දහසක් පමණ දෙවඟනන් වැනි වරඟනන් විසින් පිරිවරණ ලදුව ඒ ඒ කාලයට සැපවූ පරිද්දෙන් තුන්පහ-යෙහි **යසොධරා** දෙවිය අග්‍රමහෙසිකා කොට දිව්‍ය සම්පත් සදෘශ රාජ්‍ය සම්පත් අනුභවකරමින් සිටියෝය. ඉක්බිති උන්වහන්සේ උයන් කෙළියට යන ගමනේ දී ජරා ව්‍යාධි මෘත සඞ්ඛ්‍යාත තුන්පෙර නිමිති දැක සසරෙහි කලකිරී සිටිය සඳ නැවත යහපත්ව හැඳ පොරවනලද පැවිදි රැවක් දැක ප්‍රසන්න සිත් ඇතිව පැවිදිවීමෙහි ආලය උපදවා උද්‍යාන ක්‍රීඩාකොට නුවරට අවුත් එදින රාත්‍රී භාගයෙහි මහත් ශ්‍රී සමෘද්ධීන් අති රම්‍යවූ

Non-commercial distribution

ප්‍රාසාදයටනැඟී යහන් මස්තකයෙහි සැතපුණු සේක් නැවත පිබිදී අසුන් මතුයෙහි බද්ධපර්‍යඞ්කයෙන් වැඩහිඳ තූර්‍යභාණ්ඩයන් දමා එහි තන්හි තන්හි නිදන නාටක ස්ත්‍රීන් ගේ විප්‍රකාර දැක දිව විමනක් වැනිවූ ඒ ප්‍රාසාදය එදවස් අමුසොහොනක් මෙන් වැටහී අදම මා විසින් මහාභිනිෂ්ක්‍රමණය කරන්ට වටනේයයි සිතා ශ්‍රී යහනින් නැඟී සිට ඡන්න නම් අමාත්‍යයා කැඳවා ඔහු ලවා කන්ථක නම් අශ්වරාජයා සරසා ඡන්නයා ලවා අසුගේ වාලධිය ගන්වා තමන් වහන්සේ අසුපිටට පැණ නැඟී දෙවියන් විසින් හළ දෙරින් හස්තප්‍රාප්තවූ රාජ්‍ය ශ්‍රී සම්පත් හා සතියකින් ලැබෙන චක්‍රවර්ති සම්පතද අලුයම දැමූ කෙල පිඬක්සේ සලකා හැරදමා ඇසළ මස පුරපසළොස්වක් පොහෝදින උතුරුසළ නකතින් මධ්‍යම රාත්‍රියෙහි මහබිනික්මන් කොට පසළොස් පැය ඇතුළත තිස් යොදුන් මගගෙවා අරුණෝද්ගමන වේලෙහි අනොමා නම් ගංතෙරට පැමිණ සටිකාර නම් මහාබ්‍රහ්මයා විසින් ගෙනැවිත් දෙනලද අටපිරිකර පිළිගෙන පැවිදිව සාවුරුද්දක් මුළුල්ලෙහි අප්‍රමාණ දුෂ්කර ක්‍රියාකොට අත්තකිලමථානුයොගයයි කියන ලද ශරීර විඩා කිරීමෙහි යෙදීමෙන් මොක්ෂයාගේ අභාවය ලොකයාට ප්‍රකාශකොට නැවත මධ්‍යම ප්‍රතිපදයයි කියනලද ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි පිළිපැද වෙසහ මැදිපොහොදින අලුයම් වේලෙහි දැවිටිදඬු වළඳා මුව ශොධනය කොට මනාසේ සිවුරු හැඳ පොරවා අජපාල න්‍යග්‍රොධ නම් නුගරුක් මුලට වැඩ භික්ෂාටන වෙලාව පැමිණෙන තෙක් නැගෙණහිර ලොකධාතුව බලා වැඩ හුන්සේක.

එකල්හි උරුවෙල් දනව්වෙහි සෙනානී නම් නියමිගම සෙනානී නම් කෙළඹිහු ගේ දුහිතෘවූ සුජාතාව විසින් පුදනලද රන්තළිය සමග ක්ෂීරපායාසය පිළිගෙන හුන් තැනින් නැඟී ඒ වෘක්ෂය සිසාරා ප්‍රදක්ෂිණා කොට තළියගෙන නෙරඤ්ජරා නම් ගංතෙරට පැමිණ සුප්‍රතිෂ්ඨිත නම් තොට සමීපයේ සිහිල් සෙව නෙහි රන්තළිය තබා ගඟට බැස ස්නානයකොට ගොඩනැඟී හැඳ පෙරව පූර්වදිග බලා වැඩහිඳ එකුන්පණස් පිඬක් කෙරෙමින් ක්ෂීරපායාසය වළඳා රන්තළිය උඩුගංබලා යන සේ ගඟටදමා නෙරඤ්ජරා නදීතීරයෙහි සුගන්ධ පුෂ්පයෙන් සැදුම්ලත් නීල වර්ණ ප්‍රභාවෙන් සිත්කළු වූ සල්වනයෙහි දිවාවිහරණය කොට පඤ්ච අභිඤ්ඤා අෂ්ටසමාපත්ති උපදවා සවස් වේලෙහි දිව්‍ය

Non-commercial distribution

බ්‍රහ්මාදීන් විසින් මදරාදි පුෂ්පයෙන් පුදන ලදුව ජය මහා භූමි යෙහි හටගත් අශ්වත්ථ බොධිවෘක්ෂාභිමුඛව වඩනාසේක් **සොත්ථිය** නම් බ්‍රාහ්මණයා විසින් දෙනලද කුසතණ අටමිට පිළිගෙන බොධි වෘක්ෂරාජයා වෙත එළඹ දකුණු දිශාභාගයට ගොස් උන්වහන්සේ වැඩසිටියදී එහි පෘථිවිය කම්පාවිය. එසේම පශ්චිමොත්තර දිශාවන්ට වැඩිය කල්හිදු පොළොව කම්පාවිය. නැවත මහබෝසතාණන්වහන්සේ නැගෙණහිර දිශාභාගයට ගොස් වැඩසිටිසේක් ඒ ස්ථානය පය්‍යඞ්කයට ප්‍රමාණවූ අචල ස්ථානය බැවින් නිශ්චලව සිටිකල්හි පෙර සියලු බුදුවරයන්ම මාර විජයකොට ක්ලෙශවිධ්වංශනය කළාවූ උත්තම ස්ථානයයි සලකා තණ මිටි අගින් අල්වා සැළු කෙණෙහිම මහා පෘථිවිය විවෘතව පාරමිතානුභාවයෙන් පැන නැංගාවූ තුදුස් රියන් ප්‍රමාණ වජ්‍රාසනාරූඪව ''මාගේ මේ ශරීරයෙහි මස්, ලේ, ඇට, නහර වියලී සුණු විසුණුව ගිය නමුදු සම්‍යක් සම්බොධියට පැමිණ මිස මාගේ වීය්‍ය නොහරිමි''යි සිතා වීය්‍යාධිෂ්ඨානයෙන් බද්ධපය්‍යඞ්කයෙන් මට සිලුටුවූ බෝ කඳට පිටලා නැගෙණහිරට මුහුණලා වැඩ සිට සපරිවාර මාරපරාජය කොට ප්‍රථම යාමයෙහි පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවනයයි කියනලද පූර්වේනිවාසානුස්මෘති ඥනයද, මධ්‍යම යාමයෙහි සත්වයන්ගේ චුතූ උත්පත්ති දෙක දැනීමයයි කියනලද දිව්‍ය චක්ෂුරභිඥනයද, පශ්චිම යාමයෙහි ආශ්‍රවක්ෂය කරඥනයද ලබා ප්‍රතීත්‍ය සමුත්පාද යෙහි ප්‍රඥව බහා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සම්මර්ශණය කරත් කරත් දසදහසක් සක්වළ අනන්තවාරයක් කම්පාකරවා සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් යන සතර මග ඵතර ඵලයට පැමිණ අරුණෝද්ගමනවෙලෙහි ලොව්තුරා බුඩත්වයට පැමිණියේක.

මෙසේ සවාසනා සකල ක්ලෙශයන් මූලොත්පාටනය කොට නසා බුඩත්වයට පැමිණි තථාගතයන්වහන්සේ එහිදී සත්සති යවා නැවත බ්‍රහ්මාරාධනාව පිළිගෙන ඇසළ මස පසළොස්වක් පොහෝද **බරණැස ඉසිපතනාරාමයට** වැඩමවා **කොණ්ඩඤ්ඤය, භද්දිය, වප්පය, මහානාමය, අස්සජිය** යන පස්වග මහණුන්ට ආමන්ත්‍රණය කොට ''වෙ මෙ භික්ඛවෙ **අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා**'' යනාදීන් දම්සක් සුතුරෙන්

Non-commercial distribution

මහුල් බණ වදරා කෞණ්ඩිඤ්ඤ ස්ථවිරයන් ඇතුළුව දිව්‍ය බ්‍රහ්මයන් නිවන්පුර පමුණුවා එතැන් පටන් අප්‍රමාණ සතරාමර ලොකවාසීන් ධර්මාමෘත දනයෙන් සන්තර්පණය කෙරෙමින් පන්සාලිස් හවුරුද්දක් මුළුල්ලෙහි කළමනා සකල බුද්ධ කෘත්‍ය යන් කොට නිමවා වෙසඟ පුර විසා නකත ලත් අඟහරුවාද කුසිනාරා නුවර මල්ලරජුන්ගේ උපවර්තන නම්වූ ශාලවනොද්‍යාන යෙහි යුග්මශාල වෘක්ෂ අතුරෙහි පනවනලද පිරිනිවන් මඤ්චක යෙහි උතුරට හිසලා දකුණුලයෙන් නැවත නැගී නොසිටින සංඥාවෙන් උතුම් වූ සිංහ ශය්‍යාවෙන් සයනයකොට සියලු භික්ෂූන්ට අප්‍රමාද පදයෙන් අන්තිම අවවාදය දී වදරා සූවිසිකෙළ ලක්ෂයක් පමණ සමාපත්තීන්ට සමවැදීමෙන් සකල සමාපත්ති සුඛානුභවකොට දසදහසක් සක්වළ කම්පාකරවා පිරිනිවන් පෑ වදළ සේක.

මෙසේ සකල ලොකවාසීන්ට මේ ශ්‍රී සද්ධර්මාමෘත දනය සඳහා අප තථාගතයන් වහන්සේ යට දැක්වූ පරිදි ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලෙහි අනූපමය වීර්‍යයෙන් පාරමී ධර්ම පුරා තිබෙන බවත් එහෙයින්ම ඒ මේ ධර්මය අතිශය දුර්ලභ බවත් සලකා සකල සාධූන් විසින් ඉතා දුකසේ ලබාගත් ඒ මේ ධර්මය අසාබලා සිත්හි ධාරණය කර ගැණීමෙන් ධර්මය වූ පරිදි පිළි පැදීමෙන් සඟමොක් සම්පත් අත්පත්කර ගැණීමට නිතර උත්සාහ වැඩිය යුතු.

මෙතැන් පටන් ප්‍රෙතවස්තු වණ්ණනාව සිංහලට නගා කියනු ලබන බැවින් හේ මනා ව ශ්‍රවණ ධාරණය කොට ස්වල්ප මාත්‍ර වූද අකුශල කර්මයා ගේ විශේෂ දුඃඛවිපාක අවබොධ කටයුතු.

එහි ප්‍රෙතවස්තු නම්: සිටු පුත්‍රාදීවූ ඒ ඒ සත්වයන් ප්‍රෙතවැ ඉපදීමට හෙතුවූ යම් අකුශල කර්මයක්වේද, ඒ අකුශලකර්ම ප්‍රකාශ කිරීම් වශයෙන් පැවති ''බෙත්තූපමා අරහන්තෝ'' යනාදිවූ පය්‍යාප්ති ධර්මය මෙහි ප්‍රෙතවස්තුයයි කියනු ලැබේ. ඒ මේ ප්‍රෙතවස්තු දෙශනාව කවරෙකු විසින් වදරන ලද්දේද, කොතැන් හිදී කවර කලෙක, කිනම් කරුණක් නිසා වදරන ලද්දේදැයි යන මේ ප්‍රශ්නයන් ගේ විසර්ජනය වනාහි මෙහි මතු කියනු ලැබේ.

මේ ප්‍රෙතවස්තු වනාහි අර්ත්ථොත්පත්ති වශයෙන් හා පුච්ඡා විස්සජ්ජන වශයෙන් දෑයි දෙයාකාරයකින් පැවැත්තේය.

Non-commercial distribution

ඒ දෙයාකාරය අතුරෙන් යම් ප්‍රෙතවස්තුවක් අර්ත්ථොත්පත්ති වශයෙන් පැවැත්තේද, ඒ ප්‍රෙතවස්තුව භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින්ම වදරන ලදි. පුච්ඡාවිස්සජ්ජන වශයෙන් පැවැති අනික් ප්‍රෙතවස්තු නාරද සථවිරාදි ශ්‍රාවකයන් විසින් විචාරණ ලදුව ඒ ඒ ප්‍රෙතයන් විසින් කියනලදහ. ශාස්තෘවූ තථාගතයන් වහන්සේ වනාහි යම් හෙයකින් නාරද සථවිරාදි ශ්‍රාවකයන් විසින් ඒ ඒ පුච්ඡාවිස්සජ්ජන ගාථාවන් තමන් වහන්සේට සැලකළ කල්හි ඒ ඒ කාරණය අර්ත්ථොත්පත්ති කොට ගෙන පැමිණි සිව්වණක් පිරිසට ධර්මදෙශනා කළසේක්ද, එහෙයින් සියලු ප්‍රෙතවස්තු දෙශනාව බුඩභාෂිතම නම් විය. පවත්වන ලද උතුම් දම්සක් ඇති ශාස්තෘන් වහන්සේ රාජගෘහ නගරාදියෙහිවූ ඒ ඒ විහාරාරාමයන්හි වැඩ වාසය කර වදරන කල්හි බොහෝ සෙයින් ඒ ඒ අර්ත්ථොත්පත්තියෙහිලා පුච්ඡා විස්සජ්ජන වශයෙන් සත්වයන්ට කර්මඵල ප්‍රත්‍යක්ෂකිරීම සඳහා ඒ ඒ ප්‍රෙතවස්තු දෙශනාවට නගන ලද්දේය යනු මේ මෙහි පළමුකොට ''කවරෙකු විසින් වදරන ලද්දේද්ද'' යි යනාදි ප්‍රශ්න කර්මයන්ට සාධාරණ හෙයින් විසඳීම වේ. අසාධාරණ හෙයින් විසඳීම වනාහි ඒ ඒ වස්තූන් සම්බන්ධි අර්ත්ථවර්ණනායෙහිම පැමිණෙන්නේය. ඒ මේ ප්‍රෙතවස්තු දෙශනාව වනාහි (සංගීති කාරක මහාසථවිරයන් වහන්සේලා) විනයපිටකය, සූත්‍රපිටකය, අභිධර්ම පිටකයයි කියන ලද පිටකත්‍රය ධර්මයන් අතුරෙන් සූත්‍රපිටකයට ඇතුළත්කොට සූත්‍රපිටකයෙහි දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අඞ්ගුත්තර නිකාය, ඛුද්දක නිකාය සඞ්ඛ්‍යාත පස්මහසඟි අතුරෙන් ඛුද්දක නිකායාන්තර්ගත කොට සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක අබ්භූත ධර්ම, වෙදල්ල යන නවඞ්ගශාසනාඞ්ගයන් අතුරෙන් ගාථාඞ්ගයෙන් උපලක්ෂිතවූ සංගායනා කර වදළසේක.

''වාසීතිං බුඩතෝ ගණ්හිං-වෙසහස්සානි භික්ඛුතෝ,
චතුරාසීති සහස්සානි-යෙමෙ ධම්මා පවත්තිනෝ''ති

යම් මේ සුවාසූ දහසක් ධර්මස්කන්ධයෝ පවත්නාහුද එයින් දෙයසූ දහසක් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ වෙතින්ද, දෙදහසක් තථාගත ශ්‍රාවක ශාරීපුත්‍ර මෞද්ගල්‍යායනාදි භික්ෂූන් වහන්සේලා වෙතින්ද අවබොධකර ගතිමියි මෙසේ ධර්මභාණ්ඩාගාරික ආනන්ද සථවිරයන් වහන්සේ විසින් ප්‍රතිඥාකළාවූ අසූ

Non-commercial distribution

සාරදහසක් ධම්ස්කන්ධයන් අතුරෙන් ධම්ස්කන්ධ කිහිපයකින් සංගෘහීතය, බණවර වශයෙන් බණවර සතරක් පමණ වේ. වර්ග වශයෙන් උරගවර්ගය, උබ්බරිවර්ගය, චූළවර්ගය, මහාවර්ගයයි කියා වර්ග සතරකින් සංග්‍රහ කළෝය. ඒ වර්ග සතර අතුරෙන් පළමු වර්ගයෙහි (කථා) වස්තු දෙළසක් වෙති. දෙවන වර්ගයෙහි තෙළ සක්ද, තුන්වන වර්ගයෙහි දසයක්ද, සතරවන වර්ගයෙහි වස්තු සොළසක් දැයි මෙසේ (කථා) වස්තු වශයෙන් එක්පණස් වස්තු වෙන් ප්‍රතිමණ්ඩිත වීය. එහි වර්ගයන් අතුරෙන් උරග වර්ගය මුල්වේ. වස්තු අතුරෙන් උරගවර්ගයට ඇතුළත් ඛෙත්තූපම ප්‍රෙතවස්තුව මුල්වේ. ඒ වස්තුවෙන්ද **ඛෙත්තූපමා අරහන්ථකා** යනාදි මේ ගාථාව පළමු වෙයි.

ප්‍රාරම්භය සමාප්තයි.

1. 1 වෙනි කථාව

උරගවර්ගයෙහි පළමුව**ඛෙත්තූපම ප්‍රෙතවස්තුව** නම්, කවරයත්-එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:-

ත්‍රෙලොක්‍ය තිලකායමාන අප භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ එක් සමයෙක්හි රජගහ නුවර සමීපයෙහිවූ (රජුන් විසින් ලෙහෙනුන්ට බත්වැටුප් තබා අභයදුන් හෙයින්) කලන්දකනිවාප නම් වූ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක්. එක්තරා සිටුපුත්‍ර ප්‍රෙතයෙකු අරභයා ඒ මේ ඛෙත්තූපම ප්‍රෙතවස්තු දෙශනාව කළසේක. රජගහනුවර වනාහි ධන සම්පත්තියෙන් ආඪ්‍යවූ මහත් ධන ඇති මහත් උපභොග පරිභොග සම්පත් ඇති බොහෝ වස්තූපකරණ ඇති රැස්කරනලද නොයෙක් කෙළගණන් ධන ඇති එක්තරා සිටු පුත්‍රයෙක් විය. මහත් ධන සම්පතින් යුක්ත බැවින් ඕහට මහා ධන සිටාණෝමයයි නම් විය. එකල්හි ඕහට ප්‍රිය මනාපවූ එකම පුත්‍රයෙක් විය. ඒ පුත්‍රයා නුවණැති බවට පැමිණි කල්හි දෙමව් පියෝ මෙසේ සිතූහ. ''අපගේ පුතණුවන් දවසක් පාසා දහස දහස බැගින් වස්තුව වියදම් කළත් හවුරුදු සියයකිනුදු මේ ධන සම්භාරය නිමාවට නොයන්නේය. (එහෙයින්) ශිල්ප ශාස්ත්‍රොද්ග්‍රහණය සඳහා වෙහෙසීමෙන් මෝහට ප්‍රයෝජන

Non-commercial distribution

යක් නැත්තේය. කාලාන්තනුවූ කායවිත්තයෙන් යුක්තව සුව සේ හොඟසම්පත් පරිහරණය කෙරේවා'යි සලකා කිසි ශිල්ප ශාස්ත්‍රයක් නොම ඉගැන්වූවාහුය. තරුණවියට පැමිණි ඕහට කුලයෙන් හා රූපයෙන්ද යෞවන ලීලායෙන්ද සම්බඩවූ පඤ්ච කාම රසාස්වාදනයටම සිත යොමුවූ ධර්ම සංඥයෙන් තොරවූ තරුණ ස්ත්‍රියක් (විවාහකොට) ගෙනාවාහුය. ඒ තරුණ සිටු තෙමේ ඈ හා සමග අභිරමණය කරන්නේ කුශල ධර්මයෙහි සිත් පමණකුදු නූපදවා ශ්‍රමණ බ්‍රාහ්මණ ගුරුදෙමව්පියන් කෙරෙහි ආදර ගෞරව නැතිවැ සුරා ධූර්තාදි ජනයා විසින් පිරිවරණ ලදුව තුටුපහටුවෙමින් පස්කම් සැපයෙහි ඇලී ගිජුව මොහයෙන් අන්ධව කල් ඉක්මවා මව්පියන් කලුරිය කළ කල්හි නළු නාටක ගායනාකාරාදීන්ට කැමැති පරිදි දෙමින් ධනය විනාශකොට නොබෝ දවසකින්ම වස්තුවෙන් පිරිහීම බවට පැමිණ නයගෙන ජීවිකා වෘත්තිය කරන්නේ පසුව නයද නොලබා නය හිමියන් විසින් (දෙනලද නය ආපසු) ඉල්වන ලද්දේ ඒ නය ගැතියන්ට තමා සතු කෙත් වත් ගෙවල් ආදි දේපල දී කබල් ගත් අත් ඇතිව සිහා ඇවිද කමින් එම නුවර අනාථ ශාලාවෙක වාසය කෙරේ.

එකල්හි එක් දවසක් සොරු රැස්ව ඒ සිහන්නාට මෙසේ කීවාහුය:- ''එම්බල පුරුෂය තට මේ දුඃඛ ජීවිතයෙන් කවර ප්‍රයොජනද තෝ ශරීර ශක්තියෙන් හා ජවයෙන්ද බලයෙන්ද යුක්ත වූ තරුණයෙක, කුමක් හෙයින් අත් පා නැත්තෙකුමෙන් සිටින්නෙහිද, එව අප සමග ගොස් සොරකමින් අනුන් සතු වස්තුවගෙන සුවසේ දිවි පැවැත්ම කරව''යි කිහ. එකල ඔහු ''මම වෙරකම් කරන්ට නොදනිමි''යි කීයේය. එබසට සොරු ''අපි තට සොරකම උගන්වමු. තෝ අපගේ වචනය පමණක්ම කරව''යි කීවාහුය. එතෙම මැනවයි පිළිගෙන ඒ සොරුන් සමග ගියේය. එකල්හි ඒ වෙර පුරුෂයෝ ඔහු අතට මහත් මුගුරක්දී ගෘහ සන්ධි බිඳ ගෙට ඇතුල් වෙමින් ඔහු ගෘහ සන්ධිය සමීපයෙහි හෙවත් ගෙ බිඳි කපොල්ල ලඟ සිටුවා ''ඉඳින් මෙහි අන් කිසිවෙක් ආයේ නම් ඔහු මේ මුගුරෙන් ගසා එක පහරින්ම මරව''යි කීවෝය. ඒ අන්ධ බාල මනුෂ්‍යතෙම වැඩ අවැඩ නොදන්නේ අනුන්ගේ ඊමම බලමින් එහි සිටියේය. සොරු වනාහි ගෙට වැදී ගතයුතුවූ රන් ආදි බඩු හැරගෙන

Non-commercial distribution

ගෘහවාසී මනුෂ්‍යයන් දැනගත් කෙණෙහිම ඔබිමොබ පැනගියා හුය. ගෘහ මනුෂ්‍යයෝ නැඟිට යුහුසුලුව දුවමින් ඔබි මොබ සොයා බලන්නාහු ගෘහ සන්ධි දෙරටුවෙහි සිටි ඒ පුරුෂයා දැක බොල දුෂ්ට චෞර යයි කියා අත් පා අල්වාගෙන මුඟුරු ආදියෙන් තළා ''දෙවයන් වහන්ස මේ සොරා ගෘහ සන්ධිය ලඟදී අප විසින් අල්වා ගන්නා ලද්දේ''යයි කියා රජහට දක් වූවාහුය. එවිට රජාණෝ මේ සොරා ගේ හිසකපා ලවයි නගර ගුත්තික ඇමතියාට අණ කළෝය. නගර ගුත්තිකයා දෙවයිනි යහපතැයි කියා ඔහු ගෙන්වාගෙන පිටිතලාහයා දැඩිකොඩ බන්දවා රන් වන් මල් වඩමින් බඳනා ලද ග්‍රීවා ඇතිව ගැඩොල් සුණු ගල්වන ලද හිස් ඇතිව වධය සඳහා ගසනලද බෙරහඬින් දක්වනලද මාඝියෙහි වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පමුණුවමින් කසවලින් තළමින් වධකස්ථානයට පමුණුවයි. මේ නුවර පැහැර ගත් මේ සොරා අප විසින් අල්වා ගන්නාලදැයි කොලාහලවිය.

ඒ කාලයෙහි ඒ නුවර සුලසා නම් වෙසහන පහයෙහි සිටියේ ජනෙල් කවුළු අතුරෙන් බලන්නී එසේ වධයට ගෙන යනු ලබන ඒ පුරුෂයා දැක පෙර ඔහු සමඟ කරන ලද පුරුදු වාසය ඇත්තී මේ පුරුෂයා මේ නගරයෙහිම මහත් සම්පත් අනුභවකොට නැවත දැන් මෙබඳුවූ අනතුරකට විපතකට පැමිණියේයයි සලකා ඕහට කරුණාව උපදවා අග්ගලා සතරක් හා පියයුතු පැන්ද මෙහෙකරුවෙකු අත යැවිය. ''මේ පුරුෂයා මේ අග්ගලා අනුභවකොට පැන් බොනතුරු ස්වාමි තෙමේ බලා පොරොත්තු වේවා''යි කියා නගරාරක්ෂක ඇමැතියා හටද දන්වා යැවිය. එකල්හි මේ අතර ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වහන්සේ දිවැසින් බලන්නේ ඔහු වැනසීමට පැමිණියා දැක කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව ''මේ පුරුෂයා පින් නොකළ කෙනෙක, පව්කළ කෙනෙක, ඒ හේතුවෙන් මේ පුරුෂයා නරකයෙහි උපදින්නේය. මා එහි ගියකල්හි වනාහි මොදකයන් (අග්ගලා) හා පැන්ද මටදී භූම්‍යෂ්ඨ දෙවියන් කෙරෙහි උපදින්නේය, එහෙයින් මේ පුද්ගලයාහට පිහිට වන්නෙමි නම් මැනවයි සිතා පැන් හා අග්ගලා ගෙනෙන ලද කල්හි ඒ පුරුෂයාගේ ඉදිරියෙහි පහළවූ සේක. ඒ ව්‍යසන ප්‍රාප්ත පුරුෂතෙම මහතෙරුන් වහන්සේ දැක පහන් සිත් ඇතිව

Non-commercial distribution

සිතන්නෙන් මේ වෙලාවේදීම මේ වධක පුරුෂයන් විසින් මරණු ලබන්නාවූ මට අග්ගලා අනුභව කිරීමෙන් කවර ප්‍රයෝජනද ''මේ වනාහී පරලොව යන මට මඟවියදම වන්නේය''යි සිතා මොදකයන් හා පැනුත් තෙරුන් වහන්සේට දෙවූයේය. සථවිර යන් වහන්සේ ඔහුගේ චිත්ත ප්‍රසාදය වර්ධනය පිණිස ඒ පුරුෂයා බලා සිටියදීම එබඳුවූ තැනෙක වැඩහිඳ අග්ගලා වළඳ පැන් බී හුනස්නෙන් නැඟිට වැඩිය සේක.

ඒ පුරුෂතෙම වනාහී චොරඝාතකයන් විසින් වධකස්ථාන යට පමුණුවා හිස කපා මරණයට පමුණුවන ලදුව නිරුත්තර පුණ්‍යක්ෂේත්‍රවූ මෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ කෙරෙහි පැහැදී කරන ලද දානමය කුශල කර්මය හෙතුකොටගෙන උදර සම්පත් ඇති දෙවලොව ඉපදීමට සුදුසුවූයේ නමුදු යම් හෙයකින් සුලඝාව නිසා මා විසින් මේ දෙයධර්ම සඞඛ්‍යාත දියයුතු දාන වස්තුව ලබන ලද්දේය යි සුලඝාව කෙරෙහි හටගත් ස්නෙහය කරණකොටගෙන මරණ කාලයෙහි සිත කිලිටුවූයේද, එහෙයින් හීනාත්මයෙහි උපදින්නේ පර්වතයෙන් ගැවසී ගත්තාවූ තැනක හටගත් ගන සෙවන ඇති මහත් නුගරුකක රුක්දෙවියෙක්ව උපන්නේය.

හෙතෙම වනාහි ඉදින් ප්‍රථම වයසෙහි කුලවංශය ආරක්ෂා කිරීමෙහි උත්සාහ කෙළේ නම් ඒ නුවරම සිටුවරුන් අතුරෙන් ශ්‍රේෂ්ඨයෙක් වෙයි. මධ්‍යම වයසෙහි උත්සාහ කෙළේ නම් මධ්‍යම සිටුතෙනෙක් වෙයි. පශ්චිම වයසෙහිදී වීර්‍යාකළානම් පශ්චිම සිටුකෙනෙක් වෙයි. ඉදින් වනාහි පළමු වයසෙහිදී ශාසනයෙහි පැවිදිවූයේ නම් රහත් වෙයි. මධ්‍යම වයස්හි පැවිදි වූයේ නම් සකෘදගාමී හෝ අනාගාමී හෝ වෙයි. පශ්චිම වයසෙහි පැවිදි වූයේ නම් සෝවාන් වෙයි. (මෙසේ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙන් යුක්තව මහාධන සිටුවරයෙකුට පුත්‍රයෙක්ව උපන්නේවී නමුදු කිසි ශිල්ප ශාස්ත්‍රයක් නොයිමගෙන) පාපමිත්‍ර සෙවනය කිරීම හෙතුකොටගෙන ස්ත්‍රී ධූර්ත සුරාධූර්තව හෙවත් සල්ලාල බෙබද්දෙක්ව කායවාඞ් මනොදුශ්චරිතයන්හි ඇලී ශ්‍රමණ බ්‍රාහ්මණාදි උතුමන් කෙරෙහි ගෞරවාදර රහිතවැ පිළි පෙළින් සියලු සැපතින් පිරිහී මහත් විපතට පැමිණියේයයි කියති.

Non-commercial distribution

ඊට පසු කලෙක ඒ රුක්දෙවියා උයනට ගිය සුලසා නම් වරහන දූක හටගත් කාමරාග ඇතිව අදුරක් මවා ඇ එහි තම විමනට ගෙනගොස් සත් දවසක් මුළුල්ලෙහි ඇ සමග සංවාසය කළේය. ඇට තමන් ගේ තොරතුරුද කීයේය. ඒ සුලසාව ගේ මවු තොමෝ ඇ නොදක්නී හඬමින් ඔබිමොබ ඇවිදියි. මහ ජනයා ඇ දූක කියන්නේ ''ආයුෂ්මතුන් මහමුගලන් තෙරුන්වහන්සේ මහත් ඍද්ධි හා මහත් ආනුභාව ඇත්තාහ, ඇගේ ගතිය දන්නා සේක, උන්වහන්සේ වෙත පැමිණ විචාරව''යි කීයේය. ආයුෂ්මතුනි! යහපතැයි කියා ඇ තෙරුන් වහන්සේ වෙත එළඹ ඒ කාරණය විතාළේය. තෙරුන් වහන්සේ ''මෙයින් සත්වෙනි දිනයෙහි වෙළුවන මහාවිහාරයෙහිදී භාග්‍යවතුන් වහන්සේ ධම් දෙශනා කරවදරන කල්හි පිරිස් කෙළවරදී දක්නෙහි''යයි වදළ සේක. ඉක්බිති සුලසා තොමෝ කියන්නී පින්වත් දෙවිය නුඹ ගේ භවනයෙහි වසන්නාවූ මට අදට සත්වෙනි දවසවිය. මෙය යුතුනොවෙයි මාගේ මව්තොමෝ මා නොදක්නී විලාපයට හා ශොකයටත් පත්වන්නීය. ''දෙවියෙනි! මා එහිම පමුණුවන් නෙහි නම් මැනවැ''යි ඒ දිව්‍ය පුත්‍රයාට කීවාය.

ඒ දිව්‍ය පුත්‍රතෙම ඇ ගෙනගොස් වෙළුවනාරාමයෙහි භාග්‍ය වතුන් වහන්සේ ධම්දෙශනා කරන කල්හි පිරිස් කෙළවර නවතා තමා නොපෙනෙන අයුරින් යුක්තව සිටියේය. එකල්හි මහජනයා සුලසාව දූක මෙසේ කීයේය:– ''නැගෙනි සුලසා වෙනි! නී මෙපමණ දවසක් කොතන්හි ගියාද, නිගේ මව් නී නොදක්නී විලාපයට හා ශොක කිරීමට පැමිණියා උමතුවට පත් වූවාක් මෙන්විය''යි කීයේය. ඕතොමෝ එපවත් මහජනයාට කීවේය. මහජනයා විසින්ද ''එසේ පව් රැස්කළාවූ කුසල් නො කළාවූ ඒ පුරුෂතෙම කෙසේ නම් දිව්‍යොත්පත්තිය ලැබුවේ ද''යි විතාළ කල්හි සුලසාව කියන්නී ''මා විසින් දෙවනලද මොදකයන් හා පැන් ආයුෂ්මතුන් මහමුගලන් තෙරුන්වහන්සේට දී ඒ කුශලකර්මය කරණකොටගෙන දිව්‍යොත්පත්තිය ලැබීය''යි කීවේය. මහජනයා එපවත් අසා ආශ්චර්‍යාද්භූත සිත් ඇතිවිය. රහතන් වහන්සේ වනාහි ලෝවැස්සාට උතුම් පින්කෙත් වැනිය. යම්බඳු රහතන් විෂයෙහි ස්වල්පවූද කරනලද සත්කාරය සත්ව යන්ට දිව්‍යොත්පත්තිය ගෙනදේයයි කියා උදරවූ ප්‍රීති සෞම නස්‍යය මහජනයා ප්‍රකාශ කළේය. භික්ෂූන්වහන්සේ ඒ

Non-commercial distribution

කාරණය භාග්‍යවතුන්වහන්සේට සැලකළාහුය: එහෙයින් භාග්‍යවත් තථාගතයන් වහන්සේ මේ 'අර්ත්ථොත්පත්තිය නිමිත්තකොටගෙන මේ ගාථාවන් වදළසේක.

1. **බෙත්තූපමා අරහන්තෝ දයකා කස්සකූපමා,**
   බීජූපමං දෙය්‍ය ධම්මං එත්තෝ නිබ්බත්තතෙ ඵලං.

2. **එතං බීජං කසිඛෙත්තං-පෙතානං දයකස්සව,**
   තං පෙතා පරිභුඤ්ජන්ති-දතා පුඤ්ඤෙන වඩ්ඪති.

3. **ඉධෙව කුසලං කත්ථා-පෙතෙව පටිපූජයං,**
   සග්ගංච කපතිමඨානං-කම්මං කත්ථාන භද්දක'න්ති.

1. අරහන්තෝ, ක්ෂීණාශ්‍රවවූ රහතන් වහන්සේ; බෙත්තූපමං, (මනාව සකස් කළ) කේෂත්‍ර සදසයෝය; දයකා, (චීවරාදී ප්‍රත්‍යය) දයකයෝ; කස්සකූපමා, ගොවියන් සමානයෝය; දෙය්‍යධම්මං, දෙයධර්ම සංඛ්‍යාත දියයුතු දන වස්තුව; බීජූපමං, බීජුවට වැනිය; එත්තෝ, මේ හෙතුවෙන්; (හෙවත් මේ දයක ප්‍රතිග්‍රහක දෙයධර්ම පරිත්‍යාග යන කරුණුතුණ සම්පූර්ණවීමෙන්) ඵලං, (උදරතර දන) විපාකය; නිබ්බත්තතෙ, උපදියි. නොහොත් චිරතර ප්‍රබන්ධ වශයෙන් පවතියි.

මෙහි භාවය නම්:- රහතන් සතන් නමැති යහපත් කෙතෙහි දයක නමැති දක්ෂ ගොවියා විසින් දන වස්තු නමැති බීජුවට වැපිරීමෙන් මහත් විපාක ලබන බව මෙයින් දක්වනලදී. තවද, අර්ථකථානුසාරයෙන් විස්තර මෙසේ දතයුතු:-

බහණ ලද වපුරණ ලද බීජය පාලනය කෙරෙයි මහත්ඵල භාව කරණයෙ (බොහෝ අස්වැන්න ගෙනදීමෙන්) රකියි යන අත්ර්ථයෙන් සාලිබීජාදීන් විරුහණස්ථානය කෙතයයි කියන ලදි රාගවෙෂාදි කේලශයන්ගේ හා සංසාර වෘත්තයාගේ දුවිත් සමූල ඝාතනයෙන් නැසූ හෙයින්ද එසේ නැසූ හෙයින්ම චීවරාදි ප්‍රත්‍යයන් පිළිගැනීමට සුදුසු හෙයින්ද, පාපකරණයෙහි රහසක් නැති බැවින්ද අර්හත්යයි කියනු ලැබේ. යම් සේ තෘණාදි දෙෂ විරහිතවූ මොනාවට සකස්කළ කෙත බීජූ වපුළකල්හි සුදුසු කාල යෙහි ජලදනාදි ගොවිකමින් යුක්තවූයේ ගොවියාහට මහත් ප්‍රයොජන (බොහෝ අස්වැන්න) දෙන්නේ වේද, එසේම ලොභ වෙෂාදි කේලශ රහිතවූ යහපත්ලෙස සකස්කරනලද රහතුන් ගේ

Non-commercial distribution

සිත දන වස්තු නමැති බීජ වපුළකල්හි යොග්‍යකාලාදි ප්‍රත්‍යයාන්තර සහිතවූයේ දයකයාහට මහත් විපාක ආනිසංස දෙන්නේය; එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ''ඛෙතතුපමා අරහන්තො'' යනු වදළසේක. මේ උත්කෘෂ්ට නිර්දෙශයයි, ඒ රහත් කෙතට ශෛක්ෂාදි පුද්ගලයන්ද ඇතුළත් නොවන හෙයිනි, දයකයන්ගේ දනවස්තු පරිත්‍යාගය සමග තම සන්තානයෙහි ඒ වස්තුව කෙරෙහි පැවැති ලොභාදි අකුසල් පහ කරන බැවින් සිදින බැවින් දයකයෝ තම සිත මසුරු මලාදියෙන් රකින්නෝ වෙති. යම්සේ ගොවිතෙම ශාලික්ෂෙත්‍රාදිය සීසෑම.ආදි කෘෂිකර්මයෙහි සුදුසු කාලයෙහි වැස්ස ලැබීම, ජල දනය, වැඩි ජලය පහකිරීම, ගවමහිෂාදීන්ගෙන් රැකීම යනාදි කෘත්‍යයන්හි අප්‍රමාදවූයේ නම් උදරවූ විපුලවූද සස්‍යඵල ලබා ගනීද, එසේම දන දයක තෙමේ ද රහතන් විෂයෙහි දනවස්තු පරිත්‍යාග කිරීමෙන් හා පාරිචය්‍යාවතෙහිද අප්‍රමාදවූයෙ උදරවූ විපුලවූද දන ඵල ලබන්නේය. යම්හෙයකින් දන චෙතනා වෙන් සකස්කළ දන වස්තුව බීජවට සමානයයි වදරන ලද්දේද ඒ දෙයධර්මොපදෙශයෙන් දනවස්තු විෂයෙහි පවත්නා පරිත්‍යාග චෙතනාවෙන්ම බීජභාවය දතයුතු. ඒ දන චෙතනාව වනාහි ප්‍රතිසන්ධි ආදි ප්‍රභෙදවූ ඒ ඇසුරුකොට ඇති අරමුණු විශෙෂය හා ඵලයද උපද වන්නීය. දන වස්තුව නූපද වන්නී යයි දතයුතු.

2. බීජං, කියන ලද පරිදි බීජයද; ක,සී කෘෂිකර්මයද; ඛෙත්තං, යථොක්ත කෙතද යන; එතං, මෙකී කරුණු තුන: පෙතානං, ප්‍රෙතයන් හටද; දයකස්සව, දයකයාහටද; (උපකාර පිණිස පවතිත්) තං, ඒ දන විපාකය; පෙතා, ප්‍රෙතයෝ; පරි භුඤ්ජන්ති, විඳිත්; දතා, දයකතෙමේ; පුඤ්ඤෙන, පුණ්‍ය ඵලයෙන්; වඩ්ඪති, මනාව වැඩේ.

විස්තරය:- මේ කියන ලද පරිදි බීජවට හෙවත් දන වස්තු නැමති බීජයද දෙයධර්ම පරිත්‍යාගය හා පාරිචය්‍යාවවූ වැපිරීම ප්‍රයොග සංඛ්‍යාත කෘෂිකර්මයද යථොක්ත ක්ෂෙත්‍රය හෙවත් රහතන් නමැති කෙතද යන මෙකී කරුණු තුන ප්‍රෙතයන්ට හා දයකයාහටත් උපකාර පිණිස පවතිත්, ඉදින් දයකයා ප්‍රෙතයන් උදෙසා දන්දේ නම් එහි විපාක ප්‍රෙතයන්ට හා දයකයා හටද ලැබේ. ප්‍රෙතයන් නොඋදෙසා දේ නම් ඒ කුශලය දය කයාහටම අයිති වේ. දයකයා විසින් ප්‍රෙතයන් උදෙසා දන් දුන්කල්හි

Non-commercial distribution

යටකියනලද යහපත් කුඹුරය යහපත් ගොවිකම යහපත් බීජය යන ත්‍රිවිධ සම්පත් සම්පූර්ණවූ ඒ කුශල අනුමොදන්කරවීමෙන් ඒ දන විපාකයවූ මහත් සම්පත් ප්‍රෙතයෝ ලබත්, දයකතෙම වනාහි ස්වකීය දනමය පුණ්‍යකර්මය නිමිත්ත කොට දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි භොගසම්පත් ආදිවූ පුණ්‍ය විපාකයෙන් මනාව වැඩෙන්නේය.

3. කුසලංකත්වා, (ප්‍රෙතයන් උදෙසීම වශයෙන් දනමය) පුණ්‍යකර්මකොට; ඉධ එව, මේ ආත්මභාවයෙහිදීම; පෙතෙව පටිපූජයං, ප්‍රෙතයන්ද (පුණ්‍ය දනයෙන්) පුදන්නේ (තෙමේත් ප්‍රියමනාපතාදෘෂ්ට ධාර්මිකවූ දනානිසංසයන්ට භාගිවන්නේ;) භද්දකං, යහපත්වූ; කම්මං කත්වාන, කුශල කර්මකොට; සග්ගංච යානං, දෙවුලොවට; කමති, (ඉපදීම වශයෙන්) පැමිණේ.

විස්තරය:– නිරවද්‍ය සුඛවිපාකාත්මියෙන් කුසල්වූ දනමය පුණ්‍යකර්ම ප්‍රෙතයන් උදෙසා දීම ඔවුන්ට කරනලද පූජාව නම් වෙයි. එහෙයින් ''අම්හාකංච කතා පූජා'' යනාදිය කියයි. ප්‍රෙතයන් උදෙසා දන්දීමෙන් පූජාකොට ඔවුන් විඳිනු ලබන දුකින් මුදලීම ඔවුන්ට කරන සත්කාරයයි, පින්දීම වශයෙන් යහපත් කුශල ක්‍රියාකොට දයකයා ඉහාත්මභාවයෙහිදීම ලොකයාහට ප්‍රියමනාප කෙනෙක්ද වෙයි. නුවනැත්තන් විසින් ඵළඹිය යුත්තේද, විශ්වාස කටයුත්තේද සැලකිය යුත්තේද වෙයි. ගරුකටයුත්තේ ප්‍රසංශා කටයුත්තේද වර්ණනා කටයුත්තේද වෙයි, යනමේ ආදි දෘෂ්ටධාර්මිකවූ දනානිසංසයන්ට පැමිණෙයි, පරලොවදී දිව්‍යමයවූ ආයුසම්පත් ආදි කාරණා දශයකින් යුක්තව සුෂ්ඨුඅග්‍ර හෙයින් ස්වර්ගයයි ලද නම් ඇති පින්කළවුන් උපදනා තැන්වූ දෙව්ලොව උපදී. මෙහි ''කුසලං කත්වා''යි පළමුවෙන් වදරා නැවත ''කම්මං කත්වාන භද්දකං''යි කීම දෙය ධර්ම පරිත්‍යාගයමෙන් ප්‍රාප්තිදන වශයෙන් දනධර්ම පරිත්‍යාග යද දනමය කුශල කර්මයමයයි දක්වනු සඳහායයි දතයුතු.

මෙහි ''පෙතා'' යන්නෙන් අර්හත්හු අදහස්කරනලදුයි සමහරු කියත්, ඒ ඔවුන්ගේ මතිමාත්‍රයකි. මක්නිසාදයත්:– පෙත කියා නමක් ක්ෂීණාශ්‍රවයන්ට ආකැනක් නැති බැවිනි. බීජාදී භාවයාගේ හා දයකයාගේ මෙන් ඒ රහත්තුන් නොයෙ–

Non-commercial distribution

දෙන බැවින් හා ප්‍රෙතයොනික සත්වයන් යෙදෙන බැවිනුත්ය. ධර්ම දේශනාවගේ කෙළවර දිව්‍යපුත්‍රයා හා සුලසාවත් ආදිකොට සුවාසූ දහසක් සත්වයන්ට ධර්මාභිසමය වූයේය.

(දෙමව්පියන් විසින් ස්වකීය දරුවන්ට නිසිකල්හි ශිල්ප ශාස්ත්‍රාද්ග්‍රහණය නොකරවීමෙන් හා පාපමිත්‍රාශ්‍රයට අවකාශ දීමෙනුත් සිදුවන බලවත් විපතට මහොපදේශක්වූ මේ කථාව කියවා බලා සිත්හි ධාරණයකරගෙන ස්වකීය දරුවන් ශිල්ප ශාස්ත්‍රාද්ග්‍රහණාදියෙන් නිසිමග භික්මවාලීමට උත්සාහවත් වියයුතු.)

මේ ප්‍රෙතවස්තු දේශනාවෙහි පළමුවූ උරගවර්ගයෙහි පළමුවූ ක්ෂෙත්‍රෝපම ප්‍රෙතවස්තු සිංහල වර්ණනාව කියා නිමවනලදී.

---

1. 2 වෙනි කථාව.

මේ ප්‍රෙතවස්තු දේශනාවෙහි පළමුවන උරගවර්ගයෙහි දෙවන සූකරමුඛ ප්‍රෙතවස්තුව නම් කවරහ යත්:- එහි පිළිවෙළ කථාව මෙසේය:-

ලොක ශිවඞ්කර භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ ලෙහෙනුන්ට වැටුප්තබා අභයදුන් හෙයින් කලන්දකනිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩවසන කල්හි මේ ප්‍රෙතවස්තුව එක්තරා සූකරමුඛ ප්‍රෙතයෙකු අරබයා වදළ සේක.

යටගිය දවස කාශ්‍යපනම් බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පැවිදිවූ එක් භික්ෂු නමක් කායවරයෙන් සංයම ඇත්තේවිය. වාක්වාරයෙන් සංවර නැත්තේවිය. භික්ෂූන්ට ආක්‍රෝෂ කෙරෙයි පරිභව කෙරෙයි. ඒ භික්ෂුව පසුව කළුරිය කොට නිරයෙහි උපන්නේ එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි ඒ නරකයෙහි පැසී එයින් සැව මේ බුඩොත්පාද කාලයෙහි රජගහනුවර සමීපයෙහිවූ ගිජ්ඣකූළුපව්ව අසල ඒ කර්මයාගේම හෙවත් අසංවර වාග්වාරික අකුශල කර්මයාගේම විපාකාවශිෂ්ට වශයෙන් බඩසා දුකින් හා පිපාසයෙන් මඩනා ලද්දවූ ප්‍රෙතයෙක්ව උපනි. ඒ ප්‍රෙත සත්වයාගේ ශරීරය ස්වල්පවල්පවිය, මුව හූරුමුව වැනිවිය.

Non-commercial distribution

එකල්හි ආයුෂ්මත් නාරද තෙරුන් වහන්සේ ගිජ්ඣකූටට පවිත යෙහි වැඩවසනසේක් එක් දිනක් උදෑසන්හිම සිරුර පිළිදහුම් කොට පා සිවුරු රැගෙන රජගහනුවරට පිඬු පිණිස වඩිමින් අතර මගදී එකී ප්‍රෙතයා දැක ඔහු විසින් කරනලද කර්මය විචාරමින් මේ ගාථාව කීසේක.

4. කායෝ තෙ සබ්බසොවණ්ණා-සබ්බා ඔභාසතෙ දිසා,
මුඛන්තෙ සූකරස්සෙව-කිං කම්ම මකරී පුරේ'ති

4. තෙ, සාගේ; කායෝ, ශරීරයතෙම; සබ්බසොවණ්ණා, සියල්ල රන්වන් විය; සබ්බා දිසා, සියලු දිශාවන්; ඔභාසතෙ, (ශරීර ප්‍රභායෙන්) බබුළුවයි; තෙ මුඛං, තාගේ මුඛය වනාහි; සූකරස්ස ඉව, සූකර මුඛය බඳුය; පුරා, පෙර ජාතියෙහි; කිං කම්මං, කෙබඳු කර්මයක්; අකරී, කෙළේද.

එම්බල ප්‍රෙතය, තාගේ ශරීරය සියල්ල රන් හා සමානය, ශරීරාලොකයෙන් සියලුම දිශාවන් භාත්පසින් බබුළුවයි එසේද වුවත් තාගේ මුඛය හූරුමුව සමානය, මෙසේවීමට තෝ පෙර අතීත ජාතියෙහිදී කෙබඳුවූ කර්මයක් කෙළෙහිදැයි විචාළෝය. මෙසේ තෙරුන්වහන්සේ විසින් ඒ ප්‍රෙතයා යටගිය දවස කළ කර්මය අසන ලදුව ගාථාවකින් විසඳන්නේ:-

5. කායෙන සඤ්ඤතො ආසිං වාචායාසිං අසඤ්ඤතො,
තෙන මෙ තාදිසො වණ්ණා-යථා පස්සසි නාරද'ති

5. කායෙන, කායවාරිකවූ සංවරයෙන්; සඤ්ඤතො ආසිං, (මම) සංවර ඇත්තේවීමි; වාචාය, වාග්වාරයෙන්; අසඤ්ඤතො ආසිං, අසංවරයෙන් යුක්තවීමි; තෙන, එයි (සංවර අසංවර දෙකි) න්; නාරද, පින්වත් නාරදයන් වහන්ස; යථාපස්සසි, යම්සේ (නුඹ වහන්සේ ප්‍රත්‍යක්ෂවශයෙන්) දුටුවාහුද; තාදිසො, එබඳුවූ; මෙ මාගේ; වණ්ණා, ශරීර වර්ණය වීය.

ස්වාමීනි නාරදයන්වහන්ස, මම පෙර කායවාරය පිළිබඳ හික්මීමෙන් යුක්තවීමි වාක්වාරය සම්බන්ධි අසංවරයෙන් සමන්විතවීමි, ඒ කාරණයෙන් හෙවත් හික්මීම් නොහික්මීම් යන ඒ දෙකින් යුක්තවූ මාගේ සිවිය හා ශරීර සන්ධානය යම්සේ නුඹ වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවාහුද එබඳු වීයයි නොහොත් කයින් මනුෂ්‍යසටහන් ඇතිව සුවඥවඥවීම් මුඛයෙන් සූකර

Non-commercial distribution

සදෘශයෙක් වීමියි කීයේය. මෙසේ තෙරුන්වන්සේ විචාරණු ලැබූ ප්‍රෙත තෙම ඒ කරුණ විසඳූ ඔහුම නිමිත්තකොට තෙරුන් වහන්සේට අවවාද දෙමින් මේ ගාථාව කීය:-

6. කං තාහං නාරද බ්‍රූමි-සාමං දිට්ඨමිදං තයා
මාකාසි මුඛසා පාපං-මා ඛො සූකරමුඛො අහූ'ති

6. නාරද, පින්වත් නාරදයන් වහන්ස; තයා, නුඹවහන්සේ විසින්; සාමං, තෙමේම; ඉදං, මේ (මාගේ ශරීරය); දිට්ඨං, (යම් හෙයකින්) දක්නා ලද්දේද; තං, එහෙයින්; තෙ, නුඹවහන්සේට; අහං, මම; බ්‍රූමි, (අවවාද වශයෙන්) කියමි; මුඛසා, මුඛයෙන් ඉහවත් වාග්වාරයෙන්; පාපං, පාපකර්මය; මා අකාසි, නොකෙරව; සූකරමුඛො, හූරුමුව ඇත්තෙක්; මා ඛො අහු, නොම වෙව.

ස්වාමීනි නාරද තෙරුන් වහන්ස, යම්හෙයකින් ගෙළ පටන් යට කොටස මිනිස් සටහන්වූද මතු හූරු සටහන් වූද මේ මාගේ ශරීරය නුඹවහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ හෙයින්ම දක්නා ලද්දේද එහෙයින් ඔබවහන්සේට මම අවවාද වශයෙන් කියමි, වචනයෙන් මුසාවාදාදි පාපකර්මයකට මාසේ සූකරමුඛ ඇත්තෙක් නොවෙනු මැනවි. ඉදින් වනාහි නුඹවහන්සේ දෙඩ මලුව වචනයෙන් පවි කරන්නාහු නම් ඒකාන්තයෙන් සූකරමුඛ ඇති වන්නාහුය.

ඉක්බිති ආයුෂ්මත් නාරද තෙරුන්වහන්සේ රජගහනුවර පිඬු පිණිස හැසිර බතින් පසු වේලෙහි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩියේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සඬ්ඛ්‍යාත සිව්පිරිස මැද වැඩහුන් තථාගතයන්වහන්සේට එපවත් දැන්වූහ. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ''නාරදය මා විසින් ඒ ප්‍රෙත සත්වතෙම පෙරදීම දක්නා ලද්දේයයි වදරා නොයෙක් අයුරින් ලාමකවූ වාග්දුශ්චරිත සන්නිශ්‍රීතවූ ආදීනවය හා වාක්සුචරිත ප්‍රතිසංයුක්තවූ ආනිසංසයත් වදරමින් ධර්මදේශනා කළසේක. ඒ දෙශනාව එතැන්හි පැමිණි පිරිසට සාත්ථිකවිය.

(අනුන්ට බැණ වැදීම් අපහස කිරීම් ආදි වාග්දුශ්චරිතයෙන් මතු කටුක දුක්විපාක විඳින්ට සිදුවන බව මේ කථාවෙන් දැන ස්ත්‍රී පුරුෂ කාවිසිනුත් කායවාඞ්මනස් යන ත්‍රිවිධවාරයම මනා සේ හික්මවා ගැනීමට තරයේ ඉටාගත යුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනාවෙහි උරගවර්ගයෙහි දෙවන සූකරමුඛ ප්‍රෙතවස්තු සිංහල වර්ණනාව කියා නිමවනලදී.

Non-commercial distribution

1. 3 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනාවෙහි උරගවර්ගයෙහි තෙවන **පූතිමුඛ ප්‍රෙතවස්තුව** නම් කවරහයත්– එහි පිළිවෙළ කථාව මෙසේය:–

සුරාසුරනරභ්‍රමරනිකර නිශෙවිත පාද පඞ්කජාන්විතවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කලන්දකනිවාප නම් වූ වෙළු වනාරාමයෙහි වැඩ වාසයකර වදරනකල්හි මේ ප්‍රෙතවස්තු දෙශනාව අන්‍යතර පූතිමුඛ ප්‍රෙතයෙකු අරභයා දෙශනා කළයේක. අතීත කාලයෙහි කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ සමයෙහි වනාහි උන්වහන්සේගේ ශාසනයෙහි කුලදරුවෝ දෙදෙනෙක් පැවිදිව ශීලාචාර සම්පන්නව සැහැල්ලු පැවතුම් ඇතිව එක්තරා ගමක ආවාසයෙක්හි සාමාග්‍රී වාශයෙන් විසූහ එකල්හි ලාමක අදහස් ඇති පෙශුන්‍ය වචනයෙ (කේලාම් කීමෙ)හි ඇලුනාවූ එක්තරා මහණෙක්තෙම ඒ භික්ෂුදෙනම වසන තැනට පැමිණියේය. තෙරුන්වහන්සේලා දෙනම ඒ ආගන්තුක මහණහු සමග පිළිසඳර කථාකොට විසීමට සෙනසුනක්දී පසුවද ඒ ආගන්තුක භික්ෂුව කැඳවා ගෙන ගමට පිඬු පිණිස වැඩියෝය. ගම්වැසි මනුෂ්‍යයෝ උන්වහන්සේලා දැක ඒ තෙරුන් වහන්සේලා කෙරෙහි ඉතාමත් යටහත් භාවයෙන් (වත් පිළිවෙත්) කොට කැඳ බත් ආදියෙන් පූජාකළෝය. ඒ ආගන්තුක මහණ විහාරයට පැමිණ මෙසේ සිතීය:– ''මේ ගොචර ග්‍රාමය එකාන්තයෙන් යහපත්ය, මනුෂ්‍යයෝද ශ්‍රද්ධාසම්පන්නයෝය, රසවත් ප්‍රණීතවූ පිණ්ඩපාතය දෙති, මේ ආවාසයද සිහිල් සෙවනින් හා ජලයෙන් යුක්තය, මෙහිම සුවසේ වාසයකරන්ට හැකිය. මේ ස්ථවිර භික්ෂූන් දෙනම මෙහිම වාසය කරනකල්හි මට සැප විහරණයක් නොවන්නේය, අතැවැසිව විසීමක් මෙන් වන්නේය, එහෙයින් මම මේ තෙරණුවන් දෙනම ඔවුනොවුන් බිඳුවා යම්සේ උන්වහන්සේලා නැවත මෙහි නොවසන්නාහුද එලෙස කරන්නෙමි'' යි කල්පනා කෙළේය.

ඉක්බිතිව එක්දවසක් මහා ස්ථවිරයන් වහන්සේ අනිත් දෙනමටම අවවාදදී තමන් වහන්සේ වසන තැනට පැමිණියේක. කෙල තොලු මහණා ටික වේලාවක් ඉක්මවා මහතෙරුන්වහන්සේ වෙත එළඹ වැඳ තෙරුන් වහන්සේ විසින් ''ඇවැත්නි නොවැ

Non-commercial distribution

කල්හි කුමක් පිණිස ආයෙහිදැයි''යි අසා වදළසේක් ''එසේය සවාමීනි කියයුතු කිසිවක් ඇත්තේය''යි කීවිට ''ඇවැත්නි කිය ව''යි තෙරුන් විසින් අනුදන්නා ලදුව මෙසේ කීය. සවාමීනි ඔබ වහන්සේගේ මේ යහලු තෙරුන්වහන්සේ අභිමුඛයෙහිදී මිතුරෙකුමෙන් තමා පෙන්වා අනභිමුඛයෙහි සතුරෙකුමෙන් නුගුණ කියාය''යි කීකල්හි ඔහු කුමක් කියාදැයි විචාරණුලද්දේ සවාමීනි අසනු මැනවි. ''මේ මහතෙරුන් වහන්සේ කපටියෙක, කළ වරද සහවා නිදෙස් බව අභවන මායා ඇත්තෙක, නැති ගුණ පෙන්වන කුහකයෙක, මිථ්‍යාජීවයෙන් හෙවත් නොකට යුතුදේ කිරීමෙන් ජීවිකාව කරත්ය''යි නුඹවහන්සේගේ නුගුණ කියාය''යි කීය. (එවිට මහතෙරුන් වහන්සේ කියන්නේ) ''ඇවැත්නි එසේ නොකියව, ඒ භික්ෂුතෙම මෙසේ මා නුගුණ නොකියන්නේය, ගිහිකල්පටන් මාගේ සවභාවය ඔහු දනියි, ඔහු ප්‍රියශීලීය, යහපත් සිල් ඇත්තෙකැයි''යි වදළහ.

''සවාමීනි ඉදින් නුඹවහන්සේ තමන් පිරිසිදු සිත් ඇති බැවින් එසේ සලකන්නාහුය, ඒ තෙරුන් සමග මගේ වෛර යක් නැත. කුමක් හෙයින් මම ඔහු විසින් නොකියන ලද්දක් කියන ලද්දේයයි කියම්ද, එය එසේවේවා! කල්‍යාමකින් තමන් වහන්සේම දැනගන්නාහුය''යි කීය. තෙරුන්වහන්සේද පෘථග් ජන භාව වශයෙන් දෙගඩියා සිත් ඇතිව මෙසේද වන්නේයයි සැක සහිත සිත් ඇතිව මදක් ලිහිල්වූ විශ්වාසය ඇතිවිය. ඒ අඳුන පෙහෙසුන් තෙපලන මහණතෙම පළමුකොට මහ තෙරුන් බිඳ අනිත් තෙරුන්ද යටකියනලද පරිද්දෙන්ම බින් දේය. පසුව ඒ තෙරුන් වහන්සේලා දෙනමම දෙවෙනි දව සෙහි ඔවුනොවුන් කථානොකොට පා සිවුරු රැගෙන ගම පිඬු පිණිස හැසිර පිණ්ඩපාත භොජනය ගෙනැවිත් තමන් වසන තැනම හිඳ වළඳ සාමීචි මාත්‍රයකුදු නොකොට එදින එහිම වැස එළිවූ කල්හි ඔවුනොවුන් නොදන්වාම පහසු තැන්වෙත වැඩියා හුය. කේලාම් කීමෙහි යෙදුන මහණ වනාහි සම්‍යඩවූ මනොරථය ඇතිව පිඬු පිණිස ගමට ඇතුල්වූවා මනුෂ්‍යයෝ දැක ''ස්වාමීනි තෙරවරු දෙනම කොතැන්හි වැඩියාහුද''යි ඇසුවාහුය. එවිට ඒ භික්ෂුව කියන්නේ රැ මුළුල්ලෙහිම ඔවුනොවුන් කලහකොට මාවිසින් ''ඩබර නොකරව්, සමගිවව්, ඩබරය නම් අනත්ථ ඵල වන්නේ වෙයි, මතුභවයෙහි දුක් උපදවන්නේය, අකුශල පක්ෂ

Non-commercial distribution

යෙහි පවත්නේය. පෙරාණිකයෝද කලහය හේතුකොට ගෙන මහත් වැඩදයක දෙයින් පිරිහුණාහුයයි මේ ආදිය කියන ලද්දේ නමුදු මාගේ අවවාද වචන පිළිනොගෙන බැහැර ගියෝ ය''යි කීය. ඉන්පසු ගම්වැසි මනුෂ්‍යයෝ කියන්නාහු ''තෙරුන් වහන්සේලා දෙනම කැමති තැනක වඩිත්වා! නුඹ වහන්සේ වනාහි අපට අනුකම්පා පිණිස මේ ආවාසයෙහිම නොකළකිරී වසනුමැනව''යි යාචිඤ්ඤා කළෝය. ඒ කේලාම් කී මහණ යහප තැයි පිළිගෙන එහිම වසන්නේ කිහිප දවසකට පසු මෙසේ සිතීය. ''මා විසින් සිල්වත්වූ යහපත් ආචාර ධර්ම ඇති භික්ෂූන් වහන්සේලා දෙනම ආවාස ලොභය හේතුකොටගෙන බිඳුවන ලද්දෝය. මා විසින් එකාන්තයෙන් බොහෝවූ ලාමක අකුශල කර්මයක් රැස්කරන ලද්දේ''යයි බලවත් විපිළිසර සිතින් මඩනා ලදුව ශොකවෙගයෙන් ගිලන්ව නොබෝකලකින්ම කළුරිය කොට අවීචිමහනිරයෙහි උපන.

අනික් යහලු තෙර දෙදෙනා වහන්සේ දනව් සැරිසරා වඩ නාහු එක් ආවාසයක දී මුණගැසී ඔවුනොවුන් සතුටුවී ඒ කේලාම් කී මහණ විසින් කියනලද හෙදකර වචන අන්‍යොන්‍යයන්ට සැලකොට ඔහුගේ ඒ කර්ම බොරුබැව් දැන සමගිව පිළිවෙළින් ඒ ආවාසයටම නැවත වැඩියාහුය. මනුෂ්‍යයෝ ස්ථවිර දෙදෙනා වහන්සේ දැක තුටුපහටුව උපන් සොම්නසින් යුක්තව සිව්පසින් උපස්ථාන කළෝය. තෙරුන් වහන්සේලා එහිම වසමින් සප්පාය ආහාර ලාභයෙන් එකහවූ සිතැතිව විදසුන් වඩා නොබෝකලකින්ම අර්හත්වයට පැමිණියාහුය. පෙහෙසුන් කී මහණ එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි නිරයෙහි පැසි මේ බුඩොත්පාද කාලයෙහි රජගහ නුවරට නුදුරු තෙනෙක්හි පූතිමුඛ ප්‍රෙත යෙක්ව උපන. ඔහුගේ ශරීරය ස්වර්ණවර්ණවිය. කටින් වනාහි පණුවෝ නික්මී මුඛය ඔබිමොබ කත් ඔහුගේ මුඛයෙන් දුර වූද අවකාශය පැතිර දුගඳ වහනය වෙයි. එකල්හි ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ ගිජුකුළු පව්වෙන් බසිමින් ඒ ප්‍රෙත යා දැක ඔහු විසින් කරනලද කර්මය විචාරමින් මේ ගාථාව වදළ සේක.

7. දිබ්බං සුභං ධාරෙසි වණ්ණධාතුං
වෙහායසං තිට්ඨසි අන්තලික්ඛෙ,
මුඛඤ්ච තෙ කිමයො පූතිගන්ධං
බාදන්ති කිං කම්මමකාසි පුබ්බෙ'ති.

Non-commercial distribution

7. දිබ්බං, දෙවියන් ගේ කයට බඳුවූ; සුභං, යහපත්වූ; වණ්ණ ධාතුං, ඡවිවණ්ණය; ධාරෙසි, දරන්නෙහි; වෙහාසයං, වෙහාසයයි නම් කරනලද; අන්තලික්ඛෙ, අහසෙහි; තිට්ඨසි, සිටින්නෙහිය; (එසේදවුවත්) පූතිගන්ධං, කුණුගඳවූ; තෙ මුඛංච, තාගේ මුඛය; කිමයො, පණුවෝ; ඛාදන්ති, (සිදුරුකොට) කත්; පුබ්බෙ, පූර්‍ව ජාතියෙහි; කිං කම්මං, කිනම් කර්‍මයක්; අකාසි, (තෝ) කෙළෙහිද.

එම්බල ප්‍රෙතය තෝ දෙවියන් ගේ ශරීරය වැනිවූ යහපත් ඡවිවණ්ණය දරන්නෙහිය වෙහාසයයි සංඥාකරන ලද අහසෙහි සිටි නෙහිය, එසේද වුවත් තාගේ ඉතා දුගඳවූ මුව පණුවෝ කති, පූර්‍වකාලයෙහි තෝ මෙබඳු ආත්මභාවයක් ලැබීමට කරුණුවූ කෙබඳු කර්‍මයක් කෙළෙහිදැයි අසා වදළසේක. මෙසේ තෙරුන් වහන්සේ විසින් තමාකළ කර්‍මය විචාරණ ලද්දාවූ ඒ ප්‍රෙත සත්ව තෙම එපවත් විසඳමින් ගාථාවකින් කියයි.

8. සමණො අහං පාපෝ දුට්ඨවාචො
තපස්සි රූපො මුඛසා අසඤ්ඤතො,
ලද්ධාව මෙ තපසා වණ්ණධාතු
මුඛඤ්ච මෙ පෙසුණියෙන පූති'ති.

8. අහං, මම; තපස්සිරූපො, ශ්‍රමණ ප්‍රතිරූපවූ; මුඛසා අසඤ්ඤතො, වාග්වාරික අසංවරයෙන් යුක්තවූ; දුට්ඨවාචො, දුට්ඨවචන ඇති හෙවත් මුසාවාද පෙශුන්‍යාදි වාග්දුශ්චරිත යෙන් යුක්තවූ; පාපොසමණො, පවිටු මහණෙක්වීමි; තාපසා, බ්‍රහ්මචර්‍යා ගුණානුභාවයෙන්; මෙ, මාවිසින්; වණ්ණධාතු, ශරීර වර්‍ණය; ලඩාව, ලබන ලද්දීය; පෙසුණියෙන, කේලාම් කී අකුශල යෙන්; මෙ, මාගෙ; මුඛංච, මුඛය; පූති, කුණුවිය.

ස්වාමීනි, නාරද තෙරුන් වහන්ස, මම පෙර දුට්ඨවචන හෙවත් මෙරමා ගුණ නසන පරුෂවචන ඇතිව බොරුකීම් කේලාම්කීම් ආදි වාග්දුශ්චරිතයෙහි ඇලුනාවූ නොහික්මුන වාග් චාරයෙන් යුක්තවූ ශ්‍රමණ වෙශධාරී පවිටු මහණෙක් වීමි, බ්‍රහ්ම චර්‍යා කුශලානුභාවයෙන් මා විසින් ශරීරවර්‍ණය ලබනලදී. කේලාම් කී අකුශල කර්‍මවිපාකයෙන් මාගේ මුඛය දුර්ගන්ධ විය. මෙසේ ඒ ප්‍රෙතයා තමන් විසින් කළ කර්‍මය ප්‍රකාශකොට පසුව තෙරුන් වහන්සේට අවවාද දෙමින් අවසාන ගාථාව කිය,

Non-commercial distribution

9. **කයිදං තයා නාරද සාමං දිට්ඨං**
අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං,
මා පෙසුණං මාව මුසා අභාණි
යක්ඛොහි තුවං හොහිසි කාම කාමී'ති.

9. නාරද, භවත් නාරදයන් වහන්ස; තං ඉදං, ඒ මේ මාගේ රූපය; තයා, නුඹ වහන්සේ විසින්; සාමං, තමාම; දිට්ඨං, දක්නා ලද්දේය, අනුකම්පකා, අනුකම්පාශීලිවූ; යෙ, යම්බඳුවූ; කුසලා, පරහිත (ප්‍රතිපත්තියෙහි) දක්ෂවූ බුඩාදි මහොත්තමයෝ; වදෙය්‍යුං, (යමක්) කීහුද (එයම කියමි); පෙසුණං, කේලාම්, මා අභාණි, නොකියව; මුසා, බොරුද; මා අභාණි, නොකියව; තුවං, නුඹ; කාම කාමී, කැමති කැමති සම්පත් ඇති නොහොත් කැමති පරිදි ඉන්ද්‍රියන් හැසිරවීමෙන් අභිරමණ ශීලිවූ; යක්ඛොහොහිසි, දෙවියෙක් (හෝ දෙවියන් අතුරෙන් එක්තරා කෙනෙක් හෝ) වන්නෙහිය.

පින්වත් නාරදයන් වහන්ස, නුඹ වහන්සේ විසින් ඒ මේ මාගේ රූපය තමන්ම දක්නාලදී. අනුකම්පාශීලිවූ පරහිත ප්‍රතිපත්තියෙහි දක්ෂවූ බුද්ධාදි මහොත්තමයෝ යම්බඳු අවවාදයක් කීහුද එය මම කීහුද එය මම කියමි, පෙහෙසුන් බස නොකියනු මැනවි, බොරු නොකියනු මැනවි, ඉදින් නුඹ වහන්සේ මුසාවාද පිසුණාවාචයන් හැරපියා වාක් සංවරයෙන් යුක්තවන්නාහු නම් මහත් දිව්‍යසම්පත් ලබා එහි සැප පරිදි ඉඳුරන් හැසිරවීමෙන් අභිරමණශීලිවූ යක්ෂයෙක් හෝ දෙවියෙක් හෝ දෙවියන් අතුරෙන් එක්තරා කෙනෙකු හෝ වන්නාහුයයි කීය. ස්ථවිරයන් වහන්සේ එපවත් අසා එතනින් පිටත්ව රජගහනුවරට වැඩමවා පිඬු පිණිස හැසිර බත්කිස නිමවා පසුබත් කාලයෙහි පිණ්ඩපාත ගමනින් පෙරලා වැඩිසේක් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේට ඒ කාරණය සැලකළෝය. ශාස්තෘවූ තථාගතයන් වහන්සේ එය අර්ත්ථොත්පත්තිකොට ධර්මදෙශනා කළසේක. ඒ දෙශනා තොමෝ එතැනට පැමිණි පිරිසට සාර්ත්ථකවිය.

(බොරු කේලාම් කියා සමගිවූවන් බිඳුවීමෙන් මතු තමන්ට සිදුවන මහත් විපත මෙයින් දැන එබඳු පවිකම් වලින් නිතර වැලකී විසිය යුතු.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි පළමුවන උරගවර්ගයෙහි තෙවන පූතිමූඛ ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

Non-commercial distribution

1. 4 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරගවර්ගයෙහි සිව්වන **පිට්ඨයිතලිකා ප්‍රෙතවස්තුව** කෙසේදයත් – හේ මෙසේ දතයුතු:–

සර්ව්ජගදනන්ද කරවූ විපදෙත්තම බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ දෙවුරම් වෙහෙර වැඩ වාසයකර වදරණසේක් ගෘහපතිවූ අනේපිඬු සිටාණන් ගේ දනයක් අරභයා මේ ධර්මදෙශනාව වදළසේක.

අනේපිඬු මහසිටු නම්වූ ගෘහපතියාගේ මිනිපිරියක්වූ ළදරු යක් හට කිරිමව් තොමෝ පිටියෙන් තැනූරුවක් ''මේ නුඹෙ දුහිතෘය, මේ රැගෙන ක්‍රීඩාකරව'' යි කියා දුන්නීය. ඈ ඒ පිටි රූපය කෙරෙහි දුවණිය යන සංඥාව ඉපදවිය. පසුව එක් අවසක් ඈ ඒ රූපය හැරගෙන ක්‍රීඩාකරන කල්හි ප්‍රමාදයකින් (බිම) වැටී බිඳුනේය. ඒ හේතුවෙන් දරිකාතොමෝ ''මාගේ දුව මළාය''යි හැඬුවේය. හඬන්නාවූ ළදරිය කිසිම ගෘහවාසි ජනයෙකු විසින් සනසාලිය නොහැකිවිය. එකල්හි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ අනේපිඬු ගහැවිහුගේ ගෘහයෙහි පණවන ලද බුද්ධාසනයෙහි වැඩ සිටියෝය. මහසිටාණෝද භාග්‍යවත් බුදුරජුන් සමීපයෙහි සිටියෝයි. කිරිමව ඒ ළදරියගෙන සිටාණන් සමීපයට ගියේය. සිටාණෝ ඒ ළදරිය දැක කුමක් නිසා දරුවා හඬාදැයි ඇසුහ. කිරිමව එපවත් සිටාණන්ට දන්වීය. සිටාණෝ ඒ ළදරිය ඇකයෙහි හිඳුවාගෙන කියනුවෝ ''නුඹේ දූ සඳහා දනක් දෙන්නෙමැ''යි හහවා ශාස්තෘන් වහන්සේට සැලකළාහුය. ''ස්වාමීනි මාගේ මිනිපිරියගේ දියණියවූ පිට්ඨයිතලිකා (පිටිරු)ව උදෙසා දන්දෙනු කැමැත්තෙමි, ඒ හෙයින් මාගේ ආරාධනාව හෙට දවසට පන්සියක් භික්ෂූන් සමග ඉවසා වදරණු මැනවැ''යි ආරාධනා කළෝය. භාග්‍යවතුන් වහන්සේ තූෂ්ණිම්භාවයෙන් ඉවසා වදළසේක. පසුවද භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පන්සියක් භික්ෂූන් සමග සිටාණන්ගේ ගෙදරට වැඩමවා බත්කිසකොට නිමවා අනුමෝදනා කරන සේක් මේ ගාථාවන් වදළසේක:–

10. යං කිඤ්චා රම්මණං කත්වා–දජ්ජා දනං අමච්ඡරී,
පුබ්බපෙතෙව ආරබ්භ–අථවා වත්ථුවෙදකා,

Non-commercial distribution

11. චත්තාරොව මහාරාජෙ-ලොකපාලෙ යසස්සිනො,
කුවෙරං ධතරට්ඨං ච-විරූපක්ඛං විරුළ්හකං.

12. තෙවෙව පූජිතා හොන්ති-දයකාව අනිප්ඵලා,
නහිරුණ්ණං ච සොකොවා යාචඤ්ඤා පරිදෙවනා
නතං පෙතස්ස අත්ථාය-එවං-ඨිට්ඨන්ති ඤාතයො.

13. අයඤ්චඛො දක්ඛිණා දින්නා-සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස-ඨානසො උපකප්පති'ති.

10. අමච්ඡරී, නොමසුරු තැනැත්තේ; යංකිඤ්චි ආරම්මණං කත්වා, (මඩගලාදීන් අතුරෙන්) යම්කිසි අරමුණක් කොට; පුබ්බපෙතෙව, පූර්‍වප්‍රෙතයන්ද (හෙවත්) පෙර කළුරිය කළවුන්ද; වත්ථුදෙවතා, ගෘහවස්තු ආදීන්හි අධිගෘහීත දෙවතාවන්ද; අථවා, නොහොත් මෙයින් අන්‍ය වූ දිව්‍ය මනුෂ්‍යාදි යම්කිසිවෙකුත්; ආරබ්භ, අරභයා; දනං, දනය; දජ්ජා, දෙන්නේය.

තමාගේ සම්පත්තියෙන් මෙරමා හා සාධාරණ භාවය නොඉවසීම ලක්ෂණ කොට ඇති මසුරුකම් නොමැත්තෙන් නොමසුරුවූ මාත්සර්‍ය්‍ය ලොභාදි සිත හට ගන්නා මල දුරුකොට දන ශීලී පුද්ගල තෙම මඩගලාදි අවස්ථාවන් අතුරෙන් යම්කිසි කරුණක් අරමුණු කොට පෙර කළුරිය කළ මව්පියාදීන් උදෙසා හෝ ගෘහ වස්තු ආදීන්හි අධිගෘහීත දෙවතාවන් අරභයා හෝ මෙයින් අන්‍යවූ ද දිව්‍ය මනුෂ්‍යාදී යම් කිසිවෙකු උදෙසා හෝ දනය දෙන්නේය.

11. කුවෙරං, වෛශ්‍රවණය; ධතරට්ඨංච, ධෘතරාෂ්ට්‍රය; විරූපක්ඛං, විරූපාක්ෂය; විරූළ්හකං, විරූඪය; (යන) යසස්සිනො, යසස් ඇත්තාවූ, ලොකපාලෙ, ලොකපාලක වූ; චත්තාරොව මහාරාජෙ, සිව්වරන් මහරජුන්; (අරභයාද දන් දෙන්නේය.)

එහි පළමුකොට දෙවියන් අතුරෙන් ප්‍රකට වූ සමහර දෙවි කෙනෙකුන් දක්වමින් කීහු – වෛශ්‍රවණය, ධෘතරාෂ්ට්‍රය, විරූපාක්ෂය; විරූඪය යන යසස් ඇත්තා වූ ලෝක පාලක වූ සිව්වරන් මහරජුන් අරභයාද දන් දෙන්නේය.

12. තෙවඵව, ඔවුහුද (හෙවත් ඒ සතරවරන් මහරජුන් හා පූර්‍වප්‍රෙත ගෘහ වස්තු දෙවතාදිහුද; පූජිතා හොන්ති, (දායකයා විසින්) පුදන ලද්දෝ වෙත්; දයකාව, දයකයෝද; අනිප්ඵලා,

Non-commercial distribution

නිෂ්ඵල නොවන්නෝ වෙත්; රුණ්ණංවා, (මළ අය සඳහා) හැඩීම හෝ; සොකොවා, සිත්තැවිල්ල වූ ශොකය හෝ; යාව අඤ්ඤ, (මෙයින්) අන්‍ය යම්බඳු; පරිදෙවනා, විලාපකීම හෝ; නහි, නොම කටයුතුයි; පෙතස්ස, කළුරිය කළාහට; තං, ඒ හැඩීම් ආදිය; අත්ථාය, උපකාර පිණිස; න, නොවේ; ඤාතයෝ, අඤ්ඤ ඤාතීහු; එවං තිට්ඨන්ති, (එසේ වුවත්) මෙසේ සිටිත්.

ඒ සතර වරන් මහරජවරුද පූර්‍වප්‍රෙතයෝද වස්තුදෙවතාදී හුද උදෙසීම් ක්‍රියාවෙන් පුදන ලද්දෝ වෙත්ද ඒ දන දයකයෝද අනුන්ට පින්දීම් පමණකින් නිෂ්ඵල නොවන්නෝය හෙවත් දයකයෝද දානවිපාකයන්ට හිමිවන්නෝය. යම්කෙනෙක් ස්වකීය ඤාතීන්ගේ මරණය කරණ කොට ගෙන හඬත්ද, ශොක කරත්ද වීලාප කියත්ද, එය ඔවුන්ගේ නිරර්ත්ථ ක්‍රියාවකි. එයින් තමා තැවෙනු පමණක් මිස ප්‍රෙතයන්හට කිසිත් අර්ථයක් නැත්තේමය, එබැවින් කදුළු වැගිර වීමවූ හැඩීමද, සිත් තැවිල්ල වූ ශොකයද නොකටයුතුයි. මෙයින් අන්‍ය වූ යම් විලාප කීමක් වන්නීද හෙවත් එකම පුතා කොයිදැයි යනාදි වාග් විප්‍රලාපයක් වේද එයත් නොම කටයුතුය. යම්හෙයකින් හැඩීම, ශොක කිරීම, විලාපකීම යන සියල්ල කළුරිය කළ තැනැත්තාහට උපකාර පිණිස නොවන්නේද එහෙයින් එය නොම කටයුතුයි. එසේ වුවත් අඤ්ඤ වූ ඤාතිජනයෝ එසේ කරති.

මෙසේ මළකෙනෙකු සඳහා හැඩීම් ආදිය නිෂ්ඵලබව දක්වා දානාදි පින්කම් කොට පින් පැමිණවීම සාත්ර්ථක බැව් දක්වන සේක් ''අයංච ඛො දක්ඛිණා දින්නා'' යනාදි ගාථාව වදළ සේක.

13. දින්නා, (දයකයා විසින්) දෙන ලද; අයංච ඛො දක්ඛිණා, මෙම දානය වූකලී; සඞ්ඝමිහි, (නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ) සඞ්ඝ යා විෂයෙහි; සුප්පතිට්ඨිතා, මොනවට පිහිටියාය; අස්ස, මේ ප්‍රෙතයාහට; දීඝරත්තං, බොහෝ කාලයක් මුළුල්ලෙහි; හිතාය,හිත පිණිස; ඨානසෝ, එකඟෙහිම; උපකප්පති, පැමිණෙයි.

නිරුත්තර පුණ්‍ය ක්ෂෙත්‍ර වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සඞ්ඝයා විෂයෙහි දයකයා විසින් දෙන ලද මෙම දක්ෂිණාව මනාව පිහිටියාය. ප්‍රෙතයාහට මේ දානවිපාකය බොහෝ කලක් හිත සැප පිණිස එකඟෙහිම පැමිණෙයි. එහි මේ ධර්‍මතාවයයි යම්

Non-commercial distribution

හෙයකින් ප්‍රෙතයන් උදෙසා දයකයා දන්දුන්කල්හි ඉදින් ප්‍රෙතයෝ අනුමොදන් වෙත්ද, එකණෙහිම එකුශලයා ගේ විපාකයෙන් ප්‍රෙතයෝ ප්‍රෙත දුකින් මිදෙත්. මෙසේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ධර්මදෙශනා කොට මහජනයා මළගිය-වුන් උදෙසා දන් දීමෙහි සිත් අලවා හුනස්නෙන් නැඟිට වැඩිය සේක.

දෙවන දිනයෙහි සිටුහාය්‍යාව හා සෙසු නෑයෝද සිටාණන්ට අනුව පවතිමින් මෙසේ මාසයක් පමණ කල් මහදන් පැවැත් වූහ. එකල්හි පසේනදිකොසොල් මහරජ තෙමේ භාග්‍යවත් බුදු-රජාණන් වහන්සේ වෙත එළඹ ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කවර හෙයකින් භික්ෂූහු මසක් පමණ කල් මාගේ ගෘහයට නො වැඩියාහුද''යි විචාළේය. ශාස්තෘන් වහන්සේ ඒ කරුණ වදළ කල්හි රජතෙමේද සිටාණන්ට අනුව පවත්නේ බුදුපාමොක් බික් සඟනට මහදන් පැවැත්විය. නුවරවැසියෝ එ දැක රජ්ජුරු වන්ට අනුව පවතිමින් මසක් පමණ මහදන් පැවැත්වූහ. මෙසේ මාස දෙකක් මුළුල්ලෙහි පිටිඨිතලිකාව මුල්කොට මහදන් පැවැත්වූහ.

මේ ප්‍රෙතවස්තු දෙශනාවෙහි උරගවර්ගයෙහිවූ සිව්වන පිටිඨිතලිකා ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

---

1. 5 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරගවර්ගයෙහි වූ **පස්වන තිරොකුඩ්ඩ ප්‍රෙතවස්තුව** කවරහයත්:-

විනෙයජනනලින විකාශනයෙහි මාතීණ්ඩායමාන වූ සම්‍යක් සම්බුඩ සර්ඥ රාජොත්තමයාණන් වහන්සේ රජගහනුවර වැඩ වදරණසේක් බොහෝ වූ ප්‍රෙතයන් අරභයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කළ සේක. එහි මේ විස්තර කථාව වන්නීය:-

මේ කපින් දෙයනුවන කල්පයෙහි කාසිපුර නම් නුවරක් විය. එහි ජයසෙන නම් රජෙක් රාජ්‍යය කරවිය. ඒ රජහට සිරිමා නම් දෙවියක්විය. එ දෙවියගේ කුස ඵුස්ස නම් බෝසතා ණෝ ඉපද අනුක්‍රමයෙන් සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක. ජයසෙන් රජතෙම ''මාගේ පුතණුවෝ මහා භිනිෂ්ක්‍ර-මණය කොට බුදුවූ සේක. බුඩරත්නය මාගේමය, ධම්රත්නය

Non-commercial distribution

මාගේමය, සඞ්ඝ රත්නය මාගේමය''යි මමත්වය උපදවා සියලු කල්හිම තෙමේම උපස්ථාන කරයි. අනිකෙකුට උපස්ථානයට අවකාශ නොදෙයි. භාග්‍යවත් බුදුන්ගේ බාල සහෝදරවූ දෙවෙනි මෑණියන්ගේ පුත් වූ සහෝදර තිදෙන මෙසේ සිතූහ. ''බුදුහු නම් සකල ලොකයා හට හිත පිණිස උපදනාහුය, එක්කෙනෙකුටම වැඩ පිණිස නූපදනාහ. අපගේ පියරජාණෝ අනිකෙකුට අවකාශ නොදෙත්, කෙසේනම් අපි භාග්‍යවතුන් හා සඞ්ඝයාත් උපස්ථාන කරන්ට ලබන්නමෝද''යි සිතන්නා වූ ඔවුන්ට ''එබැවින් අපි දැන් කිසියම් උපායක් කරමුය''යි කියා මේ කල්පනාව විය.

ඔවුහු පිටිසර ජනපදයක් කුපිතවූවක් මෙන් කරවූහ. ඉන් පසු රජතෙමේ ප්‍රත්‍යන්ත වැස්සෝ කොපවූහයි අසා පුතුන් තුන් දෙනම පිටිසර දනව් වැසියන් සන්සිඳවීමට යැවීය. ඒ සහොදර තිදෙනා ගොස් එය සන්සිඳුවා ආවාහුය. රජතෙම සතුටුව ''යමක් තොපි කැමති නම් ඒ ගණුව''යි වරයක් දුනි. ඔව්හු ''අපි භාග්‍යවතුන්වහන්සේ උපස්ථාන කිරීමට කැමැත්තමුහ''යි කීහ. රජතෙමේ ''එය හැර අනික් කැමැති වරයක් ගණුව''යි කීය. එවිට ඔවුහු ''අපි අනිකකින් ප්‍රයෝජන නැත්තෝවමුහ''යි කීවෝය, එසේනම් ''කාලසීමාවක්කොට ගණුව''යි කීකල්හි ඔවුහු සත්අවුරුද්දක් උපස්ථානකිරීමට ඉල්ලුවාහුය. රජතෙමේ එය නුදුන්නේය. මෙපරිද්දෙන් සාවුරුද්දක්ද, පස්අවුරුද්දක්ද' සිව්වසක්ද, තුන්අවුරුද්දක්ද, දෙවසක්ද, එක්වසක්ද, සත්මසක්ද, සමසක්ද, පස්මසක්ද, සිව්මසක්දැයි කියා තුන්මස දක්වා ඉල්ලුවාහුය. එකල්හි රජතෙම තෙමසක් මුළුල්ලෙහි උවටැන් කිරීමට ගණුවයි කියා දුන්නේය. එවිට ඒ සහෝදරයෝ භාග්‍යවතුන්වහන්සේ කරා එළඹ ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි තෙමසක් මුළුල්ලෙහි භාග්‍යවත් බුදුන් උවටැන් කිරීමට කැමැත්තමුහ, ස්වාමීනි භාග්‍යවතුන්වහන්සේ මේතෙමස වස්විසීම අප වෙනුවෙන් ඉවසා වදරණසේක්ව''යි අයද සිටියාහුය. භාග්‍යවතුන්වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදළසේක. ඒ තිදෙන තමාගේ ජනපදයෙහි නියුක්ත පුරුෂයාහට ''මේ තෙමස අප විසින් භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කටයුතුය, භාග්‍යවතුන්වහන්සේට විහාරාරාමාදිකොට සියලු උපස්ථානයට සුදුසු දෑ සම්පාදනය කරව''යි කියා හසුනක් යවූහ.

Non-commercial distribution

ඒ පුරුෂතෙම සියල්ල සම්පාදනය කොට රාජපුත්‍රයන්ට නැවත දන්වා යැවීය. ඔවුහු කාෂායවස්ත්‍ර හැඳගෙන චිතාවත් කරන්නා වූ පුරුෂයන් දහස සමග භාග්‍යවතුන්වහන්සේට හා භික්ෂු සඞ්ඝයාවහන්සේටත් මනාසේ උවටැන් කරමින් ජනපදයට වැඩමවා ගෙනගොස් විහාරය පාවාදී වස් වැසෙව්වාහුය. ඔවුන් ගේ භාණ්ඩාගාරිකවූ එක් ගෘහපති පුත්‍රයෙක් තෙම ප්‍රජාපතීන් සහිතව තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාසම්පන්නවිය. පහන්සිත් ඇත්තේවිය. ඒ භාණ්ඩාගාරිකතෙම බුදුපාමොක් බික්සහනට සකස් කොට දනවස්තුව දුන්නේය. ජනපදයෙහි නියුක්ත පුරුෂයා හෙවත් ජනපදාධිපතියා ඒ දනවස්තුව ගෙන දනව්වැසි එකොළොස්-දහසක් පමණ පුරුෂයන් සමග මනාකොට දනවස්තුව යැවීය. ඔවුනතුරෙන් සමහර දනව් වැස්සෝ නටුවාවූ ශ්‍රද්ධාසිත් ඇත්තෝවූහ. ඒ අශ්‍රද්ධාවත් අය දනයට අන්තරාය කොට දන වස්තුව තුමුම කෑවාහුය. බත්හලද ගිනිලූහ. පිරිවර සහිත වූ ඒ රාජපුත්‍රයෝ භාග්‍යවතුන්ට සත්කාර කොට බුදුන් පෙරටුකොට ගෙන රජුගේ සමීපයටම නැවත ගියෝය. භාග්‍යවතුන්වහන්සේ එහි වැඩමවා පිරිනිවන් පෑසේක. රාජපුත්‍රයෝද ජනපදාධිපති යාද භාණ්ඩාගාරිකයාද පිළිවෙළින් කළුරියකොට පිරිස සමග ස්වර්ගයෙහි උපන්හ. ප්‍රතිහත චිත්තාන්විත ජනයෝ (හෙවත්) සැදැහසිත් නැතිව දන් කෑ මනුෂ්‍යයෝ කළුරියකොට නරකයෙහි උපන්නාහ. මෙසේ දෙව්ලොවින් දෙව්ලොවටද නිරයෙන් නිරයටද ඉපදීම් වශයෙන් පැමිණියාවූ ඒ මිනිසුන් දෙකොට-සටම (හෙවත් ශ්‍රද්ධාවෙන් පින් කළාවූද අශ්‍රද්ධාවෙන් දන වස්තු තමන් කා දන්හල් ගිනිලූවාවූද මනුෂ්‍යයන් දෙකොටසට) දෙයනූකපක් ඉක්ම ගියාහුය.

නැවත මේ භද්‍රකල්පයෙහි කසුප් බුදුන්කල අශ්‍රද්ධාවත් ඒ මනුෂ්‍යයෝ ප්‍රේත අපායෙහි උපන්නෝය. එකල්හි මනුෂ්‍යයෝ තම තමන්ගේ ඥාති ප්‍රේතයන්ගේ ප්‍රයෝජනය සඳහා දන්දී ''මේ පින අපගේ ඥාති ප්‍රේතයන්ට වේවා''යි කියා පින්දෙත්. ඒ ඥාති ප්‍රේතයෝ සැප ලබත්. එකල්හි මේ ප්‍රේතයෝද එය දැක කසුප් සම්මාසම්බුදුන් වෙත එළඹ ''කිමෙක්ද්දෝ ස්වාමීනි අපිත් මෙබඳු සම්පත් ලබන්නමෝද''යි විචාළාහුය. එවිට භාග්‍යවතුන්වහන්සේ වදරණසේක් ''මේ කාලයෙහි තොපි සැප නොලබන්නාහුය, අනාගතකාලයෙහි වනාහි ගෞතම

Non-commercial distribution

නම් සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන් වහන්සේ ලොව ඇතිවන-සේක, ඒ බුදුන්ගේ කාලයෙහි බිම්සරනම් රජෙක් වන්නේය. ඒ රජතෙම මෙයින් දෙයනූ කපකින් මත්තෙහි තොපගේ නෑයෙක්විය. ඒ බිම්බිසාර රජ තෙම බුදුන්ට දන්දී තොපට පින්දෙන්නේය, එකල්හි තොපි සම්පත් ලබන්නාහුය''යි වදළ-සේක. එසේ වදළ කල්හි ඒ වචනය ඒ ප්‍රේතයන්ට ''සෙට දවසෙහි තොපි සැප ලබන්නාහුය''යි වදළසේ වූයේය.

ඉන්පසු එක් බුඩාන්තරයක් ඉක්මුණු කල්හි අප භාග්‍ය-වතුන් වහන්සේ ලොව පහළවූසේක. එකල ඒ රජපුත් තිදෙනාද දහසක් පුරුෂයන් සමග දෙව්ලොවින් චුතව මගධ රට බමුණු කුලයක ඉපදී අනුක්‍රමයෙන් තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගයා ශීර්ෂයෙහි ජටිලයෝ වූහ. ජනපදයෙහි නියුක්ත පුරුෂතෙම බිම්සර රජවිය. භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රයා විසාඛ නම් සිටුවිය. ඒ භාණ්ඩාගාරිකයාගේ භාර්‍යාව ධම්මදින්නා නම් සිටු දියණිය විය. සෙසු පිරිස වනාහි රජහට පිරිවරව උපන්නාහුය. අප භාග්‍යවතුන්වහන්සේද ලොව පහළවී සත්සති ඉක්මවා පිළිවෙළින් බරණැසට වැඩමවා දම්සක් පවත්වා පඤ්චවර්ගීය භික්ෂූන් ආදි කොට දහසක් පිරිවර ඇති තුන්බෑ ජටිලයන් භික්මවා රජගහනුවරට වැඩිසේක. එහිදු එදින අහු මගද දෙරට වාසිවූ එකොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතීන් සමග කමන් වෙත එළඹියාවූම බිම්බිසාර රජාණන් ශ්‍රොතාපත්ති‍ඵලයෙහි පිහිටවූසේක. එකල්හි බිම්සර රජාණන් විසින් සෙට දවසට බතින් ආරාධනා කරනලද්දේ ඉවසා වදරා දෙවන දවසෙහි මාණවක වණ්ණයෙන් යෙදී පෙරටුව යන්නාවූ සක්දෙව් රජ විසින්:-

''දන්තො දන්තෙහි සහ
පුරාණ ජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි,
සිඞ්ගීනික්ඛසවණ්ණො
රාජගහං පාවිසි භගවා''

''යන්නෙන් දැමුණු ඉඳුරන් ඇති සවාසනා සකක්ලෙශයන් ගෙන් මිදුණාවූ සිඞ්ගීනික්ඛ සමාන ශරීර වණ්ණ ඇති හෙවත් උත්තම සුවණ්ණයට බදු පැහැඇති භාග්‍යවතුන්වහන්සේ ඉන්ද්‍රිය දමනයෙන් දැමුණාවූ භවබන්ධනයෙන් මිදුණාවූ පුරාණ

Non-commercial distribution

ජටිලයන් සමග රජගහ නුවරට වැඩියේකැ''යි මේ ආදී ගාථා-වලින් ස්තුති කරනු ලබමින් රජගහ නුවරට වැඩ බිම්සර රජුගේ මාලිගයෙ හිදී මහදන් පිළිගත්සේක. යටකී ඒ ප්‍රේතයෝ ''දැන් රජ දන්දී අපහට පින්දේය''යි සිතා මාලිගය පිරිවරා සිටියාහුය. රජතෙම දන්දී ''භාග්‍යවතුන්වහන්සේ කොතැන්හි වැඩවසත්දෝහෝ''යි භාග්‍යවතුන්වහන්සේ ගේ විහාරස්ථානයම සිතීය. ඒ දනය කිසි වෙකුට නොඋදෙසුවේය. එසේ ඒ දනය නොලැබූ ඒ ප්‍රේතයෝ සුන් ආසා ඇතිව රාත්‍රි කාලයෙහි රාජමන්දිරයෙහිදී ඉතා බියකරු ලෙස ශබ්ද කළාහුය. රජතෙම භයටද සන්ත්‍රාශයටද හා සංවේගයටද පැමිණ අලුයම් වේලෙහි (ගොස්) භාග්‍යවතුන්වහන්සේට එපවත් සැලකළේය. ''ස්වාමීන්වහන්ස මෙබඳුවූ බියකරු ශබ්දයක් ඇසුවෙමි. මට කුමක්වන්නේදෝහෝ''යි ඇසීය. එවිට භාග්‍යවතුන්වහන්සේ ''මහරජ බිය නොවෙව, තොපට මෙයින් කිසි නපුරෙක් නොවන්නේය, තොපට වැඩෙක් වන්නේය, යලිදු තොපගේ පුරාණ ඥාතීහු ප්‍රේතලොකයෙහි උපන්නෝ වෙත්, ඒ ප්‍රේතයෝ එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි තොපම ප්‍රාර්ථනා කරමින් බුදුන්ට දන්දී අපට පින්දෙන්නේ යයි සිතා හැසුරුණේය, තොප විසින් ඊයේ දන්දී පින් නුදුන් බැවින් සුන් ආසා ඇතිව එබඳුවූ භයානක ශබ්දයක් කළෝය''යි වදළසේක. කිමෙක්ද? ''ස්වාමිනි දැන්වත් පින්දුන් කල්හි ඒ ප්‍රේතයෝ සම්පත් ලබන්නා හුදැ''යි ඇසීය. ''මහරජ එසේය''යි වදළසේක. එසේවී නම් ''ස්වාමීනි භාග්‍යවතුන්වහන්සේ අද දවස මගේ දනය ඉවසා වදරණසේක්වා, ඒ ප්‍රේතයන්ට පින් දෙන්-නෙමැ''යි කීය. භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසා වදළසේක. රජ්ජුරුවෝ මාලිගයට ගොස් මහදන් පිළි-යෙළ කරවා බුදුන්ට කල් දැන්වූවෝය. භාග්‍යවතුන්වහන්සේ භික්ෂු සඞ්ඝයා සමග රාජමන්දිරයට වැඩ පනවනලද හසුන්හි වැඩහුන්සේක. ඒ ප්‍රේතයෝ වනාහි ''අදවත් සැප ලබන්-නෙමුය''යි සිතා ගොස් භිත්තිප්‍රාකාරාදියෙන් පිටත් තන්හි සිටියාහුය. යම්සේ ඒ සියලුම ප්‍රේතයෝ රජහුගේ ඇස්හමුවට පැමිණියාහු වෙද්ද, භාග්‍යවතුන්වහන්සේ එසේ කළසේක. රජතෙමේ දක්ෂිණෝදකය හෙවත් දනය සඳහා පැන් පිළිගන්-වමින් ''මාගේ ඥාති ප්‍රේතයන්ට මේ පින වේවා''යි උදෙසුවේය.

Non-commercial distribution

එකෙණෙහිම ප්‍රේතයන්ට පියුමුපුලෙන් ගැවසීගත් පොකුණු පහළවූහ. ඒ ප්‍රේතයෝ ඒ පොකුණු වලට බැස නා පැන්බී සන්සිඳුණු සිරුරු දුවිලි ක්ලාන්ත පිපාසා ඇතිව රන්වන් ශරීර ඇත්තෝ වූහ. රජ කැඳ කැවිලි බොජුන් පිළිගන්වා පින්දුනි. එකෙණෙහිම ඒ ප්‍රේතයන්ට දිව්‍යමය යාගු බාදු හොජ්‍යයෝ පහළවූහ. ඔව්හු එය අනුභවකොට පිනාගිය ඉඳුරන් ඇති වූහ. පසුව වස්ත්‍ර හා සෙනසුන් පූජා කොට පින් දුනි. ඒ ප්‍රේතයන්ට දිව්‍ය වස්ත්‍ර ප්‍රාසාද පසතුරුණු සෙනසුන් ආදී අලඬකාරවත් දේවල් පහළවූහ. ඔවුන්ට පහළවූ ඒ සම්පත් සියල්ලම රජහට යම්සේ ප්‍රකටව පෙනේද එපරිද්දෙන් භාග්‍යවතුන්වහන්සේ අධිෂ්ඨාන කළසේක. රජතෙම සම්පත් දැක ඉතා සතුටු සිත් ඇත්තේවිය. තදනන්තරව භාග්‍යවතුන්වහන්සේ දන් වළඳ පවාරණය කොට බිම්බිසාර රජහට අනුමොදනා පිණිස තිරොකුඩ්ඩ ප්‍රේතවස්තුව දෙශනා කළසේක.

14. **''තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති – සන්ධිසිඬ්ඝාටකෙසු ච,**
වාරබාහාසු තිට්ඨන්ති – ආගන්ත්වාන සකං ඝරං

15. **පහූතෙ අන්තපානම්හි – බජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ,**
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා.

16. **එවං දදන්ති ඤාතිනං – යෙ හොන්ති අනුකම්පකා,**
සුචිං පණීතං කාලෙන – කප්පියං පානභොජනං

17. **ඉදං වො ඤාතිනං හොතු – සුඛිතා හොන්තු ඤාතයො,**
තෙ ච තත්ථ සමාගන්ත්වා – ඤාතිපෙතා සමාගතා

18. **පහූතෙ අන්තපානම්හි – සක්කච්චං අනුමොදරෙ,**
චිරං ජීවන්තු නො ඤාති – යෙසං හෙතු ලභාමසෙ

19. **අම්හාකඤ්ච කතා පූජා – දයකා ච අනිප්ඵලා,**
නහි තත්ථ කසී අත්ථි – ගොරක්ඛෙත්ථ නවිජ්ජති

20. **වණිජ්ජා තාදිසි නත්ථි – හිරඤ්ඤෙන කයාක්කයං,**
ඉතො දින්නෙන යාපෙන්ති – පෙතා කාලකතා තහිං

21. **උන්නමෙ උදකං වට්ඨං – යථා නින්නං පවත්තති,**
එවමෙව ඉතො දින්නං – පෙතානං උපකප්පති.

22. **යථා වාරිවහා පූරා – පරිපූරෙන්ති සාගරං,**
එවමෙව ඉතො දින්නං – පෙතානං උපකප්පති.

Non-commercial distribution

23. අදාසි මෙ අකාසි මෙ – ඤාති මිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණං දජ්ජා – පුබ්බෙ කතමනුස්සරං.

24. නහි රුණ්ණංව සොකො වා – යා වඤ්ඤා පරිදෙවනා,
න තං පෙතානමත්ථාය – එවං තිට්ඨන්ති ඤාතයො.

25. අයඤ්ච ඛො දක්ඛිණා දින්නා – සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස - ඨානසො උපකප්පති.

26. සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතානපූජා ච කතා උළාරා,
බලඤ්ච භික්ඛූනමනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පක'' න්ති.

14. තිරොකුඩ්ඩෙසු, ගෘහප්‍රාකාර භිත්තීන් සම්බන්ධ පිටත් තන් භිද; සන්ධිසිඩ්ඝාටකෙසුව, සතරමංසන්ධි ගෘහසන්ධි භිත්ති සන්ධිවල හා තුන්මංසන්ධිවලද; වාරබාහාසු, නගර-යන්ගේ හා ගෘහයන්ගේ දොරබාවන්හිද; සකං සරං, ස්වකීය ගෘහයට; ආගන්ත්වාන, (ඥති ප්‍රෙතයෝ) අවුදින්; තිට්ඨන්ති, සිටිත්; (මෙහි ස්වකීය ගෘහය නම් පූර්ව ඥති ගෘහයද තමා ස්වාමී භාවයෙන් විසූ ගෘහයද යන දෙකම ස්වකීයයයි සලකනලදි.)

මහරජ ඥති ප්‍රෙතයෝ පෙර තමා ස්වාමීව විසූ ගෘහයවෙත හෝ පූර්ව ඥතීන්ගේ ගෘහය වෙත හෝ ස්වකීය සංඥයෙන් පැමිණ ගෘහ ප්‍රාකාර භිත්තීන් සම්බන්ධි දෙරින් පිටත් තන්හිද සතරමං සන්ධි ගෘහසන්ධි භිත්තිසන්ධි ආලොක සන්ධීන් හා තුන්මංසන්ධිවලද සිටිත්. නගරවාර ගෘහවාරයන්ගේ මුලු ඇසුරුකොට ඇති තන්හිද සිටිත්.

මෙසේ තථාගතයන්වහන්සේ (එකී ප්‍රෙතයන්) පෙර නොවිසූ නමුදු පූර්ඥති ගෘහයක් බැවින් බිම්සර රජහුගේ මාලිගාව සිය ගෙදරය යන කල්පනාවෙන් අවුත් භිත්ති ආදියෙන් පිටත සිටියාවූ ඊෂ්‍ර්‍යාමාත්සර්‍යය් අකුශලයන්ගේ විපාකය විඳින්නාවූ අතිශයින් දුක්ක නොහැකිවූ විරූපවූ බියකරු දැකුම් ඇත්තාවූද බොහෝවූ ප්‍රෙතයන් රජහට දක්වමින් ''තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති'' යන ආදී ගාථාව වදරා නැවත ඔවුන් විසින් කළ අකුශලකර්මයාගේ දරුණුබව දක්වා වදරමින් ''පහූතෙ අන්නපා නම්හි'' යනාදි දෙවන ගය වදළසේක.

Non-commercial distribution

15. පහූතෙ. බොහෝවූ; අන්නපානම්හි, ආහාරපානවර්‍ගය; ඛජ්ජභොජ්ජෙ, බාද්‍ය භොජ්‍යයන්ද; උපට්ඨිතෙ, (දන විෂයෙහි) පිළියෙළ කළ කල්හි; තෙසං සත්තානං, ඒ (ප්‍රෙත අපායෙහි උපන්) සත්වයන්ගේ; කම්මපච්චයා, කර්‍මහෙතුවෙන් (හෙවත්) අදන දන ප්‍රතිසෙධනාදි ප්‍රභෙදවූ තද මසුරු අකුශල කර්‍මයාගේ හෙතුවෙන්; කොචි, (ජීවමාන ඥති මිත්‍රාදි) කිසිවෙක්; නසරති, සිහිනොකරයි.

බොහෝවූ ආහාරපානවර්‍ගය බාද්‍ය භොජ්‍යයන්ද හෙවත් අසිත පීත බායිත සායිත වශයෙන් චතුර්විධවූම ආහාරය පිළියෙළ කළ කල්හි ඒ ප්‍රෙත යොනියෙහි උපන්නාවූ සත්වයන්ගේ මව හෝ පියා හෝ පුතෙක් හෝ මුණුපුරෙක් හෝ කිසිවෙක් ඔවුන් සිහිනොකරයි. කුමක් හෙයින්ද? තමා විසින් කරනලද නොදීම හා දීම වැලැක්වීම් ආදි ප්‍රභෙද ඇති තද මසුරු අකුශල කර්‍මය හෙතුවන හෙයිනි. ඔවුන්ගේ ඒ අකුශල කර්‍මයම මළගිය වුන් සිහිකිරීමට නැයන්ට අවකාශ නොදෙයි.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ අනල්පවූ ආහාරපාන වර්‍ගයන් ඇතිකල්හිද ඥතීන් ප්‍රත්‍යාශංසනය කරන්නාවූ ප්‍රෙතයන්ගේ පව්කම් වශයෙන් නැයන්ගේ සිහිකිරීම් පමණකුත් නැතිබව දක්වා වදාරා ප්‍රෙත විෂයෙහි උපන්නාවූ නැයන් උදෙසා දුන් රජහු විසින් දෙනලද දනයට ප්‍රශංසා කරමින් තෙවන ගාථාව වදළසේක.

16 - 17. ඤතීනං, (මව් පසින් හෝ පිය පසින් සම්බන්ධවූ) නැයන් අතුරෙන්; අනුකම්පකා, අනුකම්පාකරන්නාවූ (නොහොත්) වැඩ කැමතිවූ; යෙ හොන්ති, යම්කිසි පුත්‍රාදිකෙනෙක් වෙත්ද; (ඔවුහුතුමූ) සුචිං, පිරිසිදුව; පණීතං, ප්‍රණීතවූ (නොහොත්) උදරවූ; කප්පියං, කැපවූ (නොහොත්) ආර්‍යයන්ගේ පරිභොගයට සුදුසුවූ; පානභොජනං, ආහාරපාන වර්‍ග; කාලෙන, සුදුසු කාලයෙහි (හෙවත්) දක්ෂිණාහර්‍යයන්ගේ පරිභොගයට සුදුසු කාලයෙහි; (පිරිනමා ඥති ප්‍රෙතයන්ට) ඉදංවො, මේ පින; ඤතීනං, ඥති ප්‍රෙතයන්ට; හොතු, වේවා; ඤතයො, (අපගේ) ඥති ප්‍රෙතයෝ; සුඛිතා හොන්තු, සුවපත් වෙත්වායි; එවං දදන්ති, මෙසේ උදෙසත්ද (හෙවත්) පින් දෙත්ද; තෙ ච ඤතිපෙතා, ඒ ඥති ප්‍රෙතයෝද; තත්ථ, ඒ දන්දෙන තැනට; සමාගන්ත්වා, අවුදින්; සමාගතා, රැස්ව:-

Non-commercial distribution

ඒ ප්‍රෙත ගතික සත්වයන්ගේ අකුශලකර්ම හේතුවෙන් ඔවුන් සිහි නොකරන කල්හිදු මහරජ තොප විසින් මේ දුන් දනය පරිද්දෙන් මාතෘ පිතෘන් සම්බන්ධි ඥාතීන් අතුරෙන් අනුකම්පා කරන්නා වූ හිතෛෂි වූ පුත්‍රාදි යම් කිසි කෙනෙක් වෙත්ද ඔවුහු පිරිසිදු කොට ප්‍රණීත වූ හෝ උදර වූ කැප වූ ආර්‍යයන්ගේ පරිභොගයට සුදුසු වූ ආහාරපාන වර්ග දක්ෂිණාර්හ යන්ගේ පරිභොගයට සුදුසු කාලයෙහි හෝ ඥාති ප්‍රෙතයන් භිත්ති ආදියෙන් පිටතැ ඇවිත් සිටි කාලයෙහි දන විෂයෙහි පිරිනමා මේ දනය අපගේ ඥාති ප්‍රෙතයන්ට වේවා, ප්‍රෙත විෂයෙහි උපන් ඒ නෑයෝ මේ දන විපාකය විඳිමින් සුවපත් වෙත්වායි පින් දෙත් ද, යම් හෙයකින් මෙය ඥාති ප්‍රෙතයන්ට වේවයි කී කල්හිදු අනිකෙකු විසින් කළ කර්මය අනිකක්හට විපාක දෙන්නේ නොවේද, හුදෙක් වනාහි එසේ උදෙසා දෙනු ලබන්නාවූ ඒ දන වස්තුව ඥාති ප්‍රෙතයන්ගේ කුශල කර්මයට ප්‍රත්‍යයවේද, ඒ හෙයින් දන වස්තුව දුන් කල්හි ඒ ප්‍රෙතයන්ට එකාන්තයෙන්ම විපාක උපදවන්නා වූ කුශල කර්මයක්වේ.

18. පහුතෙ, බොහෝ වූ; අන්නපානම්හි, ආහාරපාන වර්ග; (දෙනු ලැබූ කල්හි) සක්කච්චං, (කර්මඵලය අදහමින්) සකස්ව (නොහොත්) එකඟ සිත් ඇතිව; අනුමොදරෙ, අනුමෝදන් වෙත්; යෙසං හෙතු, යම් අයගේ හෙතුවෙන් (හෙවත්) යම් අය නිසා; ලභාමසෙ, මෙබඳු සම්පත් ලබමෝද; නො ඤති, ඒ අපගේ නෑයෝ; චිරං ජීවන්තු, චිරජීවිහු වෙත්වා (හෙවත්) දීර්ඝායුෂ්කයෝ වෙත්වා.

ඒ ඥාති ප්‍රෙතයෝ ඒ දන් දෙනු ලබන තැනට අවුත් රැස්වී බොහෝ ආහාරපාන වර්ග තමන් උදෙසා දෙනු ලැබූ කල්හි කර්ම ඵලය අදහමින් අවික්ෂිප්ත සිත් ඇතිව මේ දනය අපට හිත සැප පිණිස වේවයි අනුමෝදන් වෙති. හටගත් ප්‍රීති සොම්නස් ඇත්තෝ වෙති. ''යම් නෑකෙනෙකු නිසා මෙබඳු සම්පත් අපි පිළි ලබමුද අපගේ ඒ නෑයෝ බොහෝ කල් ජීවත් වෙත්වා''යි මේ වනාහි පින් දීමෙන් ලැබූ සම්පත් අනුභව කරන්නා වූ ප්‍රෙතයන් තම නෑයන්ට ස්තුති කරන අයුරු දැක්වීමයි. ප්‍රෙත-යන්ගේ අනුමොදනායෙන්ද, දායකයන්ගේ උදෙසීමෙන්ද දක්ෂිණාර්හ සම්පත්තියෙන්දැයි යන කරුණු තුනෙන් දක්ෂිණා තොම එකාන්තයෙන්ම විපාක උපද වන්නී වේ. එකී කරුණු

Non-commercial distribution

තුණෙන් දයකයෝ විශෙෂ කාරණ වෙති. ''ඉදං වො ඤාතීනං හොතු'' කියා මෙසේ පින් දුන්නාවූ දයකයන් විසින් අපටත් පූජාවක් කරන ලදී. යම් කෙනෙකුගේ සිත්හි පරිත්‍යාගමය කර්මය උපන්නේද, ඒ පරිත්‍යාගමය කර්මය එහිදී විපාක දෙන හෙයින් දයකයෝද ඵල නැත්තෝ නොවෙත්. කිමෙක්ද ප්‍රෙත විෂයෙහි උපන් සත්වයෝම ඥාතීන් හේතු කොට සම්පත් ලබත්ද නොහොත් අනික් සත්වයෝත් ලබත් දැයි යන මේ ප්‍රශ්නයෙහි අප විසින් කිය යුත්තක් නැත, භාග්‍යවතුන් වහන්සේ විසින්ම එය ප්‍රකාශිත හෙයිනි එය කියන ලද්දේ මැයි:-

''භවත් ගෞතමයන් වහන්ස! අපි බ්‍රාහ්මණයෝ වර්‍ෂ, ඒ අපි මේ දානය සහලේ නැවූ ප්‍රෙතයන්ට පැමිණේවා මේ දානය සහලේ ඥාති ප්‍රෙතයෝ පරිභොග කරත්වායි දන්දෙමු, පින් කරමු, කිමෙක්ද-භවත් ගෞතමයන් වහන්ස! ඒ දානය ඥාති සාලොහිත ප්‍රෙතයන්ට ලැබෙද, කිමෙක්ද – ඒ දානය සහ ලේ නෑ ප්‍රෙතයෝ පරිභොග කරත්ද''යි ජාණුස්සොණි බ්‍රාහ්මණයා බුදුන්ගෙන් විචාළේය. එවිට තථාගතයන් වහන්සේ ''බ්‍රාහ්මණය ස්ථානයෙහිම ලැබෙයි, අස්ථානයෙහි නොලැබෙය''යි වදළ සේක. භවත් ගෞතමයන් වහන්ස! ස්ථානය කවරේද-අස්ථානය කවරේදැයි විචාළ කල්හි බමුණ මේ ලොකයෙහි සමහර කෙනෙක් ප්‍රාණඝාත කරන්නේවේද-පෙ-මිථ්‍යා දෘෂ්ටිකයෙක්වේද, ඒ පුද්ගලයා ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු නරකයෙහි උපදී,නිරයෙහි උපන් සතුන්ට යමක් ආහාරවේද, ඒ ආහාරයෙන් ඒ නිරිසතා එහිදී යැපෙයි. ඒ ආහාරය කරණ කොට ගෙන ඒ නිරිසතා එහිදී සිටියි. බ්‍රාහ්මණය යම් තැනක සිටියාහට ඒ දානය නොපැමිණේ නම් මෙයම අස්ථානය වේ. බමුණ මේ ලෝකයෙහි ඇතැම් පුහුලෙක් තෙම ප්‍රාණඝාත කරන්නේවේද -පෙ-මිථ්‍යාදෘෂ්ටිකයෙක් වේද, එතෙම කාබුන් මරණින් මතු තිරිසන් යොනියෙහි උපදී. තිරිසන් අපායෙහි උපන්නාවූ සත්වයන්ට යමක් ආහාරවේද ඒ ආහාරයෙන් ඔහු එතැන යැපෙයි. ඒ ආහාරයෙන් ඔහු එතැන්හි ජීවත්වෙයි. බ්‍රාහ්මණය යම් ඒ තිරිසන් යොනියෙහි ඉපද සිටියාහට ඒ දානය නොපැමිණේද මෙයත් අස්ථානය වේ. බමුණ මේ ලෝකයෙහි සමහර කෙනෙක් ප්‍රාණඝාතයෙන් වැළක්කේවේද-පෙ-සම්‍යක් දෘෂ්ටිකවේද, ඒ ප්‍රාණඝාතාදි දශ අකුශලයෙන් වැලකුණු සත්

Non-commercial distribution

පුරුෂ තෙම කාබුන් මරණින් මත්තේහි මනුෂ්‍යයන් හා එකී භාවයට පැමිණේ හෙවත් මිනිස් ලොව උපදී. -පෙ-දෙවියන් හා එකී භාවයට පැමිණේ හෙවත් දෙව්ලොව උපදී. දෙවියන්ට යම්බඳු ආහාරයක් වන්නේ නම් එයින් ඒ දෙවියා එහි යැපෙයි. එයින් ඔහු එහි ජීවත්වෙයි. යම් හෙයකින් දෙව්ලොව සිටියා හට ඒ දනය නොපැමිණේද, මෙයත් එක් අස්ථානයක් වෙයි. බ්‍රාහ්මණය මෙලොව තවත් කෙනෙක් පාණාතිපාත කර්මය කරන්නේවේද -පෙ- මිසදිටුවෙක්වේද හෙතෙම කරජකායයා ගේ භේදයෙන් මරණින් මතු ප්‍රෙත විෂයෙහි උපදී. ප්‍රෙත විෂයෙහි උපන් සතුන්ට යමක් ආහාරවේ නම් එයින් ඒ සත්වයා එහි යැපෙයි. එයින් ඒ ප්‍රෙතයා එහි ජීවත්ව සිටියි. මිත්‍රාමාත්‍යයෝ හෝ සහ ලේ නෑයෝ හෝ ඒ ප්‍රෙතයාහට මෙයින් යම් පිනක් පමුණුවත්ද එයින් ඔහු එහිදී යැපෙයි. එයින් ඒ ප්‍රෙතයා එහි සිටියි. බමුණ යම් තැනක සිටියාහට ඒ දනය පැමිණේ නම් මෙම ප්‍රෙත යොනිය ස්ථානවේ යයි වදළසේක.

භවත් ගෞතමයන් වහන්ස! ඉදින් වනාහි සහ ලේ නෑයෙක් වූ ඒ ප්‍රෙතයා ඒ දන් දෙන තැනට නොපැමිණියේ නම් කවරෙක් ඒ දනය අනුභව කරන්නේදැයි විචාළේය. බ්‍රාහ්මණය ඒ දයකයාගේ සහ ලේ නෑ වූ අනිකුදු ප්‍රෙතයෝ වෙත්ද ඔවුහු ඒ දනය අනුභව කරත්යයි වදළ සේක. පින්වත් ගොයුමාණන් වහන්ස! ඉදින් වනාහි සහ ලේ නෑ වූ ඒ ප්‍රෙතයාත් අනිකුදු සහ ලේ නෑ ප්‍රෙතයෝත් ඒ දන් දෙන තැනට නොපැමිණියාහු වී නම් ඒ දනය කවරෙක් වලඳ දැයි විචාළ කල්හි බ්‍රාහ්මණය මේ දීර්ඝ කාලයක් සසර හැසිරෙන සත්වයන් අතරෙහි යම්කිසි ඥාති ප්‍රෙත කෙනෙකුන්ගෙන් ඒ දන් දෙන තැන හිස්වන්නේය යන කාරණය නොවන්නේය. ඊට අවකාශ නැත්තේය. බ්‍රාහ්මණය එතකුදු වුවත් දයකයෝ ඵල සහිත වෙත් යයි වදළහ. ප්‍රෙත ලෝකයෙහි උපන් සතුන්ට සම්පත් ප්‍රතිලාභයට හේතු වූ සිසැම ගෙරි රැකීම් ආදි අන් කටයුත්තක් එහි නැති බවත් මෙයින් දෙන ලද දනමය පුණ්‍යයෙන් යැපෙන බවත් දක්වීමට ''නහි'' යනාදිය වදරණ ලදී.

19. අම්භාකඤ්ච, (පින්දුන් දයකයන් විසින්) අපටත්; පූජා කතා, පූජා කරන ලද්දීය; දයකාව, දයකයොත්; අනිප්ඵලා,

Non-commercial distribution

(සිතෙහි හටගත් පරිත්‍යාගමය කර්මයට එහිදීම විපාක දෙන හෙයින්) ඵල සහිතයෝ වෙත්; තත්ථ, ඒ ප්‍රෙත විෂයෙහි; නහිකසී අත්ථී, කෘෂිකර්මයක් නොමැත්තේය; එත්ථ, මේ ප්‍රෙත යොනියෙහි; ගොරක්ඛා, ගෙරි රැකීමකුත්; නවිජ්ජති, නැත්තේය.

20. තාදිසිවණ්ණිජ්ජා, (ඒ ප්‍රෙතයන්ට සම්පත් ප්‍රතිලාභයට හේතු වූ) එබඳු වෙළඳමකුත්; නත්ථී, නැත; හිරඤ්ඤෙන, රනින්; කයාක්කයං, ක්‍රයවික්‍රය සඞ්ඛ්‍යාත (එබඳු) ගනු දෙනුව-කුත්: නත්ථී, නැත්තේය; කාලකතා, කළුරිය කළා වූ; පෙතා, ප්‍රෙතයෝ; තහිං, ඒ ප්‍රෙත අපායෙහි: ඉතෝ, මෙලොවින්; දින්නෙන, (ඥාති මිත්‍රා මාත්‍යයන් විසින්) දෙන ලද පිනින්; යාපෙන්ති, යැපෙත් (හෙවත්) ආත්මභාවය පවත්වත්.

ප්‍රෙතයෝ යමක් නිසා සුවසේ ජීවත් වන්නාහු නම් එබඳු සීසෑම් ක්‍රියාවකුත් ඒ ප්‍රෙත අපායෙහි නොමැත්තේය. එපමණකුත් නොව එහි ගෙරි රැකීමකුත් නැත්තේය. ඒ ප්‍රෙතයන්ට සම්පත් ලැබීමට හේතු වූ යමක් ඇති නම් එබඳු වෙළඳමකුත් එහි නැත්තේය. රනින් ක්‍රයවික්‍රය සංඛ්‍යාත ගනුදෙනුවකුත් එහි නැත්තේය. කළුරිය කළා වූ ඒ ප්‍රෙත අපායෙහි උපන් ප්‍රෙතයෝ හුදෙක් මෙහි සිටින ඥාති මිත්‍රා මාත්‍යයන් විසින් දෙන ලද දන සම්පතින් යැපෙත්. ආත්මභාවය පවත්වත්. දැන් යට කියන ලද කාරණය උපමාවලින් ප්‍රකාශ කිරීම සඳහා ''උන්නමෙ උදකං'' යනාදි ගාථාවය වදළහ.

21. උන්නමෙ, උන්නත ප්‍රදෙශයෙහි (උස්තැන); වට්ඨං උදකං, වර්ෂා කරන ලද ජලය; යථා, යම් සේ; නින්නං, නිම්න ස්ථානය (පහත් තැන) කරා; පවත්තති, පැමිණේද; එව මෙව, එපරිද්දෙන්ම; ඉතෝ, මේ මිනිස් ලොව සිටින ඥාති මිත්‍රාදීන් විසින්; දින්නං, දෙන ලද පින; පෙතානං, ප්‍රෙතයන්ට; උපකප්පති, පැමිණේ.

උන්නත ප්‍රදෙශයෙහි හෙවත් උස්තැන වැටුන වර්ෂා ජලය යම් සේ නිම්න ස්ථානයට හෙවත් පහත් තැන කරා බැස යන්නේද; එසේම මෙයින් දෙන ලද දානය ප්‍රෙතයන්ට පැමිණෙයි. ඵලොත්පත්තිය පිණිස යෙදෙයි. ජලයා ගේ

Non-commercial distribution

පැවැත්මට පහත් තැන මෙන්ම දනයෙන් පින් පැමිණ වීමට ප්‍රෙත ලොකය ස්ථානය වේ. එහෙයින් ''බ්‍රාහ්මණය යම් තැනක සිටියා හට ඒ දනය පැමිණේ නම් ඒ මේ ස්ථානය'' යි වදළහ.

22. යථා, යම් සේ; වාරිවහා, මහානදීහු; පූරා, පිරී; සාගරං, සයුර; පරිපූරෙන්ති, පුරවත්ද; එවමෙව, එසේම; ඉතොදින්නං, මෙයින් දෙන ලද පින; පෙතානං, ප්‍රෙතයන්ට; උපකප්පති, පැමිණේ.

යම් සේ කඳුරැලි විවර ඇළ දෙළ වළ මහවළ වලින් ගලා බසින ජලයෙන් මහා ගංහා පිරී සමුද්‍රය කරා පැමිණෙත්ද, එසේම මෙයින් දෙන ලද දනය පෙර කියන ලද පරිද්දෙන්ම ප්‍රෙතයන්ට ලැබෙයි. යම් හෙයකින් ප්‍රෙතයෝ මේ මිනිස් ලොවින් කිසිවක් ලබමු යයි ආශාවෙන් මඩනා ලදුව ඥති ශ්‍රෘහයට ඇවිත් මෙනම් දේ අපට දෙනු මැනවැයි ඉල්වන්ට නොහැකිවෙත්ද, එහෙයින් ඒ ප්‍රෙතයන් ගේ මෙකියන සිහි කටයුතු කරුණු සිහි කරන්නාවූ කුල පුත්‍රයා දන් දෙන්නේ යයි දක්වමින් ''අදසි මෙ'' යනාදි ගාථාව වදළ සේක.

23. මෙ, මට; අදසි, (මෙනම් දෙයක්) දුන්නේය; මෙ, මාගේ; මෙනම් කටයුත්ත අවසාන කළේය; මෙ, මාගේ; ඤති, (අසවල් අය මව් පසින් හෝ පිය පසින් සම්බන්ධ බැවින්) නැයෙක; මිත්තා, (ස්නෙහ වශයෙන් සංරක්ෂණයෙහි සමර්ත්ථ බැවින්) මිත්‍රයෝය; සඛා, (පංශු ක්‍රීඩායෙහි පටන්) යහළුවෙක (යයිද කියා); පුබ්බෙ කතං, පෙර කරන ලද උපකාරය; අනුස්සරං, සිහි කිරීමෙන්; පෙ තානං, ප්‍රෙතයන්ට; දක්ඛිණං, දනය; දජ්ජා, දෙන්නේය.

කළුරිය කළ අය ජීවත්ව සිටියදී මට මෙනම් ධනයක් හෝ ධාන්‍යයක් හෝ දුන්නේය. මාගේ මෙනම් කටයුත්ත අවසානයට නොපැමිණියේ අවසන් කළේය. අසවල් තැනැත්තේ මගේ මව් පසින් හෝ පිය පසින් සම්බන්ධය ඇති බැවින් නැයෙක, ස්නෙහ වශයෙන් පාලනය කිරීමට සමර්ත්ථ බැවින් මිත්‍රයෙක, වැළි කෙළියෙහි පටන් යහලුවෙකැයි පෙර වස්තු දීමා දී ක්‍රමයෙන් කරන ලද උපකාරාදිය සිහි කිරීමෙන් කළුරිය කළ වුන්ට නැයන් විසින් පින් දිය යුතු වන්නේය,

Non-commercial distribution

24. රුණ්ණංවා, (ඥාති මරණයක් හේතු කොට ගෙන) හැඬීම හෝ; සොකොවා, ශොක කිරීම හෝ; යාවඤ්ඤ පරිදෙවනා, යම් අනිකුදු විලාපකීම හෝ; නහි, නොමකටයුතුයි; තං, ඒ හැඬීම් ආදිය; පෙතානං අත්ථාය, ප්‍රෙතයන්ට වැඩ පිණිස; න, නොවේ; එවං, එසේම; ඤාතයෝ, ඥාතීහු; තිට්ඨන්ති, සිටිත්.

25. සඩ්ඪමිහි, සඩ්ඪයා විෂයෙහි; දින්නා, දෙන ලද; අයං ච බෝ දක්ඛිණා, මෙම දක්ෂිණාව; සුප්පතිට්ඨිතා, මොනවට පිහිටියාය; දීඝරත්තං, බොහෝ කාලයක් මුළුල්ලෙහි; අස්ස, ඒ ප්‍රෙතයා හට; හිතාය, වැඩ පිණිස; ඨානසෝ, එකණෙහිම; උපකප්පති, පැමිණේ.

යම් ජනයෝ වනාහි ඥාතීන් ගේ මරණයෙන් හැඬීම්, ශොක කිරීම් ආදියෙන් යුක්තවම සිටිත් ද, ඒ කළුරිය කළවුන් ගේ ප්‍රයෝජනය පිණිස කිසිවක් නොදෙත් ද, ඔවුන් ගේ ඒ ඇඬීම්, ශොකාදිය හුදෙක් තමා තැවෙන පමණක්ම වෙයි. කළුරිය කළවුන්ට කිසි වැඩක් සිදු නොවේ යයි දක්වමින් ''නහි රුණ්ණංව'' යනාදි ගාථාව වදාරා නැවත මගධෙශ්වර වූ බිම්බිසාර රජ විසින් දෙන ලද දක්ෂිණාව සාර්ත්ථක බව දක්වීමට ''අයංච බෝ'' යනාදි ගාථාව වදළහ. ඒ ගාථා දෙකේ අර්ත්ථය යට කියන ලද්දේමැයි.

දැන් යම් හෙයකින් මේ දක්ෂිණාව දුන් රජු විසින් ඥාතීන්ට ඥාතීන් විසින් කටයුතු කෘත්‍ය කරණයෙන් ඥාති ධර්මය දක්වන ලද්දේද, බොහෝ ජනයා ඉදිරියෙහි ප්‍රකාශ කළ කල්හි තොප විසිනුත් මෙපරිද්දෙන්ම නැයන් කෙරෙහි ඥාති ධර්මය සම්පූර්ණ කටයුතු යයි නිදර්ශනය ප්‍රකට කරන ලද්දේ වේ. ඒ ප්‍රෙතයන් දිව්‍ය සම්පතට පැමිණ වීමෙන් ප්‍රෙතයන්ට මහත් පූජාවක්ද කරන ලද්දේය, බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ අන්න-පානාදියෙන් සන්තර්පණය කිරීමෙන් භික්ෂූන්ට ශරීර ශක්තිය දෙන ලද්දේය, අනුකම්පාදි ගුණ පිරිවර කොට ඇති ත්‍යාග චෙතනාව නිපදවීමෙන් අනල්ප වූ පින් රැස් කරන ලද්දේය, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මේ සත්‍ය වූ ගුණවලින් රජුට ප්‍රශංසා කරමින් ''සො ඤාති ධම්මෝ'' යනාදී අවසාන ගාථාව වදළ සේක.

26. සො අයං නිදස්සි තොව, ඒ මේ දක්වන ලද්දේ; ඤාති ධම්මෝ, ඥාති ධර්මයයි (හෙවත්) නැයන් විසින් නැයන්ට

Non-commercial distribution

කටයුතු කිරීමයි; පෙතානං, ප්‍රෙතයන්ට; උළාරා, මහත් වූ හෝ ප්‍රශංසා කරන්නා වූ; පූජාව, පූජාවක්ද; කතා, කරන ලදී; භික්ඛූනං, භික්ෂූන්ට; බලංව, කාය බලයද; අනුප්පදින්නං, දෙන ලදී; තුම්හෙහි, තොප විසිනුත්; අනප්පකං, ස්වල්ප නුවූ; පුඤ්ඤං, පින; පසුතං, රැස් කරන ලදී.

තොප විසින් ඒ මේ ඥති ධර්මය හෙවත් නෑයන් විසින් නෑයන්ට කටයුතු ධර්මය දක්වන ලදී. ප්‍රෙතයන්ට මහත් පූජාවක් ද කරන ලදී. භික්ෂූන්ට කාය බලය ද දෙන ලදී. තොප විසින් අනල්ප වූ පිනක් රැස් කරන ලදී.

මෙහි ''සො ඤති ධම්මො ච අයං නිදස්සිතො'' යන මේ ගාථා පදයෙන් භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාවෙන් රජ සතුටු කළ සේක, ඥති ධර්මයා ගේ සන්දර්ශනය හේතු සන්දර්ශනයයි. ''පෙතාන පූජා ච කතා උළාරා'' යන මේ පදයෙන් නැවත නැවත පූජා කරණයෙහි සමාදන් කරවයි. ''බලං ච භික්ඛූන මනුප්ප දින්නං'' යන මෙයින් උත්සාහවත් කර විය. මෙහි භික්ෂූන්ට කාය බලානු ප්‍රදානයම එබඳු වූවන්ට බලදීමෙහි උත්සාහ වර්ධනය කිරීමම වේ. ''තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකං'' යන පදයෙන් ප්‍රශංසා කළ සේක. මෙහි පින් රැස් කිරීම වර්ණනා කිරීමම එ රජහුගේ තත් වූ පරිදි ගුණ සංවර්ණන භාවයෙන් සතුට උපදවයි. මෙසේ මෙහි යෝජනාව දත යුතුයි.

දෙශනාව ගේ අවසානයෙහි ප්‍රෙත විෂයෙහි ඉපදීමේ ආදීනව වර්ණනාවෙන් කළ කිරුණු සිත් ඇතිව නුවනින් වීර්‍ය කළ අසූසාර දහසක් සත්වයන්ට ධර්මාභිසමය විය හෙවත් සෝවාන් මාර්ගාදිය ලැබීමෙන් ධර්මාව බොධය විය. දෙවන දිනයෙහි ද දෙව් මිනිසුන්ට මෙසේම තිරොකුඩ්ඩ දෙශනාව දේශනා කළ සේක. සත් දවස එබඳුවූම ධර්මාවබොධය විය.

(මෙකල්හිදු නොයෙක් වංචා ප්‍රයොග කූට උපාය යොදා ගනිමින් තුනුරුවන් සතුදේ පැහැර ගෙන කෑමෙහි ලජ්ජා භය රහිත අශ්‍රද්ධාවන් කපටි අඳුන අය සිටිති. ඔවුන්ට මේ තිරොකුඩ්ඩ කථා වස්තුව මහොපදෙශයකි. එහෙයින් ඔවුන් විසින් මෙය ඉතා ඕනෑකමින් කියවා බලා තුනුරුවන් සතුදේ කෑමෙන් මතු තම තමන්ට ලැබෙන ඉතා බියකරු දරුණු දුක්රැස සිත්හි ධාරණය කරගත යුතුයි.)

Non-commercial distribution

මේ ප්‍රෙසවස්තු දෙශනායෙහි උරගවර්යෙහිවූ පස්වන තිරොකුඩ්ඩ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදි.

1. 6 කථාව

තවද මේ ප්‍රෙත වස්තු දෙශනාවෙහි උරග වර්ගයෙහි සවන **පවපුත්‍රබාදක ප්‍රෙතවස්තුව** කවරහයත්-හේ මෙසේ දතයුතු:-

සවීලොකෙක තිලකායමානවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි පඤ්චපුත්‍රබාදක ප්‍රෙතියකු හෙවත් පුතුන් පස්දෙනෙකු කන ප්‍රෙතදුවක් අරබයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කළසේක. සැවැත් නුවරට සමීප ගමක වනාහි එක්තරා කෙළෙඹී පුත්‍රයෙකු ගේ භාය්‍යාව වඳවූයේය. ඒ කෙළෙඹියා ගේ නෑයෝ ''නුඹේ භාය්‍යාව දරුවන් නැත්තීය, එහෙයින් නුඹට අන් ස්ත්‍රියක් ගෙනෙමුය''යි මෙසේ කීවාහුය. ඒ කෙළෙඹියා ඒ බිරින්ද කෙරෙහි සෙනහ යෙන් නොකැමැතිවිය. එවිට ඔහුගේ බිරින්ද එපවත් අසා ස්වාමි පුරුෂයාහට මෙසේ කීවේය. ''ස්වාමිය මම වඳවෙමි, අනික් ස්ත්‍රියක් ගෙනායුතුය, නුඹ වහන්සේගේ කුලවංශය ගෙන-යනු මැනව''යි කියා ඈ විසින් පීඩාකරනු ලබන්නාවූ ඒ පුරුෂතෙම අන්‍ය ස්ත්‍රියක් ගෙනායේය. ඕතොම මැතකලෙක ගැබිනී විය. වඳ ස්ත්‍රී තොම ''මෑ පුතෙකු ලැබ මේ ගෙදරට ඉසුරු වන්නීය''යි සිතා ඊෂ්‍යාවෙන් මඩනා ලදුව ඇගෙ දරු ගැබ හෙලීමට උපායක් සොයන්නී එක්තරා පරිබ්‍රාජිකාවක් ආහාර පානාදියෙන් සන්තර්පණය කොට ඈ ලවා ඒ ස්ත්‍රියගෙ දරුගැබ වැටෙන බෙහෙත් දෙවීය. ඒ ස්ත්‍රිය දරුගැබ වැටුණු කල්හි තම මව්ට එපවත් කීය. මවුතොමෝ ස්වකීය ඥතීන් රැස් කරවා ඒ කාරණය ප්‍රකාශ කළේය. ඒ නෑයෝ ''තී විසින් මේ තැනැත්-තියගේ දරුගැබ හෙලන ලද්දේදැ''යි වඳ ස්ත්‍රියගෙන් මේ කාරණය විවාළෝය. එවිට ''මම දරුගැබ නොහෙලුවෙමි''යි ඈ කීවේය. ''ඉදින් තී විසින් ගැබ නොහෙලන ලද්දේනම් දිවි රීමක් කරව''යි කී කල්හි ''ඉදින් මා විසින් ගර්භය හෙලන ලද්දේ නම් දුගතිපරායණව සාපිපාසායෙන් මඩනා ලදුව සවස් කාලයෙහි හා උදය කාලයෙහිත් දරුවන් පස් පස්දෙන බැගින් වද ඒ වැදූ දරුවන් තෙමේම කා සෑහීමකට නොපැමිණෙන් නෙමියි, නිතර දුර්ගන්ධවූ නිලමැස්සන්ගෙන් ගැවසීගත්තාවූ

Non-commercial distribution

ශරීර ඇත්තියක්ද වන්නෙමි''යි බොරුකියා දිවිරීම කළේය. ඒ **බොරු** දිවුළ ගැහැණිතොමෝ නොබෝකලකින් කළුරිය කොට **එම** ගමට සමීප තැනක දුර්වර්ණ ස්වරූප ඇති ප්‍රෙතියක්ව උපන්-**නේය. එකල්හි** ජනපදයෙහි වස්විසූ තෙරුන්වහන්සේ අටනමක් **බුදුන් දක්නා පිණිස** සැවත්නුවරට වඩින්නාහු එගමට නුදුරු **තැනක** සිහිල් සෙවණින් හා ජලයෙන් යුත් වනයක විසීමට **පැමිණියා** හුය, එකල්හි ඒ ප්‍රෙතදුව තෙරුන් වහන්සේලාට තමා දැක්වීය. ඒ තෙරුන් අතුරෙන් සංඝස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතියගෙන් විචාරන්නාහු:-

27 නග්ගා දුබ්බණ්ණ රූපාසි-දුග්ගන්ධා පූති චායසි,
මක්ඛිකා පරිකිණ්ණාව-කානු ත්වං ඉධ තිට්ඨසි''ති.

27. නග්ගා, නිවීස්ත්‍රුව; දුබ්බණ්ණරූපා අසි, විරූපවූ ඉතාම බියකරු දැකුම් ඇති රූපයෙන් යුක්ත වූයෙහිය: දුග්ගන්ධා, දුගඳ වූ; පූති, ශරීරයෙන් කුණුගඳ; වායසි, හමන්නෙහිය, මක්ඛිකා **පරිකිණ්ණාව**, හාත්පස නිලමැස්සන්ගෙන් ගැවසී ගත්තී වෙයි; **කානුත්වං**, කිනම් වූ තී; ඉධ, මෙතන; තිට්ඨසි, සිටින්නෙහිද.

එම්බල ප්‍රෙතිය! තී නිවීස්ත්‍රුව ඉතාමත් බියකරු රූපයෙන් යුක්තවන්නෙහිය, නපුරු ගඳ ඇත්තිය, ශරීරයෙන් කුණුපගඳ හමන්නේය, හාත්පස නිලමැස්සන්ගෙන් ගැවසීගත්තේමය, මෙබඳුවූ තී මෙතැන ඔබිමොබ හැසිරෙන්නී කිනම් තැනත්ති යක්දැයි කියා ගාථාවකින් පිළිවිසූසේක. එකල්හි තෙරුන්වහන් **සේ** විසින් මෙසේ විචාරණලද්දවූ ඒ ප්‍රෙතී තොමෝ තමාගේ තතු ප්‍රකාශ කරන්නී සත්වයන්ට සංවේග උපදවමින්:-

28. අහං භදන්තෙ පෙතිම්හි-දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා.

29. කාලෙන පඤ්චපුත්තානි-සායං පඤ්ච පුනාපරෙ,
විජායිත්වාන ඛාදමි-තෙපි නා හොන්ති මෙ අලං.

30. පරිඩය්හති ධුමායති-ඛුදය හදයං මම,
පානීයං නලභෙ පාතුං-පස්ස මං ව්‍යසනං ගත-න්ති.

28. භදන්තෙ, ස්වාමීන්වහන්ස; අහං, මම; දුග්ගතා, දුකට පැමිණියාවූ; යමලොකිකා, යමලොකයයි ලද නම් ඇති ප්‍රෙත ලොකයහි උපන්නාවූ; පෙතිඅම්හි, ප්‍රෙතියක්වෙමි; පාපකම්මං

Non-commercial distribution

කරිත්වාන, පාපකම්යක් කොට; ඉතො, මේ මිනිස්ලොවින්; පෙත ලොකං, ප්‍රෙතලොකයට; ගතා, ඉපදීම් වශයෙන් පැමිණියා වෙමි.

29. කාලෙන, උදය කාලයෙහි; පංචපුත්තානි, පුතුන් පස් දෙනෙකුන්ද; පුන, නැවත; සායං, සවස් කාලයෙහි, අපරෙපංච, තවත් දරුපස්දෙනෙකුන්ද; විජායිත්වාන, වද; ඛාදමි, කමි; තෙ අපි, ඒ දරු දසදෙනම; මෙ, මාගේ; (ක්ඛුධා විනොදනාය පිණිස) අලංනාහොන්ති, පමණ නොවෙත්.

30. මම, මාගේ; හදයං, හෘදය; බ්‍රූදය, ක්ඛුධාග්නියෙන්; පරිඩයහ්ති, හාත්පස දැවෙයි; ධූමායති, දුමන්නේවේ; පානීයං, පියයුතු පැන්; පාතුං, බොන්ට; නලභෙ, නොලබමි; ව්‍යසනං ගතං, (මෙබඳු) විපතකට පැමිණියාවූ; මං, මා; පස්ස, බලනු මැනවි.

ස්වාමීන් වහන්ස මම දුකට පැමිණියාවූ යමලොකයයි ලද නම් ඇති ප්‍රෙත ලොකයෙහි උපන්නාවූ ප්‍රෙතියක් වෙමි, මිනිස් ලොවදී පව්කම් කොට මේ මිනිස් ලොවින් ප්‍රෙත ලොකයට උත්පත්ති වශයෙන් පැමිණියේ වෙමි.

ඒ මම උදය කාලයෙහි දරු පස්දෙනෙකුන්ද නැවත සවස් කාලයෙහි තවත් දරු පස්දෙනෙකුන්ද ප්‍රසූතකොට කමි. ඒ දරු දසදෙනාද එකදවසක් මට කුසගින්න නිවාගැනීමට ප්‍රමාණ නොවෙත්.

බඩගින්නෙන් පෙළෙන්නාවූ මාගේ හෘදය උදරාග්නියෙන් හාත්පස තැවෙයි. දුමන්නේවෙයි. පිපාසායෙන් මඩනාලදුව ඒ ඒ තැන ඇවිදින්නී පැන්බොන්ට නොලබමි. ස්වාමීනි ප්‍රෙතොපත්ත්තියෙන් සාධාරණවූද අසාධාරණවූද මෙබඳු විපතකට පැමිණි මා බලනු මැනවයි මේ ගාථාතුන කියා තමා විසින් විඳිනු ලබන්නාවූ දුක තෙරණුවන්ට ප්‍රකාශකළේය. තෙරුන්වහන්සේ එපවත් අසා ඒ ප්‍රෙතිය විසින් කරනලද අකුශලකර්මය විචාරණ සේක්:-

31. ''කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මස්ස විපාකෙන-පුත්තමංසාති ඛාදසි''ති.

Non-commercial distribution

31. කායෙන, කායවාරයෙන්ද; වාචාය, වාග්වරයෙන්ද; මනසා, මනොවාරයෙන්ද; කින්නුදුක්කටං, කිනම් දුශ්චරිතයක්: කතං, කරනලද්දේද; කිස්ස කම්මවිපාකෙන, කවර අකුශල කර්මයක්හුගේ විපාකයකින්; පුත්තමංසානි, දරුමස්; ඛාදසි, කන්නෙහිද;

ප්‍රේතිය නී විසින් කයින් වචසින් මනසින් කිනම් දුශ්චරිත යක් පෙරකරන ලද්දේද, කෙබඳු කර්මයක්හුගේ විපාකයකින් නී පුත්‍රමාංස කන්නෙහිදැයි කියා ගාථාව වදළසේක. තෙරණුවන් එසේ ඇසූ කල්හි ඒ ප්‍රේතිය තමා කළ කර්මය තෙරණුවන්ට කියන්නී:-

32. සපත්ති මෙ ගබ්භිනී ආසි-තස්සා පාපං අචෙතයිං,
සාහං පදුට්ඨමනසා-අකරිං ගබ්භපාතනං.

33. තස්සා චෙමාසිකො ගබ්භො-ලොහිතඤ්ඤෙවපග්ඝරි,
තදස්සා මාතා කුපිතා-මය්හං ඤාති සමානයි.

34. සපථඤ්ච මං කාරෙසි-පරිහාසාපයි ච මං,
සාහං සොරඤ්ච සපථං-මුසාවාදං අභාසිසං.

35. පුත්තමංසානි ඛාදමි-සබෙ තං පකතං මයා,
තස්ස කම්මස්ස විපාකෙන-මුසාවාදස්ස උභයං,
පුත්තමංසානි ඛාදමි-පුබ්බ ලොහිතමක්ඛිකා''ති.

32. මෙ, මාගේ; සපත්ති, සමාන ස්වාමියා ඇති; ගබ්භිනී, ගර්භිණී ස්ත්‍රියක්; ආසි, විය; තස්සා, ඈ කෙරෙහි; පාපං, රෞද්‍රවූ කර්මයක්; අචෙතයිං, සිතීමි; සා අහං, ඒ මම; පදුට්ඨමනසා' ප්‍රදුෂ්ටසිතින්; ගබ්භපාතනං, ඇගේ දරුගැබහෙළීම; අකරිං, කළෙමි.

33. තස්සා, ඇගේ; චෙමාසිකො, හටගන දෙමසක්වූ; ගබ්භො, දරුගැබ; ලොහිතං එව, ලෙයමව; පග්ඝරි, වැහුරුණේ ය; තද, එකල, අස්සා, ඇගේ; මාතා, මව්තොම; මය්හං, මට; කුපිතා, කිපී; ඤාති, (සිය) නෑයන්; සමානයි, රැස්කරවිය;

34. මං, මාලවා; සපථං කාරෙසි; (ඇගේ මවුතොම) දිවි රිමද කරවිය; මං; මා; පරිහාසාපයිච, බියෙන් තැතිගැන්විය; සා අහං, ඒ මම; සොරංච, දරුණුවූම; සපථං, දිවුරුම්කොට; මුසා-වාදං, බොරුබස්; අභාසිසං, කීයෙමි.

Non-commercial distribution

35. සචෙ, ඉදින්; මයා මාවිසින්; තං, ඒ පුත්‍රගර්භපාතනය; පකතං, කරනලද්දේනම්; පුත්තමංසානි, ස්වකීය පුත්‍රමාංස; ඛාදමි, කන්නියක්වෙමියි; තස්ස කම්මස්ස, ඒ ගර්භපාතන වශ යෙන් ප්‍රවෘත්තිතවූ ප්‍රාණඝාත කර්මයාගේද; මුසාවාදස්සච, මුසා වාද අකුශල කර්මයාගේද; උභයං විපාකෙන, විපාකවය කරණ කොට; පුබ්බලොහිතමක්ඛිතා, පූයාවෙන් හා ලෙයින් වැකුණු සිරුර ඇතිව; පුත්තිමංසානි, දරුමස්; ඛාදමි, අනුභව කරමි.

ස්වාමීනි ගර්භණීවූ මාගේ සමාන හිමියා ඇති ස්ත්‍රියක්විය, සමාන ස්වාමියා ඇති ඈ කෙරෙහි රෞද්‍රවූ කියාවක් සිතුවෙමි. ඒ මම කෝපවූ සිතින් ඇගේ දරුගැබ හෙළීම කෙළෙමි.

ඇගේ දෙමස්වූ දරුගැබ ලෙයම වී වැගුරුණේය, එකල ඇගේ මව මට කිපී තම නෑයන් රැස්කරවීය.

ඇගේ මව්තොමෝ මාලවා දිවුරුමද කරවිය, මා බියෙන් තැතිගැන්විය, ඒ මම දරුණුවූ බොරු දිවුරුම්කොට කීයෙමි, හෙවත් ඉදින් ඒ දරුගැබ හෙළීම මා විසින් කරන ලද්දේනම් මෙබඳු තැනැත්තියක් වෙම්වායි කියා කරනලද්දවූම පාපකර්මය නොකරනලද්දක් කොට දක්වමින් දිවුරුම් වශයෙන් බොරු කීවෙමි.

ඉදින් මා විසින් මේ ගර්භපාතන අකුශලකර්මය කරන ලද්දේ නම් මතු භවයෙහිදී මාගේ පුත්‍රමාංසයන්ම කන්නෙමියි කියා බොරු දිවුරුවෙමි, ඒ ගැබහෙළීම වශයෙන් පැවැති ප්‍රාණඝාත අකුශල කර්මයාගේද මුසාවාද අකුශල කර්මයාගේද යන උභය කර්මයාගේම උභය විපාක කරණකොටගෙන සැර– වයෙන් හා ලෙහෙයෙන් තැවරුණ ශරීර ඇතිව පුත්‍රමාංස අනුභව කරමියි කීයේය.

මෙසේ ඒ ප්‍රෙතිය තමාගේ කර්ම විපාකය ප්‍රකාශකොට නැවත තෙරුන්වහන්සේට මෙසේ කීයේය:–

''ස්වාමීනි මම මේ ගමම අසවල් කෙළෙඹියාහට භාර්‍යාවී ඊර්ෂ්‍යාවෙන් මඩනාලදුව දරුණු පව්කම්කොට මෙසේ ප්‍රෙත යොනියෙහි උපනිමි, ස්වාමීනි, ආයාචනා කරමි ඒ කෙළෙඹි යාගේ ගෙදරට ඔබවහන්සේ වඩිනු මැනව, එවිට ඒ කෙළෙඹි පුත්‍රතෙම නුඹවහන්සේලාට දන්දෙන්නේය, ඒ දනය ඔහු ලවා

Non-commercial distribution

මට දෙවනු මැනවි. එසේකළ කල්හි මේ ප්‍රෙතලොකයෙන් මාගේ මිදීම වන්නේය''යි කීයේය. තෙරුන්වහන්සේලා ඒ කථාව අසා ඇට අනුකම්පා කරමින් ඇ ඒ දුකින් මුදවන ස්වභාව යෙහි පිහිටියෝව ඒ කෙළෙඹියාගේ ගෙදරට පිඬුපිණිස වැඩි-යෝය. කෙළෙඹියා තෙරුන්වහන්සෙලා දැක හටගත් පැහැදීම් ඇතිව පෙරගමන්කොට පාත්‍රයන් රැගෙන තෙරුන්වහන්සේලා අසුන්හි වඩාහිඳුවා ප්‍රණීත ආහාර වළඳවන්ට පටන්ගත්තේය. තෙරුන්වහන්සේලා ඒ කථා ප්‍රවෘත්තිය කෙළෙඹියා හට කියා ඒ දානය ඒ ප්‍රෙතියට දෙවුසේක. එකෙණෙහිම ඒ ප්‍රෙතිය ඒ ප්‍රෙත දුකින් මිදී උදරවූ සම්පත් පිළි ලබා රාත්‍රිකාල යෙහි කෙළෙඹි පුත්‍රයාහට තමා දක්වීය. පසුව තෙරුන්වහන්සේලා අනුක්‍රමයෙන් සැවැත්නුවරට වැඩමවා බුදුරජාණන්වහන්සේට එපවත් සැළකළාහුය. භාග්‍යවතුන්වහන්සේ ඒ කාරණය අර්ථොත්පත්තිකොට පැමිණි පිරිසට දහම් දෙසූ සේක. එකල මහජනතෙමේ ලද සංවෙග ඇතිව ඊෂ්‍යාමාත්සර්‍ය්‍ය අකුශලයෙන් වැළකුණේය. මෙසේ ඒ ධර්මදෙශනා කොමෝ මහාජනයාහට සාර්තක විය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරගවර්ගික සවන පංචපුත්‍රබාදක ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී,

1. 7 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනාඅයෙහි උරගවර්ගයෙහිවූ සත් වන **සප්තපුත්‍ර බාදක ප්‍රෙතවස්තුව** කවරහයත්:–

සනරාමර ලොකශිවංකරවූ සර්ව්ඥරාජොත්තමයාණන්වහන් සේ දෙවුරම්වෙහෙර වැඩවාසයකර වදරනකල්හි දරු සත්දෙ නෙකුන් කන ප්‍රෙතියකු අරභයා මේ වස්තුව දෙශනා කළසේක.

සැවැත්නුවරට නුදුරු එක්තරා ගමෙක වනාහි එක්තරා උපාසකයෙකුහට පළමු වයසෙහි සිටි රූපසම්පත්තියෙන් සමෘඩවූ ශීලාචාරගුණ සමන්විතවූ පුත්‍රයෝ දෙදෙනෙක් වුහ. ඒ පුතුන් ගේ මව්තොමෝ මම පුත්‍රයන් ඇත්තියක් වෙමියි සිතා පුත්‍රයන් ගේ වශයෙන් (අහංකාර උපදවා) ස්වාමිපුරුෂයාට අවමන් කෙරෙයි. බිරින්ද විසින් අවමන් කරනලද ඒ පුරුෂතෙම කල කිරුණු සිත් ඇතිව අන් ස්ත්‍රියක් ගෙනායේය. ඇ නොබෝ

Non-commercial distribution

කලකින් ගර්භිණී විය. එකල්හි ඒ පුරුෂයාගේ පළමු බිරින්ද ඊෂ්‍යාවෙන් මඩනාලදුව එක්තරා වෙදෙකු ආමිසයෙන් සංග්‍රහ කොට ඔහු ලවා ඇගේ තෙමස්වූ දරුගැබ පතනය කරවිය. එවිට නෑයන් විසින්ද ස්වාමියා විසින්ද ''තී විසින් මැගේ දරුගැබ හෙලවන ලද්දේදැ''යි විචාරණ ලද්දවූ ඕතොමෝ ගැබ හෙළීම නොකෙරෙව්වෙමියි බොරුකියා එය නොඅදහන්නාවූ ඔවුන් විසින් ''දිවිරිම කරවා''යි කියන ලදුව සවස්කාලයෙහි හා උදය කාලයෙහි දරුවන් සත් සත්දෙනා වද දරුමස් කන්නියක් වෙමියි, නිතර දුගඳව නිලමැස්සන්ගෙන් ගැවසීගත්තියක්ද වන්නෙමියි කියා දිවුළේය ඕතොමෝ මෑතකලෙක කළුරිය කොට ඒ ගර්භපාතන අකුශල කර්මයාගේද, මුසාවාද අකුශලයා ගේද විපාකයෙන් ප්‍රෙතයොනියෙහි උපන්නී කියනලද ක්‍රම යෙන්ම හෙවත් යටකී ප්‍රෙතදුව මෙන්ම දරුමස් කමින් එම ගමට සමීප තන්හි හැසිරෙයි එසමයෙහිද බොහෝ තෙරුන්වහන්සේලා ග්‍රාමාවාසයක වස්වැස පවරා බුදුරජාණන් වහන්සේලා දක්නා පිණිස සැවැත්නුවරට එන්නාහු එගමට නුදුරු තන්හි එක් පෙදෙසක රාත්‍රියෙහි වාසය කළෝය. එකල්හි ඒ ප්‍රෙතිය ඒ තෙරුන්වහන් සේලාට තමා දැක්වීය. එකල්හි මහතෙරුන් වහන්සේ ඇගෙන්:-

36. *නග්ගා දුබ්බණ්ණ රූපාසි-දුග්ගන්ධා පූති වායසි,
මක්ඛිකා පරිකිණ්ණාව-කානු ත්වං ඉධ තිට්ඨසි-නි.

නග්නව විරූප වූ බියකරු රූපයෙන් යුක්තව දුර්ගන්ධ වූ කුණු ගඳ හමන්නා වූ භාත්පස නිලමැස්සන්ගෙන් ගැවසී ගත් මෙහි සිටින තී කවරියක්දැයි ගාථාවෙන් විචාළසේක. තෙරුන් විසින් විචාරණ ලද ඒ ප්‍රෙති තොමෝ:-

37. †අහං භදන්තෙ පෙතිම්හි-දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා.

38. ‡කාලෙන සත්තපුත්තානි-සායං සත්ත පුනාපරෙ,
විජායිත්වාන ඛාදමි-තෙපි නා හොන්ති මේ අලං.

39. පරිඩය්හති ධුමායති-බුදය හදයං මම,
නිබ්බුතිං නාධිගච්ඡාමි-අග්ගිදඩ්ඪාව ආතපෙ-නි.

Non-commercial distribution

ස්වාමීනි මම පාපකර්මයක් කොට මේ මිනිස් ලොව සිට ප්‍රෙත ලොකයට ඉපදීම වශයෙන් පැමිණියා වූ දුකට පත් වූ යමලොක යයි ලද නම් ඇති ප්‍රෙත යොනියෙහි උපන්නා වූ ප්‍රෙතියක් වෙමි.

උදය කාලයෙහි පුත්‍රයන් සත් දෙනෙකුන්ද නැවත සවස තවත් දරුවන් සත් දෙනෙකුන්ද ප්‍රසූත කොට අනුභව කරමි. ඒ දරු තුදුස්දෙනාම (කෑ නමුදු) මගේ බඩගින්න නිවීමට ප්‍රමාණ නොවෙත්.

39. බුදුය, බඩගින්නෙන් (පෙළෙන්නා වූ); මම හදයං, මාගේ හෘදය; පරිඩය්හති, භාත්පස දැවෙයි; ධූමායති, දුම් නගන්නේ වෙයි; ආතපෙ, අධික උෂ්ණ වූ අව්ව ඇති කල්හි; අග්ගිදඩ්ඪාඉව, ගින්නෙන් දැවුණු තැනැත්තියකු මෙන්; නිබ්බුතිං, සාපිපාසා දුක් සන්සිඳීමට; නාධිගච්ඡාමි, නොපැමිණෙමි.

මාගේ හෘදය බඩගින්නෙන් භාත්පස දැවෙයි, දුම් නගන්නේය උෂ්ණ වූ අව්ව ඇති කල්හි ගින්නෙන් දැවෙන්නියකු මෙන් සාපිපාසා දුක් සංසිඳීමකට නොපැමිණෙමි යයි කියා ගාථා තුනකින් ප්‍රතිවචන දුන්නේය. ඒ කථාව අසා මහා ස්ථවිරයන් වහන්සේ ඈ විසින් පෙර කරන ලද අකුශල කර්මය විචාරණ සේක්:-

40. *කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-පුත්තමංසානි ඛාදසි-නි.

එම්බල ප්‍රෙතිය නී විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශලකර්මයක් පෙර කරන ලද ද කවර අකුශල කර්මයක්හුගේ විපාකය කරණ කොට ගෙන දරු මස් කන්නෙහිදැයි ඇසූහ. එවිට ඒ ප්‍රෙතිය තමාගේ ප්‍රෙතලොකොත්පත්තියට හා පුත්‍රමාංස භක්ෂණයටත් කාරණය කියමින් මේ ගාථාවෙන් ප්‍රකාශ කළේය.

41. අහු මය්හං දුවෙ පුත්තා-උභො සම්පන්නයොබ්බනා,
සාහං පුත්තබලූපෙතා-සාමිකං අති මඤ්ඤිස.

42. තතො මෙ සාමිකො කුඩ්ඩො-සපත්තිං අඤ්ඤමානයි,
සා ච ගබ්භං අලභිත්ථ-තස්සා පාපං අවෙතයි.

43. සාහං පදුට්ඨමනසා-අකරිං ගබ්භපාතනං,
තස්සා තෙමාසිකො ගබ්භො-පූතිලොහිතකො පති.

Non-commercial distribution

44. †තදස්සා මාතා කුපිතා-මය්හං ඤාති සමානයි,
සපථං ච මං කාරෙසි-පරිභාසාපයි ච මං.

45. ‡සාහං සොරඤ්ච සපථං-මුසාවාදං අභාසිසං,
පුත්තමංසානි ඛාදමි-සවෙ තං භකතං මයා.

46. *තස්ස කම්මස්ස විපාකෙන-මුසාවාදස්ස චුභයං,
පුත්තමංසානි ඛාදමි-පුබ්බාලොහිත මක්ඛිතා-ති.

41. මය්හං, මගේ; දුවෙ පුත්තා අහු, පුත්‍රයෝ දෙදෙනෙක් වූහ; උභො, දරු දෙදෙන; සම්පන්නයොබ්බනා, සමෘද්ධ වූ යොවුන් වයස් ඇතිවූහ; සා අහං, ඒ මම; පුත්තබලූපෙතා, පුත්‍ර බලයෙන් යුක්තවූවා; සාමිකා, ස්වාමිපුරුෂයා; අතිමඤ්ඤිසං, අතික්‍රමණය කොට සිතුවෙමි.

42. තතො, ඒ හෙතුවෙන්; සාමිකො, හිමි තෙමේ; මෙ, මට; කුද්ධො, කිපුණේ; සපත්තිං, සෙවෙතක්; අඤ්ඤං, අන් ස්ත්‍රියෙකු; ආනයි, ගෙනායේය; සාච, ඕතොමෝද; ගබ්භං අල භිත්ථ, දරු ගැබක් ලැබීය; තස්සා, ඈ කෙරෙහි; පාපං, පාප කර්මයක්; අචෙතයිං, සිතුවෙමි.

43. සා අහං, ඒ මම; පදුට්ඨමනසා, ප්‍රදුෂ්ට සිතින්, ගබ්භ පාතනං, ගැබහෙලිම; අකරිං, කෙළෙමි; තස්සා, ඇගේ; තෙමාසි කො ගබ්භො, තෙමස් වූ ගැබ; පූතිලොහිතකො, කුණු ලේවී; පති, වැටුණේය.

ස්වාමීනි, මට පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. ඒ දෙදෙන සම්පූර්ණ යොවුන් වයස් ඇති වූහ. පුත්‍ර බලයෙන් යුක්ත වූ ඒ මම ස්වාමි පුරුෂයා පහත් කොට සිතුවෙමි.

ඒ හේතුවෙන් හිමියා මට කිපී සෙවෙතක් අන් ස්ත්‍රියක් ගෙනායේය. ඈ තොමෝ ද දරු ගැබක් ලැබීය. ඈ කෙරෙහි රෞද්‍ර පාප කර්මයක් මම සිතුවෙමි.

ඒ මම ක්‍රෝධ සිතින් දරු ගැබ හෙළීම කෙළෙමි. ඇගේ තෙමස් ගත වූ දරු ගැබ කුණු ලේ වී වැටුණේය. එකල්හි ඇගේ මව මට කිපී තම නෑයන් රැස්කර වීය. මා ලවා දිවුර විය. මා බියෙන් තැති ගැන්විය.

Non-commercial distribution

ඒ මම දරුණු වූ බොරු දිවුරුම් කොට කීවෙමී. ඉදින් මා විසින් මේ ගැබ් හෙලීම් අකුශලය කරන ලද්දේ නම් මතු භවයෙහි දී මාගේ දරු මස්ම කන්නෙක් වෙමිවා කියා බොරු දිවුරු වෙමී.

ඒ ගැබ් හෙලීම අකුශලයාගේ ද, බොරු කී අකුශල කර්මයා-ගේ ද යන කර්ම දෙදෙනාගේම විපාකයෙන් සැරවයෙන් හා ලෙයින් තැවරුණ ශරීර ඇතිව දරු මස් කමියි කියේය.

සසු සියල්ලම මීට පළමු කී ප්‍රෙත වස්තුව හා සමානවේ මය. ඒ වස්තුවෙහි කියන ලද්දේ තෙරුන් වහන්සේලා අට නමකි. මෙහි බොහෝ තෙරුන් වහන්සේලා කියන ලදහ. ඒ කථායෙහි පුත්‍රයෝ පස් දෙනෙකි. මෙහි සත් දෙනෙකැයි යන මෙයම වෙනස වේ. මෙසේ ඒ ප්‍රෙතිය තමන්ගේ කර්මය ප්‍රකාශ කොට නැවත මහ තෙරණුවන්ට මෙසේ කීයේය.

ස්වාමීන් වහන්ස, මම මෙම ගම අසවල් කෙළෙඹියාහට භාර්‍යාවක් වී ඊර්ෂ්‍යාවෙන් මඩනා ලදුව පව්කම් කොට මෙසේ ප්‍රෙත යෝනියෙහි උපනිමි. ස්වාමීනි, ආයාචනා කරමි. ඒ කෙළෙඹියා ගේ ගෘහයට වඩිනු මැනවී. එවිට ඒ කෙළෙඹි තෙම නුඹ වහන්සේලාට දන් දෙන්නේය. ඒ දානය මට ඔහු ලවා උදෙසවනු මැනවි. එසේ කළ කල්හි ප්‍රෙත ලෝකයෙන් මගේ මිදීම වන්නේ යයි කියේය. තෙරුන් වහන්සේලා එපවත් අසා අනුකම්පා කරමින් ඈ ප්‍රෙත දුකින් මුදවන ස්වභාවයෙහි පිහිටියාහු ඒ කෙළෙඹියාගේ ගෙදරට පිඬු පිණිස වැඩියාහුය. කුටුම්බික තෙම තෙරුන් වහන්සේලා දැක හටගත් ප්‍රසාද ඇතිව පෙර ගමන් කොට තෙරුන් වහන්සේලා අසුන්හි වඩා හිඳුවා ප්‍රණීතාහාර වලඳවන්ට පටන්ගත්තේය. තෙරුන් වහන්සේලා ඒ කථා ප්‍රවෘත්තිය කෙළෙඹියාහට කියා ඒ දානය ඒ ප්‍රෙතියට උදෙසෙව්වාහුය. එකෙණෙහිම ඒ ප්‍රෙතිය ඒ දුකින් පහව මහත් සම්පත් ලබා කෙළෙඹියාහට තමා දක්වීය. නැවත තෙරුන්-වහන්සේලා පිළිවෙළින් සැවැත්නුවරට වැඩ බුදුන්ට එකරුණ සැලකළාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්-පත්තිකොට පැමිණි පිරිසට ධර්මදේශනා කළසේක. දේශනාව මහාජනයාහට ප්‍රයෝජන විය.

Non-commercial distribution

(බොරුකීම, බොරු දිවිරීම, දරුගැබ් හෙලීම, ගැබ්හෙලීමට විෂ බෙහෙත් යෙදීම් ආදිවූ දරුණු පව්කම්වලින් මතුභවයෙහිදී ලැබෙන ඉතා කටුක දුක් විපාක මේ කථාවෙන් හා මීට පළමු කී කථාවෙනුත් මනාසේ දැනගෙන පව්කම්වලින් නිතර වැලකී විසිය යුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි පළමුවන උරග වර්ගයෙහිවූ සත්වන සප්තපුත්‍රබාදක ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදි.

1. 8 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරග වර්ගයෙහි අටවෙනි **ගොන ප්‍රෙතවස්තුව** කවරේදයත්. හේ මෙසේ දතයුතු.

අසරණ සරණ කරුණා නිධාන වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසනසේක්, පියා මළාවූ එක්තරා කෙළෙඹියෙකු අරබයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කළසේක.

සැවැත්නුවර වනාහි එක්තරා කෙළෙඹියෙකුගේ පියා කළුරිය කෙළේය. ඒ කෙළෙඹියා පියාණන්ගේ මරණය කරණකොට ශොකයෙන් තැවෙන සිත්ඇතිව විලාප කියමින් උමතුවකු මෙන් ඇවිදිමින් යම් යම් ජනයෙකු දුටුවේනම් ඒ ඒ අයගෙන් ''කිමෙක්ද මාගේ පියා තොපි දුටුවාහුද''යි විචාරයි. එසේවූ කෙළෙඹියාගේ ශොකය පහකරන්ට කිසිවෙකුට නොහැකිවිය. ඒ කෙළෙඹියාගේ හෘදයෙහි වනාහි කළය තුළ දැල්වූ පහනක්සේ ශ්‍රොතාපත්ති ඵලයට හෙතු සම්පත් දිලිසෙයි. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ උදයකාලයෙහි ලොව බලා වදරනසේක් ඔහුගේ ශ්‍රොතාපත්ති ඵලයට හෙතුසම්පත් දැක වදරා ''මේ කෙළෙඹියා හට අතීත කාරණය ගෙනහැර දක්වා ශොකය සන්සිඳුවා ශ්‍රොතාපත්තිඵලයදීම වටනේය''යි සිතා වදරා දෙවෙනි දිනයෙහි පසු බත් වේලෙහි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩිසේක්, පශ්චාත් ශ්‍රමණයකු හැරගෙන ඔහුගේ ගෘහවාරයට වැඩිසේක. එවිට ඒ කෙළෙඹියා ''ශාස්තෘන්වහන්සේ වැඩිසේකැ''යි අසා පෙර ගමන් කොට බුදුන් ගෙට වැඩමවා ගෙන ගොස් ශාස්තෘවූ කථාගතයාණන් වහන්සේ පණවනලද අස්නෙහි

Non-commercial distribution

වැඩහුන්කල්හි තමා භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක සිටියේ ''කිමෙක්ද ස්වාමීනි මාගේ පියාණන් ගියතැන නුඹ-වහන්සේ දන්නාහුදැයි විචාළේය. එකල ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ඕහට වදරනසේක් ''කිමෙක්ද උපාසකය නුඹ මේ අත්බැව්හිවූ පියා විචාරන්නේද? නොහොත් අතීතයෙහිවූ පියා විචාරන්නේදැ''යි අසා වදළසේක. ඒ කෙළෙඹියා බුදුන්ගේ ඒ වචනය අසා ''මාගේ පියවරු බොහෝ වෙත්ලැ''යි සිතා තුනීවූ ශොක ඇත්තේ ස්වල්පයක් මඩ්‍යස්ථතා ලැබීය. එකල්හි තථා-ගතයන් වහන්සේ ඔහුගේ ශොක විනොදනය පිණිස දැහැමී කථාවක් කොට පහවූ ශොක ඇති මෘදුවූ සිත් ඇති බව දැන චතුස්සත්‍යාන්තර්ගතවූ ධර්මදෙශනාවෙන් ශ්‍රොතාපත්ති ඵලයෙයි පිහිටුවා විහාරයට වැඩිසේක. ඉක්බිති භික්ෂූන් වහන්සේලා ධර්මසභායෙහිදී ''ඇවැත්නි බුඩානුභාවය බලනු මැනවි. එබඳු ශොකයෙන් මඩනා ලද්දවූ අතිශයින් ශොක කළාවූ උපාසකයා භාග්‍යවතුන් වහන්සේ විසින් ඇසිල්ලකින්ම ශ්‍රොතාපත්ති ඵල-යෙහි පිහිටුවන ලද්දේය''යි කථාව ඉපදවූහ. ශාස්තෘන්වහන්සේ එතනට වැඩමවා පණවනලද උතුම් බුඩාසනයෙහි වැඩ-හුන්සේක්. ''මහණෙනි දැන් කවර කථාවකින් යුක්තව තෙපි හුන්නහුදැ''යි අසා වදළසේක. භික්ෂූහු එපවත් බුදුන්ට සැල-කළාහුය. එකල බුදුරජාණන් වහන්සේ වදරනසේක්, ''මහණෙනි මා විසින් මොහුගේ ශොකය පහකරනලද්දේ දැන් පමණක්ම නොවෙයි, පෙරත් ශොකය පහකරන ලද්දේමය''යි වදරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ අතීත කථාව ගෙනහැර දක්වා වදළසේක.

යටගිය දවස බරණැස්නුවර එක්තරා ගෘහපතියකුගේ පියා කළුරිය කළේය. ඒ ගෘහපතියා පියාගේ මරණය කරණකොට ගෙන ශොකයට හා විලාපකිරීමට පැමිණියේ කඳුළු වැකුණු මුහුණ ඇතිව ලෙහි අත්ගසා හඬමින් ඔහුගේ ඇට තබනලද සැය පැද කුණුකරයි. එවිට ඔහුගේ පුත්‍රවූ පණ්ඩිතවූ ව්‍යක්තවූ බුඩි-සම්පන්නවූ සුජාත නම් කුමාරතෙම පියාණන්ගේ ශොකය පහකිරීමට උපාය සිතමින් එක්දවසක් බිහිනුවර මළ ගොනෙකු දැක තෘණ හා පැන්ද ගෙනවුත් ඒ ගොනුගේ ඉදිරියෙහි තබා පිඬුකොට දෙමින් ජීවත්ව සිටිනෙකුටමෙන් ඒ ගොනුට අණ-කරවමින් ''කාපිය කාපිය, බීපිය බීපිය''යි කියමින් සිටියේය.

Non-commercial distribution

එතනට පැමිණි පැමිණි ජනයෝ ඒ ක්‍රියාව දැක ''යහළු සුජාතය කිමෙක්ද යම් බඳුවූ නුඹ මළාවූ ගොනෙකුට තණ හා වතුර ගෙනවුත් දෙන්නේද නුඹ උමතුවෙක් වූයේද''යි කියත් හෙතෙම කිසිවක් නොකියයි. මිනිස්සු ඔහුගේ පියා හමුවට ගොස් නුඹේ පුත්‍රයා උමතු වූයේය, මළ ගොනෙකුට තෘණ හා ජලය දේය''යි කීවෝය. ඒ අසාම කෙළෙඹියාහට පියා සඳහා තුබූ ශොකය පහව ගියේය. මාගේ පුත්‍රයා උමතුවූයේ ලැයි ශොකයෙන් යුත් සිතින් වේගයෙන් අවුත් ''සුජාතය නුඹ පණ්ඩිතවූ ව්‍යක්තවූ බුඩිමත් කෙනෙක් නොවේද, කවර හෙයකින් මළගොනෙකුට තෘණොදකයන් දෙන්නේදැ''යි චොදනා කරමින්

47. **කින්නු උම්මත්ත රූපොව – ලායිත්වා හරිතං තිණං,**
බාද බාදති ලපසි – ගතසත්තං ජරග්ගවං,

48. **නහි අන්නෙන පානෙන–මතො ගොනො සමුට්ඨහෙ,**
ත්වංසි බාලොව දුම්මෙධො–යථා තඤ්ඤොව
දුම්මති – ති.

47. කින්නු, කිමෙක්ද; උම්මත්තරූපො ඉව, උම්තු 'ස්ව–භාවය ඇත්තෙකුමෙන් (හෙවත්) චිත්තවික්ඛෙපයට පැමිණියකු මෙන්; හරිතං තිණං, නිල්තණ; ලායිත්වා, කපාගෙනවිත්; ගත–සත්තං, දිවිපහවූ (මැරුණු); ජරග්ගවං, මහලු ගොනෙකු; බාද බාද ඉති, කාපිය කාපියයි; ලපසි, කියන්නෙහිද.

දරුව කිමෙක්ද නුඹ උමතු ස්වභාව ඇත්තෙකු මෙන් නිල්තණ කපා ගෙනැවිත් මළ සතෙක්වූ මහළු ගොනෙකුට මෙය කාපිය කාපියයි කියන්නේද.

48. අන්නෙන, ආහාරයෙන්ද (හෙවත්) දෙනලද නිල්තණ වලින් හෝ; පානෙන, පැනින් හෝ; මතො ගොනො, මළ ගොනා; නහිසමුට්ඨහෙ, නැහිටුවාලිය නොහැක්කේමය; දුම්මති, ප්‍රඥ රහිතවූ (හෙවත්) උමතුවූ; යථාතං අඤ්ඤෙ, අන්පුහුලෙකු යම්සේද; ත්වං, එසේ නුඹත්; දුම්මෙධො, ප්‍රඥනැති; බාලොව අසි, බාලයෙක්වූයේදැයි; යන ගාථා දෙක කීයේය.

නුඹ විසින් දෙනලද නිල්තණවලින් හෝ පැනෙන් මළ–ගොනා ලැබූ දිවි ඇත්තෙක්ව නොමනැඟී සිටින්නේය. නුඹ බාලයෙක් වූයේද ප්‍රඥ නැත්තෙක් වූයේද අන් නුවණ නැති උමතු

Non-commercial distribution

පුතුලෙකුමෙන් නුඹ නොමග යන්නෙක්වී ක්‍රියා කරේදැයි කීය. සුජාත කුමාරතෙම එය අසා පියාට හැඟවීම සඳහා තම අදහස ප්‍රකාශ කරමින් ගාථා දෙකක් කීයේය.

49. ඉමෙ පාදූ ඉමං සීසං-අයං කායෝ සවාලධි,
නෙත්තෝ තථෙව තිට්ඨන්ති-අයං ගොනෝ සමුට්ඨහෙ.

50. නායාකස්ස හත්ථපාදූ-කායෝ සීසඤ්ච දිස්සති,
රුදං මත්තිකථූපස්මිං-නනු ත්වඤ්ඤෙව දුම්මති-ති.

49. ඉමෙපාදූ, මේ සිව්පාද; ඉමං සීසං, බෙරයක්බඳු මේහිස ද; සවාල්ධි, වාලධිය සහිතවූ; අයං කායෝ, මේ ශරීරයද, නෙත්තා, මේ නෙත්‍රයෝද; තථාඑව, එසේම; තිට්ඨන්ති, තිබෙත්; (එ හෙයින්) අයං ගොනෝ, මේ ගොන්තෙම; සමුට්ඨහෙ, නැගී සිටින්නේයයි; (මගේ අදහස විය.)

මේ ගොනුගේ මේ සිව්පාද බෙරයක් වැනි මේ හිසද, වාල ධිය සහිතවූ මේ ශරීරයද, නෙත්‍රවයද, මරණයට පළමු යම්සේද එලෙසම දැනුත් තිබෙත්. මේ කාරණයෙන් මේ ගොනා නැඟී සිටින්නේයයි මගේ අදහස වන්නේය.

50. අය්‍යකස්ස, මුත්තණුවන්ගේ; හත්ථපාද, අත් පා හා; කායෝ, ශරීරයද; සීසඤ්ච, හිසද, නදිස්සති, නො දක්නා ලැබේ, මත්තිකථූපස්මිං, (ඇට බහා) මැටියෙන් කළ සෑය නිමිත්ත කොට; රුදං, හඬන්නාවූ; ත්වං එව, නුඹම; දුම්මතිනනු ඉති, නිෂ්ප්‍රාඥ නොවේද

පියාණන් වහන්ස මගේ මුත්තණුවන්ගේ අත්පා හෝ ශරීරය හෝ හිස හෝ දක්නා නොලැබෙති, හුදෙක් වනාහි ඔහුගේ ඇට බහා මැටියෙන් බඳනාලද සෑයම බලා හඬන්නාවූ නුඹ මට වඩා ගත ගුණයකින් සහස්‍ර ගුණයකින් නුවණ නැත්තෙක් වන් නේය, බිදෙනසුලු සංස්කාර ධර්මයෝ බිඳෙත්. එහිදී එය දත් අය ගේ කවරනම් විලාපයක්දැයි පියාණන්ට ධර්ම කීයේය. ඒ ධර්ම කථාව අසා බෝසතාණන්ගේ පියාණෝ ''මාගේ පුත්‍රයා පණ්ඩිත ය, මට කාරණය අහවන්ට මේ ක්‍රියාව කෙළේය''යි සිතා ''පුත්‍ර සුජාතය, සියලු සත්වයෝම මරණ ස්වභාව ඇත්තාහ''යි යනමේ කාරණය දැනගන්නාලදී. මෙතැන් පටන් මම ශොක නොකරන් නෙමි, ශොක හරණට සමතා නම් නුඹවැන්නෙකු වියයුතුයයි කියා පුතණුවන්ට ප්‍රශංසා කරමින් ගාථා සතර කීහ,

Non-commercial distribution

51. ආදිත්තං වත මං සන්තං-සතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං-සබ්බං නිබ්බාපයෙ දරං.

52. අබ්බුළ්හං වත මෙ සල්ලං-සොක හදය නිස්සිතං,
යො මෙ සොක පරෙතස්ස-පිතුසොකං අපානුදි.

53. ස්වාහං අබ්බුළ්හ සල්ලොඝම්-සීතීභූතොඝම් නිබ්බුතො,
නඝොවාමි නරොදම්-තව සුත්වාන මාණව.

54. එවං කරොන්ති සප්පඤ්ඤ-යෙ හොන්ති අනුකම්පකා,
විනිවත්තයන්ති සොකම්හා-සුජාතො පිතරං යථා-ති.

51. සතසිත්තං, ගිතෙල් ඉස්නාලද; පාවකං ඉව, ගින්නක් මෙන්; ආදිත්තං සන්තං, ශොකාග්නියෙන් ගිනිගත්තාවූම; මං වත, මා; වාරිනා ඔසිංචං විය, ජලය වත් කරන්නෙකුමෙන්; සබ්බං දරං. සියලු චිත්තදහය; නිබ්බාපයෙ,නිවන්නේය.

ගිතෙල් ඉස්නා ලද ගින්නක්මෙන් ඒකාන්තයෙන් ශොකාග් නියෙන් දැල්වුනාවූ මා (ගින්නට) ජලය වත්කලාක් මෙන් සියලු සිත්දැවිලි නිවූයේය.

52. මෙ, මාගේ; හදයනිස්සිතං, හෘදයනිශ්‍රිතවූ; සොකංසල් ලං, ශොකනමැති හුල; අබ්බුළ්හං වත, උදුරන ලද්දේය; යො, යම් කුමාරයෙක් තෙම; සොකපරෙතස්ස, ශොකයෙන් මඩනා ලද්දවූ; මෙ, මගේ පිතුසොකං, පියා අරබයා උපන් ශොකය; අපා නුදි, පහකළේද.

යම් පුත්‍රයෙක් මාගේ හෘදය නිශ්‍රිතවූ ශොක නැමැති හුල එකාන්තයෙන් ඉදුරුවේද ශොකයෙන් මඩනා ලද්දවූ මගේ පිතෘ ශොකය හෙවත් පිය මරණින්වූ ශොකය පහකළේද.

53. සො අහං, ඒ මම; අබ්බුළ්හසල්ලො අස්මි, ඉදිරුණු ශොක නැමැති හුල් ඇත්තේ වෙමි; සීතීභූතො අස්මි, සිහිල්වූයේ වෙමි; නිබ්බුතො අස්මි, නිවුණේ වෙමි; මාණව, පින්වත් මාණව කය; තවසුත්වාන, නුඹේ වචනය අසා, නසොවාමි' ශොකනො කරමි; නරොදම්, නොහඬමි.

පින්වත් මාණවකය ඒ මම නුඹේ වචනය අසා උදුරනලද ශොකනැමැති හුල් ඇත්තේවෙමි. සිහිල්වූයේ වෙමි, නිවුණු සිතැත්තේ වෙමි, දැන් මම ශොක නොකරමි, නොහඬමි,

Non-commercial distribution

54. යථා යම්සේ සුජාතො, සුජාතකුමාර තෙම;පිතරං, පියා; සොකමිහා, සොදුකින් (මුදලුයේද); සප්පඤ්ඤ, සප්‍රඥවූ; අනුකම්පකා, අනුකම්පාකාරීවූ: යෙ හොන්ති, යම් ජනකෙනෙක් වෙත්ද; (ඔව්හු) එවං කරොන්ති එසේ කරත්; විනිවත්තයන්ති, ශොකයෙන් මුදවත්

යම්සේ මේ සුජාත කුමාරතෙම තමාගේ පියා ශොකයෙන් මිදෙව්වේද එසේම අන්‍යවුද අනුකම්පා කරන යම් සප්ජනයෝ වෙත්නම් ඒ ප්‍රාඥයෝද එසේකරත්, ශොක සංසිඳවත්, පියව රුන්ටද අන්‍යයන්ටද උපකාර කරත්.

මාණවකයාගේ අවවාද වචන අසා පියතෙම පහවූ ශොකඇතිව ජලස්නානය කොට ආහාර අනුභව කොට කර්‍මාන්තයන් පවත්වා පසුව කළුරිය කොට ස්වර්‍ගපරායණ විය.

ශාස්තෘන් වහන්සේ මේ ධර්‍මදේශනාව ගෙනහැර දක්වා ඒ භික්‍ෂූන්ට චතුස්සත්‍ය ධර්‍මය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර බොහෝ ජනයෝ සොවාන්ඵලාදියෙහි පිහිටියාහුය. එකල්හි සුජාත කුමරයාණෝ නම් මේ කාලයෙහි ලොකස්වාමි වූ තථාගතයන් වහන්සේ වූසේක.

මව්පියාදීන්ගේ මරණින් ඇතිවන සෝ දුක් කනගාටු සන්සිඳුවා ගැනීමට මහොපදෙශයක්වූ මේ කථාව කාවිසිනුත් කියවා බලා සිත තබාගත යුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරගවර්‍ගයෙහිවූ අටවෙනි ගොන ප්‍රෙතවස්තු වර්‍ණනාව කියා නිමවනලදී.

1. 9 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරගවර්‍ගයෙහිවූ නව වෙනි **මහාපෙසකාර ප්‍රෙතවස්තුව** කෙසේදයත්:—

දිව්‍යමනුෂ්‍යලොකෙක ශාස්තෘවූ තථාගතයන් වහන්සේ සැවැත්නුවර වැඩවසන කල්හි එක්තරා පෙශකාර ප්‍රෙතියකු අරභයා මේ ප්‍රෙතවස්තුව වදළසේක. දෙළොස්නමක් පමණවූ භික්‍ෂූන් වහන්සේලා වනාහි බුදුන් සමීපයෙන් කමටහන් ගෙන වාසයට තැනක් සොයමින් වස්වසන කාලය ලභාවූකල්හි සිහිල් සෙවනින් හා ජලයෙන් යුක්තවූ සිත්කලුවූ එක්තරා අරණ්‍යයක් හා ඊටම

Non-commercial distribution

ඉතා නුදුරුවූ ඉතා ලංනුවූ ගොදුරු ගමද දැක ඒ අරණ්‍යයෙහි එක රැයක් වාසය කොට දෙවෙනි දිනයෙහි ගමට පිඬුපිණිස වැඩියාහුය. ඒ ගමද පෙශකර්මය කරන්නාවූ එකොළොස් දෙනෙක් වාසය කරත්. ඔවුහු ඒ භික්ෂූන් දැක උපන් සොම්නස් ඇතිව තම තමන්ගෙ ගෙට වැඩමවාගෙන ගොස් ප්‍රණීත ආහාරයෙන් වළඳවා ''ස්වාමීනි ඔබවහන්සේලා කොතන්හි වඩිනාසේක්ද'' යි ඇසුවාහුය. එවිට ''උන්වහන්සේලා අපට යම්තැනක පහසුනම් එතනට යන්නෙමුය'' යි කීහ. ''ස්වාමීනි එසේවී නම් මෙහිම වාසයකට යුතුය'' යි කියා වස්වැසීමට ආරාධනා කළෝය. භික්ෂූන් වහන්සේලා ඒ ආරාධනාව පිළිගත්හ. උපාසකවරු ඒ භික්ෂූන්ට ඒ අරණ්‍යයෙහි ආවාස කරවා දුන්නෝය. භික්ෂූන් වහන්සේලා එහි වස් එළඹියාහුය, ඒ ගම ජ්‍යෙෂ්ඨ පෙශකාරයා භික්ෂූන් දෙනමකට සිව්පසයෙන් සකස්කොට උපස්ථාන කළේය. අනික් පෙශකාරයෝ එකඑක භික්ෂුනමකටම උපස්ථාන කළාහුය. ජ්‍යෙෂ්ඨ පෙශකාරයාගේ භාය්‍යා තෙමෝ ශ්‍රද්ධා නැත්තීය, තුණුරුවන් කෙරෙහි ප්‍රසාද නැත්තීය, මිත්ථ්‍යාදෘෂ්ටි ඇත්තීය, මසුරුසිත් ඇත්තීය, එහෙයින් භික්ෂූන්ට මනාසේ උවටැන් නොකරන්නීය, ඒ පෙශකාරතෙම එය දැක ඇගේම බාලනැගනියන් ගෙනැවිත් තමන්ගේ ගෙයි ඓශ්වය්‍යය බාරදුන්නේය. ඈ ශ්‍රද්ධා සම්පන්නව සකස්ව භික්ෂූන් පොෂණය කළේය. ඒ සියලුම පෙශකාරයෝ වස්වැස පැවරූ භික්ෂූන් එක එක නමට එක එක සළුව බැගින් දුන්නාහුය, එහිදී මසුරු සිත් ඇති පළමුවෙනි පෙශකාරයාගේ බිරින්ද දුෂ්‍යවූ සිත් ඇතිව තමාගේ හිමියාහට පරිභව කළේය. ''නුඹ විසින් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට යම් ආහාරපාන දනයක් දෙන ලද්දේද ඒ දනය නුඹට පරලොවදී මලමුත්‍රවද සැරව හා ලේද වී පහළවේවා, වස්ත්‍ර දීලිසෙන අයොමය වස්ත්‍රවෙත්වා'' යි කීයේය. එගම විසූ ජ්‍යෙෂ්ඨ පෙශකාරයා පසුකලෙක කළුරිය කොට වින්ධ්‍ය පර්වත ස්ථවනයෙහි ආනුභාවසම්පන්න රුක්දෙවි-යෙක්ව උපන්නේය. ඒ ප්‍රධාන පෙශකාරයාගේ මසුරුවූ භාය්‍යාව වනාහි කළුරිය කොට ඒ රුක්දෙවියා වසන තැනට නුදුරුතන්හි ප්‍රෙත දුවක්ව උපන්නේය. ඒ ප්‍රෙතිය නග්නව දුර්වර්ණව සාපිපාසායෙන් මඩනා ලදුව ඒ බූමාටු දෙවියන් ලඟට ගොස් ''ස්වාමිය මම වස්ත්‍ර නැතිව බලවත් ක්ෂුධා පිපාසායෙන් මඩනාලදුව ඇවිදිමි, මට වස්ත්‍ර හා ආහාරපානත් දුනමැනව'' යි

Non-commercial distribution

කීය. එවිට ඒ දෙවිතෙම ඒ ප්‍රෙතියට දිව්‍ය ආහාරපාන දුන්නේය, ඒ ආහාර පානවලින් ඒ ප්‍රෙතිය විසින් ගත් ඇසිල්ලෙහිම මලමූත්‍ර බවට හා පූයා ලේ බවටත් පැමිණෙත්. දෙනලද සළුවද ඈ විසින් වැලඳගක්කල දිලිසෙන යපට වෙයි, ඒ ප්‍රෙතිය මහත් දුක් විඳිමින් ඒ වස්ත්‍රය හැරදමා හඬමින් ඇවිදින්නේය.

එසමයෙහි එක්තරා භික්ෂුනමක් වස්වැස නිමවා බුදුන් වැඳීමට යන්නේ මහත් ගැල් සමූහයක් සමග විහාරයට පැමිණියේය. ගැල්පදින්නෝ රාත්‍රියෙහි මගගෙවා ගොස් දවල්-කාලයෙහි වනයෙහි සත සෙවනින් හා ජලයෙන් යුක්තවූ ප්‍රදෙශයක් දක ගැල් මුදා මදක්කල් ගිමන් හැරියාහුය. ඒ භික්ෂුව වනාහි විවේක කැමති බැවින් මදක් ඉවත්ව සිහිල් සෙවනින් යුත් වන ලැහැබින් වැසුනාවූ එක්තරා රුකක්මුල සහළසිවුර පණවා හුන්නේ රාත්‍රියෙහි මග ගමන් විඩාවෙන් ක්ලාන්ත ශරීර ඇත්තේ නින්දට පැමිණියේය. ගැල්පදවන්නෝ විඩාසන්-සිඳුවාගන මගට පිළිපන්හ. ඒ භික්ෂුතෙම නොපිබිදියේය. පසුව සවස් කාලයෙහි නැගී සිට ගැල්පදවන්නන් නොදක්නේ එක්තරා නොමගකට බැස පිළිවෙළින් ඒ දෙවියා වසන තැනට පැමිණියේය. එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම ඒ මහණුන්නාන්සේ දක මනුෂ්‍ය ස්වරූපයෙන් ලඟට පැමිණ පිළිසඳර කථාකොට තම විමනට වැඩමවාගෙන පයගානා අඳුන් ආදියදී ලංව හුන්-නේය. එකල්හිදු ඒ ප්‍රෙතිය ඇවිත් ''ස්වාමීනි, මට ආහාරපාන හා වස්ත්‍ර දුනමැනව''යි කීය. ඒ දිව්‍යපුත්‍රතෙම ඈට ඒ ආහාර පානාදිය දුන්නේය. ඒවා ඈ ගත් ඇසිල්ලකින්ම මලමූත්‍රපූයා ලේද දිලිසෙන අයොමය වස්ත්‍රද වූවාහුය, ඒ භික්ෂුව එය දක උපන් සංවෙග ඇතිව ඒ දිව්‍යපුත්‍රයාගෙන් විචාරන්නේ:-

55. ගූථඤ්ච මුත්තං රුහිරඤ්ච පුබ්බං
පරිභුඤ්ජති කිස්ස අයං විපාකෝ,
අයන්නුකිං කම්ම මකාසි නාරී
යා සබ්බදා ලොහිත පුබ්බභක්ඛා.

56. නවානි වත්ථානි සුභානි චෙව
මුදූනි සුඛානි ච ලොමසානි,
දින්නානිමිස්සා කිතකා භවන්ති
අයන්නු කිං කම්ම මකාසි නාරී – ති.

Non-commercial distribution

55. අයං නාරී, මේ ස්ත්‍රිය; ගූථංච, අසුචිද; මුත්තං, මූත්‍රද; රුහිරංච, ලේද; පුබ්බං, සැරවද; පරිභුඤ්ජති, අනුභව කරයි; කිස්ස, කවර කර්මයක්හුගේ; අයං විපාකො, මේ විපාකයෙක්ද; යා, යම්බඳු ප්‍රෙතියක්; සබ්බද, සෑමකල්හී; ලොහිත පුබ්බභක්ඛා, ලේහා සැරව අනුභව කරන්නීද; අයං නාරී, මේ ස්ත්‍රීතොමෝ; කිංකම්මං, කවර අකුශල කර්මයක්; අකාසිනු, (පෙර) කළේද.

පින්වත් දිව්‍යපුත්‍රය, මේ ස්ත්‍රී තොමෝ අසුචි හා මූත්‍රද ලේ හා සැරවද අනුභව කරයි. මේ කවර කර්මයක්හුගේ විපාකයෙක්ද, යම්බඳු ප්‍රෙතියක් තොමෝ සෑමකල්හි ලේ හා සැරව අනුභව-කරන්නීද ඕතොමෝ පෙර කිනම් අකුශල කර්මයක් කෙළේද.

56. ඉමිස්සා, මෑට; දින්නානි, දෙනලද; සුභානිවෙව, යහපත්වූද; මුදුනි, මෘදුවූද; සුඛානිව, පිරිසිදු පැහැඇත්තාවූද; ලොමසානි, සුඛස්පර්ශීවූද; නවානි වත්ථානි, අභිනව වස්ත්‍ර; කිතකාභවන්ති, ලොහවස්ත්‍ර සදෘශවෙත්; අයං නාරී, මේ ස්ත්‍රී තොමෝ; කිංකම්මං, කවර අකුශල කර්මයක්, අකාසිනු ඉති, කළේද.

මෑට දෙන ලද යහපත්වූද මෘදුවූද පිරිසිදු පැහැ ඇත්තාවූද සුඛස්පර්ශීවූද අලුත් වස්ත්‍ර යපට සමානවෙත්, එසේවීමට මේ ස්ත්‍රිය කිනම් අකුශල කර්මයක් පෙර කළේදයි කියා ගාථා දෙකකින් විචාළේය. මෙසේ ඒ භික්ෂූහු විසින් විචාරන ලද්දවූ ඒ දෙවිපුත්තෙම ඒ ප්‍රෙතිය විසින් පූර්වජාතියෙහි කරන ලද කර්මය ප්‍රකාශ කරමින් ගාථා දෙකක් කීයේය.

57. භරියා මමෙසා අහූ භදන්තෙ
අදයිකා මච්ඡරිණී කදරියා,
සා මං දදන්තං සමණ බ්‍රාහ්මණානං
අක්කොසති පරිභාසති ච.

58. ගූථඤ්ච මුත්තං රුහිරඤ්ච පුබ්බං
පරිභුඤ්ජ ත්වං අසුචිං සබ්බකාලං,
එතඤ්ච තෙ පරලොකස්මිං හොතු
වත්ථඤ්ච තෙ කිතකා භවන්තු,
එතාදිසං දුච්චරිතං චරිත්වා
ඉධාගතා චිරරත්තාය බාදති – ති.

Non-commercial distribution

57. භදන්තෙ, ස්වාමීන්වහන්ස; එසා, මෝ තොමෝ; අදයිකා, (කිසිවෙකුට කිසිවකුත්) නොදෙන සුලුවූ; මච්ඡරිණී, මසුරුවූ; කදරියා, කද මසුරු සිත් ඇති; මම, මාගේ; හරියා අහූ, භායර්‍යාව විය; සා, ඕතොමෝ; සමණබ්‍රාහ්මණානං, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට; දදන්තං, දන්දෙන්නාවූ; මං, මා; අක්කොසති, අක්‍රොශ කරයි; පරිභාසතිව, පරිභවද කෙරෙයි.

ස්වාමීනි මෝ තොමෝ කිසිවෙකුට කිසිවක් නොදෙන සුලුවූ මසුරුවූ තද මසුරුසිත් ඇති (පෙර මාගේ භායර්‍යාව විය. ඕතොමෝ මහණ බමුණන්ට දන්දෙන්නාවූ මට අක්‍රොශ කරයි, පරිභව කෙරෙයි.

58. එතංච, මේ දානයද; තෙ, නුඹට; පරලොකස්මිං, පරලොවදී; භුථංච, මලද; මුත්තං, මූත්‍රද; රුහිරංච, රුධිරයද පුබ්බං, පූයාද; හොතු, වේවා; වත්ථංච, වස්ත්‍රද; තෙ, තට; කිතකා භවන්තු, යපටවෙත්වා; ත්වං, නුඹ; සබ්බකාලං, හැම-කල්හි; අසුචිං පරිභුඤ්ජ, අසුචි අනුභවකරන්න; එතාදිසං, මෙබඳුවූ; දුච්චරිතං චරිත්වා, (කියනලද) වාක්දුශ්චරිතාදිය කොට; ඉධ ආගතා, මේ ප්‍රෙතාත්ම භාවයට පැමිණියා; චිර-රත්තාය. චිරකාලයක් මුළුල්ලෙහි; ඛාදති ඉති, ගූථාදිය අනුභව කරයි.

මේ දුන් දානය නුඹට පරලොවදී මල හා මූත්‍රද ලේ හා සැරවද වේවා, දුන් පිළි පරලොවදි නුඹට ලොහවස්ත්‍ර සදෘශ-වෙත්වා, නුඹ සැමකල්හි අසුචී අනුභව කරවයි කියා මෙබඳුවූ වාක්දුශ්චරිතාදිය කොට මේ ප්‍රෙතාත්මභාවයට පැමිණියා බොහෝ කාලයක් මුළුල්ලෙහි අසුචි ආදියම අනුභව කෙරෙයි.

යම් අන්දමකින් ඇගේ අමනාපාකාරයෙන්ම පවත්නාවූ විපාකය වනාහි යම් දානයක් උදෙසා අමනාපවීද, ඒ අමනාපවීම හෙතුවෙන් ඒ අත්බැවින් චුතව අන්තැනක උපන්කල්හි පොළව මතුපිට හෙනවැටීමමෙන් තම මතුයෙහි වැටෙයි. මෙසේ ඒ දිව්‍යපුත්‍රයා ඈ විසින් පෙර කරන ලද කර්‍මය කියා නැවත ඒ භික්ෂූහු ගෙන් ''ස්වාමීනි මෑ ප්‍රෙතලොකයෙන් මිදවීමට යම්කිසි උපායක් ඇත්තේදැ''යි විචාළේය. භික්ෂූන් වහන්සේ විසින් මිද-වීමට උපායක් ඇත්තේයයි කී කල්හි ''ස්වාමීනි එය කියනු මැනව''යි දෙවිපුත් අයැදියෙන් ''ඉදින් භාග්‍යවතුන් වහන්සේට

Non-commercial distribution

හෝ ආයාචී සඞ්ඝයාට හෝ එක භික්ෂුනමකට හෝ දන්දී මෑට අනුමෝදන් කරවනු ලැබේ නම් මේ ප්‍රෙතියත් අනුමෝදන් වීනම් එසේ ඇතිවූ කල්හි මේ ප්‍රෙත දුකින් මෑගේ මිදීම වන්නේය''යි වදරන ලදී. එබස් අසා දෙවිපුත්තෙමේ ඒ භික්ෂූන් වහන්සේට ප්‍රණීතවූ ආහාර පාන වඟී දන්දී ඒ දනය ඒ ප්‍රෙතියට දුන්නේය. එකෙණෙහිම ඒ ප්‍රෙතිය සුවපත්වූවා පිනාගිය ඉඳුරන් ඇතිව දිව්‍යාහාරයෙන් සතුටුවිය. නැවත ඒ භික්ෂූන්වහන්සේ ගේම අතට දිවසළු දෙකක් බුඩපූජාව උදෙසා දී ඒ දක්ෂිණාවද ප්‍රෙතියට දුනි. ඒ ක්‍ෂණයෙහි ඕතොමෝ දිව්‍යවස්ත්‍ර හැඳ දිව්‍යාලඞ්කාරයෙන් සැරසුණාවූ සකල කාමසම්පත්තියෙන් සමෘඩවූ දිව්‍යාප්සරාවක් සමානවිය. ඒ භික්ෂු තෙමේද ඒ දිව්‍යපුත්‍රයාගේ සෘඩියෙන් සැවත්නුවරට පැමිණ ජෙතවනාරාමයට වැඩ බුදුන් සමීපයට එළඹ වැඳ ඒ වස්ත්‍රයුග්මය පූජාකොට එපවත් බුදුරජාණන්ට සැළකළේය. භාග්‍යවතුන් වහන්සේද ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට පැමිණි පිරිසට ධම්දෙශනා කළසේක. ඒ ධම්දෙශනාව මහජනයාහට සාර්ථකවිය.

(අශ්‍රඩාවත් තද මසුරුසිත් ඇති අය අනුන්දෙන දනෙහි පවා සතුටුනොවී බැණවැදීමෙන් මතු මහත් විපතට පැමිණෙන බැව් මේ කථාවෙන් අවබොධ කටයුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරග වර්ගයෙහිවූ නවවෙනි මහාපෙශකාර ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවන ලදී.

---

1. 10 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරග වඟියෙහිවූ දසවෙනි **බල්ලාටිය ප්‍රෙතවස්තුව** කවරේදයත් හේ මෙසේ දතයුතු:-

බ්‍රහ්මාමර නරනාගාදි සකල ලොක චුම්බිත පාදපද්මොපලක්ෂිත ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ගොදුරු ගම්කොට දෙව්රම් වෙහෙර වැඩවසන කල්හි එක්තරා බල්ලාටිය ප්‍රෙතියක් අරභයා මේ කථා වස්තුව වදළසේක.

Non-commercial distribution

අතීත කාලයෙහි බරණැස්නුවර විශිෂ්ට රූ ඇත්තාවූ දර්ශනීයවූ ප්‍රසාදජනකවූ උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්විතවූ අතිමනොහර කෙශකලාපය ඇති රූපසම්පත් නිසා ජීවත්වන සුලුවූ එක්තරා වෙශ්‍යා ස්ත්‍රියක්විය. ඇගේ නිල්වූ දික් තුනී මොලොක් සිනිඳු වෙළනලද අග ඇති දෙයතින් ගතයුතුවූ කෙශයෝ වනාහි නොවිසිරී මෙවුල් කලඹ දක්වා එල්බෙත් ඇගේ ඒ කෙශශොභාව දූක තරුණ ජනයෝ බොහෝ සෙයින් ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තෝවූහ. එකල්හි ඇගේ ඒ කෙශ ශොභාව නොඉවසමින් ඊර්ෂ්‍යාවෙන් මඩනාලද ස්ත්‍රීහු කීපදෙනෙක් මන්ත්‍රණය කොට ඇගේම මෙහෙවර කරන්නාවූ වැඩකාරියෙකු ආමිසයෙන් පොළඹවා ඒ දසිය ලවා ඇගේ හිසකේ වැටෙන බෙහෙතක් දෙවාහුය. ඒ දසිය වනාහි ඒ බෙහෙත නහනසුණු සමග යොදූ ගඞ්ගානදියෙහි නහන කාලයෙහි ඒ වෙසහනට දුන්නේය. ඒ ස්ත්‍රීතොමෝ ඒ බෙහෙතෙන් මුල් සහිත හිසකේ තෙමා දියේ ගිලුණේය. ගිලුණු ඇසිල්ලෙහිම කෙශයෝ සහමුලින් ඉදිරී වැටුණාහුය. ඇගේ හිස තිත්ත ලබු ගෙඩියක් වැනි විය. එකල්හි ඈ හැමලෙසින් ඉදුරුණු හිසකේ ඇතිව සිඳින ලද මස්තකය ඇති පරවී ධෙනුවක්මෙන් අවලක්ෂණ වී ලජ්ජාවෙන් ඇතුල්නුවරට ඇතුල්වීමට නොහැකිවන්නී වස්ත්‍රයකින් හිස ඔතාගන නුවරින් පිටත එක්තරා පෙදෙසක වාසයකරන්නී කිහිප දවසක්හුගේ ඇවැමෙන් පහවූ ලජ්ජා ඇතිව තල මිරිකා තෙල් වෙළඳුමද, සුරා වෙළඳුමද කරමින් ජීවිකාව කළේය. ඕතොමෝ එක්දවසක් සුරා මදයෙන් මත්වූ මිනිසුන් දෙතුන්දෙනෙකු නිදගත් කල්හි ඔවුන් ගේ ලිහිල්වූ හැඳිවත් සොරා ගත්තේය. නැවත ඈ එක් දවසක් එක රහත්තෙර නමක් පිඬුපිණිස හැසිරෙනු දූක පහන් සිත් ඇතිව තමගෙට වැඩමවා ගෙන පණවන ලද අස්නෙහි වඩා හිඳුවා තෙල්මිශ්‍රවූ වැඟිරෙන තෙල් ඇති මුරුවට දන් දුන්නේය. ඒ තෙරුන් වහන්සේ ඈ කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගෙන වැළඳුසේක. ඈ පහන් සිත් ඇතිව තෙරුන්ගේ හිසට කුඩයක් අල්වමින් සිටියේය. ඒ තෙරුන් වහන්සේද ඇගේ සිත සතුටු කරමින් අනුමෝදනා කොට වැඩිසේක. ඒ ස්ත්‍රීතොමෝද අනුමෙවෙනි බණ වදරන කල්හිම ''මගේ හිසකේ දික් තුනී සිනිඳු මොලොක් වෙළුණු අග ඇති වෙත්වා'' යි ප්‍රාර්ථනා කළේය.

Non-commercial distribution

ඕතොමෝ මෑත කලෙක කළුරිය කොට කුශලාකුශල කර්‍ම-යන්ගේ විපාකයෙන් මුහුදු මැද රන්විමනෙක හුදකලාව උපන් නේය. ඇගේ කෙශයෝ ප්‍රාර්ථනා කරන ලද ආකාරයෙන්ම සමෘඩ වූවාහුය. මිනිසුන්ගේ සළු සොරකම් කළ අකුශලයෙන් වනාහි නග්න විය. ඈ ඒ රන්විමනෙහි නැවත නැවත උපදිමින් එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි නිර්ස්ත්‍රවම කල්යැවීය. ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවී පවත් වන ලද උතුම් දම්සක් ඇත්තේ පිළිවෙළින් වැඩමවා සැවැත්නුවර වැඩ-වසන සමයෙහි සැවැත්නුවර වාසීවූ සියයක් පමණ වෙළෙන්දේ සුවණ්ණභූමිය උදෙසා යන නැවකින් මහාසමුද්‍රයට පැමිණියාහුය. ඔවුන් නැගුණ නැව විෂම වාත වේගයෙන් ගසා යන ලදුව ඔබ්-මොබ කර කැවෙමින් ඒ විමාන ප්‍රෙතිය වසන පෙදෙසට පැමිණියේය. එකල්හි ඒ විමාන ප්‍රෙතිය විමානය සමඟ තමන් ඒ වෙළඳුන්ට දැක් විය. ඒ දැක ප්‍රධාන වෙළඳතෙමේ විචාරන්නේ:

59. කා නු අන්තෝ විමානස්මිං – තිට්ඨන්තී නූපනික්ඛමී,
උපනික්ඛමස්සු භද්දෙ ත්වං – පස්සාම තං මහිඩිකං–ති.

59. අන්තෝ විමානස්මිං, විමනතුළ; තිට්ඨන්තී, සිටින්නාවූ (තී); කානු, කවර ස්ත්‍රියක්ද; න උපනික්ඛමී, විම-නෙන් නොනික් මෙයි; භද්දෙ, සොඳුර; මහිඩිකං, මහත් සෘඩි ඇති; තං, තී; පස්සාම, (අපි) දකිනු කැමැත්තමිහ; (එහෙයින්) ත්වං, තී; උපනික්ඛ මස්සු විමනෙන් නික්මෙව.

විමනතුළ සිටින්නාවූ තී කවරියක්ද, මනුෂ්‍ය ස්ත්‍රියක්ද නොහොත් අමනුෂ්‍ය ස්ත්‍රියක්ද, සොඳුර මහත් සෘඩි ඇති තී අපි දකිනු කැමැත්තමිහ, එහෙයින් තෙපි විමනෙන් නික්මෙවයි කියා ගාථාව කීයේය. එවිට ඒ වෙළඳුට තමාට බහිනිෂ්-ක්‍රමණයට නොහැකි බව ප්‍රකාශ කරමින් ඒ ප්‍රෙතිය ගාථාවක් කීයේය:–

60. අට්ටියාමී හරායාමි – නග්ගා නීක්ඛමිතුං බහි,
කෙසෙහමිහි පටිච්ඡන්නා-පුඤ්ඤං මෙ අප්පකං කත–න්ති

60. නග්ගා, නග්නව; බහිනික්ඛමිතුං, පිටතට නික්මීමට; අට්ටියාමි, (මම) පිළිකුල් ඇත්තේවෙමි (නොහොත්) දුක් ඇති

Non-commercial distribution

වෙමි; හරායාමි, ලජ්ජාවෙමි; කෙසෙහි, හිසකේවලින්; පටිච්ඡන්නා අම්හි, පිළිසන් සිරුර ඇතිවෙමි; මෙ, මා විසින් අප්පකං පුඤ්ඤං, මඳ පිනක්; කතංඉති, කරන ලදී.

පින්වත් පුරුෂය, මම නග්නව බිහි නික්මීමට දුක්වෙමි, ලජ්ජාවෙමි, කෙශයන්ගෙන් පිළිසන් සිරුර ඇතිවෙමි, මා විසින් සුලු පිනක් එනම් මුරුවටදීම කුශලය පමණක් කරනලදී.

ඒ ප්‍රෙතිය මෙසේ කී කල්හි වෙළඳතෙමේ තමාගේ උතුරු සළුව දෙනු කැමතිව කියන්නේ—

61. හන්දුත්තරියං දදාමිතෙ – ඉමං දුස්සං නිවාසය
ඉමං දුස්සං නිවාසෙත්වා-බහිනික්ඛම සොභනෙ,
උපනික්ඛමස්සු භද්දෙ ත්වං-පස්සාම තං බහිට්ඨිත – න්ති.

61. හන්ද, එබැවින්; තෙ, තිට; උත්තරියං, (මගේ) උතුරු සළුව; දදාමි, (මම) දෙමි; ඉමං දුස්සං, මේ උතුරු සළුව; නිවාසය, හැඳගනුව; සොභනෙ, සුන්දරිය; ඉමං දුස්සං, මේ වස්ත්‍රය; නිවාසෙත්වා, හැඳගෙන; බහිනික්ඛම, බිහිනික්මෙව; භද්දෙ, සොඳුර; බහිට්ඨිතං, බිහිසිටියාවූ; තං, තී; පස්සාම; (අපි) දකුම්හ; ත්වං, තී; උපනික්ඛමස්සු, පිටත නික්මෙව.

එහෙනම් මගේ උතුරුසළුව තිට මම දෙමි, මේ මාගේ උතුරු සළුව ඇඳගනුව, සුන්දරිය මේ වස්ත්‍රය හැඳගෙන විමනෙන් එලියට එව, සොඳුර පිටතටවිත් සිටි තී අපි දකුම්හ, එහෙයින් තෙපි විමනෙන් නික්මෙවයි කියා ගාථාව කීයේය.

මෙසේද කියා වෙළෙන්ද ස්වකීය උත්තරසාටකය ඒ ප්‍රෙතියට දුන්නේය. එවිට ඕතොමෝ එසේ දෙන ලද්ද තමාට නොලැබෙන බවත් තමාට දෙනලද්ද යම්සේ ලැබේ නම් එයත් දක්වා මේ ගාථා වය කීයේය:-

62. හත්ථෙන හත්ථෙ තෙ දින්නං නමය්හං උපකප්පති,
එසෙත්ථුපාසකා සද්ධා – සම්මාසම්බුද්ධ සාවකා,

63. එතං අච්ඡාදයිත්වාන-මම දක්ඛිණ මාදිස,
අථාහං සුඛිතා හෙස්සං – සබ්බකාම සමිද්ධිනී – ති.

62. හත්ථෙන, (නුඹේ) අතින්; හත්ථෙ, (මා) අතට; තෙ, නුඹ විසින්; දින්නං, දෙනලද්ද; මය්හං, මට; නඵප-

Non-commercial distribution

කප්පති, නොලැබේ; සම්මා සම්බුද්ධ සාවකෝ, සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවකවූ; සද්ධෝ කම්ඵල විශ්වාසයෙන් යුක්ත-හෙයින් ශ්‍රද්ධාවත්වූ; එසෝ උපාසකෝ, මේ උපාසකයෙක් තෙම; එත්ථ, මොවුනතුරෙහි (ඇත්තේය.)

නිදුකාණෙනි, නුඹේ අතින් මගේ අතට නුඹ විසින් දෙන ලද්ද මට නොලැබෙයි. උපභොගයට සුදුසු නොවෙයි, සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවකවූ කම්ඵල විශ්වාසයෙන් ශ්‍රද්ධාවත්වූ රත්නත්‍රය උදෙසා සරණාගමනයෙන් යුත් මේ උපාසකයෙක් තෙම මේ ජනසමූහයා අතර ඇත්තේය.

63. එතං, මේ උපාසකයා; අච්ඡාදයිත්වාන, (මට දෙනු ලබන වස්ත්‍රයෙන්) හඳවා; මම, මට; දක්ඛිණං, දක්ෂිණාව (හෙවත්) ප්‍රාප්තිදානය; ආදිස, දෙව; අථ, එසේ කළකල්හි; අහං, මම; සබ්බකාම සමිද්ධිනී, සියලු කාම සැපතින් සමෘද්ධවූවා; සුඛිතා හෙස්සං (දිව්‍යවස්ත්‍ර හැඳ) සුවපත් වන්නෙමි.

ඒ මට දෙනු ලබන සළුවෙන් ඒ උපාසකයා හඳවා මට ප්‍රාප්තී දානය දුනමැනව, එසේ කළ කල්හි මම සියලු කාම සම්පත්තියෙන් සමෘද්ධව දිව්‍යවස්ත්‍ර හැඳ පොරවා සුවපත් වන්නෙම්යි කීය.

වෙළෙන්දෝ එපවත් අසා ඒ උපාසකයා නහවා සුවඳ ගල්වා වස්ත්‍ර යුග්මයකින් හැඳවූහ. ඒ කාරණය ප්‍රකාශ කරන්නා වූ සංගීතිකාරක මහා ස්ථවිරයෝ ගාථා තුනක් කීහු.

84. තංව තෙ නහාපයිත්වාන-විලිම්පෙත්වාන වාණිජා,
වත්ථෙහච්ඡාදයිත්වාන-තස්සා දක්ඛිණමාදිසුං.

65, සමනන්තරානුද්දිට්ඨයේ-විපාකෝ උප පජ්ජථ,
හොජනච්ඡාදන පානීයං-දක්ඛිණාය ඉදං ඵලං,

66. තතෝ සුධා සුචි වසනා-කාසි කුන්තම ධාරිණී,
හසන්ති විමානා නික්ඛම්-දක්ඛිණාය ඉදං ඵලන්ති.

64. තෙ වාණිජා, ඒ වෙළෙන්දෝ; තංව, ඒ උපාසකයා; නහාපයිත්වාන, නහවා; විලිම්පෙත්වාන, උතුම් සුවඳ ගල්වා; වත්ථෙහි, වස්ත්‍ර දෙකකින්; අච්ඡාදයිත්වා, හඳවා; තස්සා, ඒ ප්‍රෙතියට; දක්ඛිණං ආදිසුං, දක්ඛිණාව දුන්නාහුය.

Non-commercial distribution

වෙළෙන්දෝ ඒ උපාසකයා නහවා උතුම් සුවඳින් ඇහ ගල්වා වණ් ගන්ධ රස සම්පන්න සව්‍යඤ්ජන හොජනය වළඳවා හඳනා සළුව සහ උතුරුසළුවදුයි යන සළු දෙකකින් හඳවා හෙවත් සළු දෙකක්දී ඒ ප්‍රෙතියට ඒ දානය දුන්නාහුය.

65. උද්දිට්ඨෙ, සමනන්තරා, (ඇට දක්ඛිණාව) උදෙසීමට අනතුරුවම; විපාකෝ උපපජ්ජථ, විපාක උපනී; හොජනච්ඡාදනපානීයං, නානාප්‍රකාර දිව්‍ය හොජන සදෘශවූ හොජනද නානා විරාගවණ් සම්ජ්වලිත දිව්‍යවස්ත්‍ර සදෘශ වස්ත්‍රද අනෙකවිධ පාන වර්ගද; (උපන) දක්ඛිණාය, දානයාගේ; ඉදංඵලං, මේ විපාකවෙයි.

ඇට දක්ෂිණාව උදෙසීමට අනතුරුවම දානයාගේ විපාක උපන්නේය. කෙබඳු විපාකයෙක්ද යත්, නන්වැදෑරුම් දිව බොජුන් සමාන හොජනද, නානා විරාගවණ්යෙන් සමුජ්වලිත දිව්‍ය වස්ත්‍ර සමාන වස්ත්‍රද, නොයෙක් වැදෑරුම් පානවර්ගද උපන්නේය, දක්ෂිණාවෙහි මෙබඳු විපාක ඇතිවිය.

66. තතෝ, (යථොක්ත හොජනාදීන්ගේ ප්‍රතිලාභයට) පසුව; සුද්ධා, නැහැමෙන් පිරිසිදු වූ ශරීර ඇතිව; සුචිවසනා හඳනා ලද ශුඛ වස්ත්‍ර ඇතිව; කාසිකඋත්තමධාරිණී, කසීසළු වලටත් වඩා උතුම් වස්ත්‍ර ධාරීව; හසන්ති, සිනාහසෙමින්; විමානා, විමනින්; නික්ඛම්, නික්මුණේය; දක්ඛිණාය, දානයාගේ; ඉදං ඵලං, මේ විපාකය වේ.

යථොක්ත හොජනාදි ප්‍රතිලාභයෙන් පසුව ස්නානයෙන් ශුඛ ශරීර ඇතිවූ යහපත් ශුඛවස්ත්‍ර හැන්දවූ කසීසළුවලටත් වඩා උත්තම වස්ත්‍රධාරීවූ ඒ ප්‍රෙතීස්තාමෝ දරුවෙනි යුෂ්මතුන්ලාගේ දානයෙහි මේ විපාක විශෙෂය බලවයයි ප්‍රකාශකිරීම් වශයෙන් සිනහසෙමින් විමනින් ඉදිරියට පැමිණියේය.

ඉන්පසු ඒ වෙළෙන්දෝ මෙසේ ප්‍රත්‍යක්ෂවසයෙන් පුණ්‍ය ඵලය දැක ආශ්චය්‍යාද්භූත සිත් ඇතිව ඒ උපාසකයා කෙරෙහි හටගත් ගරුබුහුමන් ඇත්තාහු කරනලද ඇදිලි ඇතිව ඔහු ආශ්‍රය කළාහුය. ඒ උපාසක තෙමේද ඒ වෙළඳජනයා ධර්ම කථාවෙන් බොහෝ සෙයින් පහදවා සරණයෙහි හා ශීල ගුණයෙහිද පිහිටෙව්වේය. ඒ වෙළෙන්දෝ ඒ විමාන ප්‍රෙතිය විසින් පෙර කරන ලද කර්මය මේ ගාථාවෙන් විවාළාහුය:-

Non-commercial distribution

67. සුචිත්තරූපං රුචිරං-විමානං තෙ පභාසති,
දෙවතෙ පුච්ඡිතා චික්ඛ-කිස්ස කම්මස්සිදං ඵලං-ති.

67. තෙ, තිගේ; සුචිත්තරූපං, (හස්ත්‍යාශ්ව ස්ත්‍රී පුරුෂාදී වශයෙන්ද මාලාකම් ලතාකම්දි වශයෙන්ද) මොනවට කරන ලද චිත්‍රරූප ඇති; රුචිරං විමානං, සිත්කළු විමන; පභාසති, බබලයි, දෙවතෙ, පින්වත් දෙවහන; පුච්ඡිතා, විචාරණුලද්දී; කස්ස කම්මස්ස, කවර කුශලකර්මයක්හුගේ; ඉදං ඵලං, මේ විපාකදැයි; ආචික්ඛ, (අපට) කියව.

''පින්වත් දෙවහන, තොපගේ විමන හස්ත්‍යාශ්ව ස්ත්‍රී පුරුෂාදීන්ගේ වශයෙන්ද මාලාකම් ලතාකම්දීන්ගේ වශයෙන්ද මනා කොට කරනලද චිත්‍රරූප ඇත්තේය. සිත්කළුය, බබලයි, මේ විපාකය කවර කුශල කර්මයක්හුගේද, දනමය කුශලකර්මයා-ගේද නොහොත් ශීලමය කුශලයක්හුගේදැයි විචාරණ ලද්දවු ති අපට කියව.

මෙසේ වෙළඳුන් විසින් විචාරණුලද ඒ ප්‍රෙතිතොමෝ මා විසින් කරනලද සුලු කුශලකර්මයාගේ මේ විපාකය වෙයි, අකුශල කර්මයාගේ විපාක වනාහි අනාගතයෙහි අවීචිමහනරක-යේදී මෙබඳු විපාක වන්නේයයි කියා ඒ කර්මවිපාක දෙකම ප්‍රකාශ කරමින් මේ ගාථා කීයේය.

68. භික්ඛුනො වරමානස්ස-දෙණිනිම්මජ්ජනං අහං,
අදසිං උජුභූතස්ස-විප්පසන්නෙන චෙතසා.

69. තස්ස කම්මස්ස කුසලස්ස-විපාකං දිසමන්තරං,
අනුභොමි විමානස්මිං-තඤ්ඤෙදනි පරිත්තකං.

70. උද්ධං චතූහි මාසෙහි-කාලකිරියා භවිස්සති,
එකන්තං කටුකං භොරං-නිරයං පපතිස්සහං.

71. චතුක්කණ්ණං චතුවාරං-විභත්තං භාගසො මිතං,
අයොපාකාර පරියන්තං-අයසා පටිකුජ්ජිතං.

72. තස්ස අයොමයා භූමි-ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජන සතං-එරිත්වා තිට්ඨති සබ්බදා.

73. තත්ථාහං දිසමද්ධානං-දුක්ඛං වෙදිස්ස වෙදනං,
ඵලංව පාපකම්මස්ස-තස්මා භොවාමහං භුස-න්ති,

Non-commercial distribution

68. අහං, මම; චරමානස්ස, පිඩු පිණිස හැසිරෙන්නාවූ; උජුභූතස්ස, (චිත්තජිව්හවංකකුටිල භාවකරණ ක්ලේශයන්ගේ අභාවයෙන්) ඍජුභාවයට පැමිණියා වූ; භික්ඛුනො, (භින්නක්-ලේශී වූ) භික්ෂුවක්හට; විප්පසන්නෙන චෙතසා, (කර්මඵල ඇදහීමෙන්) මනා පහන් සිතින්; දෙණි නිම්මජ්ජනං, තෙල්මුසු මුරුවටක්; අදසිං, දුනිමි.

පින්වත් සත්පුරුෂයෙනි, සිත ඇද වක්බැව් කරන ක්ලෙශ යන්ගේ අභාවයෙන් ඍජු බවට පැමිණියාවූ පිඩුපිණිස හැසි රෙන්නාවූ භින්නක්ලෙශීවූ එක් රහතන් වහන්සේ නමකට මම කර්මඵල විශ්වාසයෙන් යහපත් ප්‍රසන්න සිතින් තෙල් මිශ්‍ර තල මුරුවටක් (පෙර මිනිසත් බැව්හිදී) දුනිමි.

69. තස්ස කම්මස්ස කුසලස්ස, ඒ කුශල කර්මයාගේ; විපාකං, විපාකය; දිසමන්තරං, බොහෝ කලක් මුළුල්ලෙහි; විමානස්මිං, විමනෙහි (ඉපිද); අනුභොමි, අනුභව කරමි; තංච, ඒ විපාකයද; ඉදානි, දැන්; පරිත්තකං, අල්පාවශෙෂවිය.

ඒ කුශල කර්මයාගේ විපාකය මේ විමානයෙහි ඉපදී බොහෝ කාලයක් මුළුල්ලෙහි මම විඳිමි. ඒ කුශලකර්ම විපාකයද දැන් අවශිෂ්ඨව පවත්නේ ස්වල්පයකි.

70. චතුහි මාසෙහි, සිව්මසකින්; උඩං, මතු (පස්වන මස); කාලකිරියා භවිස්සති, (මාගේ) කාලක්‍රියාව වන්නේය; අහං, මම; එකන්තං, එකාන්තයෙන්; කටුකං, කටුකවූ; සොරං, දරුණුවූ; නිරයං, අවීචිමහානිරයෙහි; පපතිස්සං, වැටෙන්නෙමි.

එහෙයින් නොබෝ කලකින්ම මෙයින් චුතවන්නෙමි, සිව් මසකින් මතු පස්වෙනි මාසයෙහි මාගේ කාලක්‍රියාව වන්නේය, ඒ ප්‍රෙතයොනික භාවයට වඩා එකාන්තයෙන්ම කටුකවූ දරුණු වූ මෙහි සැපයක් නැති හෙයින් නිරයයි ලද නම් ඇති නරකයට මම පැමිණෙන්නෙමි. මෙහි නිරයයි කියා අවීචිමහා නිරය අදහස්කළ බැවින් එය ස්වරූප හෙයින් දක්වයි:-

71. චතුක්කණ්ණං, කොන් සතරක් ඇත්තේය; චතුවාරං, (සිව්දිග) සිව් දෙරක් ඇත්තේය; මිතං, ප්‍රමාණකරන ලදුව; භාගසො, කොටස් වශයෙන්; විභත්තං, මොනවට බෙදන ලද්දේය; අයොපාකාර පරියන්තං, යපවුරකින් වටකරන ලද්දේය; අයසා, යපියනකින්; පටිකුජ්ජිතං, වසන ලද්දේය.

Non-commercial distribution

සිව් කොනක් ඇත්තේය, සිව් දිශාවන්හිවූ සිවු දොරකින් යුක්තය, කොටස් වශයෙන් ප්‍රමාණකරන ලදුව මනාව බෙදන ලද්දේය, යපවුරකින් වටකරන ලද්දේය, යපිනයකින් මතු වසනලද්දේය.

72. තස්ස, ඒ අවීචිමහා නරකයාගේ; අයොමයා භූමී, අයොමයවූ භූමිය; ජලිතා, (වහ්නිජ්වාලයෙන්) දිලිසුණේය; තෙජසා යුතා, (භාත්පස නැඟී) මහත් ගිනිදැලින් නිරන්තරයෙන් යුක්ත වන්නීය; සබ්බදා, සෑමකල්හි; සමන්තායොජනසතං, භාත්පස (සියලු දිශාවන්හි) යොදුන් සියයක් තැන; ඵරිත්වා තිට්ඨති, පැතිර සිටියි.

ඒ අවීචිමහා නරකයාගේ අයොමය භූමිය ජ්වලිතවන්නීය, භාත්පසින් නැඟී මහත් ගිනිදැලින් නිරතුරුව සමුජ්වලිතවෙයි, මෙසේ වනාහී භාත්පසින් පිටත සියලු දිශාවන්හි යොදුන් සියක් තැන් සෑමකල්හි පැතිර වහ්නිජ්වාලය පවතී.

73. අහං, මම; තත්ථ, ඒ මහානිරයෙහි; දීඝං අද්ධානං, බොහෝ කලක් මුළුල්ලෙහි; දුක්ඛං වෙදනං, දුක්වේදනා; වෙදිස්සං, විඳින්නෙමි; පාපකම්මස්ස, මා විසින් කළ පාප කර්මයාගේ; ඵලංච, (මෙබඳු දුක්විඳීම) විපාකයක් (ඇත්තේය); තස්මා, ඒ හේතුවෙන්; අහං, මම, භුසං, බොහෝසේ; සොචාමී, ශොක කරමි.

ඒ මහානිරයෙහි වැටී මම බොහෝ කලක් මුළුල්ලේහි දුක් වේදනාව විඳින්නෙමි, මෙබඳු දුක් විඳීම මා විසින් කරනලද පාපකර්මයා ගේ විපාකය වන්නේය, ඒ හේතුවෙන් මම දැන් ශොක කරමි.

මෙසේ ඒ දෙවඟන විසින් තමාකළ කර්ඵලය හා මතු කාලයෙහි නිරයෙහි උපදින බවත් ප්‍රකාශ කළ කල්හි කරුණා-වෙන් මෙහෙයනලද සිත් ඇති ඒ උපාසකතෙම ''එසේ වීනම් මෑට මම පිහිට වන්නෙමි''යි සිතා ''පින්වත් දෙවඟන නුඹ හුදකලාවූ මට දන්දීම් වශයෙන් සකල කාමයෙන් සමෘඩ්ව උදර සම්පත්තියෙන් යුක්තවූවාය. දැන් වනාහී මේ උපාසකයන්ට දන්දී බුදුගුණද සිහිකොට නිරයොත්පත්තියෙන් මිදෙන්නෙහිය'' යි කීයේය. එවිට ඒ විමාන ප්‍රේතිකාමෝ තුටුපහටු සිත් ඇතිව මැනවයි කියා ඒ උපාසකවරුන් දිව්‍ය ආහාරපානවලින් වළඳවා

Non-commercial distribution

දිව්‍යා වස්ත්‍රයන් හා නන්වඳුරුම් රත්නයෙන්ද දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ උදෙසාද දිව්‍යවස්ත්‍රයුග්මයක් ඒ උපාසකයන්ගේ අතටදී ''ස්වාමීනි, එක්තරා විමන ප්‍රේතියක් තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාද යුග්මය හිසින් වඳියයි කියා සැවැත්නුවරට ගොස් මාගේ වචනයෙන් ශාස්තෘන්වහන්සේ වඳිවිය''යි කියා වැඳීමද යැවිවේය. ඒ නැවද තමාගේ සෘඩ්‍යානුභාවයෙන් ඒ වෙළඳුන් විසින් කැමතිවනලද පටුනට එදිනම පැමිණවිය, එකල්හි ඒ වෙළෙන්දෝ ඒ පටුනෙන් (ගොඩබැස) අනුක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණ දෙව්රම්වෙහෙරට ඇතුල්ව බුදුන්ට ඒ වස්ත්‍ර යුගලය පිළිගන්වා වන්දනාවද සැලකොට මුලපටන් ඒ සියලුම කථාප්‍රවෘත්තිය බුදුන්ට දැන්වූවාහුය. ශාස්තෘන් වහන්සේ ඒ කාරණය අර්ථාත්පත්ති කොටගෙන පැමිණි පිරිසට විස්තර වශයෙන් ධර්ම දෙශනා කළසේක. ඒ දෙශනාව මහජනයාහට සාර්ථක විය.

ඒ උපාසකයෝ වනාහි දෙවෙනි දවසෙහි බුද්ධප්‍රමුඛසංඝයා වහන්සේට මහදන්දී ඇට ප්‍රාප්තිදනය කළාහුය. ඒ ප්‍රේතිය ඒ ප්‍රේතලෝකයෙන් චුතව නානාවිධ රත්නයෙන් බබළන්නාවූ තව්තිසා දෙවලොව රන්විමනක දෙවඟනන් දහසක් පිරිවර කොට ඇතිව උපන්නේය.

(සුලුවූවත් අනුන් අයත් දේ සොරාගැනීමෙන් තමා මතු මහත් දුකට ගොඳුරුවණ බවත් ප්‍රේතයන්ට පින්දීම මිස වෙන කිසිවක් නොලැබෙන බවත් මොහොතක්වත් කල්‍යානමිත්‍රාශ්‍රය ලැබීමෙන් පැමිණෙන්ට තිබෙන නිරාදුකින් පවා මිදියහැකි බවත් මේ කථාව කියවීමෙන් අවබොධ කටයුතු.)

මේ ප්‍රෙතවස්තු දේශනාවෙහි උරගවර්ගයෙහිවූ දසවෙනි බල්ලාටිය ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

---

1. 11 වෙනි කථාව.

තවද මේ ප්‍රෙතවස්තුව දෙශනායෙහි උරගවර්ගයෙහිවූ එකොළොස් වන **නාග ප්‍රෙතවස්තුව** කෙසේද යත්–

ත්‍රිභුවනජන මනොනන්දනකර ගම්භීරතර දෙශනා විලාස ඇති ගුණ සාගරායමාණ ශාස්තෘවූ බුදුරජණන් වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවාසය කරන කල්හි බ්‍රාහ්මණ ප්‍රෙතයන්

Non-commercial distribution

දෙදෙනෙකුන් අරභයා මේ ප්‍රෙතවස්තුව වදළසේක. සත්හැවිරිදි වයස්වූ ආයුෂ්මත් සංකිච්ච සාමණේරයන් වහන්සේ වනාහි කරගෙහිදීම රහත් බවට පැමිණ සාමණේර භූමියෙහි සිටිසේක් තිස්නමක් පමණ භික්ෂූන් හා සමඟ අරණ්‍යයෙ වසනසේක් පන්සියක් සොරුන් අතින් ඒ භික්ෂූන්ට පැමිණි මරණය වලක්වා ඒ සොරුන්ද භික්මවා පැවිදිකරවා බුදුන් හමුවට වැඩිසේක. ශාස්තෘන්වහන්සේ ඒ මහණුන්ට ධර්මදෙශනා කළසේක. දෙශනා වසානයෙහි ඒ භික්ෂූන් වහන්සේලා අර්හත්වයට පැමිණියේය. පසුව ආයුෂ්මත් සංකිච්ච සාමණේරයන් වහන්සේ පරිපූර්ණ (විසි)වස් ඇතිව උපසම්පද ලැබ ඒ පන්සියක් රහත් භික්ෂූන් සමඟ බරණැසට ගොස් ඉසිපතනාරාමයෙහි වාසයකළසේක. මිනිස්සු තෙරණුවන් වෙත පැමිණ දහම් අසා පහන්සිත් ඇතිව වීථිපිළිවෙළින් කොටස් කොටස්වී ආගන්තුක දානය. දුන්නාහුය ඔවුනතුරෙන් එක්තරා උපාසකයෙක් තෙම නිති බත්දීමෙහි මිනිසුන් සමාදන් කරවිය, ඒ මනුෂ්‍යයෝ ශක්ති පමණින් නිතිබත් නියමකොට තැබුවාහුය. එකල්හි බරණැස්නුවර එක්තර මිසදිටු බමුණෙකුගේ පුත්‍රයෝ දෙදෙනෙක් හා එක් දියණියක්ද වුවාහුය. ඔවුනතුරෙන් ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ඒ උපාසක යාගේ මිත්‍රයෙක්විය. ඒ උපාසක තෙම ඒ මිත්‍රයා කැඳවාගෙන ආයුෂ්මත් සංකිච්චතෙරුන් වහන්සේ සමීපයට ගියේය. ආයුස්මත් සංකිච්ච තෙරුන්වහන්සේ ඒ බමුණාහට ධර්මදෙශනා කළසේක. එකල හෙතෙම මෘදු සිත් ඇතිවිය. එකල්හි ඒ බමුණාට ඒ උපාසකතෙම ''නුඹ එක් භික්ෂූනමකට නිති බතක් දෙව'' යි කීයේය ''ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට නිතිබත්දීම බ්‍රහ්මණුවූ අප විසින් නුපුරුදුකරන ලද්දේය, එහෙයින් මම නොදෙමැ''යි කීයේය.

කිමෙක්ද මටවත් බතක් දෙන්නෙහි හෝ නොදෙන්නෙහි දැයි ඇසිය. කෙසේ නම් නුඹට නොදෙමිදැයි බ්‍රාහ්මණයා කීයේය. එසේවීනම් මට යම් දානයක් දෙසිනම් එය එක් භික්ෂූනමකට දෙවයි උපාසකයා කීය. ඒ බමුණු කුමරා මැනවයි පිළිවදන්දී දෙවෙනි දිනයෙහි උදෑසනම විහාරයට ගොස් එක භික්ෂූනමක් වැඩමවාගනවුන් වැළඳවීය. මෙසේ කල්යන් යත් භික්ෂූන්ගේ ප්‍රතිපත්ති දැක ධර්මයද අසා ඔහුගේ බාලසහෝදරයාද නැඟණියද බුද්ධශාසනයෙහි ඉතා ප්‍රසන්නව පුණ්‍යකර්මයන්හි ඇළෙන්වූහ.

Non-commercial distribution

මෙසේ ඒ තිදෙනා සම්පත් පමණින් දන්දෙමින් ශ්‍රමණ බ්‍රාහ්මණ යන්ටද සත්කාර කළෝය, ගරුකළෝය, බුහුමන්කළෝය, පූජාකළෝය ඔවුන්ගේ මව්පියෝ වනාහි ශ්‍රද්ධා නැත්තෝය, තුණුරුවන් කෙරෙහි අප්‍රසන්නයහ, මහණ බමුණන් කෙරෙහි ගරු නොකළෝය, පුණ්‍යක්‍රියාවන්හි ආදර නැත්තෝය, කැමති-නුවාහුය ඔවුන්ගේ දියණියවූ කුමරිය මයිලණුවන්ගේ පුතුට විවාහය කොට දීමට නෑයෝ නියමකරගත්හ, ඒ පුතණුවෝ ආයුෂ්මත් සංකිච්ච තෙරුන්වහන්සේ ගේ සමීපයෙහිදී බණඅසා උපන් සංවේග ඇතිව පැවිදිව නිතර තම මවගේ ගෙදර දන්වැළඳීමට වඩනාහ. මව්තොමෝ දියණිවූ බමුණු කුමරිය කෙරෙහි ඒ සාමණෙරයන් ප්‍රලොභ කරවයි ඒ හෙතුවෙන් හෙතෙම කලකිරී උපාඩ්‍යායන්වහන්සේ වෙත එළඹ ''ස්වාමීනී මම සිවුරුහරිමි, මට අවසර දුනමැනව''යි කීයේය. උපාඩ්‍යාය තෙමේ ඔහුගේ හෙතුසම්පත් දැක ''සාමණෙරය මසක් පමණ බලාපොරොත්තුවෙව''යි කීය. ඒ සාමණෙර තෙයම්ද මැනැවැයි පිළිගෙන මස ඉක්මගිය කල්හි එසේම දැන්විය. උපාඩ්‍යාතෙමේ 'නැවත අඩමසක් බලාපොරොත්තුවෙවැ''යි කීයේය අඩමස ඉක්මුණු කල්හි එලෙසම කීකල තවත් ''සත්දවසක් බලා-පොරොත්තුවෙව''යි කීය. ඒ හෙරතෙමේ මැනැවයි කීය පිළිගත්තේය.

එකල්හි ඒ සත්දවස තුළ සාමණෙරයන්ගේ නැන්දණියගේ ගෘහය නටුවාවූ වහල ඇත්තේ දිරුණු දුබල බිත්තිය සුලඟින් හා වැස්සෙන් කඩාවැටුණේය. එහිදී බමුණාද බැමිණියද පුත්‍රයෝ දෙදෙනද දියණියද ගෙට යටවී කළුරිය කළෝය. ඔවුනතු රෙන් බ්‍රාහ්මණයා හා බ්‍රාහ්මණියත් ප්‍රේතයොනියෙහි උපන්නා හුය. දෙපුත්තුද දියණියද භූම්‍යාසථ දෙවියන් කෙරෙහි උපන්හ. ඔවුනතුරෙන් වැඩිමහල් පුතණුවන්ට හස්තියානාවක් උපන. මලණුවන්ට අස්වෙළෙඹුන් යෙදූ රථයක්ද, දියණියන්ට රන් සිවිගෙයක්ද උපන. බමුණා හා බැමිණියත් මහත් මහත් යමු ගුරුගෙන එකිනෙකා කොටාගනිත්. පහර වැදුන තන්හි මහත් මහත් කළ පමණ ගඩුනැඟී මොහොතකින්ම පැසී පැලෙත්. ඒ දෙදෙන එකිනෙකාගේ ගෙඩිපලා ක්‍රොධයෙන් මඩනාලදුව නිෂ්කාරුණිකව පරුෂ වචනයෙන් තර්ජනයකරමින් සැරව හා ලේ පානය කරත් තෘප්තියක් නොලබත්.

Non-commercial distribution

පසුව සාමණේරතෙම කලකිරීමෙන් මැඩුණේ උපාධ්‍යාය යන් වෙත එළඹ ''ස්වාමීනි මා විසින් ප්‍රතිඥාකරනලද දවස් ඉක්ම ගියහ, මම ගෙදර යන්නෙමි, මට අනුදන වදළමැනව''යි කීය. එසේ කී කල්හි උපාධ්‍යායයන් වහන්සේ හිරු අස්තඞගතවූ කල්හි කෘෂ්ණපක්‍ෂය සම්බන්ධි තුදුස්වක්දින පවත්නාකල්හී එවයි කියා ඒ සාමණේරයන් කැඳවාගෙන ඉසිපතනාරාමයාගේ පිටි-පසින් මදක්තැන් ගොස් සිටියහ. එකල්හිම ඒ දෙවිපුත් දෙදෙන නැගෙණිය සමග ඒ මගින්ම යක්‍ෂ සමාගමට සම්භාවනා කිරීමට යත් ඔවුන්ගේ මව්පියෝ වනාහි මුගුරුගත් අත් ඇතිව අතිශයින් පරුෂවචන ඇතිව කාළවර්ණ ශරීරයෙන් යුක්තව ආකුල ව්‍යාකුලවූ රළුවූද වැටුණාවූද කෙහෙවලු ඇතිව හෙනගින්නෙන් දුවුණු තල්කඳන් සමානව වැඟුරුණ පුයා හා ලේ ඇතිව රැලි වැටුණ ශරීරයෙන් යුක්තව ඉතාමත් පිළිකුල් බියකරු දකුම් ඇති ව ඒ දෙවිකුමරුන් ලුහුබැඳ යත්. එකල්හි ආයුෂ්මත් සංකිච්ච තෙරුන් වහන්සේ ඒ හෙරණුන්දැ යන්නාවූ ඒ සියළු දෙන යම්සේ දක්නේද එබඳුවූ සඞ්ඛාහිසංස්කාරයක්කොට ''සාමණේරය යුෂ්මතා මේ යන්නවුන් දක්කෙහිද''යි හෙරණ නමගෙන් ඇසූ සේක. එවිට සාමණේර තෙම ''එහෙයි ස්වාමීනි දකිමි''යි කීය. එහෙනම් මොවුන් විසින් කළකම් පිළිවිසවයි කීහ. ඒ හෙරණුන් දැ හස්තියානාදියෙන් යන්නවුන්ගෙන් පිළිවෙළින් විචාළේය. එකල ඔවුහු ''පසුව යම් ප්‍රෙතයෝ දෙදෙනෙක් එත්ද ඔවුක් විචාරව''යි කීහ. සාමණේරතෙම ඒ ප්‍රෙතයන්ගෙන් ගාථාවයකින් මෙසේ විචාළේය:-

74. පුරතොව සෙතෙන පලෙති හත්ථිනා
මපේක්ඛ පන අස්ස තරිරථෙන,
පච්ඡා ච කඤ්ඤා සිවිකාය නීයාති
ඔහාසයන්ති දස සබ්බසො දිසා.

75. තුම්හෙ පන මුග්ගරහත්ථපාණිනො
රුදම්මුඛා භින්නපභින්නගත්තා,
මනුස්සභූතා කිමකත්ථ පාපං
යෙනඤ්ඤමඤ්ඤස්ස පිවාථ ලොහිත-න්ති.

74. පුරතොව, (සියල්ලට) පළමුව; සෙතෙන, ධවල වර්ණවූ; හත්ථිනා, ඇත්වාහනයෙන්; පලෙති, (එක් දෙවියෙක්)

Non-commercial distribution

යයි; මජ්ඣිමපන, අතරෙහි වනාහි; අස්සතරිරථෙන, අස්වෙළඹුන් යෙදූ රියකින් (යයි); පච්ඡාව, පසුවද; කඤ්ඤා, දිව්‍යකන්‍යාවක්; සබ්බ සෝ, ශාන්ත්පසින්; දසදිසා, දසදිහුන්; ඔභාසයන්තී, (ස්වකීය ශරීර ප්‍රභායෙන් හා වස්ත්‍රාභරණාදි ප්‍රභායෙන්ද) බබුළුවමින්; සිවිකාය, සිවියහනකින්; නීයාති, ගෙනයනු ලබයි.

සියල්ලට පළමුවෙන්ම ශ්වේතවර්ණ ඇත්යහනින් එක්දෙවි යෙක්යයි, මැද අස්වෙළඹුන් යෙදූ රියකින් තව දිව්‍යපුත්‍රයෙක් යයි, පසුවද භාන්ත්පසින් සියලු දසදිහුන් ස්වකීය ශරීරප්‍රභාව යෙන් හා වස්ත්‍රාභරණාදි ප්‍රභාවයෙන්ද බබුළුවමින් සිවියහනින් දෙවඟනක් ගෙනයනු ලබයි.

75. මුග්ගරහත්ථපාණිනෝ, මුගුරුගත් අත්ඇත්තාවූ; තුම්හෙපන, තෙපි වනාහි; රුදම්මුඛා, හැඩුමුහුණින් යුක්තව; භින්න පභින්නගත්තා, (පොළුපහරින් ඒ ඒ තැන) සිදුණු බිඳුණු ශරීර ඇත්තාහු; යෙන, යම්හෙයකින්; අඤ්ඤමඤ්ඤස්ස, එකිනෙකා ගේ; ලොහිතං, ලෙය; පිවාථ, බොන්නාහුද; මනුස්සභූතා, මනුෂ්‍යවූවාහු (තෙපි); කිං පාපං, කිනම් පාපකර්මයක්; අකත්ථ, කළාහුද.

තොපි වනාහි මුහුරුගත් අත් ඇතිව හැඩු මුහුණින් යුක්තව මුගුරු පහරින් ඒ ඒ තැන බිඳුණ සිදුණ සිරුරු ඇතිව එකි නෙකාගේ ලෙය යම්හෙයකින් බොන්නාහුද (එකල) මනුෂ්‍යවූ තොපි කිනම් අකුශල කර්මයක් කළාහුදයි විචාළේය.

මෙසේ සාමණෙරයන් විසින් විචාරණ ලද්දවූ ඒ ප්‍රෙතයෝ ඒ සියලු පවත් සිවිගයකින් කීහ.

76. පුරතොව යො ගච්ඡති කුඤ්ජරෙන
සෙතෙන නාගෙන චතුක්කමෙන,
අම්හාකං පුත්තො අහු ජෙට්ඨකො සො
දනානි දත්වාන සුඛී පමොදති.

77. යො සො මජ්ඣෙ අස්සතරිරථෙන
චතුබ්භි යුත්තෙන සුවග්ගිතෙන,
අම්හාකං පුත්තො අහුමජ්ඣිමො සො
අමච්ඡරී දනපති විරොචති.

Non-commercial distribution

78. යා සා ච පච්ඡා සිවිකාය නීයති
නාරී සපඤ්ඤා මිගමන්ද ලොචනා,
අම්හාකං යිතා අහු සා කනිට්ඨා
හාගඩිඅ හාගෙන සුඛී පමොදතී.

79. එතෙව දානානි අදංසු පුබ්බෙ
පසන්න චිත්තා සමණ බ්‍රාහ්මණානං.
මයම්පන මච්ඡරිනො අහුම්හා
පරිභාසකා සමණ බ්‍රාහ්මණානං.
එතෙ පදත්වා පරිචාරයන්ති
මයඤ්ච සුස්සාම නළොව බිත්තො-නි.

76. යො, යම් දෙවියෙක්තෙම; පුරතොව, ඉදිරියෙන්ම; සෙතෙන, සුදුවූ; චතුක්කමෙන, පාසතරක් ඇති; නාගෙන, (අනභිභවනීයාර්ත්ථයෙන්) නාගසඞ්ඛ්‍යාතවූ; කුඤ්ජරෙන, ඇත් වාහනයෙන්; ගච්ඡති, යේද; සො, හෙතෙම; අම්හාකං අපගේ; ජෙට්ඨකො, ජ්‍යෙෂ්ඨවූ; පුත්තො අහු, පුත්‍රයා විය; දානානි දත්වාන, (ඔහු) දන්දී; සුඛී, සුවපත්වූයේ; පමොදති, සතුටුවෙයි.

සාමණෙරයන් වහන්ස, මේ යන්නවුන් අතුරෙන් ඉදිරියෙන්ම ධවලවර්ණවූ සිවිපා ඇති කුඤ්ජර සංඛ්‍යාත ඇත්යහනින් යම් දෙවියෙක් යේද; ඒ තෙම අපගේ වැඩිමල් පුත්‍රයා වෙයි. ඔහු දන් දී සුවපත්වී දැන් සතුටුවෙයි.

77. යොසො, යම් ඒ දෙවියෙක්තෙම; මජ්ඣෙ, මධ්‍යයෙහි; සුවග්ගිතෙන, සුන්දර ගමන් හෝ චතුර ගමන් ඇති; චතුබ්භි යුත්තෙන, වෙළෙඹුන් සිව්දෙනෙකු යෙදුවාවූ; අස්සතරිරථෙන; අශ්වතරීරථයෙන් (යේද); සො, ඒ තෙම; අම්හාකං, අපගේ; මජ්ඣිමො, මධ්‍යම වූ; පුත්තො අහු, පුත්‍රයා විය; අමච්ඡරී, මසුරු නුවූයේ; දානපති, දානපති (දීමෙහි ස්වාමි) යෙක් වූයේ; විරොචති, දැන් බබළයි.

අස් වෙළෙඹුන් සිව් දෙනෙකු යෙදූ රථයෙන් සුන්දර ගමනින් හෝ චතුර ගමනින් යුක්තව යම් ඒ දෙව්කුමරෙක්යේද ඒ තෙම අපගේ මධ්‍යම පුත්‍රයාය; ඔහු නොමසුරුව දානපතියෙක්ව දන් දුන් බැවින් දැන් බබළයි.

78. සපඤ්ඤා, ප්‍රඥාසහිතවූ; මිගමන්දලොචනා, මුවදෙනෙකුට බදු මඳ ඇසිපියහෙළීම් ඇති; යාසාව නාරී, යම් ඒ (දිව්‍ය)

Non-commercial distribution

ස්ත්‍රියක් තොමෝ; පච්ඡා පසුව; සිවිකාය, රන්සිවි යහනින්; නීයාති, ගෙනයනුලැබේද; සා, ඕතොමෝ; අම්හාකං, අපගේ කනිට්ඨා යිත්‍තා අහු, බාලදුවවිය; භාගඩ්ඨභාගෙන, භාගාර්ධභාග දානයෙන් (හෙවත්) තමාලත් කොටසින් අඩකොටසක් දීම හෙතුවෙන්; සුඛී, සුවපත්වූවා; පමොදති, දැන් සතුටුවෙයි.

මුවදෙනෙකුමෙන් මඳ ඇයිපිය හෙළීම් ඇති යම් ඒ දෙවඟනක් රන්සිවිගෙයකින් පසුවයේද ප්‍රඥවත්වූ ඒ ස්ත්‍රිය අපගේ බාල දුහිතෘව වන්නීය. ඈ තමාලත් (ආහාර) කොටසින් අඩක් දීම හෙතුවෙන් දැන් සුවපත්වූවා සතුටුවෙයි.

79. එතෙව, මොවුහු; පුබ්බෙ, පෙර; පසන්නචිත්තා, තුනුරුවන් කෙරෙහි පහන්සිත් ඇතිව; සමණ බ්‍රාහ්මණානං, මහණ බමුණන්ට; දානානි අදංසු, දන් දුන්නාහුය; මයම්පන, අපි වනාහි; මච්ඡරිනෝ අහුම්හා, මසුරු සිත් ඇත්තෝවීමු; සමණබ්‍රාහ්මණානං, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට; පරිහාසකා, පරිභව කොළෝවෙමු. එතෙ, මොවුහු; පදත්වා, දන්දී; පරිචාරයන්ති, දැන් දිව්‍යකාම සම්පත්හි ඉඳුරන් හසුරුවත්(නොහොත්) පරිවාර ජනයා ලවා ස්වකීය පුණ්‍යානුභාවහෙතුවෙන් මෙහෙකරවත්; මයංච, අපිදු; බිත්තෝ, (අව්වේ) දම්නලද; නළොඉව, බටගසක් මෙන්; සුස්සාම, (සාපිපාසයෙන්) වියලුණෝ වම්හ.

මොවුහු තිදෙන මහණ බමුණන් කෙරෙහි පහන්සිත් ඇතිව පෙර දන් දුන්නාහුය, අපි දෙදෙන වනාහි මසුරුව ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට පරිභවකළෝ වම්හ. ඔවුහු නොමසුරුව දන්දී දිව්‍යකාම සම්පත්හි තම ඉඳුරන් ඔබිමොබ සැප පරිදි හසුරුවත් නොහොත් පිරිවර ජනයා ලවා ස්වකීය පුණ්‍යානුභාව හෙතුවෙන් මෙහෙකරවා ගනිත්, අපි වනාහි අව්වේ බහාලූ බටයක්මෙන් සාපිපාසායෙන් හා එකිනෙකා මුඟුරුවලින් කළාඟනීමෙන්ද වියලුණෝ වම්හයි කීහ.

මෙසේ ඒ ප්‍රෙතයෝ දෙදෙන තමන්ගේ අකුශලකර්මය තුමූම ප්‍රකාශකොට ''අපි නුඹ වහන්සේගේ නෑදිමයිලෝ (මාමා හා නැන්දණී) වෙමුය''යි කීහ. සාමණෙර නම් එපවත් අසා උපන් සංවෙග ඇතිව මෙබඳු පව්කම් කළවුන්ට කෙසේනම් ආහාර සිදුවෙත්දැයි විචාරන්නේ:-

Non-commercial distribution

80. කිං තුම්හාකං භොජනං කිං සයානං
කථං සු යාපෙථ සුපාපධම්මිනෝ,
පහූතභොගෙසු අනප්පකෙසු
සුඛං විරාධාය දුක්ඛප්පත්තා-නි.

80. තුම්හාකං, තොපගේ; භොජනං, ආහාරය; කිං, කෙබඳුද; සයානං, සයනය; කිං, කෙබඳුද; සුපාපධම්මිනෝ, ඉතා ලාමක ස්වභාව ඇත්තාවූ (තෙපි); කථංසු, කවර ප්‍රකාරය-කින්; යාපෙථ, යැපෙන්නාහුද; අනප්පකෙසු, ස්වල්පනුවූ; පහූතභොගෙසු, උදර භොග සම්පත් ඇතිකල්හි; සුඛං, (සැපතට හෙතුවූ පින් නොකිරීමෙන්) සැපය; විරාධාය, වරදවාගෙන; අජ්ජ, මේ කාලයෙහි; දුක්ඛං, (මේ ප්‍රෙතයොනියට ඇතුළත්) දුකට; පත්තා, පැමිණියාහුය.

ප්‍රෙත යොනික තොපගේ ආහාරය කෙබඳුද සයනය කෙබඳුද හෙවත් කෙබඳු සයනයක නිදන්නාහුද ඉතා ලාමක ස්වභාව ඇති තොපි කවර අන්දමකින් යැපෙන්නාහුද, අපයින්ත බොහෝ සම්පත් ඇති කල්හී සැපට හෙතුවූ පින් නොකිරීමෙන් සැපයට විරුඬව ක්‍රියාකොට අද ප්‍රෙත යොනියට අයත් මේ දුකට තොපි පැමිණියාහුයයි මේ ගාථාව කීයේය.

මෙසේ ඒ සාමණෙරයන් විසින් විචාරණ ලද්දවූ ප්‍රෙතයෝ ඔහු විසින් අසනලද ඒ කාරණය විසඳමින් ගාථාවන් කීහ;

81. අඤ්ඤමඤ්ඤං වධිත්වාන-පිවාම පුබ්බ ලොහිතං,
බහුං පිත්වා න ධාතා හොම-නච්ඡාදිම්හ සෙ මයං.

82. ඉච්චෙව මච්චා පරිදෙවයන්ති
අදයකා පෙච්ච යමස්ස ඨායිනෝ,
යෙ තෙ විදිත්වා අධිගම්ම භොගෙ
නභුඤ්ජරෙ නාපි කරොන්ති පුඤ්ඤං.

83. තෙ බුප්පිපාසූපගතා පරත්ථ
පෙතා චිරං ඣායරෙ ඩය්හමානා,
කම්මානි කත්වාන දුබ්බුද්‍යානි
අනුභොන්ති දුක්ඛං කටුකප්ඵලානි.

84. ඉත්තරං හි ධනං ධඤ්ඤං-ඉත්තරං ඉධ ජීවිතං,
ඉත්තරං ඉත්තරතො ඤත්වා-දීපං කයිරාථ පණ්ඩිතෝ.

Non-commercial distribution

85. යෙ තෙ එවං පජානන්ති–නරා ධම්මස්ස කොවිද,
තෙ දනෙ නප්පමජ්ජන්ති–සුත්වා අරහතං වචො–ති.

81. මයං, අපි; අඤ්ඤමඤ්ඤං, එකිනෙකා; වධිත්වාන, තළාගන; පුබ්බලොහිතං, පූයා හා රුධිරය; පිවාම, පානයකරමු; බහුං, බොහෝකොට; පිත්වා, පානයකොට; නධාතාහොම; තෘප්ති (සෑහෙන්නෝ) නොවෙමු; නච්ඡාදිමිහසෙ, රුචි නොවෙමු; (නොහොත්) තමන්ගේ රුචියෙන් එය නො බොන්නෙමු.

''ස්වාමීනි, අපි එකිනෙකා තළාගෙන සැරව හා ලේ බොමු. බොහෝකොට පානයකොට තෘප්තියක් ඇති නොවෙමු. අපි තමන්ගේ කැමැත්තෙන් ඒ ලේ සැරව නොබොන්නෙමු.

82. ඉතිඵව, මෙසේම; අදයකා, නොදෙන සුලුවූ; මච්චා, (අපමෙන් අනිකුදු) මනුෂ්‍යයෝ; පෙච්ච, පරලොව; යමස්සයාසි නො, ප්‍රෙතවිෂයෙහි සිටින සුලුව; පරිදෙවයන්ති, විලාප කියත්; යෙ තෙ, යම් ඒ මනුෂ්‍යකෙනෙක්; හොගෙ, (මේ කාලයෙහි හා මතුත් සුබවිශෙෂ විධායකවූ) හොගසම්පත්; විදිත්වා, දැන; අධිගම්ම, ලබාගන; නහුඤ්ජරෙ, (අපමෙන් තුමූත්) අනුභව නොකරෙත්ද; පුඤ්ඤං අපි, පිනකුත්; න කරොන්ති, නො කරත්ද.

මෙසේම අපමෙන් නොදෙන සුලු මසුරුවූ කරනලද පව් කම් ඇති අනිකුදු මනුෂ්‍යයෝද ප්‍රෙතවිෂයෙහි සිටින සුලුව හෙවත් ප්‍රෙතව ඉපිද හඬත්. යම් ඒ මිනිස් කෙනෙක් මේ කාලයෙහි හා මතුත් සැප විශෙෂ විධායකවූ හොගසම්පත් දැන ලබාගන (අපමෙන් තුමූත් මසුරුකමින්) අනුභව නොකරත්ද අනුන්ට දෙමින් දානමය පිනකුත් නොකරත්ද.

83. තෙ, ඒ සත්වයෝ; දුබ්‍රුයානි, දුඃඛවිපාකවූ; කම්මානි කත්ඛාන, පවිකම්කොට; පරත්ථ, පරලොවදී; බුප්පිපාසූපගතා, සාපිපාසයෙන් මඩනාලද්දවූ; පෙතා, ප්‍රෙතයෝව; චිරං' බොහෝ කල් මුළුල්ලෙහි; ඩය්හමානා, (ක්ෂුධාදීන්ට හෙතුවූ දුඃඛාග්නියෙන්) දැවෙමින්; ඣායරෙ, දැවෙත්; කටුකඵලානි, අනිෂ්ටඵලවූ පවිකම්කොට; දුක්ඛං, (අපායික) දුක; අනුභොන්තී, (බොහෝ කල්) අනුභව කරත්.

Non-commercial distribution

ඒ සත්වයෝ දුක්විපාකවූ පව්කම්කොට පරලොව ප්‍රෙත යොනියෙහි සාපිපාසයෙන් මඩනාලද ප්‍රෙතයෝව ක්ෂුධාදියට හේතුවූ දුක්නැමැති ගින්නෙන් ''අප විසින් ඒකාන්තයෙන් කුසල් නොකරන ලද්දේය, පව්කරන ලද්දේය''යි ආදියෙන් පවත්නා විපිළිසර ගින්නෙන් දැවෙමින් බොහෝ කලක් දැවෙන්නෝය. අනිෂ්ට විපාකවූ පව්කම්කොට කටුකවූ ආපායික දුක් බොහෝ කලක් අනුභව කරත්.

84. ධනංධඤ්ඤං, ධනධාන්‍යය; ඉත්තරංහි, ක්ෂණිකමය (හෙවත්) විපරිනාම ස්වභාව ඇත්තේය; ඉධ, මේ ලොකයෙහි; ජීවිතං, මනුෂ්‍ය ජීවිතයත්; ඉත්තරං, ස්වල්පය; පණ්ඩිතෝ, සප්‍රාඥ පුරුෂතෙම; ඉත්තරං (ධන ධාන්‍යාදි උපකරණ හා මනුෂ්‍ය ජීවිතයත්) ක්ෂණිකයයි (හෙවත්) අනිත්‍යයයි; ඉත්තරතෝ, අනිත්‍ය වශයෙන්; ඤත්වා, දැන; දීපං, ප්‍රතිෂ්ඨාව (හෙවත් තමාට හිතසැප සාධක) යහපත; කයිරාථ, කරන්නේය.

ධනධාන්‍යාදි උපකරණද ක්ෂණිකය හෙවත් බොහෝකල් නොපවත්නේය අනිත්‍යමය, මෙලොව මනුෂ්‍යයන්ගේ ජීවිතයද අනිත්‍යය, හිරණ්‍ය ස්වර්ණාදි වස්තූන් හා මනුෂ්‍ය ජීවිතයත් අනිත්‍ය බැව් ප්‍රඥාවෙන් පරීක්ෂාකොට දැන සප්‍රාඥ පුරුෂයා පරලොවදී තමාට හිත සැපතට පිහිටවූ පින්කරන්නේය.

85. ධම්මස්ස කොවිද, ධර්මයෙහි දක්ෂවූ; යෙතෙනරා, යම් ඒ මනුෂ්‍යකෙනෙක්; එවං, මෙසේ; පජානන්ති, (තත්වූ පරිද්දෙන්) දනිත්ද; තෙ, ඒ මනුෂ්‍යයෝ; අරහතං වචෝ, අර්හත්වූ බුඩාදී ආර්‍යයන්ගේ වචනය; සුත්වා, අසා; දනෙ, දනයෙහි; තප්පමජ්ජන්ති, පමානොවෙත්.

ධර්මයෙහි දක්ෂවූ යම් ඒ මනුෂ්‍යකෙනෙක් මෙසේ මනුෂ්‍ය යන්ගේ වස්තු සම්පත් හා ජීවිතයත් අනිත්‍ය බව තත්වූ පරිදි දන්නාහු නම් ඒ මනුෂ්‍යයෝ අර්හත්වූ බුඩාදි ආර්‍යයන්ගේ අවවාද වචනය අසා සැමකල්හිම දන්දීමෙහි පමා නොවෙත් යයි කීහ.

මෙසේ සාමණෙරයන් විසින් විචාරණලද ඒ ප්‍රෙතයෝ ඒ ප්‍රවෘත්තිය කියා ''අපි නුඹවහන්සේගේ මාමා හා නෑනුනිය වෙමුය''යි කීවාහුය. එපවත් අසා සාමණෙරතෙම උපන්

Non-commercial distribution

සංවේග ඇතිව ශාසනයෙහි කලකිරීම පහකොට උපාධ්‍යායයන් වහන්සේ ගේ දෙපතුල් හිසින් වැඳවැටී මෙසේ කීය. ''ස්වාමීනි නුඹවහන්සේ විසින් යම් අනුකම්පාවක් කටයුතුවීද, ඒ අනුකම්පාව නුඹවහන්සේ විසින් කරුණාවෙන් මට කරන ලද්දීය, ඒකාන්තයෙන් මහත් අනර්ත්ථවූ වැටීමකින් පහකොට දුකින් මුදවා මම රක්ෂාකරන ලද්දේවෙමි දැන් මට ගිහිවාස-යෙන් ප්‍රයොජන නැත, ශාසනබ්‍රහ්මචර්‍යාවාසයෙහි ඇලෙන් නොමියි'' කීයේය. එකල්හි ආයුෂ්මත් සංකිච්ච තෙරුන් වහන්සේ ඔහුගේ අදහසට අනුරූපවූ කර්මස්ථානයක් වදළහ. ඒ සාමණේරතෙම කර්මස්ථානයෙහි යෙදීමෙන් නොබෝ කලකින්ම අර්හත්වයට පැමිණියේය. ආයුෂ්මත් සංකිච්ච තෙරුන් වහන්සේ එපවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළහ. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට පැමිණි පිරිසට විස්තර වශයෙන් ධර්මදේශනා කළසේක. දෙශනා තොමෝ මහජනයාහට සාර්ත්ථකවිය.

(පින්වත්නි, එක පවුලේ විසූ පස්දෙනා අතුරෙන් මිථ්‍යා දෘෂ්ටිකවූ මව්පියන් දෙදෙන මරණින් පසු ඉතා බියකරු බලවත් දුකට පත්ව පසුතැවිළිවූ සැටිත් උපාසකතුමාගේ සම්‍යක් උපායයෙන් සහෝදර සහෝදරියන් තිදෙන සම්‍යක් දෘෂ්ටිය වැළඳගෙන සස්නෙහි ඇලී පින්කිරීමෙන් දිව්‍ය ශ්‍රී සම්පතට පැමිණ සතුටුවූ අයුරුත් හෙරණ නම උපාධ්‍යායයන්ගේ අවවාද යට නැමීමෙන් වැටෙන්ට තිබෙන මහත් විපතින් මිදී සසරදුක් කෙළවරකළ අයුරුත් මේ කථාවෙන් දැන සිත තබාගන සැප කැමති කවුරුත් යහපත්මග ගමන් කිරීමෙන් නොපමාව සසර දුකින් මිදීමට උත්සාහවත් වියයුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උරග වර්ගික එකොළොස්වන නාග ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

1. 12 වෙනි කථාව.

කවද මේ ප්‍රෙතවස්තුව දෙශනායෙහි උරග වර්ගයට ඇතුළත් දෙළොස්වන උරග ජාතක වස්තුව කවරහයත්.

අසරණ සරණ සරණංකර ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සේක් එක්තරා උපාසකයෙකු අරභයා මේ උරග ජාතක වස්තු දෙශනාව වදළසේක, සැවැත්නුවර

Non-commercial distribution

වනාහි එක්තරා උපාසකයෙකුගේ පුත්‍රයා කළුරිය කළේය. ඒ උපාසකතෙම පුත්‍රමරණය හෙතුකොට විලාපයට හා ශොක කරණයට පැමිණියේ පිටතගොස් කිසි කටයුත්තක් කරන්ට නොහැකිව ගෙදරම සිටියේය. එකල්හි ශාස්තෘන්වහන්සේ අළුයම මහාකරුණා සමවතින් නැඟිසිට බුදු ඇසින් ලොව බලා වදරන්නේ ඒ උපාසකයා දැක පූර්වාහ්න කාලයෙහි හැඳගෙන පාසිවුරු රැගෙන ඔහුගේ ගෘහයට වැඩමවා දෙරළඟ වැඩසිටි සේක. උපාසකයා බුදුන් වැඩි බව අසා වහා නැඟිට ගොස් පෙරගමන්කොට අතින් පාත්‍රය ගෙන ගෙට වැඩමවා අස්නක් පණවා දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ පණවනලද අස්නෙහි වැඩහුන්සේක. උපාසකයාද භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය. ඔහුගෙන් භාග්‍යවතුන් වහන්සේ ''උපාසකය කිම ශොකයෙන් මඩනා ලද්දෙකුමෙන් පෙනේය''යි අසූසේක. භාග්‍යවතුන් වහන්ස එසේය, මාගේ ප්‍රිය පුත්‍රයා කාලක්‍රියා කළේය, එයින් මම ශොකයෙන් මඩනා ලද්දේවෙමි''යි කීය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ශොක දුරුකරමින් උරග ජාතකය වදළසේක. මෙසේදයත්:–

යටගිය දවස කසීරට බරණැස්නුවර ධම්මපාල නම් බ්‍රාහ්මණ කුලයක් විය. එහි බ්‍රාහ්මණයා හා බැමිණිද පුත්‍රයා හා දුවණියද ලේලි සහ දසියද යන මේ සියල්ලෝම මරණාස්මෘති භාවනායෙහි ඇලුණෝවූහ. ඔවුනතුරෙන් යමෙකු ගෙයින් නික්මේද ඒතෙම සෙසු ජනයන්ට අවවාදකොට නිරපෙක්ෂක (ආලය නැතු)වම නික්මයයි. එකල්හි එක්දවසක් බ්‍රාහ්මණ තෙම පුත්‍රයා සමග ගෙදරින් පිටත්ව කෙතට ගොස් සීසෑම කරයි. පුත්‍රයා වියලි තණපත් දර ගිනිදල්වයි. එතැන්හි එක් කෘෂ්ණ සර්පයෙක් (නාගයෙක්) තෙම ඩාහහයෙන් රුක්සිදුරෙන් නික්මවිත් මේ බ්‍රාහ්මණයාගේ පුත්‍රයා දෂ්ටකළේය. ඒ බමුණු කුමරා විෂවෙගයෙන් මුසපත්ව එතනම වැටී කලුරිය කළේ සක්දෙව් රජව උපන්නේය. බ්‍රාහ්මණතෙම පුතා මළබැව් දැක සීසෑම කම්‍යාන්තය කරන කෙත සමීපයෙන් යන එක් පුරුෂ–යෙකුට මෙසේ කීයේය. ''යහළුව මගේ ගෙදරට ගොස් බැමිණියට මෙසේ කියව: ස්නානයකොට පිරිසිදු වස්ත්‍ර හැඳගන එකෙකුට බත් හා මල් මාලා සුගන්ධාදියද ගෙනඑව''යි කියව. ඒ මගී පුරුෂතෙම එහි ගොස් බැමිණියට එසේ කීයේය ගෘහ

Non-commercial distribution

ජනයාද එලෙස කෙළේය. බ්‍රාහ්මණයා පැන් නහා බත් අනුභව කොට සුවද ගල්වා පිරිවර ජනයා විසින් පිරිවරන ලදුව පුතණු වන්ගේ මළසිරුර දරසෑයට නංවා ගිනිදල්වා දරකඳක් දවන්- නාක්මෙන් ශොකනැතිව සිත් තැවුල්ලක් නැතිව අනිත්‍ය සංඥව මෙනෙහිකරමින් සිටියේය. එකල්හි බ්‍රාහ්මණ පුත්‍රයා ශක්‍රව උපන. ඒ සක්දෙව් රජහුද අපගේ බොධිසත්වයාණෝ වූහ. එ සක්දෙව්රජ තමන්ගේ පූර්වජාතිය හා කරනලද පිනද ප්‍රත්‍යවෙක්ෂාකොට පියාණන්ට හා නැයන්ටද අනුකම්පා කරමින් බ්‍රාහ්මණ වෙශයෙන් ඒ චිතකස්ථානයට ගොස් ශොක නොකරන නැයන් දැක ''පින්වත තොපි මුවෙක් දවන්නාහුද? අපටත් මස් ටිකක් දෙව්, බඩගිනි ඇත්තෙමි''යි කීයේ. බමුණ! මුවෙක් නොවෙයි. මනුෂ්‍යයෙකැ''යි කීය. කිමෙක්ද මේ දවන තැනැත්තේ තොපගේ පසමිතුරෙක්දැයි ඇසිය, පස මිතුරෙක් නොවෙයි, ළෙඟි උපන් ඖරසපුත්‍රවූ මහාගුණවත් තරුණ පුත්‍රයෙකැයි කීය. ''එබඳු ගුණවත් තරුණ පුතෙකු මළ කල්හි නුඹලා කුමක් සඳහා ශොකනොකරව්ද''යි විචාළේය. එය අසා බ්‍රාහ්මණයා ශොකනොකරන කාරණය කියන්නේ:-

86. උරගොව තචං ජින්නං-භිත්වා ගච්ඡති සංතනූං,
එවං සරීරේ නිබ්භොගෙ-පෙතෙ කාලකතෙ සති.

87. ඩය්හමානොා නජානාති-ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න රොදමි-ගතොා සොා තස්ස යා ගතී-ති

86. උරගොා, සපීතෙම; ජීන්නං, දිරුණාවූ; තචං, සම; සංතනූං, සිය සිරුරෙන්; භිත්වා, හැරදමා; ගච්ඡති, (කැමති පරිද්දෙන්) යේද; එවං, එසේම; සරීරෙ, ශරීරය; නිබ්භොගො, නිරර්ත්ථකවූ කල්හි; පෙතෙ, (ආයු උෂ්ම විඥනයන්) පහවූ කල්හි; කාලකතෙසති, කළුරිය කළකල්හි.

87. ඩය්හමානොා, දවනු ලබන්නාවූ ශරීරය; ඤතීනං, නැයන්ගේ; පරිදෙවිතං, හැඬීම; නජානාති, නොදනී; තස්මා, එහෙයින්; එතං, මේ (මාගේ) පුත්‍රයා නිමිත්තකොට; නරොදමී, (මම) නොහඬමි; සොා, හෙතෙම; තස්ස, ඔහුගේ (කර්මය වශයෙන්) යා ගති, යම් ගමනක් (කැමැති) වීද; ගතොා, (චුති චිත්තයට අනාතුරුවම ඊට පැමිණියේය.

යම්සේ සපීතෙමේ දැදුරුබැවින් දිරාගිය සියසම දුක් උපද වමින් රුක් අතර හෝ දඬුඅතර හෝ මුල්අතර හෝ ගල්අතර

Non-commercial distribution

හෝ සැටවයක් මුදන්නාක්මෙන් ශරීරයෙන් මුදහැරදමා කැමති තැනකට යේද, එසේම සසර කරකැවෙන්නාවූ සත්වයෙම පෙරකළ කර්‍මය ක්ෂයවූ බැවින් දැදුරුවූ ස්වකීය ශරීරය හැරදමා කර්‍මවූ පරිද්දෙන් යයි පුනර්භව වශයෙන් උපදී, මෙසේ මොහුගේ මෙන් සෙස්සන්ගේද ශරීරය නිරර්ත්ථකවූ කල්හි ආයු උෂ්ම විඤ්ඤාණ යන මොවුන් ශරීරයෙන් පහවූ කල්හි මළකල්හි යම් හෙයකින් දවනුලබන්නාවූ ශරීරය විඤ්ඤාණය නැතිබැවින් දහදුකද ප්‍රිය ඥාතීන්ගේ හැඬීම හා විලාපයත් නොදනීද එහෙයින් මාගේ මේ පුත්‍රයා නිමිත්තකොට මම නොහඬමි, ඉදිනුත් මැරුණු සත්වයෝ උච්ඡේදනයට නොපැමිණෙද්ද, කරනලද අවකාශ ඇති කර්‍මයාගේ වශයෙන් මළවුන් විසින් යම් උත්පත්ති සංඛ්‍යාත ගමනක් කැමතිවන ලදද, ඒ ගතියට චුතිචිත්තයට අනතුරුවම පැමිණියේය, ඒ මළ තැනැත්තේ පූර්වඥාතීන්ගේ හැඬීම හෝ විලාපය ප්‍රාර්ත්ථනා නොකරයි. බොහෝසෙයින් පූර්ව ඥාතීන්ගේ හැඬීමෙන් කිසි අර්ත්ථසිද්ධියක් නැත්තේය යන අදහසවේ.

මෙසේ බමුණා විසින් තමන්ගේ සිහිනුවණින් කල්පනා කිරීමෙහි දක්ෂතාවය ප්‍රකාශකළ කල්හි බ්‍රාහ්මණ ස්වරූපවූ ශක්‍රතෙමේ බැමිණියගෙන් මෙසේ විවාළේය. ''මෑණියෙනි ඒ මළ තැනැත්තේ නුඹගේ කවරෙක්වේද''යි ඇසූකල්හි ''ස්වාමීනි දසමසක් මුළුල්ලෙහි කුසින් උසුලාගන සිටි (ප්‍රසූතකොට) කිරි පොවා අත්පා මනාව පිහිටුවා වඩනාලද මාගේ පුත්‍රයාය'' යි කීයේය, ''ඉදින් එසේවීනම් පියා පුරුෂවයෙන් නොහඬයි, මවගේහෘදය මොලොක්වෙයි, නී කවරහෙයින් නොහඬාදැ''යි කවරහෙයකින් නොහඬාදැයි ඇසීය. එය අසා ඈ නොහඬන කාරණය කියන්නී–

88. අනවිහිතෝ තතෝ ආග–අනනුඤ්ඤාතෝ ඉතෝ ගතෝ,
යථාගතෝ තථාගතෝ–තත්ථ කා පරිදෙවනා.

89 *ඩය්හමානෙ නජානාති–ඤාතිනිං පරිදෙවික,
කස්මා එකං නරොදමි–ගතෝ සෝ කස්ස යා ගතී–ති

88. තතෝ, ඒ (පරලොව සිටි) තැනින්; අනවිහිතෝ, (අප විසින්) නොකැඳවන ලදුව; ආග, පැමිණියේය; ඉතෝ, මෙලොවින්; අනනුඤ්ඤාතෝ, [අප විසින්] අනුනොදන්නා

Non-commercial distribution

ලදුව; ගතෝ (පරලොව) ගියේය; යථාගතෝ, යම් ආකාරයකින් ආයේද හෙවත්; යම් කර්මයකින් පැමිණියේද; තථාගතෝ, එසේ (සවකීය කර්මයවූ පරිද්දෙන්) ගියේවෙයි; තත්ථ, එහිදී; කාපරිදෙවනා, කවර හැඩීමක්ද.

එව මගේ පුත් බවට පැමිණවයි කියා අප විසින් නොකැඳවන ලද්දේය, ඔහු පෙර සිටි ඒ පරලොවින් මෙහි පැමිණියේය. දරුව තෝ පරලොව යවයි අප විසින් අනුනොදන්නා ලදුව මෙලොවින් පරලොව ගියේය, යම් සේ අප විසින් නොකැඳවන ලද්දේම මෙහි පැමිණියේද එසේම පරලොව ගියේය, හෙවත් යම් සේ ස්වකීය කර්මයෙන්ම මෙහි උත්පත්ති වශයෙන් පැමිණියේද එසේම ස්වකීය කර්මයෙන්ම පරලොව ගියේය, මෙයින් කර්ස්වක (කර්මය තමා අයත්) බව දක්වයි, මෙසේ තමා වසයෙහි නොපවත්නාවූ සසර පැවැත්මෙහි මරණය සඳහා කවරනම් විලාපයක්ද නැණවතුන් විසින් ඒ විලාප කිරීම අයුතුය නොකටයුතුයයි දක්වීය.

මෙසේ බැමිණිය ගේ වචනය අසා ඒ මළ අයගේ නැගෙණියගෙන් ''නැහණිය මේ මළතැනැත්තේ නුඹට කවරෙක් වේද''යි විචාළකල්හි ''ස්වාමිය මාගේ සහෝදරයාය''යි කීකල ''නැහෙණිය සහෝදරියෝ නම් සොහොයුරන් කෙරෙහි ස්නෙහ ඇත්තෝය, කවරහෙයකින් ති නොහඬාද''යි ඇසීය. ඕතොමෝද නොහඬන කාරණය ප්‍රකාශ කරන්නී:-

90. සචෙ රොදෙ කිසා අස්සං-තත්ථ මෙ කිං ඵලං සියා,
ඤාති මිත්ත සුහජ්ජානං-භීය්‍යෝ නො අරතී සියා,

91. *ඩය්හමානො නජානාති-ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං නරොදාමි-ගතෝ සො තස්ස යා ගති-ති.

90. සචෙ, ඉදින්; රොදෙ, අඩන්නෙම් නම්; කිසා අස්සං, කෘශවූ ශරීර ඇත්තියක් වන්නෙමි; තත්ථ, ඒ හැඩීමෙහිදී; මෙ, මට; කිංඵලංසියා, කවර ප්‍රයෝජනයක් වන්නේද; නො, අපගේ; ඤාතිමිත්ත සුහජ්ජානං, ඥාතිමිත්‍ර සුහෘජ් ජනයන්ගේ; භීය්‍යෝ, බොහෝසෙයින්; අරතිසියා, නොඇලීම දුකමවන්නේය.

Non-commercial distribution

ඉදින් මම හඬන්නේ නම් වියළුණු ශරීර ඇතිවන්නෙමි, ඒ සහෝදර මරණය කරණකොට ඇඬීමෙහිලා මට කවර නම් ප්‍රයෝජනයක්ද; කවර ආනිසංසයක් වන්නේද; මගේ ඒ ඇඬීමෙන් සහෝදරයා නො එන්නේය, ඒ හේතුවෙන් ඔහු සුගතියටද නොපැමිණෙන්නේය. අපගේ ඥාතිමිත්‍ර සුහෘජ්ජන-යන්ටද භ්‍රාතෘමරණ දුඃඛයෙන් මගේ ශොක කිරීමෙන් බොහෝ සෙයින්ම අරති සංඛ්‍යාත දුක්ම වන්නේය''යි ගාථා දෙකක් කීයේය.

මෙසේ නැඟෙණියගේ වචනය අසා ඔහුගේ භාර්‍යාවගෙන් ''ඒ මළ තැනැත්තේ කිට කවරෙක්වේද''යි ඇසීය. ඒ ''ස්වාමිය හෙතෙම මගේ ස්වාමිපුරුෂයාය''යි කීය. ''සොඳුර ස්ත්‍රීහු නම් ස්වාමි පුරුෂයා කෙරෙහි ස්නෙහ ඇත්තෝවෙත්. ඕ ස්වාමියා මළකල්හිද ස්ත්‍රීහු වැන්දඹුව අසරණ වෙත්. නුඹ කවර හේතුවකින් නොහඬාදැ''යි විචාළේය. ඕතොමෝද තමා නොහඬන කාරණය කියන්නී ගාථා වයක් කීයේය.

92. යථාපි දරකො චන්දං-ගච්ඡන්ත මනුරොදති,
එවං සම්පදමෙවෙතං-යො පෙතමනුසොචති.

93. *ඩය්හමානො නජානාති-ඤාතීනං පරිදෙවතං,
තස්මා එතං නරොදම්-ගතො සො තස්ස යා ගති-ති,

93. යථාපි, යම්සේ; දරකො, ළදරුතෙම; ගච්ඡන්තං, අහස යන්නාවූ; චන්දං, සඳමඩල (දූක); අනුරොදති, හඬාද; යො, යමෙක්තෙම; පෙතං අනුසොචති, කළුරිය කෙළෙකු නිසා ශොකකෙරේද; එතංසම්පදං, මේ කාරණයද; එවංඑව, එසේම වේ.

යම් සේ ළදරුතෙම අහසයන්නාවූ සඳමඩල දූක මට රථ චක්‍රය අරන්දුන මැනවැයි හඬාද, යමෙක් මළ තැනැත්තෙකු අරභයා ශොක කෙරේද ඔහුගේ මේ අනුසොවනයත් එබඳුවෙයි, ආකාශයෙහි ගමන් කරන්නාවූ සඳමඩල ගනු කැමති බැව් සමානය, නොලැබිය හැකි වස්තුවක් කෙරෙහි පැවැති ආසාවක් මෙයිනි.

මෙසේ ඒ මළුනුගේ බිරින්ද කී වදන් අසා පසුව දසියගෙන් ''නැඟණිය නුඹට හෙතෙම කවරෙක්වේද''යි විචාළේය,

Non-commercial distribution

''ස්වාමිය හෙතෙම මාගේ ස්වාමියායැ''යි කිවිට ''ඉදින් එසේවී නම් ඔහු විසින් තළා තිලවා වකාවත් කරවන ලද්දේ වන්නේය, එහෙයින් ඔහුගෙන් මම මොනවට මිදුනේ වෙමියයි සිතා කී නොහඬය''යි සිතමි. ''ස්වාමිය මෙසේ මට නොකියනු මැනව''යි (එසේ කීම සුදුසු නොවේ.) මාගේ ආයාර්‍යපුත්‍රතෙම ඉතාම ක්‍ෂාන්ති මෛත්‍රී දයා ගුණයෙන් යුක්තවූ යුතුදේම කරන සුලුවූ කෙනෙක ''(ළෙඟි වැඩුණු පුතෙකු වැනි වීය)''යි කීයේය. එසේනමි කී කවර හෙයකින් නොහඬාදැයි විවාළේය. ඔතොමෝද තමා නොහඬන කරුණ කියන්නී ගාථාදෙකක් කීය:-

94. යථාපි බ්‍රහ්මෙ උදකුම්භො-භින්නො අප්පටිසනිධියො,
එවං සම්පදමෙවෙතං-යො පෙතමනුසොචති.

95. *ඩය්හමානො,න ජානාති-ඤාතීනං පරිදෙවිතං,
කස්මා එතං නරොදම්-ගතො සො තස්ස යා ගති-ති.

94. බ්‍රහ්මෙ, පින්වත් බමුණ; යථාපි, යම් සේ; උදකුම්භො, දියකළය; භින්නො, බිඳුණේ; අප්පටිසන්ධියො, නැවත නො ගැළපිය හැකිවේද; යො, යමෙක්තෙම; පෙතං අනුසොචති, කළුරිය කෙළෙකු සඳහා ශොක කෙරේ නම්; එතං සම්පදං, මේ කාරණයත්; එවංඑව, එසේමයයි දතයුතු.

පින්වත් බමුණ යම් සේ පැන්කළයක් මුගුරෙන් (පොල්ල කින්) ගැසීම් ආදියකින් බිඳින ලද්දේ නම් නැවත එය පිළියම් නොකටහැක්කේ ප්‍රකෘතිමත් නොවේද, එසේම යමෙක් පර-ලොව ගියහු නිමිත්තකොට ශොක කෙරේනම් ඒ කාරණය බිඳුණකළය ප්‍රකෘතිමත් කිරීමට උත්සාහ දැරීමමෙන් නිෂ්ඵල වන්නේය.

ශක්‍රයා ඔවුන්ගේ ධර්මකථාව අසා ප්‍රසන්න සිත් ඇත්තේ ''තොප විසින් මරණානුස්මෘතිය මනාකොටම වඩනාලද්දීය. මෙතැන් පටන් තොප විසින් කෘෂිකර්මාදිකරණ කෘත්‍යයක් නැතැ''යි කියා ඔවුන්ගේ ගෘහය සත්රුවනින් පිරුණක්කොට ''අප්‍රමත්තව දන්දෙව් සිල්රකිව් පෙහෙවස් සමාදන්ව රකිවිය''යි අවවාදකොට තමාද ඔවුන්ට දන්වා ස්වකීය ස්ථානයටම ගියේය. ඒ බ්‍රාහ්මණාදීහුද දානාදී පින්කර්මකොට ආයු ඇතිතෙක් සිට (මරණින් මතු) දෙව්ලොව උපන්නාහුය. ශාස්තෘන් වහන්සේ

Non-commercial distribution

මේ උරගජාතක දෙශනාව ගෙනහැර දක්වා ඒ උපාසකයාගේ ශොකශල්‍යය (සොක නැමැති හුල) මොනවට උදුරා මත්තෙහි චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර උපාසකයා ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියේය,

(යම්කිසි මරණයක් නිසා ඇතිවන සෝදුක් ගිනි නිවා ගැනීමට මේ කථාව ඉතා ප්‍රයොජනවත් නිදර්ශනයක් බැවින් මෙය නිතර කියවා සිත්හි ධාරණය කරගතයුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි පළමුවන උරග වර්ගයෙහිවූ උරගජාතක වස්තු වණ්ණනාව කියා නිමවනලදී.

---

2. 1 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි දෙවන උබ්බරී වර්ගයෙහි පළමුවන සංසාරමොචක ප්‍රෙතවස්තුව කවරහයත්.

සාධුජන හෘදයානන්දකර ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන කල්හි මගධ රට ඉටයකාවතී නම් ගම එක්තරා ප්‍රෙතියෙකු අරභයා මේ ධර්මදෙශනාව වදළසේක. මගධ රට වනාහි ඉටයකාවතියයිද, දීසරාජියයිද කියා ගම්දෙකක් වූවාහුය, එහි බොහෝ සංසාරමොචකමිථ්‍යාදෘෂ්ටික මනුෂ්‍යයෝ වාසය කරත්. අතීත කාලයෙහිද හවුරුදු පන්සීයකට මත්තෙහි එක්තරා ස්ත්‍රියක් තොමෝ ඒ ඉටයකාවතී නම් ගමෙහි එක්තරා සංසාරමොචක කුලයක ඉපිද මිථ්‍යාදෘෂ්ටි වශයෙන් පණුවන් හා පළඟැටින්ය මරා ප්‍රෙතයන් අතර උපන්නේය. ඒ ප්‍රෙතත්වය හවුරුදු පන්සීයක් මුළුල්ලෙහි සා පිපාසාදි දුක් අනුභවකොට අප බුදුන් ලොව පහළවී පවත්වන ලද උතුම් දම්සක් ඇතිව පිළිවෙළින් රජගහනුවර ඇසුරුකොට වෙළුවනාරාමයෙහි වැඩවසන කල්හි නැවතත් ඉටයකාවතී නම් ගම එක්තරා සංසාරමොචක කුලයකම ඉපිද හත්අට අවුරුදු වයස්කාලයෙහි අනික් ළදරියන් හා සමග යම් කලෙක්හි වීථියෙහි ක්‍රීඩාකිරීමට සමර්ථවීද, එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ ගමම ඇසුරුකොට අරුණවතී විහාරයෙහි වාසයකරණසේක්, එක් දවසක් දෙළොස් නමක් භික්ෂූන් සමග ඒ ගම්දෙර සමීප මාර්ගයෙන් වඩිනසේක. එකෙණෙහි

Non-commercial distribution

බොහෝ ගම් ළඳුරියෝ ගමින් නික්මවුත් දෙරසම්පයෙහි ක්‍රීඩා කරමින් පහත්සිත් ඇතිව මව්පියන්ගේ ප්‍රතිපත්ති දැකීමෙන් ඉක්මනින් අවුත් තෙරුන් වහන්සේ හා අනිත් භික්ෂූන්ද පසඟ පිහිටුවීමෙන් වැන්දහුය, අශ්‍රද්ධාවත් කුලයාගේ දුහිතෘවූ ඒ මේ ස්ත්‍රිය වනාහි බොහෝ කලක් කුසල් නුපුරුදුකළ බැවින් සාධු ජනයාගේ ආචාර ගුණ නැතිව ආදර රහිතවැ නොහික්මුණු තැනැත්තියක්මෙන් සිටියේය. ස්ථවිරයන් වහන්සේ ඇගේ පූර්ව චරිතයද, මේ කාලයෙහි සංසාර මොචක කුලයෙහි ඉපදීමද, මතුකාලයෙහි නිරයෙහි ඉපදීමට සුදුසු තැනැත්තියෙකු බවද දැක ''ඉඳින් මෑ මා වඳින්නේ නම් නිරයෙහි නුපදින්නේය, ප්‍රෙත ලොකයෙහි ඉපිදත් මා නිසාම සම්පත් ලබන්නේය''යි දැන කරුණාවෙන් මෙහෙයනලද සිත් ඇත්තේ ඒ ළඳුරියන්ට මෙසේ වදළසේක: ''තොපි භික්ෂූන් වඳිව්, මේ ළඳුරිය වනාහි නොහික්මුණු තැනැත්තියක්සේ සිටියා''යි කීහු. එකල්හි ඒ දරිකාවෝ ඈ අතින් අල්වා ඇදගනවිත් බලාත්කාරයෙන් තෙරුන් වහන්සේ ගේ පාදයන් වැන්දෙව්වාහුය. ඈ මෑත කලෙක්හි වැඩිවිය පැමිණියා දිසරාජීනම් ගම සංසාරමොචක කුලයෙහි එක්තරා කුමරුවෙකුට විවාහකොට දෙනලදුව පිරුණු දරුගැබ් ඇතුව කාලක්‍රියා කරනලද්දී ප්‍රෙතයෙන් විෂයෙහි ඉපිද නග්නව දුර්වර්ණ ස්වභාව ඇතිව ඝාපිපාසාදුකින් මඩනාලදුව ඉතා භයංකාර දර්ශන ඇතිව ඇවිදින්නී රාත්‍රී කාලයෙහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට තමන් දක්වා එකත්පසෙක සිටියේය, ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතිය දැක ගාථාවකින් මෙසේ අසා වදළේ:-

1. **නග්ගා දුබ්බණ්ණ රූපාසි-කිසා ධමනිසන්ථතා,**
උප්ඵාසුලිකෙ කිසිකෙ-කා නු ත්වං ඉධ තිට්ඨසි-ති.

1. උප්ඵාසුලිකෙ, උස්ව නැඟුණ ඉල ඇට ඇත්තාවූ; කිසිකෙ, (ඇට සම් නහර පමණක්වූ සිරුර ඇති බැවින්) කෘශවූ තැනැත්තිය; ඩං, තී; නග්ගා, නග්නව; දුබ්බණ්ණරූපා, දුර්වර්ණ ස්වභාව ඇතිව: කිසා, කෘශව; ධමනිසන්ථතා, (මස් ලේ නැති බැවින්) ඉල්පිඟිය නහරවැල් ඇතිව; ඉධ, මෙහි; තිට්ඨසි, සිටියෙහි; කානු අසිඉති, කවරියක්ද.

විලිවැස්මක් නැතිව නපුරු ශරීර වර්ණ ඇතිව මස් ලේ නැති බැවින් නහරවැල් ඉල්පිඟිය ශරීර ඇතිව උස්වූ ඉල ඇව ඇතිව

Non-commercial distribution

කෘශවූ නොහොත් ඇට සම් නහර පමණක්වූ සිරුර ඇත බැවින් ඉතාමත් කෘශභාවයෙන් යුක්තවූ තී මෙහි සිටිනොහිය, තී කවරියක්දැයි අසා වදළහ. ප්‍රෙතිය එබස් අසා තමන් ප්‍රකාශ කොට කියන්නී:-

2. *අහං භදන්තෙ පෙතිම්හි දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන-පෙතලොකම්හො ගතා-ති.

ස්වාමීනි මම දුකට පැමිණියාවූ යමලොකයයි කියනලද ප්‍රෙත අපායෙහි උපන්නාවූ ප්‍රෙතදුවක් වෙමි, පවිකම් කොට මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයට පැමිණියෙමියි යන ගාථාව කියා නැවත තෙරුන් වහන්සේ විසින්-

3. ‡කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්ම විපාකෙන-පෙතලොකම්හො ගතා-ති.

කයින් වචසින් මනසින් කවර අකුශලයක් කරනලද්දේද කවර අකුශල කර්මයක්හුගේ විපාකයෙන් ප්‍රෙතලොකයෙහි උපන්නීදැයි ඇ විසින් කරනලද කර්මය ගාථාවකින් විවාරණ ලදුව නොදෙන සුලුව මසුරුව ප්‍රෙතයොනියෙහි ඉපදී මෙසේ මහදුක් විඳිමියි කියා දක්වන්නී:-

4. අනුකම්පකා මය්හං නාහෙසුං භන්තෙ
පිතා ව මාතා අථවාපි ඤාතකා,
යෙ මං නියොජෙයුං දදහි දනං
පසන්නචිත්තා සමණ බ්‍රාහ්මණානං

5. ඉතො අහං වස්ස සතානි පඤ්ච
යං එවරූපා විවරාමි නග්ගා,
බුදය කණ්හාය ච ඩය්හමානා
පාපස්ස කම්මස්ස ඵලං මමෙදං.

6. වන්දමි තං අය්‍ය පසන්නචිත්තා
අනුකම්ප මං ධීර මහානුභාව,
දත්වා ච මෙ ආදිස්ස යංහි කිඤ්චි
මොචෙහි මං දුග්ගතියා භදන්තෙ-ති.

4. භන්තෙ, ස්වාමීනි; පිතාව, පියා හෝ; මාතා, ඔවි හෝ; අථවාපි, නොහොත්; ඤාතකා, නෑකෙනෙක්හෝ; පසන්න-

Non-commercial distribution

චිත්තා, පහන්සිත් ඇතිව; සමණබ්‍රාහ්මණානං, මහණ බමුණන්ට; දනං දදහි, දන්දෙවයි කියා; යෙ, යම් කෙනෙක්; මං නියොජෙ-යුං, මට නියොග කරන්නාහුද; අනුකම්පකා, (එබඳු) අනුකම්පා කරන කෙනෙක්; මය්හං, මට; නඅහෙසුං, නුහු.

ස්වාමීනි, පියා හෝ මව් හෝ නොහොත් නැකෙනෙක් හෝ එබඳු යම් කෙනෙක් පහන්සිත් ඇතිව ශ්‍රමණ බ්‍රාහ්මණ-යන්ට දන් දෙවයි කියා මා දනයෙහි යොදවන්නාහුද පරලෝ වැඩෙන් අනුග්‍රහ කරන එබඳු කෙනෙක් පෙර මට නුහු.

''ඉතො අහං වස්සසතානි පඤ්ච'' යනාදි මේගය ඒ ප්‍රෙතයුව මෙයින් තුන්වන ජන්මයෙහි තමාගේ ප්‍රෙතාත්ම-භාවය සිහිකොට දැනුත් එසේම ශත වර්ෂ පසක් (හවුරුදු පන්සීයක්) මුළුල්ලෙහි ප්‍රෙතව ඇවිදිමි යන අදහසින් කීය.

5. යං, යම්හෙයකින්; එවරූපා, මෙබඳුවූ; නග්ග, විලිවැස්මක්නැතිව; ඛුදය, බඩගින්නෙන් හා; තණ්හායව, පිපාසායෙ නුත්; බප්ජමානා, පෙළෙණු ලබමින්; ඉතො, මෙතැන් පටන්; පඤ්චවස්සසතානි, හවුරුදු පන්සීයක් මුළුල්ලෙහි; අහං, මම; විවරාමි, හැසිරෙමිද; මම, මාගේ; පාපකම්මස්ස, පාපකර්මයාගේ; ඉදංඵලං, මේ විපාකය වේ.

යම් හෙයකින් මම මෙතැන්පටන් හවුරුදු පන්සියයක් මුළුල්ලෙහි මෙබඳුවූ විලිවැසුම් රහිතවූ ක්ෂුධාවෙන් හා පිපාසා යෙනුත් පෙළෙනු ලබමින් ඇවිදිම්ද, මාගේ පාපකර්මයාගේ මේ විපාකය වේ.

6. අය්‍ය, ආර්‍යයන් වහන්ස; පසන්නචිත්තා, පහන්සිත් ඇතිව; තං, නුඹ වහන්සේ; වන්දාමි, (මම) වඳිමි; මහානුභාව, මහත් ආනුභාව ඇති; ධීර, ධීරයන් වහන්ස; මං අනුකම්ප, මට අනුකම්පා කරනු මැනව; යංකිඤ්චි, යම්කිසි දනවස්තුවක්; දත්වාව, දී; මෙ, මට; ආදිස්ස, පින්දුනමැනව; භදන්තෙ, ස්වාමීන් වහන්ස; දුග්ගතියා, දුගතියෙන්; මං, මා; මොචෙහි, මුදනුමැනව.

ආර්‍යයන් වහන්ස, නුඹ වහන්සේ මම පහන්සිත් ඇතිව වඳිමි, මෙපමණක්මවූ පිනක් දන් මාවිසින් කරන්ට පිළිවනැයි දක්වයි, මහත් ආනුභාව ඇති ධීමතුන් වහන්ස, මා උදෙසා

Non-commercial distribution

අනුකම්පා කරනු මැනව, යම්කිසි දෙය ධර්මයක් මහණ බමුණන්ට දන්දී ඒ දක්ෂිණාව මට දුනමැනව, ඒ හෙතුවෙන් මේ ප්‍රෙතයොනි යෙන් මගේ මිදීම වන්නේය, ස්වාමීන්වහන්ස, මා මේ දුගති යෙන් මුදනු මැනවයි කියා ගාථාත්‍රයක් කීයේය. මෙසේ ප්‍රෙතිය විසින් කියනලද පරිදි ඒ තෙරුන්වහන්සේ පිළිපැද්දෝය. එය දැක්වීම සඳහා සංගීතිකාරක මහාස්ථවිරයන් වහන්සේලා විසින්:-

7. සාධූති සො තස්සා පටිස්සුණිත්වා-සාරිපුත්තොනුකම්පකො
භික්ඛූනං ආලොපං දත්වා-පාණිමත්තඤ්ච වොලකං,
ථාලකස්ස ච පානීයං-තස්සා දක්ඛිණමාදිසි.

7 අනුකම්පකො, අනුකම්පාසිත් ඇති; සො සාරිපුත්තො, ඒ ශාරිපුත්‍ර ස්ථවිරතෙම: තස්සා, ඇගේ කීම; සාධූති, මැනවයි; පටිස්සුණිත්වා, පිළිගෙන; භික්ඛූනං, භික්ෂුනමකට; ආලොපං, එක් බත්පිඩක්ද; පාණිමත්තඤ්ච වොලකං, එකරියනක් පමණ රෙදි කඩක්ද; ථාලකස්ස ච පානීයං, එක පැන් තැටියක්ද; දත්වා, දී: තස්සා, ඒ ප්‍රෙතියට; දක්ඛිණං ආදිසි, දක්ෂිණාව දුන්නේය.

අනුකම්පා ඇති ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතියගේ කීම අසා යහපතැයි කියා භික්ෂු නමකට බත්පිඩක් හා රියනක් පමණ රෙදිකඩක්ද, එක් දිය තැටියක්ද දන්දී ඇට දක්ෂිණාව දුන්හ.

8 *සමනත්තරා අනුද්දිට්ඨෙ-විපාකො උපපජ්ජථ,
හොජනච්ඡාදන පානීයං-දක්ඛිණාය ඉදං ඵලං.

ඇට පින්පැමිණවීමට අනතුරුවම දනයාගේ විපාක උපන්නේය, කෙබඳු විපාකයෙක්දයත්, නන්වැදැරුම් දිවබොජුන් සමාන හොජනද, නානා විරාගවණ්ණයෙන් බබළන දිව්‍යවස්ත්‍ර සමාන වස්ත්‍රද, නන්වැදැරුම් පානවර්ගද උපනි, දක්ෂිණාවෙහි මෙබඳු විපාකවිය.

9. තතො සුද්ධාසුචිවසනා-කාසිකුත්තම ධාරිණි,
විචිත්තවත්ථාභරණා-සාරිපුත්ත මුපසඞ්කමී-ති.

9. තතො, [යටකියනලද දිව්‍ය හොජනාදිය ලැබූ] පසුව; සුද්ධා, පිරිසිදු ශරීර ඇතිව; සුචිවසනා, හඳනාලද ශුඛවස්ත්‍ර

Non-commercial distribution

ඇතිව; **කාසිකුත්තමධාරිණී**, කසිසළුවලටත්වඩා උතුම් වස්ත්‍ර දරන් නිව; **විචිත්තවත්ථාභරණා**, විසිතුරු වස්ත්‍රාභරණ ඇතිව; **සාරි පුත්තං**, සැරියුත් තෙරුන්වෙත; උපසඞ්කමිත්ථ, එළඹ සිටියේය.

ඉන්පසු ඒ ප්‍රෙතිය පවිත්‍රව දිව්‍යවස්ත්‍ර හැඳ උතුම් කසිසළු දරන්නිව විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසී සැරියුත් මහ තෙරුන් වෙත පැමිණියේය.

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පිනාගිය ඉදුරන් ඇතිව පිරිසිදු ශරීරවර්ණයෙන් යුක්තව දිව්‍ය වස්ත්‍රාභරණයෙන් සැරසුණාවූ තමන්ගේ ශරීරවර්ණයෙන් භාත්පස බබුළුවමින් තමන්වහන්සේ වෙත පැමිණ සිටියාවූ ඒ ප්‍රෙතිය දැක ඇ ලවා ප්‍රත්‍යක්ෂ වශයෙන් කර්මඵලය ප්‍රකාශකරනු කැමැතිව:-

10. **අභික්කන්තෙන වණ්ණෙන-යා ත්වං තිට්ඨසි දෙවතෙ,**
ඔභාසෙන්තී දිසා සබ්බා-ඔසධී විය තාරකා.

11. **කෙන තෙ තාදිසො වණ්ණො-කෙන ත්‍ථ ඉධ මිජ්ඣති,**
උප්පජ්ජන්ති ච තෙ භොගා-යෙ කෙචි මනසො පියා.

12. **පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ**
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී-ති

10. දෙවතෙ, පින්වත් දෙව්දුව; යාත්වං, යම්බඳු වූ ති; අභික්කන්තෙන වණ්ණෙන, විශිෂ්ටවූ ශරීරවර්ණයෙන්; ඔසධී-තාරකා විය, ඖෂධීතරුවමෙන්; සබ්බාදිසා, සියලුදිසාවන්; ඔභාසෙන්ති, බබුළුවමින්; තිට්ඨසි, සිටිනොහිය.

එම්බා දෙව්දුව, ඉතා යහපත්වූ ශරීරාලොකයෙන් ඖෂධි තාරකාවමෙන් හෙවත් උසස්වූ ආලොකය මේ තරුව විසින් දරනු ලබයි හෝ ඖෂධයන්ට අනුබල ප්‍රදනය කරයි හෝ යන අර්ථයෙන් ඖෂධියයි කියා ලබනලද නම් ඇති තරුව යම්සේ භාත්පස ආලොක කරමින් සිටීද එසේම යම්බඳුවූ ති සියලු දස දිහුන් එකාලොක කරමින් සිටියි.

11. කෙන, කවර හෙතුවකින්; තෙ, කීගේ; එතාදිසො, මෙ බඳුවූ; වණ්ණො, ශරීරවර්ණයක් ඇතිවීද; කෙන, කවර

Non-commercial distribution

කුශල විශෙෂයකින්; තෙ, තිට; ඉධ, මෙතැන්හි; ඉජ්ඣති, (සුචරිතඵල) නිපදිද; තෙ, තිට; මනසොපියා, සිත්පිනවන; යෙකෙචිභොගා, [වස්ත්‍රාභරණාදී] යම්කිසි වස්තුප කරණ විශෙෂයෝ; උප්පජ්ජන්තිව, උපදිත්ද.

කවර හෙතුවකින් තිට මෙබඳු ශරීරවර්ණය ඇතිවීද, කවර පුණ්‍ය විශෙෂයකින් මෙතන්හි දැන් සිටින තී විසින් ලබන සුචරිත ඵලය නිපදනේද, පරිභොග කටයුතු වූ අර්ත්ථ යෙන් භොගයයි ලද නම් ඇති සිත් පිනවන සියලු වස්ත්‍රා-භරණාදි වස්තුපකරණ විශේෂයෝ තිට උපදිත්ද.

12. මහානුභාව, මහත් ආනුභාව ඇති. දෙවී, දෙවිය; තං, තීගෙන්; පුච්ඡාමි, [මම] විචාරමි; මනුස්සභූතා, මිනිස්වූවා; කිං, පුඤ්ඤං, කිනම්පිනක්, අකාසි, කෙළෙහිද; කෙන, කවර කුශල හෙතුවකින්; එවං, මෙසේ; ජලිතානුභාවාඅසි, දිලියෙන ආනුභාව ඇත්තීද; තෙ, තීගේ; වණ්ණොව, ශරීරවර්ණයද; සබ්බදිසා, සියලු දිගුන්; පභාසති, බබුළුවයි.

මහත් ආනුභාව ඇති දෙවතාවූව මිනිසුන් අතරෙහි උපන් නාවූ තී කවර පිනක් කෙළෙහිදැයි තීගෙන් විචාරමි. ''සත්වයෝ බොහෝසෙයින් මිනිසත් බැවිහි සිටියෝ පින්කෙරෙත්ය''යි කියා මෙය කියනලදී. තීගේ ශරීරවර්ණය සියලු දසදිගුන් බබුළුවයි. කවරහෙතුවකින් මෙසේ ජ්වලිතානුභාව ඇතිවීදැයි අසා වදළහ.

මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණ ලද්දවූ ඒ ප්‍රෙතිය වනාහි ඇට සම්පත් ලැබුණ හේතුව ප්‍රකාශකරමින් ශෙෂ ගාථා වන් කීය:—

13. උප්පණ්ඩුකිං කිසං ජාතං-නග්ගං ආපතිතව්ජවිං,
මුනි කාරුණිකො ලොකෙ-තං මමද්දක්ඛි දුග්ගතං.

14. භික්ඛූනං ආලොපං දත්වා-පාණිමත්තඤ්ච වොලකං,
ථාලකස්ස ච පානීයං-මම දක්ඛිණමාදිසි.

15. ආලොපස්ස ඵලං එස්ස-හත්ථං වස්ස සතං දස,
භුඤ්ජාමි කාම කාමිනී-අනෙකරස බ්‍යඤ්ජනං.

16. පාණිමත්තස්ස වොලස්ස-විපාකං පස්ස යාදිසං,
යාවතා නන්දරාජස්ස-විජිතස්මිං පටිච්ජදං

Non-commercial distribution

17 තතෝ බහූ තරා හන්තෙ-වත්ථානච්ඡාදනානි මෙ,
කොසෙය්‍ය කම්බලියානි-ඛෙමකප්පාසිකානි ච.

18. විපුලාව මහග්ඝා ච-තෙපාකාසෙව ලම්බරෙ,
සාහං තං පරිදහාමි-යං යං හි මනසෝ පියං.

19. ථාලකස්ස ච පානීයං-විපාකා පස්ස යාදිසං,
ගම්භීරා චතුරස්සා ච-පොක්ඛරඤ්ඤො සුනිම්මිතා.

20. සෙතොදකා සුපතිත්ථා -සිතථා අප්පටිගන්ධියා,
පදුමුප්පල සඤ්ඡන්නා-වාරිකිඤ්ජක්ඛ පූරිතා.

21. සාහං රමාමි කීළාමි-මොදමි අකුතොභයා,
මුනිං කාරුණිකංලොකං-හන්තෙ වන්දිතුමාගතා-ති.

13 ලොකෙ, ලොකයෙහි; කාරුණිකො, කරුණා සම්පන්නවූ මුනි; [ශාරීපුත්‍ර] ස්ථවිරතෙම; උප්පණ්ඩුකිං, පඬුවන්වූ; කිසං, කෘශවූ; ජාතං, බඩසයින් පීඩිතවූ; නග්ගං, නග්නවූ; ආපතිතච්ඡ වීං, සුන්බුන් සිරුරු සිවිය ඇති; දුග්ගතං දුප්පත්වූ; තං මං, ඒ මා; අද්දක්ඛි, දුටුවේය.

පඬුවන්වූ කෘශවූ ක්ෂුධාවෙන් මඩනා ලද්දවූ නග්නවූ සිදුණු බිදුණු සිරුරු සිවිඇති දුකට පැමිණියාවූ ඒ මා ලෝකයෙහි කරුණා ඇති තපස්වීවූ ඔබවහන්සේ දුටුසේක.

14. භික්ඛුනං, භික්ෂූන් වහන්සේට; භත්තං, බත්පිඩක්ද; පාණිමත්තඤ්ච චොලකං, රියනක් පමණ රෙදිකඩක්ද; ථාලකස්සව පානීයං, පැන්තලියක්ද; දත්වා, දී; මම, මට; දක්ඛිණං, දක්ෂිණාව; ආදිසි, දුනී.

භික්ෂු නමකට බත්පිඩක්ද එක් රියනක් පමණ රෙදිකඩක්ද පියයුතු පැන් තැටියක්ද දී මට දක්ෂිණාව දුන්සේක.

15. ආලොපස්ස, බත්පිඩගේ; ඵලං, විපාකය; පස්ස, බලනු මැනවි; කාමකාමිනී, [අන්‍යයන් විසිනුත්] කැමතිවිය යුතුවූ කාම සැපතින් යුක්තව; වස්සසතං දජ, දහසක් හවිරුදු මුළුල්ලෙහි; අනෙකර රසව්‍යඤ්ජනං, නොයෙක් රසමසවුලෙන්යුත්; භත්තං, දිවඔජුන්; භුඤ්ජාමී, (මම) වලදමි.

ස්වාමීනී බත්පිඩෙහි විපාක බලනු මැනවි, භවුරුදු දහසක් මුළුල්ලෙහි අනුන් විසිනුදු කැමැතිවිය යුතුවූ කාමසැපතින් යුක්තව අනෙක රසව්‍යඤ්ජනයෙන් යුක්තවූ දිවඔජුන් වලදමි.

Non-commercial distribution

16. පාණිමත්තස්ස වොලස්ස, රියනක් පමණ රෙදි කඩගේ; යාදිසං විපාකං, යම්බදු විපාකයක් වීද; පස්ස, [එය] බලනුමැනවි; නන්දරාජස්ස, නන්දරජහුගේ; විජිතස්මිං, රටෙ: යාවතා පටිච්ඡද, යම් පමණ වස්ත්‍රයෝ වෙද්ද.

ස්වාමීනි රියනක් පමණ වස්ත්‍ර දනයා ගේ විපාක යම්බදු වේද ඒ විපාකය බලනු මැනවි. නන්ද රජහුගේ රටෙහි යම් පමණ වස්ත්‍රයෝ වෙත්ද.

එහි මේ නන්දරජ නම් කවරේදයක්.

යටගිය දවස වනාහි හවුරුදු දසදහසක් ආයුඇති මිනිසුන් අතරෙහි බරණැස්නුවරවාසීවූ එක් කෙළෙඹි පුත්‍රයෙක්තෙම අර නාය‍යෙහි ජඩිසාවිහරණය කරන්නේ හෙවත් වනයෙහි ඇවිදින්නේ අරනාය්‍යථානයෙහි එක්තරා පසේබුදු කෙනෙකුන් වහන්සේ නමක් දුටුවේය. ඒ පසේ බුදුන් වහන්සේ වනාහි එහි චීවර කර්මාන්තය [සිවුරු මැසීම] කරන්නේ නුවාව නොසැහුණු කල්හි සිවුර හකුලා තබන්ට පටන්ගත්හ. ඒ කෙළෙඹියා එකරුණ දැක ''ස්වාමීනි කුමක් කරන්නාහුදැ''යි අසා ඒ පසේ බුදුන් සැහැල්ලු පැවතුම් ඇති බැවින් කිසිවක් නොකී නමුදු ''සිවුරට රෙදි නො පොහෝනේය''යි දැන තමාගේ උතුරු සළුව පසේබුදුන්ගේ පා මුල්හි තබා ගියේය. පසේ බුදුන් ඒ සළුව ගෙන නුවාව නහමින් සිවුරකොට පෙරවූහ. ඒ කෙළෙඹිතෙම දිවිකෙළවර කළුරිය කොට තවුතිසා දෙවිලොව ඉපිද එහි ආයු ඇතිතෙක් දිව්‍ය සම්පත් අනුභවකොට එයින් චුත ව බරණැස්නුවර සිට යොදුනක් පමණ තැන එක්තරා ගමක ඇමැති කුලයෙක්හි උපන. ඔහු තරුණ වයසට පැමිණිකල්හි ඒ ගම නැකත්කෙළි සොෂාකරන ලද්දේවිය. ඒ කෙළෙඹියා මැණියෙනි මට සළුවක් දුනමැනව, නැකැත් කෙළින්නෙමි''යි කියා මවට කීයේය. ඒ මවිතොමෝ දෝනාලද වස්ත්‍රයක් හැරගෙන දුන්නේය. ''මැණියෙනි මේ වස්ත්‍රය දළය''යි කීවිට අනික් වස්ත්‍රයක් අරගෙන දුන්නේය. ඒ වතද ප්‍රතික්ෂෙප කෙළේය. එකල්හි ඒ පුතණුවන්ට මැණියෝ මෙසේ කීවෝය. දරුව යම්බදු ගෙයක අපි උපනිමුද, මීටවඩා සියුම්වූ වස්ත්‍ර පිළි ලැබීමට අපට පින් නැතැ''යි කීයේය. ''මැණියෙනි ලබන තැනකට යෙමි''යි කීය. දරුව යව, මම අදම නුඹට බරණැස්නුවර රාජ්‍යශ්‍රීය ලැබෙ නම් කැමැත්තෙමි''යි කීයේය. ඒ

Non-commercial distribution

කෙළෙඹිතෙම ''මැණියෙනි යහපතැ''යි කියා මව වැඳ පැද කුණුකොට ''මැණියෙනි මම යෙමි''යි කීයේය. මැණියෝ දරුව යවයි කීහ. ඒ මවුට මෙබඳු සිතක් විය. මොහු කොතනක යයිද, ගෙයි මෙතැන හෝ එතැන හෝ හිඳින්නේය''යි සිතීය. ඒ කෙළෙඹි පුත්තෙම වනාහි පුණ්‍ය නියමයෙන් චොදනාකරන ලදුව ගමින් නික්ම බරණැස්නුවරට ගොස් [රජුගේ] මඟුල් ගල්පෝරුව පිට හිසවසා පොරවාගෙන නිදගත්තේය. එදවසද බරණැස් රජු කළුරිය කිරීමෙන් සත්වෙනි දිනය වෙයි ඇමතියෝ ද පුරෝහිත බ්‍රාහ්මණයාද රජුගේ ශරීර [අවමඩගල] කෘත්‍යය කොට රජමලුවේ හිඳගන මෙසේ මන්ත්‍රණය [කථා] කළෝය. ''රජහට එක දියණිකෙනෙක් ඇත පුතෙක් නැත, රජුන් නැති රට නොපවත්නේය, මඟුල්රථය සරසා යවමුය''යි කථාකොට ඔවිහු කුමුදුවණ් සෙන්ධවයන් සතරදෙනෙකු යොදවා සේසත පළමුකොට පස්වැදෑරුම් රාජකකුධ භාණ්ඩයන් රියේ තබා රථය පිටත්කර යවා පස්සෙන් තූර්‍යනාද පැවැත්වූහ. රථය නැගෙන හිර දෙරටුවෙන් නික්ම උයන බලා ගියේය. ''පුරුදු වශයෙන්වනාහි උයනට අභිමුඛව යයි නවත්වව්''යි සමහරු කීහ. පුරොහිත තෙම නොනවත්වව්යයි කීය. රථය [උයනට ගොස්] කුමරු පැද කුණුකොට නැගීමට සැරසී සිටියේය. පුරොහිත බමුණුතෙමේ පොරෝනා රෙදිකොන ඉවත්කොට පාදතලයන් බලමින් ''මේ දිවයින තබා දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතර මහ දිවයින්හි එකම රජබව කරන්ට සුදුස්සෙකැ''යි කියා තූර්‍යනාද පවත්වව් නැවතත් තූනීනාද පවත්වව්යයි කියා තුන්වරක් තූර්‍යනාද කරවිය. එකල්හි කුමරා මුහුණහැර බලා ''දරුවෙනි කවර කරුණක් නිසා තොපි ආවාහුදැ''යි ඇසීය. දෙවයන් වහන්ස, නුඹවහන්සේට රාජ්‍යය පැමිණේය''යි කීය. තොපගේ රජ කොහිදැ''යි ඇසීය. ''ස්වාමීනි ස්වර්ගස්ථවීය''යි කීය. 'කෙතෙක් දවස් ඉක්ම ගියාහුදැ''යි විචාළේය. ''අදට සත්වෙනි දවසය''යි කීය. ''පුත්‍රයෙකු හෝ දුහිතෘවක් හෝ නැත්තේදැ''යි විචාළේය. ''දෙවයෙනි දියණියක් සිටියි, පුත්‍රයෙක් නැතැ''යි කීය. ''එසේවීනම් රාජ්‍යය කරවන්නෙමැ''යි කී කල්හි ඔවුහු එකෙණෙහිම අභිෂෙක මණ්ඩපයක් කොට රාජදුහිතෘව සර්වාලඞ්කාරයෙන් අලඞ්කාරකොට උයනට

Non-commercial distribution

පඤ්ඤවා කුමාරයාණන් හට අභිෂේක කළාහුය. ඉක්බිත්තෙන් කරනලද අභිෂේක ඇති ඕහට ලක්ෂයක් අගනා වස්ත්‍රයක් එළවූහ. හෙතෙම ''දරුවෙනි මේ කුමක්ද''යි ඇසීය. ''දේවයන් වහන්ස හඳිනා සළුවය''යි කීහ. 'දරුවෙනි දළනොවේදැ'යි ඇසීය. 'දේවයන්වහන්ස, මනුෂ්‍යයන් පරිභොගකරන වස්ත්‍ර අතුරෙන් මීට වඩා සියුම් වස්ත්‍ර නැතැ'යි කීහ. ''යුෂ්මතුන්ගේ රජ මෙබඳු වත් හැන්දේදැ''යි විචාළේය. 'දෙවයෙනි එසේය'යි කීහ. 'තොපගේ රජ පිනැත්තෙකැයි නොසිතමි'යි කියා රන් කෙණ්ඩිය ගෙන එව්, වස්ත්‍ර ලබන්නෙමි'යි කී කල්හි රන් කෙණ්ඩිය ගෙනාවාහුය. හෙතෙම හුනස්නෙන් නැඟිට අත් සෝද මුවසෝදගෙන දකුණතින් පැන්ගෙන පෙරදිගට ඉස්සේය. එකල්හි සනපෘථිවිය පලාගෙන කප්රුක් අටක් පැන නැංගාහුය. නැවත පැන්ගෙන දකුණුදිගට පැදුම් දෙසටද උතුරු දිගටදැයි මෙසේ සිව්දිසාවන්ට ඉස්සේය. සියලු දිසාවන්හි අට අට බැගින් දෙතිසක් කප්රුක් පහළවූහ. එක එක දිසාවෙක සොළස සොළස බැගින් සිව්සැටක් කප්රුක් පැන නැංගාහුයයි සමහරු කියති. හෙතෙම එක් දිව්‍ය වස්ත්‍රයක් හැඳගෙන එකක් පොරවා ගෙන ''නන්දරජහු ගේ නුවර නූල්කටින ස්ත්‍රීහු නූල් නොකටිත්–වායි අණබෙර ලවවිය''යි කියා සේසත ඔසවා අලඬකාරයෙන් පිළියෙළකරනලද උතුම් ඇත්කඳට නැගී නුවරට ප්‍රවිෂ්ටව පහයට නැගී මහත් සම්පත් අනුභව කෙළේය. මෙසේ (සැප විඳිමින්) කල්යන කල්හි දෙවිය එක්දිනක් රජහුගේ සම්පත් දැක තපස්වීන්වහන්ස ආශ්චර්‍යයකැ'යි කියා කරුණාවත් අයුරු දැක්විය, දෙවිය මේ කුමක්ද'යි රජ විසින් විචාරණලද්දී 'දෙවයන් වහන්ස නුඹවහන්සේ ගේ සම්පත් ඉතා මහත්ය, නුඹ වහන්සේ ඉකුත්කාලයෙහි කුසල් කළෝය, දැන් මතුකාලය සඳහා කුසල් නොකරන්නාහුය'යි කීයේය. ''කවරෙකුට දන් දෙමුද සිල්වත්හු නැත්තාහුය''යි කීයේය. ''දේවයන්වහන්ස ජම්බුද්වීපය රහතුන්ගෙන් හිස්නොවේ. නුඹවහන්සේ දනයම සරසාපුව මැනව, මම රහතුන්වහන්සේ ලබන්නෙමි''යි කීයේය. දෙවෙනි දවස රජ්ජුරුවෝ මහත් අනගි දනය සරසවා ලූහ. දෙවිතොමෝ ''ඉදින් මේ දිසාවෙහි රහතුන් ඇත්නම් මෙහි වැඩමවා අපගේ ශික්ෂාව ගණිත්වා''යි අධිෂ්ඨානකොට උතුරුදිගට මුහුණලා උරෙන් යෙදී හෙවත් ළපැන්ත යටකරගන

Non-commercial distribution

වැදහොත්තේය, දෙවිය වැදහොත් කෙණෙහිම හිමවත් වෙනෙහි වසන්නාවූ පද්මාවතියගේ පුත්‍රවූ පන්සියයක් පසේ බුදුවරයන් අතුරෙන් වැඩි මහලුවූ පදුම පසේබුදුරජාණන් වහන්සේ සහෝදරයන් ආමන්ත්‍රණය කළසේක්: ''නිදුකාණෙනි නන්දරජතෙම යුෂ්මතුන්ට ආරාධනා කෙරෙයි. ඔහුගේ ආරාධනාව ඉවසව්ය''යි වදළහ. ඒ පසේ බුදුවරු ආරාධනාව පිළිගෙන එකෙණෙහිම අහසින් වැඩමවා උතුරුදිග දෙරටුව ලඟ බැස්සාහුය. මනුෂ්‍යයෝ ''දෙවයන්වහන්ස පන්සියක් පසේ බුදුවරයන් වහන්සේලා වැඩියාහුය''යි රජහට සැලකළාහුය. රජතෙම දෙවිය සමඟ ගොස් වැඳ පාත්‍රයගෙන පසේබුදුවරුන් පහයට වැඩමවා එහිදී උන්වහන්සේලාට දන්දී බත්කිස අවසන්වූ කල්හි රජතෙම සඬ්ඝස්ථවිරයන් වහන්සේගේද දෙවීතොමෝ සඬ්ඝනවක ස්ථවිරයන් වහන්සේගේද පාමුල වැතිර ''ආර්‍යයන් වහන්සේලා ප්‍රත්‍යයයෙන් ක්ලාන්ත නොවන්නාහුය. අපි පිනෙන් නොපිරිහෙන්නෙමුය, මෙහි වැසීමට අපට ප්‍රතිඥා දුන මැනවැ''යි කියා ප්‍රතිඥා කරවාගන උයනෙහි වාසස්ථාන කරවා ජීවිතාන්තය දක්වා පසේබුදුරුන් උපස්ථානකොට උන්වහන්සේලා පිරිනිවිකල්හි සාධු ක්‍රීඩා හෙවත් උත්සව පවත්වා සඳුන් අගිල් ආදි දරවලින් ශරීර ආදහන කෘත්‍යය කරවා ධාතූන් ගෙන චෛත්‍යයක් පිහිටුවා මෙබඳු මහානුභාව සම්පන්නවූ මහාර්ෂීන් ටත් මරණය වන්නේය, අප වැන්නන්ට කියතුම කවරේදැයි උපන් සංවෙග ඇතිව ජ්‍යෙෂ්ඨ පුත්‍රයා රාජ්‍යයෙහි පිහිටුවා තෙමේ ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවිය. දෙවීතොමෝද රජ පැවිදිවූ කල්හි ''මම කුමක් කරන්නෙමිද''යි සිතා පැවිදිවිය, දෙදෙනම උයනෙහි වෙසෙමින් ධ්‍යාන සැපෙන් කල්යවා ආයු කෙළවර බඹලොව උපන්හ. ඒ නන්දරජ වනාහි අප බුදුන්ගේ මහාශ්‍රාවකවූ මහකස්සප තෙරවිය. ඒ රජහුගේ අග්‍ර මෙහෙසී තොමෝ භද්‍රකාපිලානී නම් විය. මේ නන්ද රජතෙම වනාහි දුසැදහසක් හවුරුදු මුළුල්ලෙහි තෙමේ දිව්‍යවස්ත්‍ර හඳිමින් සියලුම තම රට උතුරුකුරු දිවයිනමෙන් සමෘඬකරමින් පැමිණි මිනිසුන්ට දිවසළු දුන්නේය. ඒ මේ දිව්‍ය වස්ත්‍ර සමෘඬිය සඳහා මේ ප්‍රෙතිතොමෝ ''යාවතා නන්දරාජස්ස විජිතස්මිං පටිච්ඡද'' යනාදිය කීයේය.

Non-commercial distribution

17. භන්තෙ, ස්වාමීනි; මේ, මට; කොසෙය්‍ය කම්-බලීයානි, කොසෙය්‍ය වස්ත්‍ර හා කම්බලිද; ඛොමකප්පාසිකානිච, කොමුපිළිහා කපුපිළිද යන; වත්ථානිච්ඡාදනානි, හඳනා (පොරෝනා) වස්ත්‍රයෝ; තතො, ඊට වඩා; බහුතරා, ඉතා ඛොහෝ වෙති.

ස්වාමීනි ඊටවඩා හඳනා වස්ත්‍ර හා පොරෝනා වස්ත්‍රද කොසෙය්‍ය වස්ත්‍ර හා පලස්ද කොමු පිළි හා කපුපිළිද මට ඉතා ඛොහෝ වෙත්.

18. විපුලාච, (දිග පුලුලින්) මහත්වූද; මහග්ඝාච, මාහැණිවූද; තෙ, ඒ වස්ත්‍රයෝ; ආකාසෙ එව, අහසෙහිම; ලම්-බරෙ, එල්බෙත්; සා අහං, ඒ මම; යං යංහි මනසොපියං, යම් යම් වස්ත්‍රයක් සිතට ප්‍රිය වේ නම්; තං, එය; පරිදහාමී, ඇඳ පොරවා ගනිමි.

ඒ වස්ත්‍රයෝද දිගින් හා පලලින් මහත් වන්නාහ, මාහැඟි වන්නාහ, අහසෙහි එල්බෙමින් තිබෙත්, ඒ මම මගේ සිතට යම් යම් වස්ත්‍රයක් ප්‍රිය වේ නම් ඒ ඒ වස්ත්‍ර ගෙන හඳිමි, පොරවමි.

19. ථාලකස්ස ච පානීයං, පැන්තලිය ගේ; යාදිසං විපාකං, යම්බඳු විපාකයෙක් වේද; පස්ස, (එය) බලනු මැනවි; ගම්භීරා, ගැඹුරුවූ; චතුරස්සාච, සිව්රැස්වූද; පොක්ඛරඤ්ඤෙ, පොකුණු; සුනිම්මිතා, (කර්‍මානුභාවයෙන්) මනාව මැවුණෝය.

තැටිය පුරා පැන් දෙන ලදුව මවිසින් අනුමෝදන්වන ලද්දේද, ඒ පානීය දනයා ගේ විපාකය යම් පමණ මහත්ද එය බැලුව මැනව, ගැඹුරුවූ සතරැස් පොකුණු පුණ්‍යකර්‍මානුභාවයෙන් පහළවූහ.

20. සෙතොදකා, සුදුවැල්ලෙන් ගැවසීගත්තාවූ; සුප-තිත්ථා, යහපත් තොටුපල ඇති; සීතා, සිහිල් ජලය ඇති; අප්පටි ගන්ධියා, සුවඳැති; පදුමුප්පල සංඡන්නා, පියුම් හෙළ පියුමෙන් ගැවසීගත්; වාරිකිඤ්ජක්ඛ පූරිතා, මල්රේණුවෙන් ගැවසුණ ජලයෙන් පිරුණෝද වත්.

Non-commercial distribution

ඒ පොකුණු සුදුවැලිතලායෙන් හා ජලයෙන් යුක්ත වූහ. යහපත් තොටුපල් ඇත්තාහ, සිහිල් ජලය ඇත්තාහ, පිළිකුල් කරන ගඳනැති යහපත් සුවඳින් යුක්තයහ, පියුම් හෙළපියුම් ආදි මල්රේණුවෙන් ගැවසීගත් ජලයෙන් පිරුණාහුය.

21. **සා අහං,** ඒ මම; **රමාමි,** ඇලෙමි; **කීළාමි,** ඉඳුරන් හසුරුවමි; **මොදමි,** සතුටුවෙමි; **අකුතොභයා,** කිසිවකින් බියකුත් නැත්තීවෙමි; **භන්තෙ, ස්වාමිනි;** **ලොකෙ, ලොකයෙහි;** **කාරුණිකං,** කරුණාන්විතවූ; **මුනිං, භික්ෂූවූ** (ඔබ වහන්සේ;) **වන්දිතුං,** වැඳීමට; **ආගතා,** පැමිණියෙමි.

ඒ මම (එහි) ඇලෙමි, ඉන්ද්‍රියයන් හසුරුවමි; කිසිම භයක් නැතිව භොග සම්පත්තියෙන් සතුටුවෙමි, සේවරිසුඛ විහරණ ඇත්තියක් වීමි, ස්වාමිනි ලොකයා කෙරෙහි කරුණාවත් භික්ෂු කෙනෙක්වූ දිව්‍ය සම්පත් ලැබීමට හෙතුවූ තුඹ වහන්සේ වැඳීමට පැමිණියෙමියි කීයේය.

ඒ ප්‍රෙතයුව විසින් මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඉටියකාවතිය, දීඝරාජීය යන දෙගම් වැසි මිනිසුන් තමන් වහන්සේ වෙත පැමිණි කල්හි මේ වස්තුව විස්තර වශයෙන් වදරමින් සංවේග උපදවා සංසාර මොචක පාපකර්මයෙන් මුදවා උපාසක භාවයෙහි පිහිටවූසේක. එපවත් භික්ෂූන් අතර ප්‍රකටවිය. භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට සැලකළාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්ති කොට පැමිණි පිරිසට ධර්මදෙශනාකර වදළසේක. ඒ දෙශනා තොමෝ මහජනයාට සාර්ත්ථක විය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගයෙහි පළමුවන සංසාරමොචක ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

---

2. 2 වෙනි කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගාන්තර්ගත සාරිපුත්‍ර ස්ථවිර මාතෘ ප්‍රෙතවස්තුව කවරහයත්.

විශ්වජගදීශ්වරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර

Non-commercial distribution

ස්ථවිරයන් වහන්සේට මෙයින් පස්වන ජාතියෙහි මාතෘවූ ප්‍රෙතියෙකු අරභයා මේ දෙශනා ධර්මය වදළසේක. එක්දවසක් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝද, ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝද, ආයුෂ්මත් අනුරුඩ තෙරණුවෝද, ආයුෂ්මත් කප්පින තෙරණුවෝද රජගහනුවරට නුදුරු එක්තරා වනයෙක වෙසෙත්. එකල්හිදු බරණැස්නුවර ආඪ්‍යවූ මහත් ධන ඇති මහත් භොගසම්පත් ඇති එක්තරා බ්‍රාහ්මණයෙක් තෙම මහණ බමුණන්ට හා දුගී මගී වණික් යාචකයන්හටත් පැන් පොකුණක් වැනිවූයේ ආහාර පාන වස්ත්‍ර සයනාදිය දෙයි. දෙන්නේද ආ ආ වුන්ට කාලයට සුදුසු පරිදි පාදේනා පැන් පාගල්වන තෙල් ආදිය දීමෙන් පිළිවෙළින් සියල්ල දීමෙහි පිළිපන්නේ වෙයි. පෙර බත් කාලයෙහි භික්ෂූන් ආහාර පානාදියෙන් සකස්කොට වළඳවයි. හෙතෙම දෙශාන්තරයට යන්නේ ''පින්වතිය පත වනලද පරිදිවූ මේ දනවිධිය නොපිරිහෙළමින් සකස්කොට පිහිටුවා ගනුව''යි කියා භාර්‍යාවට කීයේය. ඇ මැනවයි පිළිගෙන ඔහු පිටත්ව ගිය කල්හිම පළමුකොට භික්ෂූන්ට පනවන ලද දනවිධිය සිදලීය. වාසය පිණිස පැමිණි මගීන්ට ගේ පිටිපස හැර දමනලද දිරාපත් ශාලාව පෙන්වා මෙහි නිදගනිවයයි කීය. ආහාරපානාදිය පිණිස මගීන් එහි පැමිණි කල්හි ''අශුචි අනුභව කරව්, මුත්‍ර බී පියව් ලේ බීපියව් තොප මව්වරුන් ගේ හිස් මොල කාපියවිය''යි කියා අශුචිමෙන් පිළිකුල් කටයුතුවූ යම් යම් දෙයක් ඇද්ද ඒ ඒ දෙයෙහි නමගෙන රළු වචන කියයි. ඇ මැතකාලයෙහි කළුරියකොට අකුශල කර්මානුභාවයෙන් ඔසවා දමනලදුව ප්‍රෙත යොනියෙහි ඉපිද තමාගේ වාක් දුශ්චරිතයට සුදුසුවූ දුක්විඳින්නී පෙර ජාතියේ සම්බන්ධය සිහිකොට ආයුෂ්මත් සැරියුත් තෙරුන් වෙත එළඹුනු කැමැතිව උන්වහන්සේ ගේ විහාරයට පැමිණියේය. විහාරාධිගෘහීත දෙවියෝ විහාරයට ඇතුල්වීම වැලක්වූහ. ඒ ප්‍රෙතිය වනාහි මෙයින් පස්වෙනි ජාතියෙහි තෙරුන් වහන්සේ ගේ මව්විය. එහෙයින් ''මම ආර්‍යාවූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේහට මෙයින් පස්වෙනි ජාතියෙහි මව් වූයෙමි, තෙරුන් වහන්සේ දැකීම පිණිස විහාර දොරටුවෙන් ඇතුල්වීමට මට අවකාශ දෙව්ය''යි මෙසේ කීයේය. දෙවියෝ එය අසා ඇට ඇතුල්වීමට අවසර දුන්හ. ඒ ප්‍රෙතිය ඇතුල්වී සක්මන් කෙළවර සිට තෙරුන්ට කම්‍ය දක්විය. තෙරුන් වහන්සේ ඇ දැක කරුණාවෙන් වොදනා කරන ලද සිත් ඇතිව:-

Non-commercial distribution

22. *නග්ගා දුබ්බණ්ණ රූපාසි-කිසා ධමනි සන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ- කානු ත්වං ඉධ තිට්ඨසි-ති

විලිවැස්මක් නැතිව නපුරු ශරීරවණ් ඇතිව මස් ලේ නැති බැවින් නහරවැල් ඉල්පුන ශරීර ඇතිව උස්වූ ඉලඇට ඇතිව ඇට සම් නහර පමණක් වූ සිරුර ඇති බැවින් ඉතාමත් කෘශභාව යෙන් යුක්තවූ තී මෙහි සිටිනෙහිය, තී කවරියක්දැයි යනු ගාථාවෙන් අසා වදළසේක. තෙරුන් වහන්සේ විසින් විචාරණ ලද ඒ ප්‍රෙතිය පිළිවදන් දෙන්නී:-

23. අහං තෙ සකියා මාතා-පුබ්බෙ අඤ්ඤාසු ජාතිසු,
උප්පන්නා පෙත්ති විසයං-ඛුප්පිපාසා සමප්පිතා.

24. ඡඩ්ඩිතං වමිතං බෙලං- සිංඝාණිකං සිලෙසුමං,
වසඤ්ච ඩය්හමානානං-විජාතානඤ්ච ලොහිතං.

25. වණිතානඤ්ච යං සාණං-සීසච්ඡින්නානං ච ලොහිතං,
ඛුදපරෙතා ඛුඤ්ජාමි-ඉත්ථී පුරිස නිස්සිතං.

26. පුබ්බලොහිත භක්ඛාස්මි-පසූනං මනුසානඤ්ච,
අලෙනා අනගාරාව-නීලමඤ්ච පරායනා.

27. දෙහි පුත්තක මෙ දනං-දත්වාන උද්දිසාහි මෙ,
අප් පේච නාම මුඤ්චය්‍යං-පුබ්බලොහිත හොජනා-කි.

23. අහං, මම; පුබ්බෙ, පෙර; අඤ්ඤසු ජාතිසු, (මින් පස් වෙනි) අනික් ජාතියකදී; තෙ, නුඹගේ; සකියා මාතා, ස්වකීය මවවීම්; පෙත්තිවිසයං; ප්‍රෙතලොකයෙහි; උප්පන්නා, උපන්නී; ඛුප්පිපාසා සමප්පිතා, සාපිපාසා දෙකින් මඩනාලද්දීවෙමි.

ස්වාමීනි, මම නුඹවහන්සේ ගේ ස්වකීය මවවීම්, පෙර අන් ජාතීන් අතුරෙන් පස්වෙනි ජාතියෙහිදී වැවූ නමුදු මේ ජාති; යෙහි නොවෙමි. ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රෙතලොකයට පැමිණියා නිතර ක්ෂුධා පිපාසා දුඃඛයෙන් මඩනාලද්දීමි.

24, ඡඩ්ඩිතං, වමනයද; වමිතං, මුවමලද; බෙලං, කෙලද, සිඞ්ඝාණිකං, සොටුද; සිලෙසුමං, සෙමද; ඩය්හමානානං, සෑයෙහි-දවනු ලබන මෘතශරීරයන් ගේ; වසංච, වුරුණු තෙලද; විජාතා නඤ්ච ලොහිතං, වැදූ ස්ත්‍රීන්ගේ ලේ හා (ගැබ් මලද);

Non-commercial distribution

වමනය හා කිඹිසීම සමග මුවෙන් නික්මෙන මලද කෙලද හිස් මුලින් ගලාබැස නාස් සිදුරෙන් නික්ම යන මල (සොටු)ද සෙමද දරසෑයෙහි දවනු ලබන සිරුර පිළිබඳ වුරුණු තෙලද ප්‍රසූතකළ ස්ත්‍රීන්ගේ ලේ හා ගැබ්මලද.

25. වණිතානං, වණ ඇත්තවුන්ගේ හා; සාණසීසච්ඡින්නා නඤ්ච, නාසය හා හිස කැපූවන්ගේද; යං ලොහිතං, යම් ලෙයක් වේද; (එයත්) ඉත්ථිපුරිස නිස්සිතං, ස්ත්‍රී පුරුෂ ශරීරයන් අසුරු දේද; ඛුදපරෙතා, සාගින්නෙන් මඩනාලදුව; භුඤ්ජාමි, අනුභව කරමි.

හටගත් වණ ඇත්තවුන්ගේ හා නාසා හිස් කැපූවන්ගේත් යම් ලෙයක්වේද එය අනුභව කරමි, සාපිපාසාදෙකින් මඩනාලදුව ස්ත්‍රී පුරුෂයන්ගේ සිරුර ඇසුරුකොට ඇති යටකියනලද අශුචි හා අන්‍යවූ සම් මස් නහර සැරව ආදි අපවිත්‍රද්‍රව්‍ය අනුභව කරමි.

26. පසුනං, ගෙරින්ගේද; මානුසානංච, මිනිසුන්ගේද; පුම්බලොහිතං, සැරව හා ලේ; භක්ඛාඅස්මි, අනුභව කරන්නී-වෙමි; අලෙනා, පිහිටක් නැත්ති; අනගාරාච, වසන තැනක් නැත්ති; නීලමඤ්ච පරායනා, සොහොනෙහි දැමූ මල ඇද සයනය කොට ඇත්ති; (නොහොත්) සොහොන් අලු හා අඟුරු බහුලවූ සොහොන් බිමෙහිම ඇදේමෙන් සයනය කරන්නී වෙමි.

එළු ගව මහිෂාදීන්ගේ ලේ සැරව ආදියත් අනුභව කරමි, අසරණව අනාවාසව හෙවත් වසන ගෙයක් නැතිව සොහොනෙහි දමනලද අශුචි නැමැති මැස්ස පිහිටකොට ඇතිව නොහොත් මිනී දවනලද අලු හා අඟුරු බොහෝකොට ඇති සොහොන්බිම නැමැති මැහිපිට සයනය කරමි.

27. පුත්තක, පුතණ්ඩ; මෙ, මා සඳහා; දනං, දනයක්; දෙහී, දුනමැනව; දත්වාන, දී; මෙ, මට; උද්දිසාහි, පින්දෙනු මැනව; පුබ්බ ලොහිත හොජනා, ලේ සැරව බුදීමෙන්; මුඤ්-චෙය්‍යං, මිදෙන්නෙමි නම්; අප්පෙවනාම, යෙහෙකි.

පුත්‍රයාණෙනි, මා උදෙසා දනක් දුන මැනව, යම්සේ දෙන ලද දක්ෂිණාව මට ලැබෙද එසේ පින්දුන මැනව, නුඹ-වහන්සේගේ ප්‍රාප්තිදනය හෙතුකොට මේ ලේ සැරව ආහාර කොට ඇති ප්‍රෙත ජීවිතයෙන් මිදෙන්නෙමියි කීයේය.

Non-commercial distribution

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එබස් අසා දෙවෙනි දිනයෙහි මහාමෞද්ගල්‍යායන ස්ථවිරාදීවූ තෙරුන් තුන්නම කැඳවාගත ඒ තෙරුන් හා සමග රජගහනුවර පිඬුපිණිස හැසිරෙමින් බිම්සර රජහුගේ මාලිගාවට වැඩිසේක. රජතෙමේ තෙරුන් වහන්සේලා දැක වැඳ ''ස්වාමීනි කුමක් සඳහා වැඩියාහුද''යි වැඩිය කරුණ විචාළේය. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ එපවත් රජහට සැලකළහ. ස්වාමීනි දන්නාලදැයි කියා රජතෙම තෙරුන් වහන්සේලා යවා සියලු කටයුතු කරන ඇමතියෙකු කැඳවා ''නුවරට නුදුරුව සෙවනෙන් හා ජලයෙන් යුක්තවූ වනයෙහි සතර කිළියක් කරවාලව''යි අණකෙළේය. ඇතුල් නුවරද පොහෝනා තැනක විශෙෂ වශයෙන් තුනට බෙදා සිවිකිළියක් කර විය. තෙමෙත් එහි ගොස් කටයුතුදේ කෙළේය. කිළිවල වැඩ නිමවූ කල්හි පූජාකම් සියල්ල සලස්වා ආහාරපාන වස්ත්‍රාදිය හා බුදුපාමොක් බික්සහනට සුදුසුවූ සියලු පිරිකරද එළවා තබා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ඒ සියල්ල බාරදුන්නේය. එකල්හි තෙරුන් වහන්සේ ඒ ප්‍රේතිය උදෙසා ඒ සියල්ල බුඩප්‍රමුඛ සිව්දිග වසන භික්ෂු සඞ්ඝයා වහන්සේට දුන්සේක. ඒ ප්‍රේතිතොමෝ ඒ පින් අනුමෝදන්වී දෙව්ලොව ඉපිද සියලු කාම සම්පත්තියෙන් සමෘඩව දෙවෙනි දිනයෙහි ඇවැත් මහමුගලන් තෙරණුවන්වෙත පැමිණ වැඳ සිටියේය. ඇගෙන් තෙරුන් වහන්සේ කරුණු විචාළහ. ඕතොමෝ තමන්ගේ ප්‍රේතොත්පත්තිය හා දෙව්ලොව ඉපදීමත් විස්තර වශයෙන් කීයේය. එහෙයින් කියනලදී:-

28. මාතුයා වචනං සුත්වා–උපතිස්සොනු කම්පකො,
ආමන්තයී මොග්ගල්ලානං–අනුරුඬඤ්ච කප්පිනං.

29. චතස්සො කුටියෝ කත්වා–සංඝෙ චාතුද්දිසෙ අද,
කුටියෝ අන්නපානංච–මාතුදක්ඛිණමාදිසි.

30. *සමනන්තරානුද්දිට්ඨෙ–විපාකො උපපජ්ජථ,
භොජනං පානීයං වත්ථං–දක්ඛිණාය ඉදං ඵලං

31. †තතො සුඛා සුවිවසනා–කාසිකුත්තමධාරිණී,
විවිත්තවත්ථාභරණා–කොලිතං උපසඞ්කමී–ති.

Non-commercial distribution

28. අනුකම්පකොා, දයාවන්වූ; උපතිස්සොා, ශාරීපුත්‍ර තෙමේ; මාතුයා, මවගේ; වචනං සුත්වා, කීම අසා; මොග්ගල්ලානං, මුගලන් තෙරුන්ද; අනුරුඛංච, අනුරුඛ තෙරුන්ද; කප්පිනං, කප්පින තෙරුන්ද; ආමන්තයී, ඇමතුවේය.

මාතෘ ප්‍රෙතියගේ වචනය අසා අනුකම්පා ඇති උපතිස්ස නම් සැරියුත් තෙරණුවෝ මුගලන්, අනුරුඛ, කප්පින යන තෙරුන් වහන්සේලා ආමන්ත්‍රණය කළාහ.

29. වතස්සොා කුටියොා කත්වා, සිවිකිළියක්කොට: චාතුද්දිසෙ, සිවිදික්හිවූ; සංඝෙ, සංඝයාට; කුටියොා, කිළිද; අන්නපානංච, ආහාරපාන වගීද; අදා, දුනී; මාතු, මවට; දක්ඛිණං, දක්ෂිණාව; ආදිසි, දුනී.

ගෙවල් සතරක්කොට (සැරියුත් තෙරණුවන්ට බාරකළපසු උන්වහන්සේ) සිව කිළි හා ආහාරපාන වගීද (බුඩප්‍රමුඛ) සිව දිග වැසි සංඝයා වහන්සේට දුන්සේක. (එසේ පූජාකොට) මාතෘ ප්‍රෙතියට පින් පැමිණුවූසේක.

දක්ෂිණාව දීමට අනතුරුවම විපාක උපන, දිව්‍යමය ආහාර පාන වස්ත්‍ර පහළවිය. මේ දක්ෂිණාවගේ විපාකය වේ.

ඉන්පසු ඕතොමෝ පිරිසිදුව දිව්‍යවස්ත්‍ර ඇතිව උතුම් කඩ සළුධාරිව විචිත්‍රවූ වස්ත්‍රාභරණ ඇතිව කොලිත නම් මුගලන් තෙරණුවන් වෙත එළඹියේය.

එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වහන්සේ ඒ ප්‍රෙතියගෙන් මෙසේ විචාළසේක-

32. *අභික්කන්තෙන වණ්ණෙන-සා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා.

33. *කෙන තෙ තාදිසො වණ්ණො-කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා-යෙ කෙචි මනසො පියා.

34. *පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී-ති.

Non-commercial distribution

පින්වත් දෙව්දුව, යම්බඳු වූ තී ඉතා යහපත්වූ ශරීර වර්ණයෙන් ඖෂධි තාරකාවසේ සියලු දසදිසාවන් බබුලුවමින් සිටියි.

කවර හෙතුවකින් තිගේ මෙබඳු ශරීරවර්ණය ඇතිවිද, කවර හෙතුවකින් තිට මෙහිදී සියල්ල සමෘඩව උපදනේද, සිතට ප්‍රියවූ යම් කිසි සම්පත් වෙත්ද, (ඒ සියල්ල) තිට පහළවෙත්.

මහත් ආනුභාව ඇති දෙව්දුව මිනිස්වූවා තී කවර පිනක් කෙළෙහිද, කවර හෙතුවකින් මෙසේ ඒවලිතානුභාව ඇතිවීදැයි තිගෙන් මම විචාරමි. තිගේ ශරීරවර්ණයද සියලු දිසාවන් බුබුලුවාදැයි අසා වදළහ.

එකල්හි ඕතොමෝ "මම සැරියුත් තෙරණුවන්ගේ මව වෙමිය"යි යනාදියෙන් විසඳුවේය.

තදනන්තරව ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය භාග්‍යවතුන් වහන්සේට සැලකළේය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට ගෙන සම්ප්‍රාප්ත පෂිත් හට ධම්දෙශනා කළසේක. ඒ දෙශනා තොමෝ මහජනයාහට ප්‍රයෝජනවත් විය.

(පින්වතුනි, තමහිමියා නියමකළ දනය පවා නොදී පැමිණි සිහන්නන්ටද කිසිවක් නොදී රළුවචන කියා බැනවැදී වාක් දුශ්චරිතය පුරා මරණින්මතු මහත් විපතට පැමිණි අයුරු මේ කථාවෙන් දැන එබඳු පවිකම්වලින් වැලකී විසියයුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවඝිය ට ඇතුළත් දෙවෙනි ශාරිපුත්‍රස්ථවිර මාතෘ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

2. 3 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවඝිතන්තඝිතවූ තුන්වන **මත්තාප්‍රෙතවස්තුව** කවරේදයත්.

සවීලොකෙක ස්වාමිවූ බුදුරජාණන් වහන්සේ සැවත් නුවර ජෙතවනාරාමයෙහි වැඩවසන කල්හි මත්තා නම් ප්‍රෙතියෙකු අරබයා මේ දෙශනාව වදළසේක. සැවැත් නුවර වනාහි ශ්‍රද්ධාසම්පන්නවූ එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් වූයේය.

Non-commercial distribution

ඔහුගේ බිරින්ඳ තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධානැත්තිය, අප්‍රසන්නය, ක්‍රොධ කරන්නීය, දරුවන් නැත්තියක්ද විය. නමින් මත්තා නම්විය. ඉක්බිත්තෙන් ඒ කෙළෙඹිතෙමේ කුලවංශය සිඳෙන බියෙන් සමාන කුලයකින් තිස්සා නම් අනික් ස්ත්‍රියක් ගෙනායේය. ඕතොමෝ ශ්‍රද්ධාවත් විය. පහන්සිත් ඇතිවිය, ස්වාමිපුරුෂයාහටද ප්‍රිය මනාප විය, නොබෝ කලකින් ගැබිනිව දසමසක් ඇවෑමෙන් පුත්‍රකු වැදුවේය. ඒ පුත් හට භූතයයි කියා නම්විය. ඕතොමෝ ගෙට ස්වාමිදුවක්ව භික්ෂූන් සිව්නමකට මනාසේ උපස්ථාන කළේය. වඳ තැනැත්තිය වනාහි ඇට ඊර්ෂ්‍යාකරයි. ඔවුහු දෙදෙනම් එක් දිනක ජලස්නානයකොට තෙත්වූ හිසකේ ඇතිව සිටියාහුය. කෙළෙඹි තෙමේ ගුණධර්ම වශයෙන් තිස්සා නම් ස්ත්‍රිය කෙරෙහි බැඳුණු ස්නේහ ඇතිව යහපත් සිතින් ඇ සමග බොහෝකොට කථා කරමින් සිටියේය. එය නොඉවසන්නාවූ ඊර්ෂ්‍යාව ප්‍රකෘතිකොට ඇති මත්තා නම් තැනැත්තිය ගෙය ඇමද එකතුකොට තිබුණු කසල තිස්සා නම් ස්ත්‍රියගේ මත්තෙහි බහාලීය. ඇ මෑත කලෙක කළුරිය කොට ප්‍රෙත අපායෙහි ඉපිද තමාගේ අකුශල කර්ම බලයෙන් පස්වැදෑරුම් දුක් අනුභව කරයි. ඒ දුක්වනාහි දෙශනා පෙළෙන්ම ප්‍රකාශවෙයි. පසුව එක්දිනක් ඒ ප්‍රෙතිතොමෝ සැන්දෑකාලය ඉක්මගිය කල්හි ගෙයි පිටිපස නහමින් සිටිය තිස්සාවට තමන් දක්වීය. ඒ ප්‍රෙතිය දැක තිස්සා නම් ස්ත්‍රිය-

35. *නග්ගා දුබ්බණ්ණ රූපාසි-කිසා ධමනි සන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ-කාතුත්වං ඉධ කිට්ඨසි-ති.

විලිවැස්මක් නැතිව නපුරු ශරීරවර්ණ ඇතිව මස් ලේ නැති බැවින් නහරවැල් ඉල්පුන ශරීර ඇතිව උස්වූ ඉලඇට ඇතිව ඇට සම් නහර පහණක්වූ සිරුර ඇති බැවින් ඉතාමත් කෘශ භාවයෙන් යුක්තවූ නී මෙහි සිටිනෙහිය, නී කවරියක්දැල යනු ගාථාවෙන් පිළිවිසියේය.

36. අහං මත්තා තුවං තිස්සා-සපත්ති තෙ පුරෙ අහුං
පාපකම්මං කරිත්වාන-පෙතලොක මිතො ගතා-ති.

36. පුරෙ, පූර්වජන්මයෙහි; අහං, මම; මත්තා, මත්තානම් වීමි; තුවං, නී; තිස්සා, තිස්සා නම්වීය; තෙ, නිට; සපත්ති අහුං,

Non-commercial distribution

සමහිමියා ඇත්තියක් වීමි; පාපකම්මං කරිත්වාන, පවිකම් කොට; ඉතො, මේ මිනිස්ලොවින්; පෙතලොකං, ප්‍රෙතලොකයට; ගතා, පැමිණියා වෙමි.

පූර්ජාතියෙහි මම මත්තා නම් වීමි, ති තිස්සා නම් විය, තිට සමහිමියා ඇත්තියක්වීමි, අකුසල්කොට මේ මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයෙහි උපනිමියි යන ගාථාවෙන් පිළිවදන් කීයේය. නැවත තිස්සා නම් ස්ත්‍රීතොමෝ:-

37. †කින්නුකායෙන වාචාය-මනසා දුක්කටං කතං:
කිස්ස කම්ම විපාකෙන-පෙතලොක මිතො ගතා-ති.

කයින් වචසින් මනසින් කවර අකුශලයක් කරන-ලද්දේද, කවර අකුශල කර්මයක්හුගේ විපාකයෙන් ප්‍රෙත ලොකයෙහි උපන්නීදැයි කියා ගාථාවෙන් ඈ විසින් පෙර කරනලද කර්මය විචාළේ ය, නැවත අන්‍ය වූ ප්‍රෙතිතොමෝ:-

38. චණ්ඩි ච ඵරුසා චාසිං - ඉස්සුකී මච්ඡරී සටීසී,
තාහං දුරුත්තං වත්ත්වාන-පෙතලොකං ඉතො ගතා-ති.

38. චණ්ඩිච, ක්‍රොධ ඇත්තියක්ද; ඵරුසාච, පරුසබස් කියන්නියක්ද; ඉස්සුකී, ඊර්ෂ්‍යාකරන්නියක්ද; මච්ඡරී, මසුරුසිත් ඇත්තියක්ද; සඨී, කෛරාටික ගුණ ඇත්තියක්ද; ආසිං, වීමි; අහං, මව; තංදුරුත්තං, ඒ දුර්භාෂිත නිරර්ත්ථක වචන; වත්වාන, කියා; ඉතො, මේ ලොවින්; පෙතලොකං, ප්‍රෙතලොකයට; ගතා, පැමිණියා වෙමි.

ක්‍රොධ ඇත්තියක්ද, පරුෂ වචන කියන්නියක්ද, ඊර්ෂ්‍යා කරන්නියක්ද, මසුරුවූද, කෛරාටිකවූද ස්ත්‍රියක්වීමි, මම තිව දුර්භාෂිත නිරර්ත්ථක වචන කියා මිනිස්ලොවින් චුතව ප්‍රෙත ලොකයට උත්පත්ති වශයෙන් පැමිණියා වෙමියි කියා ගාථා වෙන් තමා විසින් කරනලද කර්මය කීයේය, මින්මතුද ඇලාගේ වචන ප්‍රතිවචන වශයෙන්ම ගාථා පැවැත්තාහ:-

39, †සබ්බං අහම්පි ජානාමි-යථා ත්වං චණ්ඩිකා අහු,
අඤ්ඤංච බො තං පුච්ඡාමි-කෙනාසි පංසුකුණ්ඨිතා.
40. සීසං නහාතා ත්වං ආසි-සුවිවත්ථා අලඞ්කතා,
අහංච බො තං අධිමත්තං-සමලඞ්කතනරා තයා.

Non-commercial distribution

41. තස්සා මෙ පෙක්ඛමානාය-සාමිකෙන සමන්තයි,
තතො මෙ ඉස්සා විපුලා-කොධො මෙ සමජායථ

42. තතො පංසුං ගහෙත්වාන-පංසුනා තං හි ඔකිරිං,
තස්ස කම්ම විපාකෙන-තෙනම්හි පංසුකුණ්ඨිතා.

39. යථා, යම්සේ; ඣං, තී: චණ්ඩිකා අහු, ක්‍රොධකරන්නියක්විද; සබ්බං, සියල්ල; අහම්පි, මමත්; ජානාමි, දනිමි; තං, තිගෙන්; අඤ්ඤංව ඛො, අනිකක්ම; පුච්ඡාමි, විචාරමි; කෙන, කවර කර්මයක් හෙතුකොටගෙන; පංසුකුණ්ඨිතා ආසි, කසලපස්වලින් ගැවසුන සිරුර ඇතිවීද.

40. ඣං, තී; සීසං නහාතා, ඉස්සෝද නැහැයේ; සුවිවත්ථා, පිරිසිදු වස්ත්‍ර හැන්දේ; අලඞ්කතා ආසි, සැරසුනිවිය, අහංව ඛො, මමද; තයා, පින්වතියට වඩා; තං අධිමත්තං, ඒ ඉතා වැඩියෙන්; සමලඞ්කතතරා, අතිශයින් සැරසුනී වෙමි.

41. තස්සා මෙ, ඒ මා; පෙක්ඛමානාය, බලාසිටියදී; සාමිකෙන, ස්වාමියා සමග; සමන්තයි, කථාකළේය; තතො, ඒ හේතුවෙන්; මෙ, මාගේ; ඉස්සා, ඊර්ෂ්‍යාව; විපුලා, මහත්විය; මෙ, මට; කොධො, ක්‍රෝධය; සමජායථ, උපන.

42. තතො, එහෙයින්; පංසුං ගහෙත්වාන, (කුණු) පස් ගෙන; පංසුනා, පසින්; තං, තිට; ඔකිරිං, දමාගැසුවෙමි; තස්ස කම්මවිපාකෙන, ඒ අකුශල කර්මවිපාකය හෙතුකොටගෙන; පංසුකුණ්ඨිතා අම්හි, (කසල) පස්වලින් ගැවසුණ ශරීර ඇත්තියක් වීමි.

යම්සේ තී එකල ක්‍රෝධ සිතින් සිටියේද ඒ සියල්ල මමත් දනිමි, දැන් තිගෙන් අනිකක්ම විචාරමි, කවර අකුශල කර්මයක් හෙතුකොටගෙන කසල පස්වලින් ගැවසුණු සිරුර ඇතිවීද.

නුඹ ඉස්සෝද නා පිරිසිදු වස්ත්‍ර හැඳ සැරසුණේ විය, මමද පින්වතියට වඩා ඉතා වැඩියෙන් අතිශයින් සැරසුණේවෙමි.

ඒ මා බලාසිටියදී ස්වාමිපුරුෂයා සමග නුඹ අල්ලාප සල්ලාප වශයෙන් කථාකළේය. ඒ හෙතුවෙන් මාගේ ඊර්ෂ්‍යාව මහත් විය. මට ක්‍රෝධ උපන.

එහෙයින් කසල පස්ගෙනැවිත් කසලපස් කි හිසපිට බහා ලූයෙමි. ඒ අකුශල කර්මයාගේ විපාකයෙන් කසලපස්වලින් ගැවසුණ සිරුර ඇතිවූයෙමියි කීය.

Non-commercial distribution

43. සබ්බං අහම්පි ජානාමි-පංසුනා මං ත්වමොකිරි,
අඤ්ඤංච බො තං පුච්ඡාමි-කෙන බජ්ජසි කච්ඡුයා

44. හෙසජ්ජහාරී උභයෝ-වනන්තං අගමිම්හසෙ,
ත්වඤ්ච හෙසජ්ජමාහරි-අහඤ්ච කපිකච්ඡුනෝ,

45. තස්සා තෙ අජානමානාය-සෙය්‍යං ත්‍යාහං සමොකිරිං,
තස්ස කම්මවිපාකෙන-තෙන බජ්ජාමි කච්ඡුයා.

43. සබ්බං, නී; මං, මට; පංසුනා (කුණු) පසින්; ඔකිරි, දමා ගැසීය; සබ්බං, (ඒ) සියල්ල; අහම්පි, මමත්; ජානාමි, දනිමි; තං, තිගෙන්; අඤ්ඤං ච බො, අනිකක්ද; පුච්ඡාමි, විචාරමි; කෙන, කවර හෙතුවකින්; කච්ඡුයා, කැසීම් රොගයකින්; බජ්ජසි, පෙළේද.

44. හෙසජ්ජහාරී, බෙහෙත් ගෙනෙන්නාවූ; උභයෝ, (අපි) දෙදෙන; වනන්තං, වනයට; ආගම්මිම්හසෙ, ගියෙමු; ත්වංච, නී; හෙසජ්ජං, බෙහෙත්; ආහරි, ගෙනායෙහිය; අහංච, මම වනාහි; කපිකච්ඡුනෝ, කසඹිලියාගෙඩි (නොහොත්) ස්වයංගුප්තාපත්‍ර ඵලයන්: (ගෙනාවෙමි.)

45. තස්සා, ඒ නී; අජානමානාය, නොදක්නා කල්හි; තෙ, තිගේ; සෙය්‍යං, සයනයෙහි; අහං, මම; සමොකිරිං. (ඒ ස්වයංගුප්තාපත්‍ර ඵලයන්) හාත්පස විසිරුවා දැම්මි; තස්සකම්ම විපාකෙන, ඒ අකුශලකර්මයාගේ විපාකහෙතුවෙන්; කච්ඡුයා, කැසීම් රොගයෙන්; බජ්ජාමි, පෙළෙමි.

(එවිට තිස්සාතෙරුමෝ කියන්නී) නී මා ඇහට කුණුපසින් දමාගැසීය යන මේ සියල්ල මමත් දනිමි, තවත් කරුණක් තිගෙන් මම විචාරමි, කිනම් කර්මයකින් නී කැසීම් රොගයකින් පෙළෙන්නේදැයි ඇසීය.

(එකල ප්‍රෙතිතෙරුමෝ කියන්නී) ඖෂධ වර්ග ගෙනෙන්නාවූ අපි දෙදෙන වනයට ගියෙමු, නුඹ වෙදුන් විසින් කියනලද තමන්ට උපකාර ගෙනදෙන බෙහෙත් ගෙනායෙහිය, මම වනාහි තොපට නොපෙනී කසඹිලියා කොළ හා ගෙඩි ගෙනායෙමි.

ඒ කසඹිලියාඵල පත්‍ර තිට නොදන්වා තිඹේ ආසනයෙහි මම විසුරුවා දැම්මි, ඒ අකුශලකර්ම විපාකයෙන් කණ්ඩූති රොගයෙන් පෙළෙම්යි කීය.

Non-commercial distribution

46. සබ්බං අහම්පි ජානාමි-සෙය්‍යං මෙ ත්වං සමොකිරි,
අඤ්ඤඤ්ච බොධනං පුච්ඡාමි-කෙනාසි නග්ගියා තුවං.

47. සහායානං සමයෝ ආසි-ඤාතීනං සමිති අහු,
ත්වං ච ආමන්තිතා ආසි-සසාමිනී නො ච බොධ අහං.

48. තස්සා තෙ අජානමානාය-දුස්සන්ත්‍යාහං ආපනුදිං,
තස්සා කම්මවිපාකෙන-තෙනම්හි නග්ගියා අහං.

46. තුවං, තී; කෙන, කවර හෙතුවකින්; නග්ගියා අසි, නග්නවූයෙහිද; (සෙස්ස යටකියනලද පරිදියි.)

47. සහායානං, මිත්‍රයන්ගේ; සමයෝ ආසි, සමාගමක් විය; ඥාතීනං, නෑයන්ගේ; සමිති අහු, රැස්වීමක්විය; සසාමිනී, සැමියා-සහිතවූ; ත්වංච, තීද; අමන්තිතා ආසි, කැඳවනලද්දීවිය; අහං බොධ, මම වනාහි; නොච, (ආමන්තිතා) නොකැඳවන ලදිමි.

18. තස්සා තෙ, ඒ තී; අජානමනාය, නොදනුවත්ව; තෙ, තිගේ; දුස්සං, වස්ත්‍රයක්; අපානුදිං සෙරාගතිමි; තස්සකම්ම විපා කෙන, ඒ අකුශල කර්මයාගේ විපාකයෙන්; අහං, මම; නග්ගියා අම්හි, නග්නවූයෙමි.

(එවිට තිස්සා තොමෝ)තී මගේ සයනයෙහි කසඹිලියාකොළ ගෙඩි දැමීය යන සියල්ල මමත් දනිමි, තිගෙන් අනිකක් විචාරමි, කවර කාරණයකින් නුඹ නග්නවූවාදැයි ඇසීය.

(එකල්හිදු ප්‍රෙතිතොමෝ) මිත්‍රයන්ගේ සමාගමක් විය. ඥාතීන්ගේ රැස්වීමක්විය, සැමියා සහිත නුඹ ඒ මඩගලක්‍රියා වශයෙන් එහි කැඳවන ලද්දී විය. මා නොකැඳවනලද්දී වූයෙමි,

නුඹ නොදනුවත්වම (ඒ ගමන සඳහා හැඳීමට තිබුන) තිගේ වස්ත්‍රයක් මම සොරා ගතිමි' ඒ අකුශලකර්ම විපාකයෙන් මම වස්ත්‍ර නැත්තියක් වීමියි කීය.

49. සබ්බං අහම්පි ජානාමි දුස්සං මෙ ත්වං අපානුදි,
අඤ්ඤඤ්ච බොතං පුච්ඡාමි-කෙනාසි ගූථගන්ධිනී.

50. තව ගන්ධඤ්ච මාලං ච-පච්චග්ඝං ච විලෙපනං,
ගූථකූපෙ අනාරෙසිං-තං පාපං පකතං මයා.

51. තස්ස කම්මවිපාකෙන-තෙනම්හි ගූථගන්ධිනී,
සච්චං අහම්පි ජානාමි-තං පාපං පකතං තයා.

Non-commercial distribution

49. ගුථගන්ධිනී, ගූගඳ හමාද; (සෙස්ස යටකියනලදී.)

50. තව,තිගේ; ගන්ධංච,සුවඳද; පච්චග්ඝං, අභිනවවූ හෝ මාහැඟිවූ; මාලංච' මල්මාලාවක්ද; විලෙපනංච, විලවුන්ද; ගුථ කූපෙ, අශුචිවළෙක: අතාරෙසිං, බහාලිමි; මයා, මා විසින්; තං-පාපං, ඒ පාපකර්මය: පකතං. කරනලදී.

51. තෙන, එහෙයින්; තස්ස කම්මවිපාකෙන, ඒ අකුසලකර්මයාගේ විපාකය හෙතුකොටගෙන; ගුථගන්ධිනී අම්හි, ගූගඳ වැහෙනසිරුර ඇත්තියක්වීමි; සච්චං, සැබව;තයා' තී විසින්;තං පාපං,ඒ පාපය පකතං, කරනලදී, අහම්පි,මමත්: ජානාමි, දනිමි.

තී මගේ වස්ත්‍රය සොරකම් කළෙහිය යන මේ සියල්ල මමත් දනිමි, වෙනත් කරුණක් නිගෙන් මම අසමි. කවර කර්මයකින් ශරීරයෙන් අසුචිගඳ හමන්නීදැයි විචාළේය.

(එවිට ප්‍රෙතිතොමෝ කියන්නී තිස්සාවෙනි) තිගේ අලුත්වූ හෝ මාහැඟි මල්මාලාවක්ද සුවඳ විලවුන්ද මම හැරගෙන අසුචි වළෙක බහාලීමි, අකුශල කර්මයද මා විසින් කරනලදී.

එහෙයින් ඒ අකුශල කර්මයාගේ විපාකයෙන් අසුචි දුගඳ හමන ශරීර ඇතිවීමියි කීය. තී විසින් කරනලද ඒ පාපකර්මය සැබෑය, එය මමත් දනිමි.

52. අඤ්ඤඤ්ච ඛො තං පුච්ඡාමි-කෙනාසි දුග්ගතා තුවං,
උභින්නං සමකං ආසි-යං ගෙහෙ විජ්ජතෙ ධනං,

53. සන්තෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකාසිමත්තනො,
තස්ස කම්ම විපාකෙන-තෙනම්හි දුග්ගතා අහං.

54. තදෙව මං ත්වං අවච-පාපකම්මං නිසෙවසි,
න හි පාපෙහි කම්මෙහි-සුලභා හොති සුග්ගතිං.

52. තං, තිගෙන්; අඤ්ඤංච, අනිකක්ද; පුච්ඡාමි, විචාරමි; තුවං, තී; කෙන, කවර හෙතුවකින්; දුග්ගතා අසි, දුක්පත්වූයෙහිද; ගෙහෙ, ගෙයි; යං ධනං, යම් ධනයක්; විජ්ජතෙ, විද්‍යාමාන වීද; (එය) උභින්නං, අප දෙදෙනාට; සමකං ආසි, සමානවිය.

53. දෙය්‍ය ධම්මෙසු, දානවස්තුව; සන්තෙසු, ඇතිකල්හි; අත්තනො, තමහට; දීපං, පිහිට (පින)ක්; න අකාසිං, නොකෙළෙම්; තෙන, එහෙයින්; තස්සකම්ම විපාකෙන, ඒ අකුශල කර්ම විපාකයෙන්; අහං, මම; දුග්ගතා අම්හි, දුප්පත් වීමි,

Non-commercial distribution

54. තදෙව, ඒ කාලයෙහිම; ත්වං, තී; මං, මට; අවච, (මෙසේ) කීය. පාපකම්මං, පව්කම්; නිසෙවසි, සේවනය කෙරෙහි; පාපෙහි කම්මෙහි, පව්කම්වලින්; සුගති, සුගතිය; නහි සුලභා හොති, සුවසේ ලැබියහැකි නොවේමය.

අනිකක්ද තිගෙන් මම අසමි, කවර හෙතුවකින් තී දුකට පත්වූවාදැයි (ඇසීය, ඊට පිළිතුරු දෙන ප්‍රේතිය විසින්) සැමියාගේ ගෙයි යම් ධනයක් විද්‍යාමානවීද ඒ අප දෙදෙනාට සමානවිය.

දියයුතු දනවස්තු ගෙයිතිබෙද්දී තමහට පිළිසරණවූ පිනක් මම නොකෙළෙමි, ඒ අකුශල කර්මය හෙතුකොටගෙන මම දුකට පැමිණියා වෙමි.

මා ඒ මිනිසත් බැව්හි සිටි කාලයෙහිම නුඹ මට මෙසේ කීයේය, තී පව්කම්ම කෙරෙයි පව්කම් කිරීමෙන් සුගතිය සුලභ නොවේයි එතෙකුදු වුවත් දුගතියම සුලභවේයයි ඒ පෙර නුඹ මට යම්සේ අවවාද කෙළේද මේ කාලයෙහි ඒ කීම එසේම වියයි කීය.

55. වාමතො ත්වං මං පව්වෙසි-අථොපි මං උසූයාසි,
පස්ස පාපානං කම්මානං-විපාකො හොති යාදිසා.

56. තෙ සරදසියො ආසුං-තානෙවාභරණානිමෙ,
තෙ වඤ්ඤෙ පරිවාරෙන්ති-න භොගා හොන්ති සස්සතා

57. ඉදනි භූතස්ස පිතා-ආපණා ගෙහමෙහීති,
අප්පෙව තෙ දදෙ කිඤ්චි-මා සු තාව ඉතො අගා.

55 තවං, තී; මං, මා; වාමතො, විලොම වශයෙන්; පව්වෙසි, සැලකුවෙහි; අථොපි, යලිදු; මං, මට; උසූයාසි, ඊර්ෂ්‍යාකෙළෙහි; පාපානං කම්මානං, ලාමක කර්මයන්ගේ; යාදිසො, යම්බඳු (ඉතා දරුණු); විපාකො හොති, විපාක-යෙක්වේද; පස්ස, (දැන් එය) බලව.

56. තෙ, තිගේ; සරදසියො, ගෘහදසියෝද; තානි එව අභරණානි, එම ආභරණයෝත්; ආසුං, වූවාහුද; ඉමෙ, මේ ආභරණද; තෙව, ඒ ගෘහදසියනුත්; අඤ්ඤෙ, අනික් ජනයෝද: පරිවාරෙන්ති, (දැන්) පරිභොග කරත්; භොගා, භොග සම්පත්; සස්ස තා නහොන්ති, සදකාලික නොවෙත්,

Non-commercial distribution

57. **ඉදනි, දැන්; භූතස්ස, භූතයාගේ; පිතා, පියතෙමේ; ආපණා, සල්පිලෙන්; ගෙහං, ගෙදර; එහිති, එන්නේය; තෙ, තිට; කිංචි, කිසිවක්; දදෙ, දෙන්නේනම්; අප්පෙව, යෙහෙක; තාව, ඒතාක්; ඉතො, මෙතනින්; මාසු අගා, නොයව.**

[තිස්සා තොමෝ එය අසා කියන්නී; තී මා විලොම වශයෙන් හෙවත් නොමහින් සැලකුවෙහිය, තිට හිතෙෂිවූ වැඩ කැමැත්තියක් කොට මා නොසැලකුවෙහිය, තවද මට තී ඊෂ්‍යා කෙළෙහිය. අකුශල කර්මයාගේ විපාකය යම්සේ සොරතරවේද එය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන් බලව.

තිගේ ගෙයි වැඩකාරියෝ හා ආභරණත් වූවාහුද, තී විසින් පරිභොග කරනලද ඒ මේ වස්තු දැන් අන්‍ය ස්ත්‍රීහු පරිභොග කරත්, මේ වස්තු සම්පත් නම් සදකාලික නොවෙත් ස්ථීර නොවෙත් හැම සැපත් හැරදමා යායුතුය. එහෙයින් ඒ සම්පත් සඳහා ඊෂ්‍යා මාත්සය්‍යාදිය නොකටයුතුය.

භූතනම් පුතණුවන්ගේ පියාවූ කෙළෙඹිතෙමේ සල්පිලේ සිට දැන් මේ ගෙදර එන්නේය. ගෙට ආ කෙළෙඹියා තිට දියයුතු කිසියම් දෙයක් දෙන්නේ නම් යහපත, එතෙක්කල් මේ ගෙයි පිටිපසින් නොයවයි අනුකම්පා කරමින් කීයේය.

58. **නග්ගා දුබ්බණ්ණ රූපාම්හි–කිසා ධමනි සන්ථතා,**
කොපිනමෙතං ඉත්ථීනං–මා මං භූතපිතාද්දස,

59. **හන්ද කිං තාහං දම්ම කිං වා ව තෙධ කරොම්‍යහං,**
යෙන ත්වං සුඛිතා අස්ස–සබ්බකාමසමිද්ධිනී.

60. **චත්තාරො භික්ඛූ සඩසතො–චත්තාරො පුන පුග්ගලා,**
අට්ඨ භික්ඛූ හොජයිත්වා- මම දක්ඛිණමාදිස,
තදහං සුඛිතා හෙස්සං–සබ්බකාමසමිද්ධිනී.

58. නග්ග, නග්නවූ; දුබ්බණ්ණරූපා, දුර්ණ ශරීර ඇත්තාවූ; කිසා, කෘශවූ; ධමනි සන්ථතා අම්හි, ඉල්පිගිය නහරවැල් ඇත්තියක් වීමී; එතං, මෙය; ඉත්ථීනං, ස්ත්‍රීන්ට; කොපිනං, ලජ්ජා වෙක, භූතපිතා, භූතයාගේ පියතෙම; මං, මා; මා අද්දස, නොදකීවා.

59. හන්ද, එහෙනම්; යෙන, යමක් හෙතුකොටගෙන; ත්වං, තී; සබ්බකාම සමිද්ධිනී, සියලු කාම සැපතින් සම්‍යඩවූවා;

Non-commercial distribution

සුඛිතා අස්ස, සුඛපත්වන්නේද; කිං, (එබඳුවූ) කුමක්; තෙ, තිට අහං, මම; දම්මි, දෙමිද; තෙ, තිට; අහං, මම; ඉධ, මේ කාලයෙහි කිංචා, කිනම් උපකාරයක්; කරොමි, කරමිද.

60. සඞ්ඝතො, භික්ෂුසංඝයා කෙරෙන්; චත්තාරො භික්ඛූ, භික්ෂු සිව්නමක්ද; පුන, නැවත; පුග්ගලා, පුද්ගල වශයෙන්; චත්තාරො, භික්ෂු සතරනමක්දැයි; අථය භික්ඛූ, භික්ෂූන් අටනමක්; හොජයිත්වා, වලඳවා; මම, මට; දක්ඛිණං ආදිස, පින්දුන මැනව; තද, එස්කෙළ කල්හි; අහං, මම; සුඛිතා, සුඛපත්වූවා; සබ්බකාම සමිඩ්ධී හෙස්සං, සියලු කාමයෙන් සමෘඩිවූවා වන්නෙමි.

(ඒ කිම අසා ප්‍රෙතිය තම අදහස ප්‍රකාශ කරන්නී තිස්සා වෙනි) මම විලිවැස්මක් නැති බැවින් නග්නවීමි, දුර්ණවූ ශරීර ඇත්තාවූද කෘශවූද නහර ඉල්පිගිය ශරීර ඇත්තියක්ද වීමි, ඒ නග්න දුර්ණ රූපාදිය වැසිය යුතු බැවින් ස්ත්‍රීන්ට ලජ්ජවෙක, එහෙයින් භූතයාගේ පියවූ කෙළෙඹිතෙමේ මා නොදකීවායි ලජ්ජාවෙමින්ම කීය.

(තිස්සාතොමෝ ඒ කථාව අසා හටගත් අනුකම්පා ඇතිව කියන්නී එම්බල ප්‍රෙතිය) යමක් හෙතුකොටගෙන තී සුඛපත් වන්නීද සියලු කාමසැපතින් සමෘඩවන්නීද, එසේවීමට මම කුමක් තිට දෙමිද, කිමෙක්ද වස්ත්‍රයක් දෙමිද නොහොත් බත් දෙමිද, මේ වේලාවෙහි මම තිට කවර උපකාරයක් කෙරෙම් දැයි ඇසීය.

(ඒ කිම අසා ප්‍රෙතිතොමෝ කියන්නී) භික්ෂූ සඞ්ඝයා කෙරෙන් සඞ්ඝ වශයෙන් භික්ෂූන් සිවුනමක්ද, නැවත පුද්ගල වශයෙන් භික්ෂූන් සතර නමක්දැයි මෙසේ භික්ෂූන් වහන්සේ අටනමක් රුවිපරිදි වළඳවා ඒ දක්ෂිණාව මට දුනමැනව, එකල්හි මම සුඛපත්ව සියලු කාමයෙන් සමෘඩ වන්නෙමියි කීයේය.

61. සාධූති සා පටිස්සුත්වා-භොජයිත්වාථය භික්ඛවො.
චත්ථෙහඩ්ඣාදයිත්වාන-තස්සා දක්ඛිණමාදිසි

Non-commercial distribution

62.* සමනන්තරා නුද්දිට්ඨෙ-විපාකො උපපජ්ජථ,
හොජනච්ඡාදනපානීයං-දක්ඛිණාය ඉදං ඵලං.

63* තතො සුද්ධා සුචිවසනා-කංසිකුත්තමධරිණිං
විචිත්තවත්ථාභරණා-සපත්නි උපසකමි.

61. සා, ඕතොමෝ; සාධූති, මැනවයි; පටිස්සුත්වා, පිළිවදන් දී; අට්ඨ භික්ඛවො, භික්ෂූන් අටනමක්; හොජයිත්වා, වළඳවා; වත්ථෙහි, වස්ත්‍රවලින්; අච්ඡාදයිත්වා, හඳවා (නොහොත්) පූජාකොට තස්සා, ඇට; දක්ඛිණං ආදිසි, පින්දුනි.

ඒ තිස්සාතොමෝ යහපතැයි පිළිගෙන ඒ කාරණය තම සැමියාහට දන්වා දෙවෙනි දිනයෙහි භික්ෂූන් අටනමක් වළඳවා වස්ත්‍ර පූජාකොට ඒ ප්‍රෙතියට දක්ෂිණාව දුන්නේය.

දක්ෂිණාව දුන් කෙණෙහිම දානවිපාකය උපන, දිව්‍යමය ආහාර වස්ත්‍ර පැන් පහළවිය, මේ දානයා ගේ විපාකවෙයි.

ඉන්පසු ඈ පිරිසිදුවූවා පවිත්‍ර දිව්‍යවස්ත්‍ර හැඳ උතුම් කසිසළු දරන්නීව, විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී නැවත සපත්නීවූ තිස්සාව වෙත පැමිණියේය. (එසේ පැමිණ සිටි ඇගෙන් තිස්සා තොමෝ විචාරන්නී)

64.† අභික්කන්තෙන වණ්ණෙන-යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා-ඔසධි විය තාරකා.

65.†. කෙන තෙ තාදිසො වණ්ණො-කෙන තෙ ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්තිව තෙ භොගා-යෙ කෙචි මනසො පියා.

66.* පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණෙන ච තෙ සබ්බදිසා පභාසතී-ති

පින්වත් දෙව්දුව යම් බදුවූ නුඹ ඉතා විශිෂ්ට වූ ශරීරවර්ණයෙන් ඔෂධි තාරකාවමෙන් සියලු දසදිහුන් බබුළුවමින් සිටින්නේය.

Non-commercial distribution

කවර කුශල කර්මයකින් තොපට මෙබඳු ශරීරවර්ණයක් ඇති වීද කවර හෙතුවකින් නුඹට මෙහිදී සියල්ල සමෘඩ්ධවන්නේද ප්‍රිය වූ යම්කිසි සම්පත් යෙද්ද ඒ සියල්ල නුඹට පහළවෙති.

මහත් ආනුභාව සම්පන්න දෙවහන තිගෙන් මම විචාරමි, මිනිසත් බැවිලත් නුඹ කවර කුශලකර්මයක් කළේද, කවර හෙතු-වකින් මෙසේ දිලිසෙන ආනුභාව ඇතිවූවාද, නුඹේ ශරීරවර්ණයද සකල දිශාවන් බබුළුවාදැයි ඇසිය.

67.†අහං මත්තා තුවං තිස්සා -සපත්ති තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන-පෙතලොකමිතො ගතා.

68. තව දනෙන දින්නේන-මොදමි අකුතො භයං,
චිරං ජීවාහි භගිනි-සහ සබ්බෙහි ඤාතිහි.

69.. අසොකං විරජං ඨානං-ආවාසං වසවත්තිනං
ඉධ ධම්මං චරිත්වාන-දනං දත්වාන සොභනෙ
විනෙය්‍යමච්ඡෙරමලං සමූලං-අනින්දිතාසග්ගමුපෙහි ඨානකති.

68. භගිනි, නැගැණිය; තව, තී විසින්; දින්නේන, දෙනලද; දනෙන, දනය හෙතුකොටගෙන; අක්තො භයා, බිය නැතිව; මොදමි, සතුටුවෙමි; සබ්බෙහි ඤාතිහි, සියලුනෑයන් සමඟ; චිරං, බොහෝකලක් මුළුල්ලෙහි; ජීවාහි, ජීවත්වෙව.

69. සොභනෙ, සුන්දරිය; සමූලං, ලොභ වෙෂ සහිතවූ ඊර්ෂ්‍යෙරමබං, මසුරු මලය; විනෙය්‍ය, දුරුකොට; ඉධ, මෙහිදී; ධම්මං චරිත්වාන, ධර්මයෙහි හැසිර; දනං දත්වා දන්දී; අසොකං, සොක රහිතවූ; විරජංඨානං, රජස්නැති දිව්‍යස්ථානයවූ; වස වත්තිනං, (තමා) වයසෙහි පවත්වනවුන්ට; ආවාසං, වාසස්ථාන වූ; සග්ගංඨානං, (රූපාදී පඤ්චකාමයෙන් සුවිශූ අග්‍රභෙයින් ස්වර්ගියයි ලද නම් ඇති) දෙව්ලොවට; අනින්දිතා, නින්ද නැතිව; උපෙහි ඉති, පැමිණෙව.

(එවිට දෙවහන කියන්නී පින්වත් තිස්සාවෙනි) පෙර (මිනිස් ලොවදී) මම මත්තා නම් ස්ත්‍රිය වීමි නුඹ තිස්සා නම් විය, නුඹට සැතිරිව පව්කම් කොට මම මේ මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයට ඉපදීම් වශයෙන් පැමිණියේ වෙමියි කීය.

Non-commercial distribution

තී විසින් දෙනලද දක්ෂිණාව හෙතුකොටගෙන කිසි භයක් නැතිව සියලු සැපතින් සතුටුවෙමි, නැගණියනි නුඹ සියලු ඥතීන් හා සමග බොහෝකල් ජීවත් වෙව.

සොඳුරිය, ලොභ වෙෂ සහිත වූ මසුරුමල දුරුකොට මේ මිනිස්ලොවදී දන්දී කුශලධර්මයන්කොට ශොක රහිතවූ ඩහදැලි නැති බැවින් රජස් රහිත සථානයවූ දිව්‍යමය ආධිපත්‍යයෙන් තමා වසයෙහි පවත්වන්නන්ට වාසභූමි වූ රූපාදි පඤ්චකාම සම්පත්තියෙන් සුටයූ අග්‍රහෙයින් ස්වර්ගයයි ලද නම් ඇති දෙව් ලොවට නින්දනැතිව හෙවත් ප්‍රශංසා ඇතිව පැමිණෙවයි කීය.

එකල්හි ඒ තිස්සා තොමෝ එපවත් කෙළෙඹියාහට කීයේය. කෙළෙඹි තෙමේ භික්ෂූන්ට සැලකළේය. භික්ෂූහු භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට සැලකළෝය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට සපැමිණි පිරිසට ධර්මදෙශනා කළසේක. ඒ ධර්මය අසා මහජනයා උපන් සංවෙග ඇතිව මසුරුමල පහකොට දන සීලාදී කුශල ධර්මයෙහි ඇළී සුගති පරායණ වීය.

(අලඞ්කාර ලෙස ඇඳ පැළඳගත් අය දක පවා නො ඉවසීමෙන් ඔවුන් සතු වස්ත්‍රාභරණා දි කුදු මහත් සම්පත් වනසාලීමට නොයෙක් කුට ප්‍රයොග යොදන ඊර්ෂ්‍යාක්‍රොධකාරී පාපින්ට මරණින් මතු ලැබෙන ඉතා බියකරු බලවත් දුක් විපාක දනගැනීමට මේ කථාව ඉතා අගනා උපදෙශයක් බැව් සැලකිය යුතු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරී වර්ගයට ඇතුළත් වූන්වෙනි මත්තා ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

2. 4 වෙනි කථාව.

ත වද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරී වර්ගාන්තර්ගතවූ සිව්වෙනි නන්ද ප්‍රෙතවස්තුව කෙසේද යත්.

සකල ඥෙය සාගර පාරප්‍රාප්ත ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසයකර වදරන කල්හි නන්දනම් ප්‍රෙතියෙකු අරබයා මේ වස්තු දෙශනාව වදළසේක. සැවැත්නුවරට ලහාවූ එක්තරා ගමෙක ශ්‍රද්ධාසම්පන්නවූ තුණුරුවන්

Non-commercial distribution

කෙරෙහි ප්‍රසන්නවූ නන්දසෙන නම් උපාසකයෙක් වූයේය. ඒ උපාසකයා ගේ නන්ද නම් භාර්‍යා තොමෝ වනාහි ශ්‍රද්ධා නැත්තීය. තුණ්ඩුරුවන් කෙරෙහි අප්‍රසන්නය මසුරුසිත් ඇත්තීය ක්‍රෝධ කරන්නීය පරුෂබස් කියන්නීය හිමියා කෙරෙහි ගරු නොකරන්නීය ආදර බුහුමන් නොකරන්නීය. නැන්දනියට සෙරය කියා අක්‍රෝෂ කරයි පරිභවකරයි, ඕතොමෝ මෑතක-ලෙක කළුරිය කොට ප්‍රෙත අපායෙහි ඉපිද එගමටම නුදුරු තැනක හැසිරෙන්නී එක්දිනක් ගෙයින් නික්ම පිටත යන්නාවූ නන්දසේන උපාසකයා හට ලභාවූ තැනක සිට තමා දක්වීය. ඒ උපාසකතෙම ඇ දැක:-

70. කාළි දුබ්බණ්ණරූපාසි-ඵරුසා භීරුදස්සනා,
පිඩගලාසි කළාරාසි-න තං මඤ්ඤාමි මානුසි-න්ති.

70. කාළී, (දවුණ අඟුරක්සේ) කළුවූ; දුබ්බණ්ණරූපා, නපුරු ශරීර වර්ණ ඇති; ඵරුසා, කර්කශදෙහයක් ඇති; භීරු-දස්සනා අසි, පිහුවන් ඇස් ඇතියෙහිය; කළාරා අසි, කළු දත් ඇතියෙහිය; තං, තී; මානුසිං ඉති, මනුෂ්‍ය ස්ත්‍රියෙකැයි; නමඤ්ඤාමි, නොහඟිමි.

තී දවුණු අඟුරක් බඳු කළුවූ දුර්වර්ණ ශරීරවර්ණ ඇති කර්කශ-දෙහයක් ඇති භයානක දැකුම් ඇත්තියෙක, පිටත නික්ම ගිය දත් ඇත්තියෙක තී මනුෂ්‍ය ස්ත්‍රියෙකැයි මම නොසිතමි. තී ප්‍රෙතියක්ම යයි හඟිමියි ගාථාවෙන් කීයේය. ඒ අසා ප්‍රෙතිය තමන් ගැන ප්‍රකාශකරන්නී:-

71. අහං නන්ද නන්දසේන-භරියා තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා-ති.

71. නන්දසෙන, නන්දසෙනය; අහං, මම; නන්ද, නන්ද-නම් වූ; පුරෙ, පෙර ජාතියෙහි; තෙ, නුඹ ගේ; භරියා අහුං, බිරින්දවිමි; පාපකම්මං කරිත්වාන, පව්කම්කොට; ඉතො, මේ මිනිස්ලොවින් පෙතලොකං, ප්‍රෙතලොකයට; ගතා ඉති, පැමිණියේ වෙමි.

ස්වාමී නන්දසෙනයෙනි මම නන්ද නම් වූ පෙර ජාතියෙහි ඔබ ගේ භාර්‍යාව වූයෙමි, පව්කම්කොට මේ මිනිස්ලොවින් චුත වී අවුත් ප්‍රෙතලොකයෙහි උපනිමි. ඉන්පසුව:-

Non-commercial distribution

72. *කින්නුකායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-පෙතලෝකං ඉතෝ ගතා-ති.

තී විසින් කයින් වචසින් මනසින් කවර අකුශලයක් කරන ලද්දේද, කිනම් අකුශල කර්මයක්හු ගේ විපාකයකින් මේ මිනිස් ලොව සිට ප්‍රෙතලොකයට පැමිණියාදැයි මේ ගාථාවෙන් ඒ නන්දසෙන උපාසකයා විචාළේය. මෙසේ විචාළකල්හි ඕහට ප්‍රෙති තොමෝ කියන්නී;-

73. චන්ඩි එරුසවාවා ච-තයි වාසිං අගාරවා,
තාහං දුරුත්තං වත්වාන-පෙතලෝකං ඉතෝ ගතා-ති.

73. චණ්ඩි, ක්‍රෝධසීලියක්ද; එරුසවාවා ච, රළුබස් කියන්නියක්ද; තයි, නුඹකෙරෙහි; අගාරවාච ආසිං, ගරු-නොකරන්නියක්ද වීමි; අහං, මම; තං දුරුත්තං, ඒ නිරර්ත්ථක වචන; වත්වාන, කියා; ඉතෝ, මේ මිනිස්ලොවින්; පෙත-ලොකං, ප්‍රෙත අපායට; ගතා ඉති, පැමිණියේ වෙමි.

මම පෙර ක්‍රෝධ ඇතිව රළුබස් කියන්නියක්ව නුඹ කෙරෙහිද ගරුනොකරන්නියක් වීමි මම නුඹට නපුරු වචන කියා (බැණවැදී පව්කම්කොට) මිනිස්ලොවින් ප්‍රෙතලොකයට පැමිණියෙමි'යි උත්තර කීය. නැවත ඒ උපාසකතෙම කියන්නේ:-

74. හන්දුත්තරියං දදමි තෙ-ඉදං දුස්සං නිවාසය,
ඉමං දුස්සං නිවාසෙත්වා-එහි නෙස්සාමි තං ඝරං.

75. වත්ථඤ්ච අන්නපානඤ්ච-ලච්ඡසි ත්වං ඝරං ගතා,
පුත්තෙ ච තෙ පස්සිස්සසි-සුණිසායො ච දක්ඛසි-ති.

74. හන්ද, එබැවින්; තෙ, තිට; උත්තරියං, උතුරුසළුව; දදමි, දෙමි; ඉදං දුස්සං, මේ වස්ත්‍රය; නිවාසය, හැඳගනුව; ඉදං දුස්සං, මේ වස්ත්‍රය; නිවාසෙත්වා, හැඳගන; එහි, එව; තං, තී; ඝරං, ගෙදරට; නෙස්සාමි, පමුණුවන්නෙමි.

75. වත්ථඤ්ච, වස්ත්‍රයද; අන්නපානඤ්ච, ආහාරපාන වර්ගද; ඝරං ගතා, ගෙට ගියා වූ; ත්වං, තී; ලච්ඡසි, ලබන්-නෙහිය; තෙ, තිගේ; පුත්තෙව, පුතුන්ද; පස්සිස්සසි, දක්නෙහිය; සුණිසායොව යෙහෙළිණියන්; දක්ඛසි ඉති, දක්නෙහිය.

Non-commercial distribution

එසේවී නම් තිට උතුරුසළුව දෙමි, මේ සළුව හැඳගනුව මෙය හැඳගෙන එව කී ගෙදරට පමුණුවන්නෙමි.

ගෙට ගියාවූ කී වස්ත්‍ර හා ආහාරපාන වර්ගත් ලබන්නෙහිය. තිගේ දරුවන්ද බලන්නෙහිය, යෙහෙලිණියන්ද දක්නෙහියයි කීය. එකල්හි ඕහට ඒ ප්‍රෙතිකොමෝ කියන්නී:-

76. හත්ථෙන හත්ථෙ තෙ දින්නං-න මය්හං උපකප්පති,
භික්ඛූ ච සීලසම්පන්නෙ-වීතරාගෙ බහුස්සුතෙ.

77. තප්පෙහි අන්නපාන්නෙ-මම දක්ඛිණමාදිස,
තදහං සුඛිතා හෙස්සං-සබ්බකාම සමිද්ධිනී-ති.

76. තෙ, නුඹ විසින්; හත්ථෙන, අතින්; හත්ථෙ, අතට; දින්නං, දෙනලද්ද; මය්හං, මට; න උපකප්පති, නොපැමිණෙයි; වීතරාගෙ, පහකරනලද රාග ඇති; බහුස්සුතෙ, බහුශ්‍රැතවූ; සීලසම්පන්නෙ, සිල්වත්වූ; භික්ඛූ ච, භික්ෂූන්ම.

77. අන්නපානෙන, ආහාරපානවර්ගයෙන්; තප්පෙහි, තර්පණයකරව; මම, මට; දක්ඛිණං, පින; ආදිස, දුනමැනව; තද, එකල්හි; අහං, මම; සබ්බකාම සමිද්ධිනී, සියලු කාමයෙන් සමෘඩවූවා; සුඛිතා හෙස්සං ඉති, සුවපත් වන්නෙමිය.

ස්වාමීනි නුඹ විසින් අතින් මා අතට දෙනලද දෙය මට නොලැබෙයි, සිල්වත්වූ වීතරාගවූ බහුශ්‍රැතවූ භික්ෂූන්ම ආහාර පානයෙන් වළඳවනු මැනව, එසේකොට මට ප්‍රාප්තිදනය කරනු මැනව, එසේකළ කල්හි මම සියලු කාමයෙන් සමෘඩව සුවපත් වන්නෙමියි ගාථා දෙකක් කීයේය. ඉන්පසු:-

78. සාධූති සො පටිස්සුත්වා-දනං විපුලමාකිරි,
අන්නං පානං ඛාදනීයං-වත්ථසෙනාසනානි ච.

79. ඡත්තං ගන්ධඤ්ච මාලඤ්ච-විවිධා ච උපාහනා,
භික්ඛූ ච සීලසම්පන්නෙ-වීතරාගෙ බහුස්සුතෙ,
තප්පෙත්වා අන්නපානෙන-තස්සා දක්ඛිණමාදිසි.

80. *සමනන්තරානුද්දිට්ඨෙ-විපාකො උපපජ්ජථ,
භොජනච්ඡාදනපානීයං-දක්ඛිණාය ඉදං ඵලං

81. ‡තතො සුද්ධා සුචිවසනා-කාසිකුත්තමධාරිණී,
විචිත්තවත්ථාභරණා-සාමිකං උපසඞ්කමී-ති.

Non-commercial distribution

78. සො, හෙතෙම; සාධු ඉති, මැනවයි; පටිස්සුත්වා, ප්‍රතිවචනදී; විපුලං දනං, මහත් දනය; ආකිරි, පැවැත්විය; අන්නං, ආහාරද; පානං, පානවර්ගද; ඛාදනීයං, කැයුතුදේද; වත්ථසෙනාසනානිච, වස්ත්‍ර හා සෙනසුන්ද;

79. ඡත්තං, ඡත්‍රද; ගන්ධංච, සුවඳ ද; මාලංච, මල්මාලාද; විවිධාච උපාහනා, නන්වැදෑරුම් වහන්ද (දී); වීතරාගෙ, වීතරාගවූ; බහුස්සුතෙ, බහුශ්‍රැතවූ; සීලසම්පන්නෙ භික්ඛුව, සිල්වත් භික්ෂූන්ම; අන්නපානෙන, ආහාරපානයෙන්; තප්පෙත්වා, සතප්පවා; තස්සා, ඇට; දක්ඛිණං ආදිසි, දක්ෂිණාව දුනී.

ඒ උපාසකතෙම ප්‍රෙති යගේ කීම යහපතැයි පිළිගෙන දක්ෂිණාර්හක්ෂෙත්‍රයෙහි දෙයධර්ම සඞ්ඛ්‍යාත බීජ වපුරන්නෙකු-මෙන් මහාදනය පැවැත්විය, ආහාරපාන ඛාද්‍ය භොජ්‍ය වස්ත්‍ර සෙනාසනයන්ද, කුඩ සුවඳ මල්මාලාද නන්වැදෑරුම් වහන්-සඟල්ද පිළියෙළකොට සිල්වත් වීතරාග බහුශ්‍රැත භික්ෂූන්ට දී, ආහාර පානයෙන් වළඳවා ඒ ප්‍රෙතියට පින්පැමිණ විය.

දක්ෂිණාව දීමට අනතුරුවම විපාක උපන. දිව්‍ය ආහාර වස්ත්‍ර පැන් පහළවිය. මේ දක්ෂිණාවගේ විපාකයයි.

ඉක්බිති ඈ පිරිසිදුවී යහපත් සළුහැඳ උතුම් කසිසළුදරා විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී ස්වාමියා කරා එළඹ සිටියේය. මේදැක්වූ ගාථා සතර සංගීතිකාරක මහතෙරුන් වහන්සේලා විසින් වදරන ලදහ. ඉන්පසුව උපාසකයා විචාරන්නේ:-

82. *අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං
තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා-ඔසධි විය තාරකා.

83. *කෙන තෙ තාදිසො වණ්ණො-කෙන තෙ
ඉධ මිජ්ඣති,
උප්පජ්ජන්ති ච තෙ භොගා-යෙ කෙචි
මනසො පියා.

84. *පුච්ඡාමි තං දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසතී-ති.

Non-commercial distribution

85. *අහං නන්ද නන්දසෙන-හරියා තෙ පුරෙ අහුං,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා.

86. *තව දින්නෙන දනෙන-මොදමි අකුතො භයා,
චිරං ජීව ගහපති සහ සබ්බෙහි ඤාතිහි.

87. *අසොකං විරජං යානං-ආවාසං වසවත්තිනං,
ඉධ ධම්මං චරිත්වාන-දනං දත්වානගහපති.
විතතයාමච්ඡෙරමලං-සමූලං-අනින්දිතො
සග්ගමුපෙහියානං-ති.

යන්නෙන්, පින්වත් දෙව්දුව යම්බඳුවූ කී විශිෂ්ට ශරීර වර්ණයෙන් ඔසධිතරුවමෙන් සකල දිශාවන් බබුළුවමින් සිටියි.

කවර හෙතුවකින් තිගේ මෙබඳු ශරීර වර්ණය ඇතිවීද කවර කුශල කර්මයක් හෙතුකොට මෙහි තිට කැමැති සම්පත් සමෘද්ධ වන්නේද සිත් ප්‍රියකරන යම්කිසි සම්පත් වෙයි නම් ඒ සියල්ල තිට පහළවෙත්.

මහත් අනුභාවය සම්පන්නවූ දෙව් දූව තිගෙන් මම විචාරමි, මනුෂ්‍යවූවා කවර පූණ්‍යකර්මයක් කෙළෙහිද, තිගේ ශරීරවර්ණය සියලු දිසාවන් ආලෝක කරයි, කවර කුශල කර්මයකින් මෙසේ ජ්වලිතානුභාව ඇතිවීදැයි ඇසීය.

එකල්හි ප්‍රෙතිය කියන්නී පින්වත් නන්දසේනයෙනි මම පෙර ජාතියෙහි නුඹ වහන්සේගේ නන්ද නම් භාර්‍යාව වීමී. අකුශල කර්මයකොට මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයෙහි උපනිමි.

නුඹ වහන්සේ විසින් දුන් දක්ෂිණාව හෙතුකොට කිසි-භයක් නැතිව දිව්‍ය සම්පත්තියෙන් සතුටුවෙමි, පින්වත් ගෘහපතිය නුඹ සියලු නෑයන් හා සමග බොහෝ කලක් ජීවත්වේවා.

පින්වත් ගෘහපතිය ලොභ වෙෂ සහිතවූ මසුරුමලහැ-රපියා දන්දී මේ මිනිස් ලොවදී කුශල ධර්මයෙහි හැසිර නිශ්ශොකවූ රජස් නැති තමා වසයෙහි පවත්නවුන්ට ආවා-සස්ථානවූ දෙව් ලොවට පැමිණෙවයි අවවාද කෙළේය. මේ වනාහි උපාසකයා ගේ හා ප්‍රෙතියගේත් වචන ප්‍රතිවචන ගාථාවෝ වෙත්.

Non-commercial distribution

මෙසේ ඈ තමාගේ දිව්‍යසම්පත්තියද ඒ සම්පත්තියට හෙතුද නන්දසෙනයාහට විස්තර කොට කියා තමාගේ වාසස්ථානයටම ගියාය. උපාසකතෙම එපවත් භික්ෂූන්ට සැලකෙළේය. භික්ෂූහු භාග්‍යවත්හට සැලකළහ. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ කාරණය අර්ථොත්පත්තිකොට පැමිණි පිරිසට දහම්දෙසා වදළ සේක ඒ දෙශනා තොමෝ මහජනයාට සාර්ථකවිය.

(මසුරුමලයෙන් බැඳී තම ස්වාමියාට අගෞරව අනාදර කිරීමෙන් හා රළු වචන කියා නින්ද කිරීමෙනුත් තමා ඉතා බියකරු විපතට පත්වනබැව් මෙයින් පැහැදිලිව දතයුතු.)

මේ ප්‍රෙතවස්තුදෙශනායෙහි උඛ්ඛරීවර්ගයට ඇතුළත් සතරවෙනි නන්ද ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී

2. 5 වෙනි කථාව.

තවද මේ ප්‍රෙත වස්තු දෙශනායෙහි උඛ්ඛරීවඛීන්තඛීත පස් වෙනි **මට්ටකුණ්ඩලී ප්‍රෙතවස්තුව** කවරහයත්.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වාසය කරන කල්හී මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා අරභයා මේ වස්තුව දෙශනා කළසේක. එහි යමක් කිය යුතුවේද එය පරමාර්ථදීපනී නම් විමානවස්තු වණ්ණනාවට ඇතුළත් මට්ට-කුණ්ඩලී විමානවස්තු වණ්ණනායෙහිදී කියන ලද්දේමය. එහෙයින් එහි කියනලද නයින්ම දතයුතුයි. (එහි තිබෙන පරිදි මෙසේය:-

අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසයකරනකල්හි එම සැවැත්නුවර උප භොග පරිභොග සම්පත්තියෙන් සමෘඩවූ තෙරුවන් කෙරෙහි නොපහන් මිසදිටු බමුණෙක් විය. කද මසුරු සිත් ඇති හෙතෙම කිසිවෙකුටත් කිසිවක් නොදෙයි. එහෙයින් හෙතෙම අදින්න පුඛ්බක යයි කියාම ප්‍රකට විය. මිථ්‍යා ලඛ්ධි ඇති හෙතෙම තථාගතයන් වහන්සේ හෝ උන්වහන්සේ ගේ ශ්‍රාවකයන් දකින්ටත් නොකමැතිවෙයි. මට්ටකුණ්ඩලී නම්

Non-commercial distribution

තම පුතණුවන්ද දරුව නුඹ මහණ ගොයුම් හා ඔහු ශ්‍රාවක යන් වෙත නොඑලඹියයුතු යයි ස්වකීය ලබධියෙහි භික්ම-වාලීය. එහෙයින් ඒ මට්ටකුණ්ඩලී නම් මාණවක තෙමේත් තුනුරුවන් කෙරෙහි අප්‍රසන්නව වෙසෙයි. මෙසේ වසන්නාවූ ඔහට එක් කලෙක්හි බලවත් ආබාධ යක් උපන. බමුණු-තෙම ධනය නැස්මේ බියෙන් වෙදකම් නොකරවා රොගය වැඩුණු කල්හි වෙදෙකු කැඳවා දක්වූයේය. වෙද තෙම උහු සිරුර බලා පිළියම් නොකළහැකියයි දැන පහව ගියේය,

බමුණුතෙම පුත්‍රයා ගෙයතුළ මළකල්හි බැහැරලන්ට දුෂ්කරයයි පිට දෙර කොටුවෙහි සයනය කරවූයේය. භාග්‍ය වත් සර්ඳයන් වහන්සේ එදවස රාත්‍රිය පිළිබඳ අලුයම් කාලයෙහි මහ කුළුණු සමවතින් නැගී ලොව බලනසේක් එදවස සැව නරකයෙහි ඉපදීමට සුදුසුවූ අකුශලකර්මයක් විසින් කරනලද අවකාශ ඇතිව ආයු පිරිහී වැදහොත් මට්ට-කුණ්ඩලියා දුටුසේක. එසේද දැක ඉදින් මා ඔහු වෙත ගියෙම්නම් හෙතෙම මාකෙරෙහි සිත පහදවා දෙව්ලොව ඉපිද සොහොනෙහි අඩන්නාවූ පියාවෙත එලඹ සංවෙගයට පමුණුවන්නේය. මෙසේ ඇතිකල්හි ඒ මට්ටකුණ්ඩලියා හා ඔහුගේ පියා මා සමීපයට එන්නේය. මේ කරුණෙන් මහජන සමූහයාගේ රැස්වීමද වන්නේය. මා ඒ ජන සමා-ගමයෙහි දම්දෙසූ කල්හි මහත්වූ ධර්මාවබෝධයක් වන්නේ යයි මෙසේ දැන පෙරවරු හැඳ පොරවා පාසිවුරු ගෙන මහඹික් සහන සමග සැවැත්නුවරට පිඬු පිණිස පිවිසිසේක් මට්ටකුණ්ඩලී මාණවකයාගේ පියාණන් ගෙය සමීපයෙහි සිට සවණක් බුදුරැස් හළ සේක.

මානවක තෙම ඒදැක මේ කිමෙක්දැයි ඔබ මොබ බලන්නේ තෙමේම දැමුණාවූ තෙමේම ගොපිතවූ සන්සුන් ඉඳුරන් ඇති දෙතිසක් මහපුරිස් ලකුණෙන් හා අසුවක් අනුව්‍යඤ්ජනයෙන්ද බඹයක් පමණතැන් පැතිර සිටි කෙතු-මාලාවෙන්ද හෙබියාවූ අනොපමෙයවූ බුඩශ්‍රීයෙන් හා අචි-න්ත්‍යවූ බුඩානුභාවයෙන් බබලන්නාවූ බුදුන් දුටුවේය. එසේ බුදුන් දුටු ඔහට මේ සිත්විය. ස්වකීය තෙජසින් සූර්‍යයාද කමනීය ගුණයෙන් චන්ද්‍රයාද උප ශාන්ත භාවයෙන් සියලු මහණ බමුණන්ද අභිභවනය කරන්නාවූ මේ රූපසම්පත්තිය

Non-commercial distribution

යමෙකු පිළිබඳ නම් ඒ මේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වැඩිසේක. ලොකයෙහි යම් උපශාන්ත ගුණයක් වේනම් එය මුන්වහන්සේ කෙරෙහිම වියයුතුය. ලොකයෙහි අග්‍ර පුද්ගලයා මුන් වහන්සේම වියයුතුය. මටම අනුග්‍රහ පිණිස මෙහි වැඩිශේවනැයි සිතා බුධාරම්මණ ප්‍රීතියෙන් පිනා ගිය සිරුර ඇත්තේ අප්‍රමාණවූ ප්‍රීතිය හා සතුට පහළ කරමින් පහන්සිත් ඇත්තේ ඇදිලි බැඳ හොත්තේය. භාග්‍යවතුන් වහන්සේ ඒ දැක මොහුට දෙව්ලොව ඉපදීමට මෙපමණක් ඇතැයි ආපසු වැඩිසේක. හෙතෙමේද ඒ ප්‍රීතිය හා සතුට නොහැරම කලුරිය කොට තව්තිසා දෙව්ලොව දෙළොස් යොදුන් රන්විමනක උපන්නේය. ඔහුගේ පියතෙම තම පුතුගේ ශරීරයට කටයුතුවූ සත්කාරකොට දෙවෙනිද අලුයම් කාලයෙහි සොහොනට ගොස් අහෝ මට්ටකුණ්ඩලිය, අහෝ මට්ටකුණ්ඩලියයි විලාප කියමින් සොහොන සිසාරා ඇවිදිමින් අඩයි. දිව්‍යපුත්‍රතෙම තමාගේ සම්පත්තිය බලා මම කොයිසිට කවර කර්මයක් කොට මෙහි ආයෙම්දෝයි සලකා බලන්නේ තමාගේ පෙර අත්බැව හා එහිදී මරණ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පවත්වනලද චිත්තප්‍රසාදයද මනොහරවූ අඤ්ජලිකර්ම මාත්‍රයද දැක අහෝ භාග්‍යවත් බුදුවරයෝ මහත් ආනුභාව ඇත්තෝවෙත්යයි භගවත්හු කෙරෙහි හටගත් ඉතා අධිකවූ පැහැදීම් හා බුහුමන් ඇත්තේ අදින්න පුඛබක බමුණුතෙම කුමක් කරන්නේදෝයි සලකා බලන්නේ සොහොනෙහි අඩමින් උන්නහු දැක මෙතෙම පළමුකොට මට බෙහෙතක් පමණවත් නොකරවා දැන් නික රුණේ සොහොනෙහි හඩයි. එහෙයින් මොහු සංවේගයට පමුණුවා කුශලයෙහි පිහිටුවන්නෙමියි. දෙව්ලොවින් අවුත් මට්ටකුණ්ඩලි විලාසයෙන් ඉස අත් බැඳගෙන අනේ වන්දය අනේ සූර්‍යයයි කිය කියා හඬමින් පියා සමීපයෙහි සිටියේය.

ඉක්බිති බමුණුතෙම ඔහු දැක මේ මට්ටකුණ්ඩලිතෙම ආයේ යයි සිතා ගාථාවකින් මෙසේ කීයේය.

අලඞ්කතො මට්ටකුණ්ඩලී-මාලාධාරී හරිචන්දනුස්සදෙ
බාහාපග්ගය්හ කන්දසි-වනමජ්ඣෙ කිං දුක්ඛිතොකුවන්ති.

අලඞ්කතො, අඹරණින් සැරසුනාවූ; මට්ටකුණ්ඩලි, සරීර ප්‍රදෙශය නොගැටීම පිණිස මාලාලතාදිය නොදක්වා මට්ටාකාර

Non-commercial distribution

යෙන්ම කරනලද කුණ්ඩලාභරණ ඇති; මාලාධාරී, මාලාවක් දරන්නාවූ හෙවත් පැළඳි මාලයක් ඇති; හරිවන්දනුස්සදෙ, රක්ත සඳුනින් ආලෙප කරනලද ගාත්‍රඇති; තුවං, තෝ; වනමජ්ඣෙ, මෙවනමැද; බාහාපග්ගය්හ, හිස අත් බැඳගෙන; කන්දසි, හඬ නෙහිය; කිං, කිම තුවං, තෝ; දුක්ඛිතො අසි, දුකට පැමිණියේ වෙහිද; (නොහොත්) කිං දුක්ඛිතො අසි, කවර දුකකින් දුක්ඛිත වූයෙහිද.

ආභරණයන්ගෙන් සැරසුනාවූ ශරීර ප්‍රදෙශයන් නොගැටීම පිණිස මාලාලතාදිය නොදක්වා මට්ටාකාරයෙන්ම කරන ලද කුණ්ඩලාභරණ ඇති මාලා පැළන්දවූ රත්සඳුන් ගැල්වූ ශරීර ඇති නුඹ වනමැද හිස අත් බැඳගෙන අඬන්නෙහිය නුඹ කිනම් දුකකින් දුක්වන්නෙහිදැයි ඇසීය. ඉක්බිති දිව්‍යපුත්‍රතෙම:-

සොවණ්ණමයො පභස්සරො-උප්පන්නො රථපඤ්ජරො මම
තස්ස චක්කයුගං න වින්දමි-තෙන දුක්ඛෙන ජහිස්සං ජීවිතං.

යන ගාථාවෙන්, මට රන්මුවාවූ පැහැ විහිදෙන රථපඤ්ජරයක් උපන, ඒ රථපඤ්ජරයට චක්‍රයුග්මයක් නොලබමි හෙවත් නැත, මම ඒ දුකින් ජීවිතය හරියන්නෙමි හෙවත් මැරෙන්නෙමියි කියේය. එසේ කී කල්හි බමුණුතෙම:-

සොවණ්ණමයං මණිමයං-ලොහිතඞ්කමයං අථරූපියාමයං,
ආවිඤ්ඡ මෙ හද්ද මාණව-චක්කයුගං පටිපාදයාමි තෙ

යන මේ ගාථාවෙන්, සොඳුරු මාණවකය මට කියව, මම නුඹට රණින් හෝ රිදියෙන්ද මාණික්‍යයෙන් හෝ ලොහිතඞ්කමාණික්‍ය යෙන්ද කරනලද චක්‍රයුගලයක් සලස්වා දෙන්නෙමියි කීය.

මාණවකතෙම ඒ අසා මෙතෙම තම පුතුට බෙහෙත් නොකොට පුත්‍රයා වැනි මා දැක අඬන්නේ ස්වර්ණාදියෙන් රථ චක්‍රයක් කරවා දෙමැයි කියයි. ඒ එසේවේවා මොහුට නිග්‍රහ කරන්නෙමි යයි සිතා මට කොපමණ මහත්වූ රියසක් දෙකක් කරන්නෙහිදැයි කියා යම් පමණ මහත කැමැත්තෙහිනම් එපමණ මහත්වූවක්යයි කීකල්හි සඳ හිරු දෙදෙනා ගෙන් මට ප්‍රයෝජනය ඒ සඳ හිරු දෙදෙන මට ලබාදෙවයි යදින්නාවූ ඒ මාණවකතෙම:-

Non-commercial distribution

''සො මාණවො තස්ස පාවදි-චන්දිමසූරියා උභයෙත්ථ දිස්සරෙ,
සොවණ්ණමයො රථො මම-තෙන චක්කයුග්ගෙන
සොහති''ති.

යන මේ ගාථාවෙන්, සඳ හිරු දෙදෙන මේ අහස්හි පෙනෙත්. මාගේ රන්මුවා රථය ඒ සක්යුවල කරණකොටගෙන හොඬනේ වේයයි ඒ බමුණාහට කීයේය. ඉක්බිති බමුණුතෙම ඔහට:-

''බාලො බො ත්වමසි මාණව-යො ත්වං පත්ථයසෙ අපත්තියං,
මඤ්ඤම් ත්වං මරිස්සසි-නහි ත්වං ලච්ඡසි චන්දසූරියෙ''ති.

යනුවෙන් එම්බා මාණවකය, සඳ හිරු දෙදෙන පතන්නාවූ තෝ බාලයෙක්ම වෙහිය, තෝ මියයනවා විනා සඳ හිරු දෙදෙන නොලබන්නෙහියයි කීකල්හි මාණවකතෙම කිමෙක්ද පෙනෙන්නා වූ දෙයක් නිසා හඬන්නේ බාලයෙක් වේද නොහොත් නොපෙනෙන්නාවූ දෙයක් ගැන හඬන්නේ බාල වේදැයි කීය:-

''ගමනාගමනම්පි දිස්සති-චණ්ණධාතු උභයෙත්ථ වීථියො,
පෙතො කාලකතො න දිස්සති-කොනිධ කඤ්ඤතං
බාල්‍යතරො''ති.

යන ගාථාවෙන්, එම්බා බ්‍රාහ්මණය, මේ සඳ හිරු දෙදෙනා කෙරෙහි උද්ගමනාවගමන වශයෙන් යාම් ඒම් හා පැහැ සටහන්ද අජවීථි ආදී වීථීද පෙනෙත්. කලුරියකොට පරලොව ගිය කැනැත්තේ වනාහී නොපෙනෙයි. එසේ හෙයින් මෙහි හඬන්නාවූ අප දෙදෙනා අතුරෙන් කවරෙක් ඉතා බාලබැව් ඇත්තේ වේදැයි කීකල්හි බමුණුතෙම ඒ අසා මෙතෙම යුක්තිය කියන්යයි සලකමින්:-

සච්චං බො වදෙසි මාණව-අහමෙව කඤ්ඤතං බාල්‍යතරො,
චන්දං විය දරකො රුදං-පෙතං කාලකතාහි පත්ථයන්ති,

යනුවෙන් එම්බා මාණවකය, තෝ සැබවක්ම කියන්නෙහිය, මෙහි අඬන්නාවූ අප දෙදෙනා අතුරෙන් ඉතා බාලවූයේ මම මය. මම වනාහි චන්ද්‍රයා ඉල්වා අඬන්නාවූ ළදරුවෙකු මෙන් කලුරියකොට පරලොව ගියෙකු පතමින් අඬන්නේ වෙමියි කියා ඔහුගේ ගාථාව ඇසීමෙන් නිස්සොකීවූ බ්‍රාහ්මණතෙම මාණවකයා.හට ස්තුතිකරනුයේ:-

Non-commercial distribution

''ආදත්තං වත මං සන්තං–සත සිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං– සබ්බං නිබ්බාපයීදරං.
අබ්බූළ්හී වත මෙ සල්ලං–අසෘකං හදය නිස්සිතං,
යො මෙ සොක පරෙතස්ස–පුත්තසොකං අපානුදි.
සොහං අබ්බූළ්හසල්ලොස්මි–සීති භූතොස්මී නිබ්බුතො,
නසොචාමී නරොදමි–තව සුත්වාන මාණවා''ති.

යන ගාථා තුන කියා:–

එම්බා මාණවකය, සොකයෙන් පීඩිතවූ මාගේ පුත්‍ර ශොකය දුරුකළාවූ නුඹ ගිතෙලින් ඉසිනලද ගින්නක් මෙන් පුත්‍ර ශොකාග්නියෙන් ඇවිලගත්තාවූ මාහට ජලශොකය කරන්නෙකු මෙන් ශොකාග්නියෙන් හටගත් මාගේ සියලුම විඩාව නිවුයේය. මාගේ හෘදයාශ්‍රිතවූ ශොකාග්නි සූලය උද්ධරණය කෙළේය. උදුරා දමනලද ශොක නමැති උල් ඇත්තාවූ ඒ මම නුඹගේ බස් අසා සිහිල්වූයේ වෙමි, නිවියේ වෙමි, මින් මතු ශොක නොකරමි, නොහඬමියි කීයේය.

ඉක්බිති මෙසේ පුත්‍රශොකය දුරුකොට සිටි අදින්නපුබ්බක බ්‍රාහ්මණතෙම තමහට උපදෙස් දුන් මාණවකයා දිව්‍යමය රූපයෙන් යුක්තව සිටිනහු දැක නුඹ කවරනම් වෙහිදැයි විචාරණුයේ:–

දෙවතානුසි ගන්ධබ්බො–ආදු සක්කො පුරින්දදෙ,
කොවා ත්වං කස්ස වා පුත්තො–කථං ජානෙමු තං මයන්ති.

යන ගාථාවෙන්, එම්බා තෝ කවරෙක්ද දෙවියෙක් හෝ ගඳඹෙක් හෝ වෙහිද, නොහොත් පෙර දන්දුන් හෙයින් පුරින්දද නම්වූ ශක්‍රයා හෝ වෙහිද, කවරෙකුගේ හෝ පුත්‍රයෙක්ද අපි කෙසේ දැනගනිමුදැයි ඇසීය. එබස් අසා දිව්‍යපුත්‍ර තෙමේද තමා ප්‍රකාශකරන්නේ:–

''යඤ්ච කන්දසි යඤ්ච රොදසි–පුත්තං ආළාහනෙ සයං දහිත්වා,
ස්වාහං කුසලං කරිත්වා කම්මං–කිදසානං සහව්‍යතං
පත්තො''ති.

යනුවෙන් බ්‍රාහ්මණය, තෙමේම සිය පුතු සොහොනෙහි දවා යම් පුතෙකු නිසා කඳුලු වගුරුවමින් හඬන්නෙහිනම් ඒ නුඹගේ පුත්‍රවූ මම කුශල කර්මයක් කොට තව්තිසා වැසි දෙවියන්ගේ සහභාවයට පැමිණියෙමියි කීවේය. එකල්හි බමුණුතෙම;–

Non-commercial distribution

''අප්පං වා බහුං වා නාද්දසං–දානං දදන්තස්ස සකෙ අගාරෙ,
උපොසථකම්මං වාව තාදිසං–කෙන කම්මෙන ගතොසි
දෙවලොක''න්ති.

යන මේ ගාථාව කියා එම්බා සියගෙයිදී දන්දෙන්නාවූ නුඹගේ ස්වල්පවූ හෝ මහත්වූ දනක්ද පෙහෙවස් කිරීමක් හෝ එබඳු අත්කිසි කුශල කර්මයක්ද මම නුදුටුවෙමි කවර කර්මයකින් නුඹ දෙවලොව ගියේදැයි ඇසීය. එසේ ඇසූ බමුණුහට මාණවක තෙම:–

''ආබාධිකොහං දුක්ඛිතො බාළ්හගිලානො
ආතුරරූපොමහි සකෙ නිවෙසනෙ,
බුද්ධං විගතරජං විතිණ්ණ කඩ්ඛං
අද්දක්ඛිං සුගතං අනොමපඤ්ඤං,
ස්වාහං මුදිතමනො පසන්න චිත්තො
අඤ්ජලිං අකරිං තථාගතස්ස,
තාහං කුසලං කරිත්වාන කම්මං
තිදසානං සහව්‍යතං පත්තො''ති.

යන ගාථා දෙකින් පින්වත් බමුණ මම ස්වකීය ගෘහයෙහිදී හටගත් ආබාධ ඇත්තේ එහෙයින්ම දුකට පැමිණියේ දැඩි ගිලන් බැව් ඇතිව දුක්ඛ වේදනාවෙන් පීඩිතවූයේ වෙමි. එසේ වූ මම චතුස්සත්‍යාවබොධය කළ හෙයින් බුඩ නම් වූ පහ වූ රාගාදි කෙලෙස් රජස් ඇති සියලු සැක දුරුකළා වූ සපිරුණු නුවණැති සුගතයන් වහන්සේ දුටුවෙමි.

එසේ බුදුන් දුටු මම ඉතා සන්තොෂයට හා ප්‍රසන්න භාවයට පැමිණි සිත් ඇත්තෙම් තථාගතත්වාදී කරුණෙන් තථාගත නම්වූ බුදුන්ට අඤ්ජලිකර්ම කෙළෙමි. බුදුන්ට නමස්කාර කිරීම් සඩ්ඛ්‍යාත ඒ කුශලකර්මය කළා වූ මම එම පිණින් තව්තිසා වැසි දෙවියන්ගේ එකී භාවයට පැමිණියේ වෙමියයි කීයේය. මාණවකයා මෙසේ කියත්ම බමුණාගේ සියලඟ ප්‍රීතියෙන් පිනා ගියේය. බමුණුතෙම තමාගේ ඒ ප්‍රීතිය ප්‍රකාශ කරන්නේ:–

''අච්ඡරියං වත අබ්භුතං–අඤ්ජලි කම්මස්ස අයමීදිසො විපාකො,
අහම්පි මුදිතමනො පසන්නචිත්තො–අජ්ජෙව බුඩං
සරණං වජාමී''ති,

Non-commercial distribution

යන මේ ගාථාව කීයේය. පින්වත්නි පුදුමයක, පින්වත්නි නොවූ විරූවක, අඤ්ජලිකමීයාගේ මේ මෙබඳු විපාකයෙක් වෙයි. මමද සතුටුවූ පහන්වූ සිත් ඇත්තෙම් අදම බුදුන් සරණ යෙමියි කීයේය. ඉක්බිති දිව්‍යපුත්‍රතෙම බමුණා සරණ ගමන යෙහි හා සීල සමාදනයෙහි යොදවන්නේ:-

''අජ්ජෙව බුද්ධං සරණං වජාහි-ධම්මංච සඞ්ඝංච පසන්නචිත්තො
තථෙව සික්ඛාය පදානි පඤ්ච-අඛණ්ඩඵුල්ලානි සමාදිසස්සු.

පාණාතිපාතා විරමස්සු ඛිප්පං-ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු,
අමජ්ජපෝ නොච මුසා භණාහි-සකෙන දාරෙනච හොහි
තුට්ඨොා''ති.

යනුවෙන් බමුණ පහන් සිත් ඇතිව අදම බුදුන් දහම් සඟුන් සරණ යව. එසේම සික්ෂාපද පසද ඛණ්ඩඵුල්ල නොකොට සමාදන් වෙව, පණිවායෙන් වහාම වෙන්වෙව, ලොකයෙහි හිමියන් විසින් නුදුන්දෙය නොගෙන දුරුකරව, මත්පැන් නොබොව, බොරු නොකියව, පරඅඹුවන් කරා නොගොස් සිය අඹු සමගම සතුටුවෙවයි කීවේය. මෙසේ දිව්‍යපුත්‍රයා විසින් සරණ යෙහි හා ශීලයෙහි නියුක්ත කළාවූ බමුණුතෙම ඔහුගේ වචනය හිසින් පිළිගනිමින්:-

''අත්ථකාමොසි මේ යක්ඛ-හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං-සොසි ආචරියො මම.''

යන ගාථාවෙන් යක්ෂයාණෙනි තෝ මට වැඩ කැමැත්තෙහිය, දෙවතාවාණෙනි, මට හිත කැමැත්තෙහිය, එහෙයින් මම නුඹගේ වචනය කරමි. තෝ මට ආචාර්‍ය වෙහියයි කියා තිසරණයෙහි හා පන්සිල්හි පිහිටන්නේ:-

''උපෙමි බුද්ධං සරණං-ධම්මං චාපි අනුත්තරං,
සඞ්ඝං ච නරදෙවස්ස-ගච්ඡාමි සරණං අහං.

පාණාතිපාතා විරමාමි ඛිප්පං-ලොකෙ අදින්නං
පරිවජ්ජයාමි,
අමජ්ජපෝ නොච මුසාභණාමි-සකෙන දාරෙනච
හොමි තුට්ඨොා''

යන ගාථා දෙක කියා, පින්වත් දිව්‍යපුත්‍රය මම බුදුන් සරණ කොට යෙමි. නිරුත්තර වූ ධර්මය හා නරදෙව වූ බුදුන්ගේ

Non-commercial distribution

සඩ්ඝයාද සරණකොට යෙමි. වහාම පණිවායෙන් වෙන්වෙමි, ලොකයෙහි හිමියන් විසින් නුදුන් දෙය නොගෙන දුරුකරමි, මත්පැන් නොබොමි, බොරුද නොකියමි, සිය අඹු සමග සතුටු වෙමියි තිසරණයෙහි හා පඤ්චශීලයෙහි පිහිටියේය.

ඉක්බිති දිව්‍යපුත්‍රතෙම මවිසින් බ්‍රාහ්මණයාට කටයුතුදේ කරනලදී. දැන් තෙමේම භාග්‍යවතුන් වහන්සේ කරා එලඹෙන්නේයයි සිතා එහිම අතුරුදහන්විය. බමුණුතෙමේද භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හටගත් ප්‍රසාද බහුමාන ඇත්තේ දෙවතාවා විසින්ද මෙහෙයනු ලබන්නේ මහණ ගොයුම්හු කරා එලඹෙන්නෙමියි වෙහෙර බලා යෙයි, මහජන තෙම ඒ දැක මේ බමුණු තෙම මෙතෙක් කල් බුදුන් කරා නොඑලඹ අද දරුසොවින් එලඹෙයි කෙබඳු දම්දෙසීමක් වන්නේදෝයි ඔහු ලුහුබැඳ ගියේය.

බමුණුතෙම බුදුන්කරා එලඹ පිළිසඳර කථාකොට භවත් ගෞතමයාණෙනි, කිසි දනක් නොදී ශීලයකුත් නොරැක ඔබ කෙරෙහි සිත පැහැදවීම් පමණින්ම දෙව්ලොව උපදින්ට කිම හැක්කේදෝයි විචාළේය. එකල්හි බුදුරජාණෝ බමුණ අද මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා විසින් තමාගේ දෙව්ලොව ඉපදීමට කරුණු නුඹට කියන ලද්දේ නොවේදැයි විචාළසේක.

එකෙණෙහි මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රතෙම විමානය සමගම අවුත් (හැමට) පෙනෙන්නාවූ රූපයෙන් යුක්තව විමනින් බැස භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ ඇදිලි බැඳගෙන ගෙන එකත් පස්ව සිටියේය. ඉක්බිති ශාස්තෘතෙම එම පිරිසෙහි ඒ දිව්‍ය පුත්‍රයා විසින් කළ සුචරිතය ප්‍රකාශ කොට පිරිසගේ සිත් පිරිසිදු බැව් දැන දුඃඛාදි චතුස්සත්‍ය ධර්මය වදළේය. ධර්මදෙශනාවසානයෙහි මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා හා අදින්න පුබ්බක බ්‍රාහ්මණ තෙමේද රැස්වූ පිරිසදැයි සුවාසූ දහසක් ප්‍රාණීන්ට ධර්මාවබොධය වූයේය.

මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා විමාන දෙවතාවෙකු බැවින් ඔහු පිළිබඳ වස්තුව ඉදින් විමානවස්තු පාළියෙහි සංග්‍රහයට නැගූ නමුදු යම්හෙයකින් වනාහි දිව්‍යපුත්‍රතෙම පුත්‍රශොකයෙන් සොහොනට ගොස් දරසැයවටේ කරකැවී හඬන්නාවූ අදින්න-

Non-commercial distribution

පුබ්බක බ්‍රාහ්මණයාගේ සෝදුක් දුරුකිරීම පිණිස තමාගේ දිව්‍ය ශරීරය හකුළුවා සඳුන්කල්ක ගැල්වූ සිරුර ඇතිව දෙඅත් බැඳගෙන හඬමින් දුකින් මැඩුණු අයුරෙන් ප්‍රෙතයෙකුසේ තමන් දැක්වූයේද මනුෂ්‍යාත්මභාවයෙන් පහවූ බැවින් ''ප්‍රෙත'' යන පර්‍යාය නමද (දෙවියන්ට) ලැබෙමයයි කියා ඔහු පිළිබඳ වස්තුව මේ ප්‍රෙතවස්තු පාළියෙහිත් සංග්‍රහයට නගනලදැයි දතයුතුයි.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගීයට ඇතුළත් පස්වෙනි මට්ටකුණ්ඩලී ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

---

2. 6 වෙනි කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගීන්තර්ගත සවෙනි **කාළඛණ්ඩ ප්‍රෙතවස්තුව** කවරේදයත්.

දෙවානි දෙවවූ ශාස්තෘන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවාසයකර වදරන කල්හි එක්තරා මළපුතෙකු ඇති උපාසක යෙකු අරබයා මේ වස්තුව දෙශනා කළසේක. සැවැත්නුවර වනාහි එක්තරා උපාසකයෙකුගේ පුතෙක් කළුරිය කෙළේය. ඒ උපාසක තෙමේ ඒ මරණයෙන් ශොක නැමැති හුලෙන් මඩනා ලදුව ස්නානය නොකරයි, බත්නොකයි, කර්‍මාන්තයන් නොවිචාරයි, බුඩොපසථානයට නොයයි, හුදෙක් ''දරුව ප්‍රිය පුත්‍රය මා හැර පළමුකොට කොහි ගියේදැ''යි යනාදි ශොක සහගත වචන කියමින් විකාර දෙඩවයි. ශාස්තෘන්වහන්සේ උදෑසන කාලයෙහි ලොව බලා වදරනසේක්, ඔහුගේ ශ්‍රොතාපත්ති ඵලයට හෙතු සම්පත් දැක වදරා දෙවෙනි දිනයෙහි භික්ෂු සංඝයා විසින් පිරි වරන ලදුව සැවැත්නුවර පිඬුපිණිස හැසිර කරනලද බත්කිස ඇතිව භික්ෂූන් පිටත්කරයවා අනද තෙරුන් වහන්සේ පසු මහණෙකු කොට ඔහුගේ ගෙදරට වැඩිසේක. බුදුන් වැඩිය බව (ගෘහවාසීහු) උපාසකයාහට දන්වූහ. එකල්හි ඔහුගේ ගෘහවාසී ජනතෙමේ ගෙදොර අස්නක් පනවා බුදුන් වඩා හිඳුවා උපාසකයා අල්වාගෙන ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ වීය. එකත් පසෙක හුන් ඒ උපාසකයා දෙස බලා වදරා ''උපාසකය කිමෙක්ද තෝ

Non-commercial distribution

ශොකකෙරේදැ''යි අසා වදරා ''එසේය ස්වාමීන් වහන්සැ''යි කී කල්හි ''උපාසකය පෞරාණික පණ්ඩිතයෝ පණ්ඩිතයන්ගේ කථාව අසා මළ දරුවා ගැන ශොක නොකළාහුය''යි වදරා ඒ උපාසකයා විසින් යාචිඤ්ඤාකරන ලදුව අතීත කථාව ගෙනහැර දක්වා වදළසේක.

අතීත කාලයෙහි වාරවතී නුවර දසබෑ රජ කෙනෙක් වූහ. (එනම්) වාසුදෙවය, බලදෙවය, චන්දදෙවය, සුරියදෙවය, අග්ගිදෙවය, වරුණදෙවය, අජ්ජුනය, පජ්ජුනය, ඝතපණ්ඩිතය, අඩිකුරය යන මොහු වෙති. ඔවුනතුරෙන් වාසුදෙව මහරජාණන් ගේ ප්‍රිය පුත්‍රතෙම කාලක්‍රියා කෙළේය. ඒ හෙතුවෙන් රජතෙමේ ශොකයෙන් මඩනාලදුව සියලු කටයුතු හැරපියා ඇඳට ඇඳිලි බැඳගෙන විලාප කියමින් හොත්තේය. එකල්හි ඝතපණ්ඩිත තෙම මෙසේ සිතීය, මාහැර මාගේ බෑයාණන් ගේ සොකය දුරු කරන්ට සමර්ථ වූ අන්කිසිවෙක් නම් නැත. උපායකින් මොහුගේ සොකය දුරුකරන්නෙමියි. ඒ ඝතපණ්ඩිත තෙම උමතුවෙසක් ගෙන ''මට සාවෙකු දෙව් මට සාවෙකු දෙව්ය''යි කියමින් අහස බලමින් මුළුනුවර ඇවිද්දේය. ''ඝතපණ්ඩිත තෙමේ උමතු වූයේය''යි සියලු නුවර කැලඹී ගියේය. එකල්හි රොහිණෙය්‍යා නම් ඇමතියා වාසුදෙව රජහු ගේ සමීපයට ගොස් ඔහු සමග කථාව ආරම්භකරන්නේ මේ ගාථාව කීයේය:—

88. උට්ඨෙහි කණ්හ කිං සෙසි-කො අත්ථො සුපනෙන තෙ,
යො ච තුය්හං යකො භාතා-හදයං වක්ඛුඤ්ච දක්ඛිණං,
තස්ස වාතා බලීයන්ති-සසං ජප්පති කෙසවා-ති.

88. කණ්හ, කෘෂ්ණ ගොත්‍රවත් වාසුදෙව රජ; උට්ඨෙහි, නැඟුටුන මැනව; කිං, කුමක් සඳහා; සෙසි, නිදන්නෙහිද; තෙ; නුඹට; සුපනෙන, නිදීමෙන්; කො අත්ථො, කවර වැඩෙක්වේද, තුය්හං, නුඹගේ; හදයං, හෘදය වැනිවූ; දක්ඛිණං වක්ඛුඤ්ච, දකුණැස බඳුවූ; සකොභාතා, ස්වකීය සහෝදරවූ; යොච, යම් ඝත පණ්ඩිතයෙක් වීද; තස්ස, ඔහුගේ; වාතා, උමතු වාතයෝ; බලීයන්ති, බලවත්වෙති; කෙසව, (ශොභන කෙශවත් බැවින්) කෙශව නම් වාසුදෙවය; සසං, සාවෙකු (දෙවියයි); ජප්පති ඉති, විලාප කියයි,

Non-commercial distribution

කෘෂ්ණ ගොත්‍ර ඇති වාසුදෙව මහරජ්ජුරුවන් වහන්ස, නැඟිටුනු මැනව, කුමක්පිණිස නුඹ වහන්සේ නිදන්නසේක්ද, නිදගැනීමෙන් නුඹ වහන්සේට කවර දියුණුවක් වේද, නුඹ වහන්සේ ගේ හෘදය වැනිවූ දකුණැස බඳුවූ යම් සත පණ්ඩිත නම් ස්වකීය සහෝදරයෙක්වේද, ඔහුගේ ඔබ්මොබ උපදින උමතු වාතයෝ බලවත්වෙති, වැඩෙති, ශොභන කෙසයන් ඇති බැවින් කෙසවයයි ව්‍යවහාර කරනලද වාසුදෙවයෙනි සතපණ්ඩිත තෙමේ මට සාවෙකු දෙව්යයි විලාප කියයි. ඔහුගේ කීම අසා යහනින් නැඟීටි බව ප්‍රකාශ කරන්නාවූ ශාස්තෘන් වහන්සේ බුදුවී මේ ගාථාව වදළසේක:-

89. තස්ස තං වචනං සුත්වා-රොහිණෙය්‍යස්ස කෙසවො,
තරමාන රූපො උට්ඨාසි-භාතු සොකේන අට්ටිතො-ති.

89. කෙසවො, කෙශවනම් වාසුදෙව රජතෙම; තස්ස රොහිණෙය්‍යස්ස, ඒ රොහිණෙය්‍ය නම් ඇමැතියාගේ; තං වචනං, ඒ වචනය; සුත්වා, අසා; භාතුසොකෙන, සහොදර ශොකයෙන්; අට්ටිතො, පෙළෙන ලදුව; තරමාන රූපො, වෙවුලමින්; උට්ඨාසි ඉති, නැඟී සිටියේය.

කෙසවනම් වාසුදෙව රජතෙමේ ඒ රොහිණෙය්‍ය නම් ඇමතියාගේ ඒ කීම අසා භ්‍රාතෘශොකයෙන් පෙළෙන ලදුව වෙවුලමින් යහනින් නැඟිටියේය.

රජතෙම නැඟිට වහා පහයෙන් බැස සත පණ්ඩිතයා සමීපයට ගොස් දෙයතින් ඔහු දැඩිකොට අල්වාගෙන ඔහු සමග කථා කරන්නේ:—

90. කින්නුඋම්මත්ත රූපොව-කෙවලං වාරකං ඉමං,
සසො සසොති ලපසි-කිදිසං සස මිච්ඡසි.

91. සොවණ්ණමයං මණිමයං-ලොහමයං අථ රූපියාමයං,
සඩ්ඛසිලාපවාළමයං-කාරයිස්සාමි තෙ සසං.

92. සන්ති අඤ්ඤෙපි සසකා-අරඤ්ඤෙ වන ගොචරා,
තෙපි තෙ ආනයිස්සාමි-කීදිසං සසමිච්ඡසි-ති.

90. කින්නු, කිමෙක්ද; උම්මත්තරූපො ඉව, උමතුවෙකු මෙන්; කෙවලං සියලු; ඉමං වාරකං, මේ වාරවතී නුවර (ඇවිදිමින්;) සසො සසො ඉති, සාවා සාවායයි; ලපසි; විලාප කියයිද; කීදිසං සසං, කෙබඳු සාවෙකු; ඉච්ඡසි, කැමැත්තෙහිද.

Non-commercial distribution

91. සොවණ්ණමයං, රනින් කළාවූද; මණිමයං, මිණියෙන් කළාවූද; ලොහමයං, ලොහයෙන් කළාවූද; අථ, යලි; රූපියා මයං, රිදීයෙන් කළාවූද; සඞ්ඛසිලා පවාළමයං, සක්සිලා පබළු වෙන් කළාවූද; සසං, සාවෙකු; තෙ, නුඹට; කාරයිස්සාමි, කර වන්නෙමි.

92. වනගොචරා, වනය ගොදුරුකොට ඇති; අඤ්ඤෙ අපි සසකා, අනිකුදු සාවෝද; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; සන්ති, ඇත්තාහ, තෙ අපි, ඔවුනුත්; තෙ, නුඹට; ආනයිස්සාමි, ගෙනෙන්නෙමි; කීදිසං සසං, කෙබඳු සාවෙකු; ඉච්ඡසි ඉති, කැමැත්තෙහිද.

ඝත පණ්ඩිතය නුඹ උමතුවූවෙක් මෙන් මේ මුළු වාරවතී නුවර ඇවිදිමින් ''සාවා සාවා''යයි කියා කුමක් පිණිස විලාප කියන්නේද, නුඹ කෙබඳු සාවෙකු කැමැත්තේද.

රනින් කළාවුද, මිණියෙන් කළාවූද, තඹ ලොහයෙන් කළාවූද, රිදීයෙන් කළාවූද, සඞ්ඛශිලාප්‍රවාළමයවූද, යම් සාවෙකු කැමැත්තේ නම් එය කියව නුඹට කැමැති සාවෙකු කරවා දෙන්නෙමි.

අරණ්‍යයෙහි වනය ගොදුරුකොට ඇති වෙනත් සාවෝ ඇත්තාහ. ඔවුන්ද නුඹට ගෙනෙන්නෙමි (යහපත් මුව ඇත්ත) නුඹ කෙබඳු සාවෙකු කැමැත්තේදැයි කියා ගාථාකුන කීයේය. සාවෙකුගෙන් ප්‍රයෝජන ඇතැයි යන අදහසින් සාවාගෙන් ඝත පණ්ඩිතයා පැවරුවේය. ඝත පණ්ඩිතතෙම ඒ කීම අසා;–

93. නාහමෙතෙ සසෙ ඉච්ඡෙ-යෙ සසා පඨවීනිස්සිතා,
වන්දතො සසමිච්ඡාමි-තං මෙ ඔහර කෙසවා-ති.

93. කෙසව, කෙශවනම් වාසුදේවය; පඨවීනිස්සිතා, පොළොව ඇසුරුකොට ඇති; යෙ සසා, යම් සාවෝ වෙත්ද; එතෙ සසෙ, ඒ සාවුන්; අහං, මම; න ඉච්ඡෙ, නොකැමැති වෙමි; වන්දතො, සඳමඬලෙන්; සසං, සාවෙකු; ඉච්ඡාමි, කැමැත්තෙමි; තං. ඒ සාවා; මෙ, මට; ඔහර ඉති. ගෙනදෙව. කෙසවනම් වාසුදෙවයෙනි පොළව ඇසුරුකොට ඇති යම් සාවෝ වෙත්ද ඒ සාවුන් මම නොකැමැත්තෙමි, සඳමඬලේ

Non-commercial distribution

පෙනෙන සාවා කැමැත්තෙමි, එය මට ගෙනදෙවයි කියා ගාථාව කීයේය. රජතෙමේ ඒ කීම අසා නිසැකවම මගේ සොහොයුරා උමතුවීයයි සිතා දෙමිනසට පැමිණියේ:-

94. සො නූන මධුරං ඤාතී ජීවිතං විජහිස්සති,
අපත්ථයං පත්ථයසි-චන්දතො සසමිච්ඡසි-ති.

94. ඤාති, (මගේ ප්‍රිය) ඤාති මළණුව; චන්දතො, සඳමඬලෙන්; සසං, සාවා; ඉච්ඡසි, කැමැත්තෙහිය; අපත්ථයං, නොපැතිය යුත්තක්; පත්ථයසි, පතයි; මධුරං ජීවිතං, ඉතා මිහිරි (තම) ජීවිතය; විජහිස්සති ඉති, හරින්නෙහිය යි; සො (අහං) ඒ මම; නූන (මඤ්ඤෙ,) සිතමි.

මාගේ ප්‍රිය මලණුව නුඹ සඳමඬලේ පෙනෙන සාවා කැමැත්තෙමියි කියා යම් හෙයකින් නොලැබිය හැකි දෙයක්ම පතයිද එහෙයින් තමන් ගේ ඉතා මිහිරි ජීවිතය හරින්නේයයි ඒ මම සිතමියි කියා ගාථාව කීයේය.

සත පණ්ඩිත තෙම රජුගේ කථාව අසා නිශ්චලව සිට සහෝදරය නුඹ වහන්සේ සඳමඬලේ පෙනෙන සාවා ප්‍රාර්ථනා කරන්නාහුගේ එය නොලබා ජීවිතක්ෂය වන්නේය යි දන්නාහු නම් කවර හෙයකින් මළපුතු සඳහා ශොක කරනසේක්ද්‍යැයි කියා මේ කාරණය ප්‍රකාශකරමින්.

95. එවඤ්චෙ කණ්හ ජානාසි-යථඤ්ඤමනුසාසති,
කස්මා පුරෙ මතං පුත්තං-අජ්ජාපි අනුසොචසි ති.

95. කණ්හ, කෘෂ්ණගොත්‍රවත් මහරජ; යථා, යම් සේ, අඤ්ඤං, අන්හට; අනුසාසති, අනුශාසනා කෙරෙහිද; එවං; මෙසේ; ජානාසිචෙ, දන්නෙහිනම්; කස්මා, කවරහෙයකින්; පුරෙ, පෙර; මතං පුත්තං, මළ පුතු සඳහා; අජ්ජ අපි, අදත්; අනුසොචසි ඉති, ශොක කෙරෙහිද.

සහෝදර කෘෂ්ණ නම් මහරජ්ජුරුවන් වහන්ස නොලැබිය හැකි වස්තුව නම් නොපැතිය යුතුයයි කියා ඉදින් මෙපරිදි දන්නේ නම් මෙසේ දැනම යම්පරිද්දකින් අනුන්ට අනුශාසනා කෙරේනම් නුඹ වහන්සේ එසේ නොකොට කුමක් හෙයකින් මෙයින් සිවිමසකින් පෙර මළ පුතු සඳහා අද දක්වාත් ශොක කෙරේදැයි ඇසීය.

Non-commercial distribution

මෙසේ ඒ සත පණ්ඩිත තෙම ඇතුල් වීථියෙහි සිටගනම මම මෙසේ පෙනෙන්නාවූ දෙයක්ම ඉල්ලමි. නුඹ වහන්සේ වනාහි නොපෙනෙන දෙයක් සඳහා ශොක කරන්නාහුයයි කියා ඒ රජහට ධර්මදේශනා කරන්නේ මේ ගාථාවය කියේය.

96. යෙ න ලබ්භා මනුස්සෙන-අමනුස්සෙන වා පන,
ජාතො මෙ මා මරී පුත්තො-කුතො ලබ්භා අලබ්භියං.

97. න මන්තා මූලහෙසජ්ජා-ඔසධෙහි ධනෙන වා,
සක්කා ආනයිතුං කණ්හ-යං පෙතමනුසොචසි-කි.

96. ජාතො, උපන්නාවූ; මෙ පුත්තො, මාගේ පුත්‍රතෙම; මාමරී, නොමැරේවා යන; යං, යමක්; මනුස්සෙන, මිනිසෙකු විසින් හෝ; අමනුස්සෙනවාපන, අමනුෂ්‍ය (දෙව්) යෙකු විසින් හෝ; න ලබ්භා, නොලැබිය හැකිවේද; අලබ්භියං, ඒ නොලැබිය හැකිදේ; කුතො, කවර හෙතුවකින්; ලබ්භා, ලැබිය හැකිද.

97. කණ්හ, කෘෂ්ණය; යංපෙතං, පරලොවගිය යම් පුතෙකු සඳහා; අනුසොචසි, අනුශොචනය කරයිද; ආනයිතුං, (ඔහු) පමුණුවාගන්ට; මන්තා, මන්ත්‍රප්‍රයොගයකින් හෝ; මූලහෙසජ්ජා, මූල භෙෂජ්‍යයකින් හෝ; ඔසධෙහි, නානාවිධ ඖෂධ වර්ගවලින් හෝ; ධනෙනවා, (කොටිසත සඞ්ඛ්‍යාත) ධනයකින් හෝ; නසක්කා නොහැකිය.

සහෝදරය යම්හෙයකින් උපන්නාවූ මාගේ පුත්‍රයා නොමැරේවායි කියා යම් ප්‍රාර්ථනාවක්වේද එය මනුෂ්‍යයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ නොලැබිය හැක්කේය. නුඹ නොලැබිය හැකිදෙය පතයි, නොලැබිය හැකිදෙය වනාහි නුඹ කොයින් ලබන්නේද.

කෘෂ්ණගොත්‍රවත් වාසුදෙවයෙනි නුඹ පරලොවගිය යම් පුතෙකු නිසා ශොක කරයිද ඔහු මෙහි ගෙනෙන්ට මන්ත්‍ර ප්‍රයොගයකින් හෝ මූලභෙෂජ්‍යයකින් හෝ නානාවිධ ඖෂධ වර්ග වලින් හෝ කෙළසියගණන් ධනයකින් හෝ නොහැකිය. මැරුණු යම් කෙණෙකු සඳහා ශොක කරයිද ඔහු මේ මන්ත්‍ර ජප කිරීම් ආදියකින් පමුණුවා ගන්ට නුපුළුවනැයි දතයුතු.

Non-commercial distribution

නැවත සත පණ්ඩිත තෙම මේ මරණය නම් ධනය හෙතුකොට හෝ ජාතිය හෙතුකොට හෝ විද්‍යාව හෙතුකොට හෝ ශීලය හෙතුකොට හෝ භාවනාව හෙතුකොට හෝ වලක්වාලිය නොහැක්කේයයි දක්වමින්:—

98. මහද්ධනා මහාභොගා-රට්ඨවන්තොපි ඛත්තියා,
පහූතධනධඤ්ඤා යෙ- තෙපි නො අජරාමරා.

99. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා-සුද්ද චණ්ඩාල පුක්කුසා,
එතෙ චඤ්ඤෙ ච ජාතියා-තෙපි නො අජරාමරා.

100. යෙ මන්තං පරිවත්තෙන්ති-ඡළඞ්ගං බ්‍රහ්ම චින්තිතං.
එතෙ චඤ්ඤෙව විජ්ජාය-තෙපි නො අජරාමරා.

101. ඉසයෝ චාපි යෙ සන්තා-සඤ්ඤතත්තා තපස්සිනෝ,
සරීරං තෙපි කාලෙන-විජහන්ති තපස්සිනෝ.

102. භාවිතත්තා විහරන්තා-කතකිච්චා අනාසවා,
නික්ඛිපන්ති ඉමං දෙහං-පුඤ්ඤපාපපරික්ඛයාති.

98. මහද්ධනා, මහත් ධන ඇත්තාවූද; මහාභොගා, මහත් භොගසම්පත් ඇත්තාවූද; රට්ඨවන්තෝ අපි, සියලු රට-ඇත්තාවූද; පහූත ධන ධඤ්ඤ, අපරිමිත ධනධාන්‍ය ඇත්තාවූද; යෙඛත්තියා, යම් ක්ෂත්‍රිය කෙනෙක් වෙද්ද; තෙ අපි, ඔහුතුමුත්; නොඅජරාමරා, ජරාමරණ රහිතයෝ නුවූහ.

99. ඛත්තියා, ක්ෂත්‍රියෝය; බ්‍රාහ්මණා, බ්‍රාහ්මණියෝය; වෙස්සා, වෛශ්‍යයෝය; සුද්ද, ශූද්‍රයෝය; චණ්ඩාල පුක්කුසා, සැඩොල් හා පුප්සඩුවෝය යන; එතෙව, මෙකී ක්ෂත්‍රියාදීහුද; අඤ්ඤෙව, (අම්බට්ඨාදී) අන්‍යයෝ වෙද්ද; තෙපි, ඔවුහුත්; ජාතියා, ජාතිය නිමිත්තකොට; අජරාමරානො, ජරාමරණ රහිතයෝ නුවූහ.

100. යෙ, යම්හුතුමූ; බ්‍රහ්මචින්තිතං, බ්‍රහ්මයා විසින් සිතන ලද හෝ කියනලද; ඡළඞ්ගං, ෂඩඞ්ගයුක්තවූ; මන්තං, වෙදය; පරිවත්තෙන්ති, හදරත්ද (හෙවත්) කියවද්ද (නොහොත් ඔබිමොබ පෙරළමින් හොමපූජාකරමින්) ජපකෙරෙද්ද;

Non-commercial distribution

විජ්ජාය, (බ්‍රහ්මයාට බඳු) විද්‍යාඥානයෙන් යුක්තවූ; එතෙව, මොවුහුද; අඤ්ඤෙව, සෙස්සෝද යන; තෙපි, ඔවුහුත්; නො අජරාමරා, අප්‍රාමර නුවූහ.

101. සන්තා, සන්සුන් ස්වභාව ඇති; සඤ්ඤතත්තා, සංයම සිත් ඇති; තපස්සිනෝ, (කයතැවීම් සඞ්ඛ්‍යාත) තපොගුණ ඇති; තපස්සිනෝ, භික්මුනාවූ; යෙව අපි ඉසයෝ, යම් ඍෂිහු-වෙද්ද; (නොහොත්) ඉසයෝ, (අධිශීල ශික්ෂාදිය ඉසායන අර්ත්ථයෙන්) ඍෂිවූ; සන්තා, (පාපධර්මයන් සන්සිඳවීමෙන්) ශාන්තවූ; සඤ්ඤතත්තා, (එකඅරමුණක) භික්මවනලද සිත් ඇති; තපස්සිනෝ, සම්‍යක් ප්‍රධාන යොගයෙන් වීර්‍යතාපන-යෙන් යුක්තවූ; තපස්සිනෝ, රාගාදි පව් තවන්නාවූ; යෙව අපි, යම්කෙනෙක් වෙද්ද; තෙපි, ඔවුහුද; කාලෙන, සුදුසු කාලයෙහි; ශරීරං, සිරුර; විජහන්ති, හැරද මත්.

102. භාවිතත්තා, (චතුස්සත්‍ය) කර්ම්ස්ථාන භාවනාවෙන්) වඩනාලද සිත් ඇතිව; විහරන්තා, වාසය කරන්නාවූ; කතකිච්චා, අර්හත් ඵලය පිණිස කටයුතුකොට නිමකළාවූ; අනාසවා, (කාමාදී) ආශ්‍රව රහිතයෝද; පුඤ්ඤපාප පරික්ඛයා, කුශලා කුශලයන් ක්ෂයකිරීමෙන්; ඉමං දෙහං, මේ ශරීරය; නික්ඛිපන්ති ඉති, හැරදමත්.

නිදනගතකළ මහත් ධන ඇති බැවින් බොහෝ ධන ඇත්තාවූද දිව්‍ය සම්පත් සදෘශ මහත් භොග සම්පත්තියෙන් සමන්විතවූද සියලු රට ඇති තුන්හතර අවුරුද්දකට ප්‍රයෝජන පිණිස නිදන්කොට තැබිය යුතුවූ නිතර වියදම්වන ධනධාන්‍ය-යාගේ වශයෙන් කෙළවරක් නැති ධනධාන්‍ය ඇති යම් රජ කෙනෙක් වෙද්ද මෙසේ ඒ මහාසම්පත් ඇති මහාමන්ධාතු මහාසුදර්ශනාදි ක්ෂත්‍රියයොත් ජරාමරණ ඇත්තෝවූහ. ඒකාන්ත-යෙන් මරුමුවටම පැමිණියාහුය.

ක්ෂත්‍රියයෝද බ්‍රාහ්මණයෝද වෛශ්‍යයෝද ශූද්‍රයෝද චණ්ඩාලයෝද පුප්පඩුවෝද යන මෙකී ක්ෂත්‍රියාදීහුද අනික් අම්බට්ඨාදී කුලිකයෝද ජාතිය නිමිත්තකොට අජරාමර නුහ.

ශික්ෂා, කල්ප, නිරුක්ති, ව්‍යාකරණ, ජ්‍යොතිශ්ශාස්ත්‍රය, ඡන්දෙවිචිතියයි කියනලද ෂඩඞ්ගයෙන් යුක්තවූ බ්‍රාහ්මණයන්ගේ ප්‍රයෝජනය පිණිස බ්‍රහ්මයා විසින් සිතනලද හෝ කියනලද

Non-commercial distribution

වෙදය යම් කෙනෙක් හදුරත්ද කියවද්ද නොහොත් අනුව පෙරළමින් හෝමපූජාකරමින් ජපකරත්ද, බ්‍රහ්මයා සමාන විද්‍යාවෙන් සමන්විත වූවාහුද ඒ සියල්ලෝම අජරාමරනූවෝය.

යාමනියමාදිය හා ප්‍රතිකූල සඤ්ඤිය සොයන්නාවූ සෘෂීහුද කාය වාක් දෙකින් සන්සුන් ස්වභාව ඇති රාගාදි ක්ලෙශයන් හික්මීමෙන් සංයත සිත්ඇති කය තැවීමයයි කියනලද තපො ගුණ ඇති යම් තපස්වීහු වූවෝද නොහොත් අධිශීල ශික්ෂාදිය සොයන්නාවූ ඊට ප්‍රතිපක්ෂවූ පාපධර්මයන් සංසිඳවීමෙන් ශාන්තවූ එක අරමුණක හික්මවීමෙන් සංයත සිත්ඇති සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙහි යෙදීමෙන් වීර්‍යතාපනයෙන් යුක්තවූ සම්-ප්‍රයොගයෙන් රාගාදි පව් තැවීමෙන් තපස්වීවූ යම් උතුමෝ වූවෝද ඔවුහුද මරණයට සුදුසු කල්හි ශරීරය හැරදමත්මය.

චතුස්සත්‍ය කර්මස්ථාන භාවනායෙන් වඩනාලද සිත් ඇතිව වසන්නාවූ අර්හත්ඵලය පිණිස කටයුතුකොට නිමකළාවූ නික්-ලෙශීවූ රහතන් වහන්සේලාද කුසල් අකුසල් ක්ෂයකිරීමෙන් මේ ශරීරය හැරදමත්යයි කියා මේ ගාථා පසෙන් රජහට ධර්ම දෙශනා කළේය.

මෙසේ සත පණ්ඩිතයා විසින් ධර්මය දෙශනාකළ කල්හි ඒ ධර්මකථාව අසා පහවගිය ශොක නැමැති හුල් ඇතිව ප්‍රසන්නවූ සිත් ඇති රජතෙමේ සතපණ්ඩිතයාට ප්‍රශංසා කරමින් සෙසු ගාථාවන් කීයේය.

103. *ආදිත්තං වත මං සන්තං-සතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං-සබ්බං නිබ්බාපයෙ දරං.

104. *අබ්බූළ්හං වත මෙ සල්ලං-සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස-පුත්තසොකං අපානුදි.

105. *සොහං අබ්බුළ්හසල්ලොස්මි-සිනිහුතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදාමි-තව සුත්වාන භාසිතං,

106. එවං කරොන්ති සප්පඤ්ඤා-යෙ හොන්ති අනුකම්පකා,
විනිවත්තයි සොකම්හා-සතො ජෙට්ඨංව භාතරං.

107. යස්ස එතාදිසා හොන්ති-අමච්චා පරිචාරකා,
සුභාසිතෙන අන්වෙති-සතො ජෙට්ඨංව භාතර-න්ති.

Non-commercial distribution

106. සතෝ, සත පණ්ඩිතතෙම; ජෙට්ඨංභාතරං, වැඩිමල් සොහොයුරා; සොකමිහා, පුත්‍රශොකයෙන්; විනිවත්තයි ඉව, මුදුලූ වාසේ; සප්පඤ්ඤ, සප්‍රාඥවූ; අනුකම්පකා, අනුකම්පා-කාරිවූ; යෙහොන්ති, යම් කෙනෙක් වෙත්ද; එවං කරොන්ති, (ඔවුහු) මෙසේ කරත්,

107. සතෝ, සත පණ්ඩිතතෙම; ජෙට්ඨං භාතරං, ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවූ (වාසුදෙව රජු;) සුභාසිතෙන, යහපත් වචන-යෙන්; අනුඵසිඉව, (නිඃශොකයට) පැමිණුවූවාක්මෙන්; යස්ස, යමෙකුට; එතාදිසා, මෙබඳුවූ; අමච්චා, (පණ්ඩිත) ඇමතියෝ; පරිවාරකා හොන්ති ඉති, සේවකයෝ වෙත්ද (ඔහුට සෝකයෙක් කොයින්ද)

ගිතෙල් ඉසිගින්නක්මෙන් ශොකාග්නියෙන් දිලිසුනාවූම මට ජලය ඉසින්නාක්මෙන් ඒකාන්තයෙන් සියලු සිත් දැවිල්ල නිවාලුයේය.

මගේ සිත ඇසුරුකොට පැවතුණ ශොක සල්‍යය ඒකාන්ත-යෙන් බැහැර කරන ලද්දේය. ශොකයෙන් මිරිකුණාවූ මගේ පුත්‍රශොකය යම් සොහොයුරෙක් පහකෙළේද.

ඒ මම දැන් උදුරනලද ශොක හුල් ඇත්තේ වෙමි. සිහිල්ව ගිය සිත් ඇත්තේවෙමි, නිවුණු සිත් ඇත්තේවෙමි. නුඹගේ වචනය අසා මම දැන් ශොක නොකරමි නොහඬමි.

යම්සේ සත පණ්ඩිතතෙම මළපුත් සෝකයෙන් මිරිකුණාවූ තම වැඩිමල් සොහොයුරා තමන්ගේ උපායෙහි දක්ෂ භාවයෙන් හා ධර්ම කථාවෙනුත් ඒ පුත්‍ර ශොකයෙන් මුදවා ගත්තේද මෙසේම යම් අනුකම්පාකාරිවූ සප්‍රාඥ පණ්ඩිතයෝ වෙත්නම් ඒ පණ්ඩිතයෝත් ඥාතීන්ට උපකාර කෙරෙත් යයි කීය.

යම් අන්දමකින් සත පණ්ඩිතතෙමේ වැඩිමල් සහෝදරවූ පුත්‍රශොකයෙන් පීඩිතවූ වාසුදෙව රජුට ශොකදුරුවීම පිණිස යහපත් වචනයෙන් අවවාද කෙළේද වෙනත් යම්කෙනෙකුට මෙවැනි පණ්ඩිතවූ ඇමතියෝ පිරිවරවෙත් නම් ඕහට ශොක-යෙක් නැතැයි කියා මේ අවසාන ගාථාව තථාගතයන් වහන්සේ දෙශනාකර වදළසේක.

Non-commercial distribution

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙන හැර දක්වා වදරා ''උපාසකය මෙසේ පෞරාණික පණ්ඩිතයෝ පණ්ඩිතයන්ගේ අවවාද කථාව අසා පුත්‍ර ශොකය දුරුකළෝ ය''යි වදරා චතුස්සත්‍යය ප්‍රකාශකොට ජාතකය ගළපා වදළ සේක. චතුස්සත්‍ය දේශනාවසානයෙහි උපාසකතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය.

(මරණ සෝදුක් නිවාගැනීමට මහොපදේශයක්වූ මේ ධර්ම කථාව සියලුදෙනාම කියවා සිත තබාගත යුතුයි.)

මේ ප්‍රෙතවස්තු දේශනායෙහි උබ්බරීවර්ගයට ඇතුළත් සවෙනි කෘෂ්ණ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

2. 7 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දේශනායෙහි උබ්බරීවර්ගාන්තර්ගත සත්වෙනි **ධනපාල ප්‍රෙතවස්තුව** කවරහයත්.

ත්‍රිභුවනෙක චූඩාමාණික්‍යායමාන ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙර වැඩවසන කල්හි ධනපාල නම් ප්‍රෙතයෙකු අරබයා මේ ධර්මදේශනාව වදලසේක. තථාගතයන් වහන්සේ ලොව පහළනුවූ කල්හි වනාහි දසන්නරට එරකච්ඡ නම් නුවර ධනපාල නම් සිටුකෙනෙක් විය. ඔහු ශ්‍රද්ධා නැත්-තෙක අප්‍රසන්නයෙක තද මසුරෙක කළ කුශලා කුශලයන්ගේ විපාක නැතැයි කියන මිථ්‍යාලබ්ධි ඇති නාස්තික දෘෂ්ටිකයෙක් විය. ඔහුගේ ක්‍රියාව දේශනා පාලියෙන්ම ප්‍රකට වෙයි. ඒ සිටු කළුරිය කොට වාලුකා කාන්තාරයක ප්‍රෙතයෙක්ව උපන ඔහුගේ ශරීරය තල්කඳක් පමණ විය. නැගීසිටි සිවිය රළුය විරූප භීසකේ ඇත්තේය. භයානකවූ දුර්ණීවූ ඉතාමත් නපුරු රූ ඇත්තේ අතිශයින් බියකරු දැකුම් ඇත්තේයි ඔහු පස්පණස් අවුරුද්දක් මුළුල්ලෙහි බත්හුලක් හෝ දියබින්දුවක් හෝ නොලබමින් වියලී ගිය උගුර තොල් දිව ඇතිව ක්ෂුධා පිපාසායෙන් පීඩිතව ඔබ මොබ ඇවිදියි. ඉක්බිති අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවී පවත්වනලද උතුම් දම්සක් ඇතිව පිළිවෙළින් සැවැත්නුවර වැඩවාසයකර වදරන කල්හි සැවැත්නුවර වාසීවූ වෙළෙන්දෝ පන්සීයක් පමණ ගැල්වල බඩුපුරවාගෙන උත්තරා

Non-commercial distribution

පථය (උතුරුදිගට) ගොස් එම බඩු විකුණා පසුව ලැබුණු බඩු ගැල්වල ලාගෙන ආපසු එන්නාහු සවස් කාලයෙහි එක්තරා දියවියලී ගිය ගඟක් ලඟට පැමිණ එහිදී වියමුද රාත්‍රියෙහි වාසය කළෝය. එකල්හි ඒ ප්‍රෙතතෙම පිපාසයෙන් මඩනා ලදුව පැන් සොයා අවුත් එහිදී බිඳක් පමණකුදු පැන් නොලබා පැන් ආශාව පහවී මුල්සිඳුණු තල්ගසක්සේ සිඳුණු පා ඇතිව වැටුණේය. ඒ දැක වෙළෙන්දේ:-

108.†නග්ගො දුබ්බණ්ණ රූපොසි-කිසො ධමනි සන්ථතො,
උප්ඵාසුලිකො කිසිකො-කො නු ත්වමසි මාරිසා-ති.

නිදුකානෙනි නග්නව විරූපව කෘශව නහරවැල් ඉල්පීගිය ශරීර ඇතිව උස්වූ ඉලඇට ඇතිව ඉතාමත් කෘශවූ තෝ කවරෙක්දැයි කියා මේ ගාථාවෙන් විචාළාහුය. ඉන්පසු ප්‍රෙතතෙම:-

109.*අහං භදන්තෙ පෙතොම්හි-දුග්ගතො යමලොකිකො,
පාපකම්මං කරිත්වාන-පෙතලොක මිතො ගතො-ති.

පින්වතුනි මම ප්‍රෙත ලොකයෙහි උපන් දුකටපත් ප්‍රෙතයන් වෙමි, පව්කම්කොට මිනිස්ලොවින් චුතව ප්‍රෙත ලොකයට පැමිණි යෙමියි තම පවත් කියා නැවත ඒ වෙළඳුන් විසින්:-

110.*කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්ම විපාකෙන-පෙතලොක මිතො ගතා-ති.

කයින් වචසින් මනසින් කවර අකුශලයක් කරන ලදද, කවර අකුශල කර්මයක්හුගේ විපාකයක් හෙතුකොටගෙන මිනිස් ලොවින් චුතව ප්‍රෙත ලොකයට පැමිණියේදැයි කියා ඔහු විසින් කරනලද කර්මය විචාරණ ලදුව පෙරවිසූ තැන් පටන් තමන්ගේ අතීත වර්තමාන අනාගතවූද ප්‍රවෘත්තිය දක්වමින් ඒ වෙළඳුන්ටත් අවවාද දෙමින් මෙසේ කීයේය:-

111. නගරං අත්ථි දසන්නානං-එරකච්ඡන්ති විස්සුතං,
තත්ථ සෙට්ඨී පුරෙ ආසිං-ධනපාලොති මං විදූ.

112. අසීති සකටවාහානං- හිරඤ්ඤස්ස අහොසි මෙ,
පහූතං මෙ ජාතරූපං-මුත්තා වෙළුරියා බහූ.

Non-commercial distribution

113. තාව මහාධනස්සාපි-නමෙ දතුං පියං අහු,
පිදහිත්වා වාරං භුඤ්ජාමි-මා මං යාචනකාද්දසුං

114. අස්සද්ධො මච්ඡරී චාසිං-කදරියො පරිභාසකො,
දදන්තානං කරොන්තානං-වාරයිස්සං බහුජ්ජනං,

115. විපාකො නත්ථි දානස්ස-සඤ්ඤමස්සු කුතො ඵලං,
පොක්ඛරඤ්ඤොදපානානි-ආරාමානි ච රොපිතෙ.

116. පපායො ච විනාසෙසිං-දුග්ගෙ සඩ්කමනානි ච,
ස්වාහං අකතකල්‍යාණො-කතපාපො තතො චුතො.

111. දසන්නානං, දසන්නරට (නොහොත්) දසන්න නම් රජුන්ගේ; එරකච්ඡං ඉති, එරකච්ඡයයි; විස්සුතං, ප්‍රසිඩවූ; නගරං අත්ථි, නුවරක් ඇත; තත්ථ, ඒ නගරයෙහි; පුබ්බෙ, පෙර (අතීත භවයෙහි); සෙට්ඨී ආසිං, (මම) සිටුකෙනෙක් වීමි; ධනපාලො ඉති, ධනපාල සිටුයයි; මං, මා; විදූ, (ජනයෝ) දනිත්.

112. මෙ, මට; හිරඤ්ඤස්ස, අමුරන්පිරූ; අසීති සකට වාහානං අහොසි, ගැල් වාහායන් අසූවක් විය; මෙ, මට; පහූතං. බොහෝවූ: ජාතරූපං, රත්රන්ද (ඇතිවිය); මුත්තා, මුතුද; වෙළුරියා, වෛඩූර්‍යය මැණිකක්ද; බහූ, බොහෝවූහ.

113. තාව මහාධනස්සාපි, එපමණ මහා ධනවතෙක්වූද: මෙ, මට; දතුං, දන්දීමට; පියං න අහු, ප්‍රියයක් නොවීය; යාචනකා, යාචක ජනයෝ; මං, මා; මාඅද්දසුං, නොදකිත්වායි; වාරං, ගෙදෙර; පිදහිත්වා, වසාගෙන; භුඤ්ජාමි, අනුභව කරමි.

114. අස්සඩ්ඩා, ශ්‍රද්ධා නැත්තෙක්ද; මච්ඡරී, මසුරෙක්ද; කදරියා, තද මසුරෙක්ද; පරිභාසකොච ආසිං, (බියෙන්) තර්ජනය කරන්නෙක්ද වීමි; දදන්තානං, දන් දෙන්නාවූද; කරොන්තානං, පින් කරන්නාවූද; බහුජ්ජනං, බොහෝ සත්වයන්; වාරයිස්සං, (පින්කමින්) වැලැක්වීමි.

115. දානස්ස, දන්දීමේ; විපාකො නත්ථි, ඵලයක්නම් නැත; සඤ්ඤමස්ස, ශීලසංයමයා ගේ; කුතොඵලං, කොයින්නම් විපාකයක් ලැබේද; පොක්ඛරඤ්ඤෙදපානානි, පැන් පොකුණු හා ලිංද; රොපිතෙ, රොපනය කරන ලද්දවූ; ආරාමානිච, අරම් උපවනයන් (හෙවත්) උයන් වතුද.

Non-commercial distribution

116. පපායොව, පැන් ශාලාද; දුග්ගමෙ, යානොහැකි තන්හි; සඩ්කමනානිව, ඒදඬුද; විනාසෙසිං, වනසාලීමි; සො අහං, ඒ මම; අකතකල්‍යාණො, නොකළ කුසල් ඇතිව, කත පාපො, කරනලද අකුසල් ඇතිව; තතොචුතො, එයින් චුතව.

පින්වතුනි, දසන්නරට නොහොත් දසන්න නම් රජුන්ගේ එරකච්ඡයයි ප්‍රසිඩ නුවරක් විය, ඒ නුවර පෙර අතීත භවයෙහි මම සිටුවූයෙමි, ධනපාල සිටුයයි මා දැනගනිත්. (ඒ මේ නාමය ඒ කාලයෙහි මට අර්ත්ථානුගතවීයයි දක්වයි.)

එකල මට ගැල් අසූවක් පුරාලන අමුරන් ඇතිවිය, (විසි කිරියක් වාහ නම්වේ, එය ගැලයයි කියනු ලැබේ.) එසේම කහවණුද ගැල් අසූවක් විය, මට රත්රන්ද බොහෝ ඇතිවිය, මුතු හා වෛඩූර්‍යයී මැණික්ද බොහෝවූහ.

එපමණ මහා ධනවතෙක්වූ මට දන්දීමට කැමැත්තක් නොවීය, යාචකයෝ මා නොදකින්වායි සිතා ගෙයි දොර වසා ගෙන ආහාර අනුභව කරමි.

ශ්‍රද්ධා නැත්තෙක් වීමි, මසුරුවීමි, තද මසුරෙක්ද වීමි, දන් දෙන්නවුන් දැක බියෙන් තර්ජනය කෙළෙමි. දන්දෙන්නාවූ පින් කරන්නාවූ බොහෝ සත්වයන් ඒ පින්කමින් වැලැක්වීමි.

දානමය පුණ්‍ය කර්මයා ගේ විපාකයෙක් නම් නැත, හුදෙක් පින පිනයි කියා වස්තු විනාශය කෙරේමය, ශීලසංයමයා ගේ විපාකය කොයින් ලැබේද, සිල්රැකීම නිෂ්ඵලවේ මැයිද කීමී. පැන් පොකුණු ආරාම හා මල්වතුත් පැන්ශාලා හා යානොහැකි තන්හිවූ ඒදඬු පාලම්ද විනාශකර දැමුවෙමි, ඒ මම නොකළ කුසල් ඇතිව කළ අකුසල් ඇතිව ඒ මිනිස්ලොවින් චුතව.

117. උපපන්නො පෙත්තිවිසයං–ඛුප්පිපාසා සමප්පිතො,
පඤ්චපණ්ණාසවස්සානි–යතො කාලකතො අහං.

118. නාභිජානාමි භුත්තං වා–පිතං වා පන පානියං,
යො සංයමො සො විනාසො–යො විනාසො සොසංයමො

119. පෙතාහි කිර ජානන්ති–යො සංයමො යො විනාසො,
අහං පුරෙ සංයමිස්සං–නදසිං බහුකෙ ධනෙ.

120. සන්තෙසු දෙය්‍ය ධම්මෙසු–දීපං නාකාසිමත්තනො,
සොහං පච්ඡානුතප්පාමි–අත්තකම්මඵලූපගො.

Non-commercial distribution

117. පෙත්තිවිසයං, ප්‍රෙතයොනියෙහි; උපපන්නොං, උපන්නේ; බුජ්පිපාසා සමප්පිතොං, සාපිපාසයෙන් මඩනාලද්දේ වෙමි; යතොං, යම් දිනක; අහං, මම; කාලකතොං, කළුරිය කළෙමිද; (එතැන් පටන්) පඤ්චපණ්ණාස වස්සානි, පස්පණස් අවුරුද්දක් මුළුල්ලෙහි.

118. භුත්තංවා, (ආහාර) අනුභවයක් හෝ; පානීයං, පැන්; පිතං වා පන, පීමක් හෝ; නාභිජානාමි, නොමදනිමි; යොසංයමොං, (ලොභාදි වශයෙන් කිසිවෙකුට නොදීමවූ යම් සංයමයක් වීද; සොං විනාසොං, එය (මහත්) වැනසීමක් වෙයි; යොං විනාසොං, යම් විනාසයක්වේද, සොං සංයමොං, එය (නොදීම නමවූ) සංයමයයි.

119. යොං සංයමොං, යම් (දානවස්තු) පරිත්‍යාග නොකිරීමක් වේද; සොං විනාසොං, එය (මහත්) වැනසීමකැයි; පෙතාහි, ප්‍රෙතයෝම; ජානන්ති කිර, දනිත්; අහං, මම; පුරෙ, පෙර; බහුකෙ ධනෙ, බොහෝ ධනය (විද්‍යමානකල්හි); සංයමිස්සං, (දානාදි පින් කිරියෙන්) වැලකුනෙමි; න අදසිං, දන් නුදුනිමි.

120. දෙය්‍යධම්මෙසු, දානවස්තු; සන්තෙසු, විද්‍යමාන කල්හි; අත්තනොං, තමහට; දීපං, පිහිට (පින)ක්; න අකාසිං, නොකළෙමි; අත්තකම්මඵලූපගොං, ස්වකීය කම් විපාකයට පැමිණියාවූ; සොං අහං, ඒ මම; පච්ඡානුතප්පාමි, දැන් පසුතැවිලි වෙමි.

ප්‍රෙත අපායෙහි උපන්නේ ක්ෂුධා පිපාසා දෙකින් පීඩිත වෙමි, යම කලෙක කළුරිය කළෙමිද එතැන් පටන් මම පස් පණස් අවුරුද්දක් මුළුල්ලෙහි–

ආහාර අනුභවයක් හෝ කිසිත් නොදනිමි. ලොභාදි වශයෙන් කිසිවෙකුට නොදෙන යම් වස්තු රැකීමක් වීද, ඒ දන් නොදීම මේ සත්වයන්ගේ විනාශය නමවේ, ප්‍රෙතලොකයෙහි උපන් ප්‍රෙතයන් හට මහත් වැනසීමට කරුණුවන හෙයිනි.

යම් වැනසීමක් වේනම් එය දන්නොදීම වේ. දානවස්තුව නොදීම විනාශයට හෙතුවක්ය යන කාරණය විපාක විඳින බැවින් ප්‍රෙතයෝම ප්‍රත්‍යක්ෂ වශයෙන් දනිත්, (මනුෂ්‍යයෝ නොදනිත්යයි මෙයින් දකයුතු නොවේ. මක්නිසාදයත් ප්‍රෙතයන් මෙන් සාපිපාසා දෙකින් මැඩුණාවූ මනුෂයන් දක්නා

Non-commercial distribution

ලැබෙන හෙයිනි. ප්‍රෙතයෝ වනාහි පළමු අත්බැව්හි කරනලද කර්මය ප්‍රකට හෙයින් මනාව දැනගනිත්.) මම පෙර දානාදි පුණ්‍ය ක්‍රියායෙන් වැලැක්කේ වෙමි, මහත් ධන සම්පත් විද්‍යමාන කල්හි කිසිවෙකුට නුදුන්නෙමි.

දානවස්තුව විද්‍යමාන කල්හි තමහට පිහිටවූ පිනක් නොකළෙමි, ඒ මම තමන් විසින් කරනලද පාපකර්ම විපාකයට පැමිණියේ දැන් පසුතැවිලි වෙමි.

121.*උද්ධං චතූහි මාසෙහි-කාලකිරියා භවිස්සති,
එකන්තං කටුකං සොරං-නිරයං පපතිස්සහං.

122.*චතුක්කණ්ණං චතුවාරං-විහත්තං භාගසෝ මිතං,
අයොපාකාර පරියන්තං-අයසා පටිකුජ්ජිතං.

123.*තස්ස අයොමයා භූමි-ජලිතා තෙජසා යුතා.
සමන්තා යොජනසතං-එරිත්වා තිට්ඨති සබ්බදා

124.*තත්ථාහං දීඝමද්ධානං-දුක්ඛං වෙදිස්ස වෙදනං,
ඵලං පාපස්ස කම්මස්ස-තස්මා සොචාමහං භුසං

125. තං වො වදාමි භද්දං වො-යාවන්තෙත්ථ සමාගතා
මාකත්ථ පාපකං කම්මං-ආවී වා යදි වා රහො

126. සචෙතං පාපකං කම්මං-කරිස්සථ කරොථ වා,
න වො දුක්ඛා පමුත්තත්ථි-උප්පච්චාපි පලායතං

127. මත්තෙය්‍යා හොථ පෙත්තෙය්‍යා-කුලෙ ජෙට්ඨාපචායක,
සාමඤ්ඤා හොථ බ්‍රහ්මඤ්ඤා-එවං සග්ගං ගමිස්සථා-ති.

125. තං, එහෙයින්; වො, තොපට; වදාමි, (මම) කියමි; වො, යුෂ්මතුන්ලාට; භද්දං (හොතු) යහපතක් (වේවා); එත්ථ මෙතන්හි; යාවන්තො, යම් පමණ ජනයෝ; සමාගතා, රැස්-වුවෝ වෙත්ද; ආවිවා, ප්‍රකටවශයෙන් හෝ; යදි' ඉදින්; රහොවා, රහසි ගතව හෝ; (නොහොත්) ආවිවා, කායවාක් ප්‍රයොග වශයෙන් ප්‍රකටව හෝ; රහොවා, (අභිද්‍යාදිවශයෙන්) අප්‍රකටව හෝ; පාප කං කම්මං, ලාමකවූ අකුශල කර්මය; මා අකත්ථ, (තොපි) නොකරව්.

Non-commercial distribution

126. සචෙ, ඉදින්; තං පාපකං කම්මං, ඒ ලාමක කර්මයක්; කරිස්සථ, (මතුකාලයෙහි තොපි) කරන්නව් නම්; කරොථවා, දැන් කරව් නම් හෝ; උප්පච්චාපි, අහස නැඟිලා වත්; පලායතං, යන්නාවූ; වො, තොපට; දුක්ඛා, (නිරයාදී) දුකින්; පමුත්ති, මිදී මක් නම්, න අත්ථි, නැත්තේය.

127. මත්තෙයාා හොථ, (තොපි) මවුට ආදර ඇත්තෝ වව්; (හෙවත්) මවුට උපස්ථාන කරන්නෝවව්; පෙත්තෙයාා (හොථ) පියාට ගරු (උවටැන්) කරන්නෝවව්; කුලෙජෙට්ඨ අපචායකා (හොථ), කුලදෙටුවන් පුදන්නෝ වව්; සාමඤ්ඤූ හොථ, මහණුන් පුදන්නෝවව්; බ්‍රහ්මඤ්ඤූ (හොථ), බමුණන් පුදන්නෝ වව්; එවං, මෙසේ කොට; සග්ගං, ස්වර්ගලොකයට ගමිස්සථ ඉති, පැමිණෙන්නව්ය.

මින් සිවුමසකින් මත්තෙහි මාගේ කාලක්‍රියාව වන්නේය, මම එකාන්තයෙන් කටුක වූ දරුණු වූ අවීචි මහා නරකයෙහි වැටෙන්නෙමි.

ඒ නරකය කොන් සතරක් ඇත්තේය, දෙරටු සතරක් ඇත්තේය, කොටස් වශයෙන් ප්‍රමාණකොට බෙදන ලද්දේය, යපවුරකින් වට කරන ලද්දේය, යපියනකින් වසන ලද්දේය.

ඒ නරකයා ගේ පොළවද යකඩින්ම සැදුණේවෙයි තෙජසින් යුත් අග්නිජාලාව සියලු කල්හි හාත්පස යොදුන් සීයක් පැතිර සිටියි.

ඒ නරකයෙහි මම ඉපිද බොහෝ කාලයක් මුළුල්ලෙහි පාප කර්මයා ගේ විපාකවූ දුක් වේදනාව විඳින්නෙමි, එබැවින් මම අතිශයින් තැවෙමි.

එහෙයින් තොපට මම කියමි, යුෂ්මතුන්ලාට යහපතක් වේවා, මෙහි යම් පමණ දෙනෙක් රැස්ව සිටිත්ද ඒ සියල්ලෝ මගේ වචනය අසව්, තොපි ප්‍රකට වශයෙන් හෝ අප්‍රකට වශයෙන් හෝ නොහොත් ප්‍රකට වූ ප්‍රාණඝාතාදී වූ ද මුසාවාදදීවූ ද කායවාක් ප්‍රයොග වශයෙන් හෝ අප්‍රකට වූ විෂම ලොභාදි වශයෙන් හෝ ලාමක වූ අකුශල කර්මයන් නො කරව්.

ඉදින් තෙපි ඒ ලාමක අකුශල කර්මය අනාගතයෙහි කරන්නහු නම් දැන් හෝ කරව් නම් නිරයා දී සිව්අපායෙහි

Non-commercial distribution

හා මිනිසුන් අතරෙහිත් ආයුමදවීම් ආදී වශයෙන් ඒ පාප-කර්මයා ගේ විපාක වූ දුකින් මිදීමෙක් නම් තොපට නැත. අහස්කුස්හී යන්න වුන්ටද මිදීමෙක් නැත්තේමය. මෙතනින් හෝ එතැනින් පිටව යන්නාවූ තොපකරා කර්මය ලුහුබැඳ එන්නේයැයි දැන පහව යන්නාවූද තොපට ඒ අකුශල කර්ම විපාකයෙන් මිදීමක් නැත්තේය. ගතිකාලාදි ප්‍රත්‍යයාන්තර-යන්ගේ එක්වීම ඇතිවූ කල්හි වනාහි විපාකදේමය. මෙම අදහස:-

''න අන්තළික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජතෙ සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතෝ මුඤ්චෙය්‍ය පාපකම්මා''ති.

''අහසෙහි සිටියත් පාපකර්ම විපාකයෙන් මිදීමක් නැත, සමුද්‍ර මධ්‍යයෙහි සිටියත් මිදීමක් නැත, පර්වත ගුහාවකට ඇතුල්වූවත් මිදීමක් නැත. යම් තැනක සිටියේ පාපකර්ම විපාකයෙන් මිදෙන්නේ නම් එබඳු ප්‍රදෙශයක් ලොකයෙහි නැත්තේමය'' යනු මේ ගයින්ද ප්‍රකාශ කටයුතුයි.

තොපි මැණියන්ට හිතැතිව උපස්ථානාදිය කරව්, පියා-ණන්ට උපස්ථාන කරව් කුලදෙටුවන්ට සත්කාර කරව්, ශ්‍රමණයන් පුදන්නෝවව් බාහිතපාපිවූ රහතන් වහන්සේ පුදන්නෝවව්, මෙසේ මා විසින් කියනලද ක්‍රමයෙන් කුසල් කොට දෙව්ලොව උපදින්න හුයයි කීයේය.

ඒ වෙළෙන්දෝ ඔහුගේ කීම අසා උපන් සංවෙග ඇතිව ඒ ප්‍රෙතයාට අනුකම්පා කරමින් භාජනවලින් පැන්ගෙන වුත් ඔහු සයනයකරවා මුඛයෙහි වත්කළාහුය. ඉක්බිති මහ-ජනයා විසින් බොහෝ වේලාවක් වත්කරනලද වතුර ඒ ප්‍රෙතයා ගේ පාපකර්ම බලයෙන් යටිඋගුරට නොබැස්සේය. පිපාසය කොයින් සංසිඳෙන්නේද, ඒ වෙළෙන්දේ ඒ ප්‍රෙතයා ගෙන් ''කිමෙක්ද තොප විසින් කිසියම් ආස්වාසමාත්‍රයක් ලබන ලද්දේදැ''යි විචාළාහුය. හෙතෙම කියනුයේ ''ඉදින් මෙපමණ ජනයන් විසින් මෙපමණ වෙලාවක් මගේ මුවට වත්කරනලද ජලයෙන් එකබින්දුවක් පමණවත් උගුරතුළට ඇතුල්වූයේ නම් මේ ප්‍රෙතයොනියෙන් මිදීමෙක් නොවේවා''යි

Non-commercial distribution

කීය. එකල්හි ඒ වෙළෙන්දෝ එය අසා ඉතාමත් කලකිරුණු සිත්ඇතිව පිපාසය සංසිඳවීමට හැකි කිසියම් උපායෙක් ඇත්තේදැයි ඇසුවාහුය. හෙතෙම කියන්නේ ''මේ පාපකර්මය ක්ෂයවූ කල්හි තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයන් වහන්සේලාට හෝ දන්දුන්කල්හි මට දක්ෂිණාව දෙන්නේ නම් මම මේ ප්‍රෙතාත්මභාවයෙන් මිදෙන්නෙමි''යි කීය. ඒ වෙළෙන්දෝ එබස් අසා සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ එපවත් සැලකොට තිසරණ හා පන්සිල්ද ගෙන බුදුපාමොක් බික්සඟනට සතියක් මුළුල්ලෙහි මහදන්දී ඒ ප්‍රෙතයාහට දක්ෂිණාව දුන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට ගෙන සිව්පිරිසට දහම් දෙසූ සේක. මහජන තෙමේද ලොභාදී මසුරුමල දුරුකොට දනාදී පුණ්‍යක්‍රියායෙහි මනාව ඇලුණේවීය.

(තද මසුරු බැවිහි පිහිටා දනාදි කිසි පිනක් නොකොට පින්කරන ජනයාද වලකාලීමට යම් යම් උපාය යොදමින් වස්තු තෘෂ්ණාවෙහිම ගැලීසිටින ධනවතුන්ට මෙබඳු ධර්ම කථා මහොප කාරවෙයි; එහෙයින් විශෙෂයෙන් ධනවතුන් හා සාමාන්‍යයෙන් කාවිසිනුත් මේ කථාව හා මතු කියන කථාවත් කියවා බලා සිත්හි ධාරණයකොට මතු සිදුවන විපතින් මිදීමට උත්සාහවත් වියයුතු.)

මේ ප්‍රෙතවස්තුදෙශනායෙහි උබ්බරිවර්ගයට ඇතුළත් සත්වෙනි ධනපාල ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

2. 8 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගාන්තර්ගත අටවෙනි චුල්ල සෙට්ඨි ප්‍රෙතවස්තුව කවරහයත්.

සර්ව්ලොකෙක ස්වාමිවූ ශාස්තෘන් වහන්සේ දෙවුරම් වෙහෙර වැඩවසනසේක් චුල්ලසෙට්ඨී නම් ප්‍රෙතයකු අරබයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කරනලදී බරණැස් නුවර වනාහි ශ්‍රද්ධා නැත්තාවූ රත්නත්‍රයෙහි අප්‍රසන්නවූ මසුරුවූ තද මසුරුවූ පුණ්‍ය ක්‍රියාවන්හි ආදර රහිත වූ චුල්ලසෙට්ඨී නම් එක් ගෘහපතියෙක් විය. ඒ තෙම කළුරිය කොට ප්‍රෙතලොකයෙහි උපනි.

Non-commercial distribution

ඔහුගේ කය මස් ලේ නැති ඇට නහර සම් පමණක් ඇත්තේ හිසමුඩුවූ වස්ත්‍ර නැත්තේ විය. ඔහුගේ දියණිවූ අනුලා තොමෝ වනාහි අන්ධකවින්ද රට සැමියා ගේ ගෙයි වසන්නී පියා උදෙසා බ්‍රාහ්මණ යන් වළඳවනු කැමතිව සහල් ආදීවූ දනොපකරණයන් පිළියෙල කළේය. ප්‍රෙතයා ඒ කාරණය දැන ආහාර තෘෂ්ණාවෙන් අහසින් එහි යමින් රජගහනුවරට පැමිණියේය. එකල්හි වනාහි අජාසත් රජතෙමේ දෙව්දත් විසින් මෙහෙයවන ලදුව පියා දිවියෙන් තොරකරවා ඒ විපිළිසර සිතින් හා දුඃස්වප්නයෙනුත් නින්දට නොපැමිණියේ මතුපහයට නැඟුණේ සක්මන් කරමින් ඒ ප්‍රෙතයා අහසින් යනවා දැක

128. නග්ගො කිසො පබ්බජිතොසි හන්තෙ
රත්තිං කුහිං ගච්ඡසි කිස්ස හෙතු,
ආචික්ඛ මෙ තං අපි සක්කුනෙමු
සබ්බෙන චිත්තං පටිපාදයෙ තුව-න්ති

128. හන්තෙ, ස්වාමීනි; නග්ගො, වස්ත්‍ර රහිතවූ; කිසො, කෘශවූ; පබ්බජිතො අසි, පැවිද්දෙක් වූයෙහිද; කිස්සහෙතු, කවර හෙතුවකින්; රත්තිං; රාත්‍රියෙහි; කුහිං ගච්ඡසි, කොහේයේද; තං එකරුණ; මෙ, මට; ආචික්ඛ, කියනු මැනවි; අපි සක්කුනෙමු, හැකිවන්නෙමු නම්; තුවං, නුඹට; සබ්බෙන, සියලු භොගයෙන් හෝ උත්සාහයෙන්; චිත්තං, වස්තුව; පටිපාදයෙ ඉති, සම්පාදනය කරන්නෙමි.

ස්වාමීනි නුඹ වහන්සේ නග්නවූ කෘශ ශරීර ඇති පැවිද්දෙක්ද, කවර හේතුවකින් මේ රාත්‍රියෙහි කොහේ යේද, නුඹ වහන්සේ මේ වඩින කරුණ මට කියනු මැනව. එසේ කිරීමට හැකිවන්නෙමු නම් සියලු භොගයෙන් හෝ උත්සාහයෙන් නුඹ ගේ අදහස් පරිදි වස්තුව සම්පාදනය කරන්නෙමැයි කියා මේ ගාථාවෙන් විචාළේය, මෙසේ රජ විසින් විචාරණ ලද්දවූ ප්‍රෙතතෙම එපවත් කියනුයේ මේ ගාථා තුන කීයේය,

129. බාරාණසි නගරං දූරසුට්ඨං
තත්ථාහං ගහපති අඩ්ඪකො දී නො,
අදතා ගෙධිතමනො ආමිසස්මිං
දුස්සීල්‍යෙන යමවිසයම්හි පත්තො.

Non-commercial distribution

130. සො සූචිකාය කිලමිතො තෙහි
තෙනෙව ඤාතිසු යාමි ආමිස කිඤ්චි හෙතු,
අදනසිලා න ච සද්දහන්ති
දනඵලං හොති පරම්හි ලොකෙ,

131. ධිතා ච මය්හං ලපතෙ අභික්ඛණං
දස්සාමි දනං පිතූනං පිතාමහානං,
උපක්ඛටං පරිවිසයන්ති බ්‍රාහ්මණෙ
යාම්‍යහං අන්ධකවින්දං හොත්තු-න්ති.

129. දුරසුට්ඨං, දුරසිට සොෂකරන ලද්දවූ (හෙවත්) සියලු තන්හි ප්‍රකටවූ; බාරාණසීනගරං, බරණැස් නුවරක් ඇත; තත්ථ, ඒ නගරයෙහි; අහං, මම; අඩ්ඪකො, මහත් සම්පත් ඇති; දීනො, නිහීන සිත් ඇති; අදනා, දන් නොදෙන්නාවූ; ආමිසස්මිං, කාම සැපතෙහි; ගෙධිතමනො, ගිජු සිත් ඇති; ගහපති, ගෘහපතියෙක් වීමි; දුස්සීල්‍යෙන, දුශ්ශීල කර්මයෙන්; යමවිසයං ප්‍රෙත ලොකයට; පත්තො අම්හි, පැමිණියේ වෙමි.

130. සො, ඒ මම; තෙහි, ඒ යථොක්ත පාපකර්ම හෙතු කොට; සූචිකාය, (ඉදිකටුවලින් විදින්නාසේ) සාගින්නෙන්; කිලමිතො, පීඩිතවූයේ වෙමි; තෙන එව, එහෙයින්ම; ආමිස කිඤ්චිහෙතු, කිසි ආහාරයක් ප්‍රාර්ත්ථනා කොට; ඤාතිසු, නෑයන් සමීපයට; යාමි‘ යමි; අදනසීලා, දන්නොදෙන සුල්ලෝ; පරම්හි ලොකෙ, පරලොවදී; දනඵලං හොති, දනයාගේ විපාකවේයයි; න ච සද්දහන්ති, නොම අදහත්.

131. මය්හං, මාගේ; ධිතාව, දියණිතොමෝද: පිතූනං, මව්පියන් උදෙසාද; පිතාමහානං, මුතුන් මීමුතුන් උදෙසාද; දනං දස්සාමි, දන් දෙන්නෙමැයි; අභික්ඛණං, නිතර; ලපතෙ, කියයි; උපක්ඛටං, (දනවස්තු) සජ්ජිතකොට; බ්‍රාහ්මණෙ, බමුණන්; පරිවිසයන්ති, වළඳවන්නී වෙයි· අහං, මම; අන්ධක විඳූං, අන්ධකවින්ද නම් නුවරට; හොත්තුං, කෑමට; යාමි ඉති, යමි.

පින්වත් මහරජ දුරසිටම ගුණකීර්ති වශයෙන් සොෂකරන ලද්දවූ හෙවත් සියලු තන්හි ප්‍රකටවූ බරණැස් නුවරක් ඇත්තේය. මම පෙර එනුවර මහත් සම්පත් ඇති ගෘහපතියෙක් වීමි, හීන සිත් ඇති වීමි, දන්නොදෙන සුලුවූයේ කාම සැපතෙහි ගිජු වූ සිත් ඇත්තෙක් වීමි, තමා විසින් කරනලද දුශ්ශීල කර්මයෙන් ප්‍රෙත ලොකයට පැමිණියෙමි.

Non-commercial distribution

ඒ මම ඒ කියනලද දන්නොදීම් ආදි පාපකම් හෙතුවෙන් ඉදිකටු සමාන සාපිපාසා දෙකින් විඳිනලදුව මිරිකෙමි. (ඒ පව් කම් සිහිකරන්නාවූ ඒ ප්‍රෙතයාහට ඉතාමත් දෙම්නස් උපන. එහෙයින් මෙසේ කියයි) ඒ සාපිපාසා දුක හෙතුකොටගෙන කිසියම් ආහාරයක් ප්‍රාර්ත්ථනා කරමින් නැයන්වෙත යමි. යම් සේ මා සේ දන් නොදෙන සුලුවූ අනික් මිනිස්සුද දන විපාකය එකාන්තයෙන් පරලොවදී පිහිටවේ යයි නො අදහත්ද ඔවුහුත් මාසේම ප්‍රෙතයෝවී මහත් දුක් අනුභව කරත්.

මාගේ දියණිකොමෝ මව්පිය සුලුපිය මහපිය මුතුන් මිමුතුන් උදෙසා දන්දෙන්නෙමැයි කියා නිතර හෝ බොහෝ සේ දනවස්තු සජ්ජිතකොට බමුණන් වළඳවන්නීය. මමත් අන්ධකවින්ද නුවරට කිසිවක් කෑමට යමියි ගාථාතුන කීයේය. මින්පසු:-

132. තමවොච රාජා අනුභවියාන තම්පි
එයාසි බ්‍රිප්පං අහම්පි කරිස්සං පූජං,
ආචික්ඛ මෙ තං යදි අත්ථි හෙතු
සද්ධායිතං හෙතුවචො සුණොමි.

133. තථාති වත්වා අගමාසි තත්ථ
භුඤ්ජිංසු භත්තං න ච පන දක්ඛිණාරහා,
පච්චාගමී රාජගහං පුනාපරං
පාතුරහොසි පුරතො ජනාධිපස්ස.

134. දිස්වාන පෙතං පුනරෙව ආගතං
රාජා අවොච අහම්පි කිං දදාමි,
ආචික්ඛ මෙ තං යදි අත්ථි හෙතු
යෙන තුවං චිරතරං පිණිතො සියා.

132. රාජා, අජාසත් රජතෙම; තං, ඒ ප්‍රෙතයාට; අවොච, (මෙසේ) කීය; තංපි, ඒ දනයද; අනුභවියාන, අනුභවකොට; බ්‍රිප්පං, වහා; එයාසි, එන්නෙහිය; අහම්පි, මමත්; පූජං, පූජාවක්; කරිස්සං, කරන්නෙමි; යදි, ඉදින්; හෙතු අත්ථි, (කිසි) කරුණක් ඇත්නම්; සද්ධායිතං, ඇදහිය යුතු වූ; තං හෙතුවචො, ඒ හෙතු යුක්ත වචනය; මේ, මට; ආචික්ඛ, කියව; සුණොමි, (එය මම) අසමි.

Non-commercial distribution

133. තථා ඉති, එසේයයි; වත්වා. කියා; තත්ථ, ඒ (වළඳවන) තැනට; අගමාසි, ගියේය; භත්තං, බත; භුඤ්ජිංසු, (බමුණෝ) වැළඳුවාහුය; නවපන දක්ඛිණාරහා, දක්ෂිණාර්හයෝ නොමවැළඳුවාහුය; පුන, නැවත; අපරං, අනික්වර; රාජගහං, රජගහනුවරට; පච්චාගමි, පෙරලා ආයේය; ජනාධිපස්ස, රජහුගේ; පුරතෝ, ඉදිරියෙහි; පාතුරහොසි; පහළවිය.

134. රාජා, රජතෙම; පුන එව ආගතං, නැවතද පැමිණියා වූ; පෙතං, ප්‍රෙතයා; දිස්වාන, දැක; අහං; අපි, මමත්; කිං දදාමි, කෙබඳු (දානයක්) දෙන්නෙම් දැයි; අවොච, කීය; යෙන, යම් කරුණකින්; තුවං, නුඹ; චිරතරං, බොහෝ කලක් මුළුල්ලෙහි; පිණිතොසියා, සෑහෙන්නේ වෙයිද; යදි, ඉදින්; හෙතු අත්ථි, කිසි කාරණයක් ඇත්නම්; තං, එය; මෙ, මට; ආචික්ඛ, කියව.

එසේ කියා සිටි ප්‍රෙතයාට අජාසත් රජතෙමේ කියනුයේ තාගේ දියණිය විසින් ඒ පිළියෙළ කරනලද දානයත් අනුභව කොට නැවත මෙහි වහාම එව, මමත් තොප සඳහා පූජාවක් කරන්නෙමි, ඉදින් තොපට දත් ලැබෙන ආකාරයක් ඇත්නම් අසවල් තැනදී අසවල් ප්‍රකාරයට දන්දුන් කල්හි මට ලැබෙයයි කියා ඇදහිය යුතුවූ කරුණු සහිත වචනයක් මට කියව, ඒ කිම මම අසමියි කීය.

එසේ යහපතැයි කියා ප්‍රෙතතෙම ඒ අන්ධකවින්ද නුවර බමුණන් වළඳවන තැනට ගියේය. එහි දුශ්ශීල බ්‍රාහ්මණයෝ රැස්ව ආහාර අනුභව කළාහුය. දක්ෂිණාවට සුදුසුවූ සිල්වත්හු අනුභව නොකළෝය. එහෙයින් ප්‍රෙතතෙම ආහාර නොලබා නැවත තවවරක් රජගහනුවරට පෙරලා ආයේ අජාසත් රජහු ගේ ඉදිරියෙහි පෙනී සිටියේය.

රජතෙම නැවත පෙරලා ආවාවූ ප්‍රෙතයා දැක මමත් තොපට කෙබඳු දානයක් දෙමිද ඉදින් යම්හෙයකින් නුඹ බොහෝ කල් මුළුල්ලෙහි සම්පතින් සතුටුවන්නේද, එබඳු කාරණයක් ඇත්නම් ඒ මට කියවයි කීයේය, එකල්හි ප්‍රෙතතෙම කියනුයේ:-

Non-commercial distribution

135. බුද්ධඤ්ච සංඝං පරිවිසියාන රාජ
අන්නෙන පානෙනපි චීවරෙන,
තං දක්ඛිණං ආදිස මෙ හිතාය
එවං අහං චිරතරං පීණිතො සියා.

136. තතො ච රාජා නිපතිත්ව තාවදෙ
දනං සහත්ථා අතුලං දදිත්වා සංඝෙ,
ආරොචයි පකතිං තථාගතස්ස
තස්ස ච පෙතස්ස දක්ඛිණං ආදිසිත්ථ.

137. සො පූජිතො අතිවිය සොභමානො
පාතුරහොසි පුරතො ජනාධිපස්ස,
යක්ඛොහමස්මි පරමිඩ්ඪිපත්තො
න මය්හමිඩ්ඨමසාදිසා මනුස්සා.

138. පස්සානුභාවං අපරිමිතං මමයිදං
තයානුදිට්ඨං අතුලං දදිත්වා සංඝෙ,
සන්තප්පිතො සතතං සද බහූහි
යාමය්හං සුඛිතො මනුස්සදෙවා-ති.

135. රාජ, (පින්වත්) රජ; බුඩංව, බුදුන්ද; සඞ්ඝං, සඞ්ඝයාද; අන්නෙන, ආහරයෙන්ද; පානෙන අපි, පානවර්ගයන්ද; පරිවිසියාන, වළඳවා; චීවරෙන, සිවුරෙන්ද (පූජාකොට); තං දක්ඛිණං, ඒ පින; මෙ, මට; හිතාය, වැඩ පිණිස; ආදිස, දුන මැනව; එවං, එසේකළ කල්හි; අහං, මම; චිරතරං, බොහෝ කල් මුළුල්ලෙහි; පීණිතො සියා, තෘප්ත වන්නෙමි.

136. තතොව, ඒ වචනයෙන් (නොහොත්) ඒ පහයෙන්: රාජා, රජතෙම; තාවදෙ, එකෙණෙහිම; නිපතිත්ව, නික්ම; අතුලං, උදරවූ (නොහොත්) ප්‍රණීතවූ; දනං, දනය; සහත්ථා, සියතින්; සඞ්ඝෙ, සංඝයාට; දදිත්වා, දී; තථාගතස්ස, තථාගත යන් වහන්සේට; පකතිං, ප්‍රකෘතිය (හෙවත්) ප්‍රවෘත්තිය; ආරොචයි, සැළකළේය; තස්ස පෙතස්සච, ඒ ප්‍රෙතයාහටද; දක්ඛිණං, පින; ආදිසිත්ථ, දුනි.

137. පූජිතො, පුදන ලද්දවූ; සො, ඒ ප්‍රෙතතෙම; අතිවිය ශොභමානො, (දිව්‍යානුභාවයෙන්) ඉතාමත් බබලමින්; ජනාධිපස්ස, රජහුගේ; පුරතො, ඉදිරියෙහි; පාතුරහොසි, පහළවිය;

Non-commercial distribution

අහං, මම; පරමිඩ්පත්තෝ, උත්තමර්ධියට පැමිණියාවූ; යක්ඛෝ අස්මි, යක්ෂ (දෙවි) යෙක් වෙමි; මය්හං, මගේ; ඉඩ්සම සදිසා, ආනුභාව සම්පත්තියෙන් සමව හෝ භොගසම්පත්තියෙන් සදෘශවූ හෝ' මනුස්සා, මනුෂ්‍යයෝ; න හොන්ති, නොවෙත්.

138, මම, මාගේ; අපරිමිතං, අප්‍රමාණවූ; ඉදං ආනුභාවං, මේ දිව්‍යානුභාවය; පස්ස, බලනුමැනව්; තයා, නුඹ විසින්; සඞ්ඝෙ, ආර්‍ය්‍ය සඞ්ඝයාට; අතුලං. මහදන්; දදිත්වා, දී; අනුද්දිවියං, (මට පින්) පමුණුවන ලදී; මනුස්සදෙව, මිනිස්දෙව් වූ (මහරජ); සද, සෑමකල්හි; සතතං, නිරන්තරයෙන්; බහූහි, බොහෝ දනවස්තුවෙන්; සන්තප්පිතෝ, පිනවනලද්දවූ; අහං, මම; සුඛිතෝ, සුවපත්වූයේ; යාමි ඉති, යෙමි.

මහරජ බුදුන් සහිත සංඝයා ආහාරපානයෙන් වළඳවා සිවුරුද පිළිගන්වා ඒ දක්ෂිණාව මට හිත පිණිස දුන මැනව, එසේ ඇති කල්හි මම බෙහෝකල් මුළුල්ලෙහි සැපතින් සතුටු වන්නෙ මැයි කියේය. රජතෙමේ ඒ කීමෙන් පසු නොබොහෝ ඒ පහයෙන් බැස ඒ අරුණෝද්ගමන වේලාවෙහිම සියතින් බුදුන් සහිත සංඝයාට ප්‍රණීත ලෙස දන්දී ස්වාමීනි මේ දනය එක්තරා ප්‍රෙතයෙකු සඳහා මවිසින් දෙනලදැයි එපවත් තථාගතයන් වහන්සේට සැලකළේය. එසේ සැල කොට ඒ ප්‍රෙතයාහට දක්ෂිණාව දුන්නේය.

එවිට ඒ ප්‍රෙතතෙම දක්ෂිණාව දීමෙන් පුදනු ලැබුයේ දිව්‍යානුභාවයෙන් අතිශයින් බබලමින් ජනෙශ්වරවූ රජහුගේ ඉදිරියෙහි පෙනී සිටියේය. මහරජ මම ප්‍රෙතාත්ම භාවයෙන් මිදී දෙවි බවට පැමිණියෙමි. මාගේ ආනුභාව සම්පත්තිය හා සමානවූ හෝ භොග සම්පත්තිය හා සදෘශවූ හෝ ආනුභාව හා සම්පත් ඇති මනුෂ්‍යයෝ නැත්තාහ.

මාගේ මේ අප්‍රමාණ දිව්‍යානුභාවය හා සම්පත් බලනු මැනවැයි කියා තමාගේ සම්පත් ප්‍රත්‍යක්ෂ වශයෙන් රජහට දක්වමින් කියනුයේ නුඹ වහන්සේ විසින් මා කෙරෙහි අනුකම්පාවෙන් ආර්‍ය්‍යසඞ්ඝයාහට මහදන් දී මට දක්ෂිණාව දෙන ලදී. බොහෝවූ ආහාරපාන වස්ත්‍රාදි දියයුතු දනවස්තුවෙන් ආර්‍ය්‍යසඞ්ඝයා සන්තර්පණය කළාවූ නුඹ වහන්සේ විසින් සෑම

Non-commercial distribution

කල්හි ජීවිතාන්තය දක්වා මම නිතර පිනවන ලද්දෙමි. එහෙයින් මිනිස්දෙවිවූ මහ රජ්ජුරුවන් වහන්ස දැන් මම සුවපත්වූයේ කැමති තැනකට යමැයි රජුගෙන් අවසර ගත්තේය.

මෙසේ ප්‍රෙතයා අවසරගෙන ගිය කල්හි අජාසත් රජතෙමේ ඒ කාරණය භික්ෂූන්ට දැන්විය. භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ සැලකළාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට ගෙන පැමිණි පිරිසට ධර්මදෙශනා කළ සේක. ඒ ධර්මය අසා මහජන තෙමේ මසුරුමලය පහකොට දානාදි පුණ්‍ය ක්‍රියායෙහි යෙදුණේය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගීයට ඇතුළත් අටවෙනි චුල්ලසෙට්ඨී ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

2. 9 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගාන්තර්ගත නවවෙනි **අඩ්කුර ප්‍රෙතවස්තුව** කවරහයත්.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සේක් අඩ්කුර ප්‍රෙතයා අරබයා මේ ප්‍රෙතවස්තුව දෙශනාකළ සේක. මෙහි අඩ්කුරතෙම එකාන්තයෙන් ප්‍රෙතයෙක් නොවෙයි. යම් හෙයකින් ඔහුගේ චරිතය වනාහී ප්‍රෙතයන් හා සම්බන්ධයට ගියේද, එහෙයින් අඩ්කුර ප්‍රෙත වස්තුවයයි කියන ලදී. එහි මේ සංක්ෂෙප කථාව වන්නීය:-

උත්තරමධුරා නුවරට අධිපතිවූ මහාසාගර රජහුගේ පුත්‍රවූ උපසාගර කුමරු නිසා උත්තරාපථයෙහි කංසභොගයෙහිවූ අසිතඤ්ජන නම් නුවර මහාකංස රජහුගේ දියණි වූ දෙවගර්භා නම් දෙවිය කුස උපන් අඤ්ජන දෙවිය, වාසුදෙවය, බලදෙවය, චන්ද දෙවය, සුරියදෙවය, අග්ගිදෙවය, වරුණදෙවය, අජ්ජුනය, පජ්ජුනය, ඝතපණ්ඩිතය, අඩ්කුරය කියා වාසුදෙවයා ආදිකොට යම් ඒ දසබෑයන් හා අඤ්ජනදෙවී සමග එකොළොස් ක්ෂත්‍රිය කෙනෙක් වූහුද, ඔවුනතුරෙන් වාසුදෙවයා ආදිකොට ඇති සොහොයුරෝ අසිතඤ්ජන නුවර ආදිකොට වාරවතී නුවර අවසන්කොට සියලු දඹදිව තෙසැට දහසක් නුවරවල සියලු රජුන් චක්‍රයෙන් හෙවත් සමූහබලයෙන් ජීවිතක්ෂයට පමුණුවා

Non-commercial distribution

වාරවතී නුවර වසමින් රාජ්‍යය දසකොටසක්කොට බෙදුවාහුය. සොහොයුරී වූ අඤ්ජන දෙවිය සිහිනොකළාහුය. නැවත සිහිවී ''කොටස් එකොළසක් කරමු''යයි කී කල්හි ඔවුනතුරෙන් සියල්ලටම බාලවූ අඩිකුර තෙමේ ''මාගේ කොටස ඇට දෙව්, මම වෙළඳුම්කොට ජීවත්වන්නෙමි, තොපි තම තමාගේ ජනපදවල සුංකම් මට හරිවිය''යි කීය. ඔවුහු මැනවයි පිළිගෙන ඔහුගේ කොටස සහෝදරියට දී රජහු නවදෙන වාරවතී නුවර විසුවාහුය. අඩිකුර තෙම වෙළඳුම් කරමින් නිතර මහදන් දෙයි. ඒ අඩිකුරයා ගේ භාණ්ඩාගාරිකවූ වැඩ කැමැති එක් දාසයෙක් විය. අඩිකුරතෙම ඔහු කෙරෙහි පහන්සිත් ඇතිව ඕහට එක් කුලදුවක් ගෙනැවිත් දුනි. ඒ දාසතෙම පුතෙකු ගැබට පැමිණි කල්හිම කළුරිය කෙළේය. අඩිකුර තෙම ඒ පුතු උපන් කල්හි ඔහුගේ පියාට දුන් බත් වැටුප් ඒ පුතුට දුන්නේය. නවැත ඒ දරුවා වැඩිවිය පැමිණි කල්හි මේ තෙම දාසයෙක් වේද දාසයෙක් නොවේදැයි රජකුලයෙහි විනිශ්චයක් උපන. එය අසා අඤ්ජන දෙවිතොමෝ දෙනෙකු උපමා කොට මව් සැමිදුවක් බැවින් පුත්‍රයාද ස්වාමියෙක්මයයි කියා දාස භාවයෙන් මිදවිය. දරුතෙම වනාහි ලජ්ජාවෙන් එහි විසීමට නොහැකිව හෙරුව නගරයට ගොස් එක්තරා සන්නාලියෙකු ගේ දියණියක් සරණකොටගෙන සන්නාලි ශිල්පයෙන් ජීවිකාව කෙළේය. එකල්හි හෙරුව නුවර අසය්හ නම් මහසිටුකෙනෙක් විය. ඒ සිටුතෙම මහණ බමුණන්ට හා දුගී මගී වණිබබක යාචක ජනයාටත් මහදන් දෙයි. ඒ සන්නාලි තැනැත්තේ සිටාණන්ගේ ගෙදර නොදන්නාවුන්ට ප්‍රීති සොමනස් ඇතිව අසය්හ සිටුහුගේ ගෙදර දකුණු අත දිහුකර ''මෙතනට ගොස් ලැබිය යුතු දෙයක් ලබා ගනිත්වා''යි පෙන්විය. ඔහුගේ කමය පාලියෙහිම ආයේය. ඒ තෙමේ මෑත කාලෙක කළුරිය කොට වාළකාකාන්තාරයක එක්තරා නුගරුකෙක්හි භූම්‍යස්ථ දෙවතාවක්ව උපන්නේය. ඔහුගේ දකුණු අත කැමති සම්පත් දෙන්නේ විය. එම හෙරුව නගරයෙහි අසය්හ සිටුහුගේ දානයෙහි ව්‍යාපෘතවූ ශ්‍රද්ධා රහිතවූ අප්‍රසන්නවූ මිත්ථ්‍යාදෘෂ්ටිකවූ පුණ්‍ය ක්‍රියායෙහි ආදර සිත් නැති එක්තරා පුරුෂයෙක් කළුරියකොට ඒ දෙවිපුත් වසන තැනට නුදුරු තන්හී ප්‍රේතයෙක්ව උපන. ඔහු විසින් කරන ලද කමීයද පාලියෙහිම ආයේය. අසය්හ මහසිටුතෙම වනාහි කාලක්‍රියාකොට තවුතිසා දෙවිලොව සක් දෙවිරජුගේ එකීභාවය (එකතුබව)ට පැමිණියේය.

Non-commercial distribution

ඉක්බිති පසුකලෙක අඩිකුරතෙමේ පන්සියක් ගැලින් හා තවත් බමුණෙක් පන්සීයක් ගැලින්දැයි දෙදෙනා ගැල් දහසකින් බඩුගෙන වාළුකාකාන්තාරයට පිළිපන්නේ මංමුළාව බොහෝ දවසක් එහිම හැසිරෙමින් ක්‍ෂයවූ තණ හා වතුර හා ආහාර ඇත්තෝ වූවාහුය. අඩිකුරතෙම ඔහුගේ දූතයන් ලවා සිවිදිග පැන් සොයවා බැලීය. එකල්හි ඒ කැමති සම්පත් දෙන අත් ඇති දෙවිතෙම ඔවුන්ට ඒ පැමිණි විපත දැක අඩිකුරයා විසින් පෙර තමන්ට කරන ලද උපකාරය සඳහන් කොට එකාන්තයෙන් මේ වේලාවට මොහුට මා විසින් පිහිට විය යුතුයයි සලකා තමන් වසන නුගරුක දැක්වීය. ඒ නුගරුකවනාහි අතුපතරින් යුක්තය. සතුවූ පත්‍ර ඇති ගස සෙවන ඇති නොයෙක් දහස් ගණන් ප්‍රරොහ ඇත්තේය. දිගින් හා පුළුලින්ද උසින්ද යොදුනක් පමණ විය. ඒ දැක අඩිකුරතෙම තුටුපහටුව ඒ ගහයට කඳවුර බැන්දවිය. දෙවිතෙමේ තමාගේ දකුණු අත දිහුකොට පළමු කොට පැනෙන් සියලු ජනයා සතප්පවාලීය. ඉන්පසු යම් යම් දේ කැමතිවේද ඒ ඒ අයට ඒ ඒ දේ දුන්නේය. මෙසේ ඒ මහජනයා නොයෙක් වැදැරුම් ආහාරපානාදියෙන් කැමැතිසේ සන්තර්පණයකොට මංවිඩා සන්සිඳුන කල්හි ඒ බමුණු වෙළඳ තෙමේ නුනුවණින් කල්පනා කරමින් මෙසේ සිතුවේය. ධනලාභය සඳහා මෙතැනසිට කාම්බොජයට ගොස් අපි කුමක් කරන්නෙමුද, මේ දෙවියාම වනාහි යම් කිසි උපායකින් ගෙන යානාවට නංවාගනා අපගේ නුවරටම යන්නෙමු යයි සිතිය මෙසේ සිතා ඒ කාරණය අඩිකුරයාහට කියන්නේ:-

139. **යස්ස අත්ථාය ගච්ඡාම-කම්බොජං ධනහාරකා,**
අයං කාම දදෙ යක්ඛො-ඉමං යක්ඛං නියාමසෙ.

140. **ඉමං යක්ඛං ගහෙත්වාන-සාධුකෙන පසය්හවා,**
යානං ආරොපයිත්වාන-බ්‍රිප්පං ගච්ඡාම චාරක''න්ති.

139. ධනහාරකා, (බඩු විකිණීමෙන් ලත්) ධනය හැර ගෙනෙන්නාවූ (අපි); යස්ය අත්ථාය, යම් කරුණක් පිණිස; කම්බොජං, කාම්බොජරටට; ගච්ඡාම, යමුද; අයං යක්ඛො, මේ දෙවිපුත් තෙම; කාමදදෙ, කැමති සම්පත් දෙන්නේ වෙයි; ඉමං යක්ඛං, මේ දිව්‍ය පුත්‍රයා; නීයාමසෙ, ගෙනයන්නෙමු.

Non-commercial distribution

140. ඉමං යක්ඛං, මේ දෙවියා; සාධුකෙන, යාච්ඤකිරී මෙන් හෝ; පසය්හ වා, මැඩ බලාත්කාරයෙන් හෝ; ගහෙත්-වාන, අල්වාගෙන; යානං, සැප යහනකට; ආරොපයිත්වාන, නංවාගෙන; වාරකං, වාරවතී නුවරට; ඛිප්පං, වහා; ගච්ඡාම ඉති, යමු.

අපි යම් කරුණක් සඳහා මෙතන සිට කම්බොජ රටට යනු කැමැතිවෙමුද ඒ ගමනෙන් සිදුකටයුතු වැඩ මෙහිදී සිදුවෙයි. මේ දෙවිතෙමේ ද කැමැති කැමැති සම්පත් දෙන්නෙක, එහෙයින් මේ දෙවියා යාච්ඤ කොට ඔහුගේ කැමැත්තෙන් හෝ ඉදින් කැමැත්තෙන් නොයානම් බලාත්කාරයෙන් හෝ යානාවට නංවා යානාවෙහි දෙයත් පස්සට හරවා ඔහු බැඳගෙන මෙයින් වහා වාරවතී නුවරට යමුයයි කීයේය. බ්‍රාහ්මණයා විසින් එසේ කියන ලද්දවූ අඩිකුරතෙමේ සත්පුරුෂ ධර්මයෙහි පිහිටා සිට ඔහුගේ කීම ප්‍රතික්ෂප කරමින්:-

141. **යස්ස රුක්ඛස්ස ඡායාය-නිසීදෙය්‍ය සයෙය්‍ය වා,**
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය-මිත්තදුබ්භෝ හි පාපකෝ-ති

141. යස්සරුක්ඛස්ස, යම් රුකක්හුගේ; ඡායාය, සෙවෙනෙහි; නිසීදෙය්‍ය, හිඳිනේ හෝ; සයෙය්‍යවා, හෝනේ හෝ වේද; තස්ස, ඒ රුකගේ; සාඛං, අත්ත; නභඤ්ජෙය්‍ය, නොබිඳින්නේය; හි, යම් හෙයකින්; මිත්තදුබ්භෝ, මිත්‍රද්‍රෝහය; පාපකෝ, ලාමක වේද; එහෙයිනි.

යම් ගසෙක සෙවනයට යමෙක් හුන්නේය හෝ සයනය කෙළේ හෝ වේද හෙතෙම ඒ ගහේ අතු නොබිඳින්නේය, බින්දේ නම් ලාමක වූ මිත්‍රද්‍රෝහියෙක් වේමය, යම් සිහිල් සෙවන ඇති රුකක් ග්‍රීෂ්මයෙන් පීඩිතවූ පුද්ගලයාගේ විඩා දුරුකරන්නේවේද, ඒ රුකට පවා නපුරක් නොසිතියයුතුය, සඤයන් කෙරෙහි නපුරක් සිතීම ගැන කියනුම කවරේද, මේ දිව්‍යපුත්‍ර තෙමේද සත්පුරුෂයෙක, පෙරාතුව උපකාර කරන්නෙක, අප ගේ දුක් දුරුකළ කෙනෙක, අපට බොහෝ උපකාර ඇත්තෙක, ඔහට කිසි අවැඩක් නොසිතිය යුතුය, එකාන්තයෙන් ඒ දෙවි තෙම පිදිය යුත්තේමයයි දැක්වීය. බමුණා ඒ කීම අසා ''අර්ථයා ගේ මූලය විනයතෙම කනී''යි කියන නීතිමඬගලය නිසා අඩිකුර යාහට විරුඬපක්‍ෂයෙහි සිට:-

Non-commercial distribution

142. **යස්ස රුක්ඛස්ස ඡායාය-නිසිදෙය්‍ය සයෙය්‍ය වා,**
බන්ධම්පි තස්ස ජින්දෙය්‍ය-අත්ථෝ වෙ තාදිසෝ සියාති

442. වෙ, ඉදින්; තාදිසෝ, එබඳුවූ; අත්ථෝසියා, ප්‍රයොජනයක් වේනම්; තස්ස, ඒ රුකගේ; බන්ධම්පි, කඳපවා; ජිනේදය්‍ය ඉති, කපන්නේය; (සෙස්ස යට කියන ලදි. මෙබඳු අනික් තන්හිද මෙසේමැයි.)

පින්වත් අඩකුරය, යම් ගසක්හුගේ සෙවනෙහි හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේද එබඳු දැව සම්භාරයකින් ඉදින් ප්‍රයොජනයක් වෙනම් ඒ වෘක්ෂයාගේ කඳපවාකපා ගන්නේයඇතු ආදිය ගැන කියනුම කවරේදැයි කීයේය. මෙසේ බ්‍රාහ්මණයා විසින් කියනලදුව අඩකුරතෙම සත්පුරුෂ ධර්ම පිළිගනිමින් කියන්නේ:-

143. **යස්ස රුක්ඛස්ස ඡායාය-නිසිදෙය්‍ය සයෙය්‍ය වා,**
න තස්ස පත්තං හින්දෙය්‍ය-මිත්තදුබ්භෝ හි පාපකොති

143. තස්ස, ඒ වෘක්ෂයා ගේ; පත්තං, පත්‍ර; නහින්දෙය්‍ය, නොකඩන්නේය.

බ්‍රාහ්මණය, යම් ගසෙක සෙවනයට හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේද, ඒ ගහේ කොළපතක් පමණවත් නොකඩන්නේය, ශාඛාදිය කැඩීම ගැන කියනුම කවරේද එසේ සින්දේනම් ලාමක මිත්‍රද්‍රොහියෙක් වන්නේමයයි කීයේය. නැවතත් බමුණා තමන්ගේ වාදය ගන්වමින්:-

144. **යස්ස රුක්ඛස්ස ඡායාය-නිසිදෙය්‍ය සයෙය්‍යවා,**
සමූලම්පි තං අබ්බූහෙය්‍ය-අත්රේථා වෙ තාදිසෝ සියා-ති

144. සමූලම්පි, මුලුත් සමගම; තං ඒ රුක; අබ්බූහෙය්‍යා උදුරන්නේය.

පින්වත් අඩකුරය, යමෙක් යම් ගසක සෙවනේ හිඳින්නේ හෝ නිදන්නේ හෝ වේද එබඳු ලී වලින් ප්‍රයෝජනයක් ඇතිවී නම් ඒ ගස සහ මුලින්ම උපුටා ගන්නේයයි කීය. මෙසේ බමුණා විසින් කී කල්හි නැවත අඩකුර තෙම ඒ කීම නිරර්ථක කරනු කැමැතිව:-

Non-commercial distribution

145. යස්සෙකරත්තිම්පි සරෙ වසෙය්‍ය
යත්ථන්නපානං පුරිසො ලභෙථ,
න තස්ස පාපං මනසාපි චෙතයෙ
කතඤ්ඤුතා සප්පුරිසෙහි වණ්ණිතා.

146. යස්සෙකරත්තිම්පි සරෙ වසෙය්‍ය
අන්නෙන පානෙන උපට්ඨිතො සියා,
න තස්ස පාපං මනසාපි චෙතයෙ
අදුබ්භපාණි දහතෙ මිත්තදූහිං.

147. යො පුබ්බෙ කතකල්‍යාණො-පච්ඡා පාපෙන හිංසති,
අල්ලපාණිහතො පොසො-න සො භද්‍රානි පස්සති-ති.

145. පුරිසො; කිසිපුරුෂයෙක් තෙම; යස්ස, යමෙකු ගේ; සරෙ, ගෙයි; එකරත්තිම්පි, එකරැයක් පමණවත්; වසෙය්‍ය, වසන්නේද; යත්ථ, යමෙකු සමීපයෙහිදී; අන්නපානං, අහාරපානවර්ග; ලභෙථ, ලබන්නේද; තස්ස, ඒ පුරුෂයාහට; මනසාපි, සිතින්වත්; පාපං, නපුරක්; නචෙතයෙ, නොසිතන්නේය; සප්පුරිසෙහි, (බුඩාදි) උත්තම පුරුෂයන් විසින්; කතඤ්ඤුතා, කෘතඥතාව; වණ්ණිතා, පසස්නාලදී.

146. යස්ස, යමෙකුගේ; සරෙ, ගෘහයෙහි; එකරත්තිම්පි, එක රැයක් පමණවත්; වසෙය්‍ය, යමෙක් වාසය කරන්නේද; අන්නෙන, ආහාරයෙන් හා; පානෙන, පානවර්ගයෙන්; උපට්ඨිතොසියා, උපස්ථාන කෙළේදෙ; තස්ස, ඔහට, මනසාපි, සිතින්වත්; පාපං, අයහ පතක්; නචෙතයෙ, නොසිතන්නේය; අදුබ්භපාණි, අහිංසක අත් ඇති පුද්ගලතෙම; මිත්තදූහිං, මිත්‍රද්‍රොහියා; දහතෙ, දවයි.

147. යො, යම් පුද්ගලයෙක් තෙම; පුබ්බෙ, පෙරකාලයෙහි; කතකල්‍යාණො, කරනලද යහපත (උපකාර) ඇත්තේ; පච්ඡා; පසුකලෙක; පාපෙන, නපුරකින්; හිංසති, පෙළාද; අල්ලපාණි හතො, උපකාර කරණුයෙහි දෝනාලද අත්ඇත්තෙකු විසින් නසනලද (නොහොත්) අකෘතඥවූ; සොපොසො ඒ පුරුෂතෙම; භද්‍රානි, යහපත; න පස්සති ඉති, නොදකී.

යම් පුද්ගලයෙකු ගේ ගෙයි ය්මකිසි පුරුෂයෙක් එක් රැයක් පමණවත් විසූයේ නම් යමෙකු සමීපයෙහි දී ආහාරපාන හෝ යම්කිසි භොජනයක් හෝ ලැබුවේ නම් ඒ උපකාර කළ

Non-commercial distribution

පුද්ගලයාහට සිතින් පවා නපුරක් නොසිතන්නේය. කයින් වචසින් නපුරක් නොකටයුතු බව කියනුම කිම? කුමක් හෙයින්ද යත්, කළ උපකාර සැලකීම නම් බුඩාදි ශ්‍රේෂ්ඨ පුරුෂයන් විසින් වණ්ණනා කරන ලදී. එහෙයිනැයි දතයුතු.

යමෙකු ගේ ගෘහයෙහි එක් රැයක් නමුදු විසුවේද මේ දේ ගනුව මෙය වළඳවයි කියා ආහාරපානාදියෙන් යමෙකු විසින් උපස්ථාන කරන ලද්දේද, ඒ උපකාර ස්වාමියාහට සත්පුරුෂ තෙමේ සිතින්වත් අයහපතක් නොසිතන්නේය. කයින් වචසින් අයහපතක් නොකටයුතු බව කියනුම කවරේද එසේ අයහපතක් කළේ නම් අහිංසක හස්තය තෙමේ ඒ මිත්‍රද්‍රොහී පුද්ගලයා විනාශ කෙරෙයි. වැඩ පසස්නා අදහසින් යුත් පුද්ගලයා කෙරෙහි අනිකෙකු විසින් කරනලද අපරාධය අවිශෙෂයෙන් ඕහටම අවැඩ ගෙන දෙන්නේ වේ. දුෂ්‍ය නුවූ පුද්ගල තෙමේ අර්ත්ථ වශයෙන් ඒ නපුරුදේ කරන අය වසන්නේ නම් වෙයි, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදළසේක්:-

''යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඩිගණස්ස
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො''ති.

තරහ නැත්තාවූ ක්ලෙශාඩිගණයන් දුරුකළාවූ පිරිසිදු සිත් ඇති පුරුෂොත්තමයෙකුට යම් කෙනෙක් නපුරක් කෙරේද ඒ නපුර ඒ අඥනයාටම විපාකදේ, කෙසේද යත්- උඩුසුළඟට දැමූ සියුම් රජස යටිසුළඟ කරා පැමිණෙන්නාක් මෙනි.

පළමුකොට කිසි සත්පුරුෂයෙකු විසින් කරනලද උපකාර ඇති යම් පුද්ගලයෙක් තෙමේ පසුව ඒ උපකාරකළ අයට නපුරු අදහසින් පීඩාකෙරේද, උපකාර ක්‍රියායෙහි පිරිසිදු අත් ඇති පුරුෂයා විසින් යටකියන ලද නයින් නසනලද්දවූ ඒ අකෘතඥ පුද්ගල තෙමේ මේ ලොව හෝ පරලොවද යහපතක් නො ලබා යයි කීයේය.

මෙසේ සත්පුරුෂ ධර්මයට රුකුල් දීමෙන් අඩිකුරයා විසින් මැඩපවත්වා කියන ලද ඒ බමුණා නිරුත්තරව. නිශ්ශබ්ද විය. දෙවි තෙමේ ඔවුන් දෙදෙනාගේ වදන් පිළිවදන් අසා බ්‍රාහ්මණ

Non-commercial distribution

යාහට කිපී ''එසේ වේවා මේ දුෂ්ට බ්‍රාහ්මණයාහට කටයුතුදේ පසුව දන්නෙමැ''යි සිතා තමා කිසිවෙකු විසින් මැඩපැවැත්විය නොහැකි බවද පළමුකොට දක්වමින්:–

148. **නාහං දෙවෙන වා මනුස්සෙන වා**
ඉස්සරියෙන වාහං න සුප්පසය්හො,
යක්ඛොහමස්මි පරමිද්ධිපත්තො
දූරඩ්ගමො වණ්ණබලූපපන්නො–ති.

148, අහං, මම; දෙවෙනවා, (යම්කිසි) දෙවියෙකු විසින් හෝ; මනුස්සෙන වා, මිනිසකු විසින් හෝ; නසුප්පසය්හො, අතිශයින් මැඩපැවැත්විය නොහැකිවෙමි; ඉස්සරියෙන වා, දිව්‍ය මනුෂ්‍යෛශ්වර්‍යයකින් හෝ; නසුප්පසය්හො, මැඩලිය නොහැක්කේ වෙමි; හං, (නොඉවසිමෙහි) හුං; අහං, මම; පරමිඩි පත්තො, උත්තමර්ඩියට පැමිණි; යක්ඛො අස්මි, යක්‍ෂයෙක් වෙමි; දූරඩ්ගමො, (සැණෙකින්ම) දුරද යන්නේ වෙමි; වණ්ණ බලූපපන්නො ඉති, රූපසම්පත්තියෙන් හා ශරීර ශක්තියෙන් යුක්තවූයේ වෙමි.

මම යම්කිසි දෙවියෙකු විසින් හෝ යම්කිසි මිනිසෙකු විසින් හෝ චාතුර්මහාරාජික ශක්‍ර සුයාමාදීන් ගේ දිව්‍ය සෘඩිය කින් හෝ චක්‍රවර්ත්ති ආදීන්ගේ පුණ්‍ය සෘඩියකින් හෝ මැඩ පැවැත්විය නොහැක්කේ වෙමි, (මෙහි ''ඉස්සරිය'' ශබ්දයෙන් මහානුභාව සම්පන්න දිව්‍ය මනුෂ්‍යයන් සංග්‍රහ කෙරෙයි, දෙවියෝ මහානුභාවයෝමය, තමන් ගේ පුණ්‍යඵලයෙන් රුකුල් ලැබූ මිනිසුන් පවා ප්‍රයොග විපත්තියක් නැති කල්හි මැඩ පවත්වන්ට නොහැකි වෙත්. අන් දෙවියන් පිළිබඳ කියනුම කවරේද) තමන් ගේ පින වශයෙන් මම දෙවි බවට පැමිණියේ වෙමි. දෙව්වූයේද එසේ මෙසේ දෙවියෙක් නොවෙමි. යලිදු උතුම් දිව්‍ය සෘඩියට පැමිණියේ වෙමි, සැණෙකින්ම දුරකැනකට යාමට පුලුවන්වෙමි. රූප සම්පත්තියෙන් හා ශරීර ශක්ති යෙන්ද යුක්තවෙමි, (''පරමිඩිපත්තො, දූරඩ්ගමො, වණ්ණ බලූපපන්නො'' යන මේ පද තුනෙන් මන්ත්‍රප්‍රයොගාදියකින් තමන් මැඩලිය නොහැකි බවම දක්වයි, රූපසම්පත්තියෙන් යුත් තැනැත්තේ අනුන් විසින් බුහුමන් කරන ලද්දේවේ, රූප සම්පත්තිය නිසා විසභාගවස්තූන් හාද ආකුල විය යුතු නොවේ,

Non-commercial distribution

රූපසම්පත් නියද යටපත්කොටලිය නොහැකි බවට කරුණක් යයි කියනලදී.) මින්පසු අඩිකුරයා හා දිව්‍ය පුත්‍රයා අතරත් වචන ප්‍රතිවචන වශයෙන් පැවති ගාථාවෝ පසළොසක් වෙති.

149. පාණි තෙ සබ්බසොවණ්ණෝ-පඤ්චධාරෝ මධුස්සවෝ,
නානා රසා පග්ඝරන්ති-මඤ්ඤෙහං තං පුරින්දද-න්ති.

150. නම්හි දෙවෝ න ගන්ධබ්බෝ-න පි සක්කෝ පුරින්දදෙ,
පෙතං මං අඩිකුර ජානාහි-හෙරුවම්හා ඉධාගතං.

151. කිං සිලෝ කිං සමාචාරෝ-හෙරුවස්මිං පුරෙ තුවං,
කෙන තෙ බ්‍රහ්මචරියෙන-පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති.

152. තුන්නවායෝ පුරෙ ආසිං-හෙරුවස්මිං තදා අහං,
සුකිච්ඡවුත්ති කපණෝ-න මෙ විජ්ජති දාතවෙ.

153. ආවෙසනඤ්ච මෙ ආසි-අසය්හස්ස උපන්තිකෙ,
සද්ධස්ස දානපතිනෝ-කතපුඤ්ඤස්ස ලජ්ජිනෝ

154. තත්ථ යාචනකායන්ති-නානාගොත්තා වණිබ්බකා,
තෙ ච මං තත්ථ පුච්ඡන්ති-අසය්හස්ස නිවෙසනං.

155. කත්ථ ගච්ඡාම භද්දං වෝ-කත්ථ දානං පදීයතෙ,
තෙසාහං පුටයෝ වක්ඛාමි-අසය්හස්ස නිවෙසනං.

156. පග්ගය්හ දක්ඛිණං බාහුං-එත්ථ ගච්ඡථ භද්දං වෝ,
එත්ථ දානං පදීයතෙ-අසය්හස්ස නිවෙසනෙ.

149. තෙ, යුෂ්මතුන්ගේ; පාණි, දකුණත; සබ්බසොවණ්ණෝ, හැමලෙසින් රන්වන්වෙයි; මධුස්සවෝ, මිහිරි රස වැහෙන්නාවූ; පඤ්චධාරෝ, ධාරාපසක් ඇත්තේය (හෙවත්) ඇඟිලි පසින් කැමතිවනලද සම්පත් වැගිරෙන්නේවෙයි; නානා රසා, නන්වැදෑරුම් රසයෝ; පග්ඝරන්ති, වැගිරෙත්; තං, නුඹ; පුරින්දදං ඉති, ශක්‍රයායයි; අහං, මම; මඤ්ඤෙ, සිතමි.

150. දෙවෝ, ප්‍රකට දෙවියෙක්; න අම්හි, නොවෙමි ගන්ධබ්බෝ න, ගන්ධර්ව්‍යකායික දෙවියෙක්ද නොවෙමි; පුරින්දදෙ, (පෙරදන්දුන්හෙයින්) පුරින්දද නමිවූ; නඝිසකෙකා. ශක්‍රදෙවෙන්ද්‍ර යෙක්ද නොවෙමි; අඩිකුර, පින්වත් අඩිකුරය; හෙරුවම්හා, හෙරුවනුවරින් (චුතව): ඉධ, මෙහි; ආගතං, (උත්පත්ති වශයෙන්) පැමිණියා වූ; පෙතං, ප්‍රෙතයෙකැයි; මං, මා; ජානාහි, දනුව.

Non-commercial distribution

151. තුවං, නුඹ; පුරෙ; පෙර අත්බැව්හි; හෙරුවස්මිං, හෙරුව නගරයෙහිදී; කිං සීලො, කෙබඳු සිලඇත්තෙක්වීද; කිං සමාචාරො, කෙබඳු සමාචාර ඇත්තෙක් වූයේද; කෙන බ්‍රහ්මචරියෙන, කෙබඳු ශ්‍රේෂ්ඨචාර්‍යවක් හෙතුකොට; තෙ, යුෂ්මතුන්ගේ; පාණිම්හි, අත්හි; පුඤ්ඤං, පුණ්‍යඵලය; ඉජ්ඣති, දැන් නිපදීද,

152. තදෘ පුරෙ, පෙර එකල්හි; අහං, මම; හෙරුවස්මිං හෙරුව නුවර; තුන්නවායො අස්මිං, සන්නාලියෙක්වීමි; සුකිච්ඡ වුත්ති, ඉතා දුකසේ දිවිපැවැත්ම ඇති; කපණො, බැගෑපත් කෙනෙක්වීමි; දතවෙ, දන්දීමට; මේ, මට; නවිජ්ජති, (කිසිවක්) නැත,

153. සද්ධස්ස, කම්ඵල විශ්වාසයෙන් යුක්තවූ; දතපතිනො, දන්දීමෙහි ස්වාමිවූ; කතපුඤ්ඤස්ස, පෙරකරනලද පින් ඇති; ලජ්ජීනො, පාපයට පිළිකුල් කරන සුලුවූ; අසය්හස්ස, අසය්හ සිටුහු ගේ; උපන්තිකෙ, (ගෙය) සමීපයෙහි; මෙ, මාගේ; ආවෙසනංච ආසි, ගෙය හෝ කම්ාන්තශාලාවද විය.

154. තත්ථ, එතනට; නානාගොත්තා, නොයෙක් ගොත්‍ර ඇති; යාචනකා, යාචකජනයෝද; වණිබ්බකා, ගුණකියා ඉල්වන්නෝද; ආයන්ති, පැමිණෙත්; තෙව, ඔවුහු; අසය්හස්ස, අසය්හ සිටුහුගේ; නිවෙසනං, ගෘහය; මං පුච්ඡන්ති, මා විචාරත්.

155. වො, නුඹට: භද්දං, යහපතක් වේවා: දනං, දනය; කත්ථ, කොතන්හි; පදීයතෙ, දෙනු ලැබෙද; කත්ථ, කොතැන්හි, ගච්ඡාම, (අපි) යමුද; තෙසං, ඔවුන් විසින්; පුට්ඨො, විචාණ ලද්දවූ; අහං, මම; අසය්හස්ස, අසය්හ සිටුහුගේ; නිවෙසනං, ගෘහය; වක්ඛාමි, කියමි.

156. අසය්හස්ස, අසය්හ සිටුහුගේ; එත්ථ නිවෙසනෙ, මේ නිවෙස්හි; දනං පදීයතෙ, දන්දෙනු ලැබේ: එත්ථ, මෙතනට; ගච්ඡථ, යව්; වො, යුෂ්මතුන්ට; භද්දං, සෙතක්(වේයයි); දක්ඛිණං බාහුං, දකුණත; පග්ගය්හ, දිහුකොට; (කීවෙමි)

එම්බා දිව්‍යපුත්‍රය, තොපගේ දකුණු අත සත්කාරයෙන් සුවණ්ණ වණ්ණවෙයි. ඇඟිලි පසින් අනුන් කැමතිවනලද සම්පත් වහනයවෙයි මිහිරි කටුක කසටාදි ප්‍රභෙද ඇති නොයෙක් වැදෑ

Non-commercial distribution

රුම් රස වැගිරෙයි, අතවැහරු කල්හි මිහිරි රසාදියෙන් සමන් විත විචිත්‍ර ඛාද්‍ය භෝජ්‍යයන් කැමැතිසේ හෙන බැවින් තොප මහානුභාව සක්දෙවි රජයයි මම සිතමියි කීයේය.

එකල්හි දිව්‍ය පුත්‍රයා කියන්නේ පින්වත් අඩකුරය මම වෛශ්‍රවණාදි ප්‍රකට දෙවියෙක් හෝ නොවෙමි, ගන්ධර්ඛා-යිකදෙවියෙක් හෝ නොවෙමි. පෙර අත්බැව්හි නුවරක් පාසා දන් දුන් බැවින් පුරින්දදයයි ලද නම් ඇති සක්දෙව් රජද නොවෙමි, මම කවරෙක්දයත්, හෙරුව නුවරින් චුතව මේ වාළුකාකාන්තාරයෙහි මේ නුගරුකට උත්පත්ති වශයෙන් පැමිණි මහත් සෘඩි ඇති එක්තරා ප්‍රෙතයෙකැයි මා දැනගනු වයි කීයේය.

එවිට අඩකුර තෙමේ විචාරන්නේ එම්බා දිව්‍යපුත්‍රය පෙර අත්බැව්හි හෙරුව නගරයෙහි වසන්නාවූ නුඹ පවින් වැලකීම ලක්ෂණකොට ඇති කෙබඳු ශීලයක් සමාදන් වූයේද, ප්‍රාප්ති පුණ්‍යක්‍රියා ලක්ෂණකොට ඇති කවර සමාචාර ඇත්තෙක් වූයේ ද, නොහොත් දානාදී කුශල සමාචාරයන් අතරෙන් කෙබඳු සමාචාරයක් ඇත්තේවීද කවර නම් ශ්‍රේෂ්ඨචාරිත්‍රවක් හෙතු කොට ගෙන තොපගේ අත්වල මෙබඳු පින්පල නුපදීද එය කියවයි කීය.

එකල්හි මම පෙර හෙරුව නුවර සන්නාලියෙක් වීමි, ඉතා දුකසේ දිවිපැවැතුම් ඇත්තේවීමි, දිළින්දෙක් වීමි, මගී ජනයාට හා මහණ බමුණන්ට දියයුතු කිසි දානවස්තුවක් මට නැතිවිය, මගේ සිතින් වනාහි දන්දෙනලදී මගේ ගෙය නොහොත් කර්මාන්ත ශාලාවද කර්මඵල විශ්වාසයෙන් ශ්‍රද්ධාවත්වූ දීමෙහි නිතර පැවැති පරිත්‍යාග සම්පත්තියෙන් හා ලොභ සිත මැඩපැවැත්වීමෙන්ද ස්වාමිවූ පෙර කරනලද සුචරිත කර්ම ඇති පවට පිළිකුල් කරන ස්වභාව ඇති අසය්හ මහසිටුහුගේ ගෙදර සමීපයෙහි විය.

ඒ මාගේ ගෙදරට අසය්හ සිටාණන්ගෙන් කිසිවක් ඉල්වා ගනු කැමැති නානාවිධ ගොත්‍ර ඇති යාචක ජනයෝද දයක යාගේ හා පුණ්‍යඵලාදීන්ගේත් ගුණකීම් ආදී වශයෙන් තමන් ගේ යාචක භාවය ප්‍රකාශකරන්නෝද පැමිණෙත්, ඒ පැමිණි යාචකාදීහු අසය්හ සිටාණන්ගේ ගෘහය මගෙන් විචාරත්,

Non-commercial distribution

නුඹට යහපතක් වේවා! අපි අසය්හ මහසිටුහු විසින් දන් දෙනු ලැබෙයයි අසා ආවෝවෙමු, කොතන්හි දනය දෙනු ලැබෙද, කොතන්හි ගියකල්හි ඒ දනය ලැබිය හැකිදැයි මෙසේ ඒ මාර්ගික ජනයා විසින් ලබන තැන් විචාරනු ලැබූ මම පෙර පින්නොකළ බැවින් මේ කාලයෙහි මෙබඳු ජනයාහට කිසිවක් දෙන්ට පොහොසත් නොවීමි. මොවුන්ට දන්දෙන කැන පෙන්වමින් දනවස්තු ලැබීමට උපාය කීමෙන් ප්‍රීති උපදවා ගැනීමෙන් මෙපමණකින්වත් බොහෝ පින් රැස්කර ගනිමියි. සිතා ආදර බැව් උපදවා දකුණත දිහුකොට ඔවුන්ට අසය්හ සිටාණන්ගේ ගෙදර කීවෙමි.

අසය්හ සිටාණන්ගේ මේ ගෙදර ගෙදර දන්දෙනු ලැබේ. මෙතනට තොපි යව්, එසේ ගියවිට නුඹලාට යහපතක් වේයයි කීවෙමි.

157. තෙන පාණි කාමදදෙ-තෙන පාණි මධුස්සවෙ,
තෙන මෙ බ්‍රහ්මචරියෙන-පුඤ්ඤං පාණිමිහි ඉජ්ඣති.

158. න කිරත්වං අද දනං-සකපාණිහි කස්සචි,
පරස්ස දනං අනුමොදමානො-පාණිං පග්ගය්හ පාවදි.

159. *තෙන පාණි කාමදදෙ-තෙන පාණි මධුස්සවෙ,
තෙන තෙ බ්‍රහ්මචරියෙන-පුඤ්ඤං පාණිමිහි ඉජ්ඣතී.

160. යො සො දනමද හන්තෙ-පසනනො සකපාණිහි,
සො හිත්වා මානුසං දෙහං-කින්නුසො දීසතං ගතො.

161. නාහං පජානාමි අසය්හසාහිනො
අඩ්ඩගීරසස්ස ගතිං ආගතිං වා,
සුතඤ්ච මෙ වෙස්සවණස්ස සන්තිකෙ
සක්කස්ස සහව්‍යතං ගතො අසය්හො.

162. අලමෙව කාතුං කල්‍යාණං-දනං දතුං යථාරහං,
පාණිං කාම ඉදං දිස්වා-කො පුඤ්ඤං න කරිස්සති,

163. සො හි නූන ඉතො ගන්ත්වා-අනුප්පත්වාන චාරකං,
දනං පටියපයිස්සාමි-යං මමස්ස සුඛාවහං.

164. දස්සාමි අන්තං පානඤ්ච-වත්ථසෙනාසනානි ච,
පඤ්ච උදපානඤ්ච-දුග්ගෙ සඞ්කමනානි චා''ති.

Non-commercial distribution

157. තෙන, ඒ හෙතුවෙන්; පාණි, අත; කාමදදෙ, දැන් කැමැති කැමැති සම්පත් දෙන්නේවෙයි; තෙන, ඒ හෙතුකොට; පාණි, හස්තය; මධුස්සවො, මිහිරිරස වැහෙන්නේවෙයි; තෙන බ්‍රහ්මචරියෙන, ඒ උතුම් හැසිරීම් හෙතුවෙන්; මෙ, මාගේ; පාණිම්හි, අතෙහි; පුඤ්ඤං, පුණ්‍යවිපාකය; ඉජ්ඣති, පහළවෙයි,

158. ත්වං, නුඹ; කස්සචි, කිසිවෙකුට; සකපාණිහි, සියතින්; න අදා කිර, නුදුන්ල; පරස්ස, අනිකෙකුගේ; දනං, දනය; අනු මොදමානො, අනුමොදන් වෙමින්; පාණිපග්ගය්හ, අත දිගු කොට; පාවදී, කීයේල.

160. භන්තෙ, පින්වත; යො සො, යම් ඒ අසය්හ නම් සිටු කෙනෙක්; පසන්නො, පහන්සිත් ඇතිව; සකපාණිහි, සියතින්; දනං අදා, මහදන් දුන්නේද; සො, හෙතෙම; මානුසං දෙහං, මිනිසත්බව; හිත්වා, හැරපියා; කින්නුසො දිසතං, කෙබදු තැන කට; ගතො, ගියේද;

161. අසය්හ සාහිනො, නොඉවසිය හැක්ක ඉවසන්නාවූ; අංගිරසස්ස, ශරීරයෙන් නික්මෙන රස්මි ඇති අසය්හ සිටුහුගේ; ගති, උත්පත්ති ගමන හෝ; ආගතිංවා, (මෙහි) නැවත පැමිණීම හෝ; අහං, මම; නපජානාමි, නොදනිමි; ච, වැළි; අසය්හො, අසය්හ සිටුතෙමේ; සක්කස්ස, ශක්‍රයාගේ; සභව්‍යතං, එකීභාවයට;ගතො, පැමිණියේ යයි; වෙස්සවණස්ස, වෛශ්‍රවණ මහරජුගේ; සන්තිකෙ, හමුවෙහිදී; මෙ, මා විසින්; සුතං, අසනලදී.

162. කල්‍යාණං, යහපත; කාතුං, කිරීමට; අලංඑව, සුදුසු මය; යථාරහං, සුදුසු පරිද්දෙන්; (නොහොත්) සම්පත්ඵල පරිද්දෙන්; දනං, දනය; දතුං, දීමට; අලමෙව, සුදුසුමය; කාමදදං, කැමැති සම්පත් දෙන; පාණිං, අත; දිස්වා, දැක; කො, කවරෙක් නම්; පුඤ්ඤං නාකරිස්සති, පින් නොකරන්නේද;

163. භි, ඒ එසේ මැයි; සො, ඒ මම; ඉතො, මේ වාලුකා කාන්තාරයෙන්; ගන්ත්වා, පහවගොස්; වාරකං, වාරවතී නුවරට; අනුප්පත්වාන, නැවත පැමිණ; යං, යම් පිනක්; මම, මට; සුඛා වහං අස්ස, සැප ඵලවන්නේද; දනං, දනය; නූනපටිඅපයිස්සාමි, ඵලවා තබන්නෙමි.

Non-commercial distribution

164. අන්නං, ආහාරද, පානංච, පානවරීද; වත්ථසෙනාස නානීච, වස්ත්‍ර හා සෙනසුන්ද; දස්සාමි, දෙන්නෙමි; පපඤ්ච, පැන්හල්ද; උදපානංච, ලිංද; දුග්ගෙ, දුර්ගමස්ථානයෙහි; සඞ්කමනානීච ඉති, හේදඬුද (පිහිටුවන්නෙමි.)

ඒ අනුන් ගේ දනය ප්‍රකාශ කිරීමෙන් අනුන් විසින් කරන ලද දනය සකස්කොට අනුමෝදන්වීම් හෙතුවෙන් මේ කාලයෙහි මගේ අත කප්රුකක් මෙන්ද කල්පලතාවක් මෙන්ද කැමැති කැමැති සම්පත් දෙන්නේ වෙයි. ඒ කුශලය හෙතු කොට ගෙන මගේ අතින් කැමැති වස්ත්‍ර වැහෙන්නේ වෙයි. ඒ මගේ ශ්‍රේෂ්ඨ චෙතනාහෙතුවෙන් අත්හි පින්පල පහළවේයයි කීය.

එකල අඩිකුරතෙම කියන්නේ පින්වත් දිව්‍ය පුත්‍රය, නුඹ මහණ බමුණන්ට හෝ කිසිවෙක් හට තමාසතු කිසි දනවස්තුවක් සියතින් නුදුන්නේලු හුදෙක් වනාහි අනුන් විසින් කරන ලද අනුන්ගේ දනය ඉතා යහපත මහදන් පවතීයයි සිතා අනුමෝදන්වීමෙන්ම දකුණත දිහුකොට දන්දෙන තැන යාචකාදීන්ට කීයේල.

ඒ කුශලය හෙතුකොටගෙන තොපගේ හස්තය කැමැති කැමැති සම්පත් උපදවයි. ඒ කුශලය හෙතුකොට ගෙන යුෂ්මතුන්ගේ හස්තයෙන් නානාවිධ මිහිරි රස වැහෙයි. අනුන්ගේ දනානුමෝදනාවෙන් යාචකාදීන්ට දන්සැල දක්වාලු ඒ ශ්‍රේෂ්ඨ චෙතනාකුශලය හෙතුකොටගෙන නුඹගේ හස්තයෙහි මෙබදු පින්පල පහළවෙයි. පුණ්‍යස්වභාවය එකාන්තයෙන් ඉතා ආශ්චර්‍ය වේයයි කීය.

තවද පින්වතුන් වහන්ස අනුන් විසින් පවත්වන ලද දනය අනුමොදන්වූ නුඹ වහන්සේට පළමුකොට මෙබඳු විපාකයක් මෙබඳු ආනුභාවයක් වේනම් යම් ඒ අසය්හ මහසිටු නම් කෙනෙක් පහන්සිත් ඇතිව සියතින් මහදන් දුන්නේද ඒ සිටුතෙමේ මෙලොව මිනිසත් බව හැර කොතනකට ගියේද, ඒ අසය්හ සිටුහුගේ පරලොව ගමන කෙබඳුවීදැයි විවාළේය.

එකල දෙවිපුත් කියනුයේ පින්වත් අඩිකුරය, ලොභයෙන් මඩනාලද මසුරු සිත් ඇත්තවුන් විසින් ඉවසිය නොහැකිවූ දන පරිත්‍යාගාදි විභාග ඇති සත්පුරුෂ ධර්මය ඉසුලුවාවූ

Non-commercial distribution

තමාවෙත පැමිණි යාචකයන් දැක මහත් ප්‍රීති සොම්නස් උපදවා විශෙෂයෙන් පැහදුන මුහුණ ඇතිව සිටි හෙයින් ශරීරයෙන් නික්මෙන රස්මි ඇති ඒ අසය්හ සිටාණන්ගේ උත්පත්ති ගමන මෙනම් යයි කියා හෝ අසවල් කාලයෙහි මෙහි නැවත පැමිණෙන්නේයයි කියා හෝ මම නොදනිමි මේ කාරණය මට අවිසයවූ එකකි. එකකුදු වුවත් අසය්හ සිටු-තෙමේ සක්දෙව්රජහට එකතුව තව්තිසා දෙව්ලොව උපනැයි යන මේ කාරණය උපසථානයට පැමිණි මාවිසින් වෙසමුණු මහරජහුගේ සමීපයෙහිදී අසනලදැයි කීයේය.

එකල අඩකුරතෙම කියන්නේ පින්වත් දිව්‍යපුත්‍රය, පුණ්‍ය ක්‍රියා කිරීම යුතුමය, තම සම්පත් ඇති පරිද්දෙන් දන්දීම යුතු මය, අනුන් කළපින අනුමෝදන්වීම පෙරදුරිකොට දානපතියාගේ ගෙදරට යන මග කියාලු පමණින් කැමැති කැමති සම්පත් පහළවන අත් ඇති මේ දිව්‍යරාජවූ තො දක්නාවූ මාවැනි කවරෙක් නම් තමහට පිහිටවූ පින් නොකරන්නේද, මෙසේ අනියම් වසයෙන් පුණ්‍යක්‍රියායෙහි ආදර දක්වා දැන් තමා කෙරෙහි ඒ පින නියමකොට දක්වන්නාවූ අඩකුර තෙමේ කියන්නේ.

ඒ මම මේ වාළකා කාන්තාරයෙන් ගොස් චාරවතී නුවරට පැමිණ දන් පවත්වන්නෙමි, යම් දානයක් මට පරලොවදී සැප ඵලවන්නේද, එබඳුවූ ආහාරපාන වඊ හා වස්ත්‍ර සෙනාසනයන්ද දෙන්නෙමි. පැන්ශාලා හා ලින්ද යා නොහැකි තැන්වල ඒදඹු පාලම්ද තනවමියි කීය.

මෙසේ අඩකුරයා විසින් දන්දෙන්නෙමැයි කියා දැන්වූ කල්හි දෙවිතෙමේ සතුටු සිත් ඇතිව කියනුයේ නිදුකාණෙනි, නුඹ නිසැකව දන්දෙව, මම තොපට යහලුව කටයුතු කරන්-නෙමි යම්හෙයකින් නුඹගේ දානවස්තු ක්ෂයවීමට නොයන්නේද එපරිද්දෙන් කරන්නෙමියි කියා ඔහු දානක්‍රියායෙහි මනාව උත්සාහ ගන්වා නැවත බමුණාට කියනුයේ ''එම්බල බමුණු දෙළෙන්ද තෝ වනාහි මාවැන්නෙකු බලාත්කාරයෙන් ගැලට නංවාගන යනු කැමැතිවූයේ තමාගේ ප්‍රමාණය නොදන්-නෙහිදැ''යි කියා ඔහුගේ බඩු අතුරුදන් කරවා යක්ෂ විහිංසනයෙන් පීඩා කරවා ඔහු බියගැන්වීය. එකල්හි අඩකුර

Non-commercial distribution

තෙම ඒ දෙවියා නානාප්‍රකාරයෙන් යාච්ඤාකොට බ්‍රාහ්මණයා ලවා සමා කරවමින් පහදවා සියලු බඩු ප්‍රකෘතිමත් කරවා රාත්‍රිය පැමිණිවිට දෙවියා හැරයන්නේ ඔහුට නුදුරු තැනක සිටි ඉතා බියකරු දැකුම් ඇති එක්තරා ප්‍රෙතයෙකු දැක ඒ ප්‍රෙතයා විසින් කරනලද කර්මය විචාරන්නේ:-

165. කෙන තෙ අඞ්ගුලි කුණ්ඨා-මුඛඤ්ච කුණ්ඩලී කතං
අක්ඛිනි ච පග්ඝරන්ති-කිං පාපං පකතං තයා-ති.

165. ප: කෙන, කවර හෙතුවකින්; තෙ, තොපගේ; අඞ්ගුලී, ඇඟිලි; කුණ්ඨා, කුණුව වකුටු වීද; මුඛංච, මුහුණද; කුණ්ඩලී-කතං, කොඩොල් කෙළේද (නොහොත්) මුඛවිකාරයෙන් හැකුළුණේ වීද; අක්ඛිනිච, පග්ඝරන්ති, අශ්‍රූ වගුරත්; තයා, තාවිසින්; කිංපාපං, කෙබඳු පවක්; පකතං ඉති, කරන ලද්දේද.

භා: කවර හෙතුවකින් තොපගේ ඇඟිලි කුණුවී වකුටු වීද මුහුණද හැකිලි විකාර වත් වීද ඇස්වලින් අශ්‍රුවියයි කියන ලද කඹ වැගිරෙද්ද, මෙසේ වීමට නුඹ විසින් කිනම් පාප කර්මයක් කරන ලදදැයි ඇසීය. එකල්හි ඒ වෙළඳුට ප්‍රෙත තෙම කියනුයේ:-

166. අඞ්ගීරසස්ස ගහපතිනො-සද්ධස්ස සරමෙසිනො,
තස්සාහං දනවිස්සග්ගෙ-දනෙ අධිකතො අහුං.

167. තත්ථ යාචනකෙ දිස්වා-ආගතෙ හොජනත්ථිකෙ,
එකමන්තං අපක්කම්ම-අකාසිං කුණ්ඩලී මුඛං.

168. තෙන මෙ අංගුලී කුණ්ඨා-මුඛඤ්ච කුණ්ඩලීකතං,
අක්ඛිනිපි පග්ඝරන්ති-තං පාපං පකතං මයා-ති.

166. ප: අඞ්ගීරසස්ස, සිරුරෙන් රැස් විහිදුණාවූ; ගහපතිනො, ගෘහපතියෙක්වූ; සරං එසිනො, ගෘහවාසීවූ; තස්ස, ඒ අසය්හ සිටුහුගේ; දනවිස්සග්ගෙ, දනාග්‍රයෙහි (හෙවත්) දන්දෙන තැන; දඝන, දන්දීමෙහි; අහං, මම; අධිකතො අහුං, අධිකාරියෙක් කරන ලද්දේ වීමි.

167. තත්ථ, එහි; හොජනත්ථිකෙ, ආහාරයෙන් ප්‍රයෝජන ඇතිව; ආගතෙ, පැමිණියාවූ; යාචනකෙ, යාචකයන්; දිස්වා, දැක; එකමන්තං, එකත් පසෙක; අපක්කම්ම, ඉවත් වී; කුණ්ඩලී මුඛං, මුව හකුලුවා ගැනීම; අකාසිං, කෙළෙමි.

Non-commercial distribution

168. තෙන, එහෙයින්; මෙ, මාගේ; අංගුලි, ඇඟිලි; කුණ්ඨා, (කුණුව) වකුටු වූහ; (සෙස්ස යට කියනලද පරිදිසි.)

හා: ශරීරයෙන් නික්මෙන කාන්ති ඇති ගෘහපතියෙක්වූ ශ්‍රද්ධාවත්වූ ගෘහයෙහි වාසය කළාවූ ඒ අසය්හ සිටුහුගේ දනාග්‍රයෙහි දන වස්තු දන් දීමෙහි මම අධිකාරියෙක් හෙවත් ප්‍රධානයෙකු කොට තබන ලද්දේ වූයෙමි.

ඒ දනාග්‍රයට ආහාර සොයා පැමිණි යාචකයන් දැක දනයෙහි ව්‍යාපෘත වූවහු විසින් දන් දෙන තැනින් බැහැර නොගොස් සුදුසු තැනම සිට උපන් ප්‍රීති සෞමනස්‍යයෙන් යෙදී ප්‍රසන්න මුඛවර්ණයෙන් යුක්තව ස්වහස්තයෙන් දනය දියයුතුය, අනුන් ලවා හෝ සුදුසු පිළිවෙළින් දෙවිය යුතුය, මම වනාහි එසේ නොකොට යාචකයන් එනවා දුරදීම දැක තමන් නොපෙනී එකත්පසක ඉවත්වී සිට මුහුණ හකුළුවා ගතිමි.

යම්හෙයකින් එකල මම ස්වාමියා විසින් දනාධිකාරී කෘත්‍යයෙහි යොදන ලද්දේ දන් දෙන කාලය එළඹ සිටි කල්හි මසුරු සිතින් මඩනා ලදුව දනාග්‍රයෙන් ඉවත් වෙමින් පා හකුළුවාගන සිටියෙමිද, සියතින් දියයුතු දනය එසේ නොකොට අත් හකුලුවාගන සිටියෙමිද, ප්‍රසන්න මුඛයෙන් යුක්ත වියයුතු තන්හි මුහුණ හකුලුවා ගත්තෙමිද, සිය ඇසින් බැලියයුතු දනයෙහිදි ඇස්වල කළුබව ඉපදවීමිද, එහෙයින් මගේ අත ඇඟිලිද පා ඇඟිලිද වකුටු වූවාහුය, මුහුණද හැකිලි විරූප ස්වභාව ඇත්තේ විය. ඇස්වලින්ද අශුචි මෙන් දුගඳින් පිළිකුල්වූ කඳුලු වැගිරෙත්. එහෙයින් කියනලදී,

තෙන මේ අංගුලී කුණ්ඨා-මුඛඤ්ච කුණ්ඩලිකතං,
අක්ඛීනි ච පග්ඝරන්ති-කං පාපං පකතං මයා-ති.

එපවත් අඩකුර තෙමේ අසා ප්‍රෙතයාට ගරහමින්:-

169. ධම්මෙන ඉත කාපුරිය- මුඛඤ්ච කුණ්ඩලිකතං,
අක්ඛීති ච පග්ඝරන්ති-යං ත්වං පරස්ස දනස්ස
අකාසි කුණ්ඩලිමුඛ-නති

169. ප: කාපුරිස, නිඳිත පුරුෂය; ඣං, තෝ; යං, යම් හෙයකින්; පරස්ස, අනුන්ගේ; දනස්ස, දනයෙහි; කුණ්ඩලි මුඛංච, මුව හකුලුවා ගැනීම; අකාසි, කෙළෙහිද; ධම්මෙන, (එහෙයින්) යුතුවූම කරුණෙන්; තෙ, තාගේ; මුඛඤ්ච, මුහුණද; කුණ්ඩලීකතං, හැකිලගියේ කරනලදි; අක්ඛීනිච, ඇස්ද; පග්ඝරන්ති ඉති, අශුචි වගුරත්ය;

Non-commercial distribution

ලාමක පුරුෂයතෝ යම්හෙයකින් අනුන්ගේ දනයෙහි ලොභසිතින් මුහුණ හකුලුවා ගැනීම කෙළෙහිද එහෙයින් නිසි වූම කාරණයෙන් තාගේ මුහුණද හැකිළුණුවක් කරනලදී. ඇස් වලින්ද අශුචි වැහෙත්යයි කියේය. නැවත අඩිකුරතෙම දන පති වූ ඒ සිටාණන්හට නිදුකරමින්:-

170. **කථඤ්හි දනං දදමානො-කරෙය්‍ය පරපත්තියං,**
අන්නපානං ඛාදනීයං-වත්ථසෙනාසනානි චා-ති.

170. අන්නපානං, ආහාරපානද; ඛාදනීයං, කෑයුතුදෑද; වත්ථසෙනාසනානිව, වත් හා සෙනසුන්ද; (යන) දනං, දනය; දදමානො. දෙන්නාවූ පුරුෂතෙමේ; පරපත්තියං, අනුන් විසින් සිදුකළ යුත්තක් කොට; කථංහි කරෙය්‍ය, කෙසේ නම් කරන්නේද.

දන්දෙන පුරුෂතෙම ආහාරපාන ඛාද්‍ය වස්ත්‍ර සෙනාසන යන් දීම කෙසේ නම් අනුන්ලවා සිදුකරවන්නේද තමා විසින් බලාම සියතින් දියයුතු වන්නේය. තෙමේම ඒ දනයෙහි ව්‍යාපෘත වන්නේය, අන්පරිද්දකින් වීනම් තමාගේ දනවස්තුව නිකරුණේ විනාශ වන්නේය, දක්ෂිණාර්හයෝ වනාහි සාදුකින් පෙළෙන්නාහු යයි කීය. මෙසේ ඒ සිටාණන්ට ගර්හාකොට දැන් තමා පිළිපැදිය යුතු විධිය දක්වමින් ගාථා දෙකක් කියයි.

171. ***සො හි නූන ඉතො ගන්ත්වා-අනුප්පත්වාන චාරකං,**
දනං පටියපයිස්සාමි-යං මමස්ස සුඛාවහං.

172. ***දස්සාමන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානිච,**
පපඤ්ච උදපානඤ්ච-දුග්ගෙ වඩ්කමණානි චා-ති.

ඒ මම මෙයින් ගොස් චාරවති නුවරට පැමිණ දන් පවත් වන්නෙමි. යම් දනක් මට පරලොවදී සැප ඵලවන්නේවේද එබඳු ආහාරපානයන් හා වස්ත්‍ර සෙනාසනයන්ද දෙන්නෙමි. පැන් හල් හා පැන් පොකුණුද තනවමින් දුගීමස්ථානයන්හි ඒදඬු පාලම්ද තනවමියි කීයේය.

173. **තතො හි සො නිවතතිත්වා-අනුප්පත්වාන චාරකං,**
දනං පටියපයි අංකුරො-යං කුමස්ස සුඛාවහං.

174. **අදූ අන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානි ච,**
පපඤ්ච උදපානඤ්ච-විප්පසන්නෙන චෙතසා.

Non-commercial distribution

175. කො ඡාතො කො ච තසිතො-කො වත්ථං පරිවස්සති,
කස්ස සන්තානි යොග්ගානි-ඉතොයොජෙන්තු වාහනං.

176. කො ඡත්තිච්ඡති ගන්ධඤ්ච-කො මාලං කො උපාහනං,
ඉතිස්සු තත්ථ සොසෙන්ති-කප්පකා සූද මාගධා,
සද සායඤ්ච පාතො ච-අංකුරස්ස නිවෙසනෙ-ති.

මේ ගාථා සතර අඩකුරයාගේ ප්‍රතිපත්ති දැක්වීමට සංගීති කාරක මහාසථවිරයන් විසින් කියනලදහ.

173. සො අඩකුරො, ඒ අඩකුරතෙම; තතොහි, ඒ මරු කතරින්; නිවත්තිත්වා, නික්මී. වාරකං, වාරවති නුවරට; අනුප්පත්වාන, පැමිණ; යං, යම් දනයක්; තුමස්ස, තමහට; සුඛාවහං, සැප ඵලවන්නේද; දනං, ඒ දනය; පටියපයි, පිහිට විය.

174, විප්පසන්නෙන චෙතසා, පහන් සිතින්; අන්නංච, ආහාරද; පානංච, පානවගීද, වත්ථසෙනාසනානිච, වස්ත්‍ර හා සෙනසුන්ද; අද, දුනි; පපංච, පැන්හල්ද; උදපානංච, ලිංද; (පිහිටවී)

175. කො කවරෙක්; ඡාතො, සාගිනි ඇත්තේද; කො ච, කවරෙක්; තසිතො, පිපාසා ඇත්තේද; කො, කවරෙක්, වත්ථං, වස්ත්‍ර; පරිවස්සති, වැළඳ ගන්නේද; කස්ස, කවරෙකුගේ; යොග්ගානි, රථයුගවාහනයෝ; සන්තානි, විඩාවට පැමිණියෝ වෙද්ද; ඉතො, මේ වාහන සමූහයෙන්; වාහනං, රුචි වාහන යක්; යො ජෙන්තු, යොදත්වා.

176. කො, කවරෙක් තෙම; ඡත්තං, කුඩ; ඉච්ඡති, කැමතිවේද; කො, කවරෙක්තෙම; ගන්ධංච, සුවඳද; මාලං, මල්මාලාද (කැමැතිද); කො, කවරෙක්; උපාහනං, වහන (කැමැතිද); ඉතිස්සු, මෙසේ වනාහි; තත්ථ අඩකුරස්ස නිවෙසනෙ, ඒ අඩකුරයාගේ නිවෙසෙහි; කප්පකා, කපුවෝද; සූද, අරක්කැමියෝද; මාගධා; සුවඳ දෙන්නෝද; සද, සෑමකල්හි; සායඤ්ච, සවසද; පාතොච, උදයද; සොසෙන්ති ඉති, සොෂා කෙරෙත්ය.

දෙවියා විසින් පුරවනලද සියලු කොටු ගෙවල් ඇති ඒ අඩකුර තෙම ඒ වාළුකා කාන්තාරයෙන් නික්ම ගොස් වාරවති

Non-commercial distribution

නුවරට පැමිණ යම් දානයක් තමහට මෙලොව හා පරලොවත් සැප උපදවන්නේද එබඳු සියලුම ධානාදි උපකරණ ඇති මහා දානය පැවැත්විය ආහාරපාන වගීද වස්ත්‍ර හා සෙනසුන්ද පැන් හල් හා ලිංද විශෙෂයෙන් ප්‍රසන්න සිතින් කරවා දුන්නේය.

කවරෙක් සාදුකින් පිඩිත වූයේද හෙතෙම අවුත් රුචිවූ පරිද්දෙන් ආහාර අනුභව කෙරේවා, කවරක් පිපාසා ඇත්තේද, කවරෙක් වස්ත්‍ර කැමැත්තේද, කවරෙකු ගේ රියයුග වාහනයෝ විඩාවට පැමිණියාහුද, ඒ හැමදෙනම අවුත් පානවගී පානය කෙරේවා, වස්ත්‍ර හැරගෙන අඳීවා, මේ රථ සමූහයෙන් රුචිපරිදි වාහනයක් හැරගෙන රථයුග වාහනයන් යොදු ගනිත්වා.

කවරෙක් කිළඤ්ජවිජත්‍රාදි හෙද ඇති කුඩ කැමැතිවේද ඒ තෙම කුඩ ගනීවා, කොකුම් යොන්පුප් තුවරලා තුරුක්තෙල් යන සිව්දෑගඳ ආදි සුවඳ වගී කැමැත්තේද හෙතෙම කැමැති සේ සුගන්ධ ජාති ගනීවා, ගෙතූ නොගෙතූ මල් කැමැත්තේ මල් මාලා හැර ගනීවා, බල්ලබඩාදි විශෙෂ ඇති වහන්සඟල් කැමැති වන්නේ එය ගනීවා, මෙසේ වස්ත්‍රදෙන කපුවෝද ආහාරදෙන අරක්කැමියෝද සුවඳදෙන ජනයෝද අඩිකුරයාගේ ඒ දානශාලා වෙහි සෑමදම උදය සවස සොඹා කෙරෙත්.

මෙසේ මහදන් පවත්වන්නාවූ අඩිකුරයා ගේ දානශාලාව කල් යත් යත් යාචකයන් තෘප්තියට පැමිණි හෙයින් යාචක ජනයාගෙන් හිස්විය. දන්සැල හිස්වූවා දැක අඩිකුරතෙම දීමෙහි උදර අදහස් ඇති බැවින් නොසතුටු සිත් ඇතිව තමාගේ දාන ක්‍රියායෙහි යෙදී සිටි සින්ධක නම් මාණවකයා කැඳවා කියන්නේ:–

177. සුඛං සුපති අංකුරෝ–ඉති ජානාති මං ජනෝ,
දුක්ඛං සුපාමි සින්ධක–යං න පස්සාමි යාචකෙ.

178. සුඛං සුපති අංකුරෝ–ඉති ජනාති මං ජනෝ,
දුක්ඛං සුපාමි සින්ධක–අප්පකෙ සු වණිබ්බකෙ–ති.

177. අඩිකුරෝ, අඩිකුර රජතෙම; සුඛං, සුවසේ; සුපති ඉති, සයනය කෙරේයයි; ජනෝ, ජන තෙමේ; මං ජානාති, මා දනියි; සින්ධක, සින්ධකය; යං, යම්හෙයකින්; යාචකෙ, යාචකයන්; න පස්සාමි, (මම) නොදක්නෙමිද (එහෙයින්); දුක්ඛං, දුකසේ; සුපාමි, (මම) නිදමි.

Non-commercial distribution

178. සින්ධක, සින්ධකය; අප්පකෙ, ස්වල්පවූ; සුවණිබබකෙ, ගුණකියා ඉල්වන ජනයා ඇති කල්හි වනාහි; දුක්ඛං සුපාමි ඉති, දුකසේ සයනය කරමි. (සෙස්ස යටකියන ලදී)

සින්ධකය අඩකුර රජතෙමේ කිර්ත්තියෙන් හා භොග සම්පත්තියෙනුත් සම්පූර්ණව දනපතියෙක්ව තම භොග සම්පත්තියෙන් හා දනසම්පත්තියෙන් යුක්තව සුවසේම නිදගනියි. සුවසේ පුබුදීයයි කියා ජනයා මාගැන සලකයි. යම්හෙයකින් මාගේ අදහසට අනුරූප වූ දනවසතු පිළිගන්නා බොහෝ වූ යාචකයන් නොදක්නෙමිද එහෙයින් මම වනාහි දුකසේම නිදොපගතවෙමි, දුකසේ පුබුදිමි. සින්ධකය එසේ දන්සැලෙහි වණිබබක ජනයා හෙවත් ගුණකියා ඉල්වන ජනයා ස්වල්ප දෙනෙකු ඇති කල්හි මම දුකසේ නිදමි, දුකසේ පුබුදිමියි කියා ගාථාවය කීය. එකී බස් අසා සින්ධක තෙම ඒ අඩකුරයාගේ උදර දනාධ්‍යාශය අතිශයින් ප්‍රකට කරනු කැමතිව මේ ගාථාව කීයේය:–

179. සක්කො වෙ තෙ වරං දජ්ජා-තාවතිංසානමිස්සරො,
කිස්ස සබ්බස්ස ලොකස්ස-වරමානො වරං වරෙ-ති.

179. තාවතිංසානං, තවුතිසා වැසි දෙවියන්ටද; සබ්බස්ස, ලොකස්ස, සියලු ලොකයාහටද; ඉස්සරො, ඊශ්වරවූ; සක්කො, සක්දෙව්රජතෙම; තෙ, නුඹට; වරං, වරයක්; දජ්ජාවෙ, ඉදින් දෙන්නේනම්; වරමානො, ප්‍රාර්ත්ථනා කරන්නාවූ නුඹ; කිස්ස වරං, කෙබඳු වරයක්; වරෙ පතන්නේද.

පින්වත් අඩකුරය, තවුතිසාවැසි දෙවියන්ට හා සියලු ලොකයාහටත් ප්‍රධානවූ සක්දෙව් රජතෙමේ සිතට කැමති යම්කිසි වරයක් ගනුවයි කියා ඉදින් නුඹවහන්සේට වරයක් දෙන්නේ වී නම් නුඹ කෙබඳු වරයක් ගන්නේදයි විචාළේය. එවිට අඩකුර තෙමේ තම අදහස් තත්වූ පරිදි අහවා කියන්නේ:–

180. සක්කො වෙ මෙ වරං දජ්ජා-තාවතිංසාන මිස්සරො,
කාලුට්ඨිතස්ස මෙ සතො-සුරයස්සුග්ගමනං පති.

181. දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං-සීලවන්තො ච යාචකා,
දදතො මෙ න ච්‍යෙථ-දත්වා නා නුතපෙය්‍යහං,
දදං චිත්තං පසාදෙය්‍යං-එවං සක්කං වරං වරෙ-ති,

Non-commercial distribution

180-181. තාවතිංසානං, තව්තිසාවාසින්ට; ඉස්සරො, ස්වාමීවූ; සක්කො, සක්දෙව්රජ; මෙ, මට; වරං, වරයක්; දජ්ජාවෙ, ඉදින් දෙන්නේ නම්; කාලෙ, උදයකාලයෙහි; උට්ඨිතස්ස සතො, නැඟිසිටියාවූම (නොහොත්) උට්ඨානවීර්‍ය සමන්විතවූම; මෙ, මට; සුරියස්ස උග්ගමනං පති, සූර්‍යෝදය කාලයෙහි; දිබ්බා, දෙව්ලොවට ඇතුළත්වූ; යක්ඛා, ආහාරයෝ; පාතුභවෙය්‍යුං, උපදින්නාහුනම්; යාචකා, යාචකයෝ; සීලවන්තොව, සිල්වත් වන්නාහු නම්; දදතො, දන්දෙන්නාවූ; මෙ, මාගේ; න ඛීයෙථ, (දනවස්තුව) ක්‍ෂයනොවේ නම්; අහං, මම; දත්වා, දන්දී; නානුතපෙය්‍යං, පසුතැවිලි නොවෙමි නම්; දදං, දන්දෙමින්; චිත්තං, සිත; පසාදෙය්‍යං, පහදවන්නෙම් නම්; එවං, මෙබඳුවූ; වරං, වරය; සක්කං, ශක්‍රයාගෙන්; වරෙ ඉති, ප්‍රාර්ත්ථනා කරමි.

ඉදින් දෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රතෙම මට වර දෙන්නේවී නම් උදය කාලයෙහි නැඟිසිටියාවූ හෙවත් දක්ෂිණාර්හයන්හට අපචායන පාරිචර්‍යාදි වශයෙන් උට්ඨාන වීර්‍යයෙන් සමන්විතවූ මට සූර්‍යයා උදවෙන කල්හි දිව්‍යාහාර පහළ වන්නාහුද, යාචකයෝද සිල්වත් යහපත් ස්වභාව ඇත්තෝවෙත්ද, පැමිණි පැමිණි ජනයන්ට දන්දෙන්නාවූද මාගේ දනවස්තු ක්‍ෂයනොවන්නෙද, දියයුතු දනය දී කිසියම් අප්‍රසාදයක් දැක එයින් පසුතැවිලි නොවෙම්ද, දෙමින් පහන්සිත් ඇතිවම දෙන්නෙම්ද යන මේ අසූමින් ශක්‍රයාගෙන් ආරොග්‍ය සම්පත්තියද, දෙයධර්මසම්පත්තියද, දක්ෂිණාර්හ සම්පත්තියද, දනවස්තූන්ගේ අපරිමිත සම්පත්තියද, දයක සම්පත්තියදැයි යන මේ පස්වැදෑරුම් වරය ගනිමැයි කියා ගාථාදෙක කීයේය.

මෙහි ''උදයකාලයෙහි නැඟිසිටීම'' යන්නෙන් නිරොගි සම්පත්තියද ''දිව්‍යාහාර පහළවීම'' යන්නෙන් දෙය ධර්‍ම සම්පත්තියද, ''යාචකයෝ සිල්වත්හු වෙත්වායි'' යන්නෙන් දක්ෂිණාර්හ සම්පදවද, ''දන්දෙන්නාවූ මගේ දනවස්තු ක්‍ෂය නොවේවා'' යන්නෙන් දන වස්තුහුගේ අප්‍රමාණ සම්පත්තියද, ''මම දන්දී පසුතැවිලි නොවෙමි. දෙමින් මම පහන් සිත්ව දෙන්නෙමැ''යි යන මෙයින් දයක සම්පත්තියදැයි යන මේ සම්පත් පස වැඩසිදුවෙන බැවින් කැමතිවන ලදහ, එකී සම්පත් පසම දනමය පුණ්‍යක්‍රියාවගේ එපමණ මහත්භාවය පිණිස වෙත් යයි දතයුතු. මෙසේ අඬකුරයා විසින් තම අදහස් අහවා කීකල්හි

Non-commercial distribution

එහි සිටියා වූ නීති ශාස්ත්‍රය පුරුදුකළ සොනක නම් එක් පුරුෂ යෙක් ඒ අඩකුරයා බොහෝකොට දීමෙන් මුදවනු කැමැතිව ''න සබ්බවිත්තානි'' යන ආදි මේ ගාථා දෙක කීයේය. සින්ධක තෙමේ අඩකුර රජු විමසනු කැමතිව මෙසේ කීයේයැයි සමහරු කියති.

182. න සබ්බ විත්තානි පරෙ පවෙච්ඡෙ
දදෙය්‍ය දනඤ්ච ධනඤ්ච රක්ඛෙ,
තස්මා හි දනා ධනමෙව සෙය්‍යො
අතිප්පදනෙන කුලා න හොන්ති.

183. අදනමතිදනං ච නප්පසංසන්ති පණ්ඩිතා
තස්මා හි දනං ධනමෙව සෙය්‍යා
සමෙන වත්තෙය්‍ය සධිරධම්මොති-ති.

182. සබ්බවිත්තානි, සියලු ධනයන්; පරෙ, අන්හට; න පවෙච්ඡෙ, නොදෙන්නේ; දනංච, දනයද; දදෙය්‍ය, දෙන්නේය; ධනංච, ධනයද; රක්ඛෙ, රකින්නේය; තස්මාහි, එහෙයින්ම; දනා, දීමට වඩා; ධනං එව, ධනයම; සෙය්‍යො, ශ්‍රේෂ්ඨවෙයි; අතිප්පදනෙන, අධික කොට දීමෙන්; කුලා, කුලයෝ; නහොන්ති, නොපවතිත්.

183. පණ්ඩිතා, පණ්ඩිතයෝ; අදනං, නොදීමද; අතිදනංව පමණ ඉක්මවාදීමද; නප්පසාසන්ති, නොපසසත්; තස්මාහි, එහෙයින්; දන,, දීමට වඩා; ධනං එව, වස්තුව රැකීමම; සෙය්‍යො, උතුම්වේ; සමෙන, සමවිධියෙන්; වත්තෙය්‍ය, (දන අදන දෙක්හි) පවත්නේය; සො, එය; ධිරධම්මො ඉති, බුඩි මතුන්ගේ (නීතික්‍රමයෙහි දක්ෂයන් ගේ) ධර්මයවේ.

පින්වත් අඩකුරය දක්ෂිණාර්හයෝ ලැබුහයි කියා සවිඤ්ඤාණක අවිඤ්ඤාණක ප්‍රභෙද ඇති සියලු සම්පත් කිසිත් ඉතිරි නොකොට නොදිය යුතුය. වැලිදු තමන්ට වසනු උපදින ප්‍රමාණය දන සම්පත් පමණින් දනයද දියයුතුය. නොලත්දෙය ලැබීම හා ලත් දෙය රැකගැනීම හා රක්ෂාකරන ලද්ද යන මොවුන්ගේ සම්බන්ධ වශයෙන් ධනය රැක්ක යුතුය.

''එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය-වීහි කම්මං පයොජයෙ,
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය-ආපදසු භවිස්සතී''ති.

Non-commercial distribution

''යනුවෙන් වස්තුවෙන් එක් කොටසක් අනුභවයද දෙකෙන් කොටසක් කම්මාන්ත පිණිසද යෙදිය යුතු, සතරවෙනි කොටස විපතක් පැමිණිවිට වියදම් කිරීම සඳහා තැන්පත්කොට තබන්නේය''යි කියනලද විධියෙන් හෝ ධනය රක්ෂාකරන්නේය, දනය ඒ වස්තු මුල්කොට ඇති බැවින් මාත්‍රා තුනම ඔවුනොවුන් පිරිසිදු කිරීමෙන් සෙවිය යුතුයයි කියා නීති සිතන්නෝ කියත්. යම්හෙයකින් ධනයද රකිමින් දන්දීමද කරන තැනැත්තේ දෙලොව වැඩ පිණිස පිළිපන්නේවේද, දනයත් ධනය මුල්කොට ඇතිවේද එහෙයින් දීමට වඩා ධනයම ශ්‍රේෂ්ඨවෙයි. (අධික වශයෙන් දීම නොකොට යුතුය යන අදහසවේ.) වස්තුවේ ප්‍රමාන නොදැන දීම නිසා අයිකව දන් දීමෙන් කුල පරම්පරාවෝ නොපවතිත් යයි කීය.

පසුව නුවණැත්තන් විසින් පසස්නාලද කරුණක්ම දක්වමින් බත්සැන්දක්වත් සහල්මිටක්වත් දන්නොදීමද, පමණ ඉක්මවා පරිත්‍යාග සංඛ්‍යාත අධික දනයද පණ්ඩිතයෝ ප්‍රශංසා නොකෙරෙත්. සර්ප්‍රකාරයෙන් නොදීම් හෙතුවෙන් පරලෝ සැපතින් පිරිහෙයි, අධික දන හෙතුවෙන් ඉහාත්මභාවයෙහි කුලප්‍රවෙණිය නොපවතියි විෂමනුවූ ලෞකික පරීක්ෂකයන් විසින් ගර්හිතනුවූ මධ්‍යම න්‍යාය ක්‍රමයෙන් දන් පවත්වන්නේය. යටකියනලද යම් දන අදන ප්‍රවෘත්තියක්වේද එය නුවණැත්තාවූ නීති දක්ෂවූ පණ්ඩිතයන් ගේ ධර්මය වේ. ඔවුන් ගිය මගයයි කිය.

එය අසා අඩිකුරතෙම ඒ සොනකයා ගේ අභිප්‍රාය පෙරළමින් කියන්නේ:-

184. අහෝ වතාරෙ අහමෙව දජ්ජං
සන්තෝ හි මං සප්පුරිසා භජෙයුං,
මෙසොව නින්නානහිපූරයන්තෝ
සන්තප්පයෙ සබ්බ වණිබ්බකානං

185. යස්ස යාචනකෙ දිස්වා-මුඛවණ්ණෝ පසීදති,
දත්වා අත්තමනෝ හොති-තං සරං වසතෝ සුඛං,

186. යස්ස යාචනකෙ දිස්වා-මුඛවණ්ණෝ පසීදති,
දත්වා අත්තමනෝ හොති-එසා පුඤ්ඤස්ස සම්පද.

187. පුබ්බෙ දනා සුමනෝ-දදං චිත්තං පසාදයෙ,
දත්වා චත්තමනෝ හොති-එසා පුඤ්ඤස්ස සම්පද-ති.

Non-commercial distribution

184. අරෙ, **එම්බල** මාණවකය; අහං, මම; දජ්ජං එව, **දෙන්නෙමිමය; සන්තෙහි, සන්සුන් කාය වාග් මනො සමාචාර ඇති; සප්පුරිසා, සත්පුරුෂයෝ**; මං, මා; භජෙයය්‍යුං, ආශ්‍රය **කරන්නාහුය; නින්නානි, නිම්නස්ථානයන්; අභීපූරයන්තො, මනාවපුරවමින්; මෙසො වීය, වර්ෂාකරන මහාමෙඝය මෙන්; සබ්බවණිබ්බකානං, සියලු යාචක ජනයන් ගේ (අදහස); සන්–තප්පයෙ, සතපන්නේ නම්; අහො වත ඉති, යෙහෙකි.**

185. යාචනකෙ, සිඟන්නන්; දිස්වා, දැක; යස්ස, යමෙකු ගේ; මුඛවණ්ණො, මුඛවර්ණය; පසීදති, පහදීද; දත්වා, දන්දී; අත්ත මනො හොති, සතුටුසිත් ඇතිවේද; තං සරං, ඒ ගෙහි; වසතො, වසන්නාහට; සුඛං, සැපවේ.

186. එසා, මෝතොමෝ; පුඤ්ඤස්ස, කුසලයා ගේ; සම්පද, සම්පත්තිය (හෙවත්) පිරීම වෙයි. (සෙස්ස යට–කියනලදී.)

187. දනා, දන්දීමෙන්; පුබ්බෙ එව, පෙරම; සුමනො, **සතුටුසිත් ඇතිවේද; දදං, දන්දෙමින්; චිත්තං, සිත; පසාදයෙ, පහදවන්නේද; දත්වාව, දන්දීද; අත්තමනොහොති, සොම්නස් සිතැතිවේද; එසා, මෝතොමෝ; පුඤ්ඤස්ස, පුණ්‍යයා ගේ සම්පද ඉති, සම්පත්තියයි.**

. **එම්බල** මාණවකය, දීමට වඩා ධනය ශ්‍රේෂ්ඨ යයි නීතිදක්ෂ යන් ගේ මේවාදයයි කියා ඉදින් යම් කෙනෙක් කියතත් මම එකාන්තයෙන් දන්දෙන්නෙමිමය, ඒ දීම ඇති කල්හි සන්සුන් කායවාඩිමිනො සාමාචාර ඇති සත්පුරුෂයෝ මා ඇසුරුකරන්–නාහුය, නිම්නස්ථාන පුරවමින් වසින්නාවූ මහ වැස්සමෙන් මම සියලු වණිබ්බක ජනයාගේ අදහස් සම්පූර්ණ කරමින් ඔවුන් සන්තර්පණය කරන්නෙම් නම් ඉතා යහපත.

ගෘහවාසී වූ යම් පුද්ගලයෙකුහට යාචකයන් දැක පළමු–කොට එකාන්තයෙන් මාගේ පින්කෙත එළඹසිටියේ යයි හටගත් ශ්‍රද්ධාව හෙතුකොට මුඛවර්ණය පහදීද, සම්පත් පමණින් ඔවුන්ට දන්දී ප්‍රීතිසෞමනස්‍ය සහගත සිත්ඇතිවේද, මෙහි යම් ඒ යාචකයන් ගේ දැකීමක්වේද, ඒ යාචකයන් දැක සිත පැහදීමක්–වේද, සුදුසු පරිද්දෙන් දන්දී සතුටුසිත් ඇතිබවක් වේද, ඒ තුන ගෙයි වසන්නාහට සැපවේ, **මේ කුශලයාගේ සම්පත් පිරීමවෙයි.**

Non-commercial distribution

සම්පත් නිධානයෙන් වෙන්කොට තමා අනුව යන නිධානයක් නිදන් කොට තබන්නෙමියි සිතා මුඤ්චන චෙතනාවට හෙවත් දන්දීමට පූර්වයෙහිදීම දනොපකරණ සම්පාදනය කරන තැන් පටන් දයක තෙමේ සොම්නස් ඇතිවේද, දෙමින් දනවස්තුව දක්ෂිණාර්හයන්ගේ අතට පිළිගන්වමින් නිස්සාර ධනයෙන් බැහැරකොට සාරවූ දනය කරමැයි සිතා තමාගේ සිත පහදවා ගන්නේද, දක්ෂිණාර්හයන්හට දනවස්තුව පිරිනමා පණ්ඩිතයන් විසින් පණුවනලද දනය මා විසින් දෙනලදී. අහෝ යහපතැයි කියා ප්‍රීති සොම්නස් ඇතිවේද, යම් මේ පූර්වචෙතනා මුඤ්චන-චෙතනා අපරචෙතනා යයි කියනලද කම්ඵල විශ්වාසය අනුව-ගිය සොම්නසින් උපදවා ගත් මේ ත්‍රිවිධ චෙතනාවන්ගේ පිරිමක් වේද ඕතොමෝ පින පිළිබඳ සම්පත් වන්නීය. මෙයින් අන්පරිද්දකින් නොවන්නේ යයි කීයේය.

මෙසේ අඩිකුරතෙමේ තමා පිළිපදින විධිය ප්‍රකාශ කොට ඉතා බොහෝ සෙයින් මනාව වැඩුණු දනාධ්‍යාශය ඇතිව දවසක් දවසක් පාසා මහදන් පැවැත්වීය. ඔහු විසින් එකල්හි සියලු රාජ්‍යවල නහුල් උඩුකුරුකොට මහදන් දෙනුලබන කල්හි පිළිලත් සියලු උපකරණ ඇති මනුෂ්‍යයෝ තම තමන්ගේ ගොවිකම් ආදි කර්මාන්තයන් හැරදමා සුවසේ හැසුරුණාහුය. ඒ කර්මාන්ත නොකිරීම් හෙතුවෙන් රජුන්ගේ කොටුගෙවල් හිස්වූවාහුය. ඒ හෙතුවෙන් රජවරු ''පින්වතාගේ දනය නිසා අපගේ වස්තු ඉපදීමට විනාශයක් වීය. කොෂ්ඨාගාරයෝ ක්ෂය-වීමට ගියාහුය. ඒ ගැන යුතු අඳුමක් දැනගත යුතුය''යි කියා අඩිකුරයා වෙත දූතයෙකු පිටත්කර යැවුවාහුය. එය අසා අඩිකුර-තෙම දක්ෂිණාපථයට ගොස් දෙමළ ප්‍රදේශයක මුහුදට තුදුරු තැනෙක මහත් දන්සැල් කරවා මහදන් දෙමින් ආයු ඇතිතෙක් සිට මරණින් මතු තව්තිසා දෙව්ලොව උපන්නේය. ඔහුගේ දනසම්පත්තිය හා ස්වර්ගලොකොත්පත්තියද දක්වමින් සංගීති-කාරයෝ මේ ගාථාවන් කීහු:-

188. සට්ඨිවාහසහස්සානි-අඩිකුරස්ස නිවෙසනෙ,
භොජනං දියතෙ නිච්චං-පුඤ්ඤපෙක්ඛස්ස ජන්තුනො.

189. තිසහස්සානි සුද හි-ආමුත්තමණි කුණ්ඩලා,
අඩිකුරං උපජීවන්ති-දනෙ යඤ්ඤස්ස ව්‍යාවටා.

Non-commercial distribution

190. සටයීපුරිසසහස්සානි- ආමුත්තමණි කුණ්ඩලා,
අඩිකුරස්ස මහාදනෙ-කටියං ඵාලෙන්ති මාණවා

191. සොළසිත්ථීසහස්සානි-සබ්බාලඩිකාර භූසිතා,
අඩිකුරස්ස මහාදනෙ-විධා පිණ්ඩෙන්ති නාරියො.

192. සොළසිත්ථී සහස්සානි-සබ්බාලඩිකාරභූසිතා,
අඩිකුරස්ස මහාදනෙ-දබ්බීගාහා උපටයීතා,

193. බහුං බහුන්තං පාදසි-විරං පදසි බත්තියො,
සක්කච්චඤ්ච සහත්ථාච-චිතතීකත්වා පුනප්පුනං,

194. බහූ මාසෙ ච පක්ඛෙ ච-උතූ සංවච්ඡරානි ච,
මහාදනං පවත්තෙසි-අඩිකුරො දීඝමන්තරං.

195. එවං දත්වා යජිත්වා ච-අඩිකුරො දීඝමන්තරං,
සො හිත්වා මානුසං දෙහං-තාවතිංසූපගො අහූ-ති.

188. පුඤ්ඤූපෙක්ඛස්ස, දානාඩ්‍යාශය ඇති; අඩිකුරස්ස, අඩිකුර රජහුගේ; නිවෙසනෙ, ගෘහයෙහි; සටයීවාහ සහස්සානි, (සුවඳැල් සහල් ආදියෙන් පුරවනලද) ගැල්සැටදහක්; භොජනං, ආහාර; ජන්තූනං, සත්වසමූහයාට; නිච්චං, නිතර; පදීයත, දෙනුලැබේ.

189. යඤ්ඤස්ස, මහායාගයයි සංඥිතවූ; දනෙ, දානයෙහි; ව්‍යාවටා, ව්‍යාපෘතවූ; ආමුත්තමණිකුණ්ඩලා, නොයෙක් මිණි-කොඩොල් දරු; තිසහස්සානි, තුන්දහසක් පමණ; සූදහි, හත්ත කාරකයෝ; අඩිකුරං, අඩිකුර රජුනිසා; උපජීවන්ති, ජීවත්වෙත්.

190. ආමුත්තමණිකුණ්ඩලා, පැළඳගත් මාණික්‍ය කුණ්-ඩලාභරණ ඇති; සටයීපුරිසසහස්සානි, සැටදහසක්; මාණවා, තරුණ පුරුෂයෝ; අඩිකුරස්ස, අඩිකුරයාගේ; මහාදනෙ, මහාදානයෙහි; කටියංඵාලෙන්ති, දරපලත්.

191. අඩිකුරස්ස, අඩිකුරයාගේ; මහාදනෙ, මහාදන,-යෙහි; සබ්බාලඩිකාරභූසිතා, සර්‍වාලඩ්කාරයෙන් සැරසුනාවූ; නාරියො, නාරිසඩ්ඛ්‍යාතවූ; සොළසිත්ථී සහස්සානි, සොළොස් දහසක් ස්ත්‍රීහු; විධා, කුළුබඩු; පිණ්ඩෙන්ති, (ඇඹරීම් වශයෙන්) පිඩුකරත්.

192. දබ්බීගාහා, හැඳිගත් අත්ඇතිව; උපටයීතා, එළඹසිටියාහුය. (සෙස්ස පෙරසේමැයි.)

Non-commercial distribution

193. ඛත්තියො, අඩ්කුර රජතෙම; බහුං, බොහෝ දන වස්තු; බහුන්නං, නොයෙක් ජනයන්ට; විරං, බොහෝකල් මුළුල්ලෙහි; පාදසි, ප්‍රකෂියෙන් දුනි; සක්කච්චංච, සකස්-කොටද; සහත්ථාච, සියතින්ද; චිත්තීකත්වා, ගරුබුහුමන් සිත්ඇතිකොට; පුනප්පුනං, නැවත නැවත (නොහොත්) බොහෝ සෙයින් පාදසි, ප්‍රදනය කෙළේය.

194. අඩ්කුරොා, අඩ්කුරතෙම; බහූමාසෙව, බොහෝ මාසයන් මුළුල්ලෙහිද; බහුපක්ඛෙව, නොයෙක් පක්ෂයන් මුළුල්ලෙහිද; උතු, නොයෙන් සෘතු මුළුල්ලෙහිද; සංවච්ඡරානිච, බොහෝ අවුරුදු මුළුල්ලෙහිද; දීඝමන්තරං, දීඝකාලාන්තරයක; මහාදනං, මහත් දනය; පවත්තෙසි, පැවැත්වීය.

195. එවං, මෙසේ (උක්ත ප්‍රකාරයෙන්;) සො අඩ්කුරොා, ඒ අඩ්කුර රජතෙම; දීඝමන්තරං, දීඝකාලාන්තරයක් මුළුල්-ලෙහි; දත්වා, දන්දී; යජිත්වාච, මහත්යාගකොට; මානුසංදෙහං, මනුෂ්‍යදෙහය; හිත්වා, හැරපියා; ත චතිංසූපගො අහු ඉති, තව්තිසා දෙවුලොවට පැමිණියේ විය.

දනාඩ්‍යාශය ඇති දන්දීමෙහි ඇලුණාවූ අඩ්කුර රජහුගේ ගෘහයෙහි දවසක්පාසා සුවඳ ඇල්සහල් ආදියෙන් පුරවනලද ගැල් සැටදහසක් වියදම්කොට සත්ව සමූහයාට ආහාර දෙන ලද්දේය.

නානා මාණික්‍ය කුණ්ඩලාභරණ පැළඳගත්තාවූ මහා-යාගයයි සංඥාකරනලද දනයෙහි ව්‍යාපෘතවූ ප්‍රධාන භක්ත කාරකයෝ තුන්දහසක් වෙති. ඔවුනතුරෙන් එකිනෙකාගේ වචනකාරී මනුෂ්‍යයෝ බොහෝ වෙත්යයි දකයුතු ඔවුහු හැමදෙන අඩ්කුර රජු නිසා ජීවත්වෙති.

අඩ්කුරයාගේ මහාදනයෙහිදී නානාප්‍රකාර බාද්‍ය භොජ්‍යාදි ආහාර විශෙෂයන් පිසීම පිණිස මාණික්‍ය කුණ්ඩලාභරණාදියෙන් සැරසුණාවූ තරුණ මනුෂ්‍යයෝ සැටදහසක් දරපළත්.

අඩ්කුර රජහුගේ මහාදනයෙහිදී සර්වාලඩ්කාරයෙන් සැර සුණාවූ ස්ත්‍රීහු සොළොස් දහසක් කටයුතුවූ ආහාරයට සුදුසුවූ කුළු බඩු අඹරා පිඩුකරත්.

තවද අඩ්කුර රජහුගේ දනාග්‍රහයෙහි සර්වාභරණයෙන් සැරසී හැඳි රැගෙන පැමිණි ස්ත්‍රීහු සොළොස් දහසක් වෙති.

Non-commercial distribution

ඒ අඩකුර රජතෙමේ හවුරුදු විසිදහසක් ආයු ඇති මිනිසුන් ඇති කල්හි උපන්නේ බොහෝ දනවස්තු නොයෙක් ජන සමූහයාහට බොහෝකල් මුළුල්ලෙහි දුන්නේය. ඒ දීමද සකස් කොට ආදර සහිතව අනුන්ට නියම කිරීමකින් නොව සියතින්ම ගරු බුහුමන් සිත් ඇතිකොට නොයෙක්වර දුන්නේය.

ඛක්මස ආදිකොට ඇති නොයෙක් මාසවලද **කෘෂ්ණ ශුක්ල** භෙද ඇති බොහෝ පක්ෂයන්හිද වසන්ත ග්‍රීෂ්මාදි නොයෙක් ඍතුවලද, චිත්‍ර සංවත්සරාදීවූ බොහෝ අවුරුදුවලද අඩකුර තෙමේ බොහෝ කාලයක් මුළුල්ලෙහි මහදන් පැවැත් වූයේය. මෙසේ උක්තප්‍රකාරයෙන් ඒ අඩකුර රජතෙම සමහර දක්ෂිණාර්හයන්හට සමහර දනවස්තු පරිත්‍යාග වශයෙන්දී නැවත නොයෙක් දනවස්තු බොහෝ කාලයක් මුළුල්ලෙහි සියලු යාචකයන්හට කැමැති පරිද්දෙන් දන්දෙමින් මහායාග වශයෙන් පූජාකොට ආයුකෙළවර මනුෂ්‍යාත්ම භාවය හැර පිළිසිඳ ගැනීම වශයෙන් තවුතිසා දෙව්ලොවට පැමිණියේය.

මෙසේ ඒ අඩකුරයා තවුතිසා දෙව්ලොව ඉපිද දිව්‍යසම්පත් අනුභව කරන කල්හි අප බුදුන්කල ඉඳුක නම් මාණවකතෙම පිඬු පිණිස වැඩිය ආයුෂ්මත් අනුරුඬ ස්ථවිරයන් වහන්සේට ප්‍රසන්න සිත් ඇතිව බත්සැන්දක් දෙව්වේය. හෙතෙම මෑත කලෙක කළුරියකොට ක්ෂේත්‍රගත පුණ්‍යකර්මයාගේ ආනුභාවයෙන් තවුතිසා දෙව්ලොව මහත් සෘඩි ඇති මහානුභාව දිව්‍ය පුත්‍රයෙක්ව උපන්නේ දිව්‍යමය රූප සම්පත් ආදි කරුණු දසයකින් අඩකුර දිව්‍යපුත්‍රයා මැඩපවත්වා බබලයි. එහෙයින් කියනලදි:-

196. කටව්‍හු භික්ඛං දත්වාන-අනුරුඬස්ස ඉන්දකො,
සො හිත්වා මානුසං දෙහං-කාවතිංසූපගො අහු.

197. දසහි යානෙහි අඩකුරං-ඉන්දකො අතිරොචති,
රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ-ඵොට්ඨබ්බෙ ච මනොරමෙ.

198. ආයුනා යස්ස වෙව-වණ්ණෙන ච සුඛෙන ච,
ආධිපච්චෙන අඩකුරං-ඉන්දකො අතිරොචති-ති.

196. සො ඉන්දකො, ඒ ඉන්දකතෙමේ; ඇනුරුඬස්ස, ඇනුරුඬ තෙරුන්ට; කටව්හු භික්ඛං, හැන්දක් පමණ බත්; දත්වාන, දී; මානුසංදෙහං, මිනිසත්බව; හිත්වා, හැරපියා; තාව තිංසූපගො අහු, තවුතිසා දෙවුලොවට පැමිණියේ විය.

Non-commercial distribution

197-198. ඉන්දකො, ඉන්දක දිව්‍යපුත්‍රතෙම; අඩ්කුරං, අඩ්කුර දිව්‍යපුත්‍රයාට වඩා; දසාභියඤ්ඤෙහි, සම්පත් කරුණු දසයකින්; අතිරොචති, අධිකව බබලයි; මනොරමෙ, සිත්කලුවූ; රූපෙ, රූප සම්පත්තියෙන්ද; සද්දෙ, ශබ්දයෙන්ද; රසෙ, රස යෙන්ද; ගන්ධෙ, ගන්ධයෙන්ද; ඵොට්ඨබ්බෙව, ස්පෘෂ්ටව්‍ය යෙන්ද; ආයුනා, ආයුසම්පත්තියෙන්ද; යසසාවෙව, පිරිවර සම්පත්තියෙන්ද; වණ්ණෙනව, ලක්ෂණ සම්පත්තියෙන්ද; සුඛෙනව, සැප සම්පත්තියෙන්ද; ආධිපච්චෙන, ඓශ්වර්‍ය්‍ය සම්පත්තියෙන්ද; ඉන්දකො, ඉන්දකතෙමේ; අඩ්කුරං, අඩ්-කුරයා; අතිරොචතීති, මැඩ බබලයි.

ඒ ඉන්දක තෙමේ අනුරුඬ තෙරුන් වහන්සේට බත් සැන්දක් දී මිනිසත්බව හැරදමා තවුතිසා දෙව්ලොව උපත. ඒ ඉන්දික දිව්‍යපුත්‍ර තෙමේ අඩ්කුර දිව්‍යපුත්‍රයාට වඩා මනොරම්‍යවූ රූප සම්පත්තියෙන් හා ශබ්ද ගන්ධ රස ස්පෘෂ්ටව්‍යයෙන්ද ආයුසම්පත්තියෙන් හා මහත් පරිවාර සම්පත්තියෙන්ද ශරීර සෂ්ඨාන සම්පත්තියෙන් හා කායික චෛතසික සැපයෙන්ද ඓශ්වර්‍ය්‍ය සැපතින්දැයි යන මේ සම්පත් දසයෙන් අධිකව බබලයි.

දෙවියන්ගේ ආයුෂ පිරිසිඳිනලද පමණ යයි කියන ලද්දේ නොවේද? සැබව එසේ කියනලදී. ඒ වනාහි බොහෝ වශයෙන් කියන ලද්දකි. ඒ එසේමැයි ප්‍රයෝග විපත්ති ආදියෙන් සමහර දෙවියන්ගේ මරණය අතරතුරවේමය, ඉන්දක දෙවිතෙම වනාහි තුන්කෙළ සැටදහසක් හවුරුදු සම්පූර්ණ කෙරේමය. එහෙයින් ''ආයුනා අතිරොචති'' යනු කියනලදී.

මෙසේ අඩ්කුරයා හා ඉන්දකයාත් තවුතිසා දෙව්ලොව ඉපිද දිව්‍ය සම්පත් වලඳන කල්හි අපගේ භාග්‍යවතුන් වහන්සේ බුඬත්වයට පැමිණීමෙන් සත්වෙනි අවුරුද්දේ ඇසළ මිස පුණු පොහෝ දිනයෙහි සැවැත්නුවර දෙරටුව සම්පයෙහිවූ ගණ්ඩබ්බ රුක්මුලදී යමාමහ පෙළහරකොට පිළිවෙළින් ත්‍රිපද චික්‍රමයෙන් තවුතිසා භවනයට වැඩ පරසතු රුක්මුල පාණ්ඩුකම්බල ශෛලා සනයෙහි යුගන්ධර පර්‍වත මස්තකයෙහි තරුණ සූර්‍ය්‍යයාමෙන් බබලමින් දශවිධ ලොකධාතුවෙන් රැස්වූ දිව්‍යබ්‍රහ්ම පිරිසගේ ආලොකය තමන් වහන්සේගේ ශරීරා ලොකයෙන් මැඩපවත්

Non-commercial distribution

වමින් අභිධම්ම දෙශනාවට වැඩහුන් සේක් ලඟ සිටිය ඉන්දක දිව්‍යපුත්‍රයාද දෙළොස් යොදුනක් ඇත සිටි අඩකුර දිව්‍යපුත්‍රයා ද දැක වදරා දැක්ෂිණාර්හ සම්පත් වදරනු පිණිස:-

199. මහාදනං තයා දින්නං-අඩ්කුර දීඝමන්තරං,
අතිදූරෙ නිසින්නොසි-ආගච්ඡ මම සන්තිකෙ-ති.

199. අඩ්කුර, අඩ්කුරය; තයා, තොප විසින්; දීඝමන්තරං, දීර්ඝකාලයක් මුළුල්ලෙහි; මහාදනං, මහදන්; දින්නං, දෙනලදී; අතිදූරෙ, ඉතා දුරුතන්හි; නිසින්නොසි, හුන්නෙහිය; මම, මාගේ; සන්තිකෙ, හමුවට; ආගච්ඡ ඉති, එවයි.

එම්බා අඩ්කුරය තොප විසින් දිර්ඝකාලයක් මුළුල්ලෙහි මහ දන් දෙනලදී. (එසේද වුවත්) ඉතා දුරතන්හි සිටිනෙහිය මා සමීපයට එවයි වදළසේක. එය අසා අඩ්කුරතෙම කියනුයේ භාග්‍යවතුන් වහන්ස මා විසින් බොහෝ කලක් මුළුල්ලේහි බොහෝ දනවස්තු පරිත්‍යාගකොට පවත්වන ලද්දාවූද මහාදනය දක්ෂිණාර්හ සම්පත් නොලැබීමෙන් කෙතක්නුවූ තැනක වපුල බිජුවට මෙන් මහත්ඵල නොවීය. ඉන්දකයාගේ බත්හැන්දක් පමණදීම වනාහි දක්ෂිණාර්හ සම්පත්තින් යුක්තවූ බැවින් යහපත් කෙත වපුල බිජුවට මෙන් මහත්ඵල වූයේයයි කීයේය. ඒ කාරණය දක්වන්නාවූ සංගීතිකාරයෝ මෙසේ කීහ:-

200. තාවතිංසෙ යද බුඩ්ඩො-සිලායං පාණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තකමූලම්හි-විහාසි පුරිසුත්තමො.

201. දසසු ලොකධාතූසු-සන්නි පතිත්වාන දෙවතා,
පයිරුපාසන්ති සම්බුඩං වසන්තං නගමුද්ධනි.

202. න කොචි දෙවො වණ්ණෙන-සම්බුඩං අතිරොචති,
සබ්බෙ දෙවෙ අධිගය්හ-සම්බුදධොව විරොචති.

203. යොජනානි දස මෙ ච-අඩ්කුරොයං තද අහු,
අවිදූරෙව බුද්ධස්ස-ඉන්දකො අතිරොචති.

204. ඔලොකෙත්වාන සම්බුද්ධො-අඩ්කුරඤ්චාපි ඉන්දකං,
දක්ඛිණෙය්‍යං පභාවෙන්තො-ඉදං වචනමබ්‍රැවි,

205. *මහාදනං තයා දින්නං-අඩ්කුර දීඝමන්තරං,
අතිදූරෙ නිසින්නොසි-ආගච්ඡ මම සන්තිකෙ.

Non-commercial distribution

200. පුරිසුත්තමෝ, පුරුෂොත්තම වූ; බුද්ධෝ, සර්ව්ඥතෙම, තාවතිංසෙ, තවුතිසා භවනයෙහි; පාරිච්ඡත්තකමූලම්හි, පරසතු රුක්මුල; පණ්ඩුකම්බලෙ සිලායං, පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි; යද, යම්කලෙක; විහාසි, වාසය කෙළේද.

201. දසසුලොකධාතුසු, දසදහසක් චක්‍රවාටයන්හි; දෙවතා, දෙවියෝ; සන්නිපතිත්වාන, රැස්ව; නගමුඩනි, මෙරමුදුනෙහි; වසන්තං, වසන්නාවූ; සම්බුද්ධං, සම්බුදුන්; පයිරුපාසන්ති, පයුපාසනය කරත්.

202. කොචිදෙවෝ, කිසිදෙවියෙක්; වණ්ණෙන, ශරීරවර්ණයෙන්; සම්බුද්ධං, සම්බුදුන්ට වඩා; න අතිරොචති, නොබබලයි; සබ්බෙදෙවෝ, සියලු දෙවියන්; අධිගය්හ, අභිභවනය කොට; සම්බුද්ධොව, බුදුහුම; විරොචති, බබලයි.

203. අයං අඩ්කුරෝ, මේ අඩ්කුරතෙම; තදා, එකල්හි; දස වෙව යොජනානි, දෙලොස් යොදුන් අතර; අහු, වීය, ඉන්දකෝ, ඉන්දකතෙම; බුද්ධස්ස, බුදුන්ට අවිදූරෙ එව, නුදුරු තැනම; අති රොචති, අධිකව බබලයි.

204. සම්බුද්ධෝ, සම්‍යක් සම්බුද්ධතෙමේ; අඩ්කුරංච අපි, අඩ්කුරයාද; ඉන්දකං, ඉන්දකයාද; ඔලොකෙත්වාන, බලාවදරා; දක්ඛිණෙය්‍යං, දක්ෂිණාර්හයා; පභාවෙන්තෝ, ප්‍රකාශකරමින්; ඉදං වනවං, මේ වචනය; අබ්‍රැවි, වදළේය

පුරුෂොත්තම වූ සර්ව්ඥයන් වහන්සේ තවුතිසා දෙව්ලොව පරසතු රුක්මුල පඬු ඇඹුල් සලස්නෙහි යම්කලෙක්හි වැඩ විසූ සේක්ද, එකල්හි ජාතික්ෂෙත්‍රයයි සංඥ කරන ලද දසදහසක් සක්වළෙහි කාමාවචර දෙවියෝද බ්‍රහ්මයෝද රැස්ව මහමෙර මුදුනෙහි වැඩසිටිය සම්‍යක් සම්බුධයන් වහන්සේ ධර්මශ්‍රවණය පිණිස ඇසුරු කරත් එහි කිසිම දෙවියෙක් ශරීර වර්ණයෙන් බුදුරජාණන් වහන්සේට වඩා නොබබලයි. සර්ව්ඥයන් වහන්සේම සියලු දෙවියන් මැඩපවත්වා බබලනසේක. යථොක්ත චරිතය ඇති අඩ්කුරතෙමේ බුදුන් හමුවන කල්හි බුදුන් මැඩහුන් කැන සිට දෙළොස්යොදුන් අතර තැනක සිටියේය. ඉන්දකයා බුදුන් ලහම සිට බබලයි. සම්‍යක් සම්බුධයන් වහන්සේ අඩ්කුර දිව්‍යපුත්‍රයා හා ඉන්දක දිව්‍යපුත්‍රයාත් දෙස බලා වදරා දක්ෂිණාර්හයන් ප්‍රකාශ කරමින් මේ වචනය වදළසේක. එම්බා

Non-commercial distribution

අඩිකුරය තොප විසින් දීර්ඝකාලයක් මුළුල්ලෙහි මහදන් දෙනලදී. (එසේවූවත්) නුඹ මට ඉතා දුරු තන්හි සිටින්නේය. මාගේ සමීපයට එවයි වදළහ.

206. **වොදිතො භාවිතත්තෙන-අඩිකුරො ඉදමබ්‍රවී.**
කිං මය්හං තෙන දනෙන-දක්ඛිණෙය්‍යෙන සුඞ්ඝතං.

207. **අයං සො ඉන්දකො යක්ඛො-දජ්ජා දනං පරිත්තකං,**
අතිරොචති අම්හෙහි-චන්දෙ කාරගණෙ යථා.

208. **උජ්ජඩ්ගලෙ යථා බෙත්තෙ-බීජං බහුකම්පි රොපිතං,**
න විපුලං ඵලං හොති-න පි තොසෙති කස්සකං.

209. **තථෙව දනං බහුකං-දුස්සිලෙසු පතිට්ඨිතං,**
න විපුලං ඵලං හොති-නපි තොසෙති දයකං

210. **යථාපි භද්දකෙ බෙත්තෙ-බීජං අප්පම්පි රොපිතං,**
සම්මා ධාරං පවෙච්ඡන්තෙ-ඵලං තොසෙති කස්සකං.

211. **තථෙව සීලවන්තෙසු-ගුණවන්තෙසු තාදිසු,**
අප්පකම්පි කතං කාරං-පුඤ්ඤං හොති මහප්ඵල-න්ති.

206. භාවිතත්තෙන, (ආයුෂ්මාණි භාවනාවෙන් වඩනාලද සිත් ඇති) බුදුන් විසින්; වොදිතො, මෙහෙයන ලද්දවූ; අඩිකුරො, අඩිකුරතෙම; ඉදං, මේ වචනය; අබ්‍රැවි, කීයේය; **මය්හං, මගේ** (දනය); දක්ඛිණෙය්‍යෙන, දක්ෂිණාර්හයාගෙන්; සුඞ්ඝතං හිස්, විය; තෙන දනෙන, ඒ දනයෙන්; කිං, කවර ප්‍රයොජනද.

207. සො අයං, ඒ මේ; ඉන්දකො යක්ඛො, ඉන්දක දෙවි තෙම; පරිත්තකං දනං, සුලු දනක්; දජ්ජා, දී; කාරගණෙ තරු සමූහයන්; චන්දෙ යථා චන්ද්‍රයාමෙන්; අම්හේහි අතිරොචති, අප ඉක්මවා බබලයි.

208. යථා, යම්සේ; උජ්ජඩ්ගලෙ, ඉතාම තද භූමිභාග ඇති; බෙත්තෙ කෙතෙහි; රොපිතං, වපුරනලද; බීජං, බීජ: බහුකම්පි, බොහෝවූවත්; විපුලං ඵලං, මහත්ඵල; නහොති, නොවේද; කස්සකං, ගොවියා; නපි තොසෙති, **නොම සතුටුකෙරේද.**

209. තථෙව, එසේම; දුස්සීලෙසු, දුශ්ශීලයන් විෂයෙහි; පතිට්ඨිතං, පිහිටුවනලද; බහුකං දනං, මහාදනය, විපුලං ඵලං, උදර විපාක ඇත්තේ; නහොති, නොවේ; දයකං, දයකයා; නපි තොසෙති, සතුටු නොම කරයි.

Non-commercial distribution

210. යථාපි, යම් සේ; භද්දකෙ ඛෙත්තෙ, යහපත් කෙතක; රොපිතං, වපුරනලද; බීජං, බීජය; අප්පම්පි, සුලුවූවත්; ධාරං, වැසි දහර; සම්මා, මනාකොට; පවෙච්ඡන්තෙ, පවත්නා කල්හි; ඵලං, සශ්‍යඵලය; කස්සකං, ගොවියා; තොසෙති, සතුටු කෙරේද.

211. තථෙව, එසේම; ගුණවන්තෙසු, ධ්‍යානාදි ගුණවත්වූ; තාදිසු; (ඉෂ්ටාදින්හි) තාදිලක්ෂණ ප්‍රාප්තවූ; සීලවන්තෙසු, සිල් වතුන් විෂයෙහි; කතං, කරනලද; පුඤ්ඤංකාරං, පුණ්‍යොපකාරය; අප්පකම්පි, ස්වල්ප වූවත්; මහප්ඵලං හොති ඉති, මහත්ඵල වෙයි.

පාරමීපරිභාවිතවූ ආයත්‍යිමාගී භාවනා ව පිණිස වඩනාලද සිත් ඇති සම්‍යක් සම්බුඩයන් වහන්සේ විසින් මෙහෙයනලද්දවූ අඩිකුර දෙව්පුත් තෙමේ දක්ෂිණාර්හයන්ගෙන් හිස්වූ ඒ මාගේ දනයෙන් කවර ප්‍රයෝජනදැයි ස්වකීය දනමය පුණ්‍යයට හෙලා දකිමින් මේ වචනය කියේය.

ඒ මේ ඉන්දක දිව්‍ය පුත්‍රතෙමේ ස්වල්පවූ දනක්දී තාරකා සමූහය මැඩ බබලන චන්ද්‍රයාමෙන් අපට වඩා රූප සම්පත් ආදියෙන් අයිකව බබලයි.

යම්සේ ඉතාමත් තද භූමිභාග ඇති කෙතක වපුරනලද බීජ බොහෝවූවත් මහත් සශ්‍යඵල නොලැබේද ඒ හෙතුවෙන්ම ගොවියා සතුටු නොකෙරේද, එපරිද්දෙන්ම දුශ්ශීලයන් විෂයෙහි බොහෝවූද දනය දෙනලද්දේ වුවත් මහත්ඵල අත්නොවෙයි. ඒ හෙතුවෙන්ම දයකයන් සතුටු නොකරයි.

යම්සේ යහපත් කෙතෙහි රොපණය කරනලද ස්වල්පවූද බීජය අඩමසකින් දසදිනකින් පස්දිනකින් මනාව වර්ෂාජලය ලැබුණු කල්හි මහත් සශ්‍යඵල ඇතිවේද එයින් ගොවියා සතුටු කෙරේද, එසේම ධ්‍යානාදී ගුණ සම්පන්නවූ ඉෂ්ටාදී ආරම්මණයන්හි අකම්පාමාන ලක්ෂණයට පැමිණියාවූ සිල්වතුන් කෙරෙහි කරනලද ස්වල්පවූද පුණ්‍යොපකාරය මහත් විපාක ඇතිවෙ. එයින්ම දයකයන් සතුටු කෙරේයයි කීය.

512. විචෙය්‍ය දනං දතබ්බං–යත්ථදින්නං මහප්ඵලං,
විචෙය්‍ය දනං දත්වාන–සග්ගං ගච්ඡන්ති දයකා.

Non-commercial distribution

213. විචෙය්‍ය දනං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ-ති.

212. යත්ථ, යම් පුද්ගලයෙකු විෂයෙහි; දින්නං, දෙනලද (දනය); මහප්ඵල, මහත්ඵලවේද; විචෙය්‍ය, (පින්කෙත ත්‍රිවිධයින්) සොයා; දනං, දනය; දාතබ්බං, දියයුතු; දයකා, දායකයෝ; විචෙය්‍ය, නුවණින් සොයා; දනං දත්වාන, දන්දී; සග්ගං, ස්වර්ගයට; ගච්ඡන්ති, යෙත්.

213. ඉධජීවලොකෙ, මේ මනුෂ්‍ය ලොකයෙහි; යෙ දක්ඛිණෙය්‍යා, යම් දක්ෂිණාර්හයෝ වෙත්ද; විචෙය්‍ය, (ඔවුන් නුවණින්) පරීක්ෂාකොට; දනං, දීම; සුගතප්පසත්ථං, බුදුන් විසින් පසස්නා ලදී; සුඛෙත්තෙ, යහපත් කෙතෙහි; වුත්තානි, වපුරනලද; බීජානි, බීජයෝ; යථා, යම්සේද (එමෙන්); එතෙසු, මේ දක්ෂිණාර්හයන් විෂයෙහි; දින්නානි, දෙනලද්ද; මහප්ඵලානි ඉති, මහත්ඵල ඇත්තාහු වෙත්.

යම් පුද්ගලයෙකු විෂයෙහි දෙනලද දනය මහත්ඵල ඇති වේද ඒ පින්කෙත නුවණින් සොයා දන් දිය යුතුයි, දායකයෝ සිල්වතුන් නුවණින් සොයා දන් දී ස්වර්ගලොකයට පැමිණෙත්.

මේ ලොකයෙහි දක්ෂිණාව පිළිගැනීමට සුදුසුවූ යම් සිල්වත්හු ඇත්තාහු නම් ඔවුන් සොයා දන්දීම බුදුන් විසින් පසස්නා ලදී, මේ දක්ෂිණාර්හවූ සිල්වතුන් විෂයෙහි දෙනලද දනයෝ යහපත් කෙතේ වපුල බීජයන් මෙන් මහත්ඵල ඇති වන්නාහුයයි කියනලදී.

ඒ මේ අඩිකුරප්‍රෙත වස්තුව බුදුරජාණන් වහන්සේ තවුතිසා භවනයෙහිදී දසදහසක් සක්වළ දෙවියන් ඉදිරියෙහි දක්ෂිණාර්හ සම්පත් ප්‍රකාශකරනු පිණිස ''මහාදනං කයා දින්නං'' යනාදියෙන් තමන් වහන්සේ විසින් උපදවනලදී. එහිදී තුන්මසක් මුළුල්ලෙහි අභිධර්මය දෙශනාකොට මහාප්‍රවාරණ දිනයෙහි දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලද්දවූ දෙවාතිදෙවවූ සර්ව්ඥයන් වහන්සේ දෙවිලොවින් නික්ම සංකස්ස නුවරට බැස අනුක්‍රමයෙන් සැවැත් නුවරට වැඩමවා දෙවරම්වෙහෙර වැඩ වසනසේක් සිවුපිරිස මැද දක්ෂිණාර්හ සම්පත්

Non-commercial distribution

ප්‍රකාශ කරනු පිණිස ''යස්ස අත්ථාය ගච්ඡාම''යන ආදියෙන් විස්තර ව ශයෙන් දෙශනාකොට චතුස්සත්‍ය කථාවෙන් දෙශනාව කුළුගන්වා වදළසේක. දෙශනාවගේ අවසානයෙහි නොයෙක් කෙළදහස්ගණන් ප්‍රාණීන්ට ධර්මාවබොධය වූයේය.

මේ ප්‍රේතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගයට ඇතුළත් නවවෙනි අඩිකුර ප්‍රේතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

2. 10 වෙනි කථාව

තවද මේ ප්‍රේතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගාන්තර්ගත දසවෙනි උත්තරමාතෘ ප්‍රේතවස්තුව කවරහයත්:-

ඒ කථාවස්තුවෙහි මේ අර්ථවර්ණනාව වන්නීය:-ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ වදළ කල්හි පළමු මහා ධර්ම සංගායනාව පැවැත්වූ පසු ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ දෙළොස් නමක් භික්ෂූන් සමග කොසඹෑ නුවරට නුදුරුවූ එක්තරා අරණ්‍යයක වාසය කළෝය. එකල්හි වනාහි උදෙනි රජහුගේ එක්තරා ඇමතියෙක් කළුරිය කළේය ඔහු විසින්ද පෙර නුවර කර්මාන්තයෝ විධාන කරන ලදහ. එකල්හි රජතෙමේ ඔහු පුත්වූ උත්තර නම් මාණවකයා කැඳවා ''නුඹද පියා විසින් අධිෂ්ඨාන කරනලද කර්මාන්තයන් විධාන කරවන්නැ''යි කියා ඔහු සිටිය තනතුරෙහි තැබුවේය. ඒ තෙමේද මැනවයි කියා පිළි ගෙන එක් දවසක් නුවර ප්‍රතිසංස්කරණය කටයුතුවූ දඩු ගෙනෙන පිණිස වඩුවන් රැගෙන වනයට ගියේය. එහි ආයුෂ්මත් මහා කච්චායන ස්ථවිරයන් වහන්සේ වසන තැනට එළඹ තෙරණුවන් එහි පාංසුකූල චීවර දරා විවේකව හිඳිනවුත් දැක ඉරියව්වෙහිම පැහැදී කරනලද පිළිසඳර කථා ඇතිව වැඳ එකත්පසෙක හුන්නේය. ඕහට තෙරුන් වහන්සේ ධර්මදෙශනා කළහ. ඔහු ධර්මය අසා රත්නත්‍රයෙහි හටගත් ප්‍රසාද ඇතිව තිසරණයෙහි පිහිටුවා ''ස්වාමීනි අනුකම්පාකොට හෙට දවස මගේ දන භික්ෂූන් සමග ඉවසා වදළමැනව''යි කියා තෙරුණුවන්ට ආරාධනා කළේය. තෙරුවන් වහන්සේ තූෂ්ණීම්භාවයෙන් ඉවසා වදළසේක. හෙතෙම එතැනින් නික්ම නුවරට ගොස් ''මා විසින් හෙට දවස දනට තෙරුන් වහන්සේ ආරාධනා කරන ලදහ,

Non-commercial distribution

තොපත් මාගේ දානස්ථානයට ආයුතුය''යි කියා අනික් උපාසක වරුන්ට කීයේය. හෙතෙම දෙවෙනි දිනයෙහි උදෑසනම ප්‍රණීතවූ බාද්‍ය භෝජ්‍යයන් පිළියෙළ කරවා කල්දන්නවා භික්ෂූන් සමග වැඩිය තෙරුන් වහන්සේට පෙරගමන්කොට වැඳ ඉදිරිකරගනවුත් ගෙට වැඩම කරවූයේය. ඉක්බිත්තෙන් බොහෝ වටිනා කැප පසතුරුණු අතුරනලද අසුන්හී ස්ථවිරයන් වහන්සේ හා භික්ෂූන්ද වැඩහුන් කල්හි ගඳමල් දුම් පහන් වලින් පූජාකොට ප්‍රණීතවූ ආහාර පාන වර්ගයෙන් වළඳවා උපන් පැහැදීම් ඇතිව කරනලද ඇදිලි ඇතිව අනුමොදනාව අසා කරනලද භුක්තානුමෝදනා ඇති තෙරුන් වහන්සේ වඩින කල්හි පාත්‍රය ගෙන අනුව යන්නේ නුවර සීමා වෙන් නික්මී නවතිමින් කියන්නේ''ස්වාමීනි නුඹ වහන්සේලා විසින් නිතර මා ගේ ගෙදරට වැඩමවිය යුතුය''යි යාච්ඤාකොට තෙරුන්වහන්සේ ඉවසූබැවි දැන නැවතුණේය. මෙසේ හෙතෙම තෙරණුවන්ට උපස්ථාන කරමින් උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටීමෙන් සෝවාන් ඵලයට පැමිණියේය.

හෙතෙම විහාරයක්ද කරවිය. සියලුම තම නෑයන් ශාසන ය කෙරෙහි මනා පහන්සිත් ඇත්තවුන් කෙළේය. ඔහුගේ මව් වනාහි මසුරුමලයෙන් වැඩුණු සිත් ඇත්තියක්ව මෙසේ පරිහව කොට කීවේය. ''යම් හෙයකින් නුඹ මා අකැමැති කල්හිම මහණුන්ට ආහාරපාන දෙයිද? ඒ ආහාරපාන නුඹට පරලොවදී ලේවී උපදීවා''යි කීය. විහාර පූජා දිනයෙහි එක් මොනරපිල් මිටියක් දීමට අවසර දුන්නේය. ඈ කළුරිය කොට ප්‍රේත යොනියෙහි උපන්නේය. මොනරපිල් කළඹ දීම අනුමෝදන්වූ හෙතුවෙන් ඒ ප්‍රේතියගේ කෙශයෝ නිල්ව සිනිඳුව වෙළුණු අගඇතිව සියුම්ව දිගඇති වූවාහුය. ඕතොමෝ යම් කලෙක පැන් බොන්නෙමියි සිතා ගඩගානම් ගඟට බසිද එකල්හි ගඟ ලෙයින් පිරුණු වෙයි. ඕතොමෝ පස් පනස් හවුරුද්දක් මුළුල්ලෙහි සාපිපාසා දුකින් මිරිකීමෙන් යුක්තව ඇවිද එක් දිනක් කඩබාරෙවත ස්ථවිරයන් ගංතුවුරෙහි දිවාවිහරණයෙහි වැඩහිඳිනුවන් දැක තමන්ගේ කෙශයන්ගෙන් ශරීරය වසාගෙන තෙරුන්වෙත පැමිණ පැන් ඉල්වීය ඒ සඳහා කියනලදී:-

Non-commercial distribution

214. **දිවාවිහාරගතං භික්ඛුං-ගඞ්ගාතීරෙ නිසින්නකං,**
තං පෙතී උපසංකම්ම-දුබ්බණ්ණා හිරුදස්සනා.

215. **කෙසා චස්සා අතිදීඝා-යාවභූමාවලම්බරෙ,**
කෙසෙහි සා පටිච්ඡන්නා-සමණං එතදබ්‍රවී-ති

214-215. දුබ්බණ්ණා, දුර්වර්ණ වූ; හිරුදස්සනා, බියකරු දැකුම් ඇති; සාපෙති, ඒ ප්‍රෙතිකාමෝ දිවාවිහාරගතං, දිවාවිහරණයට පැමිණි; ගඞ්ගාතීරෙ; ගංතෙර; නිසින්නකං, හුන්නාවූ; තං භික්ඛුං, ඒ භික්ෂුහුවෙත; උපසඞ්කම්ම, එළඹියා; අස්සා, ඇගේ; කෙසාච, කෙශයෝද; අතිදීඝා, ඉතා දිගයහ; යාවභූමි, බිමදක්වා; අවලම්බරෙ, එල්බෙත්; සා, ඕතොමෝ; කෙසෙහි, ඒ කෙහෙයෙන්; පටිච්ඡන්නා, පිළිසන්වූවා; සමණං, ඒ ශ්‍රමණයන් වහන්සේට; එතං, මේ වචනය; අබ්‍රවී, කීයේය.

දුර්වර්ණවූ බියකරු දැකුම් ඇති තමන් ගේ කෙසයෙන් වැසුණ ශරීර ඇති ඒ ප්‍රෙතිය දිවාවිහරණයට පැමිණ ගංගා නදී තීරයෙහි වැඩහුන්නාවූ ඒ ශ්‍රමණයන්වෙත පැමිණ මේ වචනය කීයේය. තවද ඇගේ ඉතා දික්වූ කෙශයෝ බිම දක්වා එල්බෙති. මේ ගාථා දෙක සංගීතිකාරකයන් විසින් මේ කථාවේ මුලින්ම තබන ලද්දහ. ඒ ප්‍රෙතිකාමෝ විනාහි තෙරුන්වෙත එළඹ පැන් ඉල් වන්නි:-

216. **පඤ්චපණ්ණාසවස්සානි-යතො කාලකතා අහං,**
නාභිජානාමි භුත්තං වා-පීතං වා පන පානියං,
දෙහි ත්වං පානීයං භන්තෙ-තසිතා පානියාය මෙ-ති.

216. භන්තෙ, ස්වාමීනි; අහං, මම; යතො, යම් දවසක; කාලකතා, කලුරිය කෙළේවෙමිද; (එතැන්පටන්) පඤ්චපණ්ණාසවස්සා නි, පස්පණස් අවුරුද්දක් මුළුල්ලෙහි; භුත්තංවා, (ආහාර) කෑමක් හෝ; පානීයං, පැන්; පීතං වා පන; පිමක් හෝ; නාභිජානාමි, නොමදනිමි; තසිතා, පිපාසයෙන් මිරිකෙමි; පානීයාය, පැන් පිණිස ඇවිදිනාවූ; මෙ, මට; ත්වං, නුඹ වහන්සේ; පානීයං, පැන්; දෙහි ඉති, දුනමැනව.

ස්වාමීනි මම යම් දවසකදී කළුරිය කෙළෙමිද, එතැන්පටන් (මේ ප්‍රෙත යෝනියෙහි ඉපදී) පස් පණස් හවුරුද්දක් මුළුල්ලෙහි ආහාරයක් අනුභව නොකළෙමි. පැන් නොබීවෙමි. ස්වාමීනි නුඹ වහන්සේ පිපාසිතව පැන් පිණිස ඇවිදින්නා වූ මට පැන්දෙනු මැනවැයි කීය. ඉන්පසු:-

Non-commercial distribution

217. අයං සීතොදකා ගඞ්ගා-හිමවන්තතො සන්දති,
පිව එත්තො ගහෙත්වාන-කිං මං යාචසි පානියං.

218. සචාහං හන්තෙ ගඞ්ගාය-සයං ගණ්හාමි පානියං,
ලොහිතං මෙ පරිවත්තති-තස්මා යාචාමි පානියං.

219. කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-ගඞ්ගා තෙ හොති ලොහිතං.

220. පුත්තො මෙ උත්තරො න ම-සඩ්ඩො ආසි උපාසකො,
සො ච මය්හං අකාමාය-සමණා නං පවෙච්ඡති.

221. චීවරං පිණ්ඩපාතඤ්ච-පච්චයං සයනාසනං,
තමහං පරිභාසාමි-මච්ඡෙරෙන උපද්දුතා.

222. යං ත්වං මය්හං අකාමාය-සමණානං පවෙච්ඡසි,
චීවරං පිණ්ඩපාතඤ්ච-පච්චයං සයනාසනං.

223. එතං තෙ පරලොකස්මිං-ලොහිතං හොතු උත්තර,
තස්ස කම්ම විපාකෙන-ගඞ්ගා මෙ හොති ලොහිත-න්ති

217. සීතොදකා, සිහිල් ජලය ඇති; අයං ගඞ්ගා, මේ ගංගා නදීතෝමෝ; හිමවන්තතො, හිමවත් පව්වෙන්; සන්දති, ගලා බසියි; එත්තො, මේ ගඞ්ගානදියෙන්; ගහෙත්වාන, ගෙන; පිව, බොව; කිං, කුමක් හෙයින්; පානියං, පැන්; මං යාචසි, මගෙන් ඉල්වයිද.

218. හන්තෙ, ස්වාමීනි; සචෙ, ඉදින්; අහං, මම; ගඞ්ගාය, ගඞ්ගානදියෙහි; පානියං, පැන්; සයං, තෙමේ; ගණ්හාමි, ගන්නේ නම්; මෙ, මට; ලොහිතං, ලෙයවී; පරිවත්තති, පිරිනැමෙයි; තස්මා, එහෙයින්; පානියං, පැන්; යාචාමි, යාච්ඤාකරමි.

219. ගඞ්ගා, මහානදීතොමෝ; තෙ, තිට; ලොහිතං හොති, ලේවේද (සෙස්ස යටකියනලදී.)

220-221. මේ, මාගේ; පුත්තො, පුත්‍රවූ; උත්තරො නාම, උත්තර නම් මාණවකතෙම; සඩ්ඩො, ශ්‍රද්ධාවත්වූ; උපාසකො ආසි, උපාසකයෙක් විය; සොච, හෙතෙමේද; මය්හං මා; අකාමාය, නොකැමැති කල්හි; සමණානං, මහණුන්ට; චීවරං, සිවුරුද; පිණ්ඩපාතඤ්ච, පිණ්ඩපාතයද; සයනාසනං, සෙනසුන්ද; පච්චයං, ගිලන්පසද; පවෙච්ඡති, දෙයි; මච්ඡෙරෙන, මසුරු මලයෙන්; උපද්දුතා, පීඩිතවූ; අහං, මම; තං, ඔහුට, පරිභාසාමි, පරිභව කරමි.

Non-commercial distribution

222. මය්හං, මා; අකැමාය, අකමැති කල්හි; ත්වං; නුඹ; සමණානං. ශ්‍රමණයන්ට; යං, යම්බඳු; චීවරං, සිවුරුද; පිණ්ඩ-පාතංච, පිණ්ඩපාතයද; සයනාසනං, සෙනසුන්ද; පච්චයං, ගිලන්පසද; පවෙච්ඡසි, දෙයිද.

223. උත්තර, උත්තරය; එතං, මේ (ප්‍රත්‍යයසමූහය); තෙ, නුඹට; පරලොකස්මිං, පරලොව දී; ලොහිතං හොතු, ලේවේවා; තස්ස කම්මවිපාකෙන, ඒ අකුශල කර්මයා ගේ විපාක යෙන්; මෙ, මට: ගඞ්ගා, ගඞ්ගාන දී තොමෝ; ලොහිතං හොති ඉති, ලේවෙයි.

එම්බා ප්‍රෙතදුව මහත් පිනි ඇති බැවින් හිමවත්ය යි ලද නම් ඇති පර්වත රාජයා කෙරෙන් පටන්ගෙන සිහිල්දිය ඇති මේ ගඞ්ගා නම් නදිය ගලාබසියි, මේ මහගඟින් පැන්ගෙන රුවිවූ පරිදි බීපියව, කවර හෙයකින් මගෙන් පැන් ඉල්වාදූයි විචාළේය. එවිට ප්‍රෙතිය කියන්නේ ඉදින් ස්වාමීනි මම ගඟපැන් තෙ මේම ගත්තේවීනම් මාගේ පව්කම් වශයෙන් ලේවෙයි. (ඇ විසින් ගත් පමණ ජලය ලේවෙයි,) එහෙයින් මම නුඹ වහන්-සේගෙන් පැන් ඉල්වමියි කීයේය. එකල තෙරුන් වහන්සේ විචාරන්නාහු, ප්‍රෙතිය කී විසින් කයින් වචසින් මනසින් පෙර කවර දුශ්චරිතයක් කරන ලද්දේද, කවර අකුශල කර්මයක්හු ගේ විපාකයකින් ගංගානම් ගඟජලය නිට ලේ වේදූයි අසා වදළහ. එවිට ප්‍රෙතිය කියන්නේ මාගේ පුත්‍රවූ උත්තර නම් මාණවක තෙමේ ශ්‍රද්ධාවත් උපාසකයෙක් විය, එතෙම මා නොකැමති කල්හි ශ්‍රමණයන්ට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසය දෙයි, මසුරු මලයෙන් උපද්‍රැතවූ මම ඔහුට පරුෂ වචනයෙන් නින්ද කළෙමි. නුඹ මා නොකැමැති කල්හි ශ්‍රමණයන්ට යම් බඳු චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍ය-යන් දෙයිද, ඒ මේ දෙනලද දෙය එම්බා උත්තරය තට පරලොවදී ලේ වේවායි කියා දෙස් කිරීම් වශයෙන් කරනලද ඒ පාපකර්මයා ගේ විපාකය හෙතු කොටගෙන ගඞ්ගා නම් නදිය මට රුධිරවේය යි කීයේය.

එකල්හි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතිය උදෙසා භික්ෂු සඞ්ඝයාහට පියයුතු පැන් දුන්හ, පිඬුපිණිස හැසිර බත්ගෙනැවිත් භික්ෂූන්ට දුන්හ, කසල ගොඩවල් ආදියෙන් පාංශු

Non-commercial distribution

කුලවිස්ත්‍ර ගෙනැවිත් සෝදා බිසිද විමිලිකාවන්ද කොට භික්ෂූන්ට දුන්හ. ඒ හෙතුවෙන් ඒ ප්‍රෙතියට දිව්‍ය සම්පත් පහළවූහ. ඈ තෙරුන් වහන්සේ වෙත පැමිණ තමා විසින් ලත් දෙව්සැප තෙරණුවන්ට දැක්වීය. ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය තමන් වහන්සේ වෙත පැමිණි ඔව් පිරිසට ප්‍රකාශකොට ධර්මකථාව දෙශනා කළසේක. ඒ හෙතුවෙන් මහජන තෙමේ හටගත් සංවෙග ඇතිව පහවූ මසුරුමල ඇතිව දනශීලාදි දශකුශල ධර්මයෙහි මනාව ඇලුණේවිය. මේ ප්‍රෙතවස්තුව වනාහි දෙවෙනි සංගායනා වෙහිදී සංග්‍රහවට නගනලදුයි දතයුතු.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගියට ඇතුළත් දසවෙනි උත්තරමාතෘ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

---

2. 11 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගීත්තර්ගීත එකොළොස් වෙනි **සුත්ත ප්‍රෙතවස්තුව** කියනු ලැබේ.

ඒ සුත්ත ප්‍රෙතවස්තුහුගේ උප්පත්තිය කවරිද යත්:-සැවැත් නුවරට සමීපවූ එක්තරා ගමෙක අපගේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ලොව පහළනුවූ කල්හිම හවුරුදු හත්සියකට පෙර එක්තරා දරුවෙක් තෙම එක් පසේබුදුන් වහන්සේ නමකට උපස්ථාන කළේය. ඔහුගේ මව් තොමෝ ඔහු තරුණ වයසට පැමිණි කල්හි ඔහට සමාන කුලයකින් එක්තරා කුල දියණියක් විවාහ කොට ගෙනාවේය, විවාහ දවසෙහිම ඒ කුමාරතෙමේ යහළුවන් සමග ජලස්නානයට ගියේ නාගයෙකු විසින් දෂ්ට කරන ලදුව කාලක්‍රියා කළේය. යකෙකු විසින් අල්වා ගැනී-මෙන්යයි කියාද සමහරු කියත්. ඒ කුමාරතෙම පසේබුදුන්ට උවටැන් කිරීමෙන් බොහෝ කුශල කර්මයන් කොට සිටියේ වී නමුදු ඒ තරුණිය කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් විමාන ප්‍රෙතයෙක්ව උපන්නේය මහත් සෘඩි හා මහානුභාව ඇත්තේද විය. එකල්හි ඒ විමානප්‍රෙත තෙම ඒ කුමරිය තම විමනට ගෙනයනු කැමතිව "කවර උපායකින් මෑ දෘෂ්ටධර්මවෙදනීයවූ කුශල කර්මයක් කොට මා හා සමග මේ විමන්හි සිත්අලවන්නේ දෝහෝයි කියා ඇට දිව්‍ය සම්පත් විඳීමට හෙතුව විමසමින් පසේබුදුන් සිවුරු කර්මාන්තය කරනුවන් දැක මිනිස් රුවින් එහි

Non-commercial distribution

ගොස් වැඳ ''ස්වාමීනි කිමෙක්ද නුල්වලින් වැඩ ඇත්තේද''යි කියා ඇසුවේය. ''උපාසකය මම සිවුරු කර්මාන්තය කරමු''යි කීසේක. එසේවී නම් ස්වාමීනි අසවල් තැනට නූල් සිහමනේ වඩිනු මැනව''යි කියා ඒ කුමරියගේ ගෙය පෙන්විය. පසේ-බුදුරජාණෝ එතනට වැඩමවා ගෙදොර වැඩ සිටියහ. එකල්හි ඈ එහි වැඩසිටිය පසේබුදුන් දැක පහන් සිත් ඇතිව ''මාගේ ආර්‍යියන් වහන්සේ නූල් වලින් වැඩකැමැති සේකැ''යි දැන එක් නූල්ගුළියක් දුන්නේය. එවිට ඒ අමනුෂ්‍ය තෙමේ මනුෂ්‍ය රූපයෙන් ඒ තරුණියගේ ගෘහයට ගොස් ඇගේ මවට යාච්ඤ්ඤා-කොට ඈ හා සමග කිහිප දවසක් වාසයකොට ඇගේ මවට අනුග්‍රහ පිණිස ඒ ගෙයි සියලු භාජනයන් රන් රුවන්වලින් පුරවා ''මේ දෙවියන් විසින් දෙනලද ධනය කිසි වෙකු විසින් නොගත යුතුය''යි කියා සියලු භාජනවල මත්තෙහි නම් ලිව්වේය. හෙතෙම් ඒ කුමරියත් හැරගෙන තමාගේ විමනට ගියේය. ඇගේ මව් බොහෝ ධනසම්පත් ලබා තම නෑයන්ට හා දුගී මගී ආදීන්ටද දී තමාද අනුභවකොට කළුරිය කරන්නී ''ඉදින් මාගේ දියණියෝ අවාහු නම් මේ ධනය පෙන්නාලව''යි නෑයන්ට කියා කළුරිය කළේය. ඉන්පසු අවුරුදු සත්සීයක්හුගේ ඇවැමෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව ඉපිද පවත්වනලද උතුම් දම්සක් ඇතිව අනුක්‍රමයෙන් සැවැත්නුවර වාසය කර වදරන කල්හි ඒ අමනුෂ්‍යයා සමග විසුවාවූ ඒ ස්ත්‍රියට කලකිරීමක් උපන, ඕතොමෝ ඒ අමනුෂ්‍යයාට ''ආර්‍ය්‍ය පුත්‍රය මා ස්වකීය ගෘහයට නැවත පමුණුවනු මැනවැ''යි කියන්නී:-

224. අහං පුරෙ පබ්බජිතස්ස භික්ඛුනො
සුත්තං අදාසිං උපගම්ම යාචිතා,
තස්ස විපාකො විපුලඵලූපලබ්භති
බහූ ච මෙ උපපජ්ජරෙ වත්ථකොටියො.

225. පුප්ඵාභිකිණ්ණං රමිතං විමානං
අනෙකචිත්තං නරනාරි සෙවිතං
සාහං භුඤ්ජාමි ච පාරුපාමි ච
පහූතචිත්තා න ච තාව ධීයති.

226. තස්සෙව කම්මස්ස විපාකමන්වයා
සුඛඤ්ච සාතඤ්ච ඉධූපලබ්භති,
සාහං ගන්ත්වා පුනරෙව මානුසං
කාහාමි පුඤ්ඤානි නයයාපුත්තම-න්ති.

Non-commercial distribution

224. උපගම්ම, (මාවෙත) එළඹ; යාචිතෝ, (භික්ෂාව-යාචනයෙන්) ඉල්ලන ලද්දවූ; අහං, මම; පබ්බජිතස්ස. (ක්ලෙශයන් නිරවශෙෂකොට ප්‍රහීණ කළ බැවින්) ප්‍රව්‍රජිත නම්වූ; භික්ඛුනෝ, (භග්න ක්ලෙශ භාවයෙන්) භික්ෂුවූ පසේබුදුන්ට; පුරෙ; පෙර, සුත්තං අද සිං, නූල්දුනිමි; තස්ස, ඒ දුනයාගේ; විපුල ඵලෝ, මහත්ඵල ඇති: විපාකෝ, විපාකය; උපලබ්භති; දැන් ලැබෙයි; බහුව, බොහෝ වූම; වත්ථකොටියෝ, කෙලගණන් වස්ත්‍රයෝ; මෙ, මට: උප පජ්ජරෙ, උපදිත්.

225. පුප්ඵාභිකිණ්ණං, (නොයෙක්) මලින් ගැවසුණාවූ; රම්මං සිත් අලවනලද; අනෙක චිත්තං, නානාවිධ චිත්‍රකම් ඇති (නොහොත්) නොයෙක් රුවනින් විසිතුරු රූ ඇති; නරනාරී සෙවිතං, (පරිචාරකවූ) ස්ත්‍රී පුරුෂයන් විසින් සෙවුනා ලද; විමා නං, විමන; සා අහං, ඒ මම; පරිභුඤ්ජාමිව, පරිභොග කරමි; පාරුපාමිව, (කැමති වස්ත්‍රයක්) පොරවාගනිමි; පහූත චිත්තා, බොහෝ වස්තූපකරණ ඇත්තාහ; නවතාවඛීයති, (එය) ක්ෂය නොවෙයි.

226. තස්සෙව කම්මස්ස, ඒ (සූත්‍රදනමය) කුශල කර්මයාගේ; අන්වයා, හෙතුවෙන්; සුඛං විපාකං, සැපවිපාකවූ; සාතංච, (ඉෂ්ට මධුර සඞ්ඛ්‍යාත) සැපය; ඉධ, මේ විමනෙහිදී: උපලබ්භති, ලැබේ; සා අහං, ඒ මම; පුනඵව, නැවතද; මානුසං, මිනිස්ලොවට; ගන්ත්වා, ගොස්; පුඤ්ඤානි, කුසල්; කාහාමි; කරන්නෙමි; අය්‍යපුත්ත, ස්වාමිපුත්‍රය; මං මා; නය ඉති, පමුණුවනු මැනව.

''ආයස්මයෝ උදෙසා සිටින් මෙය ආයස්මයන්ගේ ඉල්වීමය''යි කියනලද කායවිඤ්ඤත්ති ප්‍රයොග සංඛ්‍යාත භික්ෂාචය්‍යාවෙන් මාගේ ගෙදරට වැඩමවා ඉල්වන ලද්දවූ මම කාමාදි කෙලෙස්-මල තම සන්තානයෙන් නිරවශෙෂකොට දුරුකළ හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රව්‍රජිත නම් වූ බුන්කෙලෙස් ඇති බැවින් භික්ෂු නම්වූ පසේ බුදුකෙනෙකුන්ට කපුවලින් කටින ලද නූල් ගුලියක් දුනිමි. ඒ නූල් දුනයාගේ මහත් ඵලයවූ විපාකය මේ කාලයෙහි ලැබේ. නොයෙක් සියදහස් ගණන් ප්‍රභෙද ඇති වස්ත්‍රයෝ උපදිත්.

නොයෙක් මලින් ගැවිසී ගත්තාවූ සිත් පිනවනලද නන්වැදෑරුම් සිතියම් හෝ නොයෙක් මුතුමැණික් ආදි රත්නවලින් විසි

Non-commercial distribution

තුරුවූ පරිවාරිකාවූ නරනාරීන් විසින් සෙවුනා ලද විමානය ඒ මම පරිභොග කරමි. නොයෙක් කෙළඟණන් වස්ත්‍රයන් අතුරෙන් කැමැති කැමැතිවූ වස්ත්‍ර හඳිමි පොරවා ගනිමි, බොහෝ වස්තූපකරණ ඇත්තෙමි. ඒ වස්තු ක්ෂය නොවෙයි.

එම සූත්‍ර දනමය පුණ්‍ය කර්මයාගේ හෙතු භාවයෙන්ම කැමති මිහිරි සැප මේ විමන්හිදී ලැබේ. ඒ මම නැවත මිනිස්ලොවට ගොස් සුවවිසෙස් නිපදවන්නාවූ පින් කරන්නෙමි. ආයුෂ්පුත්‍රය නුඹ මා මිනිස්ලොවට පමුණුවනු මැනවයි කීය. එය අසා ඒ අම නුෂ්‍යතෙම ඈ කෙරෙහි පිළිබඳ සිත්ඇති බැවින් හා කරුණා වෙන්ද මිනිස්ලොව ගමන නොකැමැති වෙමින්:-

227. **සතත තුවං වස්සසතා ඉධාගතා**
ජිණ්ණා ච වුඩා ච තහිං භවිස්සසි,
සබ්බෙව තෙ කාලකතා ච ඤාතකා
කිං තත්ථ ගන්ත්වාන ඉතො කරිස්සසි-නි.

227. තුවං, නී, සත්තවස්සසතා, හවුරුදු සත්සියකින් පෙර; ඉධ, මෙතනට; ආගතා, පැමිණියා වෙයි; තහිං, ඒ මිනිස්ලොවදී; ජිණ්ණාව, ජරාජීර්ණවූවාත්; වුඩාව, වයොවෘඩවූවාත්; භවිස්සසි, වන්නෙහිය; තෙ, නිගේ; සබ්බෙව ඤාතකාව, සියලුම නෑයෝද; කාලකතා, කළුරිය කළෝය; ඉතො, මෙතැනින්; තත්ථ, එහි; ගන්ත්වාන, ගොස්; කිං කරිස්සසි ඉති, කුමක් කරන්නෙහිද.

පින්වතිය, නී මීට අවුරුදු සත්සියයකට උඩදී මේ විමනට පැමිණියාය, මේ විමානයෙහිදී දිව්‍යමය ඍති ආහාරයන්ගෙන් පොෂ්‍ය කරනලද ශරීරය ඇති නී කර්මානුභාවයෙන් මෙපමණ කල් තරුණාකාරයෙන්ම සිටියාය, මේ විමන හැරගියේ කර්මක්ෂය වන බැවින් හා මනුෂ්‍යයන්ට අයත් ඍතු ආහාරයන්ගේ වශයෙන්ද ඒ මිනිස්ලොවදී ජරාජීර්ණවූ වයොවෘඩවූ තැනැත්තියක් වන්නෙහිය, දීඝකාලයක් ඉක්මගිය බැවින් නිගේ සියලු නෑයෝද මළාහුය, එහෙයින් මේ දෙව්විමන හැර ඒ මිනිස්ලොවට ගොස් නී කුමක් කරන්නෙහිද, ඉතිරි ආයුකාලයද ගෙවෙනතුරු මෙහිම වෙසෙවයි කීයේය. මෙසේ ඔහු විසින් කියන ලද්දවූ ඒ ස්ත්‍රී තොමෝ ඔහුගේ කීම නොඅදහමින් නැවතද:-

Non-commercial distribution

228. **සත්තෙව වස්සානි ඉධාගතාය මේ**
දිබ්බඤ්ච සුඛඤ්ච සමප්පිතාය,
සාහං ගන්ත්වා පුනරෙව මානුසං
කාහාමි පුඤ්ඤානි නයය්‍යපුත්ත ම-න්ති.

228. අය්‍යපුත්ත, ස්වාමිපුත්‍රය, ඉධ, මෙතනට; ආගතාය. පැමිණියාවූ; දිබ්බංච සුඛංච, දිව්සැපත්; සමප්පිතාය, වැළඳුවාවූ; මේ, මට; සත්තෙව වස්සානි. හවුරුදු සතක්ම වූහ: (සෙස්ස යට කියනලදී.)

ආය්‍යපුත්‍රය, මේ විමනට පැමිණියාවූ දිවපහසුව වළඳන්-නාවූ මට හවුරුදු සතක්ම ඉක්ම ගියාහුයයි සිතමි, (හවුරුදු සත්සියයක් මුළුල්ලෙහි දිවසැපතින් පිනාගිය හෙයින් බොහොම කල් ඉක්ම ගියේයයි නොසලකමින් මෙසේ ගියේය.) ඒ මම නැවත මිනිස්ලොවට පමුණුවනු මැනවයි කීය.

මෙසේ ඇ විසින් කියනලද්දවූ ඒ විමාන ප්‍රෙතතෙම නොයෙක් ප්‍රකාරයෙන් ඇට අවවාද කොට තී මෙයින් සත්දිනකට වැඩියෙන් ජීවත්නොවෙයි. තීගේ මෑණියන් විසින් තබනලද මා විසින් දෙනලද ධනය ඇත්තේය. ඒ ධනය ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දන්දී මේ විමතෙහිම ඉපදීම ප්‍රාර්ථනා කරවයි කීයා ඇ අතින් අල්වා ගෙනවුත් ගමමැද තබා ''මෙතනට පැමිණි අනික් ජනයන්ටද ශක්ති පමණින් පින්කරව් යයි අවවාද කරව''යි කියා ගියේය. එහෙයින් කියනලදී:-

229, **සෝ තං ගහෙත්වාන පසය්හ බාහායං**
පව්වානයිත්වාන ථෙරිං සුදුබ්බලං,
වදෙසි අඤ්ඤම්පි ජනං ඉධාගතං
කරොථ පුඤ්ඤානි සුඛූපලබ්භතී-ති.

229. සෝ, ඒ විමාන ප්‍රෙතතෙම; ථෙරිං, වයොවෘඩවූ; සුදුබ්බලං, අතිශයින් දුර්වලවූ; තං, ඒ ස්ත්‍රිය; පසය්හ, බලාත්-කාරයෙන්, බාහායං. අතින්; ගහෙත්වාන, අල්වාගෙන පතිආනයිත්වාන, නැවත (ගමට) පමුණුවා; ඉධ, මෙතනට; ආගතං, පැමිණියාවූ; අඤ්ඤම්පිජනං, අනිත් ජනයාටත්; පුඤ්ඤානි, පින්; කරොථ, කාව්; සුඛූපලබ්භති ඉසි, සැපලැබෙයයි; වදෙසි, කියව,

Non-commercial distribution

ඒ විමාන ප්‍රෙතතෙම වෘඩවූ ජරාජීර්ණ භාවයෙන් ඉතා දුබලවූ ඒ ස්ත්‍රිය බලාත්කාරයෙන් පමුණුවන්නියකුමෙන් අතින් අල්වා ගෙන ඇ ඉපදී වැඩුණු ගමට නැවත ගෙනැවිත් සිටුවා මෙසේ කීය, (ඒ ස්ත්‍රිය වනාහි ඒ විමනින් ඉවත්වීමට අනතුරුවම ජීර්ණවූ වෘඩවූ මහලුවූ කල් ඉක්මගිය මහලු වයසට පැමිණි තැනැත්තියක් විය) සොඳුර නුඹත් පින්කරව, තී දැකීම සඳහා මෙතනට පැමිණෙන අනිකුත් ජනයාටද ගිනිගත් හිස හෝ වස්ත්‍රයද නොබලා යහපත් මුහුණ ඇතිව දනශීලාදීවූ පින්කරවියයි කියනු. පින එකාන්තයෙන්ම ඒ කුශලයාගේ විපාකයවූ සැප ලබාදෙයි. මෙහි සැක නොකටයුතුයයි කියා අවවාද කරව. මෙසේ කියා ඔහු ගිය කල්හි ඒ ස්ත්‍රියද තම නැයන් වසන තැනට ගොස් ඔවුන්ට තමන් හඳුන්වා ඔවුන් විසින් බාරදෙනලද ධනය හැරගෙන මහණ බමුණන්ට දන්දෙමින් තමා ලහට පැමිණි ජනයන්ට මෙසේ කීයේය,

230. දිට්ඨා මයා අකතෙන සාධුනා
පෙතා විහඤ්ඤන්ති තථෙව මානුසා,
කම්මඤ්ච කත්වා සුඛවෙදනීයං
දෙවා මනුස්සා ච සුඛෙ ඨිතා පජා-ති.

230. අකතෙන, නොකළාවූ; සාධුනා, කුශල කර්මයෙන්; පෙතා, ප්‍රෙතයෝද: තථෙව, එසේම; මානුසා, මිනිස්සුද; විහඤ්ඤන්ති, වැනසෙත්; සුඛවෙදනීයං, සැපවිපාකවූ; කම්මංච-කත්වා, කුශල කර්මයකොට; සුඛෙඨිතා, සැපතෙහි පිහිටියාවූ (නොහොත්) සැපයෙන් දියුණුවූ; දෙවා, දෙවිවූද; මනුස්සාව, මිනිස්වූද; පජා, ප්‍රජාව; මයා මාවිසින්; දිට්ඨා ඉති, දක්නාලදී.

ප්‍රෙතයෝ යම්සේද එසේම නොකරනලද කුශලයෙන් හා කරනලද අකුශල කර්මයෙන්ද පෙළෙමින් සාපිපාසාදියෙන් විඩාවට පැමිණෙමින් මහදුක් විඳින්නාවූ මනුෂ්‍යයෝ මාවිසින් දක්නාලදහ. සැප විඳියයුතුවූ කුශල කර්මයකොට ඒ කරනලද කුශල කර්මයෙන් හා නොකරනලද අකුශල කර්මයෙන්ද දෙවිමිනිසුන්ට ඇතුළත් සැපයෙහි සිටී ප්‍රජාව මාවිසින් දක්නාලදී මේ කාරණය තමහට ප්‍රත්‍යක්ෂ විය. එහෙයින් තෙපි පව් දුරින්ම දුරුකරමින් පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙවියයි කීය.

මෙසේ වනාහි අවවාද දෙමින් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට සත් දවසක් මුළුල්ලෙහි මහදන් පවත්වා සත්වෙනි දිනයෙහි කළුරිය

Non-commercial distribution

මකාට තව්තිසා දෙව්ලොව උපන්නීය. භික්ෂූහු එපවත් භාග්‍ය වතුන් වහන්සේට සැළකලෝය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට සම්ප්‍රාප්ත පර්ෂත්හට ධර්ම දෙශනා කළසේක. විශෙෂ වශයෙන්ද පසේබුදුන් කෙරෙහි පවත්වන ලද දනයාගේ මහත්ඵලබව හා මහානිසංස බවත් වදළසේක, ඒ ධර්මකථාව අසා මහජනයා පහකරනලද මසුරුමල ඇතිව දනාදී කුශල ක්‍රියායෙහි ඇලුණේය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරී වර්ගයට ඇතුළත් එකොළොස්වෙනි සූත්‍ර ප්‍රෙතවස්තු වර්ත්තනාව කියා නිමවනලදී.

2. 12 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගාන්තර්ගත දෙළොස්වෙනි **කණ්ණමුණ්ඩ ප්‍රෙතවස්තුව** කවරහ යත්.

විශ්වජගදීශ්වර ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසයකර වදරන සමයෙහි කණ්ණමුණ්ඩ ප්‍රෙතියකු අරභයා මේ වස්තුව දෙශනා කරනලදී. යටගිය දවස කසුප් බුදුන් කල්හි කිම්බිල නුවර සෝවාන්වූ එක් උපාසකයෙක් තෙම පන්සීයක් උපාසකවරුන් සමග සමාන අදහස් ඇතිව මල්වතු වැවීම් හේදඩු දැමීම් සක්මන්වලු තැනීම් ආදි පුණ්‍ය කර්මයන්හි තත්පරව වසන්නේ සඞ්ඝයාහට විහාරයක් කරවාදී ඒ උපාසකයන් සමග කලින්කල විහාරයට යයි. ඒ උපාසකවරුන්ගේ භාය්‍යාවෝද උපාසිකාවෝවී ඔවුනොවුන් සමගිව මල්ගඳවිලවුන් ආදියගත් අත් ඇතිව කලින්කල විහාරයට යන්නාහු අතරමග ආරාම හා විශ්‍රාම සභාදීන්හු නැවතී විඩා සංසිඳුවාගන යන්නාහුය. එකල්හි එක්දවසක් එක් සභාශාලාවක රැස්වසිටි ධූර්ත පුරුෂයෝ කිහිප දෙනෙක් ඒ ස්ත්‍රීන් ඒ ශාලාවෙහි නැවතීසිට ගිය කල්හි ඇලාගේ රූපසම්පත්තිය දැක පිළිබඳ සිත් ඇතිව ඔවුන් ශීලාචාර ගුණ සම්පන්නබව දැන ''මැලාඅතරෙන් එකියෙකුගේවත් ශීලභෙදය කරන්ට කවරෙක් සමර්ථවේද''යි කියා කථාවක් ඉපදවූවාහුය. එහි සිටි එක්තරා ධූර්තයෙක් ''මම සමර්ථවෙමි''යි කීයේය. එකල්හි ඒ ධූර්තයෝ ''ඔහු හා සමග (මසු) දහසකින් අද්භූත (ඔට්ටු) කර මුය''යි කියා ඔට්ටු කළෝය.

Non-commercial distribution

''ශීලභෙදය කළ කල්හි නුඹට අප විසින් දහසක් දියයුතුය. ශීලභෙදය නොකළ කල්හි නුඹ විසින් අපනට දහසක් දියයුතු''යි කීහ හෙතෙම වස්තු ලොභයෙන් හා ඛියෙනුත් නොයෙක් උපායවලින් ගායනා කරන්නේ ඒ උපාසිකාවන් සභාවට ආකල්හි මනාව මුදනලද සත්තතකින් යුක්තවූ ඉතා මිහිරි ස්වරඇති වීණාව වාදනය කරමින් මධුර ස්වරයෙන් පඤ්චකාම නිශ්‍රීතවූ ගීතිකා කියමින් ඒ ස්ත්‍රීන් අතරෙන් එක් ස්ත්‍රියක් ගීතිකා ශබ්දයෙන් පොළඹවා ශීලභෙදයට පමුණුවා ඈ හා සමග වීප්‍රතිපත්තියට පැමිණ හෙවත් අසඛර්මයෙහි යෙදී ඒ ධූර්ත පුරුෂයන්ගෙන් දහස දිනාගත්තේය. ඔහු විසින් දහසින් පරදවනලද ඒ ධූර්තයෝ ඇගේ ස්වාමිපුරුෂයාහට ඒ කාරණය කීවාහුය. ඒ ස්වාමිපුරුෂයා එය නොඅදහමින් ''ඒ ධූර්ත පුරුෂයෝ යම්සේ මට කීහුද කීම තී මෙබඳු තැනැත්තියක් වීදැ''යි කියා ඇගෙන් විචාළේය. එවිට ඕතොමෝ ''මම මෙබන්දක් නොදනිමි''යි කියා ප්‍රතික්ෂෙප කොට ඒ ස්වාමිපුරුෂයා එය නොඅදහන කල්හි ළඟ සිටිය සුනඛයෙකු පෙන්වා ''ඉදින් මා විසින් එබඳු පාපකර්මයක් කරන ලද්දේවී නම් මේ කන්සිඳපු කළු බලුතෙමේ ඒ ඒ භවයෙහි උපන් මා කාදමාවා''යි කියා බොරු දිවිරීම කළේය. අනික් පන්සීයක් ස්ත්‍රීහුද ඒ ස්ත්‍රිය අනාචාරයෙහි හැසුරුණු බව දන්නාහු ''කිමේක්ද මෑ එබඳු පාපකර්මයක් කළේද නොහොත් නොකළේදැ''යි කියා ස්වාමි–පුරුෂාදීන් විසින් විචාරණ ලද්දාහු ''අපි එබන්දක් නොදනිමුය'' යි බොරු කියා ''ඉදින් අපි එබන්දක් දනිමුනම් භවයක් භවයක් පාසා මෑටම දසියෝ වන්නෙමුය''යි කියා බොරු දිවිරීම කළාහුය. ඉක්බිත්තෙන් ඒ අතිචාරිණී ස්ත්‍රිය ඒ විපිළිසර සිතින් දැවුණුසිත් ඇතිව වියලී නොබෝ කලකින් මැරිගොස් හිමවත් පර්වතරාජයා සමීපයෙහිවූ සත්වැදෑරුම් මහවිල් අතරෙන් එකක්වූ කණ්ණමුණ්ඩනම් විල්තෙර සමීපයෙහි විමාන ප්‍රේතියක්ව උපන්නීය. ඇගේ විමන අසල කර්මවිපාකය විඳීමට සුදුසුවූ එක් පොකුණක් පහළ වූයේය. සෙසු පන්සීයක් ස්ත්‍රීහු කළුරිය කොට බොරුදිවුල අකුශල කර්ම වශයෙන් ඇටම දසියෝව උපන්නාහුය, ඈ ඒ පෙරකරනලද පින්කම්හුගේ විපාකය හෙතුකොටගෙන දවල් කාලයෙහි දිව්‍යසම්පත් අනුභවකොට අර්ධරාත්‍රියෙහි පාපකර්ම බලයෙන් චොදනා කරන ලදුව

Non-commercial distribution

යහනින් නැඟිට පොකුණුතෙරට යයි; එතනට ගිය ඒ ස්ත්‍රීය ඇත්පැටවෙකු පමණවූ භයඞ්කර රූප ඇති සිදුණු කන්ඇති තියුණු දික් ලප දළ ඇති ඉතා දිලිසෙන කිහිරි අඟුරු පිඩක් බඳු නෙත් ඇති නිතර පැවැති විදුලි සමූහයක් වැනි දිවකින් යුක්තවූ තද තියුණු නියපොතු ඇති රළු දික් දුවිණි ලොම් ඇති එක් කාළසුනඛයෙක් තෙම ඒ පොකුණෙන් නික්ම අවුත් ඇ. බීමහෙලා ඉතා ඛඩසයින් පෙළෙණුවෙකු සෙයින් බලාත්-කාරයෙන් අල්වාගන කමින් ඇටසැකිල්ල පමණක් ඉතිරිකොට දත්වලින් හැරගෙනැවිත් පොකුණෙහි දමා අතුරුදන්වේයි මීතොමෝද ඒ පොකුණේ ඛහාලු කෙණෙහිම ප්‍රකෘති රූපධාරීව විමනට නැඟි යහනෙහි නිදන්නීය. අනික් ස්ත්‍රීහු ඈට වහල්වම දුක් විඳිත්. මෙසේ එහි වසන්නාවූ ඔවුන්ට හවුරුදු පන්සිය පණසක් ඉක්ම ගියාහුය.

ඉක්බිති පුරුෂයන්ගෙන් තොරව දිවසැප විඳින්නාවූ ඔවුන්ට කලකිරීම ඇතිවූහ. එහිදු කණ්ඩමුණ්ඩ විලෙන් නික්මුණු පවිත්‍ර සිදුරකින් අවුත් ගඩිගානම ගඟට වැටුණු එක් ගඟක් ඇත්තේය. ඔවුන් වසන තැන සමීපයෙහිවූ දිව්‍යමය ඵලඇති අඹ ගසින් හා කොස් දෙල් ආදී ගස්වලිනුත් හෙබියාවූ උයන්වත්තක් සමාන එක අරණ්‍ය ප්‍රදෙශයක් ඇත්තේය. ඒ ස්ත්‍රීහු මෙසේ සිතුවාහුය. ''අපි මේ අඹගෙඩි මේ ගඟේ ඛහා-ලන්නෙමු. මේ ආම්‍රඵල දැක ඵල ලොභයෙන් කිසියම් පුරුෂයෙක් මෙතනට ආයේනම් යහපත, ඔහු හා සමග කාමරතියෙහි යෙදෙන්නෙමුය''යි කියා ඒ ස්ත්‍රීහු එසේ කළාහුය ඇලා විසින් ඛහලනලද ආම්‍රඵලයන් සමහරක් තාපසයෝ ගත්තාහුය. සමහරක් වන චරකයෝ ගත්තාහුය. සමහරක් කවුඩෝ හැරගෙන ගියාහුය. සමහරක් ගංඉවුරෙහි රැඳුණාහුය. එක අඹගෙඩියක් වනාහි ගඟ ජලපහරට අසුවී පිළිවෙළින් බරනැස් නුවරට පැමිණියේය. එකල්හිදු බරනැස් රජතෙමේ ලෝහ දැලින් වටකරනලද ගංගා ජලයට බැස ස්නානය කරයි. එකල්හි ගඟ වතුර පහරින් පාවුණ ඒ අඹගෙඩිය වනාහි පිළිවෙළින් අවුත් ලෝහදැලේ රැඳුණේය. වණ් ගන්ධ රස සම්පන්නවූ මහත් ඒ දිව්‍යආම්‍ර ඵලය දැක රාජපුරුෂයෝ රැගෙන රජහට පිළිගැන්වූහ. රජතෙම ඒ අඹගෙඩියෙන් ස්වල්ප මාත්‍රයක් හැරගෙන විමසීම පිණිස සිරගෙයි සිටි බධප්‍රාප්ත එක්සො-

Non-commercial distribution

රෙකුට කෑමට දුන්නේය. හෙතෙම එය අනුභවකොට ''දෙවයන් වහන්ස මාවිසින් මෙබඳු අඹ මීටපෙර නොකන ලද්දේය. මේ දිව්‍යමය ආම්‍රඵලය කැයි මම සිතමි''යි කීය. රජතෙමේ නැවතද ඔහට එක් අඹකැල්ලක් දුන්නේය, හෙතෙම එයද කා ශරීරයෙහි රැළි හා හිස පැසීමද නැතිවී අතිශය මනොහර ශරීර ඇතිව යෞවන වයස්හි සිටියෙකු මෙන් විය. එය දැක රජතෙම ආශ්චර්‍යාද්භූත සිත් ඇතිව ඒ අඹගෙඩිය වළඳ ශරීරයෙහි විශෙෂයලබා ''කොතනක මෙවැනි ආම්‍රඵලයෝ ඇත්තාහුද''යි කියා මනුෂ්‍යයන්ගෙන් විචාළේය. ''දෙවයන් වහන්ස හිමවත් පර්‍වත රාජයා සමීපයෙහි ඇත්තාහුය''යි කියා මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය. එය ගෙනෙන්ට හැක්කේදැයි විචාරණ ලද්දාහු ''දෙවයන් වහන්ස වනචරකයෝ දනිත්ය''යි කීවාහුය. රජතෙම වන චාරීවූ වැද්දන් කැඳවා ඔවුන්ට එපවත් කියා ඔවුන් එකතුව කථාකොට බාර දෙන ලද එක් වනචරයෙකුට කහවණු දහසක්දී ''තෝ වහා යව මට මෙවැනි අඹපල ගෙනෙව''යි කියා නියම කොට ඔහු පිටත් කර හැරියේය. ඒ වැදිතෙම ඒ කහවණු දහස අඹුදරුවන්ට දී මාඟොපකරණ හැරගෙන ගඟඉහළ කණ්ණමුණ්ඩ විලට අභිමුඛව ගොස් මනුෂ්‍යපථයක් ඉක්මවා ගොස් කර්ණමුණ්ඩ විලෙන් මතු සැටයොදුන් පමණ ප්‍රදෙශයෙහිදී එක් තවුසෙකු දැක කථාකොට ඒ තාපසයා විසින් කියනලද මාඟියෙන් යන්නේ නැවත තිස්යොදුන් පමණ පෙදෙස්හිදී එක් තාපසයෙකු දැක කථාකොට ඔහු විසින් කියනලද මඟින් යන්නේ නැවත පසළොස් යොදුන් පමණ තන්හිදී තවත් තවුසෙකු දැක ඔහුට තමා පැමිණි අයුරු කීයේය. තාපසතෙම ඔහුට අවවාද කළේස. ''මෙතැන් පටන් මේ මහා ගංගාව හැර මේ කුඩාගඟ නිසා උඩු ගඟබලා යන්නේ යම්විටක පර්‍වත සිදුරක් දුටුවහි නම් එකල රාත්‍රියෙහි ගිනිසුළක් හැරගෙන ඇතුල්වෙව, මේ ගංඟාවද රාත්‍රියෙහි නොපවතියි. එහෙයින් තොපගේ ගමනට යොග්‍යවෙයි යොදුන් කිහිපයක් ඉක්මීමෙන් ඒ අඹ දක්නෙහිය''යි කීයේය. හෙතෙම එසේකොට ගොස් හිරු උදවන කල්හි නානාවිධ රත්නයන්ගේ රස්මී සමූහයෙන් බැබලුණාවූ භූමිභාග ඇති පලඹරින් නැමුණු අතු සමූහ ඇති වෘක්ෂ සමූහයෙන් හෙබියාවූ නානාවිධ පක්ෂිසමූහයා විසින් නාදකරන

Non-commercial distribution

ලද්දවූ ඉතා මනොඥවූ අඹ වනයට පැමිණියේය. එකල්හි ඒ අමනුෂ්‍ය ස්ත්‍රීහු ඔහු එනු දුරදීම දැක ''මේ තෙම මට අයිතිය, මේ තෙම මට අයිතිය''යි කියමින් ලහට දුව ආවාහුය, ඒ පුරුෂයා වනාහි ඇලා සමග එහි දිව්‍යසම්පත් අනුභව කිරීමට සුදුසුවූ පුණ්‍යකර්මයක් නොකළ බැවින් ඒ ස්ත්‍රීන් දැකම බියවී මුරගාමින් දුවගොස් බරණැසට පැමිණ එපුවත රජහට සැල කළේය. රජතෙම එය අසා ඒ ස්ත්‍රීන් දැකීමට හා අඹ පල වැළඳීමටත් හටගත් අභිලාෂා ඇතිව රාජ්‍යය ඇමතියන්ට බාරකොට මුවදඩයමට යන්නෙකු මෙන් දුනු හීතල වලින් සැරසී කඩුව බැඳගත මිනිසුන් කිහිපදෙනෙකු පිරිවරකොට ඇතිව එම වනවාරී පුරුෂයා විසින් පෙන්වනලද මගින් ගොස් යොදුන් කිහිපයකින් අතර තැන මිනිසුන් නවතා වැද්ද පමණක් රැගෙන අනුක්‍රමයෙන් ගොස් ඔවුහුත් එතනින් දුරතන්හි නවත්වා සූර්‍යෝදය කාලයෙහි අඹවනයට ප්‍රවිෂ්ට විය. එවිට ඒ ස්ත්‍රීහු අලුත උපන් දිව්‍යපුත්‍රයෙකු වැනි ඒ රජු දැක පෙරගමන් කොට රජයයි දැන හටගත් ආදර බුහුමන් ඇතිව මනාකොට ජල ස්නානය කරවා දිව්‍යමයවූ වස්ත්‍රාලඞ්කාර මල්ගඳ විලවුන් වලින් මනාව සැරසීමෙන් පළඳවා විමනට නංවාගෙන ගොස් නොයෙක් අනඟි රසවත් දිවබොජුන් වළඳවා ඒ රජහට කැමති පරිදි පයර්‍යුපාසන කළාහුය. ඉක්බිත්තෙන් අවුරුදු එකසිය පණහක් ඉක්මගිය කල්හි රජතෙම අර්ධරාත්‍රි කාලයෙහි නැඟිට සිටියේ පරපුරුෂ සෙවනයට කොට ප්‍රෙතිවූ ඒ ස්ත්‍රිය පොකුණු තෙරට යනු දැක ''කුමක් පිණිස මේ තැනැත්තිය මේ වේලාවෙහි යේදේහෝ''යි විමසනු කැමතිව ලුහුබැඳ ගියේය. එකල්හි ඒ පොකුණු තෙරට ගිය ඇ සුනඛයෙකු විසින් කනු ලබනු දැක මේ කිමෙක් දෝයි කියා නොදන්නේ තුන්දවසක්ම විමසා බලා ''මෙතෙම මැගේ සතුරෙක් වන්නේය''යි සිතා විසපොවනලද හීයකින් විද සුනඛයා මරා ඒ ස්ත්‍රිය පොකුණට බස්වා නැවත ලැබූ පළමු රූපය ඇති ස්ත්‍රිය දැක ගාථා දසයකින් ඇගේ ඒ ප්‍රවෘත්තිය විචාළේය.

231. සොවණ්ණසොපානඵලකා-සොවණ්ණවාලුකසණ්ඨිතා,
තත්ථ සොගන්ධියෝ වග්ගු-සුවිගන්ධා මනොරමා.

232. නානා රුක්ඛෙහි සංජන්නා-නානා ගන්ධසමීරිතා,
නානා පදුමසංජන්නා-පුණ්ඩරිකසමොගධා,

Non-commercial distribution

233. සුරභී සම්පවායන්ති මනුඤ්ඤා මාළතෙරිතා,
හංසා කොඤ්චාභිරුදා චක්කවාකාභිකූජිතා.

234. නානා දිජගණාකිණ්ණා-නානාසර ගණායුතා,
නානා ඵලධරා රුක්ඛා නානා පුප්ඵධාරිනා.

235. න මනුස්සෙසු ඊදිසං නගරං යාදිසං ඉදං,
පාසාදා බහුකා තුය්හං-සොවණ්ණරූපියාමයා.

236. දද්දල්ලමානා ආහෙන්ති-සමන්තා චතුරෝ දිසා.
පඤ්චදසිසතා තුය්හං-යාතෙමා පරිචාරිකා.

237. කාකම්බුකෙයූරධරා-කඤ්චනා වෙලභූසිතා.
පල්ලඞ්කා බහුකා තුය්හං-සොවණ්ණරූපියාමයා.

238. කාදලීමිගසංජන්නා-සජ්ජා ගොනකසන්ථතා,
යත්ථ තුවං වාසූපගතා-සබ්බකාමසමිද්ධිනී.

239. සම්පත්තා යඩ්ඪරත්තාය-තතෝ උට්ඨාය ගච්ඡසි,
උය්‍යානභූමිං ගන්ත්වාන-පොක්ඛරඤ්ඤා සමන්තතෝ

240. තස්සා තීරෙ තුවං ඨාසි-හරිතෙ සද්දලෙ සුභෙ,
තතෝ තෙ කණ්ණමුණ්ඩෝ සුනඛෝ අඞ්ගමඞ්ගානි ඛාදති.

241. යද ච ඛායිතා ආසි-අට්ඨිසඞ්ඛලිකා කතා,
ඔගාහසි පොක්ඛරණිං-හොති කායෝ යථා පුරෙ.

242. තතෝ ත්වං අඞ්ග පච්චඞ්ගි-සුවාරූ පියදස්සනා,
වත්ථෙන පාරුපිත්වාන-ආයාසි මම සන්තිකං.

243. කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-කණ්ණමුණ්ඩෝ ච සුනඛෝ
අඞ්ගමඞ්ගානි ඛාදති-ති.

231. තත්ථ, ඒ පොකුණෙහි; සොවණ්ණ සොපාණ-ඵලකා, රනින්කළ භිණිපෙති හා පුවරුද ඇති; සොවණ්ණවාලු කසණ්ඨීතා, රුවන්මුවා වැල්ලෙන් පිහිටියාය; වග්ගු, රුවිරවූ; සුවිගන්ධා, පවිත්‍ර ගඳැති; මනොරමා, සිත්කලුවූ; සොගන්ධියො, හෙල්මැලිවෙත්.

232. නානාරුක්ඛෙහි, නොයෙක් රුක්වලින්; සංජන්නා, ගැවසී ගත්තීය; නානාගන්ධ සමීරිතා, භාත්පස නත්වැදෑරුම් සුවඳ වැහෙන සුලං හමන්නීය; නානාපදුම සංඡන්නා, නානාවිධ රක් තොත්පලයෙන් වැසුණ දියතලා ඇත්තීය; පුණ්ඩරීක සමොගධා, හෙළපියුමෙන්ද මනාව ගැවසීගත්තීය.

Non-commercial distribution

233. මනුඤ්ඤා, මනොඤ්ඤවූ; මාළුතෙරිතා, වාතයෙන් කම්පා කරනලද; සුරභි, සුවඳ; සම්පවායන්ති, මනාව හමත්; හංසා කොඤ්චාභිරුදා, හංසයන් හා කොස්වා ලිහිණියන් විසිනුත් මනාව නාදකරන ලද්දීය; චක්කවාකාභිකූජිතා, සක්–වාලිහිණින් විසින්ද මනාසේ ශබ්දකරන ලද්දීය.

234. නානාදිජගණාකිණ්ණා, නානාවිධ පක්ෂිසමූහයා–ගෙන් ගැවසීගත්තීය; නානාසරගණායුතා, නන්වැදෑරුම් පක්ෂීන්ගේ විරුත සමූහයෙන් යුත්තීය; නානාඵලධරා, නොයෙක් පලදරන්නාවූ; රුක්ඛා, වෘක්ෂ ඇත්තාහ; නානා–පුප්ඵධරා, නානාවිධ සුවඳ මල් දරන; වනා, වනයෝ ඇත්තාහ.

235. ඉදං නගරං, මේ නුවර; යාදිසං, යම්බඳුවීද; ඊදිසං, මෙබඳු නුවරක්; මනුස්සෙසු, මිනිසුන් අතරෙහි (හෙවත්) මිනිස් ලොව; න, නැත; තුය්හං, නිගේ; සොවණ්ණරූපියා මයා, රන්රිදී මුවාවූ; බහුකා, බොහෝවූ; පාසාදා, ප්‍රාසාදයෝ:–

236–237-238. සමන්තා, හාත්පස; චතුරොදිසා, සිව්–දිසාවන්හි; දද්දල්ලමානා, ඉතාමත් බබලමින්; ආහෙන්ති, හොබවත්; තුය්හං, නිට; යාඉමා පරිවාරිකා, යම් මේ වතාවත් කරන්නාවූ; පඤ්චදසිසතා, පන්සීයක් දස ස්ත්‍රීහු වෙත්ද; තා, ඒ ස්ත්‍රීහු; කාකණ්ඨකෙයූරධරා, සක්වළලු අභුපළඳනාවෙන් සැරසුණාවූ; කඤ්චනාවෙල භූසිතා, රුවන් මුදුන් මල්කඩින් මනාව සරසන ලද කෙශකලාප ඇත්තාහුය; සබ්බකාමසමිද්ධිනී, සියලු කාමයෙන් සමෘඩවූ; තුවං, නී; යත්ථ, යම් පය්හිඩක්යක; වාසූපගතා, විසීමට යන්නිද කාදලි මිගසංඝන්නා, කෙහෙල්–මුවසම් පස තුරුණු අතුරන ලද්දවූ; ගොනක සන්ථතා, දික්ලොම් කොදුපිළියෙන් අතුරන ලද්දවූ; සජ්ජා, සදනලද; සොවණ්ණ රූපියා මයා, ස්වර්ණරජතමයවූ; පල්ලඞ්කා, පය්හිඩකයෝ; තුය්හං, නිට; බහුකා, බොහෝවෙත්.

239-240. අඩ්ඪරත්තාය, අඩරෑය; සම්පත්තාය, පැමිණි කල්හි; තතො, ඒ පළහින්; උට්ඨාය, නැගිට; උය්‍යානභූමිං, උයන් වත්තට; ගච්ඡසි, යන්නෙහිය; ගන්ත්වාන, ගොස්; සමන්තතො, හාත්පස; හරිතෙ, නිල්වූ; සද්දලෙ, ළා තණසමූහ ඇති; සුභෙ, ශුභවූ; තස්සා පොක්ඛරඤ්ඤුතිරෙ, ඒ පොකුණු

Non-commercial distribution

තෙර; තුවං, කි; යාසි, සිටිනෙහිය; තතෝ, ඉන්පසු; කණ්ණ-මුණ්ඩෝ, සිඳුණුකන් ඇති; සුනඛෝ, බල්ලෙක්: තෙ, තිගේ; අඩ්ගමඩ්ගානි, ශරීරාවයවයන්; ඛාදති, කයි.

241. යදච, යම්කලෙක; ඛායිතා, (සුනඛයා විසින්) කන ලද්දී; අට්ඨිසඩ්ඛලිකා, ඇටසැකිල්ල පමණක්; කතාඅසි, කරන ලද්දීවිද; පොක්ඛරණිං, (එකල) පොකුණට; ඔගාහසි, බසිනෙහිය; යථාපුරෙ, පෙරමෙන්; කායොහොති, ශරීරය ඇතිවෙයි.

242. තතෝ, ඉන්පසු; අඩ්ගපච්චඩ්ගී, පරිපූණ් අඩ්ගප්‍රත්‍යඩ්ග ඇතිව; සුචාරු, ඉතා මනරම්වූ; පියදස්සනා, ප්‍රිය දැකුම් ඇත්තා වූ; ත්වං, ති; වත්ථෙන, වස්ත්‍රයකින්; පාරුපිත්වාන, පොරවාගන, මම සන්තිකං, මාහමුවට; ආයාසි, එන්නෙහිය.

243. කණ්ණමුණ්ඩොච, කන්සිඳුණාවූම; සුනඛෝ, සුනඛ තෙම; අඩ්ගමඩ්ගානි, ශරීරාවයවයන්; ඛාදති ඉති, කයිද; (සෙස්ස යටකියන ලදී.)

එම්බා දෙවඟන සිත්කළුවූ ඒ පුෂ්කරණීතොමෝ රුවන්මුවා හිණිපෙති හා පුවරු ඇත්තීය, හාත්පස්හි ස්වර්ණමය වාලුකා වෙත් ගැවසී ගත්තීය. එහි මනොඥවූ සුවඳැති පද්මාදි පුෂ්පයෝ ඇත්තාහ. නානාවිධ වෘක්ෂවලින් ගැවසී ගත්තීය, නොයෙක් මල් සුවඳ වැහෙන සුවඳ සුලන් හමන්නීය, නොයෙක් රත්පියු-මෙන් වැසුණ ජලතලා ඇත්තීය, හෙළපියුමෙන්ද සමාකීර්ණය. වාතයෙන් කම්පාකරනලද මනොඥවූ සුවඳ මනාව හමන්නේය. හංසයන් හා කොස්වා ලිහිණින් විසින් මනාව නාද පවත්-වන්නීය, සක්වාලිහිණින් විසින් මනා ශබ්ද පවත්වන්නීය.

නානා විධ පක්ෂි සමූහයාගෙන් ගැවසී ගත්තීය, නානාවිධ පක්ෂීන්ගේ විරුත සමූහයෙන් යුක්තය, සියලුකල්හි විවිධ ඵල භාරයෙන් නැමුණු අතුඇති බැවින් නානාවිධ ඵලදයි වෘක්ෂයෝද නොයෙක් සුවඳ මල්දෙන වනයෝද ඇත්තාහුය. තිගේ මේ නුවර යම්බඳුවේද මිනිස්ලොව මෙබඳු නුවරක් නැත්තේය. රනින් කරන ලද්දුවද රිදියෙන් කරන ලද්දුවද ප්‍රාසාදයෝ තිට බොහෝවෙත්. ඒ ප්‍රාසාදයෝ හාත්පසින් සිව්දිග අතිශයින් බබුළුවමින් දිලිසෙත්. තිට වතාවත් කරන්නාවූ යම් මේ පන්සීයක් දසස්ත්‍රීහුවෙත්ද, ඒ ස්ත්‍රීහු සක්වළුලු බාහුවළලු ආදි

Non-commercial distribution

ආභරණයන් ගෙන් සැරසුණා වූ රුවන්මුවා මුදුන් මල්කඩින් සමලඬිකෘත වූ කෙශකලාප ඇත්තාහුය. ස්වර්ණමයවූ ද රජත-මයවූ ද පීඨිකයෝ තිට බොහෝ තිබෙත්. සියලු කාම සැපතින් සමෘඩ වූ තී යම් පයීඩිකයක සයනයට යන්නී ද එහි කෙහෙල් මුවසම් පසතුරුණු අතුරන ලදුව දික්ලොම් කොදුපිළියෙන් අතුට සඳන ලද්දීය.

එසේද වුවත් තී අර්ධරාත්‍රිය පැමිණි කල්හි ඒ පළඟින් නැඟිට පොකුණ සමීපයෙහි වූ උයන්වත්තට යන්නීය, සුන්දරිය තී ගොස් භාත්පසින් නීලවර්ණවූ තරුණ තෘණ ඇති ඒ පොකුණුතෙර සිටියි, එවිට කන්සිදුණ සුනඛයෙක් තෙම ඒ පොකුණෙන් නික්ම අවුත් තිගේ අවයවයන් කයි. යම්කලෙක සුනඛයා විසින් තී කනලද්දී ද එකල්හි ඇටසැකිල්ල පමණක් කරන ලදුව පොකුණට බසින්නීය, එවිට පළමුමෙන් තිගේ ශරීරය ඇතිවෙයි. ඒ පොකුණෙන් ගොඩනැඟුණු පසු තී සම්පූර්ණ සර්ඬිග ප්‍රත්‍යඬිග ඇතිව ඉතා මනොරම ප්‍රියදර්ශන ඇතිව වස්ත්‍ර හැඳපොරවා මා සමීපයට එයි. තී විසින් කයින් වචසින් මනසින් කවර අකුශලයක් පෙර කරන ලද්දේද, කවර අකුශල කර්මයක්හු ගේ විපාකයකින් කන්සිදුණු බල්ලා තිගේ ශරීරාවයවයන් කාදැයි විචාළේය. මෙසේ ඒ රජු විසින් විචාරණ ලද්දවූ ඒ ප්‍රේතිකොමෝ මුල පටන් තමන් ගේ ප්‍රවෘත්තිය ඒරජ හට කියන්නී:-

244. කිම්බිලායං ගහපතී-සද්ධා ආසි උපාසකා,
තස්සාහං හරියා ආසිං-දුස්සීලා අතිවාරිණී.

245. එවං අතිවරමානාය-සාමිකා එතදබ්‍රවී,
නෙතං ඡන්නං නප්පතිරූපං-යං ත්වං අතිවරසි මං.

246. සාහං සොරඤ්ච සපථං-මුසාවාදං අහාසිසං,
නාහන්නං අතිවරාමි-කායෙන උද චෙතසා.

247. සචාහං තං අතිවරාමි-කායෙන උද චෙතසා,
අයං කණ්ණමුණ්ඩා සුනඛා-අඩිගමඩිගානි ඛාදතු

248. තස්ස කම්මස්ස විපාකං-මුසාවාදස්ස චූභය,
සත්තවස්සසතානී ච-අනුභූතං යතොපි මෙ
කණ්ණමුණ්ඩා ච සුනඛා-අඩිගමඩිගානි ඛාදති-ති.

Non-commercial distribution

244. කිම්බිලායං, කිම්බිලා නුවර; ගහපති, ගෘහපතියෙක් තෙම; සඩ්ඪා, ශ්‍රද්ධාවත්වූ; උපාසකෝ ආසි, උපාසකයෙක් විය; තස්ස, ඔහට; අහං, මම; භරියා ආසිං, බිරින්දවීමි; අතිචාරිණී, අබිසරුවූ; දුස්සීලා; සිල්නැත්තියක් වීමි.

245. එවං, මෙසේ; අතිචරමානාය, හිමියා ඉක්මවා හැසිරෙන්නාවූ මාහට; සාමිකෝ, හිමිතෙම; එතං, මෙය; අබ්‍රැවී, කීයේය; යං, යම් හෙයකින්; ත්වං, තී; මං, මා; අතිචරසි, ඉක්මවා හැසිරෙහිද; එතං, මෙය; නඡත්තං, යුතුනොවේ; නප්පතිරූපං, සුදුසුනොවේ.

246. සා අහං, ඒ මම; සොරඤ්ච දරුණුවූම; සපථං, දිව්‍ය රුළිකොට; මුසාවාදං, බොරු; අභාසිසං, කීවෙමි; අහං, මම; කායෙන, කයින් හෝ; උදැ, නොහොත්; චෙතසා, සිතින්; තං, ඔබ; න අතිචරාමි, ඉක්මවා නොහැසිරෙමි.

247. සචෙ, ඉදින්; අහං, මම; කායෙන, කයින් හෝ: උදැ, නොහොත්; චෙතසා, සිතින්; තං, නුඹ; අතිචරාමි, ඉක්මවා හැසිරෙමි නම්; කණ්ණමුණ්ඩෝ, ,කන්සිඳුණාවූ; අයං සුනඛෝ, මේ බලු තෙම; අඞ්ගමඞ්ගානි, ශරීරාවයවයන්; ඛාදතු, අනුභව කෙරේවා.

248. තස්සකම්මස්ස, ඒ අනාචාර අකුශලයාගේද; මුසාවා දස්සච, බොරුකී අකුශලයාගේද; උභයං, කර්මය පිළිබඳ; විපාකං, විපාකය; සත්තවස්සසතානිච, හවුරුදු සත්සියක් මුළුල්–ලෙහිම; අනුභූතං, විඳින ලද්දේවිය; යතොපි, මේ කර්මහේතු වෙන්ම; මෙ, මාගේ අඞ්ගමඞ්ගානි, ශරීරාවයවයන් කණ්ණ මුණ්ඩොව, සුන්කන් ඇතිවූම; සුනඛෝ, සුනඛතෙම; ඛාදති ඉති, අනුභවකරයි.

මහරජ කිම්බිලානුවර පෙර ශ්‍රද්ධාවත් උපසකයෙක්වූ ගෘහ පතියෙක් වූයේය. ඔහට මම භාර්‍යාව වීමි, ස්වාමියා ඉක්මවා හැසුරුණු හෙයින් අබිසරුවූ දුශ්ශීලවූ තැනත්තියක්වීමි. මෙසේ අනාචාරයෙහි හැසුරුණු මට ස්වාමිපුරුෂතෙම මෙසේ කීයේය, යම්හෙයකින් ති මා ඉක්මවා පරපුරුෂ සෙවනය කළෙහිද ඒ හැසිරීම තිට යුතු නොවේ, සුදුසු නොවේ යයි කීය. එවිට ඒ මම දරුණුවූ බොරු දිවුරමින් මෙසේ කීවෙමි, මම කයින් හෝ සිතින් නුඹ ඉක්මවා අනාචාරයෙහි නොහැසුරුණෙමි.

Non-commercial distribution

ඉදින් මම කයින් හෝ සිතින් නුඹ ඉක්මවා අනාචාරයෙහි හැසුරුණේ නම් මේ කන්සිදුණු සුනඛයා මාගේ අවයවයන් කාදමාවයි කී වෙමි. ඒ අනාචාර ක්‍රියාව හා බොරු දිවිරීම යන අකුශල කම් දෙදෙනා ගේ විපාකය හවුරුදු සත්සියක් මුළුල්ලෙහි මා විසින් විඳින ලදි. ඒ පව්කම් හෙතුවෙන් මාගේ අඩිගප්‍රත්‍යඩිගයන් සුන් කන් ඇති සුනඛතෙම කායයි මේ ගාථාපස කීයේය. මෙසේද කියා ඒ රජු විසින් තමහට කරන ලද උපකාරය වර්ණනා කරන්නී:-

249. **ත්වඤ්ච දෙව බහුකාරෝ-අත්ථාය මෙ ඉධා ගතෝ,**
සුමුත්තාහං කණ්ණමුණ්ඩස්ස-අසොකා අකුතෝ භයා.

250. **තාහං දෙව නම ස්සාමි-යාචාමි අඤ්ජලිකතා,**
භුඤ්ජ අමානුසෙ කාමෙ-රම දෙව මයා සහා-ති.

249. දෙව, දෙවයන් වහන්ස; ත්වඤ්ච, නුඹ; බහුකාරෝ, බොහෝ උපකාර වූයේය; මෙ, මට; අත්ථාය, වැඩ පිණිස; ඉධ ආගතෝ, මෙතනට ආයේය; අහං, මම; කණ්ණමුණ්ඩස්ස, කන්සුන් බලුගෙන්; සුමුත්තා, මිදුනීවෙමි; අසොකා, ශොක නැත්තියක්ද; අකුතෝ භයා, බියනැත්තියක්ද වීමි.

250. දෙව, දෙවයන් වහන්ස; අහං, මම; තං, ඔබ; නමස්සාමි, වඳිමි; අඤ්ජලිකතා, කෘතාඤ්ජලිව; යාචාමි, යාච්ඤාකරමි; දෙව, දෙවයන් වහන්ස; අමානුසෙ, අමනුෂ්‍යවූ; කාමෙ, කාම සම්පත්; භුඤ්ජ, වළඳව; මයාසහ, මා හා සමග; රම ඉති, ඇලෙව.

දෙවයන්වහන්ස නුඹ වහන්සේ මට බොහෝ උපකාරවූ සේක්ය, මට වැඩ පිණිස නුඹ වහන්සේ මෙතනට පැමිණිසේක්ය, මම කණ්ණමුණ්ඩ සුනඛයාගෙන් මිදුණෙමි, දැන් ශොකනැත්තී බයක් නැත්තියක් වීමයි කීයේය. එවිට රජතෙමේ එහි විසීම ගැන කලකිරුණු සිත් ඇතිව ඒ අදහස ඇට ප්‍රකාශ කළේය, ප්‍රේතිය එය අසා රජුකෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් එතනම ඔහුගේ විසීම යාච්ඤා කරමින් දෙවයන් වහන්ස මම නුඹ වහන්සේට නමස්කාර කරන්නෙමි, කරනලද ඇඳිලි ඇති මම යාච්ඤා කරමි, දෙවයන් වහන්ස නුඹ වහන්සේ දිව්‍ය කාමසම්පත් වළඳනු මැනව, මා හා සමග සිත් අලවනු මැනවයි මේ ගාථාදෙක කීයේය. නැවත රජතෙම එකාන්තයෙන් යහු කැමතිව තම අදහස් ප්‍රකාශ කරමින්:-

Non-commercial distribution

253. භුත්වා අමානුසෙ කාමෙ-රමිතොම්හි තයා සහ,
කාහං සුභගෙ යාචාමි-ඛිප්පං පටිනයාහි ම-න්ති.

251. තයා සහ, තී හා සමග; අමානුසෙ කාමෙ, අමනුෂ්‍ය (දිව්‍ය) සම්පත්; භුත්වා, අනුභවකොට; රමිතො අම්හි, ඇලුණේ වීමි; සුභාගෙ, සුඉන්ද්‍රිය; ඛිප්පං, වහා; මං, මා; පටිනයාහි ඉති, නැවත පමුණුවා ලවයි; අහං, මම තං, තී යාචාමි, යදිමි.

සුඉන්ද්‍රිය තී හා සමග මම දිව්‍ය කාමසම්පත් අනුභව කොට ඇලුණේවෙමි, දැන් මා මගේ නුවරටම වහා පමුණුවාලවයි කිට මම යාච්ඤ කරමියි අවසාන ගාථාව කීයේය.

එවිට ඒ විමන් ප්‍රේතිය රජහුගේ කීම අසා වියෝදුක නොඉවසන්නී ශොකාතුර භාවයෙන් වියවුල් සිත් ඇතිව වෙවුලන ශරීර ඇතිව නානාවිධ උපායවලින් ආයාචනා කොටත් එරජ එහි වස්වාගන්ට නොහැකිවන්නී මහත් වටිනා බොහෝ රත්නයන් හා සමග රජ්ජුරුවන් නුවරට පමුණුවා පහයට නංවා අඩා වැළපී තමා වසන තැනටම ගියාය. රජතෙම වනාහි එයදැක හටගත් සංවෙග ඇතිව දැනාදී වූ පුණ්‍යකර්මයන් කොට ස්වර්ගී පරායණ විය.

ඉක්බිත්තෙන් අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවී පවත්වනලද උතුම් දම්සක් ඇතිව අනුක්‍රමයෙන් වැඩමවා සැවැත්නුවර වැඩවසන කල්හි එක් දවසක් ආයුෂ්මත් මහාමොඳ්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ පවිත්‍ර චාරිකාවෙහි වඩිමින් පිරිවර සහිත ඒ ස්ත්‍රිය දැක ඇ විසින් කරනලද කර්මය විචාළසේක. ඕතොමෝ මුලපටන් සියලු ප්‍රවෘත්තිය තෙරුන් වහන්සේට කීයේය. තෙරුන් වහන්සේ ඔවුන්ට දහම් දෙසූසේක. ඒ පුවත තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට සැලකළෝය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට සපැමිණි පිරිසට ධර්මදෙශනා කර වදළසේක. මහජනයා පිළිලත් සංවේග ඇතිව පවින් වැලකී දැනාදි පින්කම් කොට ස්වර්ගීපරායණ වූයේය.

(විෂමාචාර පැවතුම්ඇති ධූර්ත පුරුෂයන්ගේ දුෂ්ට උපාය වලට ගුණවක් ස්ත්‍රීන්පවා මුළාවී සදාචාර ගුණධර්ම ඉක්මවා ලීමෙන් විපතට පැමිණෙන අයුරුත්, කාමමිත්‍යාචාරයෙහි හා

Non-commercial distribution

බොරු දිවිරිමෙහි බියකරු කටුක විපාකත් මේ කථාව කියවීමෙන් මනාව දැන එබඳු පව්වලින් වැලකී සිටීමට කවුරුත් වීර්‍ය කටයුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවර්ගයට ඇතුළත් දෙළොස්වෙනි කර්ණමුණ්ඩ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

2. 13 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරිවඝාන්තඝිත තෙළෙස්වෙනි **උබ්බරී ප්‍රෙතවස්තුව** කවරහයත්.

බ්‍රහ්මාමරනර භූවර නිකර නිෂෙවිත 'පාදපද්මොපලක්ෂිත ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙවරම් වෙහෙර වැඩවසන සේක් එක්තරා උපාසිකා කෙනෙකු අරභයා මේ උබ්බරී ප්‍රෙත වස්තුව වදළසේක. සැවත්නුවර වනාහි එක්තරා උපාසිකා-වෙකුගේ ස්වාමිපුරුෂ තෙම කළුරිය කළේය. ඒ උවසිතොමෝ ස්වාමි වියොග දුකින් ආතුරව ශොක කරමින් ආදහන ස්ථානයට ගොස් හඬයි, භාග්‍යවතුන් වහන්සේ ඇගේ සෝවාන් ඵලයට හෙතුසම්පත් දැක වදරා කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව ඇගේ ගෙට වැඩමවා පනවන ලද අස්නෙහි වැඩහුන්සේක. උපාසිකා තොමෝ ශාස්තෘන් වහන්සේ වෙත එළඹ වැඳ එකත් පසෙක හුන්නේය. එකල්හි ශාස්තෘන් වහන්සේ ඇගෙන් ''කිමෙක්ද උපාසිකාව කී ශොක කෙරේද''යි අසා වදරා ''එසේය භාග්‍යවතුන් වහන්ස ප්‍රිය විප්‍රයොග දුඃඛයෙන් ශොක කෙරෙමි''යි කී කල්හි ඇගේ සෝදුක පහකරනු කැමතිව අතීත කථාව ගෙනහැර දක්වා වදළසේක.

යටගිය දවස පඤ්චාලරට කපිලනුවර චූළනී බ්‍රහ්මදත්ත නම් රජෙක්විය. ඒ රජතෙම අගතියට යාම හැරදමා තමරට වැසි ප්‍රජාවට හිතවැඩ කිරීමෙහි ඇලී දශරාජ ධර්මයන් නොපිරි හෙලා රාජ්‍යානුශාසනා කරමින් සමහර කලෙක තමන්ගේ රාජ්‍යකරණයෙහි වැසියෝ කුමක් කියද්දෝයි අසනු කැමතිව සන්නාලියෙකු ගේ වෙසක්ගෙන හුදකලාව දෙවැන්නෙකු නැතිව නුවරින් නික්ම ගමින් ගමට ජනපදයෙන් ජනපදයට

Non-commercial distribution

යමින් මුළු රාජ්‍යය කටු නැතිව කිසිවකින් පීඩානැතිව මනුෂ්‍ය-යන් සතුටුවෙමින් නොවසන ලද ගෘහවාර ඇත්තවුන්සේ වාසය කරන්නවුන් දැක උපන් සොම්නස් ඇතිව නැවතී නුවරට අභිමුඛව එන්නේ එක්තරා ගමක එක් වැන්දඹු දුගී ස්ත්‍රියකගේ ගෙට ගියේය. ඕතොමෝ ඒ රජු දැක ''ආර්‍යයෙනි නුඹ කවරෙක්ද? කොතනසිට ආයේද''යි ඇසීය. සොඳුර මම මහන්නෙක් වෙමි. බැලපිණිස සන්නාලිකමීය කරමින් ඇවිදිමි, ඉදින් නුඹලා ගේ සන්නාලි කර්‍මාන්තයක් ඇත්නම් බත් හා වැටුප්ද දෙව් නුඹලාටත් කර්‍මාන්ත කරමි''යි කීයේය. එවිට ඕ තොමෝ ''අපට කර්‍මාන්තයක් හෝ බත් වැටුප් හෝ නැත, ආර්‍යයෙනි, අනික් මිනිසුන්ට කර්‍මාන්තකරව''යි කීයේය. එතෙම එහි කිහිප දිනක් වාසය කරමින් ධාන්‍ය පුණ්‍ය ලක්ෂණ යෙන් සමන්විතවූ ඇගේ දියණියන් දැක මවගෙන් මෙසේ ඇසුවේය. ''කිමෙක්ද මේ කුමරිය කිසියම් ස්වාමියෙකු විසින් විවාහ ගිවිසගන්නා ලද්දීද නොහොත් කිසිවකු විසින් නොකරන ලද පරිග්‍රහ ඇත්තියක්ද, ඉදින් කිසිවකු විසින් විවාහගිවිස නොගන්නා ලද්දියක් නම් මේ කුමරිය මට දෙව් මම නුඹලා සුවසේ ජීවත්වන උපායක් කිරීමට පුලුවන් කෙනෙක් වෙමි''යි කීයේය. ඕතොමෝ ආර්‍යයෙනි යහපතැයි කියා ඕහට ඒ කුමරිය දුන්නේය. හෙතෙම ඈ හා සමග කිහිපදිනක් වැස ඇට කහවණු දහසක්දී ''මම කීප දවසකින්ම එන්නෙමි සොඳුර තී කල නොකිරෙව''යි කියා තමන් ගේ නුවරට ගොස් නුවරට හා ඒ ගමටත් අතර මග සමකරවා සරසවා මහත් රාජානුභාවයෙන් ඒ ගෙදරට ගොස් ඒ කුමරිය කහවණු රැසක් මතුවෙහි සිටුවා රන්රිදී කලස් වලින් පැන් නහවා උබ්බරියයි නම් කරවා අගමෙහෙසි තනතුරෙහි තබා ඒ ගමත් ඇගේ නෑයන්ට දී මහත් රාජානුභාවයෙන් ඈ නුවරට ගෙනැවිත් ඈ සමග අභිරමණය කරමින් ජීවිතාන්තය දක්වා රජසැප අනුභව කොට ආයුකෙළවර කළුරිය කෙළේය. ඔහු කළුරිය කළ කල්හිද මෘතශරීරාදහන කෘත්‍යකළ කල්හිද උබ්බරීදෙවිය ස්වාමියාගේ වියෝදුකින් ශොකශල්‍යයෙන් මැඩුණු සිත් ඇතිව ආදහන ස්ථානයට ගොස් බොහෝ දවස් වලදී ගඳමල් ආදියෙන් පූජාකොට රජහුගේ ගුණ වර්ණනා කොට උමතුවට පැමිණියෙකුමෙන් හඬමින් විලාප කියමින් ආදහන ස්ථානය ප්‍රදක්ෂිණා කරයි. එසමයෙහි වනාහි අපගේ භාග්‍යවතුන්

Non-commercial distribution

වහන්සේ බොධිසත්ව වූයේ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවී උපදවා ගත් ධ්‍යාන අභිඥා ඇතිව හිමවත සමීපයෙහි එක්තරා අරණ්‍ය ප්‍රදෙශයක වසන්නේ සෝහුලින් මැඩුණු උබ්බරිය දිවසින් දැක අහසින් අවුත් දෘශ්‍යමාන රූපීව අහසෙහි සිට ඒ ඒ තන්හි සිට මනුෂ්‍යයන්ගෙන් ''මේ ආදහන භූමිය කවරෙකුගේද? මේ ස්ත්‍රිය කවරෙකු සඳහා බ්‍රහ්මදත්ත බ්‍රහ්මදත්තයයි කියා හඬමින් විලාප කියයිද''යි කියා විචාළේය. එය අසා මනුෂ්‍යයෝ ස්වාමිනි මේ තැනැත්තිය බඹදත් රජහුගේ උබ්බරී නම් බිරින්ද වෙයි. ඕතොමෝ ඒ රජහු කළුරිය කළ තැන් පටන් මල සිරුර දැව් තැනට අවුත් බ්‍රහ්මදත්ත බ්‍රහ්මදත්තයයි ඔහු ගේ නම ගෙන කියා හඬමින් විලාප කියායයි කීවාහුය. ඒ කරුණ ප්‍රකාශ කරන්නාවූ සංගීති කාරයෝ:-

252. අහු රාජා බ්‍රහ්මදත්තො-පඤ්චාලානං රථෙසභො,
අහොරත්තානමච්චයො-රාජා කාලඞ්කරී තදා.

252 තස්ස ආළාහනං ගන්ත්වා-භරියා කන්දති උබ්බරී,
බ්‍රහ්මදත්ත අපස්සන්තී-බ්‍රහ්මදත්තාති කන්දති.

254. ඉසී ච තත්ථ ආගංඡි-සම්පඡ්ණවරණ්ණො මුනි,
සො ච තත්ථ අපුච්ඡිත්ථ-යෙ තත්ථ සුසමාගතා,

255. කස්සවිදං ආළාහනං-නානා ගන්ධසමෙරිතං,
කස්සායං කන්දති භරියා-ඉතො දූරං ගතං පතිං.

256. බ්‍රහ්මදත්තං අපස්සන්තී-බ්‍රහ්මදත්තා කන්දති,
තෙ ච තත්ථ වියාකංසු-යෙ තත්ථ සුසමාගතා.

257. බ්‍රහ්මදත්තස්ස භද්දන්තෙ-බ්‍රහ්මදත්තස්ස මාරිස,
තස්ස ඉදං ආළාහනං-නානා ගන්ධසමෙරිතං

258. තස්සාය කන්දති භරියා-ඉතො දූරං ගතං පතිං,
බ්‍රහ්මදත්තං අපස්සන්තී-බ්‍රහ්මදත්තාති කන්දතී-ති.

252-253. පඤ්චාලානං, පඤ්චාලරට වැස්සන්ගේ; රථෙ සභො, රථිකශ්‍රේෂ්ඨවූ; බ්‍රහ්මදත්තොරාජා, බඹදත් රජෙක්; අහු, විය; රාජා රජතෙම; අහොරත්තානං, දිවාරාත්‍රීන්ගේ; අච්චයා, ඇවැමෙන්; කාලඞ්කරී, කළුරිය ක්ලේශ; තදා, එකල්හි; තස්ස, ඒ රජහුගේ; උබ්බරී, උබ්බරී නම්වූ; භරියා, දෙවිතොමෝ;

Non-commercial distribution

ආළාහනං, ආදහන ස්ථානයට; ගන්ත්වා, ගොස්; කන්දති, හඬයි; බ්‍රහ්මදත්තං, බඹදත්රජු; අපස්සන්තී, නොදන්නී; බ්‍රහ්ම දත්ත ඉති, බ්‍රහ්මදත්තයයි කියා; කන්දති, හඬයි.

254. තත්ථ, ඒ සොහොනට; ඉසීව, (ධ්‍යානාදීවූ ගුණයන් සොයන අරුතෙන්) ඍෂිවූ; සම්පණ්ණ වරණෝ, පසළොස් වරණ ධර්මයෙන් යුක්තවූ; මුනි, කාපසයෙක් තෙම; ආගංඡි, පැමිණියේය; තත්ථ, එතන්හි; යෙ, යම් මිනිස්සු; සුසමාගතා, රැස්වූවාහුද; තත්ථ, එහිදී; සොච, හෙතෙමේද; අපුච්ඡත්ථ, (ඔවුන්) විචාළේය.

255-256. නානාගන්ධ සමෙරිතං, හාත්පස නන්වැදෑරුම් සුවඳ හමන්නාවූ; ඉදං ආළාහනං, මේ සොහොන; කස්සව, කවරෙකුගේද; අයංහරියා, මේ භාර්‍යාතොමෝ; කස්ස, කවරෙකු සඳහා; කන්දති, හඬාද; ඉතො, මේ මිනිස් ලොවින්; දූරංගතං, දුර (පරලෝ) ගියාවූ; පතිං, ස්වාමීවූ; බ්‍රහ්මදත්තං, බ්‍රහ්මදත්ත යෙකු; අපස්සන්තී, නොදන්නී; බ්‍රහ්මදත්ත ඉති, බ්‍රහ්මදත්තයයි කියා; කන්දති, හඬාද; තත්ථ, එහි; යෙ, යමෙක්තුමූ; සුසමාගතා, රැස්ව සිටියෝද; තෙව, ඔවුහු; තත්ථ, එහිදී; වියාකංසු, ප්‍රකාශ කළාහුය.

257. මාරිස, නිදුකාණෙනි; බ්‍රහ්මදත්තස්ස, ඒ බඹදත් රජ හට; භද්දං, යහපතක්වේවා; තස්ස බ්‍රහ්මදත්තස්ස; ඒ බඹදත් රජුගේ; නානාගන්ධ සමෙරිතං, නොයෙක් සුවඳ හමන; ඉදං ආළාහනං, මේ සොහොන වෙයි.

258. අයං හරියා, මේ බිරින්ද; තස්ස, ඒ රජු සඳහා; කන්දති, හඬයි; (සෙස්ස යට කී පරිදියි).

පඤ්චාල රටවැසියන්ගේ මහාරථ නම් යොධවූ බඹදත් රජෙක් වූයේය. ඒ රජ දිවාරාත්‍රීන්ගේ ඇවෑමෙන් කළුරිය කළේය. එකල්හි ඒ රජහුගේ දෙවියවූ උබ්බරිතොමෝ ඒ රජු ගේ මළසිරුර දැවූ තැනට ගොස් හඬයි. බඹදත්රජු නොදක්නී බ්‍රහ්මදත්තයයි කියමින් හඬයි. ඒ උබ්බරිදෙවිය සිටි සොහොනට ධ්‍යානාදී ගුණයන් සොයන හෙයින් ඍෂිවූ ශීලසම්පදය, ඉන්ද්‍රිය සංවරශීලය, භොජනයෙහි මාත්‍රඥතාය, නිදිවුරුකිරීමෙහි යෙදීමය, ශ්‍රද්ධාදීවූ සප්තඝඩීය, චතුර්විධ රූපාවචර ධ්‍යානය යන මේ පසළොස් වරණ සඩ්ඛ්‍යාත ගුණසම්පන්නවූ අත්වැඩ

Non-commercial distribution

පරවැඩ දන්නා හෙයින් මුනි නමවූ තාපසයෙක් තෙම පැමිණියේය, යම් මනුෂ්‍යයෝ ඒ ඒ තැන සොහොනේ රැස්ව සිටියෝද එතන සිටි ඒ ජනයාගෙන් මෙසේ විචාළේය. භාත්පස නානා විධ සුවඳ හමන්නාවූ මේ සොහොන කවරෙකුගේද? මේ භාර්‍යාතොමෝ කවරෙකු සඳහා හඬාද? මෑ මෙයින් පරලොව ගිය ස්වාමීවූ බ්‍රහ්මදත්තයකු නොදක්නී බඹදත්යයි නම කියා විලාපකිම වශයෙන් කැඳවාදෑයි ඇසීය. එකල්හි යම් කෙනෙක් ඒ සොහොනෙහි රැස්ව සිටියෝද එහි සිටි ඒ මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය. නිදුකාණන් වහන්ස නොයෙක් සුවඳ හමන්නාවූ මේ සොහොන ඒ බඹදත් රජහුගේය, ඒ බඹදත් රජහට යහපතක්වේවා, ඒ බඹදත් රජුගේ මේ භාර්‍යාතොමෝ හඬයි, මෑ මෙයින් පරලොව ගිය සාමීවූ බඹදත් රජු නොදකිමින් බ්‍රහ්මදත්තයයි නම කියා හඬයි, නුඹවහන්සේ වැනි මහර්ෂීන් හිතවත්දේ සිතීමෙන් පරලොව සිටිනවුන්ටද නිතර සැපවීම යයි කීහ. එකල්හි ඒ තාපස තෙම ඔවුන්ගේ වචනය අසා අනුකම්පා උපදවා උබ්බරියගේ සමීපයට ගොස් ඇගේ ශෝදුක් දුරුකිරීම පිණිස:-

259. ඡළාසීති සහස්සානි-බ්‍රහ්මදත්තස්ස නාමකා,
ඉමස්මිං ආළාහනෙ දඩ්ඪා-තෙසං කං අනුසොචසි-නි.

259. බ්‍රහ්මදත්තස්සනාමකා, බඹදත් යන නම ඇති; ඡළාසීති සහස්සානි, සයාසූදහසක්; ඉමස්මිං ආළාහනෙ, මේ සොහොනෙහි; දඩ්ඪා, දවනලදහ; තෙසං, ඔවුනතුරෙන්; කං කවරෙකු සඳහා; අනුසොචසි ඉති, ශොකකෙරේද.

උබ්බරිය බ්‍රහ්මදත්ත යන නම් ඇත්තාවූ අසූසයදහස් දෙනෙක් මේ සොහොනෙහි දවන ලද්දහුය. ඒ අසූසය දහසක් බ්‍රහ්මදත්තයන් අතුරෙන් කවර බඹදතෙකු සඳහා නී ශොක කෙරේදැයි විචාළේය, මෙසේ වනාහි ඒ තවුසා විසින් විචාරණ ලද්දවූ උබ්බරි තොමෝ තමා විසින් අදහස් කරනලද බ්‍රහ්ම දත්තයා කියන්නී:-

260. යො රාජා චූළනිපුත්තො-පඤ්චාලානං රථෙසභො,
තං භන්තෙ අනුසොචාමි-භත්තාරං සබ්බකාමද-න්ති.

260. භන්තෙ, ස්වාමිනි; චූළනීපුත්තො, චූළනී නම් රජුගේ පුත්වූ; රථෙසභො, මහාරථ නම් යොධයෙක්වූ; පඤ්චා

Non-commercial distribution

ලානං, පඤ්චාලයන්ගේ; යො රාජා, යම් රජෙක්වීද; සබ්බ කාමදං, සියලු කැමතිදේ දෙන්නාවූ; තංහත්ථාරං, ඒ ස්වාමියා සඳහා; අනුසොචාමි ඉති, ශොක කරමි.

ස්වාමීනි චූළනී නම් රජුගේ පුත්වූ මහා රථ නම් යොධවූ පඤ්චාල රට වැසියන්ගේ යම් බඹදත් රජෙක් වූයේද, ස්වාමීනි මට සහ සියල්ලටත් කැමැති කැමැති දේ දුන්නාවූ මාගේ ස්වාමිපුරුෂවූ ඒ බඹදත්රජු අරබයා මම ශොකකරමියි ගාථාව කීයේය. මෙසේ උබ්බරිය විසින් කී කල්හි නැවත තාපස තෙම මේ ගාථා දෙක කීයේය:-

261. සබ්බෙවංහසුං රාජානො-බ්‍රහ්මදත්තස්සනාමකා,
සබ්බෙව චූළනීපුත්තො-පඤ්චාලානං රථෙසභා.

262. සබ්බෙසං අනුපුබ්බෙන-මහෙසිත්තමකාරයි,
කස්මා පුරිමකෙ හිත්වා-පච්ඡිමං අනුසොචසි-නි.

261. සබ්බෙඑව රාජානො, සියලුම රජවරු; බ්‍රහ්ම දත්තස්සනාමකා, බඹදත් නැමැත්තෝ; අහෙසුං, වූහ; සබ්බෙව, සියල්ලෝම; පඤ්චාලානං, පඤ්චාලයන් ගේ; රථෙසභා, රථික ශ්‍රේෂ්ඨවූ; චූළනීපුත්තො, චූළනී පුත්‍රයෝ වූහ.

262. සබ්බෙසං, සියලු රජුන්ට; අනුපුබ්බෙන, පිළිවෙළින්; මහෙසිත්තං, අගමෙහෙසුන් බව; අකාරයි, (නී) කෙළෙහිය; කස්මා, කවර හෙතුවකින්; පුරිමකෙ, පළමුවූ රජුන්; හිත්වා, හැර; පච්ඡිමං, පසුවූ රජු සඳහා; අනුසොචසි ඉති, ශොක කෙරෙහිද.

එම්බා උබ්බරිදෙවිය සියලුම ඒ අසූසයදහසක් රජවරු බ්‍රහ්මදත්ත යන නම් ඇතිවූහ, ඒ සියල්ලෝම චූළනී පුත්‍රවූ පඤ්චාල රටවාසින්ගේ රථීශ්‍රේෂ්ඨයෝම වූහ. ඔවුනතුරෙන් එකෙකුහටවත් මේ රාජභාවාදි විශෙෂයෝ නුවූවාහුය, නීද පිළිවෙළින් ඒ සියලුම රජුන්ගේ අගමෙහෙසුන් බවට පැමිණියෙහි, ගුණයෙන් හා ස්වාමි භාවයෙනුත් වෙනසක් නැති මෙපමණ පළමු සිටි රජවරුන් හැර පසුව වූ එක් රජෙකුටම කවර කාරණයකින් නී ශොකකරේදැයි කියා ඇසුවේය, එය අසා උබ්බරිතොමෝ උපන් සංවෙග ඇතිව නැවත තාපසයාට මෙසෙ කීය:-

Non-commercial distribution

263. ආතුමෙ ඉත්ථීභූතාය-දීඝරත්තාය මාරිස,
යස්සා මෙ ඉත්ථීභූතාය-සංසාරෙ බහු භාසයී-ති.

263. මාරිස, නිදුකාණෙනි; යස්සා, යම්බඳු; ඉත්ථීභූතාය, ස්ත්‍රී භාවයට පැමිණියාවූ; මෙ, මට; සංසාරෙ බහූ, බොහෝජාති; භාසසි, (නුඹ වහන්සේ) කියනසේක්ද?; ආතුමෙ, තමා; ඉත්ථී භූතාය, ස්ත්‍රීභාවයට පැමිණියා; දීඝරත්තාය, බොහෝකල්ද.

නිදුකාණන් වහන්ස, යමෙක් තමා සෑමදම ස්ත්‍රියක්මවේද නොහොත් පුරුෂ භාවයටත් පැමිණේද? මේ කාරණය ස්ත්‍රීභාව යට පැමිණි මා විසින් සිහිකරන ලදුව නොදත හැකිය, මෙසේ මෙපමණ බොහෝකල් සංසාරයෙහි මාගේ අනික් ඉපදීමක් නුවූයේද, එහෙයින් යම්බඳු ස්ත්‍රියක්වූ මා සියලුම ඒ රජුන්ට ඔමහෙයුන් බැව් කළේයයි නුඹවහන්සේ කියනසේක්දැයි ඇසීය. ඒ වචනය අසා තවුස්තෙම මේ ස්ත්‍රී තොමෝ ස්ත්‍රියක්ම වෙයි. පුරුෂයා පුරුෂයෙක්ම වෙයි කියා මෙබඳු නියමයක් සංසාර යෙහි නැත්තේයයි-කියා එය දක්වන්නේ මේ ගාථාව කීයේය:-

264. අහු ඉත්ථී අහු පුරිසො-පසු යොනිම්පි ආගමා,
එවමෙතං අතීතානං-පරියන්තො න දිස්සති-ති.

264. ඉත්ථී අහු, (තී) ස්ත්‍රියක් වූවෙහිය; පුරිසො අහු. පුරුෂද වූවෙහිය; පසුයොනිම්පි, තිරිසන් යොනියටද; ආගමා, සැමිණියෙහිය; එවං, මෙසේ; එතං, මේ (යථොක්ත ස්ත්‍රීභාවාදි යට පැමිණි); අතීතානං, අතීත ආත්මභාවයන්ගේ; පරියන්තො, කෙළවරක්; නදිස්සති ඉති, නොදක්නා ලැබේ.

උබ්බරිය තී සමහර කලෙක ස්ත්‍රීවිය, සමහර කලෙක පුරුෂදවිය, හුදෙක් ස්ත්‍රී පුරුෂ භාවය පමණක්ම නොවෙයි, තිරිසන් යොනියෙහි ඉපදීමටත් පැමිණියේය, මෙසේ කියනලද පරිද්දෙන් මේ ස්ත්‍රී භාවයටද තිරශ්චීනාදී භාවයටත් පැමිණියාවූ ඉක්මගිය ආත්මභාවයන්ගේ කෙළවර නුවණැසින් මහොත්සාහ යෙන් බලන්නාවුන්ටත් නොපෙනෙයි.

හුදෙක් එපමණකුදු නොවේමය. යලිදු සසර කරකැවී ඇවිදින සියලුම සත්වයන් ගේ ආත්මභාවයාගේ කෙළවර නොදක්නා ලැබෙමය නොපෙනේමය, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි මේ සංසාරය අනවරාග්‍රය, අවිද්‍යානීවරණ යෙන් යුත් තෘෂ්ණා සංයොජනයන්ගෙන් බැඳුණාවූ සසර දුව

Non-commercial distribution

ඇවිදින්නාවූ සත්වයන්ගේ පූර්වකෙළවර නොපෙනේය''යි කියා වදළසේක. මෙසේ ඒ තාපසයා විසින් සංසාරයාගේ කෙළවරක් නැති බව හා කර්මය ස්වකීය කොට ඇතිබවත් ප්‍රකාශකිරීමෙන් දෙශනා කළ ධර්මය අසා සසරෙහි කලකිරුණු සිත් ඇතිව ධර්මයෙහි පහන් සිත් ඇතිව පහව ගිය සෝහුල ඇතිව තමාගේ පැහැදීම හා ශොකය පහවීමත් ප්‍රකාශ කරන්නී:-

265. *ආදිත්තා වත මං සන්තං-සනසිත්තංව පාවකං,
චාරිනා විය ඔසිඤ්චං-සබ්බං නිබ්බාපයෙ දරං.

266. *අබ්බූළ්හං වත මෙ සල්ලං-සොකං හදයනිස්සිතං.
යො මෙ සොකපරෙතාය-පතිසොකං අපානුදිං,

267. *සාහං අබ්බූළ්හසල්ලාස්මි-සිතිභූතාස්මි නිබ්බුතා,
න සොචාමි න රොදමි-තව සුත්වා මහාමුනී-ති.

ගිතෙල් ඉස්නාලද ගින්නක් මෙන් එකාන්තයෙන් ශොකාග්නියෙන් දැල්වුණාවූ මාගේ සිතෙහි ගින්නට ජලය වත්කළාක් මෙන් සියලු දුවිලි නිවුයේය. යම් තාපසයෙක් තෙම මාගේ හෘදයෙහි පැවැති ශොක නැමැති හුල එකාන්ත යෙන් ඉදුරුවේද ශොකයෙන් මඩනාලද මාගේ හිමියා පිළිබඳ මරණ සෝදුක පහකළේද.

පින්වත් මහාමුනිවූ තාපසයන් වහන්ස, ඒ මම ඔබ වහන්සේ ගේ ධර්මකථාව අසා උදුරනලද ශොක නැමැති හුල් ඇතිවෙමි, සිහිල්වූයේ වෙමි, නිවුන සිත් ඇත්තේවෙමි, දැන් මම සෝක නොකරමි නොහඬමියි කියා මේ ගාථාත්‍රය කීයේය. දැන් කලකිරුණු සිත් ඇති උබ්බරිදෙවියගේ ප්‍රතිපත්තිය දක්වන්නාවූ ශාස්තෘන් වහන්සේ මේ ගාථා සතර වදළසේක.

268. තස්ස තං වචනං සුත්වා-සමණස්ස සුභාසිතං,
පත්තචීවරමාදය-පබ්බජි අනගාරියං.

269. සා ච පබ්බජිතා සන්තා-ගාරස්මා අනගාරියං.
මෙත්තං චිත්තං ආභාවෙසි-බ්‍රහ්මලොකූපපත්තියා.

270. ගාමා ගාමං විචරන්ති-නිගමෙ රාජධානියො,
උරුවෙලන්නාම සො ගාමො-යත්ථ කාලඤ්ච කුබ්බථ.

271. මෙත්තචිත්තං ආභාවෙත්වා-බ්‍රහ්මලොකූපපත්තියා,
ඉත්ථී චිත්තං විරාජෙත්වා-බ්‍රහ්මලොකූපගා අහූ-ති.

Non-commercial distribution

268. තස්ස සමණස්ස, ඒ ශ්‍රමණ (තාපස) යාගේ; සුභාසිතං, සුභාෂිතවූ; තං වචනං, ඒ ධර්මකථාව; සුත්වා, අසා; පත්ත චීවරං, පාසිවුරු ආදිය රැගෙන; අනගාරියං, අනගාරියත්වයෙහි; පබ්බජි, පැවිදිවිය.

269. සාව, ඕතොමෝ; අගාරස්මා, ගිහිගෙන් (නික්ම) අනගාරියං, තපසට සුදුසු තන්හි; පබ්බජිතාසන්තා, පැවිදිවූයේම; බ්‍රහ්මලොකූපපත්තියා, බඹලොව ඉපදීම පිණිස, මෙත්තං චිත්තං, මෛත්‍රීධ්‍යානය; ආභාවෙසි, වැඩුවේය.

270. ගාමාගාමං, ගමින්ගම; නිගමෙ, නියම් ගමක්පාසා; රාජධානියො, රාජධානියක් පාසා; විචරන්ති, හැසිරෙමින්; උරුවෙලන්නාම, උරුවෙල් නම්, සො ගාමො, ඒ ගම; යත්ථ, යම් තැනෙක්හිද; කාලංච කුබ්බථ, (එහි) කළුරිය කළේය.

271. බ්‍රහ්ම ලොකූපපත්තියා, බඹලොව ඉපදීම පිණිස; මෙත්ත චිත්තං, මෙත්සහගත සිත; ආභාවෙත්වා, වඩා; ඉත්ථී චිත්තං, ස්ත්‍රීභාවයෙහි සිත; විරාජෙත්වා, දුරුකොට; බ්‍රහ්ම ලොකූපගා අහු ඉති, (ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන්) බඹලොවට පැමිණියේ වීය.

ඒ උබ්බරි තොමෝ ශ්‍රමණ වූ ඒ තාපසයා ගේ සුභාෂිතවූ ඒ ධර්මකථාව අසා පාසිවුරු හැරගෙන ගිහිගෙන් නික්මගොස් පැවිදි විය. ඒ උබ්බරිතොමෝ ගිහිගේ හැරගොස් තපසට සුදුසු තන්හි පැවිදිවූයේම බඹලොව ඉපදීම පිණිස මෛත්‍රී සහගත සිත වැඩුවේය. විදර්ශනා පාදකාදිය සඳහා නොවැඩුවේය, බුදුන් නූපන් කල්හිම බ්‍රහ්මවිහාරාදිය වඩන්නාවූ තාපස පරිව්‍රාජකයෝ භව සම්පත් පිණිසම වැඩූහ බ්‍රහ්මලොකොත්පත්තිය පිණිස මෛත්‍රී සිත වඩමින් ගම් නියම්ගම් රාජධානිවල ඇවිදිමින් උරුවෙල් නම් ගමදී කළුරිය කළේය. ඇ ස්ත්‍රී භාවයෙහි ආශාව දුරුකොට ප්‍රතිසන්ධි ග්‍රහණ වශයෙන් බඹලොවට පැමිණියා යයි වදළසේක.

ශාස්තෘන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැර දක්වා ඒ උපාසිකාවගේ ශොකය දුරුකොට මත්තෙහි චතුස්සත්‍ය දෙශනාව කළසේක. චතුස්සත්‍ය දෙශනාවසානයෙහි ඒ උපාසිකා තොමෝ සෝවාන්පෙලෙහි පිහිටියේය. පැමිණි පිරිසටත් දෙශනාව සාර්ත්ථකවිය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි උබ්බරීවර්ගයට ඇතුළත් තෙළෙස්වන උබ්බරී ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

කථාවස්තු තෙළසකින් ප්‍රතිමණ්ඩිතවූ
උබ්බරි නම් විශිෂ්ය වර්ග වස්තු වර්ණනාව කියා නිමවනලදී.

Non-commercial distribution

3. 1 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවග්ගාන්තගීත පළමු වෙනි අභිජ්ජමාන ප්‍රෙතවස්තුව කෙසේද යත්.

සර්ව්ලොකෙක නායක ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වාසයකර වදරන කල්හි එක්තරා වැදි ප්‍රෙතයෙකු අරභයා මේ ප්‍රෙතවස්තුව වදළසේක. බරණැස් නුවර බස්නාහිර දිශාභාගයෙහි වනාහි ගඩිගානදියෙන් එගොඩ වාසභ ග්‍රාමය ඉක්මවා චුඤ්ඣත්ථීක නම් ගම එක් වැද්දෙක් වූයේය. ඒ වැදිතෙම වනයෙහි මුවන් මරා යහපත් මස් අහුරෙහි ලා පුලුස්සා කා ඉතිරි මස් කොලගොටුවල බහා බැඳ කදින් හැර ගෙන ගමට එයි. බාලදරුවෝ ගම්දෙරදී ඔහු දැක ''මස් මට දෙව මස් මට දෙව''යි කියා අත්දිහුකොට ලහට දිවයත්. හෙතෙම ඔවුන්ට ටික ටික මස් දෙයි. ඉක්බිති එක් දවසක් මස් නොලැබ ඇහැළ මලක් පැළඳගෙන මල් බොහොමයක් අතින්ගෙන ගමට යන්නාවූ ඔහු දරුවෝ ගම්දෙරදී දැක මස් මට දෙව මස් මට දෙවයි කියා අත්දිහුකොට ලහට දිවගියාහුය. ඒ වැදිතෙම ඔවුන්ට එක එක මල්පොකුර බැගින් දුන්නේය. ඉක්බිති ඔහු මෑත කලෙක මැරීගොස් ප්‍රෙත යොනියෙහි උපන්නේ විලිවැසුම් නැතිව විරූප ශරීර ඇතිව බියකරු දැකුම් ඇතුව සිහිනෙන්වත් ආහාරපාන නොදන්නේ හිසේ පැළඳගත් ඇහැළමල් කලාපයක් ඇතිව චුඤ්ඣත්ථීකගම නැයන්ගේ හමුවේදී කිසි ආහාරයක් ලබන්නෙමියි සිතා ගංගානම් ගඟ ජලමත්තෙහි උඩුගං බලායයි. එසමයෙහි වනාහි බිම්සර රජහුගේ කොලිය නම් මහාමාත්‍ය තෙම කුපිතවූ පිටිසර බද දනව් වැසියන් සන්සිඳුවා නැවත නුවරට එන්නේ ඇත් අස් ආදි පිරිවර බලසෙනඟ ගොඩින් යවා තමන් ගඩිගා නදියෙහි යටිගංබලා නැවකින් යමින් එසේ යන්නාවූ ඒ ප්‍රෙතයා දැක විචාරමින් මේ ගාථාව කීයේය:-

1. අභිජ්ජමානෙ වාරිම්හි – ගඩිගාය ඉධ ගව්හයි,
නග්ගො පුබ්බඩපෙතොව – මාලාධාරී අලඩ්කතො
කුහිං ගමිස්සසි පෙත – කත්ථ වාසෝ භවිස්සති-ති.

1. පෙත, එම්බා ප්‍රෙතය; ගඩිගාය, ගංගා නදිහුගේ; අභිජ්ජමානෙ, (පා තැබීමෙන්) නොකැඩෙන; වාරිම්හි, ජලමත්තෙහි;

Non-commercial distribution

නග්ගො, නග්නවූ; පුබ්බඬ්ඪපෙතො ඉව, (ශරීරයාගේ) පූර්වාර්ධ-යෙන් දෙවියෙකු වැනිවූ; මාලාධාරී, මල්මාලා පැළඳුන්දවූ; අලඞ්කතො, සරසන ලද හිසග ඇතිව; ඉධ, මෙහි; ගච්ඡසි, යන්නෙහිය; කුහිං, කොතන්හි; ගමිස්සසි, යන්නෙහිද; වාසො, විසීම; කත්ථ භවිස්සති ඉති, කොතන්හි වන්නේද.

ප්‍රෙතය පා තැබීමෙන් නොබිඳෙන ගංගානදි ජලයෙහි ශරීරයාගේ පූර්වාර්ධයෙන් දිව්‍යපුත්‍රයෙකු සේ මල්පැළඳගත් අලඞ්-කාර කරනලද හිසග ඇති නුඹ නග්නව මේ කොතන්හි යන්නේද, නුඹේ නිවාසය කවර ගමෙක හෝ දෙශයක වන්-නේද, එය කියවයි කීයේය. මෙතැන්හිදී එකල ඒ ප්‍රෙතයා විසින් හා කොලිය ඇමතියා විසිනුත් යමක් කියන ලදද එය දැක්වීමට සඞ්ගීතිකාරයෝ මේ ගාථාවන් කීහු:-

2. **චුන්දත්ථිකං ගමිස්සාමි-පෙතො සො ඉති භාසති,**
අන්තරෙ වාසභගාමං-බාරාණසියා ච සන්තිකෙ.

3. **තඤ්ච දිස්වා මහාමත්තො-කොලියො ඉති විස්සුතො,**
සත්තුං හත්තඤ්ච පෙතස්ස-පීතකඤ්ච යුගං අද.

4. **නාවාය තිට්ඨමානාය-කප්පකස්ස අදපයි,**
කප්පකස්ස පදින්තම්හි – යානෙ පෙතස්සුදිස්සථ.

5. **තතො සුවත්ථවසනො මාලාධාරී අලඞ්කතො,**
යානෙ ඨිතස්ස පෙතස්ස-දක්ඛිණා උපකප්පථ
තස්මා දජ්ජෙථ පෙතානං-අනුකම්පාය පුනප්පුන-න්ති.

2. වාසභාගාමං, වාසභ ගමටත්; බාරාණසියාව, බරණැ-සටත්; අන්තරෙ, මැද; සන්තිකෙ, (බරණැසම) සමීපයෙහිවූ; චුන්දත්ථිකං, චුන්දත්ථික නම් ගමට; ගමිස්සාමි ඉති, යන්නෙමියි; සො පෙතො, ඒ ප්‍රෙතතෙම; භාසති, කියයි.

3. කොලියො ඉති, කොලිය යයි කියා; විස්සුතො, ප්‍රකටවූ; මහාමත්තො, මහ ඇමැතිතෙම; තංච, ඒ ප්‍රෙතයා; දිස්වා, දැක; පෙතස්ස, ප්‍රෙතයා සඳහා; සත්තුං, අක්සුණුද; හත්-තංච, බත්ද; පීතකංචයුගං, ස්වර්ණවර්ණ වූ වස්ත්‍ර යුග්මයක්ද; අද, දුනි.

4. නාවාය, නැව; තිට්ඨමානාය, සිටිකල්හි; කප්පකස්ස, කරනැවැමි උපාසකයෙකුහට; අදපයි, (වස්ත්‍ර යුග්මය) දෙව්වේය;

Non-commercial distribution

කප්පකස්ස, කපුවාහට; පදින්නමහි, දුන්කල්හි; ඨානෙ, ස්ථාන-වශයෙන් (නොහොත්) එකණෙහිම; පෙතස්ස, ප්‍රෙතයාගේ (ශරීරයෙහි); උදිස්සථ, දක්නාලදී.

5. තතො, ඉන්පසු; සුවත්ථවසනො, යහපත් දිව්‍යවස්ත්‍ර හැන්දේ; මාලාධාරී, මල්පැළන්දේ; අලඞ්කතො, සැරසුණේවිය; ඨානෙ, දක්ෂිණාර්හස්ථානයෙහි; ඨිතා, පිහිටියාවූ; දක්ඛිණා, දක්ඛිණා තොමෝ; අස්සපෙතස්ස, මේ ප්‍රෙතයාහට; උපකප්පථ, පැමිණියේය; තස්මා; එහෙයින්; පෙතානං, ප්‍රෙතයන්ට; අනුකම්පාය, අනුකම්පාවෙන්; පුනප්පුනං, නැවත නැවත; දජ්ජෙථ ඉති, දක්ෂිණාව දෙන්නේය.

පින්වත මම වාසභ ගමටත් බරණැසටත් අතරෙහිවූ බරණැසට සමීපවූ චුන්දත්ථික නම් ගමට යන්නෙමියි කියා ඒ ප්‍රෙතතෙම මෙසේ කීය. එවිට කොලියයි ප්‍රකටවූ මහ ඇමැති-තෙම ඒ ප්‍රෙතයා දැක ප්‍රෙතයා සඳහා අක්සුණු හා ආහාරද ස්වණ්ණවණ්ණවූ වස්ත්‍ර යුග්මයක්ද රැගෙන යන්නාවූ නැව නවතා නැවේ සිටිය කරනැවැමි උපාසකයෙකුහට දෙවීය, කපුවාට එයදී දක්ෂිණාව දුන්කල් හි එකණෙහි ඒ ප්‍රෙතයාගේ ශරීරයෙහි හඳනා පොරොනා වස්ත්‍ර දක්නාලදි. ඉන්පසු හෙතෙම යහපත් දිව්‍යවස්ත්‍ර හැඳ පොරවා ගත්තේ මාලාභරණයෙන් මොනවට සැරසුණේය, දක්ෂිණාර්හස්ථානයෙහි පිහිටියාවූ මේ දක්ෂිණාව ඒ ප්‍රෙතයාහට යම් හෙයකින් ලැබුණේද එහෙයින් නැවත නැවතත් ප්‍රෙතයන්ට අනුකම්පාවෙන් ප්‍රෙතයන් උදෙසා දන්-දෙන්නේ යයි කීහු.

ඉක්බිත්තෙන් ඒ කොලිය නම් මහාමාත්‍යතෙම ඒ ප්‍රෙතයාට අනුකම්පා කරමින් දානවිධිය සම්පාදනය කොට ගඟ පහළට අවුත් හිරුඋදාවන කල්හි බරණැසට පැමිණියේය. භාග්‍යවතුන් වහන්-සේද ඔවුන්ට අනුග්‍රහ පිණිස අහසින් වැඩමවා ගංතෙර වැඩ සිටියේක. කොලිය මහාමාත්‍ය තෙමේද නැවින් බැස තුටු පහටුව ''ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස අනුකම්පා උපදවා අද දවස මාගේ දානය ඉවසා වදාරන සේක්වා''යි කියා භාග්‍යවතුන් වහන්-සේට ආරාධනා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ තූෂ්ණීම් භාවයෙන් එය ඉවසා වදාළසේක. ඒ ඇමැතිතෙම භාග්‍යවතුන් වහන්සේ ගේ ඉවසීම දැක එකෙණෙහිම සිත්කළු භූමිභාගයක

Non-commercial distribution

මහත්වූ අතුවලින් තැනූ මඩුව මත්තෙහි සිව්පස්හි නානාවිධ විරාගවණ්ණයෙන් විසිතුරුවූ විවිධ වස්ත්‍රවලින් සමලඞ්කෘත කරවා එහි භාග්‍යවතුන් වහන්සේට අසුනක් පණවා දුන්නේය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පැණවූ අස්නෙහි වැඩහුන්සේක. එකල්හි වනාහි ඒ මහඇමතිතෙම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ගඳමල් ආදියෙන් පුදා වැඳ එකත්පසෙක හුන්නේ තමා විසින් ප්‍රෙතයාහට යට කියන ලද වචනය හා ප්‍රෙතයාගේ පිළිතුරුද තථාගතයන් වහන්සේට සැලකෙළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ''භික්ෂුසඞ්ඝයා වඩීවා''යි සිතා වදළසේක. සිතීමට අනතුරුවම බුඩානුභාවයෙන් මෙහෙයනලද සිත් ඇති භික්ෂු සංඝතෙමේ ධෘතරාෂ්ට්‍ර හංසරාජයා පිරිවැරූ ස්වර්ණහංස සමූහයා මෙන් ධර්මරාජන්වූ බුදුන් පිරිවරා ගත්තේය. එකල්හි දුන් උදරවූ ධර්මදෙශනාවක් වන්නේයයි සිතා මහජන තෙමේ රැස්විය. එය දැක පහන්සිත් ඇති මහඇමතිතෙම බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා වහන්සේට ප්‍රණීතවූ බාද්‍යභොජ්‍යයෙන් වැළඳවිය. කරන ලද භක්තකෘත්‍යය ඇති භාග්‍යවතුන් වහන්සේ මහජනයාට අනුකම්පාවෙන් බරණැස්නුවර සමීප වැසියෝ රැස්වෙත්වායි අධිෂ්ඨාන කළසේක. ඒ සියලුම මහජනයෝ බුදුන්ගේ ඍඩි බලයෙන් රැස්වූහ. බොහෝ ප්‍රෙතයන්ද ඒ මහජනයාට ප්‍රකට කළසේක. ඒ ප්‍රෙතයන් අතුරෙන් සමහරු සුන්බුන් රෙදි කැබලි හැන්දේද, සමහරු තමන්ගේ හිසකේ වලින්ම වසාගත් ලජ්ජා ස්ථාන ඇතුවද, තවත් කෙනෙක් උපන් පරිදි රූඇති (නග්න) වද, ක්ෂුධා පිපාසයෙන් මඩනාලදුව සමින් වසනලද ඇටපමණක්වූ ශරීරඇතිව ඔබ්මොබ ඇවිදින්නාහුද මහජනයා හට ප්‍රත්‍යක්ෂ වශයෙන් පෙණුනාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රෙතයෝ එකතැනකට රැස්වී තමන් පෙරකළ පව්කම් යම්සේ මහජනයාහට ප්‍රකාශකළාහුද එබදුවූ ඍඩ්‍යභි සංස්කාරයක් ඉටා වදළසේක. ඒ කාරණය ප්‍රකාශකරන්නාවූ සංගීතිකාරයෝ මේ ගාථාවන් කීහු:-

6. සතුන්ත වසනා එකෙ – අඤ්ඤෙ කෙසනිවාසනා,
පෙතා හත්තාය ගච්ඡන්ති – පක්කමන්ති දිසොදිසං.

7. දූරෙ එකෙ පධාවිත්වා-අලඩාව නිවත්තරෙ,
ඡාතා පමුච්ඡිතා හන්තා-භූමියං පටිසුම්භිතා.

Non-commercial distribution

8. කෙචි තත්ථ පපතිත්වා භූමියං පටිසුම්භිතා,
පුබ්බෙ අකතකල්‍යාණා-අග්ගි දඩ්ඪාව ආතපෙ.

9. මයං පුබ්බෙ පාපධම්මා-සරණියො කුලමාතරො,
සන්නෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකම්හ අත්තනා.

10. පභූතං අන්නපානම්පි-අපිස්සු අවකිරියති,
සම්මග්ගතෙ පබ්බජිතෙ-න ච කිඤ්චි අදම්හයෙ.

11. අකම්මකාමා අලසා-සාදුකාමා මහග්ඝසා,
ආලොපපිණ්ඩදාතාරො-පටිග්ගහෙ පරිභාසිම්හසෙ.

12. තෙ සරා නා ච දුසියො-තානෙවාභරණානි නො,
තෙ අඤ්ඤෙ පරිහාරෙන්ති-මයං දුක්ඛස්ස භාගිනො.

6. එකෙපෙතා, සමහර ප්‍රෙතයෝ; සතුන්නවසනා, සුන්බුන් රෙදිකඩ හැන්දේද; අඤ්ඤෙ, තවත් සමහරු; කෙස-නිවාසනා, කෙශයෙන් ලජ්ජා ස්ථාන වසාගත්තෝද; භත්තාය, ආහාර පිණිස; ගච්ඡන්ති, යත්; දිසොදිසං, දිගින්දිගට; පක්ක-මන්ති, යති.

7. එකෙ, ඇතැම් ප්‍රෙතයෝ; දූරෙ, දුරතැන්; පධාවිත්වා, දුවගොස්; අලඩාව, (කිසිවක්) නොලබාම; නිවත්තරෙ, නවතිත්; ඡාතා, සාගිනි ඇත්තෝ; පමූඪිතා, හටගත් මුළා ඇතිව; භන්තා, කරකැවෙමින්; භූමියං, බිම; පටිසුම්භිතා, වැටුණා-හුවෙත්.

8. කෙචි, සමහරු; තත්ථ, ඒ (ගිය) තන්හි; පපතිත්වා, වැටී; භූමියං, බිම; පටිසුම්භිතා, වැටුණාහුවෙත්; පුබ්බෙ, පෙරජාතියෙ හි; අකතකල්‍යාණා, කුසල්නොකළාහු; ආතපෙ, අව්වෙහි; අග්ගි දඩ්ඪා ඉව, ගින්නෙන් දැවුණුවුන්මෙන් වෙත්.

9. මයං, අපි; පුබ්බෙ, පෙර අත්බැව්හිදී; පාපධම්මා, (ඊර්ෂ්‍යා මාතස්ය්‍යාදි) ලාමක ස්වභාව ඇති, සරණියො, ගෘහ-ස්වාමිනිවූ; කුලමාතරො, කුලමව්වරුවූවු; දෙය්‍යධම්මෙසු, දෙයධර්ම්ය; සන්තෙසු, විද්‍යමානකල්හි; අත්තනො, තමහට; දීපං, පිහිටක්; න අකම්හ, නොකෙළෙමු.

10. පභූතං, බොහෝවූ; අන්නපානම්පි, ආහාරපානද; අපිස්සු අවකිරියති, වසා දමනුලැබේ; සම්මග්ගතෙ, සම්‍යක්-ප්‍රතිපන්නවූ; පබ්බජිතෙ, පැවිද්දන්ට; කිඤ්චි, කිසිවක්; නව අදම්හසෙ, නොම දුනිමු.

Non-commercial distribution

11. අකම්මකාමා; නොකටයුතු අකුසලයට කැමැත්තෝ වීමු; අලසා, (කුසල කරණයෙහි) අලසයෝවීමු; සාදුකාමා, මිහිරි වස්තුවට ප්‍රියවීමු; මහග්ඝසා, බොහෝකෑවෝ වෙමු; ආලෝප පිණ්ඩදතාරෝ, බත්පිඩක් පමණවත් දෙන්නාහු; පටිග්ගහෙ, ප්‍රති ග්‍රාහකයන්ට; පරිභාසිම්හසෙ, පරිභවකළෙමු.

12. තෙ ව සරා, ඒ ගෘහයෝද; තාචදසියො, ඒ දැසියෝද; තානිඵව ආභරණානි, ඒ ආභරණයෝද; නො, අපට නැත්තාහ; අඤ්ඤෙ, අනික් අය; තෙ, ඒ ගෘහාදිය; පරිහාරෙන්ති, පරිභොග කරත්; මයං, අපි; දුක්ඛස්ස, දුකට; භාගිනො, හිමිවීමු.

සමහර ප්‍රෙතයෝ සුන්බුන් රෙදි කැබලි ඇඳගත්තෝද තවත් සමහරු හිසකේවලින් ලජ්ජාස්ථාන වසාගත්තෝද මෙහි ගොස් යම් ඒ තැනකදි ඉඳුල් බතක් හෝ වමනයකළ බතක් හෝ ගැබ්මලාදියක් හෝ යම්කිසි ආහාරයක් ලබන්නෙමු නම් යෙහෙකැයි සිතා කිසිතැනකට නොගොස් ආහාර පිණිස යත්, දිශාවෙන් දිශාවට නොයෙක් යොදුන් ගණන් අතර තැනට යති. ඇතැම් ප්‍රෙතයෝ දුරතන්හි ආහාර පිණිස දුව ගොස් කිසි ආහාරයක් නොලබාම නවතිත්, ක්ෂුධාග්නියෙන් පෙළෙන ප්‍රෙතයෝ සාපිපාසාදි දුකින් හටගත් මුර්ඡා ඇතිව කරකැවෙමින් බිමහෙළු මැටි පිඬුසේ බිම ඇදවැටෙති. සමහර ප්‍රෙතයෝ ඒ ගිය තැන ප්‍රපාතයක වැටුණාසේ ක්ෂුධාපිපාසාදි දුක් කරණ කොටගෙන සිටීමට අසමර්තථ බැවින් බිම වැටෙති, නොහොත් ඒ ගියතන්හිදි ආහාරාදිය නොලැබීමෙන් සුන් ආශා ඇතිව කිසිවෙකු විසින් පිටිපසින් තල්ලුකොට යවුවාසේම බිමවැටෙත්. පෙර ජාතියේදී කුසල් නොකළ ඒ සත්වයෝ නියං කාලයෙහි අව්වේ ගින්නෙන් දැවුණවුන්සේ ක්ෂුධා පිපාසාග්නියෙන් දැවෙමින් මහත් දුක් විඳිත්. තවද අනල්ප දුක්විඳින ප්‍රෙතයෝ කියන්නාහු අපි පෙර අත්බැව්හිදී ඊර්ෂ්‍යාමාත්සය්‍යාදියෙන් ලාමක ස්වභාව ඇතිවීමු. ගෘහ ස්වාමීනිහු වීමු, කුලදරුවන්ට හෝ කුලපිරිසට මව්වරුවීමු, දියයුතු දනවස්තුව විද්‍යමාන කල්හි තමන්ට පරලොවදී පිහිටවන පිනක් අපි නොකළෙමු. බොහෝ ආහාරපාන වර්ග වසා-දවනලදී, මනාව පිළිපන් පැවිද්දන්ට කිසි දෙයක් නුදුනිමු. සත්පුරුෂයන් විසින් නොකටයුතුවූ අකුශල කර්මයට කැමති

Non-commercial distribution

වූයෙමු නොහොත් සත්පුරුෂයන් විසින් කටයුතු වූ කුශල කර්මයට නොකැමතිවූවෙමු. කුසල් කිරීමෙහි අලස වීමු. සැපවූ මිහිරි වස්තුවලට ප්‍රියවීමු යහපත් මිහිරි ආහාර ලබා යාචකයන්ට කිසිත් නොදී තුමූම කැවෙමු බත්පිඩක් පමණවත් පින් සඳහා දෙන්නෝ ප්‍රතිග්‍රාහකයන්ට අවමන් කෙළෙමු. අපි පූර්ව ජාතියෙහි යම් තැනක අපගේ ගේයයි මමත්වයක් කළෙමුද, ඒ ගෙවල් තිබුන පරිදි ඇත්තාහ, නමුත් දැන් අපට කිසිත් නොලැබෙයි, ඒ දස දසියෝද, එම ආභරණයෝද අපට දැන් නැත්තාහුය, එකී ගෘහාදී සියල්ල දැන් අන්‍යයෝ පරිභොග කරති අපි වනාහි ඉපර හුදෙක් ක්‍රීඩායෙහි තත්පරව සම්පත් හැර ගෙනයායුතුවූ අනුගාමික කුශලයක් කරන්ට නොදැනිමින් සිටී හෙයින් මේ කාලයෙහි ක්ෂුත් පිපාසාදි දුකට හිමිවූවෝ වෙමුයයි තමන්ට නින්ද කරමින් කියත්. දැන් යම් හෙයකින් ප්‍රෙතයොනි යෙන් චුතව මිනිස්ලොව උපදින්නෝද බොහෝ සෙයින් එම අකුශල කර්මයාගේ විපාකාවශෙෂයෙන් හීනජාති ඇතිව දුගී පැවතුම් ඇතිවෙත්ද එහෙයින් ඒ කාරණය දක්වීමට ''වෙණිවා'' යනාදි ගාථාදෙක කියන ලදහ.

13. වෙණී වා අවඤ්ඤා හොන්ති-රථකාරී ච දුබ්භිකා,
චණ්ඩාලී කපණා හොන්ති-කප්පකා ච පුනප්පුනං.

14. යානි යානි නිහීනානි-කුලානී කපණානි ච,
තෙසු තෙසෙව්ව ජායන්ති-එසා මච්ඡරිනෝ ගති.

13. අවඤ්ඤා, අවමත් කටයුතුවූ; වෙණිවා, නළකරුකුල ඇත්තෝ හෝ; හොන්ති, වෙත්; රථකාරීව, සම්කරුකුල ඇත්තෝද: දුබ්භිකා, මිත්‍රද්‍රොහිවූවෝද; චණ්ඩාලී, සැඩොල්කුල ඇත්තෝද; කපණා, කෘපණ (හෙවත්) ඉතා අකරුණාවට පැමිණියෝ ද; කප්පකාව, කප්පකුලවත්හුද; පුනප්පුනං, නැවත නැවත; හොන්ති, වෙත්.

14. කපණානිව, කෘපණවූ (හෙවත්) ඉතා දුප්පත්වූ; යානි යානි නිහීනානි කුලානි, යම් යම් නිහීන කුලයෝ වෙත්ද; තෙසු තෙසු එව, ඒ ඒ (ඉතා හීන) කුලයන්හිම; ජායන්ති, උපදින්; එසා, මෝතොමෝ; මච්ඡරිනෝ, මාත්සර්‍ය්‍ය ඇත්තාගේ; ගති, ස්වභාවයයි.

Non-commercial distribution

නින්ද කටයුතුවූ කුළුපොතු කුලයෙහි හෝ සම්කරු කුල යෙහි හෝ සැඩොල් කුලයෙහි හෝ කප්පක කුලයෙහි හෝ මිත්‍ර ද්‍රොහීව දුප්පත්ව හෝ ඉතාමත් අකරුණාවට පත්වූවෝව නැවත නැවත උපදින්නෝ වෙත්. මේ නිහීන කුලයන්හි ඔබි මොබත් උපදිත්යයි කියන ලදී. මසුරු මලය හෙතුකොට ගෙන ප්‍රෙතලොකයෙහි ඉපිද එයින් මැරිගොස් බැගෑපත්වූ ඉතා පිළිකුල් කටයුතුවූ අතිශයින් දුප්පත්වූ යම් යම් වැදිකුල පුප්සඩු කුලාදියක් වෙත්ද ඒ ඒ නිහීන කුලයන්හිම උපදින්. මසුරු පුහුලන්ගේ උත්පත්තිය මෙසේ වෙයි, පින්නොකළ සත්වයන්ගේ ස්වභාවය දක්වා නැවත පින්කළ සත්වයන්ගේ ගතිය දැක්වීමට ගාථා සතරක් කියනලදහ.

15. **පුබ්බෙව කතකල්‍යාණා-දයකාවීතමච්ඡරා,**
සග්ගං තෙ පරිපූරෙන්ති-ඔභාසෙන්ති ච නන්දනං.

16. **වෙජයන්තෙ ච පාසාදෙ-රමිත්වා කාමකාමිනො,**
උච්චා කුලෙසු ජායන්ති-සහොගෙසු තතො චුතා.

17. **කූටාගාරෙ ච පාසාදෙ-පල්ලඞ්ක ගොණකත්ථතෙ,**
විජිතඩගා මොරහත්ථෙහි- කුලෙ ජාතා යසස්සිනො.

18. **අඩ්කතො අඩකං ගච්ඡන්නී-මාලාධාරි අලඞ්කතා,**
ධාතියො උපතිට්ඨන්ති-සායං පාතං සුඛෙසිනො.

15. පුබ්බෙ; පෙර; විතමච්ඡරා, පහකළ මසුරුමල ඇතිව; කතකල්‍යාණා එව, කළ කුසල් ඇතිවූම; දයකා, දයකයෝ වෙත්ද; තෙ, ඔවුහුතුමු; සග්ගං, ස්වර්ගලොකය; පරිපූරෙන්ති, පුර වත්; නන්දනංච, නන්දන වනයද; ඔභා-සෙන්ති, බබුලුවත්;

16. වෙජයන්තව, පාසාදෙ, වෛජයන්ත ප්‍රාසාදයෙහිද; රමිත්වා, ඇලී; කාමකාමිනො, (කැමැති පරිදි) කාමසම්පත් පරිභොග කළාහු; තතොචුතා, එයින් චුතව; සහොගෙසු, මහත් සම්පත් ඇති; උච්චාකුලෙසු, (ක්ෂත්‍රියාදි) උසස් කුල-යන්හි; ජායන්ති, උපදින්.

17. කුලෙජාතා, (උසස්) කුලයෙහි උපන්නෝ; කූටාගාරෙ ච, කුළුගෙයිද; පාසාදෙ, පහරයෙහිද; ගොණකත්ථතෙ, දික් ලොම් ඇති කොදුපලස් අතුරනලද; පල්ලඞ්කෙ, පර්‍යඞ්ක

Non-commercial distribution

යෙහි; විජි තඩගා, දිනු සිරුර ඇති; මොරහත්පෙහි, මොනර පිලින් සැරසුන විජිනිපත්ගත් අතින්යුක්තව; යසස්සිනො, පිරිවර ජනයා ඇත්තෝව (ඇලෙත්.)

18. මාලාධාරී, මල්මාලා දරව; අලඞ්කතා, අලඞ්කෘත-වූවාහු; අඞ්කතො අඞ්කං, ඇකයෙන් ඇකයට; ගච්ඡන්ති, යත්; සුඛෙසි නො, සැපකැමැතිවූ; ධානියො, කිරිමව්වරු; සායං, සවස්කාලයෙහිද; පාතං, උදයකාලයෙහිද; උපතිට්ඨන්ති, උපස්ථාන කරත්.

පූර්වජාතියෙහි පහකළ මසුරුමල ඇතිව දනාදි පින්කළ යම් දයකයෝවෙත්ද ඒ දයකයෝ තමන්ගේ රූපසම්පත්ති-යෙන් හා පරිවාර සම්පත්තියෙන්ද දෙව්ලොව පුරවත් එපමණකුත් නොවේමය, කල්පවෘක්ෂාදීන්ගේ ආලොකයෙන් බබලන්නනාවූම නන්දනවනය තමන්ගේ වස්ත්‍රාභරණාලොක-යෙන් හා ශරීරා ලොකයෙන්ද මැඩපවත්වා ඒ තුමූ බබුලුවා දිලිසෙත්. වෛජයන්ත ප්‍රාසාදයෙහිද ඇලී කැමැති පරිදි කාම සම්පත් පරිභොග කළ දිව්‍යපුත්‍රයෝ ඒ දෙව්ලොවින් චුතව මිනිස්ලොව මහත් සම්පත් ඇති ක්ෂත්‍රිය වංශාදි උසස් කුලවල උපදින්නාහුය ඒ උසස් කුලවල උපන්නෝ කුළුගෙවල හා පහයවලත් දික් ලොම් ඇති කොදුපලස් අතුරනලද පය්‍යඞ්ක-යෙහි ජයගත් ශරීර ඇතිව මොනර පිළින් සැරසූ විජිනිපත් ගත් අත්වලින් යුක්තව පිරිවර ජනයා ඇතිව රමණයකරත්. මාලාභරණයන්ගෙන් මනාවසර සන ලදුව ලදරු කාලයෙහිද නෑයන්ගේ හා කිරිමව්වරුන්ගේත් ඇකයෙන් ඇකයටම යෙත් බිමට නොබසිත්. ශීතවූ හෝ උෂ්ණවූ හෝ ස්වල්පයකුදු දුකක් නොවේවායි සලකා පරිහරණය කරන සැපකැමැති කිරිමව්වරු උදය සවස උපස්ථාන කරත්.

19. නයිදං අකතපුඤ්ඤානං-කතපුඤ්ඤාන මෙවිදං.
අසොකං නන්දනං රම්මං-තිදසානං මහාවනං.

20. සුඛං අකතපුඤ්ඤානං-ඉධ නත්ථි පරත්ථ ච,
සුඛඤ්ච කතපුඤ්ඤානං-ඉධ චෙව පරත්ථ ච

21. කෙසං සහව්‍යකාමානං-කත්තබ්බං කුසලං බහුං.
කතපුඤ්ඤා හී මොදන්ති-සග්ගෙ භොගසමඞ්ගිනො-ති.

Non-commercial distribution

19. අසොකං, ශොකරහිතවූ; රම්මං, රම්‍යවූ; නිදසානං, දෙවියන්ගේ; මහාවනං, මහවනයවූ; ඉදං නන්දනං, මේ නදුනුයන; අකතපුඤ්ඤානං, පින් නොකළවුන්ට; න, නො ලැබේ; කතපුඤ්ඤා නං එව, පින්කළවුන්ටම; ඉදං, මෙය (ලැබේ.)

20. අකතපුඤ්ඤනං, පින්නොකළවුන්ට; ඉධ, මෙලොව‍ද; පරත්ථව, පරලොවද; සුඛං නත්ථි, සැපතක් නැත; කත පුඤ්ඤනං, පින්කළවුන්ට; ඉධවෙව, ඉහාත්ම භාවයෙහිදීද, පරත්ථව, පරලොවදීද; සුඛඤ්ච, සැපම (ලැබේ.)

21. තෙසං, ඒ (යථොක්ත) දෙවියන් හා; සභව්‍යකාමානං, සහභාවය කැමැත්තන් විසින්; බහුං, බොහෝවූ; කුසලං, කුසල කර්මය; කත්තබ්බං, කටයුතුයි; කතපුඤ්ඤානි, (දනාදී) පින් කලෝම; භොගසමඞ්ගිනො, දිව්‍යපඤ්චකාම ගුණයෙන්යුක්ත වූවාහු; මොදන්ති ඉති, සතුටුවෙත්.

ශොකවස්තු අභිත බැවින් නිශ්ශෝකවූ තව්තිසා වැසි දෙවියන්ගේ මහාඋපවනයවූ මේ නදුන්උයන කුසල් නොකළ සත්වයන්ට නොලැබෙයි. මෙය කුසල් කළාවූ සත්වයන්හටම වෙයි. පින් නොකළ සත්වයන්ට මෙලොවදී හෝ පරලොවදී හෝ කිසි සපතක් නැත්තේය, කුසල්කළ සත් පුරුෂයන්ට මෙලොව පරලොව දෙක්හිම සැප ලැබෙමය. එහෙයින් ඒ යතොක්ත දෙවියන් හා එක් වනු කැමැත්තන් විසින් බොහෝවූ දනාදිකුසල් කටයුතු මය, කුසල්කළ සත් පුරුෂයෝම දෙව්ලොවදී පඤ්චකාම ගුණයෙන් සම්පූර්ණව සතුටුවෙත්යයි ඒ ප්‍රෙතයෝ කීහු. මෙසේ ඒප්‍රෙතයන් විසින් ආරාධන හෙතුවින් තමා විසින් කළ කර්මයාගේ ගතිය හා පුණ්‍යකර්මියාගේ ගතියත් ප්‍රකාශකළ කල්හි කලකිරුණු සිත් ඇති කොලිය මහාමාත්‍යයා ප්‍රමුඛවූ එහි රැස්ව සිටි මහජන යාගේ අදහසට අනුරූපවූ ධර්මය භාග්‍යවතුන් වහන්සේ විස්තර වශයෙන් දෙශනා කළසේක. දෙශනාවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණින්ට ධර්මාවබෝධය වූයේය.

(ඊර්ෂ්‍යා මාත්සර්‍යාදි ලාමක අදහස් ඇති අය දනාදි කුශල ක්‍රියාවක් නොකොට මැරිගොස් ප්‍රෙතාදි අනන්තාප්‍රමාණ දුඃඛ යන්ට භාජනවන සැටිත්, පින්කළ අය මතු සුගති සැප විඳින

Non-commercial distribution

සැටිත් මේ කථාව කියවීමෙන් දැනගත හැකියි. එහෙයින් සැප කැමතිකවුරුත් මේ ධර්මකථා සාදරයෙන් කියවා සිත්හි තබා ගෙන සුගති මාර්ගය ලබාගැනීමට උත්සාහවත් වියයුතුයි.)

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයට ඇතුළත් පළමුවූ අභිඡ්ජමාන ප්‍රෙතවස්තු වණ්ණනාව කියානිමවන ලදී.

---

3. 2 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගාන්තර්ගත දෙවන **සානුවාසි ප්‍රෙතවස්තුව** කවරහයත්.

ත්‍රෛලොකෛක ප්‍රදීපායමාන ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවාසයකර වදරන කල්හි ආයුෂ්මත් සානුවාසි ස්ථවිරයන්ගේ ඥාති ප්‍රෙතයන් අරභයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කළසේක.

යටගිය දවස බරණැස්නුවර කිකවනම්රජහුගේ පුත්‍රතෙම උයන්කෙළිකෙළ නුවරට එන්නේ සුනෙත්ත නම් පසේ බුදුන් පිඬුපිණිස හැසිර නුවරින් නික්ම වඩිනවුන් දැක ඓශ්වර්‍යෂ්මද යෙන් මත්වී ''මේ හිසමුඩු තැනැත්තේ කෙසේ නම් මට ඇදිලි නොකොට යේද''යි සිතා තරහවූ සිත් ඇතුව ඇතුපිටින් බැස කිමෙක්ද නුඹ විසින් පිණ්ඩපාතය ලබනලද''යි කියා කථාකර මින් පසේබුදුන් අතින් පාත්‍රයගෙන පොළවේ හෙලා බින්දේය. එකල්හි උන්වහන්සේ සියලු තන්හි අකම්පාමාන ප්‍රවෘත්ති ඇති හෙයින් විකාරයක් නොකොට කරුණාවෙන් පැතුරුණ සෞම්‍යවූ සොම්නස් සහගත නෙත් හෙලා පහන්සිත් ඇතිවම ඔහුදෙස බැලූ නමුදු නිකරුණේ උපන් ක්‍රොධයෙන් ප්‍රදූෂිත සිත් ඇතිව ''කිමෙක්ද මා කිතවරජුගේ පුත්‍රයයි නුඹ නොදනීද? නුඹේ බැලීම මට කුමක් කරන්නේද''යි කියා අවමන් කරමින් ගියේය. එතනින් පිටත්වූ ඇසිල්ලෙහිම ඕහට නරකාග්නිය සදෘශවූ බලවත් ශරීර ඩාහයක් උපන. හෙතෙම ඒ මහා සන්තාපයෙන් මැඩුණු ශරීර ඇතිව ඉතා දැඩි දුඃඛ වෙදනාවෙන් මිරිකී කළුරියකොට අවීචිමහා නරකයෙහි උපන. හෙතෙම එහි දකුණු පසින් හා වම්පසින්ද උඩුකුරුව හා යටිකුරුවද්දයි බොහෝ

Non-commercial distribution

ප්‍රකාරයෙන් පෙරළිසිට සුවාසූ දහසක් හවුරුදු මුළුල්ලෙහි පැසී එයින් චුතව ප්‍රෙතලොකයෙහි අප්‍රමාණ කාලයක් මුළුල්ලෙහි සා පිපාසාදි දුක් විඳ එයින් සැව මේ බුඩොත්පාද කාලයෙහි කුණ්ඩි නුවර සමීපයෙහි කෙවුල් ගමෙක උපන. ඕහට ජාතිස්මරණ ඥානය ඇති විය. හෙතෙම ඒ ජාතිස්මරණ ඥානයෙන් පෙර තමා විසින් අනුභයකළාවූ දුක් සිහිකරමින් තරුණවයසට පැමිණියේ නමුදු පවට බියෙන් නැයන් සමගද මසුන් බැඳීම පිණිස නොයෙයි. ඒ නැයන් යන කල්හි මස්මරන්ට නොකැමතිව සැඟවෙයි. ඉන්පසුවද මසුන් අල්ලන දැල කපාදමයි. ජීවත්වන මසුන් හැරගෙන දියේ හැරලයි. ඔහුගේ ඒ ක්‍රියාව නුරුස්නා නැයෝ ඔහු ගෙයින් බැහැර කළාහුය. ඔහුගේ එක සහෝදරයෙක් වනාහි ස්නෙහයෙන් සතුටු සිත් ඇතිවිය.

එසමයෙහි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කුණ්ඩි නුවර ඇසුරු කොට සානුවාසි පර්වතයෙහි වාසය කළෝ ය. එකල්හි ඒ කෙවට්ට පුත්‍රතෙම ඥාතීන් විසින් පහ කරන ලදුව ඔබි මොබ හැසිරෙමින් ඒ පෙදෙසට පැමිණියේ දන් වලඳන කාලයෙහි තෙරුන් ලහට ගියේ ය. තෙරුන් වහන්සේ ඔහුගෙන් විචාරා ආහාරයෙන් ප්‍රයෝජන ඇති බව දැන ඕහට බත් දී කරනලද බත් කිස ඇති ඔහුගෙන් සියලු එපවත් දැන ධර්මකථාවෙන්ම ඔහු පහන්සිත් ඇත්තේයයි දැන ඇවැත්නි නුඹ පැවිදිවන්නෙහිදැයි ඇසූ සේක. ස්වාමීනි එසේය මම පැවිදිවන්නෙමැයි කීයේය. තෙරණුවෝ ඔහු පැවිදි කරවා ඔහු සමග බුදුන් ලහට වැඩියෝය. එකල්හි ශාස්තෘන් වහන්සේ ''ආනන්දය මේ හෙරණට අනුකම්පා කරව''යි කියා ඒ අනද තෙරුන් වහන්සේට වදළසේක. ඒ සාමණේර තෙමේද පෙර පින් නොකළ බැවින් සිව්පසය පිළිබඳ ස්වල්ප ලාභ ඇත්තේවිය. එවිට බුදුරජාණන් වහන්සේ ඔහුට අනුග්‍රහ කරමින් භික්ෂූන්ගේ පරිභොගය පිණිස පැන්කළ පිරවීමෙහි යෙදෙවි සේක. එය දැක උපාසකවරු ඕහට බොහෝවූ නිති බත් එළවා තැබූහ. ඒ සාමණේරතෙම මෑතකලෙක ලබනලද උපසම්පද ඇතිව අර්හත්ඵලයට පැමිණ ස්ථවිරනමක්වී දෙලෝස් නමක් භික්ෂූන් සමග සානුවාසි පර්වතයෙහි විසීය. උන්වහන්සේගේ පන්සීයක් පමණ නැයෝ වනාහි රැස් නොකළ කුශල ධර්ම ඇතිව රැස්කරගත් මාත්සර්‍යාදි පාපධර්ම ඇතිව කළුරිය

Non-commercial distribution

කොට ප්‍රෙතලොකයෙහි උපන්හ. ඔහුගේ මව්පියෝ වනාහී ''මේ තෙම අප විසින් පෙර ගෙයින් නෙරපන ලද්දේය''යි කියා ලජ්ජාවෙමින් ඔහු වෙත නොඑළඹ ඔහු කෙරෙහි බඩ ස්නෙහ ඇති සහෝදරයා යැව්වාහුය. හෙතෙම තෙරුන් ගමට පිඬුපිණිස වැඩිය කල්හි දකුණු දණමඬල පොළවේ තබා කරන ලද ඇඳිලි ඇතිව තමන් දක්වා ''මාතා පිතා ච වො භන්තෙ'' යනාදි ගාථාවන් කීයේ ය. ''කුණ්ඩිනගරියො ථෙරො'' යනාදි මුලපටන් ගාථා පස ඒ ගාථාවන්ගේ සම්බන්ධය දැක්වීම පිණිස ධර්මසංග්‍රාහකයන් විසින් තබන ලදහ:–

22. කුණ්ඩිනගරියො ථෙරො–සානුවාසි නිවාසිකො,
පොට්ඨපාදෙති නාමෙන–සමණො භාවිතින්ද්‍රියෙ

22. තස්ස මාතා පිතා භාතා–දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන–පෙතලොකං ඉතො ගතා.

24. තෙ දුග්ගතා සූචිකට්ටා–කිලන්තා නග්ගිනො කිසා,
උත්තසන්තා මහාකායා–න දස්සෙන්ති කුරුරිනො.

25. තස්ස භාතා විකරිත්වා–නග්ගො එකපථෙකකො,
චතුකුණ්ඩිකො භවිත්වාන–ථෙරස්ස දස්සයී තුමං.

26. ථෙරො ච මනසිකත්වා–තුණ්හී භූතො අපක්කමී,
සො ච විඤ්ඤාපයී ථෙරං–භාතා පෙතගතො අහං.

27. මාතා පිතා ච තෙ භන්තෙ–දුග්ගතා යමලොකිකා,
පාපකම්මා කරිත්වාන–පෙතලොකං ඉතො ගතා.

28. තෙ දුග්ගතා සූචිකට්ටා–කිලන්තා නග්ගිනො කිසා,
උත්තසන්තා මහාකායා–න දස්සෙන්ති කුරුරිනො.

29. අනුකම්පස්සු කාරුණිකො–දත්වා අන්වාදිසාහි නො,
තව දින්නෙන දානෙන–යාපෙස්සන්ති කුරුරිනො–කිං.

22. කුණ්ඩිනගරියො, කුණ්ඩිනම් නුවර ජාතසම්බන්ධ ඇති; සානුවාසි නිවාසිකො, සානුවාසි පර්වතයෙහි වසන්නාවූ; නාමෙන, නමින්; පොට්ඨපාදෙ ඉති, පොට්ඨපාද නම්වූ; සමණො, සමිතපාපිවූ; භාවින්ද්‍රියො, වඩනාලද ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇති; ථෙරො, ස්ථවිර නමක් විය.

Non-commercial distribution

23. තස්ස, ඒ තෙරුන්ගේ; මාතා, මව්ද; පිතා, පියාද; භාතා, සහොදරයාද; දුග්ගතා, දුගතියට පත්වූ; යමලොකිකා, ප්‍රෙතලොකයෙහි උපන්නාහුය; පාපකම්මං, පව්කම්; කරිත්වාන, කොට; ඉතො, මෙයින්; පෙතලොකං, ප්‍රෙතලොකයට; ගතා, ගියාහුය.

24. දුග්ගතා, දුප්පත්වූ; සූචිකට්ටා, ඉදිකටු (බඳු රුක්ෂ වස්ත්‍රාදි(යෙන් පිඩිතවූ; කිලන්තා, ක්ලාන්තවූ කායචිත්ත ඇති; නග්ගිතො, නග්නවූ; කිසා, කෘශවූ; උත්තසන්තො, බියෙන් තැති ගන්නාවූ; මහාතාසා, හටගත් මහත් බිය ඇති; කුරුරිනො. දරුණු කම් කළාවූ; තෙ, ඒ ප්‍රෙතයෝ; නදස්සෙන්ති, නොදක්වත්.

25. තස්ස, ඒ තෙරුන්ගේ; භාතා, සොහොයුරුතෙම; විතරිත්වා, බියෙන් දුරුව; නග්ගො, නිර්වස්ත්‍රව, එකපථෙ, එක පදික මාර්ගයෙහි; එකකො. හුදකලාව; චතුකුණ්ඩිකො භවිත්වාන, චතුරඩ්ගයෙන් යන්නෙක්ව; ථෙරස්ස, තෙරණුවන්ට; තුමං, තමා; දස්සයි, දැක්වීය.

26. ථෙරොච, සථවිර තෙමේද; අමනසිකත්වා, මෙනෙහි නොකොට; තුණ්හීභූතො, නිශ්ශබ්දවූයේ; අපක්කමි, වැඩියේය; සොච, ඒ ප්‍රෙතතෙමේද; අහං, මම; භාතා, සහෝදරයෙමි; පෙතගතො, ප්‍රෙතාත්මයට පැමිණියෙමියි; ථෙරං, තෙරුන්ට; විඤ්ඤපයි, දන්වීය.

27–28. භන්තෙ, ස්වාමිනි; තෙ, නුඹගේ; මාතා, මව්ද; පිතාච, පියාද; යමලොකිකා, ප්‍රෙත අපායෙහි උපන්නෝ; දුග්ගතා. දුකට පත්වූවෝය; (සෙස්ස යටකියනලදී.)

29. කාරුණිකො, කරුණාවත්වූ (ඔබවහන්සේ); නො, අපට; අනුකම්පස්සු, අනුකම්පා කරනු මැනවි; දත්වා, දන්දී; අන්වාදිසාහි, පින් පමුණුවනු මැනව; තවා, නුඹවහන්සේ විසින්; දින්නෙන, දෙනලද; දනෙන, දනහෙතුවෙන්; කුරුරිනො, ක්‍රෑර කම් ඇත්තෝ; යාපෙස්සන්ති ඉති, යැපෙන්නාහුය.

කුණ්ඩි නුවර උපන්නාවූ ඝාතුවාසි පව්ත වැසි නමින් පොට්ඨපාද නමිවූ සමිත පාපිවූ ආර්‍යාර්‍යාගී භාවනාවෙන් වඩනා ලද ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇති රහත් තෙරනමක් වූයේය. ඒ තෙරණුවන්ගේ මව් හා පියාද සහෝදරයාද පව්කම්කොට මේ මිනිස්

Non-commercial distribution

ලොවින් චුතව ගොස් යමලොක සඞ්ඛ්‍යාත ප්‍රෙතලොක දුකට පත්වූවාහුය. ඔවුහු ප්‍රෙතදුකට පත්ව ඉදිකටුසේ කර්කශ වස්ත්‍රා දියෙන් පීඩිතයහ, (නොහොත්) විඳින අර්ත්ථයෙන් සූචියයි ලද නම් ඇති ක්ෂුත් පිපාසායෙන් මිරිකුණාහුය (නොහොත්) හිදිකටු මල සමාන මුවදෙර ඇත්තාහුය, ක්ලාන්ත කායචිත්ත ඇත්තාහ නග්නයහ ඇට සම් පමණක් බැවින් කෘශ ශරීර ඇත්තාහ දරුණු ක්‍රියා ඇත්තාහ. ''මේ ශ්‍රමණයා අපගේ පුත්‍රය''යි උපන් බියෙන් ත්‍රස්තවූ තමන් විසින් පෙරදී කරනලද කර්මය නිසා උපන් මහත් බිය ඇති ඒ ප්‍රෙතයෝ තමන් නොදක්වත්, තෙරුන් සම්මුඛ වීමට නොයෙත්. ඒ සානුවාසි තෙරණුවන්ගේ සහොදර තෙම බියෙන් දුරුව නොහොත් තුරිත ස්වභාව ඇතිව එකපදික මාර්ගයෙහි එකලාව චතුරඞ්ගයෙන් ආත්මභාවය පවත්වා හෙවත් ඉදිරියේ ලජ්ජා ස්ථානය වැසේයයි සිතා දෙදණින් හා දෙයතින් යමින් සිටියේ තමා තෙරණුවන්ට දැක්වීය. ස්ථවිරයන් වහන්සේ මෙතෙම මෙනම්යයි ඔහු නොසලකා තූෂ්ණීම්භූතව වැඩියාහ, එකල ඒ ප්‍රෙතතෙම මම පෙර අත්බැව්හිදී නුඹගේ සොහොයුරා වීමි මේ කාලයෙහි ප්‍රෙතයෙක්ව මෙහි ආයෙමියි කියා තෙරුන්ට දන්වීය. ස්වාමීනි නුඹවහන්සේගේ මව්ද පියාද පව්කම් කොට මේ මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයට පැමිණ දුක් විඳින්නාහුය. දුකට පත් ඒ ප්‍රෙතයෝ හිදිකටුමල වැනි මුඛවාර ඇතිව ක්ලාන්තවූ කායචිත්තයෙන් යුක්තව නිර්වස්ත්‍රව ඇට සම් පමණින් යුත් හෙයින් කෘශ ශරීර ඇත්තෝ වූහ. මේ ශ්‍රමණ තෙම අපගේ පුත්‍රයායි භයින් ත්‍රස්තවූ තමන් විසින් පෙර කරනලද අකුශල කර්මය නිසා උපන් මහත් බිය ඇති ක්‍රූර කර්මාන්ත ඇති ඒ ප්‍රෙතයෝ ඔබවහන්සේගේ ඉදිරියට නො පැමිණෙති. එහෙයින් කරුණාවත්වූ ඔබවහන්සේ අපට අනු කම්පා කරනු මැනවි, දන්දී අපට දක්ෂිණාව දුනමැනවි, නුඹ වහන්සේ විසින් දෙනලද දානහේතුවෙන් ක්‍රූරකර්ම ඇති ඒ ප්‍රෙතයෝ යැපෙන්නාහුයයි කීයේය. එපවත් අසා තෙරුන් වහන්සේ යමසේ පිළිපැද්දහුද එය දැක්වීම පිණිස:-

30. ථෙරෝ චරිත්වා පිණ්ඩාය-භික්ඛූ අඤ්ඤෙ ච වාදස,
එකජ්ඣං සන්නිපතිංසු-භත්තවිස්සග්ග කාරණා.

31. ථෙරෝ සබ්බෙපි තෙ ආහ-යථාලද්ධං දදථ මෙ,
සඞ්ඝභක්තං කරිස්සාමි-අනුකම්පාය ඤාතිනං.

Non-commercial distribution

32. නීයාතයිංසු ථෙරස්ස-ථෙරෝ සඩ්ඝං නිමන්තයි,
දත්වා අන්වාදිසි ථෙරෝ- මාතු පිතු ව භාතුනෝ.

33. ඉදං මේ ඤාතීනං හොතු-සුඛිතා හොන්තු ඤාතයෝ,
සමනන්තරානුද්දිට්ඨේ-හොජනං උපපජ්ජථ.

34. සුචිං පණීතං සම්පන්නං-අනෙකරසබ්‍යඤ්ජනං,
තතෝ උද්දිසයී භාතා-වණ්ණවා බලවා සුඛී.

30. ථෙරෝ, සථවිර තෙමේද; අඤ්ඤෙව, තවත්; වාදස භික්ඛු, භික්ෂූන් දෙළොස් නමක්ද; පිණ්ඩාය, පිඬුපිණිස; චරිත්වා, හැසිර, භත්තවිස්සග්ගකාරණා, බත් වැළඳීම නිමිත්ත කොට; එකජ්ඣං, එකට; සන්නිපතිංසු, රැස්වූවාහුය.

31. ථෙරෝ, ස්ථවිරතෙම; යථාලඛං, ලද යම් යම් දනය; මෙ, මට; දදථ, දෙව්; ඤතීනං, නැයන්ට; අනුකම්පාය, අනුකම්පා පිණිස; සඩ්ඝභත්තං, සඟබතක්; කරිස්සාමි, කරන්නෙමියි; තෙ සබ්බෙපි, ඒ සියල්ලන්ටම; ආහ, කීයේය.

32–33–34. ථෙරස්ස, තෙරුන්ට; නීයාතයිංසු, බාරකළා හුය; ථෙරෝ, ස්ථවිරතෙම; සඩ්ඝං, සංඝයා, නිමන්තයී, නිමන්ත්‍රණය කළේය; ථෙරෝ, ස්ථවිරතෙම; දත්වා, දන්දී; මාතු, මවටද; පිතුව, පියාටද; භාතුනෝ, සහොදරයාටද; මෙ, මාගේ; ඤතීනං, නැයන්ට; ඉදං හොතු, මේ පිනවේවා; ඤතයෝ, නැයෝ; සුඛිතාහොන්තු, සුවපත් වෙත්වායි; අන්වාදිසි, පින් පැමිණවිය; අනුද්දිට්ඨේ, පින් පැමිණවීමට; සමනන්තරා, අනතුරුව, සුචිං, පවිත්‍රවූ; පණීතං, ප්‍රණීතවූ; සම්පන්නං මිහිරිවූ; අනෙකරස බ්‍යඤ්ජනං, නොයෙක් රසමසවුලෙන් යුක්තවූ; හොජනං, දිවබොජුන්; උපපජ්ජථ, පහළවිය; තතෝ, ඉන්පසු; භාතා, සහොදර (ප්‍රේත) යා; වණ්ණවා, වණීවත්වූයේ; බලවා, ශක්තිමත්වූයේ; සුඛී, සුවපත්වූයේ උද්දිසයි, (තමා) දක්විය.

තෙරුන් වහන්සේද තෙරුන් හා වසන අනික් දෙළොස් නමක් භික්ෂූහුද පිඬුපිණිස හැසිර දන් වැළඳීම නිමිත්තකොට එක තැනකට රැස්වූහ. එකල තෙරණුවෝ යුෂ්මතුන් විසින් ලබන ලද පිණ්ඩපාතය මට දුනමැනව මගේ නැයන්ට අනුකම්පා පිණිස සඟබතක් දෙන්නෙමැයි කියා ඒ සියලුම තෙරුන්ට කීහ. ඒ තෙරුන් වහන්සේලා තමන්ලත් පිණ්ඩපාත දනය තෙරුන්ට බාර කළහ. ස්ථවිරතෙම ඒ දෙළොස් නමක් භික්ෂූන් සඩ්ඝයා

Non-commercial distribution

උදෙසීම් වශයෙන් ඒ බතදීමට ආරාධනා කළේය. එසේකොට දුනයදී මව්ට හා පියාටද සහෝදරයාටද ''ඤාතීන්ව මේ දක්ෂිණාව ලැබේවා, ඒ නැයෝ සුවපත් වෙත්වා''යි කියා දක්ෂිණාව දුන් නේය. දක්ෂිණාව දුන් කෙණෙහිම පවිත්‍රවූ ප්‍රණීතවූ මිහිරිවූ නොයෙක් රසවත් ව්‍යඤ්ජන සහිතවූ දිව්‍යභොජන පහළවිය. ඒ දිව්‍යභොජන ලැබීමෙන් පසු සහොදරවූ ප්‍රෙතතෙම රූපසම්පන්නව ශක්ති සම්පන්නව සුවපත්ව තමන් තෙරුන්ට දක්වා සිටියේය.

35. **පහූතං භොජනං භන්තෙ-පස්ස නග්ගාමිහසෙ මයං-**
තථා භන්තෙ පරක්කම-යථා වත්ථං ලභාමසෙ.

36. **ථෙරෝ සඩ්ඛාර කූටම්හා-උච්චිණිත්වාන නන්තකෙ,**
පිලොතිකං පටං කත්වා-සඩ්සෙ චාතුද්දිසෙ අද.

37. **දත්වා අන්වාදිසි ථෙරෝ-මාතු පිතූ ච භාතූනෝ**
ඉදම්මෙ ඤාතීනං හොතු-සුඛිතා හොන්තූ ඤාතයෝ.

38. **සමනන්තරානුදිට්ඨෙ-වත්ථානි උපපජ්ජිසුං,**
තතෝ සුවත්ථවසනෝ-ථෙරස්ස දස්සයී තුමං.

39. ***යාවතා නන්දරාජස්ස-විජිතස්මිං පටිච්ඡද,**
තතෝ බහූතරා භන්තෙ-වත්ථානච්ඡාදනානි නෝ.

40. ***කොසෙය්‍යකම්බලියානි-ඛොමකප්පාසිකානි ච,**
විපුලා ච මහග්ඝා ච-තෙපාකාසෙව ලම්බරෙ.

41. ***තෙ මයං පරිදහාම-යංයඤ්හි මනසෝ පියං.**
තථා භන්තෙ පරක්කම-යථා ගෙහං ලභාමසෙ.

35. භන්තෙ, ස්වාමීන්; පස්ස, බලනු මැනව; පහූතං, බොහෝවූ; භොජනං, දිව්‍යභොජන (ලබනලදී); මයං, අපි; නග්ගා අම්හසෙ, නග්නයෝ වෙමු; භන්තෙ, ස්වාමීනි; යථා, යම්සේ; වත්ථං, වස්ත්‍ර; ලභාමසෙ, ලබමුද; තථා, එසේ; පරක්කම, වැයම්කරනු මැනව,

36. ථෙරෝ, ස්ථවිරතෙම; නන්තකෙ, දමනලද; රෙදි කැබලි; සඩ්කාර කූටම්හා, කසලගොඩින්; උච්චිණිත්වා, අහුලා

Non-commercial distribution

ගෙන; පිලෙනිකං, රෙදිකැබලි; පටංකත්වා, (චීවර) වස්ත්‍රයක් කොට; වාතුද්දිසෙ, සිව්දිගින් වැඩි; සඞ්ඝෙ, සඞ්ඝයාහට, අද, දුනි.

37–38. තතො, ඉන්පසු; සුවත්ථවසනො, යහපත් වස්ත්‍ර හැන්දේ (සෙස්ස යටකියනලද පරිදියි).

ස්වාමීනි නුඹවහන්සේගේ දානානුභාවයෙන් බොහෝ දිව බොජුන් අප විසින් ලබනලදී. බලනු මැනවී, අප නග්නව සිටිමු, ස්වාමීනි යම්සේ අපි වස්ත්‍ර ලබමෝද එබඳු උත්සාහයක් කරනු මැනවයි කීය. තෙරුන් වහන්සේ ඉරි දමනලද රෙදි කැබලි කසල ගොඩවලින් අහුලාගන සිවුරක්කොට සිව් දිගින් වැඩිය සඞ්ඝයාහට දුන්හ. එසේදී තෙරුන් වහන්සේ මවුට හා පියාට හා සහොදරයාටද ''මගේ නෑයන්ට මේ වස්ත්‍රදානය ලැබෙවා, නෑයෝ සුවපත් වෙත්වා''යි කියා පින්දුන්හ, වස්ත්‍ර දක්ෂිණාව දීමට අනතුරුවම දිව්‍යවස්ත්‍ර පහළවූහ. ඉන්පසු දිව්‍ය වස්ත්‍ර හැඳ පොරවාගන තෙරුන් වහන්සේට තමන් දක්වා සිටියේය. ස්වාමීනි නන්දරජහුගේ නුවර යම් පමණ වස්ත්‍රයෝ වෙද්ද ඊටත් වඩා අපට හඳනා පොරොනා වස්ත්‍ර ඉතා බොහෝ වෙත්. දිගින් හා පලලින් මහත්වූද අනගිවූද කොසෙය්‍ය වස්ත්‍ර හා කම්බිලිද කොමුපිළි හා කපුපිළිද පහළවූහ. ඒ වස්ත්‍රයෝද අවකාශයෙහි එල්බෙමින් තිබෙත්, ඒ වස්ත්‍රයන් අතුරෙන් යම් යම් වස්ත්‍රයක් අපේ හිතට ප්‍රියවේනම් ඒ ඒ වස්ත්‍රයන් ගෙන හැඳ පොරවා ගනිමු. ස්වාමීනි අපට යම් අඳුමකින් ගෙයක් ලැබේ නම් එලෙස උත්සාහ කරනු මැනවැයි කීය.

42. ථෙරො පණ්ණකුටිං කත්වා–සඞ්ඝෙ වාතුද්දිසෙ අද,
දත්වා අන්වාදිසි ථෙරො–මාතු පිතු ච භාතුනො.

43. ඉදම්මෙ ඤාතීනං හොතු-සුඛිතා හොන්තු ඤාතයො,
සමනන්තරානුද්දිටයෙ-සරානි උපපජ්ජිසු.

44. කූටාගාර නිවෙසනා–වීහත්තා භාගසො මිතා,
න මනුස්සෙසු ඊදිසා-යාදිසා නො සරා ඉධ.

45. අපි දිබ්බෙසු යාදිසා-තාදිසා නො සරා ඉධ,
දද්දල්ලමානා ආහෙන්ති–සමන්තා චතුරො දිසා.

42–43–44. පණ්ණකුටිං කත්වා, කොළගෙයක් කොට; (සෙස්ස කීයේය) විහත්තා, බෙදන ලද්දවූ; භාගසො, කොටස්

Non-commercial distribution

වශයෙන්; මිතා, පිරිසිඳින ලද්දවූ; කූටාගාරනිවෙසනා, කුළු ගෙවල් හා නිවෙස්වූ ඝරානි, ගෘහයෝ; උපපජ්ජිසුං, පහළවූහ; ඉධ, මේ ප්‍රෙතලොකයෙහි; නො, අපගේ; ඝරා, ගෘහයෝ; යාදිසා, යම්බඳුවෙත්ද; තාදිසා, ඒබඳු ගෘහයෝ; මනුස්සෙසු, මිනිසුන් අතර; න, නොවෙත්.

45. අපි දිබ්බෙසු, දෙව්ලොව; සදිසා, යම්බඳු (පහයෝ වෙත්ද); ඉධ, මෙහි; තාදිසා එබඳුවූ; නො, අපගේ; ඝරා, ගෘහයෝ; දද්දල්ලමානා, ඉතාමත් දිලිසෙමින්; සමන්තා, හාත් පස; චතුරො දිසා, සිව්දිගුන්; ආභෙන්ති, බබුලුවත්.

තෙරණුවෝ කොළඟෙයක් කොට සතර දිගින් වඩින සඬ්ඝයාටදී මව්පියන්ට හා සහොදරයාටද ''මාගේ නෑයන් හට මේ දක්ෂිණාව ලැබෙවා ඥති ප්‍රෙතයෝ සුවපත් වෙත්වා''යි කියා පින් පැමිණුවූහ. එකණෙහිම සමසිව්රැස්දිගවට සටහන් ආදි වශයෙන් බෙදන ලද්දවූ කොටස් වශයෙන් පිරිසිඳින ලද්දවූ කුළුගෙවල් හා එයින් අන්‍යවූ නිවෙසන සඬ්ඛ්‍යාත ගෘහයෝද ඔවුන්ට පහළවූහ. මේ ප්‍රෙතලොකයෙහි අපගේ ගෘහයෝ යම් බඳු වෙත්ද එබඳු ගෘහයෝ මිනිස්ලොව නැත්තාහුය. දෙව්ලොව යම්බඳු ප්‍රාසාදයෝවෙත්ද එබඳුවූ අපගේ මෙහි ගෘහයෝ හාත් පසින් සිව්දිසාවන් ඉතාමත් බබුලුවමින් දිලිසෙත්යයි කීහ.

46. තථා හන්තෙ පරක්කම-යථා පා නං ලභාමසෙ,
ථෙරො කරකං පූරෙත්වා-සඬ්ඝෙ චාතුද්දිසෙ අද.

47. දත්වා අන්වාදිසි ථෙරො-මාතු පිතු ච භාතුනො,
ඉදම්මෙ ඤාතීනං හොතු-සුඛිතා හොන්තු ඤාතයො.

48. සමනන්තරානුද්දිට්ඨෙ-පානීයං උපපජ්ජථ,
ගම්භීරා චතුරස්සා ච-පොක්ඛරඤ්ඤො සුනිම්මිතා.

49. *සෙතොදකා සුපතිත්ථා-සීතා අප්පටිගන්ධියා,
පදුමුප්පලසංඡන්නා-වාරිකිඤ්ජක්ඛපූරිතා.

46-47-48. පානං, පැන්; ලභාමසෙ, ලබමුද; ථෙරො, ස්ථවිරතෙම; කාරකං, ඩබරාව; පූරෙත්වා, පුරවා; (සෙස්ස යටකී පරිදියි.)

ස්වාමීනි දැන් අපට පැන් ලැබෙන පරිද්දෙන් වෑයම් කරනු මැනවියි කීය. එවිට ස්ථවිරතෙම පැන්පුරවාපු ඩබරාව වාතුද්

Non-commercial distribution

දිසික සඩ්ඝයා වහන්සේට දුන්නේය. එසේදී තෙරුන් වහන්සේ මව් පියන්ට හා සහෝදරයාටද ''මාගේ නෑයන්ට මේ පින වේවා නෑයෝ සුවපත් වෙත්වා''යි කියා පින් දුන්නේය. එකණෙහිම දිවපැන් පහළ විය. ගැඹුරුවූ සතරැස් පොකුණු මැවිණහුය. ඒ පොකුණු සුදුවැලි තලායෙන් හා ජලයෙන් යුක්තවූහ. යහපත් තොටුපල් ඇත්තාහ. සිහිල්ජලය ඇත්තාහ, මනා සුවඳින් යුක්තවූහ, ඒ ඒ තැන ජලමත්තෙහි පියුම් හෙළ පියුම් ආදී මල් රේණු බරින් වැසුම් වශයෙන් පිරුණහුය.

50. තත්ථ නහාත්වා පිවිත්වා ච-ථෙරස්ස පටිදස්සයුං,
පහූතං පානීයම්හන්තෙ-පාද දුක්ඛා ඵලන්ති නො.

51. ආහිණ්ඩමානා බඤ්ජාම-සක්ඛරෙ කුසකණ්ටකෙ,
තථා හන්තෙ පරක්කම-යථා යානං ලහාමසෙ.

52. ථෙරෝ සිපාටිකං ලද්ධා-සඩ්ඝෙ චාතුද්දිසෙ අද,
දත්වා අන්වාදිසි ථෙරෝ-මාතු පිතු ච ඤාතූනං.

53. ඉදම්මෙ ඤාතීනං හොතු-සුඛිතා හොන්තු ඤාතයෝ,
සමනන්තරානුද්දිට්ඨෙ-පෙතා රථෙනමාගමුං.

54. අනුකම්පිතම්හ භද්දන්තෙ-හන්තෙනව්හාදනෙන ච,
සරෙන පානදනෙන-යානදනෙන චූභයං
මුනිං කාරුණිකං ලොකෙ-හන්තෙ වන්දිතුමාගතා-නි.

50. තත්ථ, එහි; නහාත්වා, නා; පිවිත්වාව, පැන්බී; ථෙරස්ස, තෙරුන්ට; පටිදස්සයුං, දැක්වූහ; හන්තෙ, ස්වාමීනි; පහූතං, බොහෝවූ; පානීයං, දිවපැන් (පහළවිය); නො, අපගේ; පාද, පාදයෝ; දුක්ඛා, දුකින්; ඵලන්ති, පැළෙත්.

51. සක්ඛරෙ, කැටගල් ඇත්තාවූද; කුසකණ්ටකෙ, කුසකටු ඇති භූමිප්‍රදෙශයෙහි; ආහිණ්ඩමානා, ඇවිදින්නාහු; බඤ්ජාම, කොර අණිමින් යමිහ; හන්තෙ, ස්වාමීනි; යථා, යම්සේ; යානං, යානාවක්; ලහාමසෙ, ලබමුද; තථාපරක්කම, එසේ උත්සාහ කරනු මැනවි.

52–53. ථෙරෝ, ස්ථවිරතෙම; සිපාටිකං, (එකපට ඇති) වහන් සඟලක්; ලද්ධා, ලැබ; (සෙස්ස කීසේයි.)

54. හන්තෙ, ස්වාමීනි; තෙ, නුඹවහන්සේට; භද්දං, යහපතක්වේවා; අව්හාදනෙන ච, ආහාර දනයෙන්ද; සරෙන,

Non-commercial distribution

ගෘහදානයෙන්ද; පානදානෙන, පැන්දීමෙන්ද; යානදානෙනව, යාන දානයෙන්ද; උභයං, උභයදානයෙන්; අනුකම්පිතා අම්හ, අනුකම්පාකරන ලද්දේ වම්හ; භන්තෙ, ස්වාමීනි; ලොකෙ, ලොකයෙහි; කාරුණිකං, කරුණාසම්පන්නවූ; මුනිං, භික්ෂූවූ (ඔබවහන්සේ) වන්දිතුං, වැඳීමට, ආගතා ඉති, පැමිණියෝවෙමු.

ඒ පොකුණුවල බැස නා පැන්බී තෙරුන්ට පෙනීසිට ස්වාමීනි අපට බොහෝවූ දිව පැන් පහළවීයයි කීය, දැන් අපගේ පාදයෝ විළුම් කෙළවර ආදි තැන් දුකින් පැළීයත්. කැටගල් හා කුසකටු ඇති භූමි ප්‍රදෙශයෙහි ඇවිදින්නාවූ අපි කොරඇණිම් වශයෙන් යමු, එහෙයින් ස්වාමීනි අපට රථවාහනාදී යම්කිසි යානාවක් ලැබෙනසේ උත්සාහ කරනු මැනවයි කීහ. තෙරුන් වහන්සේ එක්පටක් ඇති වහනක් ලැබ සඬ්ඝයාට දී මව්පියාදීන්ට පින් දුන්නෝය. එකෙණෙහිම දිව්‍යරථ පහළවී ප්‍රෙතයෝ දිව්‍ය රථයෙන් පැමිණ ස්වාමීන් වහන්ස ඔබ වහන්සේට වැඩක්ම වේවා. ඔබවහන්සේ විසින් ආහාර හා වස්ත්‍ර දානයෙන්ද ගෘහ හා පැන් දීමෙන්ද වාහන දීමෙන් හා මුලකී පිණ්ඩපාතාදි සිව්පස දානයෙනුත් අපට අනුකම්පා කරන ලදී. ස්වාමීනි ලොකයෙහි කරුණා සම්පන්නවූ අත්වැඩ පර වැඩ දන්නාවූ නුඹ වහන්සේ වැඳීම පිණිස අපි මෙහි පැමිණියෙමුයි කීහු.

තෙරුන් වහන්සේ එපවත් බුදුන්ට සැලකළෝය, භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට ගෙන මේ ප්‍රෙතයෝ මේ කාලයෙහි යම්සේ දුක් විඳිත්ද තෝත් එසේම මීට අනතුරු ඉකුත් අත්බැවිහි ප්‍රෙතව ඉපිද මහත් දුක් අනුභව කළෙහියයි වදාරා තෙරුන් වහන්සේ විසින් ආරාධිතවැ සුත්ත ප්‍රෙතවස්තුව වදාරා සම්ප්‍රාප්ත පිරිසට ධර්මදෙශනා කළසේක. එය අසා මහජනතෙමේ උපන් සංවෙග ඇතිව දානශීලාදී පුණ්‍ය කර්මයන්හි ඇලුණේවිය.

(ඓශ්වර්‍ය මානාභඩ්කාරයෙන් මත්වී මහොත්තමයන්ට කරනලද අපරාධ විපාක ඉතා දරුණු බවත් ප්‍රෙතයන් සඳහා දෙනලද දානය සියලුදෙයින් සම්පූර්ණ වියයුතු බවත් මේ ධර්ම කථාවෙන් අවබොධ කරගතයුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයට ඇතුළත් දෙවෙනි සානුවාසී ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

Non-commercial distribution

3. 3 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවග්ගාන්තගීත තෙවෙනි **රථකාර ප්‍රෙතවස්තුව** කවරහයත්:-

විනයජන නලින දිනකරායමාණ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවාසය කර වදරන කල්හි එක්තරා ප්‍රෙතියෙකු අරභයා මේ ප්‍රෙතවස්තුව දෙශනා කලසේක. යටගිය දවස කසුප් බුදුන් කල්හි ශීලාචාර සම්පන්නවූ එක්තරා ස්ත්‍රියක් තොමෝ කල්‍යාණ මිත්‍රයෙකුගේ ආශ්‍රයෙන් බුදුසස්නෙහි විශෙෂයෙන් ප්‍රසන්නව මොනවට බෙදනලද විසිතුරු කළ ටැම් හා භිනිපෙතිවලින් යුත් භූමිතල ඇති ඉතා දැකුම් කටයුතු එක් ආවාසයක් කොට එහි භික්ෂූන් වඩා හිඳුවා ප්‍රණිතාහාරයෙන් වළඳවා භික්ෂුසඞ්ඝයාහට පූජාකළේය. ඒ උපාසිකා තොමෝ මෑතකලෙක කළුරිය කොට වෙන අකුශලකර්මයක්හුගේ විපාක වශයෙන් හිමාලය පර්වත රාජයා සමීපයෙහි රථකාර විල ඇසුරු කොට විමාන ප්‍රෙතියක්ව උපන්නේය. සඞ්ඝයාහට ආවාසය පූජාකළ කුශලයාගේ ආනුභාවයෙන් සියල්ල රුවන් මුවාවූ උදරවූ හාත්පසින් ප්‍රසන්නභාවය එළවන්නා වූ මනොහරවූ සිත් කලුවූ පොකුණු සමීපයෙහි නන්දනොද්‍යානය සදෘශව බබලන්නාවූ විමානයක් ඇට පහළවිය. තොමෝත් රන්වන් පැහැ ඇති මනා රූ ඇති දැකුම්කලුවූ දුටුවන් පහදවන්නියක් විය, ඕතොමෝ ඒ විමනෙහි පුරුෂයන්ගෙන් තොරව දිව්‍යසම්පත් විඳිමින් වසයි. බොහෝ කල් මුළුල්ලෙහි පුරුෂයන්ගෙන් තොරව වසන්නාවූ ඇට කල කිරීමක් ඇතිවිය, ඕතොමෝ කළකිරුණු සිත් ඇතිව මේ උපායෙක් ඇතැයි සිතා දිව්‍යමය අඹගෙඩිගෙන ගහට දමයි, සියල්ල කණ්මුණ්ඩ ප්‍රෙතවස්තුවෙහි ආ නයින්ම දතයුතුයි. මෙහි වනාහි බරණැස් නුවරවැසි එක් මාණවකයෙක් තෙම ගඟේ හෙලූ ඒ අඹ අතුරෙන් එක් අඹගෙඩියක් දැක ඒ අඹ හට ගැන්ම සොයා පිළිවෙළින් ගොස් ඒ ගඟ දැක ඒ අනුසාරයෙන් ඈ වසනතැනට ගියේය. ඈ ඔහු දැක තමා වසන තැනට කැඳවාගන ගොස් පිළිසඳර කථාකරමින් හුන්නේය, ඒ පුරුෂ තෙම ඈ වසන තැන සම්පත් දැක විචාරමින් මේ ගාථාවන් කීයේය;-

Non-commercial distribution

55. වෙළුරියථම්භං රුචිරං පභස්සරං
විමානමාරුය්හ අනෙක චිත්තං,
තත්ථච්ඡසි දෙවි මහානුභාවෙ
පථඩනී පණ්ණරසෙව චන්දිමා.

56. වණ්ණො ච තෙ කනකස්ස සන්නිභො
උත්තත්තරූපො භුසදස්සනීයො,
පල්ලඩකසෙට්ඨයෙ අතුලෙ නිසින්නා
එකා තුවං නත්ථි ච තුය්හ සාමිකො.

57. ඉමා ච තෙ පොක්ඛරඤ්ඤො සමන්තා
පභූතමාලා බහුපුණ්ඩරීකං,
සුවණ්ණවුණ්ණෙහි සමන්තමොතතා
න තත්ථ පඩිකො පණකො ච විජ්ජති.

58. හංසාපිමෙ දස්සනීයා මනොරමා
උදකස්මිං අනුපරියන්තිසබ්බද,
සමය්‍ය වග්ගුපනදන්ති සබ්බෙ
බින්දුස්සරා දුන්දුභීනංව සොසො.

59. දද්දල්ලමානා යසසා යසස්සිනී
නාවායවත්වං අවලම්භ තිට්ඨසි,
ආළාරපම්හෙ හසිතෙ පියං වදෙ
සබ්බඩ්ගකල්‍යාණි භුසං විරොචසි.

60. ඉදං විමානං විරජං සමෙ යීතං
උය්‍යාන වනතං රතිනන්දිවඩ්ඨනං,
ඉච්ඡාමහං නාරි අනොමදස්සනෙ
තයා සහ නන්දනෙ ඉධ මොදිතු-න්ති.

55. මහානුභාවෙ, මහත් දිව්‍යානුභාව ඇති; දෙවි, දෙව හන; වෙළුරියථම්භං, වෛඩූර්‍යමය ස්තම්භ ඇති; රුචිරං, මනොඥවූ; පභස්සරං, ප්‍රභාශ්වරවූ; අනෙකචිත්තං, නොයෙක් සිතියම් ඇති; විමානං විමනට ආරුය්හ, නැඟී; පථඩනී, තම ගමන්මාර්ගයහි; (හෙවත්) අහස්තලයෙහි; පණ්ණරසි, පෞණ්මී දින, චන්දිමා ඉව, චන්ද්‍රයාමෙන්, තත්ථ, ඒ විමනෙහි; අච්ඡසි, හිඳිනෙහිය.

56. තෙ, තිගේ; වණ්ණොව, ශරීරවර්ණයද; උත්තත්ත රූපො, ඔප්නැගූ ස්වභාව ඇත්තේ; කනකස්සසන්නිභො,

Non-commercial distribution

ශෘඩ්ගිස්වණ්‍ණ හා සමානවූයේ; භුසදස්සනීයො, අතිශයින් දර්‍ශනීය වෙයි; අතුලෙ, අසදෘශ රූපවත් දෙවිය (නොහොත්) මහාර්හවූ; පල්ලඞ්කයෙහි; තුවං, ති; එකා, හුදකලාව; නිසින්නා, හිඳින්නී වෙහි; තුය්හං, තිට; සාමිකොව, හිමියෙක්ද; නත්ථි, නැත්තේය.

57. තෙ, තිගේ ඉමාපොක්ඛරඤ්ඤෙ, මේ පොකුණු; සමන්තා, හාත්පස; පහූතමාලා, බොහෝ මල් ඇත්තාහ; බහු පුණ්ඩරිකා, බොහෝ හෙළපියුම් ඇත්තාහ; සුවණ්ණවුණ්ණෙහි, රුවන්වැල්ලෙන්; සමන්තං, හාත්පස; ඔතතා, ගැවසීගත්තාහ; තත්ථ, එහි පඬිකො, මඩද; පණකොව, දියසෙවෙල්ද; නවිජ්ජති, නැත්තේය.

58. දස්සනීයා, දර්‍ශනීයවූ; මනොරමා, මනොරම්වූ; ඉමෙ හංසාපි, මේ හංසයෝද; උදකස්මිං, ජලයෙහි; සඛඛද, සෑම කල්හි; අනුපරියන්ති, ඔබ්මොබ හැසිරෙත්; සඛඛෙ, සියල්-ලොම; සමය්‍ය, එක්ව; බින්දුසාරා, පිඬුකළ නාදඇතිව; දුන්දු භිනං, හෙරින්ගේ; සොසො ඉව, සොඝණයමෙන්; වග්ගු, මිහිරි කොට; උපනදන්ති, නාදකරත්.

59. යසස්සිනී, එම්බා ඉසුරුමතිය; ත්වං, ති; යසසා, දිව්‍යමය සෘද්ධියෙන්; දද්දල්ලමානා, ඉතාමත් දිලිසෙමින්; නාවා යව, රුවන්නැවෙහි; අවලම්භ, එල්බ; තිට්ඨසි, හිඳිනෙහි; ආළාරපමේහ, වෙලුණ නිල් දික් ඇස් ලොම් ඇති; හසිතෙ, සිනහවන්වූ (නොහොත්) සිනහ මුව ඇති; ප්‍රියවචන කියන්නාවූ සබ්බඞ්ග කල්‍යාණි, සොභන අඞ්ගප්‍රත්‍යඞ්ග ඇත්තිය; භුසං, අතිශයින්; විරොචසි, බැබලෙහි.

60. ඉදං විමානං, මේ විමන, විරජං, රජස් රහිතවූ; සමෙ, සමභූමියෙහි; ඨිතං, පිහිටියාවූ; උය්‍යානවන්තං, නන්දනවන යෙන් යුක්තවූ; රතිනන්දිවඩ්ඪනං, සැපප්‍රීති වර්ධනය කරන්නේ කරන්නේය: අනොම දස්සනෙ, අලාමක දැකුම් ඇති; නාරී, ස්ත්‍රිය; අහං. මම, තයාසහ, තී හා සමග; නන්දනෙ, නන්දන කරවූ; ඉධ, මේ නන්දන වනයෙහි හෝ විමනෙහි; මොදිතුං, ඇලෙන්ට; ඉච්ඡාමි ඉති, කැමැත්තෙමි.

මහත් දිව්‍යානුභාව සම්පන්නවූ දෙවිය තී වෛඩූර්‍යමය ස්තම්භ ඇති මනොඥ ප්‍රභාශ්වරවූ නොයෙක් සිතියම්කළ විමනට නැඟි තම ගමන්මාර්ගයවූ අහස්තලයෙහි පෞර්ණමීදින

Non-commercial distribution

පරිපූර්ණ චන්ද්‍රයාසේ බබලමින් ඒ විමානයෙහි කැමති කැමති කල්හි වෙසෙයි. තිගේ ශරීරවර්ණයද තවනලද සිඳිගිස්වර්ණය හා සමානව අතිශයින් දර්ශනීයවෙයි, අසදෘශ රූපවත් තැනැත්තිය ති මහාර්හවූ උතුම් පර්‍යඞ්කයෙහි හුදකලාව හිඳින්නීය. නිට ස්වාමිපුරුෂයෙක්ද නැත්තේය, තිගේ මේ පොකුණු භාත්පස කමලකුවලයාදි බෙහෝ මල් හා හෙළපියුමෙන්ද යුක්තයහ, රුවන්වැල්ලෙන්ද භාත්පස ගැවසී ගත්තාහ, ඒ පොකුණු වල මඩ හෝ දියසෙවෙල් හෝ නැත්තේය, මේ පොකුණු ජල යෙහි හැමකල්හි දර්ශනීයවූ මනොහරවූ මේ හංසයෝද ඔබිමොබ හැසිරෙත්, සියලුම හංසයෝ එක්රැස්ව නොවිසුරුණු හඬ ඇතිව හෙවත් පිඬුකළ නාද ඇතිව හෙරි සොෂණයසේ මිහිරිකොට නාද පවත්වත්,, හෙවත්තිගේ පොකුණේ හැසිරෙන හංසයන්ගේ නාදය මනාව පිඬුකළ හඬ ඇති බැවින් බෙර ශබ්දයමෙනි. ඉසුරුමත් පින්වතිය ති දිව්‍යමය සෘඩියෙන් ඉතාමත් දිලිසෙමින් පියුම් පොකුණෙහි ස්වර්ණමය නෞකාවෙහිවූ මහත් වටිනා පළඟක එල්බගෙන ජලක්‍රීඩා කරමින් හිඳිනෙහිය, වෙලුණු නිල් දික් ඇස් ලොම් ඇති සිනාමුහුණු ඇති ප්‍රියවචන කියන්නාවූ සොභන අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති තැනැත්තිය ති අතිශයින් බැබළෙහිය. අලාමක දර්‍ශනඇති පින්වත් ස්ත්‍රිය තිගේ මේ විමන නිර්දෝෂවූ සමභූමි ප්‍රදෙශයෙහි පිහිටියේය. භාත්පසින් යහපත්වූ නන්දන වනයෙන් යුක්තය. සැප හා ප්‍රීතිය වඩන්නේය, ති හා සමග නන්දනකරවූ මේ නන්දන වනයෙහි හෝ විමනෙහි අභිරමණයකොට විසීමට මම කැමතිවෙමියි කීයේය. මෙසේ ඒ මානවකයා විසින් කී කල්හි වනාහි විමාන දෙවතාතොමෝ ඒ මාණවකයාහට පිළිවදන් දෙමින් මේ ගාථාව කීයේය:-

61. කරොහ කම්මං ඉධ වෙදනීයං
චිත්තඤ්ච තෙ ඉධ නිහිතං භවතු
කත්ථාන කම්මං ඉධ වෙදනීයං
එවං මමං ලච්ඡසි කාමකාමිනි-න්ති.

61. ඉධ, මෙ (දිව්‍යස්ථානයෙ)හි; වෙදනීයං, විපාකවින්ද යුතුවූ; කම්මං, කුසලකර්මයක්; කරොහි, කරව; තෙ, තුඹගේ චිත්තංච, සිතද; ඉධ, මෙහි; නිහිතං භවතු, පිහිටුවාවා, එවං, මෙසේ; ඉධ, මෙතන; වෙදනීයං, විපාක වින්දයුතුවූ; කම්මං, කුසලකර්මය; කත්ථාන, කොට; කාම කාමිනිං, කැමැතිවියයුතු කාමයෙන් යුක්තවූ; මමං, මා; ලච්ඡසි ඉති ලබන්නෙහිය.

Non-commercial distribution

පින්වත් මානවකය, මේ දිව්‍යස්ථානයෙහි සැප විපාක විඳීමට සුදුසුවූ කුශලකර්මයක් කරව, නුඹගේ සිතද මෙතැන ඉපදීමට යොමුවේවා, මෙසේ මෙතැන විපාක විඳීමට සුදුසු කුශල කර්මයක් කිරීමෙන් කැමති වියයුතු කාමයෙන් යුත් මා ලබන්නෙහියයි කීයේය. ඒ මාණවකතෙම ඒ විමාන ප්‍රෙතිය ගේ කීම අසා එතනින් මනුෂ්‍ය පථයට ගියේ එහි ඉපදීමට සිත තබාගන ඊට සුදුසු පින්කම් කොට නොබෝ කලකින් කළුරිය කොට ඒ විමනෙහි ඒ ප්‍රෙතිය හා එක්ව උපනි, ඒ කාරණය ප්‍රකාශකරන්නාවූ සංගීතිකාරයෝ:–

62. සාධූති සෝ තස්සා පටිස්සුණිත්වා
අකාසි කම්මං තහිං වෙදනීයං,
කත්වාන කම්මං තහිං වෙදනීයං
උපපජ්ජි මානවෝ තස්සා සහබ්‍යතං-න්ති.

62. සෝ, හෙතෙම, සාධු ඉති, මැනවයි තස්සා, ඇගේ; පටිස්සුණිත්වා, (වචනය) පිළිගෙන; තහිං, එහි; වෙදනීයං, විපාක විඳීමට සුදුසුවූ; කම්මං, කුශලකර්මය; අකාසි, කෙළේය මාණවෝ, මානවකතෙම; තහිං, එතන්හි; වෙදනීයං, විඳිය යුතුවූ; කම්මං, කුශලකර්මය; කත්වාන, කොට; තස්සා, ඇගේ; සහබ්‍යතං, සහභාවයට; උපපජ්ජී ඉති, පැමිණියේය.

ඒ මාණවකතෙම ඒ විමානප්‍රෙතියගේ වචනය මැනවයි පිළිගෙන එහි සැප විපාක විඳීමට සුදුසු කුශලකර්මය කළේය. මාණවකතෙම එහි සැපවිපාක විඳීමට සැහෙන පින්කම් කොට ඇගේ සහභාවයට පැමිණියේයයි කිහු.

මෙසේ ඔවුන් දෙදෙනා විමානයෙහි බොහෝකල් මුළුල් ලෙහි දිවසැප විඳින කල්හි පුරුෂතෙම කුශල කර්ම ක්ෂය වීමෙන් කළුරිය කළේය. ස්ත්‍රීතොමෝ වනාහි තමාගේ කුශලකර්ම ක්ෂේත්‍රගත බැවින් එක් බුඩාන්තරයක් පරිපූර්ණකොට එහි වීසුවේය. එකල්හි අප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවී පවත්වනලද උතුම් දම්සක් ඇතිව අනුක්‍රමයෙන් වැඩමවා දෙවු රම් වෙහෙර වැඩ වාසය කර වදරන කල්හි ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ එක්දවසක් පර්වතචාරිකා වෙහි හැසිරෙමින් ඒ විමන හා විමන් ප්‍රෙතියත් දැක ''වෙළුරිය ථම්භං රුචිරං පභස්සරං'' යනාදී ගාථාවලින් විවාළසේක, ඕ

Non-commercial distribution

කොමෝ උන්වහන්සේට මුලපටන් තමන්ගේ සියලු පුවත සැලකළේය. ඒ පුවත අසා තෙරුන් වහන්සේ සැවැත් නුවරට වැඩමවා භාග්‍යවතුන්වහන්සේට සැලකළෝය. බුදුරජාණන් වහන්සේ ඒ කරුණ අර්ත්ථොත්පත්ති කොට ගෙන පැමිණි පිරිසට දහම් දෙසූසේක. ඒ ධර්මය අසා මහජනයා දනාදී පින් කම්කොට ධම්යෙහි නිරත විය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනාවෙහි චූලවර්ගයට ඇතුළත් තුන්වෙනි රථකාර ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවන ලදි.

---

3. 4 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවග්ගාන්තගත සතර වෙනි භූත ප්‍රෙතවස්තුව කෙසේදයත්:-

අසරණ සරණ කරුණානිධානවූ බුදුරජානන් වහන්සේ සැවැත්නුවර වැඩවදරන කල්හි ප්‍රෙතයන් සිව්දෙනෙකු අරබයා මේ වස්තුව දෙශනා කළසේක. සැවැත්නුවරට නුදුරුවූ එක්තරා ගමෙක එක් කුළුවෙළදෙක් කූටමානාදියෙන් ජීවිකාව කෙළේය. ඒ කූටවාණිජතෙම හැල්වීවල බොල් රැගෙන තඹවන් මැටි තවරා ඉතා බරකොට රත්හැල් සමග කවලම්කොට වික්කේය. ඔහුගේ පුත්‍රතෙම ''ගෙට පැමිණි මාගේ මිත්‍ර සුහෘද්ජනයාට ගරු නොකරේය''යි කියා කොපව වියරුහන හැරගෙන මව්හිසට පහරක් ගැසීය. ඒ කපටි වෙළඳුගේ යෙහෙළියෙනී තොම සියලු දනොගේම ප්‍රයෝජනය පිණිස තඹනලද මස් සොරකම් කොට කා නැවත ඔවුන් විසින් විචාරණ ලදුව ''ඉදින් මා විසින් ඒ මස් කනලද්දේවීනම් භවයක් භවයක් පාසා තමන්ගේ පිටමස් කඩා ගන කන්නියක් වෙම්වා''යි දිවුරුවේය. ඒ වෙළඳුහේ භාය්‍යා තොම වනාහි යම්කිසි උපකරණයක් ඉල්වන අයට නැතැයි කියා ඔවුන් විසින් නැවතත් ඉල්වමින් පීඩාකරන ලදුව ''ඉදින් තිබෙන දේ නැතැයි කියා මම කියන්නෙම් නම් උප උපන් තන්හි අඟුවි කන්නියක් වෙම්වැ''යි බොරුකීමෙන් දිවුරුවේය. ඒ සිව්දෙනම මෑතකලෙක මැරීගොස් චින්ධ්‍යාවනයෙහි ප්‍රෙතයෝව උපන්නාහු ය. ඔවුනතුරෙන් සොරවෙළඳ තෙම අකුශල කම් විපාකයෙන් දිලිසෙන්නාවූ රත්හැල් බොල් දෙයතින් හැරගෙන තමන් හිස්

Non-commercial distribution

මුදුනේ විසුරුවාගන මහත් දුක් අනුභව කරයි. ඒ කුටවාණිජ යාගේ පුත්‍රයා යකඩ මුගුරුවලින් ගසා තෙමේම තමාගේ හිස පොඩිකරගන අනල්පවූ දුක් අනුභව කරයි. ඔහුගේ යෙහෙළිනී තොම බොරු දිවුළ අකුශල විපාක හෙතුවෙන් ඉතා මුවහත්ඇති ඉතා පලල් දික් නියවලින් තම පිටමස් ඇද කඩකඩා කමින් අපමණ දුක් විඳියි. ඔහුගේ බිරින්දට සුවඳැති සුවිශුධවූ පහකළ කළුසහල් ඇති සැල්සහල් බත ළඟට ලැබුණ ඇසිල්ලෙහිම නානාවිධ කෘමිසමූහයාගෙන් ගැවැසීගත් අතිශයින් දුගඳින් පිළිකුල් කටයුතුවූ අශුචිබවට පැමිණේ ඒ අශුචි ඇ දෙයතින් ගෙන අනුභව කරමින් මහත් දුක්විඳියි. මෙසේ ඒ සිව්දෙන ප්‍රෙත ලොකයෙහි ඉපිද මහදුක් විඳින කල්හි ඇවැත් මහමුගලන් තෙරණුවෝ පඨිතචාරිකාවෙහි හැසිරෙමින් එකදවසක් එතනට වැඩීසේක් ඒ ප්‍රෙතයන් දැක ඔවුන්කළ පාපකර්මය ඉමි ගාථාවෙන් විවාළසේක:-

63 ගූසානි එකෝ සාලිං පුනාපරෝ
අයඤ්ච නාරී සකමංසලෝහිතං,
තුවං ච ගූථං අසුචිං අකන්තිකං
පරිභුඤ්ජසි කිස්ස අයං විපාකෝ-ති.

63. එකෝ, එකෙක්; සාලිං, හැල්වී පිළිබඳ; ගූසානි, බොල්; (හිසැ විසුරුවා ගනියි) පුන, නැවත; අපරෝ; තවත් එකෙක්; (ශීර්ෂ හෙදයට පැමිණෙයි) අයංච නාරී, මේ ස්ත්‍රියද; සකමංසලෝහිතං, තම පිටිමස් හා ලේ; (අනුභවකරයි) තුවංච, නීද; අසුචිං, අපවිත්‍ර වූ; අකන්තිකං, අමනාපවූ; (හෙවත්) පිළිකුල් කටයුතුවූ; ගූථං, අශුචි; පරිභුඤ්ජසි, අනුභව කෙරෙහිය; කිස්ස, කවර අකුශලකර්මයක්හුගේ; අයං විපාකෝ, මේ විපාකය වේද.

එකෙක් දිලිසෙන හැල්වීවල බොල් තමහිස විසුරුවා ගනියි, තවත් එකෙක් හෙවත් යම් ඒ පුතෙක් මවුගේ හිසට ගැසුවේද එතෙම යමුගුරු වලින් තම හිසට ගහගනිමින් හිස පොඩි කර ගනිමින් දුක්විඳියි, මේ ස්ත්‍රිය තම පිටමස් හා ලේ අනුභවකරයි, නීද පිළිකුල් කටයුතු අපවිත්‍රවූ අශුචි අනුභවකෙරෙහි, තොප විසින් මේ කාලයෙහි යම් දුකක් විඳිනුලැබේද මේ කවර අකුශල කර්මයක්හුගේ විපාකයෙක් වේදයි විචාළෝය.

Non-commercial distribution

මෙසේ තෙරණුවන් විසින් ඔවුන් පෙරකළ අකුශල කර්මය නැවත විචාළකල්හි කූටවාණිජයාගේ භාර්‍යාතොමෝ ඔවුන් සියල්ල විසින් පෙර කරනලද කර්මය කියන්නී මේ ගාථාවන් කියේය:-

64. **අයං පුරෙ මාතරං හිංසති-අයං පන කූටවාණිජෝ,**
අයං මංසානි ඛාදිත්වා-මුසාවාදෙන වඤ්චෙති.

65. **අහංමනුස්සෙසුමනුස්සභූතා-අගාරිණීසබ්බකුලස්ස ඉස්සරා,**
සන්තෙසු පරිගුය්හාමි-මා ච කිඤ්චි ඉතෝ අදං.

66. **මුසාවාදෙන ජානෙමි-නත්ථි එතං මම ගෙහෙ,**
සවෙ මෙ සන්තං නිගුය්හාමි-ගූථෝ මෙ හෙතු භොජනං

67. **තස්ස කම්මස්ස විපාකෙන-මුසාවාදස්ස චූභයං,**
සුගන්ධසාලිනෝ හත්ථං-ගූථමෙම පරිවත්තති.

68. **අවඤ්ඤානි ච කම්මානි-න හි කම්මා විනස්සති,**
දුග්ගන්ධං කිමිජං මීළ්හං-භුඤ්ජාමි ච පිවාමිවා-කි.

64. අයං, මේ තෙම; පුරෙ, පෙර අත්බැව්හිදී; මාතරං මවට; හිංසති, පීඩාකෙළේය; අයං පන, මෙතෙම වනාහී; කූටවාණිජෝ, කුළුවෙළෙන්දෙකි; අයං මෝතොම; මංසානි, මස්; ඛාදිත්වා, කා; මුසාවාදෙන, බොරුකීමෙන්; වඤ්චෙති, වංචාකෙළේය.

65. අහං, මම; මනුස්සෙසු, මිනිස්ලොව; මනුස්සභූත, මනුෂ්‍යයෙක්වූ; සබ්බකුලස්ස, සියලු කුලයට; ඉස්සරා, ඊශ්වරවූ; අගාරිණි, ගෘහපතිනියක්වෙමි; සන්තෙසු, (උපකරණ) විද්‍යාමානකල්හිම; පරිගුය්හාමි, සැඟෙව්වෙමි; ඉතෝ, මෙයින්; කිඤ්චි, කිසිවකුත්; මාවඅදං, නුදුනිමි.

66. එතං, මෙය; මම මාගේ; ගෙහෙ, ගෙයි; නත්ථි, නැතැයි; මුසාවාදෙන, බොරුකීමෙන්; ජානෙමි, වසාලීමි; සවෙ, ඉදින්; මෙ, මාගේගෙයි; සන්තං, ඇතිව; නිගුය්හාමි, සඟවන්නෙමි නම්; මෙ, මාගේ; භොජනං, ආහාරය; ගූථොහොතු, අශුචි වේවා.

67. තස්සකම්මස්ස, ඒ අකුශල කර්මයාගේද; මුසාවාදස්සව, මුසාවාද අකුශලයාගේද; උභයං, කර්මදෙදෙනාගේ; විපාකෙන, විපාකහෙතුවෙන්; සුගන්ධසාලිනෝ, සුවඳැල් සහල් පිළිබඳවූ; හත්ථං, බත; මෙ මාහට; ගූථං, අසුචිබවට; පරිවත්තති; පෙර ළෙයි.

Non-commercial distribution

68. කම්මානි, කුශලාකුශල කර්මයෝ; අවඤ්ඤානිව, හිස් නොවෙත්මය; කම්මං, (හේතුවකින් රැස්කරනලද) කර්මය; නහි විනස්සති, (විපාකනොදී) නොවැනසේමය; දග්ගන්ධං, දුගඳවූ; කිමිජං, හටගත් පණුවපත් ඇති; මීළහං, අශුචි; භුඤ්ජා මිව, (දැන් මම) අනුභවකරමි; පවාමිව ඉති, පානයද කරමි.

මේ පුතා පූර්වජාතියෙහිදී මුගුරකින් මවුට ගැසුවේය, මේ පුරුෂතෙම වඤ්චාවෙන් වෙළඳුම්කළ කෙනෙක්ය, මේ ස්ත්‍රී නොමෝ අනිත් අයත් සමග පිළියෙළකළ මස් තමාම සොරාකෑ නොකැවෙමියි කියා බොරුවෙන් ඔවුන් රැවටුවේය. මම මිනිස්ලොව මනුෂ්‍ය ස්ත්‍රියක්ව සියලු කුලයට ප්‍රධානව ගෘහපතිනි යක්වීමි, අනුන් විසින් යමක් ඉල්වූවිට ඒ දෙය ගෙයි තිබියදීම නැතැයි කියා සැහවීමි, මේ මා සතුදෙයින් ස්වල්ප මාත්‍රවූ දෙයක් වත් අනුන්ට නුදුනිමි. යමෙකු යමක් මගෙන් ඉල්වූවිට මේ දෙය මාගේ ගෙයි නැතකියා බොරු කියා සඟවාලුවෙමි, ඉදින් තොප ඉල්වනදේ මාගෙ ගෙයි තියාගන සඟවන්නෙමි නම් මාගේ ආහාරය අශුචිවේවායි කීවෙමි, ඒ අකුශල කර්මය හා බොරු කී අකුශල කර්මය යන කර්මදෙදෙනාගේ විපාකයෙන් සුවඳ හැල් බත මාගේ විෂයෙහි අශුචිබවට පෙරළෙයි. කුශලා-කුශල කර්මයෝ හිස්නොවෙත්, හේතුවකින් රැස්කරනලද කර්මය විපාකනොදී නොනැසේමය, මාවිසින් පෙරකරනලද අකුශල-කර්මයාගේ විපාකයෙන් දැන් දුගඳවූ පණුවන්ගෙන් ගැවිසීගත් අශුචි පානය කරමියයි කීයේය.

මෙසේ තෙරුවන් වහන්සේ ඒ ප්‍රේතියගේ කීම අසා එපවත් බුදුන්ට සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථෝත් පත්තිකොට ගෙන පැමිණි පිරිසට ධර්මදේශනා කළසේක. ඒ දෙශනා තොමෝ මහාජනයාට සාර්ථක වූයේය.

(මේ මාහැඟි ධර්මකථාව කියවීමෙන් සිත්හි තබාගතයුතු උපදෙශය නම්:- එකපවුලේ විසූ සිව්දෙන මරණින්මතු තම තමන් කළ අකුශල කර්මානුරූප දරුණු විපාක දුකට පැමිණි ආකාරයයි. මෙකල තුළාකූට මාණකූටාදියෙන් හොරවෙළඳම් කරන ජනයා හා මව්පියන්ට ගරු නොකොට ගහන බණින පීඩාකරන අශික්ෂිත දරුවන්ද, ගෙදර තිබෙන ආහාරාදිය හොරාකන නින්දික අය හා තමා ලඟ තිබෙන දෙයක් යම්කිසි-

Non-commercial distribution

වෙකු ඉල්වූවිට නැත කියා බොරු දියුරණ පාපින්ද විශෙෂයෙන් මේ ධර්ම කථාව කියවා සිත්හි තබාගෙන එවැනි පව්වලින් වැලකී සිටීමට තරයේ ඉටාගත යුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි වුලවර්ගයට ඇතුළත් සකරවෙනි භූතප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී

---

3. 5 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දේශනායෙහි චූලවර්ගාන්තර්ගත පස්වෙනි කුමාර ප්‍රෙතවස්තුව වෙයි. ඒ ප්‍රෙතවස්තුහුගේ උත්පත්තිය කවරදයත්:–

සැවැත්නුවර වනාහි බොහෝ උපාසකවරු ධර්මානුචාරීව නුවර මහත් මණ්ඩපයක් කරවා ඒ මණ්ඩපය නානා වර්ණ වස්ත්‍රවලින් අලඩ්කාර කොට කල්ඇතුවම බුදුරජාණන් වහන්සේට හා භික්ෂු සඩ්ඝයාට ආරාධනා කොට මහත් අගනා පසතුරුණු අතුළ අසුන්වල බුඩප්‍රමුඛ භික්ෂුසඩ්ඝයා වඩා හිඳුවා ගඳමල් ආදියෙන් පූජා කොට මහදන් පවත්වති ඒ දැක එක්තරා මසුරු මලයෙන් මැඩුණ සිත් ඇති පුරුෂයෙක් තෙම ඒ සත්කාරය නොඉවසමින් ''මේ සියල්ල කසලගොඩෙහි බහාලුවේනම් උතුම් වෙයි, මේ හිස මුඩුවූවන්නට දීම උතුම් නොවේමය'' යි මෙසේ කීයේය. උපාසක වරු එය ගසා කලකිරුණු සිත් ඇතිව ''යම්හෙයකින් මෙසේ බුඩ ප්‍රමුඛ භික්ෂුසඩ්ඝයා කෙරෙහි වරද කරන ලද්දේද එහෙයින් මේ පුරුෂයා විසින් එකාන්තයෙන් බැරෑරුම් පවක් රැස්කර ගන්නා ලද්දේය'' යි කියා ඒ කාරණය ඔහුගේ මවුට කියා ''යව ශ්‍රාවක සඩ්ඝයා සහිතවූ භාග්‍යවතුන් වහන්සේ කමා කරව'' යි කීවාහුය. ඈ යහපතැයි කියා පිළිගෙන පුත්‍රයා තැනිගන්වමින් වැරද්ද අභවා බුදුන් හා භික්ෂු සඩ්ඝයා වෙත එළඹ පුතා විසින් කරනලද වරද කියමින් කමා කරවාගන භාග්‍යවතුන් වහන්සේට හා භික්ෂු සඩ්ඝයාහටත් සත් දවසක් කැඳ දනයක් පූජා කළේය. ඇගේ පුත්‍රයා නොබෝ කලකින්ම කළුරිය කොට ක්ලිෂ්ට කර්මයෙන් දිවිපවත්වන්නාවූ වෙසභාගේ කුස උපන්නේය. ඕතොමෝද ඔහු උපන් කෙණෙහිම දරුකයෙක්යයි දැන සොහොනෙහි දැම්ම විය. ඒ දරුතෙම ඒ සොහොනෙහි තමාගේ පින්බලයෙන්ම ගන්නාලද ආරක්ෂා

Non-commercial distribution

ඇතිව කිසිවෙකු විසින් නිරුපද්‍රැතව මවු ඇකයෙහිමෙන් සුවසේ නිදගත්තේය. දෙවියෝ ඔහුට අරක්ගත්තාහුයයිද කියත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ අලුයම් කාලයෙහි මහා කරුණා සමාපත්තියෙන් නැඟිසිට බුදු ඇසින් ලොව බලා වදරන සේක් සොහොනෙහි ලූ ඒ දරුවා දැක සූර්‍යෝදය කාලයෙහි සොඹභානට වැඩිසේක. ශාස්තෘන් වහන්සේ මෙහි වැඩිසේක. මෙතැන කාරණයකින් යුක්තමය යුතුයයි කියා මහජනයා රැස්විය. භාග්‍යවතුන් වහන්සේ රැස්වූ පිරිසට ''මේ දරු තෙමේ ලාමක කෙනෙකැයි නොසැලකිය යුතුයි. ඉදින් දැන් සොහොනෙහි දමනලදුව අනාථව සිටින නමුදු මතු කාලයෙහි වනාහි ඉහාත්ම භාවයෙහි හා පරලොවදීත් උදර සම්පත් ලබන්නේය''යි වදරා ඒ මිනිසුන් විසින් ස්වාමීනි මේ දරුවා විසින් පූර්‍ව ජාතියෙහිදී කවර කර්මයක් කරන ලදදැයි විචාරණ ලදුව,

බුඩපමුඛස්ස භික්ඛුසඩ්ඝස්ස – පූජං අකාසි ජනතා උළාරං,
තත්‍රස්ස චිත්තස්සහු අඤ්ඤථත්තං–වාචං අහාසි ඵරුසං
අසඛ්භංති.

''උපාසක ජනසමූහයා බුඩප්‍රමුඛ භික්ෂු සඩ්ඝයාහට මහත් පූජාවක් කළේ ය. ඒ පූජාවෙහිදී පෙර ජාතියෙහි මේ දරුවාගේ සිතට අනාදරයක් අගෞරවයක් ඇතිවී අසභ්‍ය පරුෂ වචනයක් කීයේය''යි මේ ආදියෙන් ඒදරකයා විසින් පෙරකරනලද කර්‍මය හා මතුකාලයෙහි පැමිණියයුතු සම්පත්ද ප්‍රකාශකොට වදරා රැස් වූ පිරිසගේ අදහසට අනුරූපවූ ධර්‍මය වදරා මතු චතුස්සත්‍යය ප්‍රකාශිතවූ ධර්‍මදෙශනාව කළසේක. චතුස්සත්‍ය දෙශනාවශාන යෙහි සුවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාවබොධය වූයේය. ඒ දරුවාද අසූකෙළක් සම්පත් ඇති එක් කෙළඹියෙක් තෙම බුදුන් හමුවෙහිදීම මගේ පුතායයි කියා අරගත්තේය. භාග්‍යවතුන් වහන්සේ ''මෙපමණකින් මේ දරුවා රක්ෂා කරන ලද්දේය, මහජනයාහවද අනුග්‍රහ කරන ලද්දේයයි සිතා වදරා විහාරයට වැඩිසේක. ඒ කුමාරතෙම මෑත කලෙක ඒ කෙළෙඹියා කළුරිය කළ කල්හි ඔහු විසින් බාරදෙනලද ධනය පිළිපැද කුලපරම්පරාව පිහිටුවමින් ඒ නුවරම මහත් සම්පත් ඇති ගෘහපතියෙක්ව දනාදි පින්කම්හි ඇලුණේය. ඉක්බිත්තෙන් එක්දවසක් භික්ෂූහු ධර්මසභායෙහිදී ''විස්මයෙක ශාස්තෘන් වහන්සේ සත්වයන් කෙරෙහි එකාන්තයෙන් කරුණා ඇතිසේක. ඒ දරුකතෙමේ

Non-commercial distribution

ඒ කාලයෙහි අසරණව සිටියේ නමුදු මේ කාලයෙහි මහත් සම්පත් විඳියි, මහත්වූ පින්ද කෙරේය''යි කියා කථාවක් ඉපද-වූහ. එය අසා ශාස්තෘන් වහන්සේ ''මහණෙනි ඒ කුමරුහට සම්පත් මෙපමණක්ම නොවෙයි. තවත් ආයුකෙළවර තවුතිසා දෙව්ලොව සක්දෙවිරජහට පුත්ව උපදින්නේය. මහත්වූද දිව්‍ය-සම්පත් ලබන්නේය''යි වදළසේක. එය අසා භික්ෂුහුද මහජනයාද ''මේ කාරණය දැක දීඝදර්ශීවූ බුදුරජාණන් වහන්සේ උපන් ඇසිල්ලේම අමුසොහොනේ දමනලද එකුමරුහට එහි වැඩමවා සංග්‍රහකළසේකැ'' යි කියා ශාස්තෘන් වහන්සේගේ ඥන විශෙෂයට ස්තුති කොට ඒ ආත්මභාවයෙහි ඔහුගේ ප්‍රවෘත්තීය කථා කළාහුය. ඒ කාරණය ප්‍රකාශ කරන්නාවූ සඞ්ගීතිකාරයෝ මේ ගාථාකීහු:-

69. අච්ඡෙරරූපං සුගතස්ස ඤාණං
සත්ථා යථා පුග්ගලං බ්‍යාකාසි,
උස්සන්නපුඤ්ඤාපි භවන්ති හෙකෙ
පරිත්තපුඤ්ඤාපි භවන්ති හෙකෙ.

70. අයං කුමාරෝ සිවථිකාය ඡඩ්ඩිතෝ
අඩ්ගුට්ඨස්නෙහෙන යාපෙති රත්තිං,
න යක්ඛභූතා න සිරිංසපා වා
විහෙඨයෙය්‍යුං කතපුඤ්ඤං කුමාරං,

71. සුනඛාපිමස්ස පලිහිංසු පාදෙ
ඨංකා සිගාලා පරිවත්තයන්ති,
ගබ්භාසයං පක්ඛිගණා හරන්ති
කාකා පන අක්ඛිමලං හරන්ති.

72. නයිමස්ස රක්ඛං විදහිංසු කෙචි
න ඔසධං සාසපථූපනං වා,
නක්ඛත්තයොගංපි න අග්ගහෙසුං
නසබ්බඨඤ්ඤානිපි ආකිරිංසු.

73. එතාදිසං උත්තමකිච්ඡපත්තං
රත්තාහතං සිවථිකාය ඡඩ්ඩිතං,
නොනීතපිණ්ඩං විය වෙධමානං
සඝංසයං ජීවිතසාවශෙසං

Non-commercial distribution

74. තමද්දසා දෙවමනුස්ස පූජිතෝ
දිස්වාව තං බ්‍යාකරි භූරිපඤ්ඤෝ,
අයං කුමාරෝ නගරස්සිමස්ස
අග්ගකුලිකෝ භවිස්සති භොගතෝ ච.

75. කිස්ස වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුවිණ්ණස්ස අයං විපාකෝ,
එතාදිසං බ්‍යසනං පාපුණිත්වා
තං තාදිසං පච්චනුභොස්සතිඩි-න්ති.

69. සත්ථා, ශාස්තෘන් වහන්සේ; යථා, යම්සේ; පුග්ගලං, පුද්ගලයා; බ්‍යාකාසි, ප්‍රකාශකළසේක්ද; (එහෙයින්) සුගතස්ස, සර්ඒදයන් වහන්සේගේ; ඤාණං, සර්ඒඥතාඥානය; අචිඡෙර රූපං, ආශ්චර්‍ය්‍ය ස්වභාව ඇත්තේය; උස්සන්න පුඤ්ඤාපි, උත්සන්න කුශල ධර්ම ඇත්තාවූද; එකෙ, සමහර පුද්ගලයෝ; භවන්තිහි, (ජාත්‍යාදියෙන් නිහීනයෝ) වෙත්මය; පරිත්තපුඤ්ඤාපි, ඉතා සුලු පිනැත්තාවූද; එකෙ, සමහරු; භවන්තිහි, (විසාරදයෝ) වෙත්ම ය.

70. සීවථිකාය, සොහොනෙහි; ඡඩ්ඩිතෝ, බහාලනලද; අයං කුමාරෝ, මේ කුමරු තෙම; අඞ්ගුට්ඨස්නෙහෙන, ඇඟිල්ලෙන් වැගුරුන කිරෙන්; රත්තිං, රාත්‍රියෙහි; යාපෙති, යපෙයි; කතපුඤ්ඤං, කරනලද පින් ඇති; කුමාරං, කුමරා; යක්ඛභූතා, යක්ෂභූතයෝද; නවිහෙඨයෙයුං, නොපෙළවාහුය; සිරිංසපාවා, සර්ජාතීහුද; න (විහෙඨයෙය්‍යුං), පීඩා නොකළාහුය.

71. සුනඛාපි, සුනඛයෝද; අස්ස, මේ කුමරුගේ; පාදෙ, පාදයන්; පලිහිංසු, (දිවින්) පිරිමැද්දහුය; ධඞ්කා, කවුඩෝද; සිගාලා, ශෘගාලයෝද; පරිවත්තයන්ති, (ඔබ්මොබ) පෙරළත්; පක්ඛිගණා, පක්ෂිසමූහයා, ගබ්භාසයං, ගැබ්මල; හරන්ති, පහකරත්; කාකා පන, කවුඩෝ වනාහි; අක්ඛිමලං, ඇස්මල; හරන්ති, පහ කරත්.

72. කෙචී, කිසි මනුෂ්‍ය කෙනෙක්; ඉමස්ස, මේ කුමරුගේ; රක්ඛං, රැකීම; නසංවිදහිංසු, නොකළාහුය; ඔසධං, ඖෂධ හෝ; සාසපට්ඨපනංවා, අබ්‍යුම්දීම හෝ; න (සංවිදහිංසු), නොකළාහුය; නක්ඛත්තතයොගම්පි, නැකත්යොගද; න අග්ගහෙසුං, නොගත්තාහුය; සබ්බධඤ්ඤනීපි, සාල්‍යාදි සර්ධාන්‍යයන්ද; න ආකිරිංසු, නොවිසුරුවාහුය.

Non-commercial distribution

73-74. රත්තාහතං, රාත්‍රියෙහි ගෙනෙනලදුව; සීවථිකාය, සොහොනෙහි; ඡඩ්ඩිතං, දමනලද්දවූ; උත්තමකිච්ඡපත්තං, ඉතාම දුප්පත්වූ; නොනීතපිණ්ඩංවිය, වෙඩරු පිඩක් බඳුවූ; වෙධමානං, වෙවුලන්නාවූ; සසංසයං, ජීවත්වේදේ නොවේදේයි සැක සහිතවූ; ජීවිතසාවසෙසං, ජීවිත මාත්‍රයම ඉතිරිවූ; එතාදිසං, මෙබඳුවූ; තං, ඒ කුමරු; දෙවමනුස්ස පූජිතෝ, දෙවිමිනිසුන් විසින් පුදන ලද්දවූ; භූරිපඤ්ඤෝ, මහාප්‍රාඥවූ තථාගතයෝ; අද්දසා, දුටුසේක; තං, ඔහු; දිස්වාව, දැකුම; අයං කුමාරෝ, මේ කුමරුතෙම; ඉමස්සනගරස්ස, මේ නුවර; භොගතොම, භොග සම්පත් වශයෙන්ද; අග්ගකුලිකෝ භවිස්සති, උත්තමකුලිකයෙක් වන්නේයයි; බ්‍යාකරි, ප්‍රකාශකළසේක.

75. අස්ස, මේ කුමරුගේ; වතං, ව්‍රතසමාදනය; කිං, කුමක් ද; බ්‍රහ්මචරියං, ශ්‍රේෂ්ඨචර්‍යාව; කිං පන, කුමක්ද; සුචිණ්ණස්ස, මොනවට පුරුදුකරන ලද්දවූ; කිස්ස, කෙබඳුවූ (ව්‍රතයක් ශ්‍රේෂ්ඨචර්‍යා) වක්හුගේ; අයං විපාකෝ, මේ විපාකය-වේද; එතාදිසං, මෙබඳුවූ; ව්‍යසනං, විපතට; පාපුණිත්වා, පැමිණ, තාදිසං, එබඳුවූ; තං, ඒ උක්තප්‍රකාර සම්පත්ද; ඉධිං, දිව්‍යර්ධිය (හෙවත්) දිව්‍යසම්පත්ද; පච්චනුභොස්සති ඉති, නැවත වලඳන්නේද.

බුදුරජාණන් වහන්සේ යම්සේ සොහොනේ දමනලදුව අසරණව සිටි දරුවා අරබයා මතුසිදුවන වැඩ ප්‍රකාශකොට වදළ සේක් ද, එහෙයින් අනුන් හා සාධාරණනුවූ ආශයානුශය ඥානාදි සර්ඥතාඥනය ආශ්වර්‍ය ස්වභාව ඇත්තේමය, ඒ මේ නුවණ අනුන්ට විෂයනොවේ, එහෙයින් කුමරු පිළිබඳ ශාස්තෘදෙශනා වෙන්ම නුවණේ පුදුම භාවය හැඟේ, උත්සන්න කුශලධර්‍ම ඇත්තාවූද මේ ලොකයෙහි සමහර පුද්ගලයෝ ලබනලද හෙතු ඇති එබඳු කුශලයාගේ වශයෙන් ජාත්‍යාදියෙන් නිහීනයෝවෙත්. ඉතා ස්වල්ප කුශලධර්‍ම ඇත්තාවූද සමහරසත්වයෝ ක්ෂෙත්‍ර-සම්පත් ආදි හෙතුවෙන් ඒ පින් මහත් ආලොක ඇති බැවින් උදරයෝ වෙත්. සොහොනෙහි දමනලද මේ කුමරුතෙම දෙවියන් විසින් ඇඟිල්ලෙන් වගුරුවනලද කිරිබිමෙන් රාත්‍රියෙහි යපුණේය. කරනලද පින්ඇති මේ කුමරුට පිශාචවූ හෝ යක්ෂවූ හෝ සජීජාති වූහෝ යම්කිසි සත්වකෙනෙක් පීඩා නොකළාහුය. මේ කුමාරයා ගේ පාදයන් සුනඛයෝ තමන්ගේ

Non-commercial distribution

දිවින් පිරිමැද්දහුය. කවුඩෝහා සිවල්ලු කිසිවෙක් පීඩා-නොකරත්වායි සිතා ඒ කුමරු රකිමින් නිරොගි බැව් දැනගැන්ම පිණිස ඔබිමොබ පෙරළත්, ගිජුලිහිණි උකුසු ආදි පක්ෂි සමූහයා ගැබ්මල පහකරත්, කවුඩෝ වනාහි කබ පහකරත්. කිසිමනුෂ්‍ය කෙනෙක් මේ කුමරු ආරක්ෂා නොකළාහුය, අමනුෂ්‍යයෝ රක්කාහුය, ඒ වේලාවෙහි හා මතුත් නිරොගි බැව් ගෙනදෙන බෙහෙතක් හෝ උපන් දරුවාගේ රැකීම සඳහා අබවලින් යම් දුම්ඇල්ලීමක් කෙරෙද්ද එයත් ඒ කුමරුට කළ කෙනෙක් නුවූහ. මෙනම් රාශියේ මෙනම් නැකතේ මේ තිථියේ ඒ මුහුර්තයේ මේ කුමරු උපනැයි කියා මෙසේ ජාතකමීයකුත් මේ කුමරුහට කිසිවෙක් නොකළාහුය. මඩිගලවිධි කරන්නෝ බෙහෙත් වශයෙන් අබතෙල් මිශ්‍ර කරනලද හැල්ආදි යම් ධාන්‍ය වර්ග විසුරුවද්ද එබන්දකුත් මෝහට නොකළාහුය. රාත්‍රියෙහි ගෙනැවිත් සොහොනේ දමනලදුව ඉතාම දුප්පත්වූ මස්වැදුල්ල පමණක්වූ බැවින් වෙඩරුපිඩක් බඳුවූ දුර්වල බැවින් කම්පාවන්නාවූ ජීවත්-වේදෝ නොවේදෝහෝයි කියා සැක සහිතවූ දිවිපැවත්මට හෙතු කරුණුනොමැති හෙයින් හුදෙක් ප්‍රාණය පමණක් ඉතිරිවූ එබඳුවූ ඒ කුමරා දෙවිමිනිසුන් විසින් පුදනලද්දවූ මහා ප්‍රාඥවූ තථාගතයන් වහන්සේ දැක මේ කුමරුතෙම මේ නුවර භොගසම්පත් වශයෙන්ද ශ්‍රේෂ්ඨකුල ඇත්තෙක් වන්නේයයි ඔහු අරභයා තතු ප්‍රකාශ කළසේක. එකල බුදුන්වෙත සොහොනේ රැස්වූ සිටි උපාසක ජනයා විසින් ඔහු විසින් පෙරකරනලද කර්මීය විචාරීම් වශයෙන් ''කිස්සවතං'' යනාදි මේ ගාථාව කියනලදි. ස්වාමිනි, මොහුගේ ව්‍රතසමාදනයකුමක්ද ශ්‍රේෂ්ඨචර්‍යාව කුමක්ද මොනවට පුරුදු කරනලද කෙබඳු ව්‍රතයක්හුගේ කෙබඳු ශ්‍රේෂ්ඨ චර්‍යාවක්හුගේ විපාකයකින් ගණිකාව කුස ඉපිද සොහොනේ දමනලදුව විපතට පැමිණුසිටි කුමරු උක්තප්‍රකාර ඒ සම්පත් හා දිව්‍යසම්පත් නැවත ලබන්නේදැයි අසනලදි. ඒ උපාසකයන් විසින් විචාරණ ලද්දවූ භාග්‍යවතුන් වහන්සේ යම් ඒපරිද්දකින් ප්‍රකාශ කළ සේක්ද එය දක්වන්නාවූ සඞ්ගීතිකාරයෝ මේ ගාථා කීහු:-

76. බුද්ධ පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස-පූජං අකාසි ජනතා උළාරං,
තත්‍රස්ස චිත්තස්සහු අඤ්ඤථත්තං-වාචං අභාසි එරුසං
අසබ්භං.

Non-commercial distribution

77. සො තං විතක්කං පටිවිනොදයිත්වා
පීතිං පසාදං පටිලද්ධා පච්ඡා,
තථාගතං ජෙතවනෙ වසන්තං
යාගුයා උපට්ඨාසි සො සත්තරත්තං,

78. තස්ස වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුවිණ්ණස්ස අයං විපාකො,
එතාදිසං බ්‍යසනං පාපුණිත්වා
තං තාදිසං පච්චනුභොස්සතිද්ධිං.

79. ඨත්වාන සො වස්සසතං ඉධෙව
සබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො,
කායස්ස භෙදා අභිසම්පරායං
සහව්‍යතං ගච්ඡති වාසවස්සා–ති.

76. ජනතා, ජනසමූහයා; බුඩපමුඛස්ස, බුඩප්‍රමුඛවූ; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසංඝයාහට; උළාරං පූජං, මහත් පූජාවක්; අකාසි, කළේය; තත්‍ර, එහිදී; අස්ස, මොහුගේ; චිත්තස්ස, සිතට; අඤ්ඤථත්තං අහු, අන්‍යථාභාවයක් (හෙවත්) අගෞරව යක් ඇතිවිය; අසබ්භං, අසභ්‍යවූ (හෙවත්) සාධුසභායෙහි නො කියයුතුවූ; ඵරුසංවාචං, රළුවචනයක්; අභාසි ඉති, කීයේය.

77. සො, හෙතෙම; පච්ඡා, පසුව; තං විතක්කං, ඒ ලාමක විතර්කය; පටිවිනොදයිත්වා, පහකොට; පීතිං, ප්‍රීතියද, පසාදං, ප්‍රසාදයට; පටිලද්ධා, පිළිලැබ; ජෙතවනෙ, ජෙතවන යෙහි; වසන්තං, වැඩවසන්නාවූ; තථාගතං, තථාගතයන්ට; සත්තරත්තං, සත්දිනක්; යාගුයා යාගුදනයෙන්; උපට්ඨාසි, උපස්ථාන කෙළේය.

78. අස්ස, මොහුගේ; තංවතං, ඒ ව්‍රත සමාදනයද; තං පන බ්‍රහ්මචරියං. ඒ ශ්‍රේෂ්ඨචර්‍යාවදවේ; සුවිණ්ණස්ස, මනාසේ පුරුදු කරන ලද්දවූ; තස්ස, ඒ කර්මයාගේ; අයං විපාකො, මේ විපාකය වේ. (සෙස්ස යටකීසේයි.)

79. සො, ඒ කුමරුතෙම; ඉධෙව, මේ මිනිස් ලොවම; වස්සසතං, හවුරුදු සියයක් මුලුල්ලෙහි; සබ්බෙහි කාමෙහි සියලු කාම සැපතින්; සමඞ්ගිභූතො, යුක්තව; ඨත්වාන, සිටකායස්ස භෙදා, ශරීරයාගේ බිඳීමෙන්; අභිසම්පරායං, පුනර්භවයෙහි; වාසවස්ස, ශක්‍රයාගේ; සහව්‍යතං, (පුත්‍රභාවයෙන්) සහභාවයට; ගච්ඡතිඉති, යන්නේය.

Non-commercial distribution

සැවැත්නුවර උපාසක සමූහයා එකතුව බුඩප්‍රමුඛ භික්ෂු සඩ්ඝයා වහන්සේට උදරවූ පූජාවක් කළේය. ඒ පූජාවෙහි (පූර්වභවයෙහිදී) මේ දරුවාගේ සිතට අගෞරවයක් නොසතුටක් ඇතිවී සත්පුරුෂ භාවයට අයුතුවූ පරුෂ වචනයක් මොහු කීයේය. ඒ මේ තැනත්තේ පසුව මවු විසින් එහි ආදීනව ඇහවූ කල්හි ඒ ලාමක විතර්කය දුරුකෙට ප්‍රීතිප්‍රසාදය උපදවාගෙන ජෙතවනාරාමයෙහි වැඩවසන්නාවූ තථාගතයන්ට සත්දිනක් කැඳ දනයෙන් උපස්ථාන කෙළේය. ඔහුගේ ඒ වුතය හා ඒ බ්‍රහ්මචර්‍යාවයි (හෙවත් මෙහි යටකියනලද පරිදි තමාගේ චිත්ත ප්‍රසාදය හා යාගුදනයත් මේ පුද්ගලයාගේ වුතයවෙයි. ඒ ශ්‍රේෂ්ඨ චර්‍යාවවෙයි. අන්කිසිවක් නැත.) ඔහු විසින් මොනවට පුරුදු කරනලද ඒ වුතයාගේ හා ඒ බ්‍රහ්මචර්‍යාවගේත් මේ විපාකය වන්නේය, ඒ හේතුවෙන් මෙබඳු විපතට පැමිණසිටි ඔහු එබඳු උක්තප්‍රකාර මානුෂික සම්පත් හා දිව්‍යසම්පත්ද වළඳන්නේය. ඒ කුමාරතෙම මේ මිනිස්ලොව හවුරුදු සීයක් මුළුල්ලෙහි සියලු කාමසැපතින් යුක්තව සිට මරණින්මතු පුණර්භවයෙහිදී සක්දෙව් රජහට පුත්‍ර භාවයෙන් එක්වීමට පැමිණෙන්නේ යයි මෙසේ වදළහ.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයට ඇතුළත් පස්වෙනි කුමාර ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

---

3. 6 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චුලවඟාන්තඟත සවෙනි **සෙරිණි ප්‍රෙතවස්තුව** කවරහයත්.

ත්‍රිභුවනජන හෘදයානන්දකර ශාස්තෘවූ තථාගතයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවාසයකර වදරන කල්හි සෙරිණී නම් ප්‍රෙතියෙකු අරභයා මේ වස්තුව දෙශනාකර වදළසේක. කුරු රට වනාහි හස්තිනී නුවර සෙරිණී නම් එක් වෙසහනක් විය. එහිදු පොහෝකරනු පිණිස ඒ ඒ දිශාවලින් භික්ෂූහු රැස් වූවාහුය. නැවත මහා භික්ෂු සඩ්ඝ සන්නිපාතය විය. ඒ දැක මනුෂ්‍යයෝ තල සහල් ආදීවූද ගිතෙල් වෙඩරු මී ආදීවූද බොහෝ දනොපකරණයන් පිළියෙළ කොට මහදන් දුන්නාහුය. එසමයෙහිදු ඒ ගණිකාකොමෝ ශ්‍රද්ධා රහිතව අප්‍රසන්නව මසුරු

Non-commercial distribution

මලයෙන් මැඩුණු සිත් ඇතිව ඒ මිනිසුන් විසින් ''මෙහි එව මේ දනය තීත් අනුමෝදන් වෙව''යි කියා උත්සාහවත්කරන ලද්දී නමුදු ''භිසමුඩු මහණුන්ට ඒ දීමෙන් කවර ප්‍රයෝජනද''යිකියා අප්‍රසාදයම ඔවුන්ට ප්‍රකාශ කළේය. ස්වල්ප මාත්‍රවූද දනවස්තු වක පරිත්‍යාගයක් නම් කොයින්ද? ඕ තොමෝ මෑත කාල යෙහි කළුරියකොට එක්තරා ප්‍රත්‍යන්ත නුවරක අගලක් මත්තෙහි ප්‍රෙතියක්ව උපන. ඉක්බිත්තෙන් හස්තිනීපුරවාසී එක්තරා උපාසකයෙක් තෙම වෙළඳම පිණිස ඒ ප්‍රත්‍යන්ත නුවරට ගොස් රෑ අළුයම් වේලෙහි යම්බඳු ප්‍රයෝජනයක් හෙතු කොට අගලමත්තට ගියේය. ඒ ප්‍රෙතිය එහිදී ඔහු දැක හැඳින නග්නව ඇට සම් පමණක් ඉතිරිවූ ශරීර ඇතිව ඉතාමත් බියකරු දැකුම් ඇතිව නුදුරුතැනකට සිටී තමන් දැක්විය. ඒ උපාසක තෙම ඒ ප්‍රෙතිය දැක:-

80. *නග්ගා දුබ්බණ්ණරූපාසි-කිසා ධමනි සන්ථතා,
උප්ඵාසුලිකෙ කිසිකෙ-කානුත්වං ඉධ තිට්ඨසි-නි.

යන්නෙන් විලිවැසිල්ලක් නැති හෙයින් නග්නවූ දුර්වර්ණ ශරීර ඇති කෘෂවූ මස් ලේ නැති බැවින් ඉල්පීගිය නහරවැල් ඇති උස්වනැඟි ඉල ඇට ඇති ඇට සම් නහර පමණින් යුත් ශරීර ඇති හෙයින් ඉතාමත් කෘශවූ තී මෙහි සිටිනෙහිය, තී කවරියක්දැයි කියා ගාථාවෙන් විවාළේය. එවිට ප්‍රෙතිතොමෝද ඒ උපාසකයාහට කියන්නී:-

81. *අහං භදන්තෙ පෙතිම්හි-දුග්ගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා-නි.

ස්වාමීනි මම පව්කම් කොට මේ මිනිස්ලොවින් චුතව යම ලොකයයි කියනලද ප්‍රෙතලොකයෙහි ඉපදී දුකටපත් ප්‍රෙතියක් වෙමියි කියා ගාථාවෙන් තමා ප්‍රකාශ කළේය. නැවත ඒ උපාසකයා:-

82. *කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මස්ස විපාකෙන-පෙතලොකං ඉතොගතා-නි,

එම්බල ප්‍රෙතිය නී විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශලකර්මයක් පෙර කරනලද්දේද, කවර අකුශල කර්මයක්හුගේ

Non-commercial distribution

විපාක හෙතුකොටගෙන මේ මිනිස් ලොවින් චුතව ප්‍රෙතලොක යෙහි ඉපදීමට පැමිණියාදැයි කියා ඇ විසින් පෙර කරනලද අකුශල කර්මය විවාළේය. එකල ප්‍රෙතීතොමෝ කියන්නී:-

83. අනාවටෙසු තිත්ථෙසු-විවිණිං අද්ධමාසකං,
සන්තෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකාසිමත්තනො.

84. නදිං උපෙමි තසිතා - රිත්තකා පරිවත්තති,
ඡායං උපෙමි උණ්හෙසු-ආතප්පො පරිවත්තති.

85. අග්ගිවණ්ණො ච මෙ වාතො-දහන්තො උපවායති,
එතඤ්ච භන්තෙ අරහාමි-අඤ්ඤඤ්ච පාපකං තතො.

86. ගන්ත්වාන හත්ථිනීපුරං-වජ්ජෙසි මය්හමාතරං,
ධීතා ච තෙ මයා දිට්ඨා-දුග්ගතා යමලොකිකා.

87, පාපකම්මං කරිත්වානපෙතලොකං ඉතො ගතා,
අත්ථිව මෙ එත්ථ නික්ඛිත්තං-අනක්ඛාතඤ්ච තම්මයා.

88. චත්තාරි සතසහස්සානි-පල්ලඞ්කස්ස ච හෙට්ඨතො,
තතො මෙ දනං දදතු-තස්සා ච හොතු ජීවිකා.

89. දනං දත්වා ච මෙ මාතා-දක්ඛිණං ආදිස්සතු මම,
තදහං සුඛිතා හෙස්සං- සබ්බකාමසමිධිනී-ති.

83. අනාවටෙසු; (කිසිවෙකු විසින්) නොවලක්වන ලද්දවූ; තිත්ථෙසු, (නදීතඩාගාදි) තීර්ත්ථ ප්‍රදෙශයන්හි; අඩමාසකං, අඩමසක් පමණ විවිණිං සෙවිවෙමි; (නොහොත්) අනාවටෙසු, (එළඹීමෙන් කිසිවෙකු විසින්) නොවලක්වන ලද්දවූ; තිත්ථෙසු, (සත්වයන්ගේ ප්‍රයොගාශය ශුඛියට කරුණු බැවින්) තීර්ත්ථනම්වූ මහණ බමුණන් ඇතිකල්හි; අඩමාසකං, (කිසිවෙකුට කිසිවක් නොදෙමින්) අඩමස්සත්, විවිණිං, විශෙෂ යෙන් රැස්කළෙමි; දෙය්‍යධම්මෙසු, දනවස්තු; සන්තෙසු; විද්‍ය මානකල්හි අත්තනො, තමහට; දීපං, පිහිටක්; න අකාසි, නොකෙළෙමි.

84. තසිතා, පිපාසා ඇතිව; නදිං, නදියකරා; උපෙමි, පැමිණියෙමි නම්; රිත්තකා, දිය හිස්ව; පරිවත්තති, පවතියි; උණ්හෙසු, උෂ්ණ කාලෙහි; ඡායං සෙවනකොට; උපෙමි, පැමිණියෙමි නම්, ආතපො, අව්ව; පරිවත්තති, පැමිණෙයි.

Non-commercial distribution

85. වාතොව, වාතයද; අග්ගිවණ්ණො, ගිනි සමානව; මෙ, මාගේ (ශරීරය); දහන්තො, දවමින්; උපවායති, හමයි: හන්තෙ, වහන්ස; එතංව, මේ (යථොක්ත) දුක්ද; තතො, ඊට වඩා; පාපකං, දරුණුවූ; අඤ්ඤංච, අනික් දුකටත්; අරහාමි, (මම) සුදුසුවෙමි.

86-87. හත්ථිනිපුරං, හස්තිනී පුරයට; ගන්ත්වාන, ගොස් මය්හං, මාගේ; මාතරා, මවට; වජ්ජෙසි, කියව; පාපකම්මං කරිත්වාන, පව්කම්කොට; ඉතො, මෙයින්; පෙතලොකං, ප්‍රේත ලොකයට: ගතා, පැමිණියාවූ; දුග්ගතා, දුප්පත්වූ; යමලොකිකා, ප්‍රේතලොකවාසිවූ; තෙ, තීගේ; ධිතාව, දියණියද; මයා, මා විසින්; දිට්ඨා, දක්නාලදි; එත්ථ, මෙහි; මෙ, මා විසින්, නික්ඛිත්තං, තබන ලද වස්තුව, අත්ථීව, ඇත්තේය; තං, එය; මයා, මාවිසින්; අනක්ඛාතංව, කිසිවෙකුට නොකියන ලද්දේත්ය.

88. පල්ලඞ්කස්සව, පර්‍යඞ්කයාගේ; මහට්ඨතො, යටින්; චත්තාරිසත සහස්සානි, සාරලක්ෂයක්; (තබනලදහ); තතො, ඒ වස්තුවෙන්; මෙ, මා උදෙසා; දනං දදතු, දන්දේවා; තස්සාව, ඒ මවුගේද; ජීවිකාහොතු, ජීවිකාව වේවා.

89. මෙ, මාගේ; මාතා මවුතොමෝ; දනං දත්වාව, දන්දී, මෙ, මට; දක්ඛිණං, පින; ආදිස්තු, පමුණුවාවා: තද, එකල්හි; අහං, මම; සබ්බකාම සම්ධිනී, සියලු කාමයෙන් සමෘඩවූවා: සුඛිතා හෙස්සං ඉති, සුවපත් වන්නෙමියි.

කිසිවෙකු විසින් නොනවත්වනලද නදීතඩාගාදී මිනිසුන් ජලස්නානාදිය කරන තොටුපොලවල මිනිසුන් සිහිනැතිව තබා ගිය යම්කිසි දෙයක් මෙහිදී ලබන්නෙම නම් මැනවයි සිතා ආශා වෙන් මඩනාලදුව අඩමසක් පමණ කල්ද ආහාර සොයා ඇවිද්දෙමි, නොහොත් එළඹීමෙන් කිසිවෙකු විසින් නොනවත්වන ලද්දවූ සත්වයන්ගේ ප්‍රයොගාශය ශුඛියට කාරණා බැවින් තීර්ථ නමිවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආති කල්හි මසුරු මලයෙන් මැඩුණු සිත් ඇතිව කිසිවෙකුට කිසිවක් නොදෙමින් අඩමස්සත් විශෙෂ යෙන් රැස්කෙළෙමි, දියයුතු දන වස්තුව විද්‍යමාන කල්හි තමාට පරලොවදී පිහිටවන පිනක් නොකෙළෙමි. පැන් පිපාසයෙන් පෙළෙන ලදුව පැන් බීමට ගඟක් කරා එළඹියෙමි නම් කවුඩන් විසින් ඉවුරේ සිට පියයුතු කරම් පිරි ගලාබසින්නා වූ

Non-commercial distribution

ඒ ගංගාවද මාගේ පාප කර්මයට හේතුකොට ගෙන දිය හිස්වී වැලිපමණක්ව සිටියි, උෂ්ණකාලයෙහි මම සෙවන ඇති තැනකට පැමිණෙම්ද මා පැමිණි කල්හි එතනට අව්ව වැටෙයි. සිහිල් වාතය ඇහ වැදීමෙන් ගිනි සමානව මාගේ ශරීරය දවමින් හමයි, වහණ්ස යටකියනලද පිපාසාදි දුක් හා ඊටත් වඩා ලාමකවූ දරුණුවූ වෙනත් දුක්ද විඳීමට මම සුදුසු වෙමි. නින්දිත පව්කම්කළ හෙයිනි. නුඹ හස්තිනී පුරයට ගොස් මාගේ මවට මෙසේ කියනු මැනව, තිගේ දුවණිය අකුශලකර්මයකොට මේ මිනිස් ලොවින් චුතව යමලොකයයි කියනලද ප්‍රේතඅපායෙහි ඉපිද දුක් විඳින්නී මා විසින් දක්නා ලද්දීයයි කියාද, පෙර මා නිදගත් ඒ පළඟ යට මා විසින් තබන ලද සාරලක්ෂයක් ධනය ඇත, මාවිසින් ඒ ධනය කිසිවෙකුට නොකියන ලද්දේය, ඒ ධනය හැරගෙන එයින් ස්වල්පයක් මා උදෙසා දන්දේවා, සෙස්ස මාගේ ඒ මවගේ ජීවිකා වෘත්තිය පිණිස වේවායි කියාද මාගේ මෑණියෝ දන්දී මට දක්ෂිණාව දෙන්නාහුද එකල්හි මම සියලු කාමසැපතින් සමෘඩව සැප ඇත්තියක් වන්නෙමැයි කියත්ය. මෙසේ මේ ගාථාවෙන් තමා විසින් පෙර කරනලද අකුශල කර්මයද නැවත ඒ උපාසකයා විසින් තමන්ට කළයුතු වැඩද කීයේය.

මෙසේ ඒ ප්‍රේතිය විසින් කී කල්හි ඒ උපාසකතෙම ඇගේ වචනය පිළිගෙන ඒ නුවර තමාගේ කටයුතු නිමවා හස්තිනීපුර යට ගොස් ඇගේ මවුට ඒ කාරණය කීයේය. එය දැක්වීම සඳහා සංගීතිකාරයෝ මේ ගාථා කීහු:-

90. සාධූති සො පටිස්සුත්වා,
ගන්ත්වාන හත්ථිනිං පුරං අවොච තස්සා මාතරං.

91. ධිතා ච තෙ මයා දිට්ඨා-දුග්ගතං යමලොකිකා,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා.

92. සා මං තත්ථ සමාදපෙසි-චජ්ජෙසි මය්හමාතරං,
ධිතා ච තෙ මයා දිට්ඨා-දුග්ගතා යමලොකිකා.

93. පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතා,
අත්ථි ච මෙ එත්ථ නික්ඛිත්තං-අනක්ඛාතඤ්ච කං මයා.

94. චත්තාරි සතසහස්සානි පල්ලඞ්කස්ස ච හෙට්ඨතො,
තතො මෙ දනං දදතු-තස්සා ච හොතු ජීවිකා.

Non-commercial distribution

95. දනං දත්වාන මෙ මාතා-දක්ඛිණං අනුදිස්සතු,
කදහං සුඛිනා හෙස්සං-සබ්බකාමසමිද්ධිනී.

96. තතො හි සා දනමදසි-දත්වා ච තස්සා දක්ඛිණමාදිසි,
පෙති ච සුඛිතා ආසි-සරීරං චාරුදස්සන-න්ති.

90. සො, ඒ උපාසකතෙම; සාධුඉති, යහපතැයි; පටිපසුත්වා, පිළිවදන්දී; හත්ථිනී පුරං, හස්තිනී පුරයට; ගන්ත්වාන, ගොස්; තස්සාමාතරං, ඇගේ මවට; අවොච, කියේය.

92. මය්හං, මාගේ; මාතරං, මවට; වජ්ජෙසි, කියවයි, සා, ඕනොමෝ; තත්ථ, එහිදී; මං, මා; සමාදපෙසි, සමාදන්කරවිය-

96. තතොහි, එහෙයින් වනාහි; සා ඕතොමෝ; දනං අදසි, දන්දුනි; දත්වාව, දී; තස්සා, ඒ ප්‍රෙතියට; දක්ඛිණං ආදිසි, පින් පැමිණුවි; පෙතීව, ප්‍රෙතියද; සුඛිතාආසි, සුවපත්විය; සරීරං, ශරීරය; චාරුදස්සනං ඉති, මනා දැකුම් ඇතිවිය. (සෙසු සියල්ල යටකී පරිදියි.)

ඒ උවසුතෙම ඒ ප්‍රෙතියගේ කීම මැනවයි පිළිගෙන හස්තිනී පුරයට ගොස් ඇගේ මවට මෙසේ කීයේය: තිගේ දියණිය පව් කම් කොට මෙයින් මැරිගොස් ප්‍රෙතලොකයෙහි ඉපදී දුක් විඳින්නී මා විසින් දක්නාලදී. එහිදී ඒ ප්‍රෙතිතොමෝ මට මෙසේද කීය: ''තිගේ දියණිය අකුසල්කොට මෙයින් සැවගොස් ප්‍රෙතලොකයෙහි ඉපදී දුක්විඳින්නී මාවිසින් දක්නාලද්දීයයි කියා මගේ මවුට කියනු මැනව. තවද එහිදී නිදගත් පළඟයට නිදන්කොට තබනලද සාරලක්ෂයක් වස්තුව ඇත, එය කිසිවෙකුට මාවිසින් නොකියනලදී. එය හැරගෙන එයින් ස්වල්පයක් මා උදෙසා දන්දේවා සෙස්ස ඒ මාගේ මවුගේ ජීවිකාවෘත්තිය පිණිස වේවා. මාගේ මව් තොමෝ දන්දී මට පින් පමුණුවා, එකල්හි මම සියලු කාමසැපතින් සමෘඩව සැප ඇත්තියක් වන්නෙමි''යි. එසේ කී කල්හි ඒ මව්තොමෝ ඒ ධනය හැරගෙන භික්ෂු සඞ්ඝයාහට දන්දී ඒ ප්‍රෙතියට පින් පැමිණුවිය, ප්‍රෙතිය සුවපත්විය, ශරීරය මනා දැකුම් ඇත්තේ විය. ඉක්බිති පිළි ලැබූ උපකරණ ඇති ඒ ප්‍රෙතිතොමෝ දෙවුසැපතෙහි පිහිටා මවට තමන් දක්වා සිට ඒ කරුණ කීයේය. මවුතොමෝ එපවත්

Non-commercial distribution

භික්ෂූන්ට කීයේය. භික්ෂූහු එපවත් බුදුන්ට සැලකළාහුය. භාග්‍යවත්හු ඒකාරණය අර්ත්ථොත්පත්තිකොට සැපත් පිරිසට දහම් දෙසූ සේක. ඒ දෙශනාව මහජනයාහට සාර්ථක වූයේය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවගීයට ඇතුළත් සවෙනි සෙරිණි ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

---

3. 7 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගාන්තර්ගත සත්වෙනි **මිගලුද්දක ප්‍රෙතවස්තුව** කවරහයත්.?

ප්‍රඥාසාගරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන කල්හි මිගලුද්දක ප්‍රෙතයෙකු අරභයා මේ වස්තුව වදළසේක. රජගහනුවර එක්තරා වැදිපුරුෂයෙක්තෙම රෑ දවල් දෙකෙහි මූවන් විද මරා ජීවිකාව කෙළේය. ඔහට එක් උපාසකයෙක්තෙම මිත්‍ර වූයේය. ඒ උපාසකතෙම ඔහු සියලු අයුරෙන් පවින් වලකාලීමට නොහැකිව ''යහළුව මෙහි එව රෑ කාලයෙහි ප්‍රාණඝාතයෙන් වලකුව''යි කියා රාත්‍රී කාලයෙහි කුශලයෙහි යෙදවීය. ඒ වැදිතෙම රාත්‍රියෙහි ප්‍රාණඝාතයෙන් වැලකී දහවල් ප්‍රාණඝාත කරයි. ඒ වැද්ද මැතකලෙක මැරිගොස් රජගහ නුවර සමීපයෙහි විමාන ප්‍රෙතයෙක්ව ඉපදී දහවල් කාලයෙහි මහත් දුක්විඳ රාත්‍රියෙහි දිව්‍යමය පඤ්චකාම ගුණයෙන් යුක්තව සැප විඳියි. ඔහු දැක ආයුෂ්මත් නාරද ස්ථවිරයන් වහන්සේ:-

97. නරනාරිපුරක්ඛතො යුවා
රජනීයෙහි කාමගුණෙහි සොභසි,
දිවසං අනුභොසි කාරණං
කිං අකාසි පුරිමාය ජාතියා-ති.

97. නරනාරිපුරක්ඛතො, දිව්‍යපුත්‍ර දුහිතෘන් විසින් පිරිවරන ලද්දවූ; යුවා, තරුණවූ (නුඹ); රජනීයෙහි, සිත්කලුවූ; කාමගුණෙහි, කාමකොටඨාසයන්ගෙන් යුක්තව; සොභසි, හොබනෙහිය; දිවසං, දවල්කාලයෙහි; කාරණං, (නන්වැදෑරුම්) කටුලු; අනුභොසි, අනුභව කෙරෙහිය; පුරිමාය ජාතියා, පූර්වජාතියෙහි; කිං, කිනම් කර්මයක්; අකාසි ඉති, කෙළෙහිද.

Non-commercial distribution

එම්බා ප්‍රෙතය අත්පා මෙහෙකරන දිව්‍යපුත්‍රයන් හා දෙවඟනන් විසිනුත් පිරිවරන ලද්දවූ තරුණයෙක්වූ තෝ රාගොත් පත්තියට හෙතුවූ කාමකොටියාසයන්ගෙන් යුක්තව ඒ කාලයෙහි බබලන්නෙහිය, දවල් කාලයෙහි නානාප්‍රකාර දුක්විඳිනෙහිය, මෙසේ සුවදුක් පැවැත්වීමට හෙතුවූ කවර කර්මයක් මෙයින් පෙර ජාතියෙහිදී තෝ කෙළෙහිද ඒ කියවයි මේ ගාථාවෙන් විචාළහ. ඒ අසා ප්‍රෙතතෙම තමා විසින් පෙර කරනලද කර්මය තෙරණුවන්ට කියන්නේ:-

98. අහං රාජගහෙ රම්මෙ-රමනීයෙ ගිරිබ්බජෙ,
මිගලුද්දෙ පුරෙ ආසිං-ලෝහිතපාණි දරුණො.

99. අවිරොධකරෙසු පාණිසු
පුථුසත්තේසු පදුට්ඨමානසො,
විචරිං අහිදරුණො තදූ
පරහිංසාය රතො අසඤ්ඤතො.

100. තස්ස මෙ සහායො සුහදයො-සද්ධො ආසි උපාසකො,
සො ච මං අනුකම්පන්නො නිවාරෙසි පුනප්පුනං.

101. මාකාසි පාපකං කම්මං මා තා දුග්ගතිං අගා,
සචෙ ඉච්ඡසි පෙච්ච සුඛං-විරම පාණවධා අසංයමා.

102. තස්සාහං වචනං සුත්වා-සුඛකාමස්ස හිතානුකම්පිනො,
නාකාසිං සකලානුසාසනිං-චිරපපාහිරතො අබුධිමා.

103. සොමං පුන හුරි සුමෙධසො
අනුකම්පාය සංයමෙ නිවෙසයි,
සචෙ දිවා හනසි පාණිනො
අථ තෙ රත්තිං භවතු සඤ්ඤමො.

104. ස්වාහං දිවා හ නිත්ව පාණිනො
විරතො රත්තිමභොසිං සඤ්ඤතො,
රත්තාහං පරිවාරෙමි
දිවා බ්‍යප්පාමි දුග්ගතො.

105. තස්ස කම්මස්ස කුසලස්ස-අනුභොමි රත්තිං අමානුසිං,
දිවා පටිහතාව කුක්කුරා-උපධාවන්ති සමන්තා බාදිතුං.

Non-commercial distribution

106. යෙ ව තෙ සතතානුයොගිනො
ධුවං පයුත්තා සුගතස්ස සාසනෙ,
මඤ්ඤාමි තෙ අමතමෙව කෙවලං
අධිගච්ඡන්ති පදං අසංඛත-න්ති.

98. අහං, මම; රම්මෙ, රම්‍යවූ; රමණීයෙ, සිත්කලුවූ; ගිරිබ්බජෙ, ගිරිව්‍රජනම්වූ; රාජගහෙ, රජගහනුවර; පුරෙ, පූර්ව ජන්මයෙහි; ලොහිතපාණි, ලේ වැකුණු අත් ඇති; දරුණො, දරුණුවූ; මිගලුද්දෙආසිං, මුවවැද්දෙක් වීමි.

99. තද, එකල්හි; අතිදරුණො, ඉතා දරුණුවූ; පරහිංසාය රතො, පරපීඩාවෙහි ඇලුණාවූ; අසඤ්ඤතො, නොහික්මුණාවූ (මම); අවිරොධ කරෙසු, (කිසිවෙකු සමග) විරුඩයක් නො කරන්නාවූ; පාණිසු, ප්‍රාණිසඞ්ඛ්‍යාත; පුථුසත්තෙසු, (මෘගශශකාදී) බොහෝ සත්වයන් කෙරෙහි; පදුට්ඨමානසෙ, ප්‍රදූෂිත සිත් ඇතිව; විචරිං, හැසුරුණෙමි.

100. තස්සමෙ, ඒ මට; සුහදයො, යහපත් සිත් ඇති; සඩ්ඪො, ශ්‍රද්ධාවත්වූ; උපාසකො, උපාසකයෙක් තෙම; සහායො ආති, මිත්‍රයෙක්විය; සොව, හෙතෙමේද; අනුකම්පන්තො, අනුකම්පා කරමින්; පුනප්පුනං, නැවත නැවත; මං, මා; නිවාරෙසි, (පවින්) වැළැක්විය.

101. තාත, සහෝදරය; පාපකං කම්මං, ලාමක අකුශල කර්මය; මා අකාසි, නොකරව; දුග්ගතිං, දුගතියට; මාඅගා, නොයව; පෙච්ච, පරලොවදී; සුඛං, සැපය; සචෙ ඉච්ඡසි, ඉදින් කැමති නම්; අසංයමා, අසංවරවූ; පාණවධා, ප්‍රාණඝාත අකුසලයෙන්; විරම; වෙන්වෙව.

102. සුඛකාමස්ස, සැපකැමතිවූ; හිතානුකම්පිනො, හිත අනුකම්පා ඇති; තස්ස, ඔහුගේ; වචනං, වචනය; සුත්වා, අසා; විරපාපාහිරතො, බොහෝකල් පවෙහි ඇලුණාවූ; අබුද්ධිමා, නුවණ නැත්තාවූ, අහං, මම; සකලානුසාසනිං, සියලු අනුඅනුශාසනාව; න අකාසිං, නොකෙළමි.

103. භූරිසුමෙධසො, බොහෝවූ යහපත් නුවණැති, සො, ඒ උපාසක තෙම; පුන, නැවත; අනුකම්පාය, දයාවෙන්; මං, මා; සංයමෙ, සුචරිතයෙහි; නිවෙසයි. පිහිටවිය; සචෙ, ඉදින්;

Non-commercial distribution

දිවා, දවල්කාලයෙහි; පාණිනො, සත්වයන්; හනසි, නසන්නෙහි නම්; අථ, යළි; රත්තිං, රාත්‍රියෙහි; තෙ, තාගේ; සඤ්ඤමො භවතු, සංවරය ඇතිවේවා.

104. සො අහං, ඒ මම; දිවා, දවල්කාලයෙහි; පාණිනො, සත්වයන්; හනිත්ව, නසා; රත්තිං, රැකාලයෙහි; විරතො, (සත්වඝාතනයෙන්) වෙන්වූයේ; සඤ්ඤතො ආසිං, සංවර ඇත්තෙක්වීමි; අහං, මම; රත්තා, රාත්‍රියෙහි; පරිවාරෙමි, (දිව සැපතෙහි) ඉඳුරන් හසුරුවමි (නොහොත්) දෙවිසැප විඳිමි; දිවා, දවල්කාලයෙහි; දුග්ගතො, දුකට පත්වූයේ, ඛජ්ජාමි, දුක් විඳිමි.

105. තස්ස කුසලස්ස කම්මස්ස, ඒ කුශලකර්මයාගේ; (විපාකයෙන්); රත්තිං, රාත්‍රියෙහි; අමානුසිං, දිව්‍යසැප; අනුභොමි, වළඳමි; දිවා, දවල්කාලයෙහි; පටිහතා ඉව, ප්‍රතිහතයින් ඇත්තවුන් මෙන් (නොහොත්) බඩවෙර ඇත්තවුන්සේ; කුක්කුරා, සුනඛයෝ; සමන්තා, හාත්පසින්; ඛාදිතුං, කෑමට; උපධාවන්ති; දිවඵත්.

106. යෙවතෙ, යම් ඒ පුරුෂයෝ වනාහි; සුගතස්සසාස, නෙ, තථාගත ශාසනයෙහි; ධුවං, ස්ථිර වශයෙන් (නොහොත්) දැඩිසේ; පයුත්තා, (අධිශීලාදියෙහි) යෙදුණාහු; සතතං, නිතර; අනුයොගිනො, අනුයොගවත්වූවෝ වෙත්ද; තෙ, ඒ පින්වත්හු; කෙවලං, හුදෙක්; අසඞ්ඛතංපදං, (ලෞකික සැපය හා අසම්මිශ්‍ර) අසංඛෘත පදනම්වූ; අමතං එව, නිර්වාණයටම; අධිගච්ඡන්ති ඉති, පැමිණෙත්යයි; මඤ්ඤමි, සිතමි.

ස්වාමීනි, මම පූර්වජාතියෙහි රම්‍යවූ සිත් ඇලවිය යුතුවූ ගිරි ව්‍රජනම් රජගහනුවර වැසියෙක්වූ නිතම සත්ව ඝාතනයෙන් ලේ වැකුණු අත් ඇති දරුණුවූ මුවවැද්දෙක් වීමි. එකල්හි ඉතා දරුණුවූ පරහිංසා කරණයෙහි ඇලුණාවූ නොහික්මුණාවූ මම කිසිවෙකු සමග විරුඩයක් නොකරන මෘගශශකාදී බොහෝ සත්වයන් කෙරෙහි දුෂ්ටවූ සිත් ඇතිව හැසුරුණෙමි. එසේවූ මට යහපත් සිත් ඇති ශ්‍රද්ධාවත් උපාසකයෙක් තෙම මිත්‍ර වූයේය. ඒ උපාසකතෙමේද මට අනුකම්පා කරමින් සහෝදරය ඉදින් නුඹ පරලොව සැප කැමති නම් අසංවරවූ දුශ්ශීල්‍යවූ ප්‍රාණඝාත යෙන් වලකුව ලාමකවූ අකුශලකර්ම නොකරව, අකුසල්කොට

Non-commercial distribution

දුගතියට නොයවයි කියා නැවත නැවතත් අවවාද කරමින් පවින් වැලක්විය. සැප කැමතිවූ හිතවැඩ කැමතිවූ ඒ උපාසකයාගේ කීම අසා බොහෝකල් පවෙහි ඇලුණාවූ අඥානවූ මම සියලු අනුශාසනාව හෙවත් සියලු කල්හි සතුන් මැරීමෙන් වැලකීමට කළ අවවාදය නොකෙළෙමි. මහත් ප්‍රඥවත් ඒ උපාසකතෙම නැවත මට අනුකම්පාවෙන් ඉදින් දවල්කාලයෙහි සතුන් මැරීම අත්හැරිය නොහැකි නම් රාත්‍රිකාලයෙහිවත් සතුන් නොමරා සංවර ඇත්තෙක් වේවයි කියා මා සුචරිතයෙහි යෙදවිය. ඒ මම දහවල් සතුන් මරා රෑ සතුන් මැරීමෙන් වැලකී සංවර ඇත්තෙක් වූයෙමි. (ඒ වැද්ද වනාහි සත්ව ඝාතනය පිණිස හුල්මල සෑදීම් ආදියෙන් රාත්‍රිකාලයෙහිද සත්ව හිංසාවෙහි යෙදුණේ විය.) මම රාත්‍රියෙහි දිව්‍ය ස්ත්‍රී පුරුෂයන් විසින් පිරිවරන ලදුව සැපවිඳිමි, දවල්කාලයෙහි මහත් දුකට පත්වූයේ සුනඛයන් විසින් කනු ලබමින් දුක්විඳිමි. රාත්‍රි ප්‍රාණඝාතයෙන් වැලකුණ ඒ කුශලකර්මයාගේ විපාකයෙන් රාත්‍රියෙහි දිවසැප විඳිමි. (ඔහු විසින් දවල් කාලයෙහි වනාහි සුනඛයන් ලවා මුවන් කවා නසනලද බැවින් කර්මය සමානවූ විපාකය ඇතිවිය) එහෙයින් දහවල් කාලයෙහි බඩක්‍රෝධ ඇත්ත වුන් මෙන් ඉතාම බියඵලවන මහත් මහත් සුනඛයෝ දුව අවුත් භාත්පසින් මාගේ ශරීරය කා ඇට සැකිල්ල පමණක් ඉතිරි කරත්, (රෑ වූවිට ඒ ශරීරය ප්‍රකෘතිමත්වී දිවසැප විඳියි.) මම නම් රාත්‍රියේ පමණක් ප්‍රාණඝාතයෙන් වැලකුණේ මෙබඳු සම්පත් විඳිමු, යම් ඒ පුරුෂ කෙනෙක් වනාහි තථාගත ශාසනයෙහි අධිශීලාදියෙහි නිතර දැඩිසේ යෙදෙන්නාහු වෙත්ද ඒ පුණ්‍යවත් ජනයෝ හුදෙක් ලෞකික සැපය හා අසම්මිශ්‍රවූ අසංස්කෘත පද යයි ලද නම් ඇති නිර්වාණයටම පැමිණෙත්යයි සිතමි. ඒ පින්වතුන්ට ඒ නිවනට පැමිණීමෙහිදු කිසි බාධාවක් නැතැයි කීයේය.

මෙසේ ඒ ප්‍රේතයා විසින් කී කල්හි තෙරණුවෝ එපවත් බුදුන්ට සැලකළෝය. ශාස්තෘන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට පැමිණි පිරිසට ධර්මදේශනා කළසේක. අනිත් සියල්ල කියනලද පරිදිමැයි.

(කෙම කථාවෙන් හා මීට අනාතුරු කථාවෙනුත් කල්‍යාණ මිත්‍රයන්ගේ යහපත් අවවාද මුළුමනින් පිළිනොපැදීමෙන්

Non-commercial distribution

ලැබෙන දරුණු දුක් විපාක හා එය ස්වල්පයක්වත් පිළිපැදීමෙන් ලැබෙන සැපවිපාකත් අවබොධ කරගන තමතමන්ට හිතවැඩ කැමැති හැමදෙනම කල්‍යාණ මිත්‍රයන්ගේ අවවාදයට නැමී තදනුකූලව පිළිපැදීමෙන් ස්වර්ගමොක්ෂ සම්පත් ප්‍රතිලාභයට වියහැවඩනු.)

මේ ප්‍රේතවස්තු දෙශනායෙහි චූලවර්ගයට ඇතුළත් සත්වන මිගලුද්දක ප්‍රේතවස්තු වර්ණනාව නිමාවනලදී.

---

3. 8. කථාව

තවද මේ ප්‍රේතවස්තු දෙශනායෙහි චූලවර්ගයෙහි අටවෙනි **විතීය මිගලුද්දක ප්‍රේතවස්තුව** කවරහයත්?

සකල සත්ව කරුණාභරිත භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවාසය කර වදරන කල්හී තවත් මුවවැදි ප්‍රේතයෙකු අරභයා මේ වස්තුව දෙශනා කළ සේක. රජගහනුවර වනාහි මුවන් මරා ජීවත්වන එක්තරා මාණවකයෙක් තෙම වස්තු සම්පත් ඇති නමුදු භොග සැප හැර දමා රෑ දවල් දෙක්හි මුවන් මරමින් හැසිරෙයි. ඔහුගේ යහළුවූ එක් උපාසකයෙක් තෙම කරුණාව නිසා කියන්නේ'' යහළුව නුඹට දීඝීකාලයක් මුළුල්ලේ අහිත පිණිස දුක් පිණිස පවත්නාවූ සතුන් මැරීම් අකුසලයෙන් වැලකෙවයි කියා අවවාද කෙළේය. ඒ වැදිතෙම ඒ අවවාදය පිළිනොගත්තේය. පසුව ඒ උපාසක තෙමේ තමන් සිත්හි ඇදී පවත්නාවූ එක්තරා රහත් තෙරුන් වහන්සේ කෙනෙකුට යාච්ඤා කරන්නේ ස්වාමීනි ඒ පුරුෂතෙම යම්සේ සත්ව ඝාතනයෙන් වලකින්නේ වේද එබඳු ධර්මයක් දෙශනා කරනු මැනව''යි යාච්ඤා කළේය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ තෙරුන් වහන්සේ රජගහනුවර පිඹුපිණිස හැසි රෙමින් ඔහුගේ ගෙදොර වැඩසිටියේක. උන්වහන්සේ දැක ඒ වැදිතෙම හටගත් බුහුමන් ඇතිව ඉදිරියට ගොස් ගෙට වැඩමවා ගනවිත් අස්නක් පණවා දුන්නේය. තෙරණුවෝ පැණෙවී අස්නෙහි වැඩහුන්හ. වැදිතෙමේද තෙරණුවන් වෙත එළඹ හිඳගත්තේය. තෙරුන් වහන්සේ ඕහට සතුන් මැරීමෙහි වැරැද්ද කියාදී පසුව ඒ සතුන් මැරීමෙන් වැලකී සිටීමේ අනුසස්ද වදළසේක. හෙතෙම එය අසා ඒ සත්ව ඝාතනයෙන්

Non-commercial distribution

වලකින්ට නොකමැති විය. එකල්හි තෙරුන් වහන්සේ ඔහුට කියන්නාහු ඇවැත්නි ඉදින් නුඹ සවිප්‍රකාරයෙන් ප්‍රාණඝාත යෙන් වලකින්ට නොහැක්කෙහි නම් රාත්‍රියෙහි ප්‍රාණඝාතයෙන් වලකුව''යි වදළහ. හෙතෙම ''ස්වාමීනි මැනව, රෑ සතුන් මැරීමෙන් වැලකෙමි''යි කියා ඉන්පසු රෑ කාලයෙහි සත්ව ඝාතනයෙන් වැලකුණේය. සෙස්ස අනතුරු (මිගලුද්දක) ප්‍රෙතවස්තුව සමානවේ.

107. කූටාගාරෙ ච පාසාදෙ-පල්ලඞ්කෙ ගොණකත්ථතෙ,
පඤ්චඞ්ගිකෙන තූරියෙන-රමසි සුප්පවාදිතෙ.

108. තතො රත්‍යා ව්‍යවසානෙ-සූරියස්සුග්ග මනම්පති,
අපවිඩො සුසානස්මිං-බහුදුක්ඛං නිගච්ඡසි.

109. *කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-ඉදං දුක්ඛං නිගච්ඡසි-ති.

107. කූටාගාරෙව, දිව්‍යමය කූටාගාරයෙහි හා; පාසාදෙ, පහයෙහිද; ගොණකත්ථතෙ, දික්ලොම් ඇති කොදුපලස් අතුරන ලද්දවූ; පල්ලඞ්කයෙහි; පඤ්චඞ්ගිකෙන තූරියෙන්, පඤ්චාඞ්ගික තූර්‍යනාදයන්. විසින්; සුප්පවාදිතෙ, මනාව වාදනය කරන කල්හි; රමසි, සිත් අලවන්නෙහිය.

108. තතො, ඉන්පසු; රත්‍යා, රාත්‍රිය; ව්‍යවසානෙ, අවසන්වූ කල්හි; සූරියස්සඋග්ගමනම්පති, සූර්‍යයා උදවූ කල්හි; සුසානස්මිං, සොහොනෙහි; අපවිඩො, බහාලන ලදුව; බහු දුක්ඛං, බොහෝ දුකට නිගච්ඡසි, පැමිණෙහිය.

දිව්‍යමය කූටාගාරයෙහි හා ප්‍රාසදයෙහිත් දික්ලොම් ඇති කොදුපලස් අතුරනලද පර්‍යඞ්කයෙහි පඤ්චාඞ්ගික තූර්‍යනාද යන් මනාව පවත්වන කල්හි ඇලී රැකාලයෙහි දිවසැප විඳියි. ඉන් පසු රාත්‍රිය ඉක්මී සූර්‍යෝදය පැමිණි කාලයෙහි සොහොනෙහි ද මන ලදුව බොහෝ දුක්විඳියි. නුඹ විසින් කයින් වචසින් මනසින් කවර අකුශලයක් පෙර කරන ලද්දේද, කවර අකුශල කර්‍මයක් හුගේ විපාකයකින් දහවල් මෙබඳු දුකකට පැමිණෙහිදැයි කියා ගාථා තුනකින් නාරද ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතයාගෙන් විවාළහ. එකල්හි උන්වහන්සේට ප්‍රෙතතෙම මෙසේ කීයේය:-

Non-commercial distribution

110. අහං රාජගහෙ රම්මෙ-රමණීයෙ ගිරිබ්බජෙ,
මිගලුද්දෙ පුරෙ ආසිං-ලුද්දෙ චාසිං අසඤ්ඤතො.

111. තස්ස මෙ සහායො සුහදයො-සද්ධො ආසි උපාසකො,
තස්ස කුලූපකො භික්ඛු-ආසි ගොතම සාවකො.

112. සොපි මං අනුකම්පන්තො-නිවාරෙසි පුනප්පුනං,
මාකාසි පාපකං කම්මං-මා තාත දුග්ගතිං අගා.

113. සචෙ ඉච්ඡසි පෙච්ච සුඛං-විරම පාණවධා අසංයමා,
තස්සාහං වචනං සුත්වා-සුඛකාමස්ස හිතානුකම්පිනො.

114. නාකාසිං සකලානුසාසනිං-චිරපාපාභිරතො අබුද්ධිමා,
සොමංපුනහුරිසුමෙධසො-අනුකම්පාය සංයමො නිවෙසයි.

115. සචෙ දිවාහනසි පාණිනො
අථ තෙ රත්තිං භවතු සංයතො,
ස්වාහං දිවාහනිත්ව පාණිනො
විරතො රත්තිමහොසිං සංයමො

116. රත්තාහං පරිවාරෙමි-දිවා බජ්ජාමි දුග්ගතො
තස්ස කම්මස්ස කුසලස්ස-අනුභොමි රත්තිං අමානුසිං
දිවා පටිහතාව කුක්කුරා-උපධාවන්ති සමන්තා බාදිතුං.

117. යෙ ච තෙ සතතානුයොගිනො
ධුවයුත්තා සුගතස්ස සාසනෙ,
මඤ්ඤාමි තෙ අමතමෙව කෙවලං
අධිගච්ඡන්ති පදං අසඩ්ඛත-න්ති.

110. ලුද්දෙ, රෞද්‍රවූ; අසඤ්ඤතොව ආසිං, අසංවර (නොහික්මුණ) ඇත්තෙක්වීමි-

111. ගොතම සාවකො, ගෞතම ශ්‍රාවකවූ; භික්ඛු, භික්ෂූ වක් තෙම; තස්ස, ඕහට; කුලූපකො ආසි, කුලූපගවිය; (සෙසු සියල්ල යටකී පරිදියි)

මම පෙර රම්‍යවූ රජගහනුවර නොහික්මී රෞද්‍රකම් ඇති සතුන්මරන මුවවැද්දෙක් වීමි. ඒමට යහපත් සිත් ඇති සැදැහැවත් උපාසකයෙක් යහළුවිය. ඒ උපාසකයාගේ කුලයට එළඹෙන ගෞතම ශ්‍රාවකවූ රහත් භික්ෂු නමක් විය. ඒ රහතන් වහන්සේද දරුව ලාමකවූ ප්‍රාණඝාත අකුශල කර්මය නොකරව, දුගතියට නොයවයි කියා අනුකම්පා කරමින් නැවත නැවතත්

Non-commercial distribution

මා පවින් වැලැක්වූහ. ඉදින් පරලොවදී සැපවිඳිනු කැමතිනම් ප්‍රාණඝාතයෙන් වලකිනු, සැපකැමතිවූ හිතානුකම්පාවත්වූ උන් වහන්සේ ගේ අවවාදය අසා බොහෝකල් පවෙහි ඇලුණාවූ අඥානවූ මම සියලු කල්හි සතුන් මැරීමෙන් වැලකීමට කළ අවවාදය නොකෙළෙමි, මහත් ප්‍රඥාවත්වූ ඒ රහතන් වහන්සේ දයාවෙන් ඉදින් දවල් කාලයෙහි සතුන් මැරීමෙන් වැලකිය නොහැකි නම් රාත්‍රියෙහිවත් සත්වඝාතනයෙන් වලකීවයි කියා නැවත මා රැ සුවරිතයෙහි පිහිටවූහ, ඒ මම දවල් සතුන්මරා රැ සතුන් මැරීමෙන් වැලකුණේවෙමි. මම රාත්‍රියෙහි දිව්‍ය ස්ත්‍රී පුරුෂයන් විසින් පිරිවරන ලදුව දැන් දිවසැප විඳිමි, දවල් කාල යෙහි මහත් දුකට පත්වූ මම සුනඛයන් විසින් කනු ලබමින් මහත් දුක්විඳිමි, රාත්‍රි ප්‍රාණඝාතයෙන් වැලකුණු ඒ කුශලකර්මයා ගේ විපාකයෙන් රැවූ විට දිවසැප විඳිමි, දවල් දවස බඩවෙර ඇත්තවුන්මෙන් ඉතා බියකරු මහත් සුනඛයෝ දුව අවුත් හාත්පසින් මාගේ ශරීරය කා ඇටසැකිල්ල පමණක් ඉතිරි කරත්.

යම් පුරුෂ කෙනෙක් වනාහි තථාගත ශාසනයෙහි අධිශීලා දියෙහි නිතර දැඩිසේ යෙදෙන්නාහුද ඒ පින්වත් ජනයෝ හුදෙක් ලෞකික සැප හා අසම්මිශ්‍රවූ අසංස්කෘත පදයයි ලද නම් ඇති නිවනටම පැමිණෙත්යයි සිතමි. ඒ පින්වතුන්ට නිවන් පැමිණීමෙහිදු කිසි බාධාවක් නැතැයි කීයේය.

මේ ප්‍රෙතවස්තු දේශනායෙහි චූලවර්ගයට ඇතුළත් අටවෙනි දුතිය මිගලුද්දක ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

---

3. 9 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයෙහි නවවෙනි කූටවිනිශ්චයික ප්‍රෙතවස්තුව කවරහයත්.

සකල සත්වකරුණා නිධානවූ ශාස්තෘවූ බුදුරජාණන්-වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසයකර වදරන කල්හි කූටවිනිශ්චයික ප්‍රෙතයෙකු අරබයා මේ වස්තුව දෙශනා කළ-සේක. එකල්හි බිම්බිසර මහරජතෙම මසකට සදිනක් පෙහෙවස් සමාදන්වෙයි. ඒ රජුට අනුව පවත්නාවූ බොහෝ මනුෂ්‍ය-

Non-commercial distribution

යෝද පෙහෙවස් සමා දන් වෙත්. රජතෙම තමන් ලඟට පැමිණි පැමිණි මිනිසුන් ගෙන් ''කිමෙක්ද තොප විසින් පෙහෙවස් සමාදන්වන ලද්දේද නොහොත් සමාදන් නොවන ලද්දේදැ''යි කියා විචාරයි. ඒ මිනිසුන් අතුරෙන් කේලාම් කියන කෙරාටිකවූ අල්ලස් ගන්නාවූ දරුණුක්‍රියා ඇති අධිකරණයෙහි නියුක්ත එක්පුරුෂයක් තෙම ''පෙහෙවස් සමාදන් නොවූයෙමි''යි කියන්ට බියවෙමින් ''දෙවයන් වහන්ස සමාදන්වූයේ වෙමිය''යි කීයේය. ඉක්බිත්තෙන් රජ සමීපයෙන් බැහැරගිය ඔහුගෙන් ''යහළුව කිම අද තොප විසින් පෙහෙවස් සමාදන්වන ලද්දේදැ''යි කියා යහළුවෙක් විචාළේය. ''යහළුව මම බියෙන් රජු ඉදිරියේදී මෙසේ කීවෙමි. මම පෙහෙවස් සමාදන් නුවූවෙමි''යි කියා කීයේය. එකල්හි යහළු තෙම ඔහුට කියන්නේ ''ඉදින් එසේවීනම් නුඹට අද අර්ථපෞෂථය වේවා, පෞෂථාඞ්ගයන් සමාදන් වෙව''යි කීයේය. එතෙම ඔහුගේ කීම මැනවැයි පිළිගෙන ගෙට ගොස් ආහාර නොකාම මුවසෝදා ගන උපොසථ සීලය ඉටා රාත්‍රි වාසයට පැමිණියේ ආහාරයෙන් හිස්වූ කුස හටගත් බලවත් වාතය හෙතුකොට හටගත් ශූලරොගයකින් සිඳිනලද ආයුසංස්කාර ඇතිව මරණයට අනතුරුව පර්වත ගුහාවෙක විමාන ප්‍රෙතයෙක්ව උපන. හෙතෙම වනාහි එක් රැයක් අඩපෙහෙවස් රැකි පමණින් දෙව් විමනක් හා දෙවඟනන් දසදහසක් පිරිවරකොට ඇති මහත් දෙව්සැපද ලැබුවේය. කුටවිනිශ්චය කළ අකුශලයෙන් හා පෙශුන්‍යවචන කී අකුශලයෙනුත් තමාගේ පිටමස් තෙමේම කඩාකයි. ඒ ප්‍රෙතයා ආයුෂ්මත් නාරද තෙරුන්වහන්සේ ගිජ්ඣකූළු පව්වෙන් බසිමින් දැක:-

118. මාලී කිරීටී කෙයූරී-ගත්තා තෙ චන්දනුස්සද,
පසන්නමුඛවණ්ණොසි-සුරියවණ්ණොව සොභසි,

119. අමානුසා පාරිසජ්ජා-යෙ තෙමෙ පරවාරකා,
දසකඤ්ඤා සහස්සානි-යා තෙමා පරිවාරිකා.

120. කාකම්බුකෙයූරධරා-කඤ්චනා වෙලහූසිතා,
මහානුභාවොසි තුවං-ලොමහංසනරූපවා
පිටයීමංසානි අත්තනෝ-සාමං උක්කඩය ඛාදසි.

121. කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-පිටයීමංසානි අත්තනෝ.
සාමං උක්කඩය ඛාදසි?

Non-commercial distribution

118. මාලී, දිවමල් දරන්නාවූ; කිරීටී, හිස්වෙළුම් ඇති; කෙයූරී, බාහුවළලූ ඇත්තෙහිය; තෙ, තාගේ; ගත්තා, ගාත්‍රයෝ; චන්ද නුස්සද, සඳුන්රස ගල්වන ලද්දහ. පසන්නමුඛවණ්ණෝ–ආසි, පහන්මුවවන් ඇත්තෙහිය; සුරියවණ්ණෝ එව, ළහිරු සමපැහැ ඇතිවම; සොභසි, බබලයි.

119. තෙ, යුෂ්මතාගේ; පරිචාරිකා, අත්පා මෙහෙකරන්නාවූ; අමානුසා, දෙව්වූ; යෙඉමෙ පාරිසජ්ජා, යම් මේ පිරිසෙහි වූවෝ වෙත්ද; තෙ, නුඹගේ; යාඉමා පරිචාරිකා, යම් මේ පරිචාරිකාවූ; දසකඤ්ඤා සහස්සානි, දසදහසක් දෙවඟනෝ වෙත්ද; ඔවුහු–

120. කාකම්බු, සක්වළලූහා; කෙයූරධරා, අඟපළඳනා දරන්නාහ; කඤ්චනාවෙල භූසිතා, රුවන් මුදුන්මල්කඩින් සැරසුණාහ; තුවං, නුඹ; ලොමහංසන රූපවා, ලොමුදැහැගැනුම් ස්වභාවඇති; මහානුභාවොා අසි, මහත් ආනුභාව ඇත්තෙහිය; අත්තනෝ, තමා ගේ; පිට්ඨිමංසානි, පිටමස්; සාමං, තෙමේම; උක්කට්ඨ, කඩා ගෙන; ඛාදසි, කන්නෙහිය.

121. කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද; මනසා, සිතින්ද; කින්නුදුක්කටං; කිනම් දුශ්චරිතයක්; කතං, කරනලදද; කිස්සකම්මවිපාකෙන, කිනම් අකුශල කර්මයක්හුගේ විපාකහෙතුවකින්; අත්තනෝ, තමාගේ; පිට්ඨිමංසානි, පිටමස්; සාමං, තෙමේම; උක්කට්ඨ, කඩාගෙන; ඛාදසි, කන්නෙහිද.

එම්බා දිව්‍යපුත්‍රය, නුඹ දිව්‍යමය පුෂ්පයෙන් සැරසුණේය, හිස් වෙළුමෙන් යුක්තය, අත්වළලූ ආදි හස්තාභරණයෙන් ප්‍රතිමණ්ඩිතය, නුඹේ ශරීරාවයවයෝ සඳුන් කල්ක ගල්වන ලදහ. නුඹගේ ප්‍රසන්නමුඛ වණ්ණයතෙම තරුණ හිරු සමානව බබලයි. තොපගේ අත්පා මෙහෙකරන යම් උපස්ථායක පිරිසක් වෙද්ද ඒ දෙව් පිරිස වන්නීය. නුඹගේ යම් මේ පරිචාරිකාවූ දසදහසක් දෙවඟනෝ වෙද්ද, ඔවුහු සක්වළලූ හා බාහා භරණයන්ගෙන් සැරසුණාහු රුවන් මුදුන් මල්කඩින් අලඬකෘතයෝ වෙති. දුටුවන් ලොමුදැහැගැන්ම උපදනා ස්වභාව ඇති නුඹ මහත් ආනුභාව ඇත්තෙහිය, එසේ නමුදු කමාගේ පිටමස් තමාම කඩාගෙන කයි. මෙසේ සිදුවීමට තොප විසින් කාය වාඞ් මනොචාරයෙන් කවර අකුශලයක් උපර කරන

Non-commercial distribution

ලද්දේද, කවර අකුශලයක්හුගේ විපාකයක් හෙතුකොටගෙන තමාගේ පිටමස් තමාම උපුටාගෙන කන්නෙහිදැයි කියා ස්ථවිරයන් වහන්සේ සිව්ගයකින් කරුණු විවාළහ. හෙතෙමේද ගාථා සතරකින් ඒ කාරණය විසඳුවේය.

122. **අත්තනොහං අනත්ථාය – ජීවලොකෙ අවාරිසං,**
පෙසුඤ්ඤමුසාවාදෙන – නිකතීවඤ්චනාය ච.

123. **තත්ථාහං පරිසං ගන්ත්වා – සච්චකාලෙ උපට්ඨිතෙ,**
අත්ථං ධම්මං නිරාකත්වා – අධම්මමනුවත්තිසං.

124. **එවං සො ඛාදතත්තානං – යො හොති පිට්ඨිමංසිකො,**
යථාහං අජ්ජ ඛාදාමි – පිට්ඨිමංසානි අත්තනො.

125. *තයිදං තයා නාරද සාමං දිට්ඨං
අනුකම්පකා යෙ කුසලා වදෙය්‍යුං
මා පෙසුණං මා ච මුසා අභාණි
මා බොසි පිට්ඨිමංසිකො තුවන්ති.

122. අහං. මම; ජීවලොකෙ, මිනිස්ලොවදී; පෙසුඤ්ඤ මුසාවාදෙන, පෙශුන්‍යහා මෘෂාවාදයෙන්ද; නිකතීවඤ්චනායව, ශඨ භාවයෙන් හා වඤ්චාවෙන්ද; අත්තනො, තමහට; අනත්ථාය, අවැඩ පිණිස; අවාරිසං, හැසුරුණෙමි.

123. තත්ථ, එහිදී; අහං, මම; පරිසං, පිරිස්මැදට; ගන්ත්වා, ගොස්; සච්චකාලෙ, සැබෑකියන්ට යුතු කාලය; උපට්ඨිතෙ, එළඹ සිටි කල්හි. අත්ථං, (දෘෂ්ටධාර්මිකාදිභෙද) වැඩ ඇති; ධම්මං, හිතවත් කාරණය (හෙවත්) න්‍යායය; නිරාකත්වා, හැරදමා; අධම්මං, අධර්ය; අනුවත්තිසං, අනුව පැවතුණෙමි.

124. යථා, යම්සේ; අහං, මම; අජ්ජ, අද; අත්තනො, තමාගේ; පිග්ඨිමංසානි, පිටමස්; ඛාදාමි, කමිද; යො, යමෙක් තෙම; පිට්ඨිමංසිකොහොති, අනුන් පිටමස් කන්නේ හෙවත් පරාඩ්මුඛයෙහි නින්ද කරන්නේවේද; සො, හෙතෙම: එවං, මෙසේම; අත්තානං, තමා; ඛාදති, කයි.

ස්වාමීනි, මම මිනිස්ලොවදී පෙහෙසුන් බස් හා මුසවා බිණීමෙන්ද කපටිකමින් හෙවත් අනුන්ට නැතිගුණ පෙන්වා විකාර කිරීමෙන් හා වංවා කිරීමෙනුත් තමාට දෙලොවම අවැඩ

Non-commercial distribution

පිණිස හැසුරුණෙමි. එහිදි මම පිරිස් මැදට ගොස් සත්‍යය කියන්ට යුතු කාලය එළඹ සිටි කල්හි දෘෂ්ටධාර්මිකාදී භෙද ඇති හිතවත් කාරණය (න්‍යාය) හැරදමා අධර්මයට අනුව පැවතුණෙමි, හෙවත් අධර්මයෙන් නඩු විනිශ්චය කෙළෙමි. ඒ කාරණයෙන් අද දවසේ මම තමාගේ පිටමස් යම් සේ කම්ද, එසේම වෙනත් යමෙක් කේලාම් කීම් ආදි අකුසල් කළේවේද ඒ සත්ව තෙමේ මෙසේ පරලොවදී තම පිටමස් තමාම කන්නේය. පින්වත් නාරදයන් වහන්ස නුඹ වහන්සේ විසින් ඒ මේ මාගේ රූපය තෙමේම දක්නාලදී. අනුකම්පා ඇති පරහිත ප්‍රතිපත්තියෙහි දක්ෂවූ යම් බුඩාදී මහොත්තමයෝ යම් අවවාදයක් වදළාහුද එයම මමත් ඔබ වහන්සේට කියමි, පෙහෙසුන් බස් හා මුසවා නොකියනු මැනව. නුඹ වහන්සේ කේලාම් හා බොරු කියා මා සේ පිටමස් කන්නෙක් නොවනු මැනවැයි කීයේය. ඉතිරි සියල්ල යටකියනලද පරිදි වේ.

(යුක්තිධර්මය ඉක්මවා අල්ලස් ගෙන නඩුවිසඳීම් ආදි පාප ක්‍රියාවන්ගේ ඉතා දරුණු විපාක මේ ධර්මකථාවෙන් දැන ඉගෙන පව්වලින් නිතර වැලකී වසිමට වීර්‍යවඩනු.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයෙහි නවවෙනි කූටවිනිච්ඡයික ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

---

3. 10. කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයෙහි දසවෙනි ධාතුවිවරණක ප්‍රෙතවස්තුව කවරහයත්-

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කුසිනාරානුවර මල්ල රජුන්ගේ උපවර්තන නම් සල්වෙනෙහි යමක සාලවෘක්ෂයන්ගේ අතරෙහිදි පිරිනිවන්පෑ වදළ කල්හි ධාතුබෙදීමද කළ කල්හි අජාසත් රජතෙම තමා විසින් ලත් ධාතු කොටස ගෙන සත් හවුරුදු සත්මස් සත්දිනක් මුළුල්ලෙහි බුදුගුණ සිහිකරමින් මහත් පූජා පැවැත්වීය. ඒ ධාතු පූජොත්සවයෙහි අසඞ්ඛ්‍ය අප්‍රමෙයවූ මනුෂ්‍යයෝ සිත් පහදවාගෙන ස්වර්ගලොකොත් පත්තියට පැමිණියාහුය. අසූහය දහසක් පමණ මනුෂ්‍යයෝ වනාහි බොහෝකල් මුළුල්ලෙහි පුරුදුකරනලද අශ්‍රද්ධවද්භාව

Non-commercial distribution

යෙන් හා මිත්ථ්‍යා දර්‍ශනයෙනුත් පෙරළුණ සිත් ඇතිව පැහැදිය යුතු තන්හිදු තමන්ගේ සිත් දූෂිතකරගත ප්‍රෙතලොකයෙහි උපන්නෝය. ඒ රජගහනුවරම ධන සම්පත් ඇති එක්තරා කෙළෙඹියක්හුගේ බිරින්ද හා දියණිය හා යෙහෙළණියද ප්‍රසන්න සිත් ඇතිව ධාතුපූජාව කරන්නෙමුයයි කියා ගඳමල් ආදිය හැරගෙන ධාතුපූජා ස්ථානය වෙත එළඹීමට පටන්ගත්හ. ඒ කෙළෙඹිතෙම ''ඇටවලට පූජාකිරීමෙන් කවර ප්‍රයොජන ද''යි කියා ඔවුන්ට නින්දකොට ධාතුපූජාවේ නුගුණ කීයේය. ඇලා ඔහුගේ කීම බාරනොගෙන ඒ ධාතුපූජා ස්ථානයට ගොස් ධාතූන් වහන්සේලාට පූජාකොට ගෙට ආවාහු එබදු ලෙඩකින් මඩනාලදුව නොබෝ කලකින් මැරිගොස් දෙව්ලොව උපන්නාහුය. ඒ කෙළෙඹිතෙම වනාහි ක්‍රෝධයෙන් මඩනාලදුව නොබෝකලකින් කළුරියකොට ඒ පාපකර්‍මය හෙතුකොටගෙන ප්‍රෙතලොකයෙහි උපන. එකල්හි එක්දවසක් ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සත්වයන් කෙරෙහි කරුණාවෙන් යම්සේ මනුෂ්‍යයෝ ඒ ප්‍රෙතයන් හා ඒ දෙවතාවනුත් දක්නාහුද එබඳුවූ සෘද්‍ධාභිසංස්කාරයක් කළසේක. එසේ කොට වෛභාරගණයෙහි සිටියාහු ධාතුපූජාවෙහි නුගුණකී ඒ ප්‍රෙතයාගෙන් ගාථා තුනකින් පිළිවිසිසේක. ඒ ප්‍රෙතෙතම උන්වහන්සේට කරුණු ප්‍රකාශකොට කීයේය.

126. **අන්තලික්ඛස්මිං තිට්ඨන්තෝ**
දුග්ගන්ධෝ පූති වායසි,
මුඛඤ්ච තෙ කිමයෝ පූතිගන්ධං
බාදන්ති කිං කම්මමකාසි පුබ්බෙ?

127. **තතෝ සක්ථං ගහෙත්වාන-ඔක්කන්තන්ති පුනප්පුනං,**
බාරෙන පරිප්ඵොසිත්වා-ඔක්කන්තන්ති පුනප්පුනං.

128. ***කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,**
කිස්ස කම්මස්ස විපාකෙන-ඉදං දුක්ඛං නිගච්ඡසි?

126. දුග්ගන්ධෝ, දුගඳවූ (තෝ) අන්තලික්ඛස්මිං, අහසෙහි; තිට්ඨන්තෝ, සිටිනේ; පූතිවායසි, කුණුගඳ හමන්නෙහිය; තෙ, තාගේ; පූතිගන්ධං, කුණුගඳැති; මුඛංච, මුවද; කිමයෝ, කෘමීහු; බාදන්ති, කත්; පුබ්බෙ, පූර්‍වජාතියෙහි; කිං කම්මං, කිනම් අකුශල කර්‍මයක්; අකාසි, කෙළෙහිද.

Non-commercial distribution

127. තතො, එහෙයින්; සත්ථං, (තියුණු මුවහත් ඇති) ශාස්ත්‍රයක්; ගහෙත්වාන, ගෙන; පුනප්පුනං, නැවත නැවත; ඔක්කන්තන්ති, කපත්; ඛාරෙන, ක්ෂාරජලයෙන්; පරිප්ඵොසිත්වා, ඉස; පුනප්පුනං, නැවත නැවතත්: ඔක්කන්තන්ති, කපත්.

එම්බල ප්‍රෙතය කුණුගඳින් යුත් තෝ අහස සිටිමින් කුණු ගඳ හමන්නෙහිය, කුණුගඳ වැහෙන තොපගේ මුඛය සිසාරා පණුවෝ වැදි වැදී කත්. තෝ පෙර අත්බැව්හිදී කිනම් අකුශල කර්මයක් කෙළෙහිද. ඒ දුගඳ වැහෙන හෙයින් හා පණුවන් විසින් කෑයුතු බැවිනුත් තොපගේ මුඛය කර්මය විසින් මෙහෙයන ලද සත්වයෝ තියුණු මුවහත් ඇති ආයුධ හැරගෙන නැවත නැවත කපත්. කැපූ කැපූ කෙණෙහි කරදිය ඉස ඉස නැවත නැවතත් කපත්. තොප විසින් පෙර කයින් වචසින් මනසින් කවර අකුශලයක් කරන ලද්දේද? කවර අකුශල කර්ම්ක්හුගේ විපාකය හෙතුකොටගෙන මෙබඳු දුකකට තෝ පැමිණියෙහිදැයි තෙරුන් වහන්සේ ඇසූහ.

129. අහං රාජගහෙ රම්මෙ – රමණියෙ ගිරිබ්බජෙ,
ඉස්සරො ධනධඤ්ඤස්ස – සුපහූතස්ස මාරිස.

130. තස්සායං මෙ භරියා ච – ධිතා ච සුණිසා ච මෙ,
තා මාලං උප්පලඤ්චාපි – පච්චග්ඝඤ්ච විලෙපනං,
ථූපං හරන්තියො වාරෙසිං – තං පාපං පකතං මයා.

131. ඡළාසීතිසහස්සානි – මයං පච්චත්තවෙදනා,
ථූපපූජං විවණ්ණෙත්වා – පච්චාම නිරයෙ භුසං.

132. යෙ ච ඛො ථූපපූජාය-වත්තන්තෙ අරහතො මහෙ,
ආදීනවං පකාසෙන්ති-විවෙචයථ නෙ තතො.

133. ඉමා ච පස්ස ආයන්තියො-මාලාධාරී අලඞ්කතා,
මාලාවිපාකං අනුභොන්ති-සම්ද්ධා තා යසස්සිනියො.

134. තඤ්ච දිස්වාන අවිඡෙරං-අඛිහුතං ලොමහංසනං,
නමො කරොන්ති සප්පඤ්ඤා- වන්දන්ති තං මහාමුනිං.

135. සො හි නූන ඉතො ගන්ත්වා-යොනිං ලද්ධාන මානුසිං.
ථූපපූජං කරිස්සාමි -අප්පමත්තො පුනප්පුන-න්ති.

Non-commercial distribution

129. මාරිස, නිදුකාණෙනි; අහං, මම; රමිමෙ, රමණීයවූ; රමණීයෙ, සිත්කළුවූ; ගිරිබ්බජෙ, ගිරිව්‍රජ නම්වූ; රාජගහෙ, රජගහනුවර; සුපහූතස්ස, ඉතා බොහෝවූ; ධනධඤ්ඤස්ස, ධනධාන්‍යයට; ඉස්සරො, හිමියෙක් වීමි.

130. තස්සමෙ, ඒ මාගේ; අයං, මෝතොමෝ; භරියාව, (පෙර අත්බැවිහි) බිරින්දවිය; ධිතාව, (මෝතොමෝ); දියණිය විය; මෙ, මාගේ; සුණිසාව, (මෑ) යෙහෙළිය විය; තා, ඇලා; මාලං, මල්ද; උප්පලංච, උපුල්ද; පච්චග්ඝං, අලුත්වූ; විලෙපනංච, විලවුන්ද; ථූපං චෛත්‍යපූජාවට; හරන්තියො, හැරගෙන යන්නවුන්; වාරෙසිං, වැලක්වීමි; මයා, මා විසින්; තංපාපං, ඒ පාපකර්මය; පකතං, කරනලදී.

131. ඡළාසීති සහස්සානි, සයාසුදහසක් පමණවූ; මයං, අපි; ථූපපූජං, චෛත්‍යපූජාව; වීවණ්ණෙත්වා, නුගුණ කියා; පච්චත්ත වෙදනා, වෙන් වෙන වශයෙන් තමන් විඳිනු ලබන මහදුක්වෙදනා ඇතිව; භූසං, අතිශයින්; නිරයෙ, නරකය සමාන ප්‍රෙත අපායෙහි; පච්චාම, පැසෙමු (නොඉක්ම) දුක්විඳිමු.

132. අරහතො, අර්හත්වූ බුදුන්ගේ; ථූපපූජාය, චෛත්‍ය පූජාව පිළිබඳ; මහෙ, උත්සවය; වත්තන්තෙ, පවත්නා කල්හි; යෙව බො, යම්හු වනාහි; ආදීනවං, පකාසෙන්ති, දෙස් කියත්ද; නෙ, ඔවුන්; තතො. ඒ පිනෙන්; විවෙචයථ, බැහැරයයි දනිව්,

133. මාලාධාරි, දිවමල් දරන්නාවූ; අලඞ්කතා, සැරසුණාවූ; මාලාවිපාකං, පුෂ්පපූජාඵලය; අනුභොන්ති, වළඳන්නාවූ; සමිඩා, (දිව්‍යසම්පත්තියෙන්) සමෘද්ධවූ; යසස්සිනියො, පිරිවර ඇති; ආයන්තියො, (අහසින්) එන්නාවූ; තා ඉමාව, ඒ මේ (දිව්‍ය) ස්ත්‍රීන්ද; පස්ස, බලව.

134. අච්ඡෙරං, ආශ්චර්‍යවූ; අබ්භුතං, අද්භූතවූ; ලොම හංසනං, ලොමුදහගන්නාවූ; තංච, ඒ (මහත් විපාක විශෙෂය); දිස්වාන, දැක; සප්පඤ්ඤා, සප්‍රාඥයෝ; තං මහාමුනිං, ඒ මහා මුනිවූ තථාගතයන්; නමෙ රොන්ති, නමස්කාර කරත්; වන්දන්ති, වඳිත්.

135. හි, ඒ එසේමැයි; සො, ඒ මම; ඉතො ගන්ත්වා, මෙයින් (චුතව) ගොස්; මානුසිංයොනිං, මිනිසත් බව, ලඩාන, ලබාගන; අප්පමත්තො, අප්‍රමත්තව, පුනප්පුනං, නැවත නැවත; ථූපපූජං, චෛත්‍යපූජාව, කරිස්සාමි ඉති, කරන්නෙමී.

Non-commercial distribution

එකල ප්‍රෙතයා කියන්නේ නිදුකාණන් වහන්ස මම රම්‍යවූ සිත්කලුවූ ගිරිව්‍රජනම රජගහනුවර බොහෝවූ ධනධාන්‍යයට ස්වාමිවූ ආඪ්‍යවූ මහා ධනවතෙක්වීමි. දැන් දෙවිවැ අහසේ සිටින මෝතොමෝ ඒ මාගේ පෙර අත්බැවිහි භාර්‍යාවය, මෝතොමෝ දුහිතෘය, මෝතොමෝ මාගේ යෙහෙළිය, ඇලා මල් හා උපුල්ද අභිනව විලවුන්ද හැරගෙන චෛත්‍යපූජාවට යන්නියන් ධාතු පූජායෙහි නුගුණ කියමින් වැලක්වීමි, මා විසින් ඒ ධාතුපූජාවේ නුගුණකීම පවකරණලදී. මා ඇතුළු අසූසය දහසක් පමණවූ අපි ධාතුපූජාවට දෙස්යයි කියා මැරිගොස් බලවත් දුක් ඇති බැවින් නිරය හා සමානවූ ප්‍රෙතඅපායෙහි ඉපිද වෙන වෙනම තම තමා විසින් විඳිනු ලබන මහත් දුක් වෙදනා විඳිමු. අර්හත් සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ චෛත්‍යය උදෙසා පූජෝත්සවය පවත්වන කල්හි මාසේ යම්කෙනෙක් දෙස් කියත්ද, ඒ පුද්ගලයන් ඒ පිනෙන් බැහැරයයි දැනගනු මැනවි. එමෙන් ඔවුහුද මහත් පිරිහීමට පැමිණෙන්නාහුය. දිව්‍යමය මල්මාලා පැලඳ සැරසුණාවූ දිව්‍යසම්පත්තියෙන් සමෘඩවූ දෙව පිරිවර ඇතිව චෛත්‍ය උදෙසා කළ මල්පූජාවේ විපාක විඳිමින් අහසින් එන ඒ මේ දිව්‍යස්ත්‍රීන් බලනු මැනව. ස්වාමිනි කාශ්‍යපයන් වහන්ස, ඒ ඉතා සුලු පූජා කුශලයාගේ ආශ්චර්‍යාද්භූතවූ ලොමුදහැගන්නාවූ ඉතා මහත් ඒ විපාක විශෙෂය දැක සප්‍රාඥයෝ උත්තම පුණ්‍යක්ෂේත්‍රවූ ඒ සර්ඥයන් වහන්සේ නමස්කාර කෙරෙත් අභිවාදනය කෙරෙත්. ඒ එසේමැයි. ඒ මම මෙයින් ගොස් මිනිසත් බව ලබා නොපමාව නැවත නැවත චෛත්‍යපූජා කරන්නෙමැයි කලකිරුණු සිතැති ප්‍රෙතයා කීයේය. මෙසේ ප්‍රෙතයා කී කල්හී මහකසුප් තෙරණුවෝ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොටගෙන පැමිණි පිරිසට දහම් දෙසුසේක.

(කුශලකම් කරන්නවුන් එයින් වැලැක්වීමෙහි හා පූජා සත්කාරයන් පිළිබඳව නුගුණ කීමෙහිත් ඇති බරපතල කටුක විපාකත් මේ ධර්මකථාවෙන් අවබොධ කරගත යුතුයි.)

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි චූලවර්ගයෙහි දසවෙනි ධාතු විවණ්ණක ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

කථාවස්තු දශයකින් ප්‍රතිමණ්ඩිතවූ කෘතීය චූලවර්ගවස්තු වණ්ණනාව නිමියේය.

Non-commercial distribution

4, 1 වෙනි කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයේ පළමුවන **මේ අම්බසක්ඛර ප්‍රෙතවස්තුව** වෙයි. ඒ වස්තුහුගේ උත්පත්තිය කවරේදයත්.

සතරාමර ලොකශිවඩ්කරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන කල්හි මිත්ථ්‍යාදෘෂ්ටි-කවූ නාස්තිකවාදී හෙවත් කරනලද කුශලාකුශල කර්මයන්ගේ විපාක නැතැයි කියන අම්බසක්ඛර නම් ලිච්ඡවි රජක් විශාලා මහනුවර රාජ්‍යය කරවිය එසමයෙහි වනාහි විශාලාමහනුවර එක්තරා වෙළෙන්දෙකුගේ සල්පිල සමීපයෙහි මඩවලින් ගැවසුණු භූමිප්‍රදේශයක් ඇත්තේය. එතනදී බොහෝජනයෝ පැනයමින් ක්ලාන්ත වෙත්, සමහරු මඩ තැවරීමෙන් පිඩා විඳින්, එය දැක ඒ වෙළඳ තෙම ''මේ මිනිස්සු මඩ නොපාගා යෙත්වා''යි සිතා දුගඳ නැති සක්පැහැ වැනිවූ ගවහිස් ඇට ගෙන්වා මඩමතුපිට දැම්මවිය. හෙතෙම ප්‍රකෘතියෙන්ම සිල්වත් විය. ක්‍රොධනැති මොලොක් වචන ඇත්තෙක් ද විය. අනුන්ගේ ඇතිපරිදි ගුණද කියයි. හෙතෙම එක්දවසක් තම යහළුවෙකු නහන කල්හි ප්‍රමාදයකින් භූමියාට නොපෙණී ඔහු හැඳි වස්ත්‍රය ක්‍රීඩා අදහසින් ඉවත්කොට ඔහුට දුක් උපදවා පසුව වස්ත්‍රය දුන්නේය. ඔහුගේ බෑණා කෙනෙක් වනාහි අනුන්ගේ ගෙවලින් බඩු සොරකම් කොට ගෙනැවිත් ඔහුගේම කඩේ තැබුවේය. බඩුහිමියෝ බඩු සොයා ගොස් බඩු හා සමග ඔහුගේ බෑනා හා ඔහුත් අල්වාගෙන ගොස් රජහට දැක්වූවාහුය. රජතෙම ''මොහුගේ හිස කපාදමව්, මොහුගේ බෑනා වනාහි උලතබව්ය''යි කියා අණකරවිය. රාජපුරුෂයෝ එසේ කළාහුය. හෙතෙම කළුරිය කොට භූම්‍යස්ථ දෙවියන් අතර උපන. හෙතෙම ගවහිසින් හේ දණ්ඩක් කළ බැවින් සුදුපාට දිව්‍යමය මනොජව සම්පන්නවූ හෙවත් සිඳුගමන් ඇති ආජානීය අශ්ව-යෙකු ලැබුවේය. ගුණවතුන්ගේ ගුණකීම් හෙතුවෙන් ඔහුගේ ශරීරයෙන් දෙවිසුවඳ හමයි. වස්ත්‍රය සඟවා තැබූ අකුශලයෙන් නග්නවිය. හෙතෙම තමා පෙරකළ කර්මය බලමින් ඒ අනුසාරයෙන් හුලතබනලද තම බෑනා දැක කරුණාවෙන් වොදනා කරනලද සිත් ඇතිව මනොජවයෙන් යුත් අසුපිට

Non-commercial distribution

නැඟී අර්ධරාත්‍රිකාලයෙහි ඔහු හුලසිටි තැනට ගොස් නුදුරු තන්හි සිට ''පින්වත ජීවත්වෙව ජීවත්වීමම උතුම්වෙය''යි කියා දවසක් දවසක් පාසා කියයි. එකල්හිදු අම්බසක්ඛර රජතෙම උතුම් ඇත්කඳපිට නැඟී නුවර පැදකුණු කරමින් යන්නේ එක්තරා ගෙයක ජනෙල් කවුළුව හැරගන රාජසම්පත් බලමින් සිටි එක් ස්ත්‍රියක් දැක පිළිබඳසිත් ඇතිවී පසු අස්නෙහි සිටි පුරුෂයාහට කියන්නේ ''මේ ගෙය හා ස්ත්‍රියත් සිත්හි තබාගනුව''යි කියා දනුම්දී පිළිවෙළින් ගොස් රජගෙට ඇතුල් වූයේ ''සගය යව ඒ ස්ත්‍රියට ස්වාමියෙකු ඇතිබව හා සැමියකු නැතිබවත් දැන ගෙන එව''යි කියා ඒ පුරුෂයා පිටත්කර යැව්වේය. ඒ පුරුෂ තෙම එතනට ගොස් සස්වාමික බැව් දැන රජහට සැලකෙළේය.

රජතෙම ඒ ස්ත්‍රිය හැරගැනීමට උපාය සිතමින් ඇගේ ස්වාමිපුරුෂයා කැඳවා ''කොල මෙහි අවුත් මට උපස්ථාන කරව''යි කියා කීවේය. ඒ පුරුෂතෙම රාජසේවය නොකැමැති නමුදු ''රාජ තෙමේ තමාගේ වචනය නොකරන මා කෙරෙහි රාජදණ්ඩනය කරන්නේය''යි සිතා බියෙන් රාජොපස්ථානය පිළිගෙන දවසක් දවසක් පාසා රජඋවටැන් කිරීමට යයි. රජද ඔහුට ඛත් වැටුප් දෙවා කිහිප දවසක් ඉක්මගිය කල්හි උදැසනම උපස්ථානයට පැමිණි ඔහුට මෙසේ කියේය. ''සගය යව අසවල් තැන එක් පොකුණක් ඇත්තේය. ඒ පොකුණෙන් අරුණුවන්මැටි හා රතුපුල්ද හැරගෙන එව, ඉදින් අදම නාවෙහි නම් කාගේ දිවි නැතැ''යි කියේය. ඔහු ගියකල්හි දෙරටු පාලයාට මෙසේ කියේය. ''අද හිරු නොබස්නාකල්හිම සියලුම දෙරවල් වැසිය යුත්කාහුය''යි කිය. ඒ පොකුණද විසාලා මහනුවර සිට තුන් යොදුනක් මත්තෙහි පිහිටියේ වෙයි. එසේ නමුදු ඒ පුරුෂතෙම මරණ බියෙන් කැකිගෙන වාතවේගයෙන් මෙන් පෙරවරුකාලයෙහිම ඒ පොකුණ ළඟට පැමිණියේය. ඒ පොකුණද අමනුෂ්‍යයන් විසින් පරිගෘහිතයයි කියා පළමු අසනලද බැවින් හෙතෙම පොකුණට බැසීමට බියෙන් ''මේ පොකුණේ යම්කිසි උපද්‍රවයක් ඇත්තේදේහෝ''යි සිතා විල වටේ ඇවිදියි. ඒ දැක පොකුණ පාලනය කරන අමනුෂ්‍යතෙම කරුණා කරමින් මනුෂ්‍යරූපයෙන් අවුත් ''පින්වත් පුරුෂය

Non-commercial distribution

කුමක් පිණිස මෙහි ආයෙහිදැ''යි විචාළේය. එකල්හි ඒ පුරුෂතෙම ඒ අමනුෂ්‍යයාහට එපවත් කීයේය. හෙතෙම ''ඉදින් එසේවිනම් යැපෙනාතරම් මැටි හා මල්ද ගනිව''යි කියා තමන්ගේ දිව්‍යශරීරය දක්වා අතුරුදන් වූයේය. ඒ පුරුෂතෙම එපොකුණෙන් අරුණුවන් මැටි හා රතුපුල්ද හැරගෙන හිරු නොබසී කල්හිම නුවර දෙරටුවෙහි ළඟට පැමිණියේය. ඒ දැන් දෙරටුපල්තෙම ඔහු කෑගසද්දීම දෙර වැසීය. හෙතෙම දෙරවැසූ කල්හි ඇතුල්වීමට අවකාශ නොලබයින් දෙරටුව ළඟ හුලතබා සිටි පුරුෂයා දැක කියන්නේ හිරනොබැස්ස කල්හිම ආවාවූ මා කෑගසද්දීම මොවුහු දෙර වැසුවාහුය, මම කල් ඇතුවම ආවෙමි, මාගේ වරදක් නැත, නුඹවිසිනුත් මේ කරුණ දැනගනුලැබෙවා''යි කියා සාක්ෂිකාරයෙකු කෙළේය. ඒ අසා හුල සිටි පුරුෂතෙමේ මෙසේ කියේය: ''මම හුලතබන ලදුව වධයට පත්වූ මරණය ඉදිරිපිට ඇත්තෙක් වෙමි, නුඹට කෙසේ සාක්ෂිකාරයෙක් වෙම්ද, මෙතන මාගේ සමීපයට මහත් සෘධිඇති එක් ප්‍රෙතයෙක් එන්නේය, ඒ ප්‍රෙතයා සාක්ෂිකරව''යි කියේය. එවිට ''මා විසින් ඒ ප්‍රෙතයා කෙසේනම් බැලිය හැකිද''යි කියේය. ඒ පුරුෂතෙම එතනම සිටියේ මධ්‍යම යාමයෙහි එතනට පැමිණි ඒ ප්‍රෙතයා දැක ඔහු සාක්ෂිකෙළේය. උදය කාලයෙහි රජ කියන්නේ– ''තාවිසින් මගේ අණ ඉක්මවනලදී, එහෙත් තට රාජදඬුවම් කරන්නෙමිය''යි කිය, එකල්හි දෙවයන් වහන්ස මාවිසින් නුඹ වහන්සේගේ අණ නොයික්මන ලදී, හිරු අසාඬගතනුවූ කල්හිම මම මෙහි ආවෙමියි කියේය්, එකල තට ඊට සාක්ෂි කවරේදැයි කියා රජ ඇසීය. හෙතෙම කියන්නේ ඒහුල සිටිනා පුරුෂයාගේ සමීපයට එන නග්න ප්‍රෙතයා සාක්ෂියයි කියා දැක්වීය. මේ කීම අප විසින් කෙසේ ඇදහිය යුතුදැයි කියා රජ විසින් ඇසූ කල්හි ''අදරැ නුඹ වහන්සේ විසින් ඇදහිය යුතු පුරුෂයෙකු මා හා සමග එවනු මැනව''යි කීයේය. ඒ අසා රජතෙම තමාම ඒ පුරුෂයා සමග එතනට ගොස් සිටියේ ප්‍රෙතයා එතනට අවුත් ''පින්වත ජීවත්වෙව ජීවිතයම ශ්‍රේෂ්ඨය'' කියා කීකල්හි ''සෙය්‍යා නිසජ්ජා නයිමස්ස අත්ථි'' යනාදි ගාථාපසකින් ඒ ප්‍රෙතයාගෙන් කරුණු විචාළේය. මෙහි මූල තිබෙන ගාථාව ඒ ගාථාවන්ගේ සම්බන්ධය දැක්වීම පිණිස සඞ්ගීතිකාරයන් විසින් තබන ලදී.

Non-commercial distribution

1. වෙසාලි නාම නගරත්ථි වජ්ජීනං
තත්ථ අහු ලිච්ඡවී අම්බසක්ඛරෝ,
දිස්වාන පෙතං නගරස්ස බාහිරං
තත්ථෙව පුච්ඡිත්ථ තං කාරණත්ථිකෝ.

2. සෙය්‍යා නිසජ්ජා නඨිමස්ස අත්ථි
අභික්කමෝ නත්ථි පටික්කමොවා,
අසිතපීතඛායිතවත්ථභොගා
පරිවාරිකා සාපි ඉමස්ස නත්ථි.

3. යෙ ඤාතකා දිට්ඨසුතං සුහජ්ජා
අනුකම්පකා යස්ස පුබ්බෙ අහෙසුං,
දට්ඨුම්පි තෙ දනි න තං ලහන්ති
විරාධිතත්තෝ හි ජනෙන තෙන.

4. න ඔග්ගතත්තස්ස භවන්ති මිත්තා
ජහන්ති මිත්තා විකලං විදිත්වා,
අත්ථඤ්ච දිස්වා පරිවාරයන්ති
බහූ ච මිත්තා උග්ගතත්තස්ස හොන්ති.

5. නිහීනත්තෝ සබ්බභොගෙහි කිච්ඡෝ
සම්බ්භික්ඛිතෝ සම්පරිහින්නගත්තෝ,
උස්සාව බින්දුව පලිම්පමානෝ
අජ්ජ සුවෙ ජීවිතස්සුපරොධෝ.

6. එතාදිසං උත්තමකිච්ඡපත්තං
උත්කාසිතං පුච්ඡමන්දස්ස සුලෙ,
අථත්වං කෙන වණ්ණෙන වදෙසි යක්ඛ
ජීව හෝ ජීවිතමෙව සෙය්‍යා-ති.

1. වජ්ජීනං, වැදෑ රජුන්ගේ; වෙසාලී නාම, වෙසාලි නම් වූ; නගරං අත්ථි, නුවරක් ඇත්තේය; තත්ථ, එහි; අම්බසක්ඛරෝ, අම්බසක්ඛර නම්වූ; ලිච්ඡවී, රජෙක්; අහු, විය; කාරණත්ථිකෝ, කාරණය දැනගනු කැමැත්තේ; නගරස්ස බාහිරං, නුවරින් පිටත (සිටි); පෙතං, ප්‍රෙතයෙකු; දිස්වාන, දැක; තත්ථෙව, එතැනදීම; තං, ඔහු; පුච්ඡිත්ථ, විචාළේය.

2. ඉමස්ස, මොහුට; සෙය්‍යා, සයනයක්ද; නිසජ්ජා, හිඳීමක්ද; නඅත්ථි, නැත්තේය; අභික්කමෝ, ඉදිරි ගමනක්

Non-commercial distribution

හෝ; පටික්කමෙවා, පසුගමනක් හෝ; නත්ථි, නැත; අසිත-පිතඛායිතවත්ථභොගා—අසිත, ආහාරයක්ද; පිත, පිමක්ද; ඛායිත, කුඩාකෑමක්ද; වත්ථභොගා, වස්ත්‍ර පරිභොගයක්ද; පරිවාරිකා, ඉදුරන් හැසිරවීමවූ; සාපි, එයත්; ඉමස්ස, මොහුට; නත්ථි, නැත්තේය.

3. අස්ස, මොහුට; පුබ්බෙ, පෙර; අනුම්පකා, අනුකම්පා ඇත්තාවූ; යෙඤ්ඤකා, යම් ඥාතිහුද; දීඨයසුතා, දෘෂ්ටශ්‍රැතවූ; යෙසුහජ්ජා, යම් මිත්‍රයෝත්; අයෙසුං, වූවාහුද; තෙ, ඔවුහුතුමූ; ඉදනි, දැන්; තං, ඔහු; දට්ඨුම්පි, දක්නටවත්; නලහන්ති, නොලබත්; තෙනජනෙන, ඒ (ඥත්‍යාදී) ජනයා විසින්; විරාධිතත්තොහි, හැර දමන ලද ආත්මභාවය ඇත්තේමය.

4. ඔග්ගතත්තස්ස, මළඅයට; මිත්තා, මිත්‍රයෝ; අහවන්ති, නොවෙත්; මිත්තා, මිත්‍රයෝ; විකලං, වස්තුවෙකල්‍යවූ පුරුෂයා; විදිත්වා, දැන; ජහන්ති, හැරදමත්; අත්ථං, ධනය; දිස්වා, දැක; පරිවාරයන්ති, (මිත්‍රයෝ) පිරිවරත්; උග්ගතත්තස්ස, (භවසම්පත්තියෙන් උසස්බැව් ඇත්තාහට හෙවත්) සමෘඩවූවාහට; බහූවමිත්තා, බොහෝවූම මිත්‍රයෝ; හොන්ති, වෙත්.

5. සබ්බභොගෙහි, සියලු (උපභොග පරිභොග) වස්තුවෙන්; නිහිනත්තො, පිරිහිණු ස්වභාව ඇති; කිච්ඡෝ, දුප්පත්වූ; සම්මක්ඛිතො, ලෙයින් වැකුණ සිරුර ඇත්තාවූ; සම්පරිහින්නගත්තො, (ඇතුළත) පැළණ ශරීර ඇත්තේ; ලිම්පමානා, තණඅග රැඳුණා වූ; උස්සාවබින්දුඉව, පිනිබිඳමෙන්; අජ්ජ, අදහෝ; සුවෙ, හෙට හෝ; ජීවිතස්ස, ජීවිතයාගේ; උපරොධො, නිරුඬයවෙයි.

6. යක්ඛ, (පින්වත්) යක්ෂය; එතාදිසං, මෙබඳුවූ; උත්තමකිච්ඡපත්තං, ඉතාමත් දුකටපත්වූ; පුච්ඡන්දස්සසූලෙ, කොසඹහුලෙහි; උත්තාසිතං, නංවනලද්දහුට; අථ, යලි; හො, පින්වත; ජීව, ජීවත්වෙව; ජීවිතං එව, ජීවිතයම; සෙය්‍යොඉති, ශ්‍රේෂ්ඨයයි; කෙන, වණ්ණෙන, කවර කරුණකින්; ත්වං, නුඹ, වදෙසි, කියන්නෙහිද.

වජ්ජිත්ගේ වෙසාලීනම් නුවරක් ඇත්තේය, එහි අම්බසක්ඛර නම් ලිච්ඡවි රජෙක්වීය, පින්වත ජීවත්වෙව ජීවිතයම්

Non-commercial distribution

උතුමැයි කියා කියන ලද්දහුගේ තේරුම දැනගනු කැමති රජ-තෙමේ ඒ විශාලාමහනුවරින් පිටතදී ප්‍රෙතයා දැක එතනදීම ඒ ප්‍රෙතයා ගෙන් මෙසේ විචාළේය.

කොසඹහුල සිටින මොහුට පිට දිගහැර නිදීමක් හෝ ඇඳ පුටු ආදියක හිඳීමක් හෝ නැත්තේය, ඉදිරියට හෝ පස්සට යාම් ආදි ස්වල්ප ගමනකුත් මොහුට නැත, කනබොනදෑ හා කඩා කන රසවිඳින දෑ හා වස්ත්‍රපරිභොගාදි ලක්ෂණවූ ඇස්කන් ආදී ඉඳුරන් හැසිරවීමකුත් මොහුට නැත.

මොහුට පෙර අනුකම්පා කළ යම් ඥාතිවරයෝද දැකී-මෙන්ම යහළුවූද නොදැකීමෙන් යහලුවූද යම් මිත්‍රයෝත් වූවාහුද ඒඥාතිමිත්‍රයෝ දැන් ඔහු දැකීමටවත් නොලබත්. එක්ව විසීම කොයින් ලැබේද, ඒ ඥාතිමිත්‍ර ජනයා විසින් මොහු හැර-දමන ලද්දේමය.

මැරුණාහට මිත්‍රයෝ නොමැතිවෙත්, ඒ මැරුණු අයට මිත්‍රයන් විසින් කටයුතු කෘත්‍යය ඉක්මගිය හෙයිනි, මළ අය අත් හැරේවා, ජීවත්වූවත් වස්තු සම්පත් විකලවූ පුරුෂයා දැන මොහුගෙන් අපට ගතයුතු කිසිදෙයක් නැතැයි කියා මිත්‍රයෝ හැර දමත්, යමෙකුට ධනය ඇතිනම් ඔහුගේ වස්තුව බලා මිත්‍රයෝ ප්‍රිය වචන කියමින් මුහුණ බලන්නේම ඔහු පිරිවරා ගනිත්. භව සම්පත්තියෙන් උසස්වූවාහට නොයෙක් මිත්‍රයෝ ඇතිවෙත්. මෙය ලොකස්වභාවයයි.

මොහු දැනට සියලු උපභොග පරිභොග වස්තුවලින් පිරිහුණාවූ දුකටපත්වූ ලෙයින් වැකුණ ශරීරඇත්තාවූ හුල-ඇනීමෙන් ඇතුළක පැළී කැඩීගිය ශරීර ඇත්තේවෙයි. තණඅග තිබෙන පිනිබින්දුවමෙන් මේ පුරුෂයාගේ ප්‍රාණය අද හෝ හෙට නැති වෙයි. එයින් මතු මොහුගේ දිවි නොපවතියි.

යක්ෂය තෝ මෙලෙස ඉතා දුකටපත්වූ කොසඹහුල අවුණා තබනාලද මේ – පුරුෂයාට පින්වත් පුරුෂය ජීවත්වෙව, හුලතුබූ තගේ මෙහි ජීවත්වීමම මෙයින් මැරුණ ජීවිතයට වඩා සිය කොටසකින් දහස්කොටසකින් උතුමැයි කියා කවර කාරණයකින් කියයිදැයි විචාළේය. මෙසේ එරජ විසින් විචාරණ ලද්දවූ ඒ ප්‍රෙතතෙම තමන්ගේ අදහස ප්‍රකාශකරමින් මේ ගාථා සතර කීයේය,

Non-commercial distribution

7. සාලොහිතො එසො අහොසි මය්හං
අහං සරාමි පුරිමාය ජාතියා,
දිස්වා ච මෙ කාරුඤ්ඤමහොසි රාජ
මා පාපධම්මො නිරයං පතායං.

8. ඉතො චුතො ලිච්ඡවි එස පොසො
සත්තුස්සදං නිරයං සොරරූපං,
උප්පජ්ජති දුක්කතකම්මකාරී
මහාභිතාපං කටුකං භයානකං.

9. අනෙකභාගෙන ගුණෙන සෙය්‍යො
අයමෙව සූලො නිරයෙන තෙන,
මෙකන්තදුක්ඛං කටුකං භයානකං,
එකන්තතිප්පං නිරයං පතායං.

10. ඉදඤ්ච සුත්වා වචනං මමෙසො
දුක්ඛූපනීතො විජහෙය්‍ය පාණං,
තස්මා අහං සන්තිකෙ න හණාමි
මාමෙකතො ජීවිතස්සුපරොධො–ති.

7. රාජ, (පින්වත්) රජ; එසො, මේ පුරුෂතෙම; මය්හං, මාගේ; සාලොහිතො අහොසි, සහලේ නෑයෙක්විය; අහං, මම; පුරිමාය ජාතියා, පූර්වජාතිය; සරාමි, සිහිකරමි; දිස්වාච, (කාරණය) දැකම; පාපධම්මො, ලාමක ස්වභාව ඇති; අයං, මේ පුරුෂතෙම; නිරයං, නරකයෙහි; මාපති, නොවැටේවායි; මෙ, මට; කාරුඤ්ඤං අහොසි, කරුණා සිතක් විය.

8. ලිච්ඡවී, පින්වත් ලිච්ඡවීරජ; දුක්කතකම්මකාරී, පවිකම් කළාවූ; එසො පොසො, මේ පුරුෂතෙම; ඉතො චුතො, මෙයින් චුතව; සත්තුස්සදං, (පාපකාරී) ජනයන්ගෙන් උත්සන්නවූ (නොහොත්) පඤ්චවිධ බන්ධනාදි දරුණු දුක් සතකින් උත්–සන්නවූ; සොරරූපං, දරුණු ස්වභාවඇති; මහාභිතාපං, මහත් දුක් ඇති (නොහොත්) මහත් සන්තාප ඇති; කටුකං, කටුකවූ; භයානකං, බිය උපදවන්නාවූ; නිරයං, මහා නරකයෙහි; උප්–පජ්ජති, උපදී.

9. අයං, මේතෙම; එකන්තදුක්ඛං, එකාන්තයෙන්ම දුක්වූ; කටුකං, අනිටුවූ භයානකං, භයජනක වූ;එකන්තතිප්පං,

Non-commercial distribution

එකාන්තයෙ (නියති)න්ම තියුණු දුක් ඇති; නිරයං, මහානරක-යෙහි; මාපති, නොවැටෙවා; තෙනනිරයෙන, ඒ මහානිරයට වඩා; අයං, එවසූලො, මේ හුලම; අනෙකභාගෙන ගුණෙන, නොයෙක් කොටස්වූ අනුසඞින්; සෙය්‍යො, උතුම්වෙයි,

10. එසො, මෙතෙම; මම, මාගේ; ඉදංවචනං, මේ වචනය; සුත්වා, අසා; දුක්ඛූපනීතො, නිරුදුකට පමුණුවන ලද්-දෙකුසේ; පාණං, ප්‍රාණය; විජහෙය්‍ය, හැරලන්නේය; තස්මා, එහෙයින්; ජීවිතස්ස, ජීවිතයාගේ; උපරොධො, නිරොධය; මෙ, මාවිසින්; කතො, කරනලද්දේ; මා (හොතු) ඉති, නොවේවයි; අහං, මම; සන්තිකෙ, (ඔහු) සමීපයෙහිදී; නහණාමි, නොකියමි.

රජ්ජුරුවන් වහන්ස, හුලතබනලද මේ පුරුෂතෙම; සමාන ලේඇති යොනිසම්බන්ධයෙන් සම්බන්ධවූ මගේ නෑයෙක්විය, මම පෙර අත්බැව්හි කරුණු සිහිකරමි, මොහු මැරිගොස් නරක-යෙහි උපදින බැව් දැක ලාමක ස්වභාව ඇති මේ පුරුෂයා නරකයෙහි නූපදීවායි කියා මට කරුණා සිතක් ඇතිවිය. පින්වත් ලිච්ඡවී රජ්ජුරුවන් වහන්ස, අකුශල කර්මකළාවූ මේ පුරුෂතෙම මෙයින් මැරී ගොස් පව්කරන ජනයාගෙන් උස්තන්නවූ නොහොත් පස්වැදෑරුම් බැඳුම්ද මුඛයෙහි පැසීසිටි ලොහොදිය-වත්කිරීමද අඟුරුපව්තයට නංවාලීමද ලොහෝ කටාරම්හි බහලීමද අසි පත්‍රවනයට පමුණුවාලීමද වෙතරණි නරකයට පමුණුවාලීමද මහානිරයෙහි බහාලීමදැයි යනමෙකී සතින් හා පඤ්චවිධ බන්ධනාදි දරුණුදුක් කරුණු වලින්ද පිරිපවත්නාවූ ඉතා දරුණු ස්වභාව ඇති මහත් දුක් හෝ තැවීම් ඇති අනිෂ්ටවූ බිය උපදවන්නාවූ නිරයෙහි උපදින්නේය. මේ පුරුෂතෙමේ එකාන්තයෙන් දුක්වූ කටුකවූ භයජනකවූ එකාන්තයෙන්ම තියුණු දුක් ඇති අවීචි මහානරකයෙහි උපදියි. ඒ මොහු උපදින තැනවූ අවීචි මහානිරයට වඩා නොයෙක් කොටසින් ආනිසංස-යෙන් මේ හුලම ශ්‍රේෂ්ඨ වේ. මේ පුරුෂතෙම මැරිගොස් නිරයෙහි උපදියි යන මේ මාගේ කීම අසා නිරයදුකට පමුණුවන ලද්දෙකුමෙන්වී තමන්ගේ ප්‍රාණය හැරදමන්නේය, එහෙයින් මොහුගේ ජීවිත නිරොධය මා විසින් කරනලද්දේ නොවේවායි සිතා මේ වචනය මොහුගේ සමීපයෙහිදී මම නොකියමි, එසේද වුවත් ''පින්වත් පුරුෂය ජීවත්වෙව, ජීවත්වීමම උතුමැයි'' යන

Non-commercial distribution

මෙපමණක්ම මම කීවෙමියි කීයේය. මෙසේ ප්‍රෙතයා විසින් තම අදහස් ප්‍රකාශ කළකල්හි නැවත රජ තෙම ප්‍රෙතයාගේ ප්‍රවෘත්තිය විචාරීමට අවසර ඇතිකර ගනිමින් මේ ගාථාව කීයේය.

11. අඤ්ඤාතො එසො පුරිසස්ස අත්ථො
අඤ්ඤම්පි ඉච්ඡාමසෙ පුච්ඡිතුං තුවං,
ඔකාසකම්මං සචෙ නො කරොසි
පුච්ඡාමි තං න ච නො කුජ්ඣිතබ්බං.

12. අද්ධා පටිඤ්ඤා මෙ තද අහු
නා වික්ඛනා දිප්පසන්තස්ස හොති,
අකාමා සද්ධෙය්‍යවචොති කත්වා
පුච්ඡස්සු මං කාමං යථා විසය්හ-න්ති.

11. පුරිසස්ස, (මේ) පුරුෂයා පිළිබඳ; එසො අත්ථො, මේ කාරණය; අඤ්ඤතො, මාවිසින් දැනගන්නාලදී; සචෙ, ඉදින්; තුවං, තෝ; නො, අපට; ඔකාසකම්මං, අවකාශකර්මය; කරොසි, කරන්නෙහි නම්; අඤ්ඤම්පි, අනිකක්ද; පුච්ඡිතුං, විචාරන්ට; ඉච්ඡාමසෙ, කැමැත්තෙමු; තංච, එයත්; පුච්ඡාමි, විචාරමි; නො, අපට; නකුජ්ඣිතබ්බං, නොකිපියයුතුයි.

12. තද, එ (ප්‍රථම දර්ශනයෙ) හිදී; අඩා, එකාන්තයෙන්; මෙ, මාගේ; පටිඤ්ඤඅහු, ප්‍රතිඥාවවිය; අප්පසන්නස්ස, අප්‍රසන්නයාහට; නාවික්ඛනාහොති, නොකිම්වෙයි; අකාමා, (නුඹගේ) අකමැත්තෙන්; සඩෙය්‍යවචො ඉති කත්වා, ඇදහියයුතු වචන ඇත්තෙකැයි කියා; කාමං, කැමැති පරිද්දෙන්; මං, මා; පුච්ඡස්සු, විචාරව; යථා, යම්සේ; විසය්හංඉති, ඉවසියහැකිනම් (කියමි).

මේ ගාථාදෙක රජහුගේ හා ප්‍රෙතයාගේත් වචන ප්‍රතිවචනයෝ වෙති, එම්බල ප්‍රෙතය හුලසිටින පුරුෂයාගේ මේ කාරණය මාවිසින් දැන් දැනගන්නාලදී. ඉදින් නුඹ අපට අවසර දෙන්නේ නම් තවත් කරුණක් විචාරීමට කැමැත්තෙමු, ඒ කාරණයද නුඹෙන් විචාරමි, මේ මිනිස්සු යම් කිසිවක් විචාරත්යයි සිතා නොකිපියයුතු යයි රජ කීයේය. එකල්හි ප්‍රෙතතෙම කියන්නේ මහරජ දැනගැනීම වශයෙන් මගෙන් විචාරවයි කියා අවසරදීම පළමු දැකීමෙහිදී නිශ්චය විය, කරුණක් විචාළකල්හි අප්‍රසන්නයා හට කිමක් නැත්තේය, ප්‍රසන්න සිතැත්තේම

Non-commercial distribution

ප්‍රසන්නයාහට කිසිවක් කියයි. නුඹ වහන්සේ වනාහි එකල්හි මාකෙරෙහි අප්‍රසන්න වූහ. මමත් නුඹ කෙරෙහි අප්‍රසන්නවීමි, ඒ කරුණෙන් මා දැනගත කියනුකැමැත්තෙක් නොවිය, දැන් වනාහි මම නුඹගේ අකැමැත්තෙන් ඇදහියයුතු වචන ඇත්-තෙක්වීමි. ඒ කාරණයෙන් නුඹ කැමත්තක් මගෙන් විචාරව, යම්සේ මට ඉවසන්ට හැකිදෙයක්නම් එසේ ස්වකීය ඥානශක්ති ප්‍රමාණයෙන් මම කියන්නෙමියි කියේය. මෙසේ ප්‍රෙතයා විසින් කරුණු ඇසීමට අවකාශ දුන්කල් හි රජතෙම මේ ගාථාව කීයේය:-

13. යං කිඤ්චාහං චක්ඛුනා පස්සිස්සාමි
සබ්බම්පි තාහං අභිසද්දහෙය්‍යං,
දිස්වාන තං නොපි වෙ සද්දහෙය්‍යං
කරෙය්‍යාසි මෙ යක්ඛ නියස්සකම්ම න්ති.

13. යක්ඛ, යක්ෂය; අහං, මම; යංකිංචි, යම්කිසිවක්; චක්ඛුනා, ඇසින්; පස්සිස්සාමි, දක්නෙමිද; අහං, මම; තං සබ්-බම්පි, ඒ සියල්ලම; අභිසද්දහෙය්‍යං, (එසේම) අදහන්නෙමි; තං, එය; දිස්වාන, දැක, වෙ, ඉදින්; නොපිසද්දහෙය්‍යං, නොම-අදහන්නෙමිනම්; මෙ, මට; නියස්සකම්මං, නිග්‍රහකර්මය; කරෙය්‍යාසි ඉති, කරව.

එම්බා යක්ෂය, මම යම්කිසිදෙයක් ඇසින් දක්නෙමිද ඒ සියල්ලම එසේම විශ්වාස කරන්නෙමි, එය දැක ඉදින් තොපගේ වචනය මම නොඅදහන්නෙමි නම් මට නිග්‍රහකර්මය කරව නොහොත් ඇස්නැති අනිකාගේ දැක්මක් නැතිහෙයින් මම යම්කිසිදෙයක්ම ඇසින් දක්නෙමි නුඹ විසින් දුටු ඇසූ දත් සියල්ලම මම විශ්වාස කරමි. තාකෙරෙහි මගේ සුප්‍රසන්න-භාවයද එබඳුම යයි කියේය. එය අසා ප්‍රෙතතෙම කියන්නේ—

14. සච්චප්පටිඤ්ඤා තව මෙසා හොතු
සුත්වාන ධම්මං ලහස්සුප්පසාදං.
අඤ්ඤත්ථිකො නො ව පදුට්ඨචිත්තො
යං තෙ සුතං අසුතං වාපි ධම්මං
සබ්බං, ආචික්ඛිස්සං යථා පජානං.

14. තව, යුෂ්මතාගේ; එසාපටිඤ්ඤා, මේ ප්‍රතිඥතොමෝ; මෙ, මට; සච්චංහොතු, සැබෑවිවා, අඤ්ඤත්ථිකො, දැනගනු

Non-commercial distribution

කැමැත්තේ; නොවපදුට්ඨවිත්තො, ප්‍රදුෂ්ටයිත් නැත්තේ; ධම්මං, (මවිසින් කියනු ලබන) ධර්මය; සුත්වාන, අසා; සුප්පසාදං, යහපත් ප්‍රසාදය; ලභ, ලබව; තෙ, නුඹ විසින්; සුතං, අසන-ලද්දවූද; අසුතංවඅපි, නොඅසනලද්දවූද; යංධම්මං, යම් ධර්මයක් වේද; යථා, යම් සේ; පජානං, (අන්‍යයාත්) දන්නේවේද; (නොහොත්) යථාපි, යම්සේ; සුතං, (මාවිසින් දන්නාලදද;) සබ්බං, සියල්ල; ආචික්ඛිස්සං, (මම) කියන්නෙමි.

මහරජ ඔබගේ මේ ප්‍රතිඥව මට සත්‍යය වේවා, මාවිසින් කියනු ලබන ධර්මය දැනගනු කැමතිවූ නුඹ කෝපයිත් නැතිව අසා මනා පැහැදීම ලබාගනුව, නුඹ විසින් ඇසුවාවූද නොඇසුවාවූද මාවිසින් දත් යම් ධර්මයක් ඇත්නම් ඒ සියල්ල නුඹට මම කියන්නෙමියි කීයේය.

15. සෙතෙන අස්සෙන අලඞ්කතෙන
උපයාසි සූලාවුතකස්ස සන්තිකෙ
යානං ඉදං අබ්භුතං දස්සනෙය්‍යං
කිස්සෙතං කම්මස්ස අයං විපාකො?

16. වෙසාලියා තස්ස නගරස්ස මජ්ඣෙ
වික්ඛල්ලමග්ගෙ නරකං අහොසි,
ගොඝසමෙකාහං පසන්නවිත්තො
සෙතං ගහෙත්වා නරකස්මිං නික්ඛිපිං.

17. එතස්මිං පාදනි පතිට්ඨපෙත්වා
මයඤ්ච අඤ්ඤෙ ච අතික්කමිම්හ,
යානං ඉදං අබ්භුතං දස්සනෙය්‍යං
තස්සෙව කම්මස්ස අයං විපාකො.

18. වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති
ගන්ධො ච තෙ සබ්බදිසා පවායති,
යක්ඛිද්ධි පත්තොසි මහානුභාවො
නග්ගො චාසි කිස්ස අයං විපාකො?

19. අක්කොධනො නිව්වපසන්නවිත්තො
සඞ්ඝාහි වාවාහි ජනං ලපෙමි,
තස්සෙව කම්මස්ස අයං විපාකො
දිබ්බො මෙ වණ්ණො සත්තං පභාසති.

Non-commercial distribution

20. **යසඤ්ච කිත්තිඤ්ච ධම්මෙ යීතානං**
දිස්වාන මන්තෙමි පසන්නචිත්තො,
තස්සෙව කම්මස්ස අයං විපාකො
දිබ්බො මෙ ගන්ධො සත්තං පවායති.

15 අලඞ්කතෙන, අලඞ්කෘතවූ; සෙතෙන. ශ්වෙත වණ්ණවූ; අස්සෙන,, අශ්වයානාවකින්; සූලාවුතකස්ස, හුලඳන්නහුගේ; සන්තිකෙ, හමුවට; උපායාසි, පැමිණෙහිය; ඉදං යානං, මේ යහන; අබ්භුතං, අද්භුතය; දස්සනෙය්‍යං, දැකුම්කලුය; කිස්ස එතං කම්මස්ස, මේ කිනම් කර්මයක්හුගේ; අයං විපාකො, මේ විපාකයවේද.

16 වෙසාලියා, වෙසාලී නම්; තස්ස නගරස්ස, ඒනගරයාගේ; මජ්ඣෙ, මැද; චික්ඛල්ලමග්ගෙ, මඩයුත් මාර්ගයෙහි; නරකං, ආවාටය (මහවළක්); අහොසි, විය; අහං මම; පසන්නචිත්තො, පහන් සිත් ඇතිව; සෙතං, සුදුවූ; එකං ගොසීසං, එක් ගවහිසක්; ගහෙත්වා, ගෙන; නරකස්මිං, මඩවලෙහි; නික්ඛිපිං, බහාලීමි.

17 එතස්මිං. මේ මත්තෙහි; මයඤ්ච, අපිද; අඤ්ඤෙව, සෙස් සෝද; පාදනි, පාදයන්; පතිට්ඨපෙත්වා, තබා; අතික්කමිම්හ, ගමන් කෙළෙමු. (සෙස්ස කියනලද පරිදියි)

18 යක්ඛ, යක්ෂය, තෙ, තෙපගේ; වණ්ණොච, ශරීර වර්ණය ද; සබ්බදිසා, සියලු දිසාවන්; පභාසති, බබුළුවයි; තෙ, යුෂ්මතාගේ; ගන්ධොච, ශරීර ගන්ධයද; සබ්බදිසා, සියලුදිග: පවායති, හමයි; ඉඩිපත්තො, (දිව්‍ය) සෘඩියට පැමිණියේ; මහානුභාවො අසි, මහත් ආනුභාව ඇත්තෙහිය; ච, යළි; නග්ගොසි, නග්නයෙක්වෙහිය; කිස්ස, කවර කර්මයක්හුගේ; අයං විපාකො, මේ විපාකයවේද;

19 අක්කොධනො, ක්‍රොධ නැත්තාවූ; නිච්චපසන්නචිත්තො, නිති පහන්සිත් ඇතිව; සණ්හාහිවාචාහි, සිඳුටු වචනයෙන්; ජනං, ජනයා ලපෙමි, කථාකරමි: තස්සෙවකම්මස්ස, ඒ කුශලකර්මයා ගේම; අයං විපාකො, මේ විපාකයවෙයි; මේ, මාගේ; දිබ්බො, දිව්‍යමයවූ; වණ්ණො, ශරීර වර්ණය; සතතං නිතර; පභාසති, බබළයි.

Non-commercial distribution

20 පසන්නචිත්තො, පහන්සිත් ඇති (මම); ධම්මෙයී-තානං, ධර්මයෙහි පිහිටියවුන්ගේ; යසංච, එශ්වර්‍යයද; කිත්තිංච, ගුණකීර්තියද; දිස්වාන, දැක; මන්තෙමි, ගුණ කීර්ත්තනය කරමි (හෙවත්) කියමි; (සෙස්ස පෙරසේමයි)

එකල රජ විචාරන්නේ ''යක්ෂය තෝ සර්‍වාලඞ්කාරයෙන් සැරසුණාවූ සුදු අසෙකු පිටින් හුලහිදින පුරුෂයා ලඟට පැමිණියෙහිය, තොපගේ අශ්වයානාව අද්භූතය දැකුම්කළුය, මෙය ලැබුණ විපාකය කිනම් කුශලකර්මයක්හුගේදැයි ඇසිය. එවිට ප්‍රෙත තෙම කියන්නේ ''මහරජ ඒ විශාලාමහනුවර මැද මඩින්යුත් මහවළක් ඇතිවිය, මම පහන්සින් ඇතිව සුදුපාට එක් ගොන් ඔලුවක් ගෙනැවිත් මඩ නොපැගි යනසේ මඩවළේ බහාලීමි. මේ ගැ ශීඝ්‍රයෙන් කළ ඒ දණ්ඩෙහි අපිද අනික් මිනිස්-සුද පාදයන් තබා ගමන් කෙළෙමු එම කුශලයාගේ හෙතුවෙන් පුදුමවූ දැකුම් කටයුතුවූ මේ අස්‍යහන මට ලැබුණේයයි කීයේය. නැවත රජ අසන්නේ ''යක්ෂය තොපගේ ශරීරවර්ණය සියලු දිහුන් බබුළුවයි, නුඹගේ ශරීරයෙන් සියලු දිසාවන්හි සුවඳ හමයි, නුඹ මහත් ආනුභාව ඇති සෘඩියට පැමිණියේය, එසේදවුවත් නග්නවූයේය, මේ කිනම් කර්මයක්හුගේ විපාකදැ''යි ඇසිය. මහරජ මම ක්‍රොධ නැතිව නිතර පහන් සිත් ඇතිව සිලුටු වව-නවලින් ජනයාට කථාකෙළෙමි, ඒ කුශල කර්මයාගේම මේ විපාකවෙයි, එහෙයින් දිව්‍යමයවූ මාගේ ශරීරවර්ණය නිතර බබළයි ධර්මයෙහි පිහිටි සත්පුරුෂයන්ගේ යශස් ගුණකීර්ත්තිය දැක පහන්සිත් ඇතිව මම වර්ණනා කෙළෙමි, ඒ කුශල කර්මයාගේම මේ විපාකයවෙයි, එහෙයින් මාගේ ශරීරයෙන් දිව්‍යමයවූ සුවඳ නිතර නිතර හමයි.

21. සහායානං තිත්ථස්මිං නහායන්තානං
ථලෙ ගහෙත්වා නිදහිස්ස දුස්සං,
බ්‍රඞ්ඛත්ථිකො නො ච පදුට්ඨ චිත්තො
තෙනම්හි නග්ගො කසිරා ච වුත්ති.

22. යො කීළමානො පකරොති පාපං
තස්සෙදිසං කම්ම විපාකමාහු,
අකීළමානො පන යො කරොති
කිං තස්ය කම්මස්ස විපාකමාහු.

Non-commercial distribution

23. යෙ දුට්ඨසංකප්පමනා මනුස්සා
කායෙන වාචාය ච සංකිලිට්ඨා,
කායස්ස හෙද අභිසම්පරායං
අසංසයං තෙ නිරයං උපෙන්ති.

24. අපරෙ පන සුගතිං ආසමානා
දනෙ රතා ස ගනිතත්තභාවා,
කායස්ස හෙද අභිසම්පරායං
අසංසයං තෙ සුගතිං උපෙන්තී-ති.

21 ඛිඩ්ඩත්තිකා, ක්‍රීඩාව ප්‍රයොජනකොට ඇත්තේ (හෙවත්) සිනා අදහස් ඇතිව; නොවපදුට්ඨචිත්තා, ප්‍රදූෂ්ටසිත් නැතිව; තිත්ථ ස්මිං, තොටෙහි; නහායන්තානං, ජලස්නානය-කරන්නාවූ; සහායා නං, යහළුවන්ගේ; ථලෙ, ගොඩ (නිබුන); දුස්සං, වස්ත්‍රයක්; ගහෙත්වා, ගෙන; නිදහිස්සං, සැඟවීමි; නෙන, ඒ හෙතුවෙන්; නග්ගො අම්හි, නග්නවූයෙමි; කසිරාවවුන්ති, දුක් පැවැතුම්දවීය.

22. යො, යමෙක්තෙම; කීළමානො, ක්‍රීඩා අදහස් ඇතිව; පාපං, පවක්; පකරොති, කෙරේද; තස්ස, ඕහට. රීදිසං, මෙබඳුවූ; කම්මවිපාකං, කර්මවිපාකය; ආහු (පණ්ඩිතයෝ) කියත්; යොජන, යමෙක් වනාහි; අකීළමානො, ක්‍රීඩා අදහස් නැතිව (හෙවත්) ලොභාදියෙන් දූෂිත සිත් ඇතිව; කරොති, (පව්) කෙරේද; තස්ස කම්මස්ස, ඒ අකුශල කර්මයාගේ; කිංවිපාකං, කොපමන විපාකයක්; ආහු, කියත්ද.

23. යෙ මනුස්සා, යම් මනුෂ්‍යයෝ; දුට්ඨසංකප්පමනා, (කාම සංකල්පනාදි වශයෙන්) දූෂිත මනොවිතර්ක ඇත්තාහු; කායෙන, කයින්ද; වාචාය ච, වචනයෙන්ද; සංකිලිට්ඨා, කිලුටුවූවෝවෙත්ද; තෙ. ඔවුහුතුමු; කායස්සහෙද, ශරීරයාගේ බිඳීමෙන්; දභිසම්ප රායං, පරලොවදී; අසංසයං, නිසැකව; නිරයං, නරකයට; උපෙන්ති, පැමිණෙත්.

24. අපරෙපන, සමහරු වනාහි; සුගතිං සුගතිය; ආස මානා, ආශංසනය (ප්‍රාර්ථනා) කරමින්; දනෙ, දන්දීමෙහි: රතා, ඇලුණෝ; සංගහිතත්තභාවා, (ප්‍රතිකූලසංඥදි වශයෙන්) සලකන ආත්මභාව ඇත්තාහුද; තෙ, ඔවුහුතුම්; කායස්සභෙද, කයබිඳී මෙන් (පසු); අභිසම්පරායං, පරලොවදී; අසංසයං, නිසැකව; සුගතිං, සුගතියට, උපෙන්ති ඉති, පැමිණෙත්ය.

Non-commercial distribution

මම සිනා අදහස් ඇතිව නොකිපුණු සිතින් යුක්තව සොර කම් කරන අදහසක්වත් නැති කරන අදහසක්වත් නැතිව වස්ත්‍ර ගොඩතබා තොටට බැස වතුර නෑවාවූ යහළුවෙකුගේ රෙද්දක් ගෙන සඟවා තබා නැවත දුනිමි, ඒ අකුශලකර්ම හෙතුවෙන් මම දැන් විලිවැස්මක් නැතිව නග්නයෙක් වීමි, දුක් පැවතුම්ද ඇති විය. යම් පුද්ගලයෙක් තෙම කෙළි අදහසින් යුක්තව පවක් කළත් ඔහුට මෙබඳු කර්මවිපාකය පණ්ඩිතයෝ කියත්, යමෙක් තෙම ක්‍රීඩා අදහස් නැතිව ලොභාදියෙන් දූෂිත සිත්ඇතිව පවක් කෙරේද එසේකළ පව්කම්ඇති ඕහට කොපමණ කටුක දුක් විපාක පණ්ඩිතයෝ කියත්ද, යම් මනුෂ්‍යකෙනෙක් කාමසංකල්පාදි වශයෙන් දූෂිත මනොවිතර්කඇතිව මනොචාරයන් හා ප්‍රාණඝාතාදි වශයෙන් කායචාරයෙන් හා වාක්චාර-යෙනුත් කිලුටුවූවෝ වෙද්ද ඔවුහු මරණින් මතු පරලොවදී නිසැකව නරකයෙහි උපදින්නාහුය. සමහරු වනාහි සුගතිය ප්‍රාර්ථනාකර මින් දනාදි කුශලක්‍රියායෙහි ඇලී ශරීරයෙහි ආදීනව සලකන්නෝය; ඔවුහු මරණින්මතු පරලොවදී නිසැකව සුගතියට පැමි ණෙත්ය''යි කීවේය.

මෙසේ ප්‍රෙතයා විසින් සංක්ෂෙපයෙන්ම කර්ම්ඵලයන් බෙදා පෙන්නුකල්හි එය නොඅදහමින් රජතෙම මේ ගාථාව කීයේය:-

25. තං කින්ති ජානෙය්‍යං අහං අවෙච්ච
කල්‍යාණපාපස්ස අයං විපාකො,
කිං වාහං දිස්වා අභිසද්දහෙය්‍යං
කො වාපිමං සද්දහාපෙය්‍ය එත-න්ති.

25. කල්‍යාණපාපස්ස, කුශලාකුශල කර්මයාගේ; අයං-විපාකො, (නුඹ විසින්); මේ විපාකය (කියන ලදී); තං කිං ඉති, ඒ කොයිප්‍රකාරදැයි කියා; අහං, මම; අවෙච්ච, දැන; ජානෙය්‍යං, (පරප්‍රත්‍යයක් නැතිබැවින්) අදහන්නෙමිද; අහං, මම; කිංවා, කෙබන්දක් වනාහි; දිස්වා, දැක; අභිසද්දහෙය්‍යං, අදහන්නෙමිද; අපි, නැවත; කොවා, කරව පණ්ඩිතයෙක්; මං, මට එතං, මේ කරුණ; සද්දහාපෙය්‍යඉති, විශ්වාස-කරවන්නේද.

''යක්‍ෂය තොප විසින් කුශලකර්මයාගේ හා අකුශල කර්මයා ගේ යම් මේ විපාකයෙක් බෙදා කියනලද්දේද ඒ කාරණය අන්‍ය

Non-commercial distribution

හෙතුවක් නැතිබැවින් මම කෙසේ අදහාගනිමිද, මම ප්‍රත්‍යක්ෂවූ කෙබඳු නිදසුනක් දැක මෙය විශ්වාස කරමිද, කවරනම් නුවණැති පණ්ඩිත පුරුෂයෙක්තෙම මේ කරුණ මට විශ්වාසකරවන්නේද එය කියව''යි කීයේය. එය අසා ප්‍රෙතතෙම කරුණකින් එපවත් ඒ රජහට ප්‍රකාශකරමින් මේගාතාවන් කීයේය:-

26. දිස්වා ච සුත්වා අභිසද්දහස්සු
කල්‍යාණපාපස්ස අයං විපාකෝ
කල්‍යාණපාපෙ උභයෙ අසන්තෙ
සියා නු සත්තා සුගතා දුග්ගතා වා.

27. නොචෙත්ත කම්මානි කරෙය්‍යුං මච්චා
කල්‍යාණපාපානි මනුස්සලොකෙ,
නාහෙසුං සත්තා සුගතා දුග්ගතා වා
හීනප්පණීතා ච මනුස්සලොකෙ.

28. යස්මා ච කම්මානි කරොන්ති මච්චා
කල්‍යාණපාපානි මනුස්සලොකෙ,
තස්මා සත්තා සුගතා දුග්ගතාවා
හීනප්පණීතා ච මනුස්සලොකෙ.

29. වයඪ්ඣකම්මානං විපාකමාහු
සුඛස්ස දුක්ඛස්ස ච වෙදනීයං,
තා දෙවතායො පරිචාරයන්ති
පච්චෙන්ති බාලා වයතං අපස්සිනො-ති.

26. කල්‍යාණපාපස්ස, කුශලාකුශල කර්මයාගේ; අයං විපාකෝ, මේ (සුවදුක්) විපාකයයි; දිස්වාච, (ප්‍රත්‍යක්ෂයෙන්) දැකද; සුත්වා, (ධර්මය) අසාද; අභිසද්දහස්සු, අදහාගනුව; කල්‍යාණපාපෙ, කුශලාකුශල යන; උභයෙ, දෙවැදෑරුම් කර්මය; අසන්තෙ, අවිද්‍යමාන කල්හි; සත්තා, සත්වයෝ; සුගතා, සුගතියට ගියෝය; දුග්ගතාවා, දුගතියට ගියෝ හෝ (වෙකැයි යන කරුණ); සියානු, කෙසේ වන්නේද.

27. එත්ථ මනුස්සලොකෙ, මේ මිනිස්ලොවද; මච්චා, මනුෂ්‍යයෝ; කල්‍යාණපාපානි කම්මානි, කුශලාකුශල කර්මයන්; නොව කරෙය්‍යුං, නොකරන්නාහු නම්; සුගතා, සුගතියට ගියාවූ හෝ; දුග්ගතා වා, දුගතියට ගියාවූ හෝ; සත්තා,

Non-commercial distribution

සත්වයෝ; න අහෙසුං, නොවන්නාහ; මනුස්සලොකෙ. මිනිස් ලොව; හීනප්පණීතාච, හීන ප්‍රණීතයෝත් (පහත් උසස් අයත්) නඅහෙසුං, නොවන්නාහ.

28. යස්මා ච, යම්හෙයකිනුත්; මනුස්සලොකෙ, මිනිස් ලොවදී; මච්චා, මනුෂ්‍යයෝ; කල්‍යාණපාපානි කම්මානි, කුශලා කුශල කර්මයන්; කරොන්ති, කෙරෙත්ද; තස්මා, එහෙයින් (සෙස්ස පෙරසේමැයි.)

29. සුඛස්ස ච, සැපයාගේද; දුක්ඛස්ස, දුඃඛයාගේද; වෙදනීයං. විඳීමට සුදුසුවූ; කම්මානං, (සුචරිත දුශ්චරිත) කර්මයන්ගේ; වයං විපාකං, දෙවැදෑරුම් විපාකය. අජ්ජ, දැන්; ආහු, කියත්; තා දෙවතායො. ඒ දෙවියෝ; පරිවාරයන්ති, ඉදුරන් හසුරුවත්; බාලා, අඥානයෝ; තං වයං, ඒ (කර්මය කර්ම්ඵලය යන) දෙක: අපස්සිනෝ: නොදක්නාහු: පච්චෙන්ති ඉති, (නිරයාදි දුකට) පැමිණෙත්ය.

''මහරජ ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන හෝ ධර්මය අසා ඒ අනු සාරයෙන් නැවත නැවත කල්පනා කරමින් හෝ කුශලකර්මයාගේ හා අකුශල කර්මයාගේත් මේ සැප විපාකය මේ දුක් විපාකය වන්නේයයි කියා අදහාගනු මැනවි, කුශලාකුශලයයි කියා කර්ම දෙකක් නැති කල්හි මේ සත්වයෝ දුගතියට ගියාහුය, මේ සත්වයෝ ඒකාන්තයෙන් සුගතියට ගියෝය කියා හෝ දිළිඳු වූවෝය කියා හෝ යන මේ කාරණය කෙසේ වන්නේද? මේ මිනිස් ලොවදී මනුෂ්‍යයෝ කුශලාකුශල කර්මයන් නොකළාහු නම් සුගතියට ගිය සත්වයෝ හෝ දුගතියට ගිය සත්වයෝත් නැත්තාහ. මනුෂ්‍ය ලොකයෙහි කුලය රූපය නිරොගිභාවය පිරිවර යනාදි සම්පත්වලින් හීනයෝ හා උසස්වූවෝත් නැත්තාහුය. යම්හෙයකින් මිනිස්ලොවදී මනුෂ්‍යයෝ කුශලාකුශල කර්මයන් කෙරෙන්ද එහෙයින් සුගතිගාමී සත්වයන් හා දුගතිගාමී සත්වයෝත් ඇත්තාහ, මිනිස්ලොව කුලරූපාදියෙන් හීනවූ හෝ උසස්වූද මනුෂ්‍යයෝ ඇත්තාහුය. සුචරිත දුශ්චරිත කර්මයන්ගේ දෙවැදෑරුම් විපාකය දැන කියත්, ඒ කෙසේදයත්- උසස් වශයෙන් සැපවිඳියයුතුවූ විපාකයක් යම්කෙනෙක් ලබත්ද ඔවුහු දෙව්ලොව දෙවතාවෝවී දෙව්සැපෙන් යුත්තව ඉන්ද්‍රියන්

Non-commercial distribution

පිනවත්, කර්‍මය හා කර්‍මඵලයත් යන දෙක නොඅදහන්නාවූ යම් අඥානයෝ වෙද්ද, පාපයෙහි ගැළුණ ඔවුහු දුක්විඳියයුතුවූ විපාකය විඳිමිව්ෝ නිරායාදියෙහි දුකට පැමිණෙත්ය''යි කීයේය.

එකල මෙසේ කර්‍මඵල විශ්වාසකරන නුඹ වනාහි කවර හෙයකින් මෙබඳු දුක් අනුභව කෙරේදැයි කියා රජුගේ අනුයොගය සඳහා ප්‍රෙතතෙම මේ ගාථාව කීයේය;-

30. නමත්ථි කම්මානි සයං කතානි
දත්වාපි මෙ නත්ථි සො ආදිසෙය්‍ය,
අච්ඡාදනං සයනමථන්තපානං
තෙනම්හි නග්ගො කසිරා ච වුත්තී කි

30. සයං, තමා විසින්; කතානි, පෙර කරන ලද්දවූ; කම්මානි, (කුශල) කර්‍මයෝ; මෙ, මට; නත්ථි, නැත්තාහුද; අථ, යලි; අච්ඡා දනං, වස්ත්‍රද; සයනං, සෙනසුන්ද; අන්තපානං, ආහාරපානද; දත්වාපි, දී; ආදිසෙය්‍ය, උදෙසන්නේද; සො, එබන්දෙකුත්; මෙ, මට; නත්ථි, නැද්ද; තෙන, ඒ හෙතුවෙන්; නග්ගො අම්හි, නග්ග වූයේ වෙමි; කසිරාවුත්ති ඉති, දුක් පැවතුම් ඇත්තේද විය.

එකල්හී ප්‍රෙතතෙම කියන්නේ; මහරජ යම්හෙයකින් දැන් වස්ත්‍රාදිය ලැබීමට හෙතුවූ තමා විසින් පෙරකරනලද පුණ්‍ය කර්‍මයෝ මට නැත්තාහුද, යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට වස්ත්‍ර හා සෙනසුන් ආහාරපාන දන්දී අසවල් ප්‍රෙතයාහට මේ දක්ෂිණාව වේවායි කියා උදෙසාද එබඳු කෙනෙකුන් මට නැද්ද, ඒ දෙවදෑරුම් කර්‍මය කරණකොට ගෙන දැන් වස්ත්‍ර නැත්තෙක් වීමි, දුක්වූ ජීවිකාවෘත්තිය ඇතිවීයයි කීයේය. ඒ අසා රජතෙම ඔහට වස්ත්‍රා දිය ලබාදීමට කැමතිවමින් මේ ගය කීයේය:-

31. සියා නු බො කාරණං කිඤ්චි යක්ඛ
අච්ඡාදනං යෙන තුවං ලහෙථ,
ආචික්ඛ මෙතං යදත්ථි හෙතු
සද්ධායිතං හෙතු වචො සුණොමා -ති.

31. යක්ඛ, ප්‍රෙතය; යෙන, යම් කරුණකින්; තුවං, තෝ; අච්ඡාදනං, වස්ත්‍ර; ලහෙථ, ලබන්නෙහි; කිඤ්චි කාරණං, කිසි

Non-commercial distribution

කරුණක්; සියානුඛො, වන්නේද; යදි, ඉදින්; හෙතු අත්ථි, කාරණයක් ඇත්නම්; සද්ධායිතං, ඇදහිය යුතුවූ; එතං, මෙය; මෙ, මට; ආචික්ඛ, කියව; හෙතුවඛො, හෙතුසහිත වචනය; සුණොමි ඉති, අසමිය.

''පින්වත් යක්ෂය යම්කරුණකින් නුඹ විස්තූ ලබන්නේද එබදු යම්කිසි කාරණයක් ඇත්නම් ඇදහියයුතු ඒ කාරණය මට කියව, හෙතුසහිත කීම මම අසමි''යි කීයේය. එකල්හි ඒ රජුට ප්‍රේතතෙම ඒ කරුණ කියන්නේ මේ ගාථාවන් කියේය;-

32. කප්පිනකො නාම ඉධත්ථි භික්ඛු
ඣායි සුසීලො අරහා විමුත්තො,
ගුත්තින්ද්‍රියො සංවුතපාතිමොක්ඛො
සිතිභූතො උත්තමදිට්ඨිපත්තො.

33. සබ්බලො වදඤ්ඤූ සුවචො සුමුඛො
ස්වාගමො සුප්පටිමුත්තකො ච,
පුඤ්ඤස්ස ඛෙත්තං අරණවිහාරී
දෙවමනුස්සානං ච දක්ඛිණෙය්‍යො.

34. සත්තො විධූමො අනීඝො නිරාසො
මුත්තො විසල්ලො අමමො අවඩ්ඪකො,
නිරූපධි සබ්බපජ්ඣ්වබ්ධිණෙ
තිස්සො විජ්ජා අනුප්පත්තො ජුතීමා.

35. අප්පඤ්ඤාතො දිස්වාපින සුජානො
මුනීති තං වජ්ජීසු වොහරන්ති,
ජානන්ති තං යක්ඛභූතා අනෙජං
කල්‍යාණ ධම්මං විචරන්ති ලොකෙ.

32-33-34-35 ඉධ, මේ සම්පයෙහි; ඣායි, (අග්‍රඵල ධ්‍යානයෙන්) ධ්‍යානකරන්නාවූ; සුසීලො, සුසිල්වත්වූ; අරහා, අර්හත්වූ; විමුත්තො, ක්ලෙශයන්ගෙන් මිදුණාවූ; ගුත්තින්ද්‍රියො, ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූ; සංවුතපාතිමොක්ඛො, රක්‍ෂා කරනලද ප්‍රාතිමොක්‍ෂ සංවරශීලය ඇති; සිතිභූතො, (සියලු කෙලෙස්විඩා දැවිලි සංසිඳවී මෙන් සිහිල්වූ; උත්තමදිට්ඨිපත්තො, අග්‍රඵල සම්‍යක්දෘෂ්ටි ප්‍රාප්තවූ; සබ්බලො, මෘදුවූ; වදඤ්ඤූ, දන ශීලිවූ; සුවචො, මනාවචන ඇති; සුමුඛො, යහපත් මුහුණ

Non-commercial distribution

ඇති; ස්වාගමො, මනාවදත් ආගම ධර්‍මය ඇති; සුප්පටිමුත්ත-කොව, පමණ දැන කථාකරන්නාවූ; පුඤ්ඤස්සඛෙත්තං, පින්කෙතක්වූ; අරණ්‍යවිහාරී, මෛත්‍රී විහරණ ඇති; දෙවමනුස්සා නං, දෙවිමිනිසුන්ට; දක්ඛිණෙයේ‍යාච. දක්ෂිණාර්හිවූම; සන්තො සන්සිඳුණු කෙලෙස් ඇති; විධුමො 'විගත මිථ්‍යා විතර්කධූම ඇති; අනීඝො. නිදුක්වූ; නිරාසො. ආසාරහිතවූ; මුත්තො, සර්‍වභවයෙන් මිදුණාවූ; විසල්ලො, පහකරනලද රාගාදි හුල්ඇති; අමමො, අහඞ්කාර රහිතවූ; අවඞ්කො, (කායවඞ්කාදියෙන්) අවඞ්කවූ; නිරූපධි, (ක්ලෙශාභිසංස්කාරාදී) උපධිනැත්තාවූ; සබ්බ පපඤ්චබිණො, ක්ෂයකරනලද (තෘෂ්ණාදි) සියලු ප්‍රපංච ඇති; තිස්සො විජ්ජා අනුප්පාත්තො, ත්‍රිවිද්‍යාවට පැමිණියාවූ; ජුතීමා, (නිරුත්තර ඥානරස්මියෙන්) දීප්තිමත්වූ; අප්පඤ්ඤතො, (ඉතාම අල්පෙච්ඡ බැවින් හා ප්‍රතිච්ඡන්න ගුණඇති බැවිනුත්) ප්‍රකටනුවූ; දිස්වාපි. දැකද; නසුජානො, (මෙබඳු සීලාදිය ඇත්-තෙකැයි) සුව සේ නොදත හැක්කාවූ; කප්පිනකොනාම, කප්පිනකනමීවූ; භික්ඛු අත්ථි, භික්ෂුනමක් ඇත; වජ්ජීසු, වජ්ජින් අතර; තං. උන්වහන්සේට; මුනිඉති, (ආත්මාත්ර්ථපරාත්ථ) දන්නෙකැයි; වොහරන්ති, ව්‍යවහාරකරත්; ලොකෙ, ලොක-යෙහි; යක්ඛභූතා, යක්ෂභූතයෝද; අනෙජං, තෘෂ්ණා රහිතවූ; කල්‍යාණධම්මං, සුන්දරශීලාදී ගුණවත්වූ; තං ඒ භික්ෂුව; ජානන්ති, දනින්; විවරන්ති, (ගුණකියා) හැසිරෙත්

36. තස්ස තුවං එකං යුගං දුවෙ වා
මමුද්දිදසිත්වාන සවෙ දදෙථ,
පටිග්ගහිතානි ච තානි අස්සු
මමඤ්ච පස්සෙථ සන්නද්ධදුස්ස-න්ති.

36. තුවං, තෝ; තස්ස, උන්වහන්සේට; එකංයුගං, එකවස්ත්‍ර යුග්මයක් හෝ; වෙවා. වස්ත්‍රයුග්ම දෙකක් හෝ; මං, මා; උද්දි සිත්වාන, උදෙසා; සවෙදදෙථ, ඉදින් දෙන්නෙහිනම්; තානි, ඒ වස්ත්‍රයෝ; පටිග්ගහිතානි ච අස්සු, පිළිගන්නා ලද්දෝ වන්නාහුනම්; සන්නඩදුස්සං, වස්ත්‍රයෙන් කළ සැටට ඇති; (නොහොත්) හැඳ පෙරවූ වස්ත්‍ර ඇති; මමංව, මාද; පස්සෙථ ඉති, දක්නේය.

''මහරජ අග්‍රඵලධ්‍යානයෙන් ධ්‍යානකරන්නාවූ යහපත් සිල් ඇති රහත්වූ කෙලෙසුන්ගෙන් මිදුණාවූ ඉන්ද්‍රිය සංවර

Non-commercial distribution

ශීලයෙන් යුක්තවූ රකිනලද ප්‍රාතිමොක්ෂ සංවරය ඇති සියලු කෙලෙස් විඩා දුරලිසංසිඳීමෙන් සිහිල්වූ උතුම් අග්‍රඵල සම්‍යක්දෘෂ්ටියට පැමිණියාවූ මෘදුවචන කියන්නාවූ දැනගිලිවූ යහපත්වූ මුහුණ ඇති මනාව දත් ආගමධර්මය ඇති පමණදන කියන්නාවූ මෛත්‍රී විහරණඇති දෙවිමිනිසුන්ට පින්කෙතක්වූ දක්ෂිණාර්හවූ සන්සිදුණු කෙලෙස් ඇති පහකළ බොරු කල්පනා නැමති දුමිඇති නිදුක්වූ තෘෂ්ණා නැති සියලු භවයෙන් මිදුණාවූ පහකළ රාගාදී හුල්ඇති කිසිවක් මගේය යන කල්පනා නැති කායවඩිකාදියෙන් ඇදනැති කෙලශාභි සංස්කාරාදි උපධි පහකළාවූ තෘෂ්ණාදි සියලු ප්‍රමාද ක්ෂයකළාවූ ත්‍රිවිද්‍යාවට පැමිණියාවූ නිරන්තර ඥානාලොකයෙන් බබලන්නාවූ ඉතා අල්පවිඡ බැවින් හා වැසුණු ගුණඇති බැවිනුත් ප්‍රකටනුවූ ගැඹුරුබැවින් දුටුවන් මෙබඳු සිල්වතෙක මෙබඳු ධර්මඥත්තෙක මෙබඳු පැනවතෙකැයි කියා මනාව නොදහැකිවූ ජටිලයන් දහසක් අතරෙන් ආයුෂ්මත් උපාලි තෙරුන් වහන්සේගේ උපාධ්‍යායවූ කප්පිනකම් භික්ෂූන් වහන්සේ නමක්මේ විශාලා-මහනුවර ඇත්තාහ. උන්වහන්සේ අත්වැඩ පරවැඩ දන්නෙකැයි කියා වඡ්ජින් අතර ව්‍යවහාරකරත්. යක්ෂභූතයෝද යහපත් සීලාදිගුණ යුත් ඒ රහතන් වහන්සේ දනිත්. මහරජ නොපි ඒ කප්පිනක මහතෙරුන් වහන්සේට එක් වස්ත්‍රයුග්මයක් හෝ යුග්මාදකක් ඉඳින් මා උදෙසා පූජාකළාහුනම් උන්වහන්සේ විසින් ඒ වස්ත්‍රයුග්මයෝ පිළිගන්නා ලද්දහුනම් ලත් වස්ත්‍ර හැඳ පොරවාගෙන සැරසුණ මා දැක්ක හැක්කේ යයි කීයේය. ඉන්පසු රජතෙම කියන්නේ.

37. කස්මිං පදෙසෙ සමණං වසන්තං
ගන්ත්වාන පස්සෙමු මයං ඉදානි,
සමජ්ජ කඩ්ඛං විචිකිච්ඡිතඤ්ච
දිට්ඨිවිසුකානි ච කො විනොදයෙ-කි

37. කස්මිංපදෙසෙ, කවර පෙදෙසක; වසන්තං, වසන්නාවූ; සමණං, ශ්‍රමණයා වෙත; මයං, අපි; ඉදානි, දැන්; ගන්ත්වාන, ගොස්; පස්සෙමු. දක්නෙමුද; සො කො, ඒ කවරෙක්තෙම්; අජ්ජ, අද; කඩ්ඛං, සැකයද; විචිකිච්ඡිතංච, ඒ විචිකිත්සාවද; දිට්ඨිවිසුකානිච, දෘෂ්ටිවිසුකයන්ද; විනොදයෙ ඉති, පහකරන්-නේද?

Non-commercial distribution

''යක්ෂය කිනම් පෙදෙසක වසන්නාවූ ඒ ශ්‍රමණයන් වහන්සේ වෙත දැන් අපි ගොස් කෙසේ දැකගනිමුද, අද ඒ කවරෙක් අපගේ විචිකිත්සාවත් මිසදිටු හුලුත් පහකරන්නේද'' යි කියා තෙරුන් වහන්සේ වසනතැන් විමසූ සේය. ඉන්පසු ඒ ප්‍රෙතතෙම මේ ගාථාව කීයේය:—

38. එසෝ නිසින්නෝ කපිනව්වනායං
පරිවාරිතෝ දෙවතාහි බහූහි,
ධම්මිං කථං භාසති සච්චනාමෝ
සකස්මිං අච්ඡෙරකෙ අප්පමත්තෝ-ති.

38. කපිනව්වනායං, කපිනව්වනා ප්‍රදෙශයෙහි; නිසින්නෝ, හුන්නාවූ; සච්චනාමෝ, (ගුණනාමයෙන්) සත්‍යනාම ඇති; අච්ඡෙරකෙ, ආශ්චර්‍යවූ; සකස්මිං, ස්වකීය කෘත්‍යයෙහි; අප්පමත්තෝ, අප්‍රමත්තවූ, එසෝ, මේ කප්පිනක භික්ෂුතෙම; බහූහි දෙවතාහි, බොහෝ දෙවියන් විසින්; පරිවාරිතෝ, පිරිවරනලදුව; ධම්මිං කථං, දහැමිකතා; භාසති ඉති, දැන් කියයි.

''මහරජ ආශ්චර්‍යවූ ස්වකීය කටයුත්තෙහි අප්‍රමාදවූ මුලකී ගුණනාමවලින් අවිපරිතනාම ඇති මේ කප්පිනක තෙරුන් වහන්සේ වදුරන් නැටීමෙන් කපිනව්වනායයි ලත් ව්‍යවහාරය ඇති ප්‍රදෙශයෙහි වැඩහිඳ දැන් බොහෝ දෙවතාවන් විසින් පිරිවරන ලදුව දහැමි කතා පවත්වනසේකැ''යි කීය. මෙසේ ප්‍රෙතයා කීකල්හි රජතෙම එකෙණෙහිම තෙරණුවන් වෙත යනු කැමතිව මේ ගාථා කීයේය.

39. තථාහං කස්සාමි ගන්ත්වා ඉදානි
අච්ඡාදයිස්සං සමණං යුගෙන,
පටිග්ගහිතානී ච තානි අස්සු
තුවඤ්ච පස්සෙමු සන්නද්ධුස්ස-න්ති.

39. අහං, මම; තථාකස්සාමි, එසේ කරන්නෙමී; ඉදානි, දැන්; සමණං, ශ්‍රමණයන් වෙත; ගන්ත්වා, ගොස්; යුගෙන, වස්ත්‍රයුග්මයකින්; අච්ඡාදයිස්සං, හන්දවන්නෙමි (නොහොත්) පූජාකරන්නෙමි; තානි, ඒ වස්ත්‍රයෝ; පටිග්ගහිතානිච අස්සු, පිළිගන්නා ලද්දෝ වන්නාහුය; සන්නද්ධ දුස්සං, වස්ත්‍රයෙන් සැරසුණාවූ; තුවංච, තුඹද; පස්සෙය්‍යු ඉති, දක්ෂනම්‍යය.

Non-commercial distribution

''යක්ෂය මම එසේ කරන්නෙමි; දැන් ශ්‍රමණයන් වහන්සේ ලඟට ගොස් වස්ත්‍රයුග්මයකින් පූජාකරන්නෙමි, උන්වහන්සේ විසින් ඒ වස්ත්‍ර පිළිගන්නා ලද්දහුනම් දිව්‍යවස්ත්‍ර හැඳ පොරවා ගන එන නුඹ අපි දක්නෙමුය''යි කීයේය. එකල්හි ප්‍රෙතතෙම තෙරුන් වහන්සේ දැන් දෙවතාවන්ට ධර්මදේශනා කරනසේක, එහෙයින් උන්වහන්සේ වෙත පැමිණීමට මේ සුදුසු කල් නොවේ යයි දක්වමින් මේ ගය කීයේය:-

40. මා අක්ඛණෙ පබ්බජිතං උපාගමි
සාධු වො ලිච්ඡවි නෙස ධම්මො,
තතො ච කාලෙ උපසංකමිත්වා
තත්ථෙව පස්සාහි රහො නිසින්ත-න්ති.

40. ලිච්ඡවී, පින්වත් ලිච්ඡවීරජ; අක්ඛණෙ, නොකල්හි; පබ්බජිතං, පැවිද්දෙකුවෙත; මාඋපාගමි, නොඑළඹේවායි; සාධු ආයාවනා කරමි; වො, (රජවූ) යුෂ්මතුන්ගේ; එසො ධම්මො න, මේ ධර්මය නොවේ; තතොච, එහෙයින්ම; කාලෙන, සුදුසුකල්හි; තත්ථ එව, එතන්හිම; රහොනිසින්නං, රහසිවහුන් (භික්ෂුව); පස්සාහි ඉති, බලව.

''පින්වත් ලිච්ඡවීරජ නුසුදුසුකල්හි පැවිද්දන්වෙත නොඑළඹෙනු මැනවයි ආයාවනා කරමි, නොකල්හි යම්තැනකට එළඹීම රජවූ නුඹවහන්සේලාගේ ධර්මයක් නොවේ, එහෙයින් සුදුසු කාලයෙහි එළඹ එහිදීම රහසිගතව වැඩහිඳින උන්වහන්සේ බලනු මැනව''යි කීයේය.

මෙසේ ප්‍රෙතයා කීකල්හි රජතෙමේ මැනවයි කියා පිළිගෙන තමාගේ රජගෙටම ගොස් පසුව සුදුසු වේලෙහි වස්ත්‍රයුග්ම අටක් ගෙන්වාගෙන තෙරුන්වහන්සේ වෙත එළඹ එකත්පසෙක හුන්නේ පිළිසඳර කථාකොට ''ස්වාමීනි මේ වස්ත්‍රයුගල අට පිළිගනු මැනව''යි කියා කීයේය. එය අසා තෙරුන්වහන්සේ කතා ඉපදවීම පිණිස ''මහරජ නුඹ පෙර දන් නොදෙන සුලුය මහණ බමුණන්ට වෙහෙස කරන ස්වභාව ඇත්තෙක දැන් කෙසේනම් ප්‍රණීත වස්ත්‍ර දෙනුකැමති වූයේදැයි ඇසූහ. එය අසා රජතෙම උන්වහන්සේට කරුණු කියමින් ප්‍රෙතයා හා එක්වීම හා ඒ ප්‍රෙතයා හා තමා විසිනුත් කියනලද සියලු පුවත තෙරුන්වහන්ට සැලකොට වස්ත්‍ර පූජාකොට ප්‍රෙතයාහට දක්ෂිණාව

Non-commercial distribution

පැමිණියේය. ඒ හෙතුවෙන් ප්‍රෙතතෙම දිව්‍යවස්ත්‍ර හැඳ පොරවා ගෙන අලංකාරව සැරසී අසුපිට නැඟී තෙරණුවන්ගේ හා රජාණන්ගේත් ඉදිරියෙහි පහළවී සිටියේය. එය දැක රජතෙම සතුටුසිත් ඇතිව ප්‍රමුදිත ව ප්‍රීති සොම්නස් ඇතිව ''ප්‍රත්‍යක්ෂ වශයෙන් මා විසින් එකාන්තයෙන් කර්මඵලය දක්නාලදී, එහෙයින් මම මෙතැන් පටන් පව් නොකරන්නෙමි, පින්ම කරන්නෙමි''යි කියා ඒ ප්‍රෙතයා හා සාක්ෂි කෙළේය. ඒ ප්‍රෙතතෙමේද කියන්නේ ලිච්ඡවී රජ ඉදින් නුඹවහන්සේ මෙ-තැන්පටන් අධර්මය හැරදමා ධර්මයෙහි හැසිරෙන්නාහු නම් මම නුඹට සාක්ෂි කරන්නෙමි, නුඹ සමීපයටද මම එන්නෙමි, හුල සිටින පුරුෂයාද වහා හූලෙන් මුදනු මැනව, එසේ ඇතිකල්හි ඔහු දිවි ලබා ධර්මයෙහි හැසිරෙමින් දුකින් මිදෙන්නේය, කලින්කල තෙරණුවන්වෙතද එළඹ ධර්මය අසමින් පින් කරව''යි ගියේය.

ඉක්බිති රජතෙම තෙරුන්වහන්සේ වැඳ නුවර ඇතුල්වී වහා වහා ලිච්ඡවී පිරිස රැස්කරවා ඔවුන් අනුදන්වා ඒ පුරුෂයා හූලෙන් මුදවා ''මොහු නිරොගි කරව්ය''යි කියා වෙදුන්ට අණ කෙළේය. තෙරුන් වෙතද පැමිණ ''ස්වාමීනි නිරයගාමී අකුශල කර්මකාට සිටියෙකුහට නිරයෙන් මිදීම වන්නේ දෝහෝ''යි කියා ඇසීය. ''මහරජ ඉදින් උදරවූ පින්කළේ නම් නිරයෙන් මිදීම වන්නේය''යි කියා තෙරුන්වහන්සේ රජු සරණයෙහි හා පඤ්චශීලයෙහිද පිහිටවූහ. හෙතෙම ඒ සරණ පඤ්චශීලයෙහි පිහිටියේ තෙරණුවන්ගේ අවවාදයෙහි පිහිටා සිට සෝවාන්විය. උල අවුණා සිටි පුරුෂතෙම වනාහි නිරොගිවී කලකිරී භික්ෂූන් අතර පැවිදි වී නොබෝකලකින්ම අර්හත්වයට පැමිණියේය. ඒ කාරණය දක්වමින් සඞ්ගීතිකාරයෝ මේ ගාථා කීවෝය:-

41. තිථාති වත්වා අගමාසි තත්ථ
පරිවාරිතෝ දසගණෙන ලිච්ඡවී,
සොතං නගරං උපසංකමිත්වා
වාසූපගච්ඡිත්ථ සකෙ නිවෙසනෙ.

42. තතෝ ච කාලෙ ගිහි කිච්චානි කත්වා
නහාත්වා පිවිත්වා ච ඛණං ලභිත්වා,
විවෙය්‍ය පෙළාතෝ යුගානි අට්ඨ
ගාහාපයී දසගණෙන ලිච්ඡවී.

Non-commercial distribution

43. සො තං පදෙසං උපසංකමිත්වා
තං අද්දසා සමණං සන්ත චිත්තං,
පටික්කන්තං ගොචරතො නිවත්තං
සීතිභූතං රුක්ඛමූලෙ නිසින්නං.

44. තමෙනං අවොච උපසංකමිත්වා
අප්පාබාධං ඵාසුවිහාරඤ්ච පුච්ඡි,
වෙසාලියං ලිච්ඡවිහං භදන්තෙ
ජානන්ති මං ලිච්ඡවී අම්බසක්ඛරො-ති.

41. සොලිච්ඡවී, ඒ ලිච්ඡවී රජතෙම; තථා ඉති, එසේයයි; වත්වා, කියා; දසගණෙන, දසසමූහයා විසින්; පරිවාරිතො, පිරිවරනලදුව; තත්ථ, එහි; අඟමාසි, ගියේය; තං නගරං, ඒ නුවරට; උපසංකමිත්වා, එළඹ; සකෙනිවෙසනෙ, වාසං උපගච්ඡිත්ථ, විසීමට පැමිණියේය.

42. ලිච්ඡවී, ලිච්ඡවීරජතෙම; තතොව. ඉක්බිති; කාලෙ, සුදුසු කාලයෙහි; ගිහිකිච්චානි, ගෘහකෘත්‍යයන්; කත්වා, කොට; නහාත්වා, ජලස්නානයකොට; පිවිත්වාව, (කා) බී; බණං ලහිත්වා, යහපත් කාලයලැබ; විවෙය්‍ය, පරික්ෂාකොට; පෙළාතො, පෙට්ටියෙන්; යුගානිඅට්ඨ, වස්ත්‍රයුක්ම අටක්; ගාහාපයී, ගෙන්විය.

43. සො, ඒ රජතෙම; තංපදෙසං, ඒ පෙදෙසට; උපසංකමිත්වා, එළඹ; සන්තචිත්තං, සන්සුන් සිත්ඇති; ගොචරතො, පිණ්ඩපාතයෙන්; පටික්කන්තං, පෙරළා වැඩමවූ; නිවත්තං, නැවතුණාවූ සීතිභූතං, සිහිල්වූ; රුක්ඛමූලෙ, රුක්මුල; නිසින්නං, වැඩහුන්නාවූ; තං සමණං, ඒ ශ්‍රමණයන් වහන්සේ; අද්දසා, දුටුවේය.

44. තමෙනං, ඔහුවෙත; උපසංකමිත්වා, පැමිණ; අප්පාබාධං, නිරොගිබවද; ඵාසුවිහාරං, පහසුවිහරනයද; පුච්ඡි, විචාළේය; භදන්තෙ, ස්වාමීනි; අහං, මම; වෙසාලියං, විශාලා මහනුවර; ලිච්ඡවී, ලිච්ඡවී රජවෙමි; අම්බසක්ඛරො, අම්බසක්ඛර නම්වූ; ලිච්ඡවීඉති, ලිච්ඡවී රජයයි; මං, මා ජානන්ති, දනිත්යයි; අවොච, කීයේය.

අම්බසක්ඛර නම් ඒ ලිච්ඡවී රජතෙම දසසමූහයා විසින් පිරිවනලදුව එසේයයි කියා ගොස් ඒ නුවරට එළඹ ස්වකීය

Non-commercial distribution

රාජ මන්දිරයෙහි වාසයට පැමිණියේය. ඉන්පසු සුදුසු කාල යෙහි ගිහිගෙයි වසන්නවුන් විසින් කටයුතුවූ කුටුම්බය පිළිබඳ කෘත්‍යයන් කොට වතුර නා කා බී යහපත් කාලය ලැබ දස ගණයා ලවා පෙට්ටියෙන් හොඳ වස්ත්‍ර තෝරා වස්ත්‍රයුග්ම අටක් ගෙන්වාගත, එය ඔටුන් ලවා ගෙන්වාගෙන ඒ ලිච්ඡවී රජතෙමේ ඒ කපිනව්වනා නම් ප්‍රදේශයට පැමිණ පිණ්ඩපාත-යෙන් පෙරළා වැඩම්වා නැවතුණාවූ සන්සිදුණු සිත් ඇති සිහිල්වූ රුක්මුල වැඩහුන් ඒ ශ්‍රමණයන්වහන්සේ දැක උන්වහන්සේ වෙත පැමිණ සැප පහසු විචාරා මෙසේ කීයේය. ස්වාමීනි මම විශාලාමහනුවර ලිච්ඡවියෙක් වෙමි, අම්බසක්ඛර නම් ලිච්ඡවී රජයයි කියා ජනයෝ මා දනිත්.

45. ඉමානි මෙ අට්ඨයුගා සුභානි
පතිගණ්හ හන්තෙ පදදාමි තුය්හං,
තෙනෙව අත්ථෙන ඉධාගතොස්මි
යථා අහං අත්තමනො භවෙය්‍යං.

46. දූරතොව සමණා බ්‍රාහ්මණා ච
නිවෙසනන්තෙ පරිවජ්ජයන්ති,
පත්තානි භින්දන්ති ච තෙ නිවෙසනෙ
සඩ්ඝාටියො චාපි විපාටයන්ති.

47. අථාපරෙ පාදකුඨාරි කාහි
අවංසිරං සමණෙ පාතයන්ති
එතාදිසං පබ්බජිතා විහෙසං
තයා කතං සමණා පාපුණන්ති.

48. තිණෙන තෙලම්පි න ත්වං අදාසි
මුළ්හස්ස මග්ගම්පි න පාවදාසි,
අන්ධස්ස දණ්ඩං සයමාදියාසි
එතාදිසො කදරියො අසංවුතො.
අථ ත්වං කෙන වණ්ණෙන කිමෙව දිස්වා
අම්හෙහි සහ සංවිභාගං කරොසි.

45. හන්තෙ, ස්වාමීනි; මෙ, මාගේ; සුභානි, යහපත්වූ; ඉමානි අට්ඨයුගා, මේ වස්ත්‍රයුග්ම අට; පතිගණ්හ, පිළිගනු මැනව; තුය්හං, ඔබ වහන්සේට; පදදාමි, දෙමි; යථා, යම්සේ;

Non-commercial distribution

අහං, මම; අත්තමනෝ හවෙය්‍යං, සතුටුසිත් ඇති වන්නෙමිද; තෙනෙව අත්ථෙන, ඒකරුණෙන්ම; ඉධ, මෙතනට; ආගතොස්මි, පැමිණියෙමි.

46. **සමණා, ශ්‍රමණයෝද; බ්‍රාහ්මණාව, බ්‍රාහ්මණයෝද; තෙ, යුෂ්මතාගේ; නිවෙසනං, නිවෙස; දූරතොව; දුරින්ම; පරිවජ්ජයන්ති, දුරුකරත්; තෙ, නුඹගේ; නිවෙසනෙ, ගෘහ සමීපයෙහිදී; පත්තානි, පාත්‍රයන්; භින්දන්තිව, බිඳින්; අපි, යළි; සංඝාටියොව, සහළසිවුරුද; විපාටයන්ති, ඉරාදමත්.**

47. **අථ, නැවත; පාදකුඨාරිකාහි, පා නමැති කෙටෙරි වලින්; අපරෙ සමණෙ, සමහර ශ්‍රමණයන්; අවංසිරං, හිස යටි කුරුව; පාතයන්ති, හෙළත්; තයාකතං, තා විසින් කරනලද; එතාදිසං, මෙබඳුවූ; විහෙසං, වෙහෙසට; පබ්බජිතා, පැවිදිවූ; සමණා, ශ්‍රමණයෝ; පාපුණන්ති, පැමිණෙත්.**

48. **ත්වං, තෝ; තිණෙන, තණඅගින්; තෙලම්පි, තෙල් බිඳක්වත්; නදදසි, නුදුන්නෙහිය; මූළ්හස්ස, මංමුළාවූවාහට; මග්ගම්පි, මාර්ගයත්; නපාවදසි, නොකීවෙහිය; අන්ධස්ස, අන්ධයාගේ; දණ්ඩං' සැරයටිය; සයං, තෙමේ; ආදියාසි, හැරගත්තෙහිය; එතාදිසො, මෙබඳු වූ; කදරියො, තදමසුරුවූ; අසංවුතො, නොහික්මුණාවූ; ත්වං, තෝ; අථ, නැවත; කෙනවණ්ණෙන, කවර ගුණයකින්; කිං එව දිස්වා, කුමක් දැක; අම්හෙහිසහ, අප සමග; සංවිභාගං කරොසි, සංවිභාගකරෙහිද.**

ස්වාමීනි මාගේ මේ යහපත් වස්ත්‍ර යුගල අට ඔබ වහන්සේට මම පූජාකරමි, යම්සේ මම සතුටු සිත් ඇති වන්නෙමිද එසේ පිළිගනුමැනව, ඒ කාරණය හෙතුකොටගෙනම මෙතනට පැමිණියෙමියි කීයේය. එකල්හි තෙරණුවෝ කියන්නාහු, මහරජ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තොපගේ මන්දිරය දුරදීම හැරදමත්, නුඹගේ රාජගෘහය සමීපයෙහිදී මහණ බමුණන්ගේ පාත්‍රයන් බිඳින්, සහළ සිවුරු ඉරාදමත්, තවද පාබඳු කෙටෙරි වලින් ඇද සමහර ශ්‍රමණකෙනෙකුන් හිස් යටිකුරුව හෙළත්, තොප විසින් කරන ලද මෙබඳු වෙහෙසට පැවිදි ශ්‍රමණයෝ පැමිණෙත්, නුඹ තණ අගින් තෙල්බිඳක් පමණවත් නුදුන්නේය, මංමුළාවෙකුට මගවත් නොකීවේය, අන්ධයාගේ සැරයටිය තෙමේ හැරගත්තේය, මෙබඳු රළුක්‍රියා ඇති කද මසුරුවූ

Non-commercial distribution

නොභික්මුණාවූ නුඹ නැවත කවර කරුණක් හෙතුකොටගෙන කුමක් දුක ශ්‍රමණවූ අප හා සමඟ තමා අඳිනා පිළිවලින් සම්හරක්දී සංවිභාගකෙරේදැයි ඇසූහ.

49. පව්වෙමි හන්තෙ යං ත්වං වදෙසි
විහෙසයිං සමණෙ බ්‍රාහ්මණෙ ච,
බ්‍රඩ්ඩත්ථිකෝ නො ච පදුට්ඨචිත්තෝ
එතම්පි මෙ දුක්කටමෙව හන්තෙ.

50. බ්‍රඩ්ඩාය යක්ඛෝ පසව්ත්ව පාපං
වෙදෙති දුක්ඛං අසමත්තහොගී,
දහරෝ යුවා නග්ගනියස්ස භාගී
කිංසු තතෝ දුක්ඛතරස්ස හොති.

49. හන්තෙ, ස්වාමීනි; ත්වං, නුඹ වහන්සේ; යං, යමක්; වදෙසි, කියනසේක්ද; පව්වෙමි, (එය මම) පිළිගනිමි; බ්‍රඩ්ඩත්-ථිකෝ, ක්‍රීඩා අදහස් ඇතිව; නොව පදුට්ඨචිත්තෝ, දූෂිතවූ සිත් නැතිව; සමණෙ, ශ්‍රමණයන්ටද; බ්‍රාහ්මණෙ ච, බමුණන්ටද; විහෙසයිං, වෙහෙසකෙලෙමි; හන්තෙ, ස්වාමීනි; එතම්පි, මෙයද; මෙ මාහට; දුක්කටංඑව, පව්ම වෙයි.

50. බ්‍රඩ්ඩාය, ක්‍රීඩාසිතින්; පාපං, පව්කම්; පසව්ත්ව, රැස්කොට; යක්ඛෝ, ප්‍රෙතයෙක්තෙම; අසමත්තහොගී, අසම්-පූර්ණ භොග ඇති; යුවා, යෞවනයෙන් යුක්තවූ; දහරෝ, තරුණ යෙක්වූයේ; නග්ගනියස්ස, නග්නභාවයට; භාගී, වූවේ; දුක්ඛං, දුක; වෙදති, විඳියි; තතෝ, ඊටවඩා; දුක්ඛතරං අතිසයින් දුකක්; අස්ස, මොහුට; කිංසු හොති, කෙසේනම් වේද.

එකල රජතෙම කියන්නේ, ස්වාමීනි නුඹ වහන්සේ පාත්‍රයන් බිඳිත්යයි යනාදියෙන් යමක් වදළහුද එය මම දනිමි, ඒ සියල්ල මා විසින් කරනලදි කරවනලදි. ස්වාමීනි දූෂිත සිත් නැතිව ක්‍රීඩා අදහසින් යුක්තව මම මහණ බමුණන්ට වෙහෙස කෙළෙමි මෙය ක්‍රීඩා අදහසින් කළනමුත් ඊට අකුසල්මවේ. එක් මනුෂ්‍යයෙක් මිනිස්ලොවදී ක්‍රීඩාපිණිස පව්රැස්කොට මැරී ගොස් දැන් ප්‍රෙතයෙක්වී අසම්පූර්ණ භොග ඇති තරුණයෙක්ව නග්නභාවයෙන් යුක්තවී ප්‍රෙතදුක්විඳියි, ඒ නග්නභාවයට වඩා වැඩිතරම් දුකක් මේ ප්‍රෙතයාහට කෙසේ නම් වේද නොවේමැයි.

Non-commercial distribution

51. නන්දිස්වාසංවෙගමලත්ථං හන්තෙ;
තප්පච්චයා කාහං දදමි දානං,
පටිග්ගණ්හ හන්තෙ වත්ථයුගානි අච්ච
යක්ඛස්සිමා ගච්ඡන්තු දක්ඛිණායො.

52. අද්ධාහි දානං බහුධා පසත්ථං
දදතො ච තෙ අක්ඛයධම්මමත්ථු,
පටිග්ගණ්හාමි තෙ වත්ථයුගානි අච්ච
යක්ඛස්සිමා ගච්ඡන්තු දක්ඛිණායො.

53. තතො ච සො ආචමයිත්ව ලිච්ඡවි
ථෙරස්ස දත්වාන යුගානි අච්ච,
පටිග්ගහිතානි ච තානි වස්සු
යක්ඛඤ්ච පස්සෙථ සන්තඩදුස්සං.

54. තමද්දසා වන්දනසාරලිත්තං
ආජඤ්ඤමාරුළ්හ මුළාරවණ්ණං,
අලඩ්කතං සාධු නිවත්ථදුස්සං
පරිවාරිතං යක්ඛමහිද්ධිපත්තං.

51. හන්තෙ. ස්වාමීනි; තංදිස්වා, ඔහු දැක; සංවෙගං අලත්ථං, සංවෙග ලදිමි; තප්පච්චයා, ඒ හෙතුවෙන්; අහං, මම; තෙ, නුඹ වහන්සේට; දානං, (වස්ත්‍ර) දානය; දදමි, දෙමි; හන්තෙ, ස්වාමීනි; වත්ථයුගානි අච්ච, වස්ත්‍රයුග්ම අට; පටිග්ගණ්හ, පිළිගනු මැනව; ඉමා දක්ඛිණායො, මේ පින්; යක්ඛස්ස, ප්‍රෙතයාහට; ගච්ඡන්තු, පැමිණෙත්වා.

52. දානං, දන්දීම; බහුධා, නොයෙක් ප්‍රකාරයෙන්; අද්ධාහි, එකාන්තයෙන්ම; පසත්ථං, පසස්නාලදී; දදතොච, දෙන්නාවූද; තෙ, නුඹට; අක්ඛයධම්මං අත්ථු, ක්ෂයනොවෙන ස්වභාව ඇති වේවා; තෙ, නුඹගේ; වත්ථයුගානිඅච්ච, වස්ත්‍රයුග්ම අට; පටිග්ගණ්හාමි, පිළිගනිමි; යක්ඛස්ස, ප්‍රෙතයාහට; ඉමාදක්ඛිණායො, මේ දක්ෂිණාවෝ; ගච්ඡන්තු, පැමිණෙත්වා.

53. සො ලිච්ඡවී, ඒ ලිච්ඡවී රජතෙම; තතොව, ඉන්පසු; ආචමයිත්ව මුවසෝදගන; ථෙරස්ස, තෙරණුවන්ට; යුගානි අච්ච, වත්යුග අට; දත්වාන, දී; තානිව, ඒ වස්ත්‍රයෝද; පටිග්ගහිතානිව අස්සු, පිළිගන්නා ලද්දෝද වෙත්වා; සන්නද්ඩදුස්සං, වස්ත්‍රයෙන් සැරසුණාවූ; යක්ඛංච, ප්‍රෙතයාද; පස්සෙථ, දකීවා.

Non-commercial distribution

54. වන්දනසාරලිත්තං, **සඳුන්සුණු ගල්වන ලද්දවූ;** ආජඤ්ඤං, ආජානීය **අසුපිටට;** ආරුළ්හං, **නැංගාවූ;** උළාරවණ්ණං, **උතුම් රූ ඇති;** සාධු, **මනාකොට;** නිවත්ථ **දුස්සං, හැඳගත් වත් ඇතිව;** අලඞ්කතං, **සැරසුණාවූ;** පරිවාරිතං, **(පිරිවර ජනයා විසින්) පිරිවරන ලද්දවූ;** යක්ඛ **මහිඞ්ඪිපත්තං, මහත් යක්ෂඍඩියට පැමිණියාවූ;** තං, **ඔහු;** අද්දසා, **දුටුවේය.**

ස්වාමීනි නග්න ප්‍රෙතයා දැක **මම සංවෙග ලදිමි, ඒ හෙතු** කොටගෙන **මම මේ** වස්ත්‍රය **නුඹවහන්සේට දෙමි, ස්වාමීනි නුඹවහන්සේ** වස්ත්‍රයුග්ම අට පිළිගනුමැනව, **මා විසින් දෙනු ලබන මේ** වස්ත්‍ර **දක්ෂිණාවෝ ප්‍රෙතයාහට ලැබෙත්වා, එකල තෙරණුවෝ දන්දීම නොයෙක් ප්‍රකාරයෙන් බුඩාදි උත්තමයන් විසින් එකාන්තයෙන්ම වර්ණනා කරනලදී. දෙන්නාවූ නුඹටද ක්ෂයනොවන ස්වභාව ඇතිවේවා, නුඹගේ වස්ත්‍රයුග්ම අට මම පිළිගනිමි, මේවස්ත්‍ර දක්ෂිණාවෝ ප්‍රෙතයාහට ලැබෙත්වා''යි කීහු. ඉන්පසු ඒ ලිච්ඡවී රජතෙම අත්පා සේදීම පෙරදැරිවූ මුව සෝදා ගන තෙරණුවන්ට ඒ රෙදි අට යුවළ පූජාකොට ඒ වස්ත්‍ර පිළිගනු ලැබෙත්වා ප්‍රෙතයාද දක්නට ලැබෙවායි කීය. එකල්හි දිව්‍ය වස්ත්‍රයෙන් සැරසුණාවූ සඳුන්කල්ක ගල්වනලද ශරීර ඇතිව ආජානීය අසුපිට නැඟුණාවූ ශ්‍රේෂ්ඨ රූපඇති දිව්‍යාභරණයෙන් සැරසුණාවූ මණාව හැඳගත් දිව්‍ය වස්ත්‍ර ඇති අනුකූල පැවතුම් ඇති ජනයා විසින් පිරිවරණ ලද්දවූ මහත් යක්ෂඍඩියට හා දිව්‍යඍඩියටත් පැමිණ සිටියාවූ ඒ දෙවියා දැක්කේය.**

55. සෝ තං දිස්වා අත්තමනෝ උදග්ගෝ
පහට්ඨචිත්තොව සුභ ග්ගරූපෝ,
කම්මඤ්ච දිස්වාන මහාවිපාකං
සන්දිට්ඨිකං චක්ඛුනා සච්ඡිකත්වා.

56. තමේනං අවොච උපසංකමිත්වා
දස්සාමි දානං සමණබ්‍රාහ්මණානං,
න චාපි මේ කිඤ්චි අදෙය්‍යමත්ථි
කුවංච මේ යක්ඛ බහූපකාරෝ.

57. කුවංච මේ ලිච්ඡවි එකදෙසං
අදාසි දානානි අමොඝමේතං,
ස්වාහං කරිස්සාමි තයාව සක්ඛිං
අමානුසෝ මානුසකේන සද්ධිං.

Non-commercial distribution

58. ගතී ව බන්ධු ව පරායනඤ්ච
මිත්තො මමාසි අථ දෙවතාසි,
යාචාමහං පඤ්ජලිකො භවිත්වා
ඉච්ඡාමි තං යක්ඛ පුනාපි දට්ඨුං.

55. සො, ඒ ලිච්ඡවීතෙම; තං දිස්වා, ඔහු දැක; අත්ත-මනො, සතුටුසිත් ඇතිව; උදග්ගො, ඔදවැඩිසිත් ඇතිව; පහට්ඨචිත්තොව, තුටුපහටු සිත් ඇතිව; සුභග්ගරූපො, අතිශය භාග්‍යසම්පන්න ශරීර ඇතිව; සංදිට්ඨිකං, සාංදෘෂ්ටිකවූ; කම්මංච, කර්මයද; මහාවිපාකං, මහත් කර්මවිපාකයද; චක්ඛුනා, සියසින්; සච්ඡිකත්වා, ප්‍රත්‍යක්ෂ කොට; දිස්වාන, දැක.

56. තං, ඔහුවෙත; උපසංකමිත්වා, පැමිණ; එතං, මෙය; අවොච, කීයේය; සමණබ්‍රාහ්මණානං, මහණබමුණන්ට; දනං, දනය; දස්සාමි, දෙන්නෙමි; මෙ, මාගේ; අදෙය්‍යං, දන් නොදිය යුතුවූ; කිංචි, කිසිවස්තුවක්; නවාපි අත්ථි, නොමැත්තේය; යක්ඛ, යක්ෂය; තුවංච, තෝද; මෙ මට; බහූපකාරොසි, බොහෝ උපකාර වූවෙහිය.

57. ලිච්ඡවී, (භවත්) ලිච්ඡවිය; තුවංච, නුඹද; මෙ, මට; එකදෙසං, එක දෙසයක්වූ; දනානි, වස්ත්‍රදනය; අදාසි, දුන්නේය; එතං, මේ දනය; අමොඝං, හිස්නොවෙයි; අමානුසො, අමනුෂ්‍යවූ; සො අහං, ඒ මම; මානුසකෙන, මනුෂ්‍යවූ; භයා සද්ධිං එව, නුඹ සමගම; සක්ඛිං කරිස්සාමි, සාක්ෂිකරන්නෙමි.

58. යක්ඛ, යක්ෂය; මම, මට; (භවං, තෝ;) ගතීව, (යහපත්) ගමන් ඇත්තෙක්ද; බන්ධුව, නැයෙක්ද; පරායනංච, පිහිටක්ද; මිත්තොව අසි, මිත්‍රයෙක් වෙහිය; අථ, නැවත; දෙවතා අසි, දෙවියෙක්වෙහිය; අහං, මම; පඤ්ජලිකොභවිත්වා, බදාදිලිව; යාචාමි, යාඥාකරමි; තං, නුඹ; පුනපි, නැවතත්; දට්ඨුං, දැකීමට; ඉච්ඡාමි, කැමැත්තෙමි.

ඒ ලිච්ඡවී රජතෙම ඒ දෙවියා දැක සතුටුව ඔදවැඩි සිතින් යුක්තව පහන් සිත් ඇතිව මහා භාග්‍ය සම්පන්න ශරීර ඇතිව ඉහතාත්මයෙහිවූ කර්මය හා මහත් කර්ම විපාකයත් සියසින් ප්‍රත්‍යක්ෂ කොට දැක ඒ දෙවියා වෙත එළඹ මෙසේ කීයේය. මෙතැන් පටන් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මම දන්දෙන්නෙමි. මගේ දන් නොදියයුතු කිසිම වස්තුවක් නැත, යක්ෂය නුඹත් මට බොහෝ උපකාරවූයේ යයි කීයේය. එකල දෙවියා

Non-commercial distribution

ක්‍යන්නේ, පින්වත් ලිච්ඡවී රජ නුඹවහන්සේද මට බොහෝ උපකාර වූවාහුය, සිවුපස දානය අතරෙන් එකක්වූ වස්ත්‍ර දානය දුන්නාහුය, මේ වස්ත්‍ර දානය හිස්නොවෙයි, අමනුෂ්‍යවූ ඒ මම මනුෂ්‍යවූ නුඹ හා සමග සාක්ෂිභාවය කරන්නෙමියි කීයේය. එකල රජ කියන්නේ, පින්වත් යක්ෂය නුඹ වනාහී මට ගති-යක්ද නෑයෙක්ද, පිහිටක්ද, මිත්‍රයෙක්ද වූයේය, දෙවතාවෙක්ද වූයේය, මම බැඳැදිලිඇතිව නුඹ යාඥාකරමි, නැවතත් නුඹ දැකීමට මම කැමතිවෙමියි කීයේය.

59. සචෙ තුවං අස්සද්ධො භවිස්සසි
කදරියරූපො විප්පටිපන්නචිත්තො,
තෙනෙව මං න ලච්ඡසි දස්සනාය
දිස්වා ච තං නාපි ච අ ලපිස්සං

60. සචෙ තුවං භවිස්සසි ධම්මගාරවො
දනෙ රතො සඞ්ගහිතත්තභාවො
ඔපාණහුතෝ සමණබ්‍රහ්මණානං
එවං මමං ලච්ඡසි දස්සනාය.

61. දිස්වා ච තං ආලපිස්සං භද්දන්තෙ
ඉමිඤ්ච සූලතො ලහුං පමුඤ්ච,
යතො නිදනං අකරිම්හ සක්ඛිං
මඤ්ඤමං සූලාවුතකස්ස කාරණා

62. තෙඅඤ්ඤමඤ්ඤං අකරිම්හ සක්ඛිං
අයඤ්ච සූලවුතො ලහුං පමුත්තො,
සක්කච්ච ධම්මානි සමාචරන්තෝ
මුච්චෙය්‍ය සො නිරයා ච තම්හා.

59. සචෙ, ඉදින්; තුවං, තෝ; අස්සද්ධා භවිස්සසි, අශ්‍රද්ධාවත් වන්නෙහිනම්; කදරියරූපො, තද මසුරු ස්වභාව ඇත්තෙහි නම්; විප්පටිපන්නචිත්තො, මිත්‍යාප්‍රතිපන්න සිත් ඇතිවන්නෙහි නම්; තෙ න එව, ඒ හේතුවෙන්ම; මං, මා; දස්සනාය, දැකීමට; නලච්ඡසි, නොලබන්නෙහිය; තං, නුඹ; දිස්වාව, දැකද; නාපිව ආලපිස්සං, කථාද නොකරන්නෙමි.

60. සචෙ, ඉදින්; තුවං, තෝ; ධම්මගාරවො, කුශලධර්මයෙහි ගෞරව ඇත්තේ; භවිස්සසි, වන්නෙහි නම්; දනෙ,

Non-commercial distribution

දන්දීමෙහි; රතො, ඇලුණේවීනම්; සඞ්ගහිතත්තභාවො, ශරීරයෙහි ආදීනව සලකන්නේවීනම්; සමණ බ්‍රාහ්මණානං, මහණ බමුණන්ට; ඔපානභූතො, පැන් සලක්මෙන් වන්නෙහි නම්; එවං, එසේ ඇතිකල්හි; මමං, මා; දස්සනාය, දක්නට; ලච්ඡසි, ලබන්නෙහිය.

61. තං, නුඹ; දිස්වාව, දැකද; ආලිපිස්සං, කථාකරන්නෙමි; තෙ, යුෂ්මතාට; භද්දං, යහපතක් වේවා; යතොනිදනං, යමකු නිමිත්තකොට; සක්ඛිං අකරිම්හ, සාක්ෂි කෙළෙමුද; සූලවුතකස්ස, හුලසිටි පුරෂයාවෙත (යාම); කාරණා, හෙතු කොටයයි; මඤ්ඤම, සිතමු; ඉමංව, මේ පුරුෂයාද, සූලතො, හුලෙන්; ලහුං, වහා; පමුඤ්ච, මුදව.

62. තෙ, ඒ (අපි); අඤ්ඤමඤ්ඤං, එකිනෙකා; සක්ඛිං, අකරිම්හ, සාක්ෂිකෙළෙමුද; සූළාවුතො, හුලහිඳින; අයඤ්ච, මේ තෙමේද; ලහුං, වහා; පමුත්තො, මිදුණේවීනම්; සො, හෙතෙම; සක්කවිවං, සකස්කොට; ධම්මානි. කුශලධර්මයන්; සමාචරන්තො, මනාසේ කරමින්, තම්භානිරයාව්, ඒ නිරාදුකිනුත්; මුච්චෙය්‍ය, මිදෙන්නේය.

එකල දෙවතාවා කියන්නේ, මහරජ ඉදින් තොපි ශ්‍රද්ධා නැත්තාහුවීනම් තද මසුරුවූවාහු නම් මිත්ථ්‍යාදෘෂ්ටියට පිළිපන්සිත් ඇති වූවාහු නම් හෙවත් ධාර්මික ප්‍රතිපදව හැරදමා අධර්ම ප්‍රතිපදවට පිළිපන්නාහු නම් ඒ හෙතුවෙන්ම මා දැකීමට නොලබන්නාහුය, දුටුවත් මම තොපට කථා නොකරන්නෙමි, ඉදින් තොපි කුශලධර්මයෙහි ගෞරව ඇතිවන්නාහු නම් දන්දීමෙහි ඇලුණාහු නම් ශරීරයෙහි ආදීනව සලකන්නාහු නම් මහණ බමුණන්ට දන්දීමෙන් පැන්සැලක්මෙන් වන්නාහු නම් මෙසේ ඇති කල්හි මා දක්නට ලැබෙන්නාහුය, දැක නුඹට මම කථා කරන්නෙමි, නුඹට වැඩක්ම වේවා, යම් හුලසිටි පුරුෂයකු ලහට ඒම හෙතුකොටගෙන අපි සාක්ෂිභාවය කෙළෙමුද එහෙයින් මේ පුරුෂයා උලෙන් වහා මුදනු මැනව, ඒ අපි එකිනෙකා සාක්ෂිභාවය කෙළෙමුද ඊට හෙතුවූ හුළ අවුණා සිටින මේ තැනැත්තේ වහාම මිදෙව්වේනම් එතෙම මනාව කුශලධර්මයෙහි යෙදීමෙන් ඒ නිරයේ දුකිනුත් මිදෙන්නේය.

Non-commercial distribution

63. කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයං
කප්පිනකඤ්ච උපසංකමිත්වා,
තෙනෙව සහ සංවිභජිත්වා කාලෙ
සයම්මුඛෙනුපනීසජ්ජ පුච්ඡ.

64. සො තෙ අක්ඛිස්සති එතමත්ථං
තමෙව භික්ඛුං උපසඞ්කමිත්වා,
පුච්ඡස්සු අඤ්ඤත්ථිකො නොව පදුට්ඨචිත්තො
සො තෙ සුතං අසුතං චාපි ධම්මං
සබ්බම්පි අක්ඛිස්සති යථා පජානං
සුතො ච ධම්මං සුගතිං අක්ඛිස්ස.

65. සො තත්ථ රහස්සං සමුල්ලපිත්වා
සක්ඛිං කරිත්වාන අමානුසෙන,
පක්කාමි සො ලිච්ඡවිනං සකාසං
අථබ්‍රැවී පරිසං සන්නිසින්නං

63. අඤ්ඤත්‍ර, අන්තැනක; වෙදනීයං, විඳදයුතුවූ; කම්මං, අකුශල කර්මයක්; සියා වන්නේය; තෙනෙවසහ, ඔහු හා සමගම; කාලෙ, සුදුසු කාලයෙහි; කප්පිනංච, කප්පිනක තෙරණුවන් වෙත; උපසංකමිත්වා, පැමිණ; උපනිසජ්ජ, හිඳ; සංවිභජිත්වා, දන සංවිභාගකොට; සයම්මුඛෙන, ස්වමුඛයෙන්ම; පුච්ඡ, විචාරව.

64. සො, හෙතෙම; තෙ, නුඹට; එතං අත්ථං, මේ කරුණ; අක්ඛිස්සති, කියන්නේය; තං එව භික්ඛු, ඒ භික්ෂුව වෙතම; උප සංකමිත්වා, එළඹ; අඤ්ඤත්ථිකො, දැනගනුකැමැත්තේ; නොව පදුට්ඨචිත්තො, දූෂිතනුවූ සිත් ඇතිව; පුච්ඡස්සු, විචාරව; සුතො, බහුශ්‍රැතවූ; සො, හෙතෙම; තෙ, යුෂ්මතා විසින්; සුතං, අසනලද්දවූද; අපි, නැවත; අසුතංච, නොඅසනලද්දවූද; සබ්බම්පිධම්මං, සියලුම කුශලධර්මය; යථා පජානං, දත්පරිද්දෙන්; අක්ඛිස්සති, කියන්නේය; සුගතිං, සුගතිගාමීවූ; ධම්මං, ධර්මය; අක්ඛිස්ස, කියන්නේය.

65. සො, ඒ රජතෙම; තත්ථ, එහිදී; අමානුසෙන, අමනුෂ්‍යයා හා සමග; රහස්සං, රහසින්; සමුල්ලපිත්වා, කථාකොට; සක්ඛිං, කරිත්වාන, සාක්ෂිකොට ගෙන; ලිච්ඡවිනං සකාසං,

Non-commercial distribution

ලිච්ඡවීන්ගේ සමීපයට; පක්කාමි, ගියේය; අථ, නැවත; සො, ඒ ලිච්ඡවී රජතෙම; සන්නිසින්නං, රැස්වහුන්නාවූ; පරිසං, පිරිසට; අබ්‍රැවී, කීයේය.

අන්තැනක විඳියයුතු අකුශලකර්මය වන්නේය; එහෙයින් කප්පිනක නම් තෙරණුවන් වෙත එළඹ ඒ උලසිටිය පුරුෂයා හා සමග යුදුසු කාලයෙහි දනසංවිභාගය කොට අන්පුරුෂයන් නොයවා ස්වකීය මුඛයෙන්ම කරුණු විචාරව, ඒ තෙරුන්වහන්සේ මේ කාරණය තොපට කියන්නාහ, නුඹ ඒ භික්ෂුව වෙතම පැමිණ දූෂිත සිත්නැතිව කරුණු දැනගන්නා කැමැතිව විචාරව, ඒ තෙරණුවෝ තොප විසින් පෙර ඇසුවාවූද නොඇසුවාවූද ධර්මය දත් පමණින් කියා දෙන්නාහුය, බහුශ්‍රැතවූ ඒ භික්ෂූන් වහන්සේ සුගතිගාමීවූ කුශලධර්මය තොපට කියාදෙන්නාහුයයි කීයේය. එකල්හි ඒ රජතෙම අමනුෂ්‍යයා හා සමග රහසින් කථා කොට ඔහු සංක්ෂිප්තකොටගෙන ලිච්ඡවිරාජ පිරිසවෙත ගියේය. රැස්වසිටි ලිච්ඡවි පිරිසට මෙසේ කීයේය.

66. සුණන්තු හොන්තො මම එකවාක්‍යං
වරං වරිස්සං ලභිස්සාමි අත්ථං
සූලාවුතො පුරිසා එද්දකම්මො
පනිහිතදණ්ඩො අනුසත්තරූපො
එත්තාවතා වීසති රත්තිමත්තා
යතො ආවුතො නෙව ජීවති න මතො.

67. තාහං මොචයිස්සාමිදානි
යථාමති අනුජානාතු සඩ්ඝො,
එතඤ්ච අඤ්ඤං ච ලහුං පමුඤ්ච
කො තං වදෙථාති කථාකරොන්නං
යථා පජානාසි කථාකරොහි
යථාමති අනුජානාති සඩ්ඝො.

68. සො තං පදෙසං උපසඩ්කමිත්වා
සූලාවුතං මොචයි බ්‍රිප්පමෙව,
මා භායි සම්මාති ච තං අවොච
තිකිච්ඡකානඤ්ච උපට්ඨපෙසි

Non-commercial distribution

69. කප්පිනඤ්ච උපසංකම්ත්වා
තෙන සමං සංවිහජිත්වා කාලෙ,
සයම්මුඛෙනුපනිසජ්ජ ලිච්ඡවී
තථෙව පුවජී නං කාරණත්ථිකො.

70. *සූලාවුතො පුරිසො එද්දක්ඛිමෙො
පනිහිතදණ්ඩො අනුසත්තරූපො,
එත්තාවතා වියති රත්තිමත්තා
යතො ආවුතො නෙව ජීවති න මතො.

66. හොන්තො, පින්වතුනි; මම, මාගේ; එකවාක්‍යං, එක් වචනයක්; සුණන්තු, අසත්වා; වරං, වරයක්; වරිස්සං, යදින්නෙමි; අත්ථං, කැමැතිවනලද අර්ත්ථය. ලභිස්සං, ලබන්-නෙමි; එද්ද කම්මො, රෞද්‍ර කියා ඇති; පනිහිතදණ්ඩො, කරන ලද ශරීර දඩුවම් ඇති; සූලාවුතො පුරිසො, හුලනිබූ පුරුෂතෙම; අනුසත්ත රූපො, (රජුකෙරෙහි) ඇලුණු ස්වභාව ඇත්තේය; යතො, යම් දිනක පටන්; ආවුතො, හුලහිදුවන ලද්දේද; එත්තාවතා, මෙතාක්; වීසතිරත්තමත්තා, විසිරැයක් පමණ (ඉක්මගිය)හ; නෙවජීවති, නොමජිවත්වෙයි; නමතො, මෙළේද නොවේ.

67. අහං, මම; තං, ඔහු; ඉදානි, දැන්; මොචයිස්සාමි, මුදවන්නෙමි; සඩ්ඪො, සමූහයා; යථාමති, කැමැතිපරිද්දෙන්; අනු ජානාතු, අනුදනීවා: එතංච, මොහුද; අඤ්ඤංච, (රාජාඥාකළ) අනිකාද; ලහුං, වහා; පමුඤ්ච, මුදනු මැනවි; තථාකරොන්තං, එසේ කරන්නාවූ; තං, ඔබට; කො, කවරෙක් නම්; වදෙථ ඉති. (එසේ නොකරවයි කියා) කියන්නේද; යථාපජානාසි, යම්සේ දන්නෙහිද; තථා කරොහි, එසේ කරනු මැනවි; යථාමති, රුචි පරිද්දෙන්; සංඝො, සමූහයා; අනුජානාති, අනුදනියි.

68. යො, ඒ රජතෙම; තංපදෙසං, ඒපෙදෙසට; උපසඩ්ක මිත්වා, එළඹ; සූලාවුතං, හුලසිටි පුරුෂයා; බිජ්පං එව, වහාම; මොචයි, මිදවිය; සම්ම, යහළුව; මාභායි, බියනොවෙවයි කියාද: තං, ඔහුට; අවොච, කීයේය; තිකිච්ඡකානංච, වෙදුන්ද; උපට්ඨ පෙසි; එලවා තැබීය.

Non-commercial distribution

69. කාරණත්ථිකෝ, කරුණං දානගහනකාමත්ථූ; ලිච්ඡවී, ලිච්ඡවී රජතෙම; කාලෙ, සුදුසු කාලයෙහි; තෙනසමං, ඔහු හා සමග; කප්පිනකංව, කප්පිනා තෙරණුවන් වෙත; උපසංකමිත්වා, එළඹ; සංවිභජිත්වා, දානසංවිභාගකොට; සයම්මුඛෙන, ඉදිරියෙහි; උපනිස්සජ්ජ, හිඳ; තථෙව, එසේම; නං, උන්වහන්සේ අතින්; පුච්ඡි, විචාළේය.

පින්වතුනි මාගේ එක වචනයක් අසත්වා, මා විසින් කැමති වනලද අදහසක් ලබන්නෙම් නම් උතුම්, රෞද්‍ර ක්‍රියා ඇතිව කරනලද ශරීර දඩුවම් ඇති හුල තැබූ පුරුෂතෙමේ දැන් රජු කෙරෙහි ඇලුණ ස්වභාව ඇත්තේය, යම්දිනක පටන් හුලතැබීද එතැන් පටන් මොහුට විසිරියක් පමණකල් ඉක්මගියහ, මොහු ජීවත්වන්නේත් නොවෙයි. මැරුණේත් නොවෙයි. ඔහු දැන් මා රුචි පරිද්දෙන් මුදවාහරින්නෙමි, ඊට මෙහි රැස්වසිටින සමූහයා අනුදනීවායි රජ කීය, මේ හුලඅවුණා සිටින පුරුෂයාද රාජාඥකළ අනිත් තැනැත්තාද වහා මුදව, එසේ ඔවුන් මිදවීම කරන්නාවූ නුඹවහන්සේට මේ වැදෑරට කවරෙක් නම් ඔවුන් නුමුදවයි කියා කියන්නේද එසේ කීමට කිසිවෙක්වත් නොලබයි, එසේද වුවත් දත්පරිදි කරනු මැනවයි කියා සමූහයාද රජුගේ අදහසට එකඟ විය. ඒ රජතෙම ඒ ප්‍රදෙශයට එළඹ හුලසිටි පුරුෂයා වහාම මුදවා යහලුව තෝ බියනොවෙවයි කියා වෙදුන්ට බාරදී සංග්‍රහ කෙළේය. පසුව ඒ ලිච්ඡවී රජතෙම ඔහු හා සමග සුදුසු කාලයෙහි දානසංවිභාගය කොට කප්පිනක තෙරණුවන් වෙත එළඹ ඉදිරියෙහි හිඳ කරුණු දානගනු කැමතිව උන්වහන්සේට මෙසේ කීයේය. රෞද්‍ර ක්‍රියා ඇති කරන ශරීර දඩුවම් ඇති රජු කෙරෙහි ඇලුණ ස්වභාව ඇතිව හුල අවුණා සිටි පුරුෂයාට විසි රියක් පමණ ඉක්මගියේය, යම් හෙතුවකින් හුලසිටි පුරුෂයා තවම ජීවත්නොවී ජීවත්වෙයි, මැරුණේත් නොවෙයි.

71.. සො මොචිතො ගන්ත්වා මයා ඉදානි
එතස්ස යක්ඛස්ස වචොහි භන්තෙ,
සියා නු ඛො කාරණං කිඤ්චි දෙව
යෙන ඉසා නිරයං නො වජෙය්‍යා.

Non-commercial distribution

72. ආචික්ඛ භන්තෙ යදි අත්ථි හෙතු
සද්ධායිතං හෙතු වචො සුණොම,
න තෙසං කම්මානං විනාසමත්ථි
අවෙදයිත්වා ඉධ බ්‍යන්තිභාවො.

73. සචෙ සො කම්මානි සමාචරෙය්‍ය
සක්කච්ච රත්තින්දිව මප්පමත්තො,
මුච්චෙය්‍ය සො නිරයා ච තම්හා
කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයං.

74. අඤ්ඤතො එසො පුරිසස්ස අත්ථො
මමම්පි දනි අනුකම්ප භන්තෙ,
අනුසාස මං ඔවද භූරිපඤ්ඤ
යථා අහං නො නිරයං වජෙය්‍යං.

71. භන්තෙ, ස්වාමීනි; මයා, මා විසින්; ගන්ත්වා, ගොස් ඉදනි, දැන්; සො, ඒ පුරුෂතෙම; මොචිතො, මුදවනලදි; එතස්ස යක්ඛස්ස, මේ යක්ෂයාගේ; වචොහි, වචනමැයි; යෙන, යම් හෙතුවකින්; සො, හෙතෙම; නිරයං, නරකයට; නොවජෙය්‍ය, නොයන්නේද; කිංචිඵව කාරණං, කිසියම් කරුණක්; සියානුබොා, වන්නේද.

72. භන්තෙ, ස්වාමීනි; යදි, ඉදින්; හෙතුඅත්ථි, කරුණක් ඇත්තේනම්, ආචික්ඛ, කියනු මැනවි; සද්ධයිතං, ඇදහියයුතුවූ; හෙතුවචො, හෙතුයුක්ත වචනය; සුණොම, අසමු; ඉධ, මෙහිදී, (කළ); තෙසං කම්මානං, ඒ කර්මයන්ගේ (විපාක); අවෙදයිත්වා, නොවිඳ; විනාසං, වැනසීමක්ද; බ්‍යන්තිභාවො, ගෙවීමක්ද; න අත්ථි, නැද්ද.

73. සචෙ, ඉදින්; සො, හෙතෙම; කම්මානි, කුශලකර්මයෙහි; සමාචරෙය්‍ය, මනාව හැසිරෙන්නේනම්; සක්කච්චං සකස්කොට; රත්තින්දිවං, දිවාරාත්‍රී දෙක්හි; අප්පමත්තො, අප්‍රමාදවන්නේ නම්; සො, හෙතෙම; කම්මාචනිරයා, ඒ නිරාදුකින්; මුච්චෙය්‍ය, මිදෙන්නේය; කම්මං, අකුශලකර්මය; අඤ්ඤත්‍ර, (අපරාපරියවශයෙන්) අන්තැනකදී; වේදනීයං සියා, විඳිදයුතු වන්නේය.

Non-commercial distribution

74. භන්තෙ. ස්වාමීනි; පුරිසස්ස, (ඒ) පුරුෂයාගේ; එසො අත්ථො, මේ අර්ථය; අඤ්ඤතො, දැන ගන්නා ලදි; ඉදනි, දැන්; මමම්පි, මටද; අනුකම්ප, අනුකම්පා කළමැනව; භූරි-පඤ්ඤ. බොහෝ නුවණැතියන් වහන්ස; යථා, යම්සේ; අහං, මම; නිරයං, නිරයට; නොවජෙය්‍යං, නොයන්නෙම්ද (එසේ); මං, මට; අනුසාස, අනුශාසනා කරනුමැනව; ඔවද, අවවාද කරනු මැනව.

ස්වාමීනි දැන් ගොස් මා විසින් හුලසිටි ඒ පුරුෂයා මුදවන ලද්දේය, ස්වාමීනි මම ඒ ප්‍රෙතයාගේ වචනයෙන් එසේකෙළෙමි, යම් හේතුවකින් ඒ හුලසිටිය පුරුෂයා නරකයට නොයන්නේ වේද. එබඳු කිසියම් කරුණක් ඇතිවත්නේනම් කියනු මැනව. ස්වාමීනි ඇදහියයුතු කරුණු සහිත වචනය අපි අසමු, මෙහිදී කරනලද ඒ පාපකර්මයන්ගේ විපාක නොවිඳ වැනසීමක් ගෙවීමක් නම් නැද්ද? මහරජ ඉදින් ඔහු දිවාරාත්‍රී දෙක්හි අප්‍රමාදව මනාසේ කුශලධර්මයෙහි හැසිරෙන්නේ වීනම් ඔහු ඒ නිරාදුකින් මිදෙන්නේය, ඒ පාපකර්මයෙහි යම් කර්මයක් උප-පද්‍යවෙදනීය වේද හෙවත් දෙවෙනි ආත්මයෙහි විපාකදේද ඒ කර්මය අහොසි කර්මවේ, යම් කර්මයක් සසර පැවැත්ම ඇති කල්හි අපරාපරීය වශයෙන් විඳිය යුතු විපාක ඇත්තේද, එය අන්‍යජාතියක විඳදයුතු වන්නේයයි වදළහ. එකල රජ කියන්-නේ, ස්වාමීනි ඒ පුරුෂයාහට වන මේ වැඩ දැන් මවිසින් දැනගන්නා ලදී, බොහෝ නුවණැතියන් වහන්ස දැන් මටත් අනුකම්පාකරනු මැනව, මම යම් පරිද්දකින් නිරයට නොයම්නෙම්ද එලෙස මට අවවාද අනුශාසනා කරනු මැනවැයි කීයේය.

75. අජ්ජෙව බුද්ධං සරණං උපෙහි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො,
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩඵුල්ලානි සමාදියස්සු.

76. පාණාතිපාතා විරමස්සු ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජ යස්සු,
අමජ්ජපො මා ච මුසා අභාසි
සකෙන දාරෙන ච හොහි තුට්ඨො
ඉමඤ්ච අරියං අට්ඨඞ්ග වරෙනුපෙකං
සමාදියාහි කුසලං සුබුද්‍රයං.

Non-commercial distribution

77. චීවරං පිණ්ඩපාතඤ්ච-පච්චයං සයනාසනං,
අන්නං පානං බාදනීයං- වත්ථසෙනාසනානි ච.

78. දදහි උජුභූතෙසු-විප්පසන්නෙන චෙතසා,
භික්ඛූ ච සීලසම්පන්නෙ-වීතරාගෙ බහුස්සුතෙ,
තප්පෙහි අන්නපානෙන-සද පුඤ්ඤං පවඩ්ඪති.

79. එවඤ්ච කම්මානි සමාචරන්තෝ
සක්කච්ච රත්තින්දිවමප්පමත්තෝ,
මුඤ්ච තුවං නිරයාව තම්හා
කම්මං සියා අඤ්ඤත්‍ර වෙදනීයං.

75. පසන්නචිත්තෝ, පහන්සිත් ඇතිව; අජ්ජඑව, අදම; බුඩං, බුදුන්ද, ධම්මංච, ධර්මයද; සඩ්ඝංච, ආර්‍ය්‍ය සංඝයාද; සරණං, පිහිට කොට; උපෙහි, යව; තථෙව, එසේම; සික්ඛාය, ශික්ෂාව පිළිබඳවූ; පදනිපංච, පදපසද; අඛණ්ඩඵුල්ලානි, ඛණ්ඩඵුල්ල නොකොට; සමාදියස්සු, සමාදන්වෙව.

76. පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; බිප්පං, වහා; විරමිස්සු, වෙන්වෙව; ලොකෙ, ලොකයෙහි; අදින්නං, නුදුන්දෙය; පරිවජ්ජයස්සු. දුරුකරව; අමජ්ජපෝ, මත්පැන් බොන්නෙක් නොවෙව; මුසා, බොරු; මාවඅහාසි, නොකියව; සකෙනදරෙනව, ස්වකීය භාර්‍ය්‍යාව සමඟ; තුට්ඨොහොහි, සතුටුවෙව; කුසලං, නිරවද්‍යවූ: සුබුද්‍රයං, සැපවිපාකවූ; අරියං, ආර්‍ය්‍යවූ; ඉමංච අට්ඨඞ්ගඋපොසථං වරෙන උපෙතං, මේ උත්තම අෂ්ටාඞ්ගයකින් යුක්තවූ උපොසථ ශීලයද; සමාදියාහි, සමාදන්වෙව.

77-78. චීවරං, සිවුරුද; පිණ්ඩපාතංච, පිණ්ඩපාතයද, පච්චයං, ගිලානප්‍රත්‍යයද; සයනාසනං, සෙනාසනද; අන්නං, ආහාරද; පානං, පානවර්ගද; බාදනීයං, කෑයුතුදෑද; වත්ථසෙනාසනානිච, වස්ත්‍ර හා සෙනසුන්ද; විප්පසන්නෙන චෙතසා, විශෙෂයෙන් ප්‍රසන්නසිතින් යුක්තව; උජුභූතෙසු, සෘජුව පිළිපන්නවුන් විෂයෙහි; දදහි, දෙව; සීලසම්පන්නෙ, සිල්වත්වූ; වීතරාගෙ, පහකළ රාග ඇති; බහුස්සුතෙ, බහුශ්‍රැතවූ; භික්ඛුව, භික්ෂූන්ද; අන්නපානෙන, ආහාරපාන වර්ගයන්; තප්පෙහි, සතප්පව; සද, සෑමකල්හි; පුඤ්ඤං පවඩ්ඪති, පින්වැඩෙයි.

Non-commercial distribution

79. එවංව, මෙසේම; කම්මානි, කුශලකර්මයන්; සමාචරන්තො, මනාවකරමින්; සක්කච්චං, සකස්ව; රත්තින්දිවං, රෑ දවල්හි; අප්පමත්තො, අප්‍රමාදවූවාවූ; තුවං, තෝ; තම්හාව නිරයා; ඒ නිරා දුකිනුත්; මුඤ්ච. මිදෙව, කම්මං, අකුශල කර්මය; අඤ්ඤත්‍ර, අන් තැනකදී; වෙදනීයංසියා, විඳදයුතු වන්නේය.

එවිට තෙරුන්වහන්සේ වදළසේක්, මහරජ තොපි අදම පහන්සිත් ඇතිව බුත්සරණ දහම්සරණ සඟසරණද යව්, එසේම පන්සිල්පද නොකඩව සමාදන්ව රකිව්, ප්‍රාණඝාතයෙන් වහාම වලකිනු, ලොකයෙහි සොරකම දුරුකරනු, මත්පැන් පානය නොකරනු, බොරු නොකියනු, ස්වකීය භාර්‍යාව හා සම්ගම සතුටුවෙනු, නැවත බොහෝ සැප විපාකදෙන කුශලයක් වූ පිරිසිදු අර්ත්ථයෙන් ආර්‍යවූ උතුම් අඞ්ග අටකින් යුත් මේ උපොෂථ ශීලයද සමාදන්වනු, චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යන සිව්පසය හා ආහාරපානද කෑයුතුදේ හා වස්ත්‍ර සෙනසුන්ද සෘජුව පිළිපන්නවුන්ට පිරිසිදු සිතින් යුක්තව දෙව, ශීල සම්පන්නවූ භික්ෂූන්වූ බහුශ්‍රැතවූ රහතන් වහන්සේලාත් ආහාර පානයෙන් එලඳව, තොපට සෑමකල්හි පින් වැඩෙයි, එකවරක් පිනක්කොට මෙපමණකින් පමණයයි සිතා ආශ්වර්‍යය සතුටුසිත් ඇතිනොවී තවතව කුසල් පුරන්නාහට සඳකල්හි පින්වැඩෙයි, නොහොත් අනික් අනික් සුචරිත පුරන්නාහට පිනයයි කියන ලද පුණ්‍ය විපාකය මතුමත්තෙහි වැඩෙයි. මෙසේ තොපි දිවා රාත්‍රී දෙක්හි අප්‍රමාදව මනාව කුශලකර්මයන් කරමින් ඒ නිරාදුකිනුත් මිදෙව්, තොප විසින් විපාක විඳියයුතු අකුශලකර්මය අන් තැනකදී විපාක දෙන්නේයයි කියා වදළහ.

80. *අජ්ජේව බුද්ධං සරණං උපෙමි
ධම්මඤ්ච සඞ්ඝඤ්ච පසන්නචිත්තො,
තථෙව සික්ඛාය පදානි පඤ්ච
අඛණ්ඩඵුල්ලානි සමාදියාමි.

81. *පාණාතිපාතා විරමාමි බ්‍රිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි
අමජ්ජපො නොච මුසාභණාමි
සකෙන දරෙන ච හොමි තුට්ඨො
ඉමඤ්ච අරියං අට්ඨඞ්ගවරෙතුපෙතං
සමාදියාමි කුසලං සුබුද්‍රයං.

Non-commercial distribution

82. *චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං,
අන්නපානං ඛාදනියං–වත්ථසෙනාසනානි ච

83. භික්ඛු ච සීලසම්පන්නෙ චිතර ගෙ බහුස්සුතෙ,
දදමි න විකප්පාමි බුඩානං සාසනෙ රතො.

84. එතාදිසො ලිච්ඡවි අම්බසක්ඛරො
වේසාලියං අඤ්ඤතරො උපාසකො,
සඩො මුදු කාරකරො ච භික්ඛු
සඩිඝඤ්ච සක්කච්ච තදා උපට්ඨහි.

85. සූලාවුතො ච අරොගො හුත්වා
පෙරි සුඛී පබ්බජ්ජං උපාගමි,
භික්ඛුඤ්ච ආගම්ම කප්පිනකුත්තමං
උභොපි සාමඤ්ඤ ඵලානි අජ්ඣගූං.

86. එතාදිසා සප්පුරිසාන සෙවනා
මහප්ඵලා හොති සතං විජානතං,
සූලාවුතො අග්ගඵලං අඵස්සයි
ඵලං කනිට්ඨං පන අම්බසක්ඛරො–කි.

83. බුඩානං, බුදුන්ගේ;සාසනෙරතො, සස්නෙහි ඇලුණාවූ (මම); සීලසම්පන්නෙ, සිල්වත්වූ; බහුස්සුතෙ, බහුශ්‍රැතවූ; චිතරාමෙ, රහත්වූ; භික්ඛුව, භික්ෂූන්ටද; දදමි, දෙමි; නවිකප්පාමි සිව්පසයදීම කඩනොකරමි.

84. එතාදිසො, මෙබඳුවූ; අම්බසක්ඛරො ලිච්ඡවී, අම්බසක්ඛර නම් ලිච්ඡවීරජතෙම; තද. එකල්හි; වෙසාලියං, විසාලාමහනුවර; සඩො, ශ්‍රද්ධාවත්වූ; මුදු. මෘදුවූ සිත්ඇති; අඤ්ඤතරො උපාසකො එක්තරා උපාසකයෙක්වී; කාරකරො, උපකාරකාරී වූයේ; භික්ඛු සංඝංව, භික්ෂුසංඝයාටද; සක්කච්චං, සකස්ටෙ;ක, උපට්ඨහි, උපස්ථාන කෙළේය.

85. සූලාවුතොව, හුලහුන් පුරුෂයාද; අරොගොහුත්වා, නිරොගිව; පෙරි. ස්වෙච්ඡාරිවූයේ; සුඛී. සුවපත්වූයේ; කම්පිනකුත්ත මං. උතුම් කප්පිනාකනමවූ; භික්ඛුංච, භික්ඛුවවෙත; ආගම්ම. අවුත; පබ්බජ්ජං, පැවිද්දට; උපාගමී, පැමිණියේය; උභොපි, දෙදෙනම, සාමඤ්ඤඵලානි. (සුදුසු පරිද්දෙන්) ශ්‍රාමණ්‍ය ඵලයන්ට; අජ්ඣ ගූං, පැමිණියාහුය.

Non-commercial distribution

86. සප්පුරිසානං, සත්පුරුෂයන්ගේ; සෙවනා, ආශ්‍රය; විජානතං, කරුණු දත්තාවූ; සතං, සත්පුරුෂයන්හට; එතාදිසා, මෙ බඳුවූ; මහප්ඵලා හොති, මහත් ආනිසංස ඇතිවෙයි; සුලභා-වුතො, හුලසිටි පුරුෂතෙමේ; අග්ගඵලං' අර්හත්ඵලයද; අම්බසක්ඛරො පන, අම්බසක්ඛරතෙම වනාහි; කනිට්ඨඵලං, කනිෂ්ඨඵලය (හෙවත්) සෝවාන්ඵලයද; අඵස්සයි ඉති, ලැබුයේය.

මෙසේ තෙරණුවන් විසින් වදරනලද්දවූ රජතෙමේ අපාය දුකින් බියවූ සිත් ඇතිව තුණුරුවන් කෙරෙහි හා කුශලධර්මයෙහිත් මනාව වැඩුණ ප්‍රසාදසින් ඇතිව එතැන්සිට කියන්නේ, ස්වාමීනි මම මෙකලම පහන් සිතැතිව බුදුන් දහම් සඟුන් සරණ කොට යෙමි, එසේම පඤ්චශීලය නොකඩවා සමාදන්ව රකිමි. මම ප්‍රාණඝාතයෙන් වහාම වෙන්වෙමි, අදත්තාදානය දුරුකරමි, මත්පැන් නොබොමි, බොරු නොකියමි, ස්වකීය භාර්‍යාවගෙන්ම සතුටුවෙමි, සැපව්පාකදෙන කුශලයක්වූ අඩඟ අටකින් යුත් මේ ආර්‍ය්‍ය උපොසථ ශීලයද සමාදන්වෙමි, වීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසයද ආහාර පාන ඛාද්‍ය වස්ත්‍ර සෙනසුන්ද සිල්වත් බහුශ්‍රැත රහත් භික්ෂූන්ට දෙමි, දන්දීම කඩ නොකරමි, බුදුසස්නෙහි ඇලුණේවෙමියි කියේය. යටකියන ලද ස්වභාවය ඇති අම්බසක්ඛර නම් ලිච්ඡවි රජ-තෙමේ එකල්හි විශාලාමහනුවර නොයෙක් දහස්ගණන් උපාසකයන් අතුරෙන් එක්තරා උපාසකයෙක්වී කල්‍යාණමිත්‍රා-ශ්‍රයෙන් ශ්‍රද්ධාසම්පන්නව මෘදුගුණ ඇතිව භික්ෂු සඞ්ඝයාහට උපකාරකාරයෙක්ව මනාසේ සිව්පසයෙන් උපස්ථාන කළේය. පළමු වනාහි ශ්‍රද්ධානැති කකීශවූ ඒ රජතෙම භික්ෂූන්ට අක්‍රෝ-ශකරන්නෙක්ද සංඝයාහට උපස්ථාන නොකරන්නෙක්දවිය. දැන් වනාහි ශ්‍රද්ධාවත් මොලොක් සිතැති උපකාර කරන්නෙක්දවී භික්ෂු සංඝයාට මනාව උපස්ථාන කෙළේය. හුලසිට පුරුෂ-තෙමේද නිරොගිවී තමාලත් සුවය ඇතිව උතුම්වූ කප්පිනක නම් රහතන්වහන්සේ වෙත එළඹ පැවිදිවූයේය, දෙදෙනම සුදුසු පරිද්දෙන් ශ්‍රාමණ්‍යඵලයන්ට පැමිණියාහ, හෙවත් හුලසිටි පුරුෂයා අග්‍රඵලයවූ රහත්ඵලයටද අම්බසක්ඛර රජතෙමේ සෝවාන්ඵලයටද පැමිණියේය. සත් පුරුෂාශ්‍රයවනාහි කරුණු දත් සත්පුරුෂයන්ට මෙබඳු මහත් ආනිසංස ඇත්තේවෙයයි කීහ.

Non-commercial distribution

මෙසේ රජු හා ප්‍රෙතයා හා තමන් විසිතුත් කියනලද කථා ප්‍රවෘත්තිය ආයුෂ්මත් මහාකප්පින තෙරුන්වහන්සේ බුදුන් වැඳීම පිණිස සැවැත්නුවරට වැඩිසේක් බුදුන්ට සැලකළෝය, ශාස්තෘන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොපත්තිකොට ගෙන පැමිණි පිරිසට ධර්මදේශනා කළසේක. ඒ දෙශනාතොමෝ මහජනයාහට සාර්ත්ථකවිය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි පළමුවන අම්බසක්ඛර ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

මේ සෙරිස්සක ප්‍රෙතවස්තුව වෙයි. ඒ වස්තුව යම් හෙයකින් සෙරිස්සක විමානවස්තුව හා වෙනසක් නැතිවේද, එහෙයින් එහි අර්ත්ථොත්පත්තියෙහි හා ගාථාවලත් යමක් කියයුතුද. ඒ සියල්ල පරමාර්ත්ථදීපනී නම්වූ විමානවස්තු වර්ණනාවෙහි කියනලද්දේමය. එහෙයින් එහි කියනලද නයින්ම ඒ කථාව දතයුතුයි. එහි තිබෙන පරිදි මෙසේය:-

(භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සකල බුද්ධකෘත්‍යයන් නිම කොට පිරිනිවන් පෑ වදළකල්හි ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියනමක් භික්ෂුසඞ්ඝයා පිරිවරකොට ඇතිව සෙතව්‍ය නුවරට වැඩමවා ඇටවෙරිය වනයෙහි වැඩහුන්සේක. එකල්හි තමන් වහන්සේගේ සමීපයට පැමිණියාවූ පායාසිනම් රාජන්‍යයා පරලොව නැත කුසල් නැත අකුසල් නැතැයි කියා ගත් විපරීත දෘෂ්ටියෙන් මුදා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටවූසේක. ඒ රාජන්‍යතෙම එතැන්පටන් කුසල් රැස්කිරීමෙහි ව්‍යාපෘතව දන් දෙන්නේ දන්දීමෙහි පුරුද්දක් නැතිබැවින් දමාපියනදෙයක්සේ සකස්නොකොට දන්දී එයින් සැව චාතුමහාරාජික දිව්‍ය ලොකයෙහි ශූන්‍යවූ සෙරිස්සක නම් රිදී විමනක හුදකලාව උපන්නේය. ඒ සෙරිස්සක විමානය නම් කසුප්බුදුන් සමයෙහි කොලම්බුවක් කොට පූජාකළ පුරුෂයෙකුට පහළවිය. මහ කෙසේදයත්:-

යටගියදවස කසුප් බුදුන් සමයෙහි එක්තරා රහතන් වහන්සේ නමක් එක්තරා ගමෙක පිඬුසිඟාගෙන ගමින් පිටත එක් බිම් පෙදෙසක වැඩහිඳ දවස්පතා ආහාර වළඳනසේක. ඒ තෙරුන් වහන්සේ එක්තරා ගවපාලකයෙක් දැක සිතන්නේ

Non-commercial distribution

මුන්වහන්සේ සුයාමරශ්මියෙන් ක්ලාන්ත වෙයි මෙතැන්හි මඩුවක් කෙළෙම් නම් ඉතා යෙහෙකැයි සිතා සතුටුසිත් ඇතිව මහරි දඩුසතරක් සිටුවා අතුවලින් මඩුවක්කොට දුන්නේය. ඒ මඩුව සමීපයෙහි සෙවන සඳහා මහරිගසකුත් රොපණය කෙළේය. හෙතෙම එයින් පසුකලක කළුරියකොට ඒ කුශලකර්ම හෙතුවෙන් චාතුම්මහා රාජික දෙව්ලොව උපන. ඔහුගේ විමන්දෙර සමීපයෙහි පෙර කරනලද කුශලකර්මය ප්‍රකාශකරනු පිණිස කර්මානුරූප වශයෙන් වර්ණ ගන්ධ සමන්විතවූ හැම කල්හි මලින් සැරසුණාවූ මහවිවනයක් පහළවිය. එහෙයින් ඒ විමානය සෙරිස්සක නම් විය. ඒ දෙව්පුත් නෙමේ එතැන්පටන් බුඩාන්තරයක් මුළුල්ලෙහි සුගතියෙහිම සැරි සරන්නේ මේ බුඩොත්පාදකාලයෙහි දෙව්ලොවින් චුතව මිනිස් ලොව ඉපද ආයුෂ්මත්වූ යසමහ තෙරණුවන්ගේ විමලාදී ගිහි යහළුවන් සිව්දෙනා අතුරෙන් ගවම්පතීනම් යහළුවාවී බුදුන්ගෙන් බණ අසා රහත්ඵලයෙහි පිහිටියේය. උන්වහන්සේ පූර්වාසනා වශයෙන් ජනශූන්‍යවූ ඒ සෙරිස්සක විමානය දැක නිතර දිවා විහරණය පිණිස වඩනාසේක. අපරභාගයෙහි ඒ විමානයෙහි පායාසි දිව්‍යපුත්‍රයා දැක ''ඇවැත්නි තෝ කවරක්ද''යි විචාරා ඔහු විසින් ස්වාමීනි සෙතව්‍ය නුවර පායාසිනම් රාජන්‍යවූ මම වනාහි මේ විමනෙහි උපනිමියි කීකල්හි ''කිමෙක්ද තෝ මිථ්‍යා දෘෂ්ටිගෙන වරදවා හැසුරුණේනොවේද, කවර හෙතුවකින් මෙහි උපන්නෙහිදැ''යි විචාළසේක. එකල්හි උන්වහන්සේට පායාසි දෙවිපුත්තෙම කියන්නේ ''ආයුෂ්වූ කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදනලද්දාවූ මම සකස්නොකොට කුසල්කළ බැවින් ශූන්‍යවූ මේ විමනෙහි හූදකලාව උප නිමි. ස්වාමීනි මිනිස්ලොවට ඇඩිය කල්හි මාගේ පිරිවර ජනයාට මෙසේ කියනුමැනවි. පායාසි රාජන්‍යයා සකස්කොට දන්නොදී හිස්වූ සෙරිස්සක විමානයෙහි උපන්නේය. තොපි මනාසේ කුසල්කරමින් ඔහු සමීපයෙහි ඉපදීමට ප්‍රාර්ථනා කරවියයි කියා කියනුමැනවැ''යි කීය. තෙරණුවෝ ඔහුට අනුකම්පාවෙන් එසේ වදළසේක. ඒ පිරිවර ජනයෝද තෙරණුවන්ගේ කිම අසා එසේම ප්‍රාර්ථනා කාමින් කුසල්කොට ඒ සෙරිස්සක විමානයෙහි උපන්නාහුය. නැවත යම්කිසි රුක් සෙවනක් හෝ වතුර බින්දුවක් හෝ නැති වාලුකා කාන්තාර

Non-commercial distribution

භූමියෙහි මගට පැමිණි මිනිසුන්ට යක්ෂයන්ගෙන් වන උවදුරු නසනු පිණිස වෙසමුණි රජහු සෙරිස්සක දිව්‍යපුත්‍රයා මාර්ගා රක්ෂාවට සිටුවූහ. ඉක්බිති පසුකලෙක අහුමගද දෙරටවාසීවූ වෙළඳුන් සමූහයක් ගැල්දහසක බඩු පුරවාගන සින්ධුසොවීර-දෙශයට යන්නාහු වාලුකා කාන්තාරයට පැමිණ උෂ්ණඍයින් දවල් නොගොස් රෑ නකත්තරු බලා මග යන්නාහු මංමුළාව අනික්දිගට ගියාහුය. ඔවුනතුරෙන් ශ්‍රද්ධාශීල සම්පන්නවූ එම ජාතියෙහි රහන්වීමට හෙතුසම්පත් ඇති එක් උපාසකයෙක් ඇත්තේය. ඔහු මව්පියන් රක්නා පිණිස වස්තුව සොයා වෙළඳමට ගියේය. එකල්හි ඒ සෙරිස්සක දෙවිපුත් තෙම ඒ උපාසකයාහට අනුග්‍රහ කරමින් විමානය හා සමග තමා දැක්වීය. එසේ දක්වා පැන් හා සෙවනක් නැති මේ වාලුකා කාන්තාරයට තොපි කුමක් සඳහා ආවාහුදැයි කියා දෙවුපුත් විසින් විචාරණ ලදුව ඒ වෙළඳහු තමන් ආපවත් කිහ. ඒ දිව්‍යපුත්‍රයාගේ හා වෙළඳුන්ගේත් කථා ප්‍රවෘත්තිය අන්තර්ගත ගාථාවෝ වෙත් මෙහි මුල ගාථා තුන ඒ ගාථාවන්ගේ සම්බන්ධය දැක්වීම පිණිස ධම්ම සංගීතිකාර මහාස්ථවිරයන් විසින් දක්වන ලදහ:-

''සුණාථ යක්ඛස්ස ච වාණිජාන ච
සමාගමෝ යත්ථ තදා අහොසි,
යථා කථං ඉතරීතරෙන වාපි
සුභාසිතං තංච සුණෝථ සබ්බෙ.
යෝ සෝ අහූ රාජා පායාසි නාමෝ
භූම්මානං සහව්‍යගතෝ යසස්සී,
සෝ මොදමානොව සකෙ විමානෙ
අමානුසෝ මානුසෙ අජ්ඣභාසීති.

යන්නෙන් යම්සේ වෙසමුණි රජුගේ පරිචාරිකවූ සෙරිස්සක දිව්‍යපුත්‍රයාගේ හා වෙළඳුන්ගේද යම් වාලුකා කාන්තාර භූමියකදී එක්වීමක් විද. එතන්හිදී ඔවුනොවුන් විසින් මනාව කියනලද යම් කථා ප්‍රවෘත්තියක් ඇතිවිද තොපි සියල්ලෝම එපුවත අසව්. සෙතව්‍යනුවර පායාසිනම් යම් රාජන්‍යයෙක්විද ඒ රාජන්‍යතෙම බ්‍රහ්මාටුදෙවියන් හා එක්ව ආනුභාව සම්පන්නව උපන. ඒ සෙරිස්සක දිව්‍යපුත්‍රයා පිරිවර දෙවතාවන් හා සමග සතුටුව දිව්‍යපඤ්ච කාම සම්පත් වළඳමින් තමාගේ විමනෙහිම සිට වෙළඳ මිනිසුන් දැක මෙසේ කියේය:-

Non-commercial distribution

''වංකෙ අරඤ්ඤෙ අමනුස්සවිථියානෙ
කන්තාරෙ අප්පොදකෙ අප්පභක්ඛෙ,
සුදුග්ගමෙ වඤ්ඤුපථස්ස මජ්ඣේථ
වංකංභයා නථියමිනා මනුස්සා.

නයිධ ඵලා මූලමයාව සන්ති
උපාදනං නත්ථි කුතො ඉධ භක්ඛෙ,
අඤ්ඤත්‍ර පංසූහි ච වාලුකාහි ච
තත්තාහි උණ්හාහි ච දරුණාහි ච

උජ්ජංගලං කත්තමිචං කපාලං
අනායසං පරලොකෙන තුල්‍යං,
ලුද්දන මාවාසමිදං පුරාණං
භූමිප්පදෙසො අභිසත්තරූපො·

අථ තුම්හෙ කෙන වණ්ණෙන
කිම්සමානා ඉමං පදෙසං හි,
අනුප්පවිට්ඨා සහසා සමෙච්ච
ලොභා භයා අථවා සම්පමූළහා''ති.

පින්වත් මනුෂ්‍යයෙනි, මේ කාන්තාරයට පැමිණි මිනිසුන්ට අපගේ ජීවිතය ඇතිවේද නැතිවේද මරණ පැමිණේද දිවිරැක ගෙන යාහැකිවේදැයි කියා සැකඋපදවන්නාවූ නිතර යක්ෂපිශාචාදී අමනුෂ්‍යයන් හැසිරෙන්නාවූ මිනිසුන්ට ගොචරනුවූ සුවසේ යා නොහැකිවූ කනබොනදෑ නැත්තාවූ පැන්ගෙන යා යුතුවූ මේ කාන්තාරයට වැදීමට පළමුවෙන් මිනිසුන්ට බියඋපදවන්නාවූ මේ වාලුකාකාන්තාරය මැද අඹ දඹ කෙහෙල් පොල් ආදි කෑයුතු ඵල මූල ජාතියකුත් නැත්තේය. රළුවූ උණු වැළිත් පසුත් හැර යටත්පිරිසෙයින් ගිනිඵලවනදර පමණවත් නැත්තේය. එහෙයින් කෑයුතු ආහාරයක් මෙහිදී කොයින් ලැබෙද නොලැබෙමය මදක් පඬුවන් රළුවූ තදපස් ඇත්තාවූ රත්කළ අයොමය කබලක් වැනිවූ සත්වයන්ට භයඵලවන්නාවූ අමනුෂ්‍ය සතුරන්ගෙන් ගැවසීගත්තාවූ කිසිසැපතක් පිහිටක් නැත්තාවූ පරලොවක් හෙවත් නරකයක් වැනිවූ පුරාණ පටන් බොහෝකල් මුළුල්ලෙහි යක්ෂයන්ටම වාසස්ථානවූ මේ භූමිප්‍රදෙශයට තොපි කවර කරුණකින් ආවාහුද කවර වස්තුවක් පතා ආවාහුද තොපගේ

Non-commercial distribution

සතුරෙකු විසින් අනතුරු කරනු කැමති ව රටින් නගාහරන ලද්දහුද නොහොත් මංමුළාව ආවාහු දැයි විචාළේය. එබස් අසා වෙළෙන්දෝ මෙසේ කීහු:–

''මගධෙසු අඞ්ගෙසු ච සත්ථවාහා
ආරොපයිස්සං පණියං පුථුත්තං,
තෙ යාමසෙ සින්ධුසොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා.

දිවා පිපාසං අන්ධිවාසයන්තා
යොග්ගානුකම්පං ච සමෙක්ඛමානා,
එතෙන වෙගෙන ආයාම සබ්බෙ
රත්තිං මග්ගං පටිපන්නා විකාලෙ.

තෙ දුප්පයාතා අපරඩමග්ගා
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ,
සුදුග්ගමෙ වණ්ණුපථස්ස මජ්ඣෙ
දිසං න ජානාම පමුළ්හචිත්තා.

ඉදං ච දිස්වාන අදිට්ඨ පුබ්බං
විමානසෙට්ඨඤ්ච තුවඤ්ච යක්ඛ,
තතුත්තරිං ජීවිතමාසමානා
දිස්වා පතීතා සුමනා උදග්ගා''නි.

පින්වත් දිව්‍යපුත්‍රය අපි අතුමගධ දෙරට වැඩුණා වූ ගැල් පදින්නෝ වමහ, ගැල්වල බොහෝ බඩු පුරවාගන වැඩි ලාබ උපදවමහයි සිතා වස්තුලොභයෙන් සින්ධු දෙශයට හා සෝවීර දෙශයට වෙළඳම පිණිස යමහ. නුඹ දක්නට පළමුවෙන් උෂ්ණය බලවත් හෙයින් සමීය ඉවසිය නොහැකිව ගොනුන්ට හා මිනිසුන්ට පහසු පිණිස අනුකම්පාවෙන් දහවල් එක්තැනක ලැහුම්ගෙන සිට අපි සියල්ලෝම රාත්‍රියෙහි මගට පැමිණියමහ, නොකල්හි ගමන යහපත් නොවෙයි, එහෙයින් ඒ වරද මගට පැමිණි යමහ. යක්ෂාධිගෘහීත වාලුකාකාන්තාරය මැද මග දැනගතනොහි මංමුළාව නුවණැස් අන්ධව ඇස්නැත්තන්සේ සින්ධුසෝවීර දෙශය අසවල්දිගයයි කියා දැනගත නොහැකිව විනාශමුඛයට පැමිණි යමහ මෙයින් මතු අපගේ දිවිනැතිවේ– කියා සිතට සැක උපන. පින්වත් දිව්‍යපුත්‍රය අප විසින් පෙර නොදක්නාලද මේ දිව්‍යප්‍රාසාදය හා නුඹගේ යම් මේ දැකීමක්වීද

Non-commercial distribution

ඒ දැකීම හෙතු වෙන් ප්‍රීතියෙන් ඔදවැඩිසිත් ඇත්තෝ වම්හ. මෙතැන්පටන් දිවිලබම්හයි සිතා නුඹවහන්සේ දැක සතුටුවම්හයි කීහු. මෙසේ සියලු පුවත කීකල්හි නැවත දෙව්පුත් තෙම මේ ගාථා දෙකින් මෙසේ විවාළේය:-

''පාරං සමුද්දස්ස ඉදඤ්ච වණ්ණුං
චෙත්තාවරං සංකුපථඤ්ච මග්ගං,
නදියෝ පන පබ්බතානඤ්ච දුග්ගා
පුට්ඨුද්දිසා ගච්ඡථ භොගහෙතු.
පක්ඛන්දියාන විජිතං පරෙසං
වෙරජ්ජකෙ මානුසෙ පෙක්ඛමානා,
යං වො සුතං වා අථවාපි දිට්ඨං
අච්ඡෙරකං තං වො සුණොම තාතා''ති.

ඒ දිව්‍යපුත්‍රතෙම තමාගේ ඉසුරුසම්පත් ඒ වෙළඳුන් ලවා ප්‍රකාශ කරවනු කැමතිව කියන්නේ පින්වත්නි, මේ වෙළඳම් කරන මිනිසුන්බලා වස්තුසොයා යන්නාවූ තොපි මහාසමුද්‍රයෙන් එතරද මෙවැනි වාලුකා කාන්තාරවලද වේවැල්බැඳ අල්වායායුතු මාර්ගවලද කණුසිටුවා යායුතුවූ සංකුපථයයි කියනලද මාර්ග-වලද ගංගා පර්වතාදි විෂම භූමිවලද වස්තුනිසා නොයෙක්දිග ඇවිදිනාහුය. එසේ ඇවිදින තොප විසින් දක්නාලද හෝ අසනලද හෝ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ යමක් ඇත්නම් ඒ සියල්ලම මට නොවලහාම කියවයි කීයේය. මෙසේ ඒ දිව්‍යපුත්‍රයා විසින් විචාරණලද ඒ වෙළඳහු මෙසේ කීහු

''ඉතොපි අච්ඡෙරතරං කුමාර
න නො සුතංවා අථවාපි දිට්ඨං,
අතීත මානුස්සකමෙව සබ්බං
දිස්වාන තප්පාම අනොමවණ්ණං.

වෙහාසයං පොක්ඛරඤ්ඤෙ සවන්ති
පහූතමාල්‍යා බහුපුණ්ඩරිකා,
දුමාවිමෙ නිච්ච ඵලූපපන්නා
අතීව ගන්ධා සුරභිං පවායන්ති.

වෙළුරියත්ථම්භා සතමුස්සිතාසෙ
සිලාපවාළස්ස ච ආයතංසා,
මසාරගල්ලා සහ ලොහිතංකා
ථම්භා ඉමෙ ජොතිරසාමයාසෙ.

Non-commercial distribution

සහස්සත්ථම්භං අතුලානුභාවං
තෙසුපරි සාධුමිදං විමානං,
රතනන්තරං කඤ්චනවෙදිමිස්සං
තපනීය පට්ටෙහිව සාධුඡන්නං

ජම්බොනදුත්තත්තමිදං සුමට්ඨයො
පාසාදසොපාන ඵලූපපන්නො,
දළ්හො ච වග්ගු සුමුඛො සුසංගතො
අතීව නිජ්ඣානඛමෝ මනුඤ්ඤෙ.

රතනන්තරස්මිං බහූ අන්නපානං
පරිවාරිතො අච්ඡරාසංගණෙන,
මුරජ්ජ ආළම්බරතූරියසුට්ඨයෝ
අභිවන්දිතොසි ථුතිවන්දනාය.

සො මොදසි නාරිගණප්පබොධනෝ
විමානපාසාදවරෙ මනොරමෙ,
අවින්තියෝ සබ්බගුණූපපන්නෝ
රාජා යථා වෙස්සවණො නළිනාා.

දෙවොනු ආසි උදවාසි යක්ඛො
උදහු දෙවින්දෙ මනුස්සභූතෝ,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
ආචික්ඛ කොා නාම තුවංසි යක්ඛා''ති.

යන්තෙන් ප්‍රථම නව යෞවනයෙහි පිහිටියාවූ පින්වත් දිව්‍ය කුමාරය මිනිසුන්ට අයත් ඉසුරු සම්පත් ඉක්මුගියාවූ යුෂ්මතුන් ගේ මේ ඉසුරුසම්පතට වඩා අප විසින් අසනලද හෝ දක්නාලද හෝ ආශ්චර්‍ය්‍ය අද්භූත දෙයක් නැත. නුඹගේ අලාමකවූ උතුම් වණ්ණ සම්පත්තිය හා විමාන සම්පත්තිය බලා තෘප්තියකට නොපැමිණෙමිහ. බොහෝ වූ ශ්වෙත රක්ත පද්මාදි නොයෙක් මලින් ගැවසුණාවූ නිර්මල සිහිල් ජලයෙන් පිරුණාවූ පොකුණු ආකාශයෙහි ගලාබසියි, මේ පොකුණු හා විමානයවට පිහිටියාවූ නොයෙක් ඵලපල්ලවයෙන් සැදුම්ලත් දිව්‍යවෘක්ෂ පඬික්තියෙන් නිතර යහපත් සුවඳ හමන්නේය. වෛඩූර්‍ය්‍ය මිසාරගල්ල ලොහිතංක ශිලාප්‍රවාළාදියෙන් නිර්මිතවූ අෂ්ටාංශ ෂොඩශාංශ වත්‍රිංශාංශවූ රැස්විහිදෙනතැන දහසක් දික්වූ ටැම්-මත්තෙහි සොභාවත්වූ මේ ප්‍රාසාදය පිහිටියේය. සත්ථවනින්

Non-commercial distribution

නිම්යාවූ අසදෘශවූ දහසක් පමණ ටැම් හා භිත්ති ස්තම්භ සෝපානමාලාවෙන් හෙබියාවූ ස්වර්ණමය වෙදිකාවෙන් යුක්තවූ මත්තෙහි රන්පටින් වසනලද්දවූ බොහෝසේම ජාම්බෝනද ස්වර්ණයෙන් යහපත්කොට ඔප්නගන ලද විමානාවයවයන් ඇත්තාවූ නුඹගේ මේ විමානය දවසක් මුළුල්ලෙහි බලාත් සිත් නොපිරෙන්නේය. මේ රන්මාලිගාව ඇතුළෙහි බාද්‍ය භොජ්‍යාදි නොයෙක් දිව්‍යභෝජන සාදු තිබෙයි, දක්ෂවූ ගන්ධර්යන් විසින් වයනලද මිහිඟුබෙර පණාබෙර ආදි පංචාංගික තූර්‍යඝොෂයෙන් එකනින්නාදවෙයි. නොයෙක් දිව්‍ය පුත්‍රයන් විසින් ස්තුතිගී කියා නමස්කාර කරන ලද්දෙහිය. යම්සේ වෙසමුණිරජු නොයෙක් මලින් සැදුණාවූ නලිනීනම් පොකුණෙහි නොයෙක් දෙවතාවන් විසින් පිරිවරනලදුව සතුටුව ක්‍රීඩා කෙරේද එමෙන් ඔබත් නොයෙක් දෙවඟනන් පිරිවරා මේ දෙවු පහයෙහි ක්‍රීඩා වශයෙන් අචින්ත්‍ය අප්‍රමේයවූ දිව්‍යසම්පත් වළඳයි. කිමෙක්ද නුඹ දෙවියෙක්ද නොහොත් මේ කාන්තාරයෙහි වසන චණ්ඩවූ යක්ෂයෙක්ද නොහොත් දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රයාද මිනිස්ජාති ඇත්තෙක්දැයි කියා සැකඇතිව මේ සාර්ථ වාහක වෙළෙන්දෝ විචාරන්නාහු එම්බා දිව්‍යපුත්‍රය නුඹ කවරෙක්දැයි විචාළහ. එකල්හි ඒ වෙළඳුන් විසින් විචාරණලද දිව්‍යපුත්‍රයා තමන් තතු දක්වන්නේ මේ ගාථාව කීයේය;-

''සෙරිස්සකො නාම අහංපි යක්ඛො
කන්තාරියො වණ්ණුපථම්හි ගුත්තො,
ඉමං පදෙසං අභිපාලයාමි
වචනකරො වෙස්සවණස්ස රඤ්ඤෙ''ති.

පින්වත් වෙළඳුනි මම මේ වාලුකා කාන්තාර භූමිප්‍රදෙශයෙහි නියුක්තවූ සෙරිස්සක නමැවූ වෛශ්‍රවණ දිව්‍යරාජයාගේ පරිචාරකවූ දිව්‍යපුත්‍රයෙක්වීමී. වෙසමුණි රජහුගේ වචනයෙන් මේ භූමි ප්‍රදෙශය රක්ෂාකරමියි කීයේය. එබස් අසා මේ සම්පත් ලැබීමට කාරණා විචාරන්නාවූ සාර්ථවාහකයෝ මෙසේ විචාළා හුය:-

''අධිච්චලද්ධං පරිණාමජන්තෙ
සයං කතං උද්දු දෙවෙහි දින්නං,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං මනුඤ්ඤං''න්ති.

Non-commercial distribution

යන්නෙන් පින්වත් දිව්‍යපුත්‍රය යුෂ්මතුන්ගේ මේ දිව්‍යෝශ්‍ය වයඃ සම්පත් කිසි කරුණක් නැතිව කැමැති පරිද්දෙන් ලත් දෙයක්ද නොමහාත් කිසිකෙනෙකු විසින් කාල වශයෙන් පිරි නමන ලද්දක්ද, නැතහොත් ඔබගේ දිව්‍ය ඍද්ධි මහිමයෙන් උපදවන ලද්දක්ද නොහොත් නුඹ විසින් ආරාධිතවූ දෙවියෙකු විසින් ප්‍රසාද වශයෙන් දෙන ලද්දක්ද නුඹ විසින් මේ විමාන සම්පත්තිය කෙසේ ලබනලද්දේදැයි කියා මේ වෙළඳ සාර්ත්ථ වාහකයෝ ඔබගෙන් විචාරත්. එකල්හි ඒ දෙවිපුත්තෙම මේ කරුණු සතරම ප්‍රතික්ඛේපකොට කුශල කර්මයම ප්‍රකාශකොට දක්වන්නේ මෙසේ කීය:-

''නාධිච්ච ලඛංන පරිණාමජං මෙ
න සයං කතං නහි දෙවෙහි දින්නං,
සකෙහි කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලඛමිදං මනුඤ්ඤ''න්ති.

යන්නෙන් මාගේ මේ ඉසුරුසම්පත් නිකරුණේ ලද්දේ නොවෙයි, යම්කෙනෙකු විසින් පිරිනමන ලද්දේත් නොවෙයි, මා විසින් උපදවන ලද්දේත් නොවෙයි, මහෙශාක්‍ය දෙවියෙකු විසින් දෙන ලද්දේත් නොවෙයි, පෙර ජාතියෙහි මා විසින් කරනලද කුශලකර්මයෙන් මේ සම්පත ලද්දේයයි කියේය. එකල්හි කුශලකර්මය විචාරන්නාවූ වෙළෙන්දෝ:-

''කින්තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලඛමිදං විමාන''න්ති.

පින්වත් දිව්‍යපුත්‍රය නුඹ විසින් පුරුදු කරන ලද කවර ශ්‍රේෂ්ඨවර්‍යාවක් කවර ව්‍රත සමාදනයක් හෙතුකොටගෙන මේ විමානය ලබනලද්දේදැයි කියා විචාළාහුය. නැවත ඒ දිව්‍යපුත්‍රතෙම තමා විසින් රැස්කරන ලද කුශලකර්මය ප්‍රකාශ කරමින් මේ ගාථාවන් කීය:-

''මම පායාසීති අහු සමඤ්ඤා
රජ්ජං යද කාරයිං කොසලානං,
නත්ථිකදිට්ඨී කදරියො පාපධම්මො
උච්ඡෙදවාදීව තදා අහොසිං,

Non-commercial distribution

සමණොව ඛො ආසි කුමාරකස්සපො
බහුස්සුතො චින්තකථී උළාරො,
සො මෙ තදූ ධම්මකථං අභාසි
දිට්ඨිවිසූකානි විනොදයී මෙ.

තාහං තස්ස ධම්මකථං සුණිත්වා
උපාසකත්තං පටිවෙදයිස්සං,
පාණාතිපාතා විරතො අහොසිං
ලොකෙ අදින්නං පරිවජ්ජයිස්සං.

අමජ්ජපො නොව මුසා අභාණිං
සකෙන දරෙන ච අහොසිං තුට්ඨො.

තම්මෙ වතං තම්පන බ්‍රහ්මචරියං
තස්ස සුවිණ්ණස්ස අයං විපාකො,
තෙහෙව කම්මෙහි අපාපකෙහි
පුඤ්ඤෙහි මෙ ලඛම්දං විමානං''ති.

මම යටගිය දවස කොසොල් ජනපදවාසීන්ගේ සෙතව්‍ය නම් නුවර විසූ පරලොව නැත කුසල් නැත අකුසල් නැතැයි කියා ගන්නාලද උච්ඡෙදෘෂ්ටි ඇති මසුරුවූ ලාමක ස්වභාව ඇත්තාවූ පායාසිනම් රාජන්‍යයෙක්වීමි. එසමයෙහි බුඩශ්‍රාවකවූ විචිත්‍ර කථිකවූ බහුශ්‍රැතවූ උදර ප්‍රඥ ඇති ඒ කුමාරකාශ්‍යප තෙරුන් වහන්සේ මට බණවදරා මාගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති හුල් පහකළ සේක. මම ඒ බණ අසා උපාසක බැව් දන්වා ප්‍රාණඝාතය අදත්තාදනය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යන පස්පවින් දුරුව දනශීලාදි විශයෙන් කුසල් පමණක් කෙළෙමි. එසේ පුරුදු කරනලද ව්‍රතසමාදනය හා එම ශ්‍රේෂ්ඨ වය්‍යාවගේ මේ විපාකය වෙයි, යහපත්වූ ඒ කුශලකර්මය හෙතු කොටගෙන මාවිසින් මේ විමානය හා මේ විපාකානිසංසය ලබනලදුයි කියේය. එකල්හි ඒ ගැල්පදින්නෝ ඒ දෙව්පුත්ද විමනද ප්‍රත්‍යක්ෂයෙන් දැන කර්මඵලය විශ්වාසකොට තමන්ගේ කර්මඵල ඇදහීම දක්වමින් මේ ගාථා දෙක කීහු:-

''සච්චං කිරාහංසු නරා සපඤ්ඤූ
අනඤ්ඤථා වචනං පණ්ඩිතානං
යහිං යහිං ගච්ඡති පුඤ්ඤකම්මො
තහිං තහිං මොදති කාමකාමී

Non-commercial distribution

යහිං යහිං සොකපරිද්දවො ච
වධොව බන්ධොව පරික්කිලෙසො,
තහිං තහිං ගච්ඡති පාපකම්මො
නමුච්චිති දුග්ගතියා කදාචී''ති.

යන්නෙන් නුවණැත්තාවූ යම් පණ්ඩිත කෙනෙක් යමක් කීවාහුනම් ඒ නුවනැති පණ්ඩිතයන්ගේ වචනය වෙනසක් අන් පරිද්දකින් වීමක් නැත්තේය. කරනලද කුසල්ඇති සත්පුරුෂ තෙම යම් යම් තැනකට යේද හෙවත් දිව්‍යලොක මනුෂ්‍ය ලොකාදි වශයෙන් යම් යම් තැනක උපදිද, ඒ ඒ තන්හි පඤ්ච කාම සම්පත් විඳිමින් සතුටුවන්නේය. කරනලද පව්කම් ඇති සත්වතෙම යම් යම් තැනකට යේද ඒ ඒ තන්හි ශොකකිරීම විලාපකිරීම වධබන්ධන විපත් ඇතිවීම ආදි නොයෙක් අනර්ථ-ඵයට පැමිණෙයි. ඒ පාපී පුද්ගලයා කිසිකලෙකත් සසරදුකින් නොමිදෙන්නේමයයි කීහ.

මෙසේ ඒ වෙළඳුන් කියද්දී විමන්දෙර සමීපයෙහිවූ මහරි රුකෙන් මුහුකුරායාමෙන් කොපු පැසුණ මහරිකරලක් නටුවෙන් ගිලිහී වැටුණේය. ඒ වැටීමෙන් පිරිවරජනයා සහිත දෙවුපුත් තෙම දෙමනසට පැමිණියේ විය. ඩෙළෙන්දෝ එය දැක මේ ගාථාව කීවාහුය:-

''සම්මූළ්හරූපොව ජනො අහොසි
අස්මිං මුහුත්තෙ කලලීකතො ච,
ජනස්සිමස්ස තුය්හඤ්ච කුමාර
අප්පච්චයො කෙන නුඛො අහොසී''ති.

යනුහෙයින් පින්වත් දිව්‍යකුමාරය, යුෂ්මතුන්ගේ පිරිවර දිව්‍යජනයාද මේ මොහොතෙහි හැමලෙසින් ශොක වශයෙන් මුළා ස්වභාව ඇතිවිය, මඩමුසු ජලයමෙන් සිත කැළඹුණේය, මේ නුඹගේ පිරිවර දෙවිජනයාගේ හා යුෂ්මතුන්ගේත් දෙමනස කවර කරුණකින් සිදුවීදැයි මේ ගාථාවෙන් විචාළෝය. එඛස් අසා දෙවිපුත්තෙම කියන්නේ:-

''ඉමෙ සිරිසූපවනා ච තාතා
දිබ්බා ගන්ධා සුරභිං සම්පවත්ති,
තෙ සම්පවායන්ති ඉමං විමානං
දිවා ච රත්තො ච තමං නිහන්ත්වා,

Non-commercial distribution

ඉමෙසං ච ඛො වස්ස සතව්වයෙන
සිපාටිකා ඵලති එකමෙකා,
මානුස්සකං වස්සසතං අතීතං
යදග්ගෙ කායමිහි ඉධූප පන්නො.

දිස්වානහං වස්සසතානි පඤ්ච
අස්මිං විමානෙ ඨත්වාන තතා,
ආයුක්ඛයා පුඤ්ඤක්ඛයා චවිස්සං
තෙනෙව සොකෙන පමුච්ඡිතොස්මී''න්ති.

යනුහෙයින් දරුවෙනි මහරි උපවනයෙන් මේ දිව්‍ය සුගන්ධයෝ හාත්පස හමත්, එ හමන දිව්‍යගන්ධයෝ මේ විමන මනාව සුවඳගන්වත්, හුදෙක් එපමණකුදු නොව තමන් ගේ ප්‍රභායෙන් දවල් හා රෑ අඳුර නසත්.

යම්හෙයකින් හවුරුදු සියයක්හුගේ ඇවැමෙන් එක එක මහරිඵලයාගේ කොපු පැසී නටුවෙන් ගිලිහී වැටේද නොහොත් පුට හෙදයට පැමිණ වියලියේද එහෙයින් මිනිසුන් පිළිබඳ හවුරුදු සියක් මට ඉක්ම ගියේය. යම් දිනක මේ දිව්‍ය නිකායෙහි මම උපන්නේවෙමිද එතැන්පටන් දිව්‍යගණනින් හවුරුදු පන්සියක් ආයුවෙයි. එහෙයින් මාගේ ආයුෂ ක්ෂය වෙයයි ශොකවශයෙන් මුළාවූවෙමියි දැක්විය. දරුවෙනි මම මේ විමානයෙහි අවුරුදු පන්සියක් සිට ආයුගෙවීමෙන් හා පින් ගෙවීමෙන් චුතවන්නෙමි. ඒ බව දැක එම ශොකයෙන් හැම ලෙසින් මුළාසින් ඇති වීමියි කීයේය. එකල්හි වෙළෙන්දෝ ඔහු අස්වසමින්:-

''කථං නු සොවෙය්‍ය තථාවිධො සො
ලද්ධා විමානං අතුලං විරාය,
යෙවාපි ඛො ඉත්තර මුපපන්නා
තෙ නූන සො වෙය්‍යූං පරිත්තපුඤ්ඤ''කි.

යන මේ ගාථාව කීහු.

යම් සත්ව කෙනෙක් පින්මදව අල්පායුෂ්කව උපන්නාහුද ඒ සත්වයෝ මරණය නිසා ශොකකරන්නාහුය, ඔබදු දිව්‍යානුභාවසම්පන්නවූ දීර්ඝායුෂ්කවූ හෙවත් හවුරුදු අනුදහසක් ආයු ඇතිව අසදෘශ දිව්‍යවිමානය ලැබසිටින නුඹ වැනි පින්වතෙක්

Non-commercial distribution

කෙසේ නම් ශොකකරන්නේද ශොක නොකටයුතුයයි කිහු. දෙව්පුත් තෙම එපමණකින්ම අස්වැසී ඒ වෙළඳ ජනයාගේ කීම පිළිගනිමින් ඔවුන්ටත් උපදෙස් දෙන්නේ මේ ගාථාව කියේය:-

''අනුවිජවිං ඔවදියඤ්ව මෙ තං
යං මං තුම්හෙ පෙය්‍යවාචං වදෙථ,
තුම්හෙ ච බො ඤාතා මයානු ගුත්තා
යෙනිච්ඡකං තෙන පලෙථ සොත්ථි''න්ති.

යම් හෙයකින් යුෂ්මත්හු මට අවවාද වශයෙන් කටයුතුවූ ''කෙසේ නම් ශොකකරන්නේද''යි යන ආදියෙන් යම් ප්‍රිය වචනයක් කිවුද. එය තොපට සුදුසුවූවක්මය, තොප විසින් කියනලද ඒ ප්‍රිය අවවාද කථාව මාවිසින් කරනලදී. දරුවෙනි තොපිද මා විසින් මේ අමනුෂ්‍යපරිගෘහීතවූ වාලුකාකාන්තාර යෙහිදී කාන්තාරය ඉක්මයනතෙක් රක්ෂාකරන ලද්දහුය, යුෂ්මත්හු යම් මගකින් යනු කැමැති නම් ඒ මගින් යවියයි කීය. එසේ කී කල්හි වෙළෙන්දෝ කෘතඥභාවය ප්‍රකාශකරමින් මේ ගාථාව කිහු:-

''ගන්ත්වා මයං සින්ධු සොවීරභූමිං
ධනත්ථිකා උද්දයං පත්ථයානා,
යථා පයොගා පරිපුණ්ණවාගා
කාහාම සෙරිස්ස මහං උළාර''න්ති.

යන්නෙන් පින්වත් දිව්‍යපුත්‍රය ධනය ප්‍රයොජනකොට ඇත්තාවූ වස්තුලාභය ප්‍රාර්ත්ථනා කරන්නාවූ අපි සින්ධු සොවීර ප්‍රදේශයට ගොස් දැන් ඔබ විසින් කරනලද ප්‍රතිඥානුරූපව ත්‍යාග ධර්මයෙන් සම්පූර්ණවම සෙරිස්සක නම්වූ මහත් උත්සව පූජාවක් කරන්නෙමුයයි කීහ. නැවත දිව්‍යපුත්‍රතෙම උත්සව පූජා කිරීම ප්‍රතික්ෂේපකරමින් කටයුත්තෙහි ඔවුන් යොදවමින් මෙසේ කියේය:-

''මා වෙව සෙරිස්සමහං අකත්ථ
සබ්බඤ්ව වො භවිස්සති යං වදෙථ,
පාපානි කම්මානි විවජ්ජයාථ
ධම්මානුයොගඤ්ව අධිට්ඨහාථා''ති.

Non-commercial distribution

පින්වත් වෙළඳුනි, තොපි නිර්භයව සින්ධු සොවීර දෙශයට පැමිණ එහිදී මහත් වස්තුලාභ ප්‍රාර්ත්ථනා කරන්නාහුයයි යන ආදි යමක් කීහුද, ඒ සියල්ල එසේම තොපට සිදුවන්නේය, ඒ ගැන තොපි සැක නොකරව්, යුෂ්මත්හු වනාහි මෙතැන්පටන් ප්‍රාණඝාතාදි පාපකර්මයන් දුරුකරව්, දානාදි කුශල ධර්මයන්හි යෙදීමට ඉටා ගනිව්, මෙය සෙරිස්සක උත්සව පූජාවයයි කීයේය.

යම් උපාසකයෙකුට වනාහි අනුග්‍රහකරමින් ඒ වෙළඳුන් ආරක්ෂා කරනුකැමැතිවීද ඒ උපාසකයාගේ ගුණ වර්ණනාකොට එය ඔවුන්ට උදෙසමින් මේ ගාථාවන් කීයේය:-

''උපාසකෝ අත්ථි ඉමම්හි සඞ්ඝෙ
බහුස්සුතෝ සීලවතූපපන්නෝ,
සද්ධෝ ච වාගී ච සුපෙසලෝ ච
විචක්ඛණෝ සන්තුසිතෝ මුතීමා.

සඤ්ඤාතමඤ්ඤා න මුසා භණෙය්‍ය
පරූපඝාතාය න චෙතසෙය්‍ය,
වෙභූතිකං පිසුණං නෝ කරෙය්‍ය
සණ්හඤ්ච වාචං සබ්බිලං භණෙය්‍ය.

සගාරවෝ සප්පතිස්සෝ විනීතෝ
අපාපකෝ අධිසීලෙ විසුඩ්ඪෝ,
සෝ මාතරං පිතරඤ්චාපි ජන්තු
ධම්මෙන පොසෙති අරියවුත්ති.

මඤ්ඤෙ සෝ මාතාපිතූන්නං කාරණා
භොගානි පරියෙසති න අත්තහෙතු,
මාතාපිතූනඤ්ච යෝ අව්වයෙන
නෙක්ඛම්මපොණෝ චරිස්සති බ්‍රහ්මචරියං.

උජූ අවඩ්ඪකෝ අඝයෝ අමායෝ
න ලෙඛකප්පෙන ච වොහරෙය්‍ය,
සෝ තාදිසෝ සුක්කතකම්මකාරී
ධම්මෙ ඨිතෝ කින්ති ලභෙථ දුක්ඛං.

Non-commercial distribution

තං කාරණා පාතුකතොම්හි අත්තනා
තස්මා ධම්මං චස්සථ වාණිජාසෙ,
අඤ්ඤත්‍ර තෙනිහ භස්මී භවෙථ
අන්ධාකුලා විප්පනට්ඨා අරඤ්ඤෙ.

තං බ්‍රිප්පමානෙන ලහුං පරෙන
සුඛො භවෙ සප්පුරිසෙන සඞ්ගමො''ති.

යන්නෙන් මේ සත්වසමූහයා අතරෙහි බහුශ්‍රැතවූ සිල්වත් බවට පැමිණියාවූ ශ්‍රද්ධාවත්වූ ත්‍යාගවත්වූ සුපෙසලවූ කට යුත්තෙහි දක්ෂවූ සතුටුසිත් ඇති කර්මස්වකෘතඥතාදියෙන් මෙලොව පරලොව හිතවැඩදන්නාවූ උපාසකයෙක් ඇත්තේය.

හෙතෙම දැන දැන බොරු නොකියන්නේය, අනුන් නොනසන්නේය; හිතවතුන් වෙන්කරන පිසුණ (කේලාම්) බස් නොකියන්නේය, මොළොක් සිලුටු වචන කියන්නේය, ගෞරව සහිතවූ සුවව කීකරුවූ හික්මුණාවූ අලාමකවූ උපාසකයෙකු විසින් රැක්කයුතු අධිශීලශික්ෂාවෙහි පිහිටියාවූ පිරිසිදු පැවැතුම් ඇති ඒ මනුෂ්‍යතෙම දැහැමින් මව් පියන් පොෂණය කරයි.

ඒ මේ උපාසකතෙම තමා නිසා නොව මව් පියන් හෙතු කොට වස්තු සොයා යයි මම සිතමි, ඔහු මව්පියන්ගේ ඇවෑමෙන් පසු නිවණට නැමුණේ ශාසන බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරෙන්නේය.

සෘජුවූ අවඩිකවූ කපටිනුවූ මායා රහිතවූ ඒ උපාසක තෙම කැපලෙසින්මුත් මායාකපටි වශයෙන් වචනයක්වත් නොකියන්නේය, එබඳු කුශලකර්ම කරනසුලුවූ ධර්මයෙහි පිහිටි ධර්ම චාරී සමචාරී පුද්ගලතෙමේ කෙසේ නම් දුකක් ලබන්නේද නො ලබන්නේය.

ඒ උපාසකයා හෙතුකොටගෙන තොපගේ ඉදිරියෙහි මම තෙමේම පහළවීමි, යම් හෙයකින් මම ධර්මය ගරුකරමින් රකිමින් තොපත් රකිම්ද එහෙයින් කොපිත් ධර්මයම බලව ධර්මයෙහිම හැසිරවේ, ඉදින් යුෂ්මත්හු ඒ උපාසකයා නැතිව මෙහි ආවාහු නම් මේ වාලුකා කාන්තාරයෙහිදී මංමුළාව අනාථව පිළිසරණක් නැතිව හලුබවට පැමිණෙන්නාහුය වැනසෙන්නා

Non-commercial distribution

හුය. අනුන්ට අවමන්කරන්නාවූ පීඩාකරන්නාවූ අනිකෙකුට එවැනිදේ වැඩිවශයෙන් පහසුවෙන් කළහැක්කේය, ක්ෂාන්ති සුරතභාවයෙහි පිහිටි ඒ උපාසක තෙම කිසිවෙකු විසින් කිසිවක් කියනලද්දේ නමුදු නොසෙල්වෙයි. එහෙයින් සත්පුරුෂයෙකු සමග එක්වීම සැපවන්නේයයි කීය.

මෙසේ ඒ දෙවිපුත් විසින් සාමාන්‍ය වශයෙන් කියන ලද්ද ස්වරූපවශයෙන් දැනගනු කැමැති වෙළෙන්දෝ:-

''කිං නාම සො කිඤ්ච කරොති කම්මං
කිං නාමධෙය්‍යං කිං පන තස්ස ගොත්තං.
මයම්පි නං දට්ඨුකාමම්හ යක්ඛ
යස්සානුකම්පාය ඉධාගතොසි
ලාභා හි තස්ස යස්ස තුවං පිහෙසී''ති.

යන ගාථාව කිහු.

පින්වත් දෙවිය, යම් උපාසකයෙකුට අනුකම්පාව පිණිස නුඹ මෙහි පැමිණියේද, අපිත් ඔහු දැනගනු කැමැත්තෝවම්හ, ඒ පුද්ගලතෙම නම් වශයෙන් කවරෙක්ද, කෘෂිකර්ම වණික් කර්මාදීන් අතරෙන් කෙබඳු කර්මාන්තයක් කරයිද, තිස්සය, පුස්සය ආදී නාමයන් අතරෙන් මව් පියන් විසින් තබනලද ඔහුගේ නාම ධෙය කුමක්ද, භග්ගව, භාරද්වාජාදී ගොත්‍රයන් අතරෙන් ඔහුගේ ගොත්‍රය කුමක්ද, යමෙකුට යුෂ්මතා ප්‍රියවෙහිද එය ඕහට ලාභයක්ම වේයි කීහ. දැන් දෙවිපුත්තෙම නාම ගොත්‍රාදි වශයෙන් ඔහු දක්වමින් මෙසේ කීයේය:-

''යො කප්පකො සම්භවනාමධෙය්‍යො
උපාසකො කොච්ඡඵලූපජීවී,
ජානාථ නං තුම්හාකං පෙසියො සො
මා ඛො නං හිළිත්ථ සුපෙසලො සො''ති.

යනුහෙයින් කරනැවෑමියෙක්වූ සම්භව නම් ඇති හිසකේ ආදිය පිහිරා අන්දමිතබන පණ්ඩව හා එම තලයත් නිසා ජීවත් වනසුලුවූ යම් උපාසකයෙක්වීද, හෙතෙම තොපට වතාවත් කරන්නෙකැයි ඔහු දැනගනිව්, ඒ උපාසකයා සුපෙසල කෙනෙකි, එහෙයින් ඔහුට අවමන් නොකරවියයි කීයේය. එසේ කීකල්හි වෙළෙන්දෝ ඔහු හැඳිනගන මෙසේ කීහ:-

Non-commercial distribution

''ජානාමසෙ යං ත්වං වදෙසි යක්ඛ
න බො නං ජානාම ස ඊදිසොනි,
මයම්පි නං පූජයිස්සාම යක්ඛ
සුත්වාන තුය්හං වචනං උළාර''න්ති.

යන්තෙන් පින්වත් දෙවිය නුඹ යමෙකු ගැන ගුණ කීයේද අපි දැන් ස්වරූප වශයෙන් ඔහු දැනගනිමු. ඒ පුද්ගලයා මෙබඳු ගුණවතෙකැයි කියා ඔහු ගැන අපි නොදැන සිටියෙමු. පින්වත් දෙවිය යුෂ්මතුන්ගේ මහත් කීම අසා අපිත් ඔහුට පූජාසත්කාර කරන්නෙමුයයි කීවෝය. ඉන්පසු දෙව්පූත්තෙම ඒ වෙළඳ ජනයා තමාගේ දෙව්විමනට නංවාගෙන අනුශාසනා කිරීම පිණිස මෙසේ කීයේය:-

''යෙ කෙචි ඉමස්මිං සත්ථෙ මනුස්සා
දහරා මහන්තා අථවාපි මජ්ඣිමා,
සබ්බෙව තෙ ආලම්බන්තු විමානං
පස්සන්තු පුඤ්ඤඵලං කදරියා''ති.

මේ ගැලෙහි ළදරු මහලු මධ්‍යම්වූ යම් කිසි මනුෂ්‍යයෝ වෙත්ද, ඒ සියල්ලෝම මේ දෙව් විමනට නගින්වා දන්තෙහි දෙන සුලුවූ තද මසුරු පුද්ගලයෝ කුශල කර්මයන්ගේ විපාකය දකින්වායි කිය මෙතැන්පටන් අවසානයෙහි තිබෙන ගාථා සය ධර්මසඞ්ගාහක මහා ස්ථවිරයන් වහන්සේලා විසින් කියන ලද්දෝය.

''තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
තං කප්පකං තත්ථ පුරක්ඛිපිත්වා,
සබ්බෙව තෙ ආලම්බිංසු විමානං.
මසක්කසාරං විය වාසවස්ස.
තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිංසු,
පාණාතිපාතා විරතා අහෙසුං
ලොකෙ අදින්නං පරිවජ්ජයිංසු.
අමජ්ජපා නො ච මුසා භණිංසු
සකෙන දරෙන ච අහෙසුං තුට්ඨා,
තෙ තත්ථ සබ්බෙව අහං පුරෙති
උපාසකත්තං පටිවෙදයිත්වා

Non-commercial distribution

පක්කාමි සත්ථෝ අනුමොදමානෝ
යක්ඛිඩියා අනුමතෝ පුනප්පුනං.

ගන්ත්වාන තෙ සින්ධුසොවීරභූමිං
ධන්ත්ථිකා උද්දයං පත්ථයානා,
යථා පයොගා පරිපුණ්ණලාභා
පච්චාගමුං පාටලිපුත්ත මක්ඛතං.

ගන්ත්වාන තෙ සංඝරං සොත්ථිවන්තෝ
පුත්තෙහි දරෙහි සමඞ්ගිභූතා,
ආනන්දි චිත්තා සුමනා පතීතා
අකංසු සෙරිස්ස මහං උළාරං.

සෙරිස්සකං ත‍ෙ පරිවෙණං මාපයිංසු
එතාදිසා සප්පුරිසාන සෙවනා,
මහත්ථිකා ධම්මගුණාන සෙවනා
එකස්ස අත්ථාය උපාසකස්ස
සබ්බෙව සත්තා සුඛිතා අහෙසුං'' න්ති.

යන්නෙන් එහිදී ඒ සියලුම වෙළෙන්දෝ මම පළමුකොට මම පළමුකොටයයි කියමින් ඒ කපුවා ඉදිරිපත්කරන ශක්‍ර යාගේ ශක්‍රභවනයටමෙන් කිසිවෙකුට අන්තරායක් නැතුව දෙව් විමනයට නැංගාහුය.

එකල්හි ඒ වෙළෙන්දෝ දිව්‍යවිමානයබලා පහන්සිත් ඇතිව ඒ දිව්‍යපුත්‍රයාගේ අවවාදයෙහි පිහිටා සරණයෙහි හා ශීලයෙහි පිහිටා උපසකභාවය දැන්නුවාහුය; ප්‍රානඝාතයෙන් වැළකුනා හුය, ලොකයෙහි නුදුන්දෙය පැහැරගැනීමෙන් වෙන්-වූවාහුය, මත්පැන්පානයෙන් වෙන්වූවාහුය, මුසවා නොකීවාහුය, ස්වකීය භාය්‍යාව හා සමග සතුටුවූවාහුය හෙවත් පරඹුවන් නොසෙවී වාහුය, මම පළමුකොට මම පළමුකොටයයි කියා ඒ වෙළෙන්දෝ උපාසකභාවය ගිවිස්සාහුය. දෙවියා විසින් අනුදන්නාලද වෙළඳ සමූහයා දිව්‍යානුභාවයෙන් නැවත නැවත සතුටුවෙමින් සුවසේ කැමතිවනලද දෙශයට ගියේය.

ධනසැපයීම ප්‍රයෝජනය කොට ඇති ධනලාභ ප්‍රාර්ත්ථනා-කරන්නාවූ ඒ වෙළෙන්දෝ සින්ධු සොවීර දේශයට ගොස්

Non-commercial distribution

අදහස් පරිදි සමෘඩ ලාභ ඇතිව නිරුපද්‍රැතව නොහොත් ආබාධ රහිතව පිඩා රහිතව අන්තරායක් විපතක් නැතිව පැළලූප්නුවරට පෙරලා ආවාහුය.

ඒ වෙළෙන්දෝ සැපෙන් යුක්තව සිය ගෙවල්වලට ගොස් පුත්‍රයන් හා භාය්‍යාවන් හා යුක්තව සොම්නස් සිත් ඇතිව සෙරිස්සක නම් මහොත්සව පූජාවන් කළාහුය. එපමණකුදු නොව කෘතඥභාවයෙහි සිට පළමු ප්‍රතිඥාවෙන් මිදෙනු පිණිසද දිව්‍ය පුත්‍රයාගේ නාමයෙන් පිරිවෙනක් හෙවත් පරිච්ඡේදවශයෙන් බැලිය යුතුහෙයින් පිරිවෙන නම්වූ ප්‍රාසාද කූටාගාර රාත්‍රිස්ථානා දියෙන් යුක්තවූ පවුරකින් වටකරනලද දෙරකොටුවලින් යුක්තවූ ආවාසයක් කළාහුය.

නොපෙරෙලෙනලද ගුණයුත් සත්පුරුෂයන්ගේ ආශ්‍රය මෙබඳු මහත් ප්‍රයෝජන ආනිසංස ඇත්තාහුය. සම්භව නම් එකම උපාසකයා නිසා සාර්ත්ථවාහකයන්ට ඇතුළත්වූ සියලුම සත්වයෝ සුවපත් වූවාහුය,

සම්භව නම් උපාසකතෙම වනාහි පායාසි නම් සෙරිස්සක දිව්‍යපුත්‍රයාගේද, ඒ වෙළඳුන්ගේද වචනප්‍රතිවචන වශයෙන් පැවති ගාථා බන්ධනයෙන් ඇසූනියායෙන්ම උගෙන තෙරුන්ට සැළකෙළේය. පායාසි දිව්‍යපුත්‍රතෙම පසුකලෙක ආයුෂ්මත් සම්භව ස්ථවිරයන් වහන්සේට කියේයයිද සමහරු කියත්. එය යශ ස්ථවිර ප්‍රමුඛ මහා ස්ථවිරයන් වහන්සේලා වීතිය ධර්ම සඞ්ගායනාවෙහිලා සංග්‍රහ කළෝය. සම්භවනම් උපාසකතෙම මව්පියන්ගේ ඇවෑමෙන් පසු සස්නෙහිපැවිදිවී රාගාදී සකල කෙලශයන් නසා අර්හත්වයට පැමිණියේය.)

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි දෙවන සෙරිස්සක ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

4. 3. කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දේශනායෙහි තුන්වෙනි නන්දක ප්‍රෙතවස්තුව කවරහයත්– මේ නන්දක ප්‍රෙතවස්තුව දක්වනු ලැබේ. ඒ නන්දක ප්‍රෙතවස්තුහුගේ උත්පත්තිය කවරදයත්–

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පා වදාරීමෙන් හවුරුදු දෙසීයක් ඇවෑමෙන් සුරට්ඨදෙශයෙහි පිඬගලනම්

Non-commercial distribution

රජෙක් විය ඔහුගේ නන්දකනම් සෙනෙවිතෙම මිථ්‍යාදෘෂ්ටිවූ විපරීත දැකුම් ඇත්තේ, ''දෙනලද්දෙහි විපාකනැතැ''යි යනාදියෙන් මිථ්‍යාග්‍රහණය හැසුරුණේය. ඒ සෙනවියාගේ දුහිතෘවූ උත්තරා නම් උපාසිකාව සුදුසු කුලයකට සරණ පාවාදෙනලද්දීය. නන්දක නම් ඒ සෙනෙවියා මැරිගොස් චින්ධ්‍යනම් වනයෙහි මහත් නුග රුකෙක විමාන ප්‍රේතයෙක්ව උපන. ඒ සෙනෙවියා කළුරියකළ කල්හි උත්තරා නම් උපාසිකා තොමෝ පිරිසිදු සිහිල් සුවඳ ජල යෙන් පිරුණ පැන්කළයක් හා කොමුපිටියෙන් කරනලද වණ්ගන්ධ රසයෙන් යුක්තවූ පූවලින් පිරුණ මාලාවක්ද එක්තරා රහතන් වහන්සේ නමකටදී ''මේ දක්ෂිණාව මගේ පියාණන්ට පැමිණේවා''යි කියා පින්දුන්නේය. ඒ දීම හේතුකොට ඒ ප්‍රේතයා හට දිවපැන් හා අපමණ දිවපුද පහළවූහ. ඒ දැක ඔහු මෙසේ සිතුවේය:- ''යම්හෙයකින් දෙනලද්දෙහි විපාකනැතැයි යනාදිය කියමින් මහජනයා මිත්ථ්‍යාදෘෂ්ටි ගන්නවනලද්දේද එහෙයින් මා විසින් එකාන්තයෙන් පව්කරනලදී. දැන්වනාහි පිඬගල රජතෙම ධර්මාශොක රජහට අවවාද දීමට ගියේය, හෙතෙම ඒ රජුට අවවාද දී එන්නේය. එබැවින් මම දැන් ඔහුගේ නාස්තික මිත්ථ්‍යාදෘෂ්ටිය දුරුකරලන්නෙමැ''යි කියා සිතුවේය. නොබෝකල කින්ම පිඬගල රජතෙම ධර්මාශොක රජහට අවවාදදී පෙරළා එන්නේ මගට පැමිණියේය. එකල්හි ඒ ප්‍රේතතෙමේ තමන් වසනතැනට අභිමුඛව ඒ මග මැවීය. රජතෙම මධ්‍යාහ්නකාල යෙහි ඒ මාර්ගයෙන් යයි. යන්නාවූ ඒ රජුට ඉදිරියෙහි මග පෙනෙයි ඔහුගේ පිටිපසින් වනාහි මග අතුරුදන්වෙයි, සියල්ලට පසුව යන පුරුෂතෙම මග අතුරුදන්වූවා දැක බියවී මහත් සේ කැගසමින් දුවගොස් රජුට කීයේය. එය අසා රජතෙම බියවී කලකිරුණු සිත්ඇතිව ඇත්කඳපිට සිට සිවිදිහුන් බලමින් ප්‍රේතයා වසන නුගරුක දැක සිවුරඟසෙනඟත් සමග ඊට අභි මුඛව ගියේය. ඉක්බිති පිළිවෙළින් රජු එතනට පැමිණිකල්හි ඍර්වාභරණයෙන් සැරසුණාවූ ප්‍රේතයා රජුවෙත පැමිණ පිළිසඳර කථාකොට පූ හා පැන්ද දෙව්වේය, පිරිවර ජනයා සහිතවූ රජතෙම චතුර නා පූ කා පැන් බී සංසිඳුණ මංව්ඩා ඇතිව ''නුඹ දෙව්යෙක්ද නොහොත් ගන්ධර්වයෙක්ද''යි යනාදී වශයෙන් ප්‍රේතයාගෙන් විචාළේය. ප්‍රේතතෙම මුලපටන්

Non-commercial distribution

තමාගේ ප්‍රවෘත්තිය කියා රජු මිත්‍යාදෘෂ්ටියෙන් මුදවා සරණයෙහි හා සීලයෙහිත් පිහිටවිය. ඒ කාරණය දක්වීමට සඞ්ගීතිකාරයෝ මෙසේ කිහු:-

87. රාජා පිඞ්ගලකෝ නාම – සුරට්ඨානමධිපති අහු,
මොරියානමුපට්ඨානං – ගන්ත්වා සුරට්ඨං පුනරාගමා.

88. උණ්හෙ මජ්ඣන්තිකෙ කාලෙ – රාජා පථං උපාගමි,
අද්දස මග්ගං රමණීයං – පෙතානං වණ්ණනාපථං.

89. සාරථිං ආමන්තයී රාජා – අයං මග්ගෝ රමණීයෝ,
ඛෙමෝ සොවත්තිකෝ සිවෝ – ඉමිනා සාරථී යාහි
සුරට්ඨානං සන්තිකෙ ඉතෝ.

90. තෙන පායාසි සොරට්ඨෝ සෙනාය චතුරඞ්ගිනියා,
උම්බිග්ගරූපෝ පුරිසෝ - සොරට්ඨං එතදබ්‍රවී.

91. කුම්මග්ග පටිපන්නම්හා – භිංසනං ලෙ මහංසනං,
පුරතෝ පදිස්සති මග්ගෝ – පච්ඡතොව න දිස්සති.

92. කුම්මග්ගං පරිපන්නම්හා – යමපුරිසාන සන්තිකෙ,
අමානුසෝ වායති ගන්ධෝ – සොසෝ සූයති දරුණෝ,

93. ස විග්ගෝ රාජා සොරට්ඨෝ – සාරථිං එතදබ්‍රවි,
කුම්මග්ගං පටිපන්නම්හා භිංසනං ලොමහංසනං
පුරතෝ ච දිස්සති මග්ගෝ – පච්ඡතෝ ච න දිස්සති.

94. කුම්මග්ගං පටිපන්නම්හා – යමපුරිස න සන්තිකෙ,
අමානුසෝ වායති ගන්ධෝ – සොසෝ සූයති දරුණෝ,

95. හත්තික්ඛන්ධඤ්ච අරුය්හ – ඔලොකෙන්තෝ චතුද්දිසං,
අද්දස නිග්‍රෝධං රමණීයං – පදපං ඡායා සම්පන්නං.
නීලබ්භවණ්ණසදියං මෙඝවණ්ණසිරී නිභං.

87. සුරට්ඨානං, සුරට්ඨදෙසයන්ට; අධිපති, ඊශ්වරවූ; පිඞ්ගලකොනාම, පිඞ්ගලනමැවූ; රාජාඅහු, රජෙක්විය; මොරි-යානං, මෞර්‍ය්‍ය රජුන්ට (නොහොත්) ධර්මාශොකයන්ට; උපට්ඨානංගන්ත්වා, උපස්ථානයට ගොස්; සුරට්ඨං සුරට්ඨදෙශය උදෙසා; පුනආගමා, පෙරළා ආයේය.

Non-commercial distribution

88. රාජා, රජතෙම; මජ්ඣන්තිකෙ, මධ්‍යාහ්නයෙහිවූ; උණ්හෙකාලෙ, උෂ්ණකාලයෙහි; පථං, මගට; උපාගමි, පැමිණියේය; පඩිකං, මොලොක් බිමඇති; රමණීයං, සිත්කලුවූ; පෙතානං, ප්‍රෙතයා විසින්; වණ්ණනාපථං, නිර්මිති මාර්ගයක්වූ; මග්ගං, මග; අද්දස, දුටුවේය.

89. රාජා, රජතෙම; සාරථිං, රියදුරා; ආමන්තයි, ඇමතුවේය; සාරථි, රියදුර; අයං මග්ගො, මේ මාර්ගයතෙම; රමණීයො, සිත්කලුය; ඛෙමො, නිර්භයය; සොවත්ථිකො, ස්වස්තිභාවය ඵලවයි; සිවො, නිරුපද්‍රවය; ඉමිනා, මේ මගින්; යාහි, යව; ඉතො, මේ මඟින්; සුරට්ඨානං, සුරට්ඨදෙශයට; සන්තිකෙ, සමීපයෙහි වෙමු.

90. සොරට්ඨො, සුරට්ඨාධිපතිවූ රජතෙම; චතුරංගිනියා සෙනාය, සිවිරහ සෙනඟ සමඟ; තෙන, ඒ මගින්; පායාසි, ගියේය; උබ්බිග්ගරූපො උත්‍රස්ත (තැතිගත්) ස්වභාව ඇති; පුරිසො, පුරුෂයෙක්තෙම; සොරට්ඨං, සුරට්ඨදෙශාධිපතියාහට; එතං, මෙය; අබ්‍රැවි, කීයේය.

91. භිංසනං, භයජනකවූ; ලොමහංසනං, ලොමුදහගන්නාවූ; කුම්මග්ගං, නපුරු මගකට; පටිපන්නාඅම්හ, පිළිපන්නෝවෙමු; පුරතො, ඉදිරියෙහි; මග්ගො, මාර්ගයතෙම; දිස්සති, දක්නාලැබේ; පච්ඡතො, පස්සෙන්; නදිස්සතිච, නොදක්නා ලැබේමය.

92. යමපුරිසානං, ප්‍රෙතයන්ගේ; සන්තිකෙ, සමීපයෙහිවූ; කුම්මග්ගං, නපුරුමගට; පටිපන්නාඅම්හ, පැමිණියෝවෙමු; අමානුසො, අමනුෂ්‍ය (ප්‍රෙත) යන් පිළිබඳ ගන්ධො, ගඳ; වායති, හමයි දුරුණෝ, දරුණුවූ; සොසො, ශබ්දය; සූයති, අසනුලැබේ.

93. සංවිග්ගො, කලකිරුණාවූ; සොරට්ඨො, සුරට්ඨාධිපතිවූ; රාජා, රජතෙම; සාරත්ථිං, රථාචාර්‍යයාට; එතං, මෙය; අබ්‍රැවි, කීයේය (සෙස්ස යටකියනලදී.)

95. හත්ථික්ඛන්ධංච, ඇන්කඳටද; ආරුය්හ, නැඟී; චතුද්දිසං, සිව්දිග; ඔලොකෙන්තො, බලන්නේ; රමණීයං, සිත්කලුවූ; ඡායාසම්පන්නං, සෙවනින් යුක්තවූ; නිලබ්භවණ්ණ

Non-commercial distribution

සදිසං, වණ්ණයෙන් නිල්වලාකුළක් සමානවූ; මෙසවණ්ණසිරී නිහං, මෙසවර්ණඋශ්‍රීසදෘශවූ; නිග්‍රොධං පාදපං, නුගරුකක්; අද්දස, දුටුවේය.

සුරට්ඨදෙශයට අධිපතිවූ පිහුවන් ඇස් ඇති බැවින් පිඬගල යයි ප්‍රකට නම්ඇති රජෙක් වූයේය, රජතෙම මෞර්‍ය්‍ය රාජවංශික ධර්මාශොක රජුට උපස්ථානයට ගොස් නැවත සුරට්ඨ දෙශයට එන්නේ උෂ්ණවූ මධ්‍යාහ්න කාලයෙහි මගට පැමිණියේ ප්‍රෙතයා විසින් මවාපෑ සිත්කලු මග දුටුවේය. එකල රජතෙම රියැදුරාට කථාකොට කියන්නේ මේ මාර්ගය සිත්කලුය නිර්භයය සැප ඵලවයි උපද්‍රව රහිත වෙයි, රථාචාර්‍ය්‍යය මේ මගින් යව මේ මගින් යන්නාවූ අපි සුරට්ඨදෙශය ලභම වෙමුයයි කීය, එසේ කියා සුරට්ඨදෙශාධිපති රජතෙම සිව්රභසෙනහ සමග ඒ මගින් පිටත්ව ගියේය, බියෙන් ත්‍රස්තවූ ස්වභාව ඇති පුරුෂයෙක් ඒ රජ හට මෙසේ කීයේය. දෙවයන් වහන්ස අපි භයජනකවූ ලොමුදහැ ගන්නා වූ නපුරු මගකට පැමිණියෝ වෙමු. ඉදිරියෙන් මග පෙනෙයි පිටපසින් මග නොපෙනෙයි, ප්‍රෙතයන්ගේ සමීපයට අපි පැමිණියෙමු, ප්‍රෙතයන්ගේ ශරීරගඳ හමයි, නිරය වල වධ කරනුලබන්නාවූ සත්වයන්ගේ දරුණු හඬද ඇසේයයි කීය. එකල කලකිරුණු සිත් ඇති සුරට්ඨදෙශයට ප්‍රධානවූ රජතෙම රථාචාර්‍ය්‍යාට මෙසේ කීයේය. අපි බියජනකවූ ලොමු දැහැගන්නාවූ අයහපත් මගකට පැමිණියෙමු. ඉදිරියෙන් මග පෙනෙයි, පසුදෙසින් මග නොපෙනෙයි, ප්‍රෙතයන්ගේ සමීප යෙහි අපි පැමිණියෝවෙමු, ප්‍රෙත ගඳ වැහෙයි, දරුණුහඬ ඇසේයයි කියා ඇතා පිටටනැඟී සිව්දිසාව බලමින් සිත්කලු සෙවනින් යුත් පැහැයෙන් නිල්වලාකුළක් සමානවූ වලාකුළක සිරියහා එකබඳුවූ නුගගසක් දුටුවේය.

96. සාරථිං ආමන්තයි රාජා-කිං එසො දිස්සති බ්‍රහා,
නීලබ්භවණ්ණසදිසො-මෙසවණ්ණසිරී නිහො.

97. නිග්‍රොධො සො මහාරාජ-පාදපො ඡායා සම්පත්තො,
නීලබ්භවණ්ණසදිසො - මෙසවණ්ණසිරී නිහො.

98. තෙන පායාසි සොරට්ඨො-යෙන සො දිස්සති බ්‍රහා,
නීලබ්භවණ්ණසදිසො-මෙසවණ්ණසිරී නිහො.

Non-commercial distribution

99. හත්ථික්ඛන්ධතෝ ඔරුය්හ-ර ජා රුක්ඛං උපාගමී,
නිසිදි රුක්ඛමූලස්මිං-සාමච්චෝ සපරිජ්ජනෝ.

100. පූරං පනීයකරකං-පූවෙ චිත්තෙ ච අද්දස,
පුරිසෝ ච දෙවවණ්ණී-සබ්බ හරණභූසිතෝ,
උපසංකමිත්වා ර ජානං-සොරට්ඨං එතදබ්‍රවී.

101. ස්වාගතං තෙ මහාරාජ-අථෝ තෙ අදුරාගතං,
පිවතු දෙවෝ පානීයං-පූවෙ ඛාද අරින්දම

102. පිවිත්වා ර ජා පානීයං-සාමච්චෝ සපරිජ්ජනෝ,
පූවෙ ඛාදිත්වා පිත්වාච-සොරට්ඨෙ, එතදබ්‍රවි.

103. දෙවතා නුසි ගන්ධබ්බෝ-ආදු සක්කෝ පුරින්දදෙ,
අජානන්තා තං පුච්ඡාම-කථං ජානෙමු තං මයං.

96. රාජා, රජතෙම; සාරථිං, සාරථියා; ආමන්තයි, කැඳවීය; බ්‍රහා, මහත්වූ; නීලබ්භවණ්ණසදිසා, නීලමෙඝවණ්ණ සදෘශවූ; මෙඝවණ්ණසිරිනිභෝ, මේවන්සිරි සමානවූ; එසා, මෙය; දිස්සති, දක්නාලැබේ; කිං, කුමක්ද; (සෙස්ස සුගමයි)

98. සොරට්ඨෝ, සුරාෂ්ට්‍රාධිපති රජතෙම; බ්‍රහා, මහත්වූ; නීලබ්භවණ්ණසදිසෝ, නිල්වලාකුළක් බඳුවූ; මෙඝවණ්ණසිරිනිභෝ, මෙඝවණ්ණශ්‍රීසදෘශවූ; සෝ; ඒ වෘක්ෂය; යෙන, යම් දිශාවකින්; දිස්සති, දක්නාලැබේද; තෙන, ඒ දෙසට; පායාසි, පිටත්විය.

99. රාජා, රජතෙම; හත්ථික්ඛන්ධතෝ, ඇත්කඳින්; ඔරුය්හ, බැස; රුක්ඛං, රුකෙවත; උපාගමී, පැමිණියේය; සාමච්චෝ, ඇමතියන් සහිතවූ; සපරිජ්ජනෝ, පිරිවරජනයා සහිතවූ (රජතෙම); රුක්ඛමූලස්මිං, රුක්මුල; නිසීදි, හුන්නේය.

100. පූරං, (පැනෙන්) පිරුණුවූ; පානීයකරකං, පැන් බඳුනක්ද; චිත්තෙ, මිහිරිවූ; පූවෙච, පුද, අද්දස, දුටුවේය; දෙවවණ්ණී, දිව්‍යවර්ණඇති; සබ්බාහරණභූසිතෝ, සියලු අබරණින් සැරසුණුවූ; පුරිසෝච, පුරුෂයෙක්ද; සොරට්ඨං, සුරාෂ්ට්‍රාධිපතිවූ; රාජානං, රජුවත; උපසංකමිත්වා, එළඹ; එතං, මෙය; අබ්‍රවී, කීයේය.

101. මහාරාජ, මහරජ; තෙ, යුෂ්මතුන්ගේ (ගමන) අදුරා ගතං, නපුරුගමනක් නොවෙයි; තෙ, නුඹගේ; (පැමිණීම)

Non-commercial distribution

අථොස්වාගතං, යහපත් පැමිණීමක්වෙයි; දෙවො, රජතෙමේ; පානීයං, පැන්; පිවතු. පානය කෙරේවා; අරින්දම, සතුරන් දමනය කරනාසුලුවූ රජ; පුවෙ, පු; ඛාද, වළඳනු මැනවි.

102. සාමච්චො, ඇමතියන් සහිතවූ; සපරිජ්ජනො, පිරිවරජනයා සහිතවූ; සොරට්ඨො, සුරට ඉසුරුවූ; රාජා, රජතෙමේ; පානීයං, පැන්; පිවිත්වා, බී; පුවෙ ඛාදිත්වා, ඛාද්‍යයන් අනුභව කොට; පීත්වාච, පානයකොට, එතං, මෙය; අබ්‍රැවී, කීයේය.

103. දෙවතානුඅසි, (නුඹ) දෙවියෙක් වෙහිද; ගන්ධබ්බො; ගන්ධර්වයෙක්ද; ආදු, නොහොත්; පුරින්දදෙ, පුරින්දද නම්වූ; සක්කො, ශක්‍රයාවෙහිද; අජානන්තා, නොදන්නාවූ; මයං, අපි; තං, නුඹ; පුච්ඡාම, විචාරමු; තං, යුෂ්මතා; කථංජානෙමු, කෙසේ දනිමුද.

ඒ දුටු රජතෙම රියදුරාට කථාකොට කියන්නේ මෙවන් පැහැයෙන නිල්වලාකුළක් සමානවූ වලාකුළක සටහන් ඇති මේ දක්නේ කිමෙක්දැයි විමෘළේය. එකල්හි ඒ රථාචාර්‍යයා කියන්නේ මහාජාණෙනි සෙවනින්යුත් නිල්පැහැ වලාකුළක් සමාණවූ මෙසවණ්ශ්‍රී සදෘශව මේ දක්නාලැබෙන්නේ නුගගසක් යයි කීය. එවිට රජතෙම නිල්පැහැ වලාකුළක්බඳු වලාකුළු සටහන් සමානවූ ඒ නුගරුක යම් දිසාවක දක්නා ලැබේද එතනට ගියේය. ඇතුපිටින් බැස ඇමතියන් සහිතවූ පිරිවර ජනයා සහිතවූ රජතෙම නුගගස ළඟට පැමිණ ගසමුල හුන්නේය. රජතෙම පැන් පිරුණු බඳුන් හා ඕහිරි වූවලින් පිරුණු භාජනද දුටුවේය. එකල දිව්‍යවණ් ඇති ප්‍රේතතෙමේද සර්‍ව භරණයෙන් සැරසුණේ සුරට්ඨදෙශාධිපතිවූ රජුවෙත පැමිණ මෙසේ කීයේය. මහරජ නුඹගේ මෙහි ඊම යහපත් පැමිණීමක්ම වෙයි, නරක ගමනෙක් නොවෙයි, රජතෙම පැන්පානය කෙරේවා, සතුරන් දමනය කරන සිලිවූ පින්වත් රජ කැවිලි වළඳනු මැනව. ඇමතියන් සහිතවූ පිරිවර ජනයා සහිතවූ රජතෙමේ කැවිලිකා පැන් බී මෙසේ කීයේය. පින්වත නුඹ දේවතාවෙකද ගන්ධර්‍වයෙක්ද නොහොත් පුරින්දද නම්වූ ශක්‍රයාදැයි නොදන්නාවූ අපි නුඹගෙන් විචාරමු. අපි කෙසේනම් නුඹ දැන ගනිමුදැයි කිය.

104. නමිහි දෙවො න ගන්ධබ්බො-නපි යක්කො පුරින්දදෙ;
පෙතා අහං මහාරාජ-සුරට්ඨා ඉධ මාගතො.

Non-commercial distribution

105. කිං සීලෝ කිං සමාචාරෝ-සුරට්ඨස්මිං පුරෙ තුවං,
කෙන තෙ බ්‍රහ්මචරියෙන-ආනුභාවෝ අයං තව.

106. තං සුණෝහි මහාරාජ-අරින්දම රට්ඨවඩ්ඪන,
අමච්චා පාරිසජ්ජා ච-බ්‍රාහ්මණෝ ච පුරොහිතෝ.

107. සුරට්ඨස්මා අහං දෙව-පුරිසෝ පාපචෙතසෝ,
මිච්ඡාදිට්ඨී ච දුස්සීලෝ-කදරියෝ පරිභාසකෝ.

108. දදන්තානං කරොන්තානං-චරයිස්සං බහුජ්ජනං,
අඤ්ඤෙසං දදමානානං-අන්තරායකරෝ අහං.

109. විපාකෝ නත්ථි දානස්ස-සංයමස්ස කුතෝ ඵලං,
නත්ථි ආචරියෝ නාම-අදන්තං කෝ දමෙස්සති.

110. සමතුල්‍යානි භූතානි-කුතෝ ජෙට්ඨාපචායිකෝ,
නත්ථි බලං විරියං වා-කුතෝ උපට්ඨානපොරිසං.

111. නත්ථි දානඵලං නාම-න විසොධෙති වෙරිනං,
ලඛෙය්‍යං ලභතෙ මච්චෝ-නියති පරිනාමජා.

112. නත්ථි මාතා පිතා භාතා-ලොකෝ නත්ථි ඉතෝ පරං,
නත්ථි දින්නං නත්ථි හුතං-සුනිහිතම්පි විජ්ජති.

104. මහාරාජා, මහරජ; අහං, මම; දෙවොනඅම්හි, දෙවියෙක් නොවෙමි; නගන්ධබ්බෝ, ගන්ධර්‍වයෙක්ද නොවෙමි; පුරින්දදෙ, පුරින්දද නම්වූ; නහිසක්කෝ, ශක්‍රයෙක්ද නොවෙමි; සුරට්ඨෙ, සුරට්ඨදෙශයෙන්; ඉධ, මෙහි; ආගතෝ, පැමිණියාවූ; **පෙතෝ, ප්‍රෙතයෙක් වෙමි.**

105. තුවං, නුඹ; පුරෙ, පූර්‍වජන්මයෙහි; සුරට්ඨස්මිං, සුරට්ඨ දෙශයෙහිදී; කිංසීලෝ. කෙබඳු සිල්වතෙක් වූවෙහිද; කිංසමාචාරෝ, කෙබඳු සමාචාර ඇතිවූවෙහිද; තෙ, නුඹගේ; කෙනබ්‍රහ්මචරියෙන, කෙබඳු බ්‍රහ්මචර්‍යාවක් හෙතුකොට; තව, නුඹට; අයං ආනුභාවෝ, මේ ආනුභාව ඇතිවීද.

106. අරින්දම, සතුරන්දමන සුලුවූ; රට්ඨවඩ්ඪන, රට වර්ධනය කරන්නාවූ; මහාරාජ, මහරජ; තං, එය; සුණෝහි, අසනුමැනවි; අමච්චා, ඇමතියෝද; පාරිසජ්ජාව, පිරිවරජනයෝද; පුරොහිතෝ බ්‍රාහ්මණොව, පුරොහිත බමුණුතෙමේද; (සුණන්තු) අසත්වා.

Non-commercial distribution

107. දෙව, දෙවයන්වහන්ස; අහං, මම; සුරට්ඨස්මා, සුරටය දෙසයෙන්; පාපචෙතසෝ, පවිසිත් ඇත්තාවූ; මිච්ඡා දිට්ඨිව. (නාස්තිකදෘෂ්ටියෙන්) විපරීත දැකුම්ඇත්තාවූ; දුස්සීලෝ, නිශ්ශීලයෙක්වූ; කදරියෝ, තදමසුරෙක්වූ; පරිභාසකෝ, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට පරිභව කරන්නාවූ; පුරිසෝ, පුරුෂයෙක්වීමි.

108. අහං, මම; දදන්තානං, දන්දෙන්නවුන්ටද; අඤ්ඤෙසං, අනුන්ට; කරොන්තානං, උපකාර කරන්නවුන්ටද; අන්තරායකරෝ, අනතුරු කරන්නෙක්ව; දදමානානං, දන් දෙනුවන්ගෙන්; බහුජ්ජනං, බොහෝ ජනයා; වාරයිස්සං, (දානමය පුණ්‍යයෙන්) වැලක්වීමි.

109. දානස්ස, දානයාගේ; විපාකොනත්ථි, මතු විපාක යෙක් නැත; සංයමස්ස, ශීලසංයමයාගේ; ඵලං විපාකයක්නම්; කුතෝ, කොයින්ද; ආචරියොනාම, (ආචාර සමාචාර ශික්ෂාපක) ආචාර්‍යයෙක්නම්; නත්ථි, නැත; අදන්තං, නොදැමුණහු; කෝ, කවරෙක් තෙම; දමෙස්සති, දමනය කරන්නේද.

110. භූතානි, සත්වයෝ; සමතුල්‍යානි, (ඔවුනොවුන්) සමසමයෝ වෙත්; ජෙට්ඨාපචායිකෝ, ජ්‍යෙෂ්ඨාපචායන පුණ්‍යයක් නම්; කුතෝ, කොයින්ද; බලං, බලයක් හෝ; විරියංවා, වීර්‍යයක් හෝ; නත්ථි, නැත; උට්ඨානපොරිසං, උත්ථාන පුරුෂ පරාක්‍රමයක්; කුතෝ, කොයින්ද.

111. දානඵලංනාම, දානවිපාකයක් නම්; නත්ථි, නැත; වෙරිනං, (වෛරයන්ගේ වශයෙන් පවිකළ) වෛර ඇති පුද්ගලයා; නවිසොධෙති, පිරිසිදු නොකරයි; මච්චෝ, මනුෂ්‍ය තෙමේ; නියතිපරිනාමජා, නියතිපරිනාමජ වශයෙන්; ලද්ධෙය්‍යං, ලැබිය යුතුදේ; ලභතෙ, ලබයි.

112. මාතා, මව්කෙනෙක්ද; පිතා, පියෙක්ද; භාතා, සොහොයුරෙක්ද; නත්ථි, නැත; ඉතෝ, මෙලොවින්; පරං මතු; ලොකෙ, ලොකයක්; නත්ථි; නැත; දින්නං, මහාදානයක්; නත්ථි, නැත; හුතං, දුරසිට එළවනලද සත්කාරයද; නත්ථි, නැත; සුනිහිතම්පි, මොනවට තබන ලද්දකුත්; නව්ජ්ජති, නැත්තේය.

මහරජ මම දෙවියෙක් නොවෙමි, ගන්ධර්වයෙක් නොවෙමි, නුවරක් පාසා දන් දුන් හෙයින් පුරින්දදයයි කියනලද ශක්‍ර

Non-commercial distribution

යෙක්ද නොවෙමි. මම වනාහි සුරට්ඨදෙශයෙන් මැරී මෙහි ඉපදීම් වශයෙන් පැමිණි ප්‍රෙතයෙක් වෙමියි කීයේය. එවිට රජ විචාරන්නේ නුඹ පෙර සුරට්ඨදෙශයෙහි විසූකල්හි කවර ශීල යක් ඇත්තෙක්වූයේද, කිනම් සමාචාර ඇත්තෙක්වූයේද, නුඹ ගේ කවර බ්‍රහ්මචර්‍යාවක් හෙතුකොටගෙන තොපට මෙබඳු ආනුභාවයක් ඇතිවීදැයි කියා ඇසීය. එකල ප්‍රෙතයා කියන්නේ සතුරන් දමනය කරන්නාවූ රට වර්ධනය කරන්නාවූ මහ රජ-පුරුවන් වහන්ස නුඹ හා ඇමතිජනයා හා නුඹගේ පුරොහිත බ්‍රාහ්මණයාද එය අසනු මැනව, දෙවයන්වහන්ස මම සුරට්ඨ දෙශයෙහි පුරුෂයෙක් වෙමි, මම පව්ටු තැනැත්තෙක්ද මිථ්‍යා දෘෂ්ටිකයෙක්ද සිල් නැත්තෙක්ද, තද මසුරෙක්ද මහණබමුණන්ට නින්දාපරිභව කරන්නෙක්ද වීමි, මම දන්දෙන්නවුන්ට හා උපකාර කරන ජනයාටත් අන්තරාය කරන්නෙක්ව දන්දෙන දනන්ගෙන් බොහෝදෙන දනමය කුශලයෙන් වැලැක්වීමි. දන්දෙන දයකයාහට ඒ දනයාගේ මතු පැමිණියැනැකි විපාකයක් නැත්තේය, ශීලයාගේ විපාකයක් නැත්තේය, ආචාර සමාචාර වත්හි හික්මවන කිසිම ආචාර්‍යකෙනෙක් නම් නැත්තේය, ස්වභාවයෙන්ම සත්වයෝ හික්මුණෝ හෝ නොහික්මුණෝ වෙත් එහෙයින් නොහික්මුණු සත්වයා කවරෙක් හික්මවන්නේද මේ සත්වයෝ සියල්ලෝම එකිනෙකා සමසමයෝ වෙත්. එහෙයින් ජ්‍යෙෂ්ඨයෙක් නැත්තේය, එසේ හෙයින් ජ්‍යෙෂ්ඨයන්ට කට යුතුවූ වැඳීම් ගරුකිරීම් ආදි කුශලයකුත් කොයින්ද, නැත්තේය, තමාගේ ශක්තියෙහි පිහිටි සත්වයෝ යම් වීර්‍යයක් කොට මිනිසුන් අතර යහපත් පිනැති බැව් ආදිකොට අර්හත්වය දක්වා සම්පතට පැමිණෙත්ද එබඳු වීර්‍ය බලයකුත් නැත්තේය, මේදේ අපගේ පුරුෂ වීර්‍යයෙන් පුරුෂක්‍රියාවෙන් පැවැත්තේයයි කියන උත්ථානයක් පුරුෂ පරාක්‍රමයයක් නැත්තේය, දනයාගේ කිසිම ඵලයක්නම් නැත, දනපස්තුවදීම අලුකරන ලද්දක්සේ නිෂ්ඵලවෙමය, වෛරයන්ගේ වශයෙන් හෝ ප්‍රාණඝාතාදීන්ගේ වශයෙනුත් කරන ලද පව්ඇති පුද්ගලයා දානශීලාදී කුසල්කිරී මෙන් කිසිකලක පිරිසිදුනොවෙයි, මේ සත්වයා ලැබියයුතු හෝ දුකක් හෝ ලබන්නේද එය නියම පිරිනැමීම් වශයෙන් ලබයි, කර්මයක් කළ බැවින් නොවෙයි, ඊශ්වරාදී හෙතුවකිනුත් නොලැබෙයි, මව්පිය සහෝදරාදීන් කෙරෙහි යහපත් පිළිපැදී-

Non-commercial distribution

මෙන් හෝ වරදවා පිළිපැදීමෙන් හෝ විපාක බවක් නැත්තේය, මෙලොව හැර පරලොවක් නම් කිසිත් නැත, ඒ ඒ තැන්හිදීම සත්වයෝ සිඳෙත්, දෙනලද මහාදානයාගේ විපාකයෙක් නැත, දුරසිට කරනලද සත්කාරයාගේද විපාකයක් නැත, යම්හෙයකින් මහණ බමුණන්ට දන්දීම අනුගාමික නිධානයක්යයි කියන්ද එබන්දකුත් නැත්තේය, ඒ ඔවුන්ගේ වචනයෙන් කීම පමණකි.

113. **යොපි හනෙය්‍ය පුරිසං-පරස්ස ඡින්දතෙ සිරං,**
න කොචි කිඤ්චි හනති-සත්තත්තං විවරමන්තරෙ.

114. **අච්ඡෙජ්ජඡෙජ්ජෝ ජීවෝ-අට්ඨංසොගුළපරිමණ්ඩලෝ,**
යොජනානං සතං පඤ්ච-කෝ ජීවං ඡෙතුමරහති.

115. **යථා සුත්තගුළෙ ඛිත්තෙ-නිබ්බෙඨෙන්තං පලායති,**
එවමෙවම්පි සෝ ජීවෝ-නිබ්බෙඨෙන්තෝ පලායති.

116. **යථා ගාමතෝ නික්ඛම්ම-අඤ්ඤං ගාමං පවිසති,**
එවමෙවම්පි සෝ ජීවෝ-අඤ්ඤං කායං පවිසති.

117. **යථා ගෙහතෝ නික්ඛම්ම-අඤ්ඤං ගෙහං පවිසති,**
එවමෙවම්පි සෝ ජීවෝ-අඤ්ඤං බොන්දිං පවිසති.

118. **චුළාසීති මහාකප්පුනෝ-සතසහස්සාතිපි හි,**
යෙ බාලා යෙව පණ්ඩිතා
සංසාරං ඛෙපයිත්වාන-දුක්ඛස්සන්තං කරිස්සරෙ,

113. යොපි, යමෙකුත්; පුරිසං, පුරුෂයෙකු; හනෙය්‍ය, නසන්නේද; පරස්ස, අනිකෙකුගේ; සිරං, හිස; ඡින්දතෙ, සිඳිද; කොචි, කිසිවෙක් තෙම; කිංචි, කිසි පුද්ගල ඉයකු; නහනති, නොනසයි; සත්තන්නං, (පෘථිවි ආදි) සප්තකාය යන්ගේ; විවරමන්තරෙ, සිදුරු අතරෙහි (ප්‍රවෙශවෙයි.)

114. ජීවෝ. (සත්වයන්ගේ මේ) ජීවයතෙම; අච්ඡෙජ්ජ හෙජ්ජෝ සිදබිඳලියහැකි නොවේ; අට්ඨංසෝ, අටස්ද; ගුලපරිමණ්ඩලෝ, ගුලපිරිමඬුලුදවෙයි; යොජනානං සතංපඤ්ච, යොදුන් පන්සියක් උසදවෙයි; කෝ, කවරෙක්තෙම; ජීවං, ජීවය; ඡෙතුං, සිඳින්නට; අරහති, සුදුසුද.

115. යථා, යම් සේ; සුත්තගුළෙ, (වෙළාකළ) හූගුළියක්; ඛිත්තෙ, (වෙළුම්හැරීම් වශයෙන්) දැමූකල්හි; නිබ්බෙඨෙන්තං,

Non-commercial distribution

වෙළුම් හරිමින්; පලායති, යේද; එවං එවම්පි, එසේම; සොජීවෝ, ඒ ජීවයතෙම; නිබ්බඛයෙන්තෝ, නිවේඨනයවෙමින්; පලායති, යයි.

116. යථා, යම්සේ, ගාමතෝ, (කිසිවෙක්) නිවාසග්‍රාම යෙන්; නික්ඛම්ම, නික්මී; අඤ්ඤංගාමං, අනික් ගමකට; පවිසති, ප්‍රවිෂ්ටවේද; එවමෙවම්පි, එසේම; සොජීවෝ, ඒ ජීවය; අඤ්ඤං කායං, අනික් ශරීරයකට; පවිසති, ඇතුල්වේ.

117. යථා, යම්සේ; ගෙහතෝ, ගෙයින්; නික්ඛම්ම, නික්මී; අඤ්ඤංගෙහං, තවත් ගේකට; පවිසති, ප්‍රවිෂ්ටවේද; එවමෙවම්පි, එසේම; සොජීවෝ, ඒ ජීවයතෙම; අඤ්ඤං-බොන්දිං, අනික් ශරීරයකට; පවිසති, ප්‍රවෙශවෙයි.

118. යෙබාලා, යම් අන්ධබාලයොත්වෙත්ද; යෙව-පණ්ඩිතා, යම් පණ්ඩිතයොත්වෙත්ද (ඔවුහු); මහාකප්පුනෝ, මහාකල්පයන්; චූළසීතිසතසහස්සානිපිහි, සුවාසුලක්ෂයක් මුළුල්ලෙහිම; සංසාරං, සසර; ඛෙපයිත්වාන, (ඔබිමොබ ඉපදීම් වශයෙන්) ගෙවා; දුක්ඛස්සඅන්තං, දුක් කෙළවර; කරිස්සරෙ, කරන්නාහුය.

යම් පුරුෂයෙක්තෙම තවත් පුරුෂයෙකු මරන්නේද, අන් පුරුෂයෙකුගේ හිසකපන්නේද, එහිදී පරමාත්ථ වශයෙන් කිසි වෙක්තෙම කිසිසත්වයෙකු නොමරයි, පෘථිවිආදී සප්තධාතු කායය සිදුරු බැඳින් මරන්නාක්මෙන්වෙයි; පෘථිවී ආදි සප්ත ධාතු ශරීරයාගේ සිදුරු අතර ශස්ත්‍රය ඇතුල්වෙයි, එහෙයින් සත්වයෝ කඩු ආදියෙන් ගසා මරනලද්දක්හු මෙන් වෙත්, ජීවයමෙන් සෙසු ශරීරයෝද නිත්‍ය ස්වභාව හෙයින් නොසිඳෙත්, සත්වයන්ගේ මේ ජීවය නිත්‍ය ස්වභාව හෙයින් ශස්ත්‍රා දියකින් ගසා නොසිඳිය හැක, නොබිඳියහැක, ඒ ජීවය වනාහි සමහර කලෙක අටස්වෙයි, සමහරකලෙක ගුළියක්සේ පිරිමඩුලු වෙයි, කෙවලී බවට පැමිණියේ නම් යොදුන් පන්සියයක් උස වෙයි, මෙසේ නිත්‍ය වූ විකාර රහිත වූ ජීවය ආයුධාදියකින් කපන්ට කවරෙක් නම් සමර්ථවේද, ඒ ජීවය කැපීම් ආදි කිසිවකින් චෙනස් නොකොට හැකිය, යමෙකු විසින් පර්වතයක් මුදුනක හෝ සිට නූල්ගුළි (බෝල) යක් වෙළුම් හැරීම් වශයෙන් දමූ කල්හි නොවේලීම යම්සේයේද නූලනිමවූකල්හි නොයේදළු සේම්

Non-commercial distribution

ඒ ජීවය මහාකල්ප අසුසාරලක්ෂයක් මුළුල්ලෙහි ආත්මභාව නමැති ගුළිය නොවෙළෙමින් පවතියි. යම් සේ යම් කිසි පුරුෂ යෙක්තෙම තමන් නිවැසි ගමින් නික්ම කිසියම් කටයුත්තක් හේතුකොටගෙන වෙන ගමකටයේද එසේම ඒ ජීවයද මේ ශරීරයෙන් නික්ම තවත් ශරීරයකට නියතවශයෙන් පැමිණෙයි. යම්සේ යමෙක් තමා සිටි ගෙයින් නික්ම අන් ගෙයකට පැමිණේද, එසේම ඒ ජීවය මේ ශරීරයෙන් නික්ම අන්‍ය කයකට පැමිණේ. යම් අන්ධබාලයෝත් වෙත්ද පණ්ඩිතවූ යම් ජන යෝත් වේත්ද ඒ සියල්ලෝම මහා කල්ප අසූසාරලක්ෂයක් මුළුල්ලේම ඔබිමොබ ඉපදීම් වශයෙන් සංසාරය ගෙවා දුක් කෙළවර කරන්නාහුය. පණ්ඩිතයෝද අතරතුර සසර සිදලන්ට නුපුළුවන්වෙත්, බාලයෝද ඒ මහාකල්ප අසූසාරලක්ෂයට වැඩියෙන් නොපවතිත්යයි කියා ඔහුගේ ලබ්ධිය වේ. එහි මහා කල්පය නම් අනවතප්නාදි එක් මහවිලකින් හවුරුදු සියක් සියක් ගියකල තණඅගින් එකඑක දිය බින්දුවක් බැහැර කරත්ද මේ ක්‍රමයෙන් සත්වරක් ඒ විල දිය නැතිවූ කල්හි එක් මහා කල්පයක්යයි කියා මෙබඳු මහා කල්ප අසූසාරලක්ෂයක් සංසාරයාගේ කාලප්‍රමාණයයි කියත්.

119. මිතානි සුබද්ධක්ඛානි – දෙණෙහි පිටකෙහි ච,
ජිනෝ සබ්බං පජානාති – සම්මුළ්හා ඉතරා පජා.

120. එවං දිට්ඨී පුරෙ ආසි – සම්මුළ්හෝ මොහපාරුතෝ,
මිච්ඡාදිට්ඨීව දුස්සීලෝ – කදරියෝ පරිභාසකෝ.

121. ඔරං මෙ ඡහි මාසෙහි – කාලකිරියා භවිස්සති,
එකන්තං කටුකං සොරං – නිරයං පපතිස්සහං,

119. සුබද්ධක්ඛානි, සුවිදුක්; දෙණෙහි, ද්‍රෝණයකින් හෝ; පිටකෙහිච, පැසකින් හෝ; මිතානි, (මණිනලද්දක්හුමෙන් යථොක්ත කාලපරිච්ඡේදයෙන්) පමණ කරන ලදහ; ජිනෝ, ජින භූමියෙහි සිටියෙක්; සබ්බං, සියල්ල; පජානාති, ප්‍රකෂී-යෙන්දනී; ඉතරාපජා, අනිත් ප්‍රජාතොමෝ; සම්මුළ්හා, අතිශයින් මුළාවේයි.

120. පුරෙ, පෙර; එවංදිට්ඨී, මෙබඳු දෘෂ්ටි ඇත්තෙක්; ආසිං, වීවී; සම්මුළ්හෝ, අතිශයින් මුළාවූයේද; මොහපාරුතෝ,

Non-commercial distribution

මොහයෙන් වැසුණේද; මිච්ඡාදිට්ඨිය ම, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේද; දුස්සීලයා, සිල් නැත්තේද; කදරියා, තදමසුරුද; පරිභාසකයා, පරිභව කරන්නේද වීමි.

121. ජහිමාසෙහි; සමසකින්; ඔරං, මෙබ; මෙ, මාගේ; කාලකිරියා, කාලක්‍රියාව; භවිස්සති, වන්නේය; (සෙස්ස යට කියන ලදී.)

සත්වයන්ගේ සැප දුක් දෙක ද්‍රෝණයෙන් හෝ පැසකින් හෝ මිණින ලද්දක්මෙන් යට කියන ලද කාළපරිච්ඡේදයෙන්ම පමණ කරන ලද බැවින් නියතින් සමව පවත්නාහුය. ඒ මේ සියල්ල ජීන භූමියෙහි සිටියෙක් දනී, අනිත් මේ ප්‍රජාතොමෝ මෝහයෙන් මුළාව කරකැවෙයි. මහරජ පෙර මම මෙසේ කියන ලද නාස්තික මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක් වූයෙමි, යට කියන ලද දෘෂ්ටියට හෙතුභූත වූ අතිශය මුළාවෙන් මුළා වූයෙමි. සහජාත මෝහයෙන් වැසුණු කුසල් බිජු ඇත්තෙක් වීමි, මෙසේ මිථ්‍යාදෘෂ්ටිකයෙක්ද දුශ්ශීලයෙක්ද තද මසුරු සිත් ඇත්තෙක්ද මහණ බමුණන්ට නින්ද කරන්නෙක්ද වූයෙමියි කීය. මෙසේ පූර්ජාතියෙහි තමාට උපන් යම් ලාමක මිථ්‍යාදෘෂ්ටියක්වීද ඒ මිථ්‍යාලබ්ධිහුගේ වශයෙන් කරන ලද පාපකර්ම දක්වා නැවත තමා විසින් මතු කාලයෙහි විඳිය යුතු ඒ පාපකර්මයාගේ විපාක දක්වමින් ප්‍රේත තෙම කියන්නේ, මහරජ මෙයින් සමසකින් මොබෙහි මාගේ මරණය වන්නේය, මම මැරී ගොස් ඒකාන්තයෙන් කටුකවූ දරුණු වූ නිරයෙහි වැටෙන්නෙමි යි කීය.

122.* චතුක්කණ්ණං චතුවාරං – විහත්ථං භාගසෝ මිතං,
අයොපාකාරපරියන්තං – අයසා පටිකුජ්ජිතං.

123.* තස්ස අයොමයාභූමි – ජලිතා තේජසා යුතා,
සමන්තා යොජනසතං – ඵරිත්වා තිට්ඨති සබ්බදා.

124. වස්සානි සතසහස්සානි – සොසෝ සුයති තාවදෙ,
ලක්ඛෝ එසෝ මහාරාජ – සතභාගවස්සකොටියෝ.

125. කොටිසතසහස්සානි – නිරයෙ පච්චරෙ ජනා,
මිච්ඡාදිට්ඨී ච දුස්සිලා – යෙ ච අරියූපවාදිනෝ.

126.* තත්ථාහං දීඝමද්ධානං – දුක්ඛං වෙදිස්ස වෙදනං,
ඵලං පාපස්ස කම්මස්ස – තස්මා සොචාමහං භුසං.

Non-commercial distribution

124. මහාරාජ, මහරජ; වස්සානිසතසහස්සානි, හවුරුදු ලක්ෂයක් ඉක්ම ගිය කල්හි; තාවදෙ, එතනින්; සොසො, ශබ්දයක්; සූයති, ඇසෙයි; සතභාගවස්සකොටියො, සියක් කොටස්වූ හවුරුදු කොටියක් වෙති; එසො, මෙය; ලක්ඛො, (ආයු) පරිච්ඡෙදයයි.

125. යෙවජනා, යම් සත්වකෙනෙක්; කොටිසතසහස්සානි, හවුරුදු සියකෙළක් මුළුල්ලෙහි; නිරයෙ, නරකයෙහි; පච්චරෙ, පැසෙත්ද (ඔවුහු); මිච්ඡාදිට්ඨිකච, මිථ්‍යාදෘෂ්ටිකයෝද; දුස්සීලා, දුශ්ශීලයොද; අරියූපවාදිනො, ආර්‍යෝපවාද කළෝද වෙත්.

ඒ නරකය නම්, සිව්කොනක් ඇත්තේය, දෙරටු සතරක් ඇත්තේය, කොටස් වශයෙන් පමණ කොට බෙදන ලද්දේය, නවයොදුන් සත ඇති යපවුරකින් වට කරන ලද්දේය, නව යොදුන් ගනකම ඇති යපියනකින් වසන ලද්දේය, ඒ නරකයාගේ යපොළව නිතර ගිනිගෙන දිලිසෙයි, ගිනිදැල්වලින් යුක්ත වන්නීය, භාත්පසින් සියක් යොදුන් දුර සෑමදම ගිනිදැල් පැතිර සිටින්නීය. මහරජ ඒ නරකයෙහි ඉපිද හවුරුදු ලක්ෂයක් ඉක්මුණු කල්හි නිදුකානෙනි මෙහි දුක් විඳින්නාවූ තොපට අවුරුදු ලක්ෂයක් ඉක්ම ගියේ යයි කියා ඒ නරකයෙහි ශබ්දයක් ඇසෙයි, මහරජ නිරයෙහි වැටී දුක් විඳිමින් පැසෙන සත්වයන්ගේ ආයුපරිච්ඡෙදය හවුරුදු සියක්කොටියක් වෙයි. මේ කාරණය මෙසේ කියන ලද්දේ වෙයි:- දශක දශයක් සියයකි, සියදසයක් දහසකි, දසදහස් දසයක් ශතසහස්‍ර (ලක්ෂ) යකි, ශතසහස්‍ර සියයක් කොටියකි, ඒ කොටීන්ගේ වශයෙන් අවුරුදු සියක් කොටියක් වේ, ඒ සියක් කොටියද නිරයට අයත්වූම අවුරුදු ගණන් වසයෙන් දත යුතුයි, මිනිස් ගණනින් හෝ දෙව් ගණනින් නොවේමය, මෙබඳු නොයෙක් හවුරුදු සිය කෙළගණනක් නිරයෙහි උපන් සත්වයන්ට ආයුවෙති. මෙසේ යම් සත්ව කෙනෙක් යම්බඳු පාපකර්මයක් හේතුකොට ගෙන නිරයෙහි වැටී හවුරුදු සියකෙළ ගණන් මුළුල්ලෙහි පැසෙත්ද, ඔවුහු නම්, මිථ්‍යාදෘෂ්ටිකයෝද දුශ්ශීලයෝද ආර්‍යෝපවාද අකුසල් කළෝද වෙත්. මහරජ මම නිරයෙහි ඉපදීමට හොස් මවිසින් කරන ලද පාපකර්මයාගේ විපාකයවූ දුක් වෙදනා දීසී කාලයක් මුළුල්ලෙහි විඳින්නෙමි, එහෙයින් මම අතිශයින් ශොක කරමියි කීයේය. මෙසේ තමා

Non-commercial distribution

විසින් මතු කාලයෙහි විඳිය යුතු වූ පාපකර්මී විපාකය දක්වා නැවත "නුඹගේ කවර බ්‍රහ්මචර්‍යා හෙතුවකින් ඔබට මේ ආනුභාවය ඇති වූයේ දැ"යි කියා රජු විසින් ඇසූ කාරණය කියා ඔහු සරණයෙහි හා ශීලයෙහිත් පිහිටුවනු කැමැතිව කියන්නේ:-

127. තං සුණෝහි මහාරාජ – අරින්දම රට්ඨවඩ්ඪන,
ධීතා මය්හං මහාරාජ – උත්තරා භද්දමත්ථු තෙ.

128. කරොති භද්දකං කම්මං – සීලෙසුපොසථෙ රතා,
සඤ්ඤතා ස විභාගී ච - වදඤ්ඤූ වීතමච්ඡරා.

129. අඛණ්ඩකාරී සික්ඛාය – සුණ්හා පරකුලෙසු ච,
උපාසිකා සක්‍යමුනිනො – සම්බුද්ධස්ස සිරීමතො.

130. භික්ඛු ච සීලසම්පන්නො – ගාමං පිණ්ඩාය පාවිසි,
ඔක්ඛිත්තචක්ඛු සතිමා – ගුත්තචාරො සුසංවුතො.

131. සපදානං චරමානො – අගමා තං නිවෙසනං,
තමද්දස මහාරාජ – උත්තරා භද්දමත්ථු තෙ.

132. පුරං පානියස්ස කරකං – පුවෙ චින්තෙ ච සා අද,
පිතා මෙ ක ලකතො හන්තෙ – තස්ස තං උපකප්පතු.

127-128. අරින්දම, අරින්දම වූ; රට්ඨවඩ්ඪන, රට වර්ධනය කරන්නාවූ; මහාරාජ, මහරජ; තං, එය; සුණෝහි, අසනු මැනව්; මහාරාජ, මහරජ; තෙ, යුෂ්මතුන්ට; භද්දං අත්ථු, යහපතක් වේවා; මය්හං, මාගේ; උත්තරා, එනමවූ; ධීතා, දියණි තොමෝ; භද්දකං කම්මං, කුශලකර්‍ය; කරොති, කරයි; සීලෙසු, නිත්‍ය පඤ්චශීලයෙහිද, උපොසථෙ, උපොසථශීල-යෙහිද; රතා, ඇලුණී වෙයි; සඤ්ඤතා, භික්මුණිද, සංවිභාගීව, දානසංවිභාග ඇත්තීද; වදඤ්ඤූ, බොහෝදෑ දෙන්නීද; වීතමච්ඡරා, පහවූ මසුරුමල ඇත්තීද වෙයි.

129. පරකුලෙසු, අන්කුලයක; සුණ්හාව, යෙහෙළියක් වූවත්; සික්ඛාය, ශික්‍ෂාව; අඛණ්ඩකාරී, කඩනොකරන සුලුය; සක්‍යමුනිනො, ශාක්‍යමුනිවූ; සිරිමතො, ශ්‍රීමත්වූ; සම්බුද්ධස්ස, සම්බුදුන්ගේ; උපාසිකා, උපාසිකාවක් විය.

130. ඔක්ඛිත්තචක්ඛු, යටහෙළන ලද ඇස් ඇති; සතිමා, සිහි ඇති; ගුත්තචාරො, රකින ලද ඉඳුරන් ඇති; සුසංවුතො, මනාව භික්මුණාවූ; සීලසම්පන්නො, සිල්වත්වූ; භික්ඛු, භික්ෂු නමක්; ගාමං, ගමට; පිණ්ඩාය, පිඬු පිණිස; පාවිසි, වැඩියේය.

Non-commercial distribution

131. මහාරාජ, මහරජ; තෙ, නුඹට; භද්දං අත්ථු, වැඩෙක් වේවා; සපදනං. ගෙපිළිවෙළින්; චරමානො, වඩිමින්; තං නිවෙසනං, ඒ ගෙදරට; අගමා, වැඩියේය; උත්තරා තොමෝ; තං, ඒ භික්ෂුනු; අද්දස, දුටුවේය.

132. සා, ඕතොමෝ; පූරං, පැන්පිරුණාවූ; පානියස්ස කරකං, පැන්බඳුනක්ද; චිත්තෙ, විචිත්‍රවූ; පූවේච, බාද්‍යයන්ද; අද, දුනි; හන්තෙ, ස්වාමිනි, මෙ, මාගේ; පිතා, පියතෙම; කාල කතො, කළුරියකෙළේය; තස්ස, ඕහට; තං, ඒ පින; උපකප්පතු, පැමිණේවා.

මහරජ ඒ කාරණය අසනුමැනව, මහරජ ඔබට වැඩක්වේවා මහරජ මගේ උත්තරානම් දියණිතොමෝ කුශලකම් කරයි, නිත්‍ය පඤ්චශීලයෙහි හා උපොසථශීලයෙහිත් ඇලුණිය, භික්මුණිය, දන් දෙන්නිය. බොහෝදෑ දෙන්නිය, පහවූ මසුරුමල ඇත්තිය, පරකුලයෙහි යෙහෙළියක් වූවත් ශික්ෂාව නොකඩන්නිවූය, ශ්‍රීමත් ශාක්‍යමුනිවූ සර්ඳුයන් වහන්සේගේ උපාසිකාවක්විය, යට හෙළනලද ඇස් ඇති සිහියෙන් යුත් ගුප්තචාර ඇති යහපත් සංවරයෙන් යුත් සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් ගමට පිඬු පිණිස වැඩිසේක. මහරජ ඔබට යහපතක් වේවා, ගෙපිළිවෙළින් වැඩිය ඒ භික්ෂූන් වහන්සේ ඇගේ ඒ නිවසට වැඩිසේක් උත්තරාව උන් වහන්සේ දුටුවේය. දැක ඈ පැන්පිරුණ පැන්භාජනයක් හා විසිතුරු කැවිලිපිරෙවි භාජනයක්ද ගෙනැවිත් පූජාකොට ස්වාමිනි මාගේ පියාණෝ කළුරිය කළෝය, ඒ පියාණන්හට මේ දක්ෂිණාව ලැබෙවායි කියා පින් දුන්නේය.

133. සමනන්තරානුද්දිට්ඨේ විපාකො උපපජ්ජථ,
භුඤ්ජාමි කාමකාමීහං-රාජා වෙස්සවණෙ යථා.

134. තං සුණොහි මහාරාජ-අරින්දම රට්ඨවඩ්ඪන,
සදෙවකස්ස ලොකස්ස-බුද්ධො අග්ගො පවුච්චති,
තං බුඩං සරණං ගච්ඡ-සපුත්තදරො අරින්දම.

135. අට්ඨඞ්ගිකෙන මග්ගෙන-ඵුසන්ති අමතං පදං,
තං ධම්මං සරණං ගච්ඡ-සපුත්තදරො අරින්දම.

Non-commercial distribution

136. චත්තාරෝ මග්ගපටිපන්නා-චත්තාරොව ඵලෙ යීතා,
එස සඞ්ඝෝ උජුභූතෝ-පඤ්ඤාසීල සමාහිතෝ,
තං සඞ්ඝං සරණං ගච්ඡ-සපුත්තදරෝ අරින්දම.

137*. පාණාතිපාතා විරමස්සු බිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයස්සු,
අමජ්ජපෝ මා ච මුසා අභාසි
සකෙන දරෙන ච හොහි තුට්ඨෝ.

133. වෙස්සවණෝරාජා, වෛශ්‍රවණ දිව්‍යරාජයා; යථා, යම් සේද; අහං, මම; කාමකාමී; කාමයෙන් සමෘඩව; භුඤ්ජාමී, සැප විඳිමි (සෙස්ස යටකියනලද පරිදියි සෙසුතැන්ද එසේමයි.)

134. සදෙවකස්ස, දෙවියන් සහිතවූ; ලොකස්ස, ලොකයා හට; බුඩ්ඩෝ, සර්ව්ඥතෙම; අග්ගෝ, අග්‍රයයි; පවුච්චති, කියනු ලැබේ; අරින්දම, පින්වත් රජ, සපුත්තදරෝ පුත්‍ර දාරාවන් සහිතවූ (තෙපි) තං බුඩ්ඩං, ඒ බුදුන්; සරණං ගච්ඡ, සරණකොට යව;

135. අරින්දම, රජ, අට්ඨඞ්ගිකෙනමග්ගෙන, ආර්‍ය්‍ය-අෂ්ටාංගික මාර්ගයෙන්; අමතපදං, නිර්වාණපදය; ඵුසන්ති, ස්පර්‍ශකරත්; තං ධම්මං, ඒ ධර්‍මය; සරණං ගච්ඡ, සරණකොට යව.

136. මග්ගපටිපන්නා, මාර්ග ප්‍රතිපන්නයෝ; චත්තාරෝ, සිව් දෙනෙක් වෙති; ඵලෙයීතා, ඵලයෙහි සිටියාවූ; චත්තාරොව, සතරදෙනෙක් වෙති; එසෝ සඞ්ඝෝ, මේ අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝ තෙමේ; උජුභූතෝ, සෘජුවූ; පඤ්ඤාසීල සමාහිතෝ, ප්‍රඥාශීලයන් ගෙන් යුක්තවේ; අරින්දම, පින්වත් රජ; තං සඞ්ඝං ඒ සඞ්ඝ යා; සරණං ගච්ඡ, සරණකොට යව.

පින්වත් කෙනෙහිම මට දානවිපාක පහළවිය, වෛශ්‍රවණ දිව්‍යරාජයාමෙන් කාමයෙන් සමෘඩව මම දැන් සැපවිඳිමි. සතුරන් දමනය කරන්නාවූ රට වර්ධනය කරන්නාවූ මහ රජ්ජුරුවන් වහන්ස ඒමා කියන්නක් ඇසුව මැනව, සර්ව්ඥයන් වහන්සේ දෙවියන් සහිත සියලු ලෝකයාහට අග්‍රයයි කියනු ලැබෙත්, රජ්ජුරුවන් වහන්ස පුත්‍රදාරාවන් සහිතවූ තෙපි ඒ බුදුන් සරණ කොටයව, අඩිග අටකින්යුත් ආර්‍ය්‍ය මාර්ගයෙන් ප්‍රාඥයෝ නිවන් ලබත්, අෂ්ටාංගික මාර්ගය හා නිවනදවූ ඒ ධර්‍මය සරණ

Non-commercial distribution

කොට යව, මාර්ගයට පිළිපන් පුද්ගලයෝ සතරදෙනෙක, සෝවාන් ආදි ඵලයෙහි පිහිටි පුද්ගලයෝ සතරනමක, මේ ආර්‍යපුද්ගල සඞ්ඝතෙමේ සෘජුව පිළිපන් ප්‍රඥාශීලගුණයෙන් සමන්විතය. රජාණෙනි, පුත්‍රදාරාවන් සමග තෙපි ඒ සඞ්ඝයා සරණකොට යව. වහාම ප්‍රාණඝාතයෙන් වලකිනු මැනව, ලොකයෙහි නුදුන්දෙයගැනීම හෙවත් සොරකම දුරුකරනු, මත්පැන් නොබොනු, බෙරුනොකියනු, ස්වකීය දරාව සමගම සතුටුවනු හෙවත් පරස්ත්‍රී සෙවනයෙන් වලකිනු මැනවයි කීයේය.

138. **අත්ථකාමොසි මෙ යක්ඛ-හිතකාමොසි දෙවතෙ,**
කරොමි තුය්හං වචනං-ත්වංසි ආචරියො මම.

139. **උපෙමි බුද්ධං සරණං-ධම්මංචාපි අනුත්තරං,**
සඞ්ඝඤ්ච නරදෙවස්ස-ගච්ඡාමි සරණං අහං.

140.* **පාණාතිපාතා විරමාමි ඛිප්පං**
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි,
අමජ්ජපො නොව මුසා භණාමි
සකෙන දරෙන ච හොමි තුට්ඨො.

138. යක්ඛ, යක්ෂය; මෙ, මට; අත්ථකාමොඅසි, වැඩ කැමැත්තෙහිය; දෙවතෙ, පින්වත් දෙවිය; හිතකාමොඅසි, හිතකැමැත්තෙහිය; තුය්හං, නුඹගේ; වචනං, වචනය; කරොමි, කරමි; ත්වං, තෝ; මම, මාගේ; ආචරියොඅසි, ආචාර්‍යයා වෙහිය.

139. අහං, මම; බුඩං, බුදුන්; සරණං උපෙමි, සරණකොට යමි; නරදෙවස්ස, බුදුන්ගේ; අනුත්තරං, නිරන්තරවූ; ධම්මංච, ධර්මයද; සංඝංච, ශ්‍රාවක සංඝයාද; සරණං ගච්ඡාමි, පිහිටකොට යමි.

මෙසේ ප්‍රේතයා විසින් සරණ හා ශීලයත් සමාදන් කරවන ලද්දවූ රජතෙම සතුටුසිත් ඇතිව කියන්නේ, එම්බා යක්ෂය නුඹ මට වැඩ කැමැත්තේය, හිතකාමියෙක්ය, පින්වත් දෙවීය ඔබගේ අවවාද වචනය මම කරමි, නුඹ මගේ ආචාර්‍යවරයාය. මම දැන් බුදුන් සරණකොට යෙමි, නිරුත්තරවූ ධර්මය සරණ

Non-commercial distribution

කොටයෙමි, බුදුන්ගේ ශ්‍රාවක සඞ්ඝයාද සරණකොට යමි. වහාම ප්‍රාණඝාතයෙන් වලකිමි, නුදුන්දෙය ගැනීමෙන් වලකිමි, මද්‍යපානයෙන් වලකිමි, බොරු නොකියමි, ස්වකීය දරාව සමගම සතුටුවෙමියි කියා පෙර තමා විසින් ගත් ලාමක දෘෂ්ටිය හැරීම ප්‍රකාශ කරමින් මෙසේ කීය:-

141. ඔපුණාමි මහාවාතෙ-නදියා වා සීඝගාමියා,
වමාමි පාපකං දිට්ඨිං-බුද්ධානං සාසනෙ රතො.

142. ඉදං වත්වාන සොරට්ඨෝ-විරමිත්වා පාපදස්සනා,
නමො භගවතො කත්වා-පාමොක්ඛො රථමාරුහී-ති

141. පාපකංදිට්ඨිං, ලාමක (බොල්) මිථ්‍යාදෘෂ්ටිය; මහාවාතෙ, මහත්වූ වාතයෙහි; ඔපුණාමි. පිඹහරිමි; සීඝගාමියා, සීඝ්‍ර සැඩ පහර ඇති; නදියාවා, නදියෙහි හෝ; වමාමි, පාකරහරිමි; බුඩ්ධානං, බුදුන්ගේ; සාසනෙ, සස්නෙහි; රතො, ඇලුණේවෙමි.

142. සොරට්ඨෝ, සුරට්ඨාධිපති (රජ) තෙම; ඉදංවත්වනා, මෙය කියා; පාපදස්සනා, ලාමකදර්‍ශනයෙන්; විරමිත්වා, වැලකී; භගවතො, බුදුන්ට; නමොකත්වා, නමස්කාරකොට; පාමොක්-ඛො, ප්‍රාචීනදිශාභිමුඛව; රථං, රාජරථයට; ආරුහිඉති, නැංගේය.

පින්වත් යක්ෂය මහාවාතය හමනවිට බොල් හරික්නාක් මෙන් මගේ ඒ ලාමක දෘෂ්ටිනමැති බොල් තොපගේ ධර්‍ම දෙශනා නැමැති සුලඟේ හරිමි, සීඝ්‍ර සැඩපහරඇති මහානදියෙහි තෘණ කාෂ්ඨපත්‍ර කසල පාවියන්නාසේ තොපගේ ධර්‍මදෙශනා නමැති මහානදියෙහි මාගේ ලාමක දෘෂ්ටි සඞ්ඛ්‍යාත තෘණාදි කසල හැර දමමි, ඊට කාරණයතම්:- යම්හෙයකින් මම එකාන්-තයෙන් අමා වැහෙන්නාවූ භාග්‍යවත් බුදුන්ගේ සස්නෙහි සිත් ඇලවීමද එහෙයින් ඒ මිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත විෂ වමාරා දමමියි කීය.

සුරට්ඨාධිපතිවූ රජතෙම මෙය කියා ලාමක දෘෂ්ටියෙන් වැලකී බුදුන්ට නමස්කාරකොට නැඟෙනහිර දෙසට අභිමුඛව ගමනට සැරසූ තම රාජරථයට නැංගේය රජ නැඟුණු රථය යක්ෂානුභාවයෙන් එදවසම සියනුවරට පැමිණියේ රාජභවනයට ඇතුල්විය, ඒ රජතෙම මැනකලෙක මේ පුවත භික්ෂූන්ට

Non-commercial distribution

කීයේ ය. භික්ෂූනු ඒ කාරණය ස්ථවිරයන් වහන්සේලාට සැල කළාහුය. තෙරුන්වහන්සේලා තෘතීය සඞ්ගීතියෙහිලා සංග්‍රහවට නැඟූ සේක.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි තුන්වන නන්දක ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

4. 4 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි සතර වෙනි රෙවතී ප්‍රෙතවස්තුව කෙසේද යත්-මේ රෙවතී ප්‍රෙතවස්තු යම් හෙයකින් රෙවතී විමානවස්තුව හා වෙනසක් නොවේද එහෙයින් මෙහි අර්ථොත්පත්තියෙහි හා ගාථාවලත් යමක් කිය යුතුවේද එය පරමාර්ත්ථදීපනී නම්වූ විමානවස්තු වණ්නායෙහි කී නයින්ම දතයුතුයි. එහි තිබෙන පරිදි මෙසේය:—

(සනරාමරලොකසිවඞ්කරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බරණැස්නුවර සමීපයෙහිවූ බරණැස් රජහු විසින් නිග්‍රොධමුව රජනට දෙනලද වැටුප් හා අභයදන ඇති හෙයින් මිගදය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩ වාසයකරන සේක. එසමයෙහි බරණැස් නුවර ශ්‍රද්ධාසම්පන්නවූ කුලයක උපන්නාවූ ශ්‍රද්ධාවත්වූ තුනුරුවන් කෙරෙහි පහන්සිත් ඇති නන්දියනම් උපාසකයෙක් විය. හෙතෙම නිතර දන්දෙන්නෙක්ද දානපතියෙක්ද සඞ්ඝයාට උපස්ථාන කරන්නෙක්ද විය.

එසමයෙහි සමීප ගෙයක නන්දියයන්ගේ මයිලණුවන් දුවු රේවතීනම් කුමාරිකාවක් ඇත්තිය. ඕතොමෝ දන්නොදෙයි සිල් නොරකියි බණ නොඅසයි. නන්දියයන්ගේ මව්පියෝ ඒ රේවතීය නන්දියයන්ට සරණ පිණිස ගෙනෙනු කැමැතිවූහ. ඒ රේවතිය පව්ටු අදහස් ඇතිහෙයින් නන්දියයා නොකැමැති විය. නන්දියයන්ගේ මෑණියෝ රෙවතියට මෙසේ කීහු, දියණිය තෝ මේ ගෙට අවුත් සංඝයා වහන්සේ වැඩහිඳිනා බොජුන්හල අලුත් ගොම පිරිබඩගා හිඳිනා අසුන් පණවා පාත්‍රාධාරයන් එළවා තබව, භික්ෂූන් වහන්සේ වැඩිය කල්හි නමස්කාර කොට පාත්‍ර ගෙන වඩාහිඳුවා ඩබරාවෙන් පැන්පෙරාදි වැළඳුකල්හි පාත්‍ර සෝද උපස්ථාන කර,ව මෙසේ කළකල්හි මපුතණුවන්

Non-commercial distribution

සිත්ගත්තිනම් වේයයි කීහ. එබසට රේවති තොමෝ සැදහ නැතත් ස්වාමිපුත්‍රයා සිත්ගන්නා පිණිස එසේම කෙළේය. ඉක්බිති රේවති අවවාදයෙහි පිහිටියායයි මැණියෝ නන්දියයාට කියා නන්දියයා යහපතැයි කියා ඉවසූකල දවස්නියම කොට ආවාහ කෙළෝය එකල්හි නන්දියයා රේවතියට මෙසේ කීයේය. සොඳුර මගේ භික්ෂු සංඝයා වහන්සේටද මවුපියන්ටද උපස්ථාන කරන්නී වී නම් තී මේ ගෙයි විසිම ලබයි, එසේ හෙයින් නොපමාව වත්පිළිවෙත් කරවයි කීයේය. රේවති තොමෝ නන්දියයන්ගේ බස් අසා යහපතැයි පිළිගෙන හිමියා සිත්හන්නා පිණිස නොබෝ දවසක් සැදැහැවත් එකියක්සේ ස්වාමිපුරුෂයාට අනුව පවතිමින් දරුදෙදෙනෙකු ලැබීය. නොබෝකලකින් නන්දියයන්ගේ දෙමව්පියෝ කලුරිය කළාහුය. එකල්හි ඒ ගෙයි සියලුම ඉසුරු සම්පත් රේවතියට හිමිවිය. නන්දිය උපාසක තෙමේද මහදන් දීමෙහි ස්වාමියෙක්ව භික්ෂු සඞ්ඝයා වහන්සේට දන්පැවැත්වීය. දුගීමගී යාචකාදීන්ට ගෙදර දන්වැට තබා දන් දුන්නේය.

නන්දියයා ඉසිපතන මහාවිහාරාසන්නයෙහි ගබඩා සතරකින් ප්‍රතිමණ්ඩිතවූ ශාලාවක් කරවා එහි ඇඳ පුටු බිසිබිම්බොහන කලල්පැදුරු ගිනිකබල් කළ කොතලා ආදී සෙනාසන භාණ්ඩයෙන් ඒ විහාරය අතුරුවා බුඬප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට මහ දන්දී බුදුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන්වත්කොට විහාරය පිළිගැන් වූයේය. ඒ දක්ෂිණෝදකය හා දනය සමගම තවුතිසා දිව්‍ය ලොකයෙහි දිගින් හා පුළුලින් භාත්පස දෙළොස් යොදුන් පමණ ඇති යොදුන් සියයක් උසඇති හිරුරැස් කළඹක්සේ බලන්නවුන්ගේ ඇස් බමවන්නාවූ සත්රුවන්මුවාවූ සර්‍වාභරණයෙන් බබළන්නාවූ නොයෙක් දහස්ගණන් දෙවඟනන් විසින් ගායනා කරනලද්දවූ සප්තවිධ රත්නමය දිව්‍යප්‍රාසාදයක් පහළ විය. එකල්හි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ දෙවචාරි කාරේහි වඩිනසේක් නන්දියයාහට පහළවූ ඒ දෙව්පහය දැක තමන් වහන්සේට නමස්කාර පිණිස පැමිණි දිව්‍යපුත්‍රයන්ගෙන් මේ ප්‍රාසාදය කාගේදැයි විචාරා වදළසේක. ස්වාමීනි මේ ප්‍රාසාදය හිමිතැනැත්තේ මිනිස්ලොව වසයි, බරණැස් නුවර නන්දියනම් කෙළෙඹිපුත්‍රයෙක් සංඝයා වහන්සේ උදෙසා ඉසිපතන මහා විහාරාසන්නයෙහි ගබඩා සතරකින් සැරසුණාවූ සිව්

Non-commercial distribution

ශාලාවක් කරවා පිළිගැන්විය, ඕහට මේ දෙව්පහය පහළවීයයි කීවාහුය. ඒ විමනෙහි උපන් දිව්‍යාඞ්ගනාවෝ තෙරුන් වහන්සේට වැඳ කියන්නාහු ස්වාමීනි බරණැස්නුවර නන්දියනම් උපාසකයාට පරිවාරිකාවනු පිණිස අපි මේ දෙව්විමනෙහි උපනුම්හ, ස්වාමීනි නන්දියයන්ට මෙසේ වදළමැනව, නන්දියයෙනි තොපට අත්පා මෙහෙකරනු පිණිස උපන් දෙවඟනෝ තොප මිනිස්ලොව කල්යවන හෙයින් කළකිරුණු සිත්ඇත්තාහුය, දිව්‍යාලොක සම්පත්තිය නම් මැටිබඳුනක් බිඳ රන්බඳුනක් ගන්නාක් මෙන් ඉතා මන වඩන්නේයයි කියා මේ දෙව්ලොව ඒමට වදළමැනවැයි කීවාහුය. දෙවඟනන් කීබස් යහපතැයි කියා මහතෙරහු වහා දෙවු ලොවින් මිනිස්ලොවට වැඩමවා දම්සබා මණ්ඩපයෙහි සිව්වණක් පිරිස්මැද වැඩහුන් බුදුන්කරා එළඹ මෙසේ විචාළසේක, ස්වාමීනි කරනලද කුසල් ඇතිව අප්‍රමත්තව වසන කුලපුත්‍රයන්ට මිනිස් ලොව සිටියදීම දිව්‍යලොකයෙහි සම්පත් පහළවේදැයි විචාළ සේක මෞද්ගල්‍යායනය නන්දියයන්ට තවුතිසා දෙව්ලොව පහළවූ දිව්‍යසම්පත්තිය තොප විසින් දක්නාලද්දේ නොවේද, දැන් කුමක් පිණිස මා විචාරන්නෙහිදැයි වදළසේක. එකල්හි තෙරණුවෝ එසේය ස්වාමීනි නන්දියන්ට පහළවූ දිවඉසුරු මා විසින් දක්නාලද්දේ යයි දන්වූසේක. එකල්හි බුදුරජාණන් වහන්සේ ඕහට ධර්ම දෙශනා කරනසේක් යම්සේ දෙශාන්තරයකට ගොස් කලක් වාසයකොට පැමිණි පුරුෂයා දැක ඥාතිමිත්‍රයෝ පෙරමගට ගොස් විශේෂයෙන් සතුටුවෙත්ද, මනාව පිළිගනිත්ද, එසේම කරනලද කුසල් ඇති සත්පුරුෂයෝ මෙලොවින් පරලොව යනකල්හි කුසල් නැමැති ඥාතිමිත්‍රයෝ සම්පත් නැමැති අතින් පිළිගෙන ආදර බුහුමන් දක්වා සතුටුවෙත්යයි දක්වනසේක් මේ ගාථාදෙක වදළසේක:-

''චිරප්පවාසිං පුරිසං-දූරතෝ සොත්ථිං මාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච-අභිනන්දන්ති ආගතං
තථෙව කතපුඤ්ඤම්පි-අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති-පියං ඤාතිංව ආගත''න්ති.

යන්නෙන් යම්සේ යම් පුරුෂයෙක් විදෙශයකට ගොස් එහි බොහෝකලක් වැස ලබනලද ලාභසත්කාර ඇතිව සුවසේ

Non-commercial distribution

සිය ගමට ඒද ඔහු දැක ඥාතිමිත්‍ර යහළුවෝ ඉදිරියට ගොස් වැඳීමෙන් හා සිපගැන්මෙන්ද ආඛ්‍ය යහපතැයි යනාදි ප්‍රියවචන කියා විශෙෂයෙන්ම සතුටුවෙත්ද, එසේම දානශීලාදි වශයෙන් කරන ලද කුසල් ඇතිව මෙයින් පරලොවගිය සත්පුරුෂයාද කුසල් නැමැති ඥාතිමිත්‍රයෝ ආයු වර්ණාදි පඬුරු දක්වා සම්පත් නැමැති අතින් පැමිණි ප්‍රිය ඥාතියෙකුමෙන් පිළිගන්නාහුයයි වදළසේක.

ඒ බණ අසා ප්‍රීතින් පිරුණාවූ නන්දියයා පෙරදවසට වඩා බොහෝසෙයින් දන්දෙයි සිල්රකිමින් බොහෝ කුසල්කරයි. ඒ නන්දිය උපාසකයා වෙළඳුම පිණිස යන්නේ එක් දවසක් රෙවතිය කැඳවා කියන්නේ සොඳුර මා විසින් සංඝයාට හා දුගී මගී යාචකයන්ටත් දෙනලද දානය මා සිටිනාසේ අප්‍රමත්තව පවත්වාලවයි කීය. ඒ රෙවතියද යහපතැයි කියා පිළිගත්තේය. මෙසේ අවවාදකොට ඔහු වෙළඳුමට ගියේනම්දු යම් යම් කැනක ලැබුම්ගෙන වෙසේද ඒ ඒ තන්හි සහනට හා දුගීමගී යාචකයන්ටත් විභවානුරූපපරිද්දෙන් දන්දෙන්නේමය, රහතන් වහන්සේලාද ඔහුට අනුකම්පා උපදවා දුරිනුදුඅවුත් දන් පිළිගන්නාසේක. රෙවතිය වනාහි නන්දියයා ගිය කීපදවසක් දානය පවත්වා යාචකයන්ට දෙනදානය නැතිකෙළේය. භික්ෂූන් වහන්සේලාටද කාඩි හා නිවුඩුසහලේ බත් දුන්නේය. භික්ෂූන් වහන්සේ වැළඳුතන්හි තමන් අනුභවකොට ඉතිරිබත්හුලු හා දියමස් ගොඩමස් කැබලිවුසු ඇටකටු විසුරුවා මහණුන්ගේ ක්‍රියාව නොපි බලව්, අප සැදුහැයෙන් දෙනලද දානය මෙසේ අහක දමත්යයි කියා සංඝයාගේ නුගුණ කියා මනුෂ්‍යයන්ට දක්වයි. පසුව නන්දියයෝ අදහස් සිදුවීමෙන් එහිදී ලබනලද ලාභසත්කාර ඇතිව අවුත් එපවත් අසා නොසතුටු සිත් ඇතිව රෙවතිය ගෙයින් පිටත්කරවා ගෙට පැමිණියේය. දෙවනදවස් බුදුපාමොක් මහසඟනට දන්දී එනැන්පටන් භික්ෂූන්ට හා අසරණ යාචකයන්ටත් මනාව නිදන් පැවැත්වූයේය. නැවත තමාගේ යහළුවන් විසින් යාච්ඤාකොට ගෙට කැඳවාගත එන ලද රෙවතියට බත් පිළි පමණක්දී ඉන්ට සැලැස්විය. නන්දියයා නොබෝ දවසකින් කළුරියකොට තවුතිසා දෙව්ලොව තමන්ට පහළවූ දෙව්විමනෙහිම උපන්නේය. රෙවතිය වනාහි නන්දිය-යන් කළුරිය කළපසු සියලු දන්වැට නැතිකොට මේ ශ්‍රමණයන්

Non-commercial distribution

නිසා මාගේ ලාභසත්කාර නැතිවීයයි සංසයා කෙරෙහි වෛරබැඳ භික්ෂූන්ට අක්‍රෝශපරිභව බෙණෙමින් ඇවිදියි. එකල්හි වෙස-මුණුරජු යක්ෂයන් දෙදෙනකු කැඳවා මෙසේ කීයේය, යව තොපි ගොස් මෙයින් සත්වන දවස ජීවත්ව සිටියදීම රෙවතිය නරකයට දමන්නෙමුයයි කියා සියලු බරණැස්නුවරට ඇසෙනසේ හඬගා කියවියයි නියොග කෙළේය. ඒ යක්ෂයෝ ගොස් මෙයින් සත්වන දවසේ ජීවත්ව සිටියදීම රෙවතිය නරකයෙහි බහාලනු ලැබෙයයි උද්ඝොෂණය කළාහුය. මහජනයා ඒ ශබ්දය අසා සංවේගයට පැමිණියේ බියෙන් තැතිගත්තේය. රෙවතිය වනාහි ප්‍රාසාදයට නැඟී දෙර වසාගෙන හිඳියි. සත්වන දවස් ඇගේ අකුශලකර්මය විසින් චොදනා කරනලදුව වෙසමුණු රජු විසින් අණවා එවනලද යක්ෂයෝ දෙදෙන අඤ්ජනකූට පර්වතයමෙන් ඉතා නිල්වූ භයානකවූ මහත් ශරීරඇතිව පර්වත සිදුරක්මෙන් මහත් මුඛයක් ඇතිව දෙකපොලයෙන් නික්මුණාවූ මහත් දළ ඇතිව ගිනිගෙන දිලියෙන යවටසේ මහත් රතැස්ඇතිව මැදින් බිදී අගින් පැතලිවූ මහත් නාසිකාඇතිව සල දිදී ඇවිලෙන ගිනිවැටසේ ක්‍රූරවූ තඹ හිසක් රැවුල් ඇතිව නිල් මේකුලක්සේ මහබඩඇතිව තියුණුවූ මුවහත්ඇති කඩුපෙළක්සේ දික්වූ ලේ දරාවෙන් ගැවසීගත්තාවූ රතු නියපතරඇතිව රැළිසහිත පළල් නළල්තල ඇතිව පිටිතොල මස් කකා මිනිමස්කා ලේ බොන්නාහු භයානක චණ්ඩපරුෂ ස්වභාවඇතිව මතුමහල්තලයෙහිහුන් රෙවතිය වෙත පැමිණ ''උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ'' යන ආදිය කියමින් නන්වැදැරුම් අත්වලින් අල්වාගෙන මහජනයා මෙය බලාගනීවායි කල්පනා කොට මුළුනුවර වීථියෙන් වීථියට කරකවා අහසට පැනනැඟී තව්තිසා දෙවුලොවට පමුණුවා නන්දිය උපාසකයාගේ දෙව්විමනද සම්පත්ද ඇට පෙන්වා ඇ විලාප කියද්දීම උස්සද නිරය සමීපයට පැමිණවූහ. ඒ රෙවතිය යමපල්ලෝ උස්සද නිරයෙහි බහාලූහ. එහෙයින් මෙසේ කීහ:-

''උට්ඨෙහි රෙවතෙ සුපාපධම්මෙ
අපාරුතවාරෙ අදනසීලෙ,
නෙස්සාම තං යත්ථ දුග්ගතා
සමප්පිතා නෙරයිකා දුක්ඛෙනා''ති.

යන්නෙන් එම්බල ඉතා පව්ටු ස්වභාව ඇති දන්නොදෙන සුලුවූ රෙවතිය මේ ප්‍රාසාදය නරක දුකින් ගළවන්ට නොහැකි

Non-commercial distribution

වෙයි. හුන්තැනින් වහා නැඟිසිටුව, යම්හෙයකින් ආයස්මයන් වහන්සේට නින්ද පරිභව කරමින් තිගේ දෙර සමීපයට පැමිණි යාචකයන්ට ආහාරපානාදි වශයෙන් කිසිවක් නොදී දඩුමුගුරු කැටපහත් ආදියෙන් ගසා පීඩාකොට එළවමින් අනුන්ගේ සම්පත් නොඉවසන සුලුව තමාගේ සම්පත් සහවා මසුරුව සඨප්‍රයොගයෙන් හෝ කපටිකමින් යෙදී තුනුරුවන් ගුණ නොසලකා දානශීලාදි කිසියම් කුශලකර්මයක් නොකළේද එබඳු ලාමක ස්වභාව ඇති නී වැනි හීන සත්වයන්ට නරකවල දෙර නොවසන ලද්දේය. නී වැන්නන්ට නරකයම වාසස්ථාන වන්නේය, මේ මනුෂ්‍ය ලොකයෙහි දානපතිව දන්දුන්නාවූ සිල් වත්වූ නොමසුරුවූ තිගේ ස්වාමිපුත්‍රයා වැනි පින්කළවුන්ටම ස්වර්ගලොකය වාසස්ථාන වන්නේය, එසේහෙයින් පින්කළවුන්ට ස්වර්ගයත් පවුකළවුන්ට අපායත් තියනවාමිස මේ ප්‍රාසාදය තිට රක්ෂාස්ථානයක් නොවෙයි, මෙහි මොහොතකුදු නොයිඳ පලා එව, එසේනොව මෙතන්හි හිඳින්ට නොදෙමිහ, වහා නැඟී සිටු වයිකීහ.

''ඉච්චෙව වත්වාන දූතා
තෙ වෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා,
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතිං
පක්කාමයුං දෙවගණස්ස සන්තිකෙ''ති.

මෙසේ කීමට අනතුරුව ඉතා ලේපාට ඇස් ඇති මහත්වූ යමදූතයන් සදෘශවූ ඒ යක්ෂයෝ දෙදෙන වෙනවෙනම අත්දෙක අල්වා ගෙන තව්තිසා දෙව්ලොව දිව්‍යසමූහයාගේ සමීපයට රෙවතිය පැමිණවූහ. බරණැස්නුවර මුළුල්ලෙහි පවුකළවුන් මතු වීදිනාදුක් මෙසේයයි කියන්නාසේ වීථියෙන් වීථියට මුළුනුවරම බිමලා ඇද කරකවා උකුස්සන්ගත් කුකුළුපාට වියෙකුසේ අහසට නහාගෙන ගොස් තව්තිසා භවනයෙහි නන්දියයන්ගේ විමන්දෙර සිටියහ, එකල්හි යකුන් විසින් තවුතිසා භවනයට ගෙන ගොස් නන්දිය දිව්‍යපුත්‍රයාගේ විමන්දෙර සිටුවන ලද ඒ රෙවති තොමෝ හිරුමඬලසේ ඉතා ප්‍රභාවන්ව බබළන්නාවූ විමන දැක මෙසේ විචාළේය:-

''ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
ව්‍යම්භං සුභං නඤ්ඤනජාලච්ඡන්නං,
කස්සෙතමාකිණ්ණජනා විමානං
සූරියස්ස රංසී රිව ඡාතමානං,

Non-commercial distribution

නාරීගණා වන්දනසාරලිත්තා
උභතෝ විමානං උපසොභයන්ති,
තං දිස්සති සුරියසමානවණ්ණං
කෝ මොදති සග්ගපත්තෝ විමානෙ''ති

යන්නෙන් අහසෙහි දහසක් රැසින් දිලිසෙන්නාවූ හිරුවිම නක්සේ රන්දැල් වසා නොයෙක් රශ්මි සමූහයෙන් හා සප්තවිධ රත්නයෙන් ආකීර්ණව ජ්‍යොතිෂ්මත්ව බබළන්නාවූ මේ පෙනෙන විමන කවරෙකුගේද, යෙළයාලක් පමණ සඳුන් සුවඳ විලවුන් ගල්වනලද සිරුර ඇති දිව්‍යස්ත්‍රී සමූහයා දෙවිසළුපැළඳ සත්රුව නින් විසිතුරුවූ සවිභර්ණයෙන් සැරසී මේ විමන් දෙපසැ සත්රුවනින් විසිතුරු සෙමෙරගෙන දෙපස සලමින් සිටිති, සමහරු ගී කියති, සමහරු ගයනා කෙරෙති,භාවභාව ලීලාවෙන් යුත් නොයෙක් දහස්ගණන් දෙවඟනෝ දෙපසසිට දිව්‍යපුත්‍රයා සතුටු කෙරෙති, මෙසේ මේ පරිවාර දිව්‍යසෙනාව මධ්‍යයෙහි හිරු මඩලසේ මේ ප්‍රාසාදයෙහි සතුටුවෙමින් සැපවිඳින්නේ කවරෙක්දැයි කියා යක්ෂයන්ගෙන් විචාළේය. එසේ විචාරණලද ඒ යක්ෂයෝ මෙසේ කීහු:–

''හිරාණසියං නන්දියො නාමාසි උපාසකා
අම්චිජරී දනපතී වදඤ්ඤූ
තස්සෙත මාකිණ්ණජනං විමානං
සුරියස්ස රංසි රිව ජොතමානං

නාරීගණා වන්දනසාරලිත්තා
උභතෝ විමානං උපසොභයන්ති,
තං දිස්සති සුරියසමානවණ්ණං
සෝ මොදති සග්ගප්පත්තෝ විමානෙ''ති

මිනිස්ලොව බරණැස්නුවර නොමසුරුව දනපතිව යාචක–යන්හට දනගිලිව දන්දුන්නාවූ තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇති සිල්වත්වූ නන්දියනම් උපාසකයෙක් විය, ඔහට දහසක් රැසින් දිලිසෙන හිරුමඩලමෙන් බලළන්නාවූ අනල්ප දිව්‍ය චන්දන කුඞ්කුමාදි සාරගන්ධයෙන් අඞ්ගරාග ගෙන සිටි දිව්‍ය ස්ත්‍රීන් ගෙන් ගැවසීගත් මේ දෙව්පහය. පහළවිය. එහි බලන්න වුන්ගේ ඇසට රසඳුනක් බඳුවූ දෙව්නිලුපුල්පෙති වැනි දිහු

Non-commercial distribution

පුළුල්වූ සුනිල්වූ නෙතින් හා සියලු අවයව සැපතින් සැරසුණාවූ භාවභාව විලාසයෙන් යුත් නොයෙක් දහස්ගණන් දෙවඟනෝ සඳුන් විලවුන්ගෙන ඔහු පිරිවරා සිටිති මෙසේ දෙපස සැදී සිටි දිව පිරිස්මැද හිරුසේ බබලන්නාවූ මේ පෙනෙන දිව්‍යපුත්‍රයා නම් නන්දිය උපාසකයායයි කීවාහුය. එකල්හි රෙවතිය කියන්නී:-

"නන්දියස්සාහං භරියා
අගාරිනී සබ්බකුලස්ස ඉස්සරා,
හත්ථුවිමානෙ රමිස්සාමි දානහං
න පත්ථයෙ නිරයං දස්සනායා"ති.

එසේවී නම් පින්වත්නි, මම ඒ නන්දියයාගේ බිරින්දැවිමි, නන්දියයාගේ සියලුම කුටුම්බයට ස්වාමිදුවක් විමි, එසේ හෙයින් දැනුදු මාගේ ස්වාමියාගේ විමන්හි සිත් අලවමි, නොපි යම් නරකයකට මා පමුණුවනු කැමැත්තාහුද ඒ නරකය දැන් දැකීමටවත් එහි පිවිසීමටවත් මම නොකැමැත්තෙමියි කීවේය. එසේ කී රෙවතියට යක්ෂයෝ කියන්නාහු එම්බල රෙවතිය තිගේ ප්‍රාර්ත්ථනාවෙන් කම් නැත, නන්දිය දිවය පුත්‍රයාගේ සිත්කළුවූ නිමිලවූ කීයිකලෙකත් තී කරා නොපැමිණෙන්නාවූ ස්වභාව ඇති මේ රුවන්පහය තී කුමක් පිණිස ප්‍රාර්ත්ථනා කෙරෙහිද? එසේ නොපතව, තී නරකයට යනු කැමැතිවේවයි නොකැමැතිවේවයි තිගේ පැතීමෙන් ප්‍රයෝජන නැතැයි කියා සංසවකනම් නිරය සමීපයට ගෙන ගොස් මේ ගාථාව කීහ:-

"එසො තෙ නිරයො සුපාපධම්මෙ
පුඤ්ඤං තයා අකතං ජීවලොකෙ,
නහි මච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහව්‍යත"න්ති.

ඉතා ලාමක ස්වභාව ඇති රෙවතිය තී විසින් මිනිස් ලොවදී ස්වල්පමාත්‍රවූද කුශලකර්මයක් නොකරන ලද්දේය, එසේ පින් නොකොට තමාගේ සම්පත් සහවන සුලු වූ මසුරු මලයෙන් යුක්තවූ අනුන් කෙරෙහි ක්‍රොධ ඉපදවීමෙන් හා තමා සිත හටගත් ලොභාදි පාප ධර්මයන් හා ලාමක ස්වභාව ඇති තී වැනි සත්වයන්ට වනාහී කුසල් කොට දෙව්ලොව මහත් දිව ඉසුරු

Non-commercial distribution

විඳිනා දෙවියන් හා සමග වාසය කිරීමට නොලැබේ යයි කියා බොහෝ කලක් දුක් වින්ද යුතු ස්ථානවූ මේ සංඝවක නම් නරකය තිට අයිතිය නියත වන්නේ යයි කීහ.

එසේ කියා ඒ යක්ෂයෝ දෙදෙනා එතන්හිම අතුරුදන් වූහ. ඒ හා සමාන යමපල්ලන් දෙදෙනෙක් අවුත් ඒ සංඝවක නම් ගුථනරකයෙහි ලන පිණිස අදනා කල්හි රෙවතිය ඒ නිරය දැක යමපල්ලන්ගෙන් මෙසේ විචාළේය:-

''කින්නු ගුථඤ්ච මුත්තඤ්ච-අසුචි පතිදිස්සති,
දුග්ගන්ධං කිමිදං මීළ්හං-කිමෙතං උපවායති''ති,

යන්නෙන් මල හා මුත්‍රාදියෙන්ද ඔරුනැවිසා මහත් පණු වන්ගෙන් ගැවසුණාවූ නහය පැළෙන තරම් දුගඳ ඇති මේ මහත් අශුචි වළක් දක්නා ලැබෙයි. මෙසේ දුගඳ හමන අශුචි වළ කුමක්දැයි විචාළේය. එසේ විචාළ රෙවතියට නරකයේ නමද දිග පුළුල හා ආයුෂද ප්‍රකාශ කරන්නාහු:-

''එස සංඝවකෝ නාම-ගම්භීරෝ සතපෝරිසෝ,
යත්ථ ඩස්සසහස්සානි-තුවං පච්චසි රෙවතෙ''ති.

මේ නරකය ගැඹුරෙන් සියක් යොදුනක් පමණ උස වන්නේය, සියක් යොදුන් වට ඇති සියක් යොදුන් තැන සිටිය වුන්ගේ ඉස පැළෙන තරම් දුගඳ ඇති කකියන ලද ගුථනරක යෙහි හුණු සත්වයා සුවිමුබවූ ලොහොතුඩු වැනි තුඩු ඇති ඔරු නැවි පමණ පණුවෝ වටලාගෙන හාත්පසින් සිවි සිඳ මස් සිඳ නහර ඇට සිඳ මස් ලියලියා කමින් සකල ශරීරය ගුල්ලන් විදපු දණ්ඩක් මෙන් සිදුරු කොට ඇට මොල කති. මේ නරක යෙහි ආයුෂද මිනිස් ලොව තුන්කෙළ සැටලක්ෂයක් හවුරුදු සංඝවක නම් ගුථනරකයෙහි එක් දවසක් වෙයි, එබඳු දවසින් තිස්දවස මසක් කොට දෙළොස් මසක් හවුරුද්දක් කොට ඒ අවුරුදු ගණනින් මේ නරකයෙහි දහසක් හවුරුදු ආයුවන්නේය. එම්බල රෙවතිය තී ඒ නරකයෙහි නොයෙක් දහස් ගණන් අවුරුදු පැසෙන්නේ යයි කියා යමපල්ලන් විසින් කියන ලද කල්හි රෙවති තොමෝ තමන් ඒ නරකයෙහි උපදනට හේතුවූ අකුශල කර්මය විචාළේය:-

''කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
එකන සංඝවකෝ ලද්ධෝ-ගම්භීරෝ සතපෝරිසෝ''ති.

Non-commercial distribution

කාය වාඞ් මනස් යන වාරයන්ගේ වශයෙන් ත්‍රිවිධවූ දුශ්චරිතයන් අතුරෙන් කිනම් අකුශල කර්මයක් මා විසින් කරන ලද්දේද, කවර අකුශලයක් හේතු කොට ගෙන සියක් පුරුෂ ප්‍රමාණ ගැඹුරුවූ සංසවක නම් මේ ගූථනරකය මා විසින් ලබන ලද්දේද, කවර අකුශලයකින් මේ නරකයෙහි උපදිමදැයි විචාළේය. එකල්හි යමපල්ලෝ ඒ අකුශල කර්මය ප්‍රකාශ කොට කියන්නාහු.

''සමණෙ බ්‍රහ්මණෙ වාපි-අඤ්ඤෙ වාපි වනිබ්බකෙ,
මුසාවාදෙන වඤ්චෙසි-තං පාපං පකතං තයා''ති.

රෙවතිය නී සන්සිඳුවන ලද ලොභ වෙෂාදි පව් ඇති හෙයින් ශ්‍රමණවූද බැහැර කිරීම් වශයෙන් නසන ලද ලොභාදි පාපයන් ඇති හෙයින් බ්‍රාහ්මණවූද අන්‍යවූ යාචකයන්ද යන මේ හැම දෙනම බොරු කීමෙන් රවටා වංචා කෙළෙහිය, නී විසින් එබඳු පව්කම් කරන ලදී. වාරත්‍රයෙන් ප්‍රාණඝාතාදි පව් කෙළේවී නම් මෙබඳු මහත් දුකට පැමිණෙන්නේය. නීද කායාදි වාරත්‍රයෙන් මහත් අකුසල් කෙළෙහිය. එහෙයින් මේ නරකයෙහි පැසෙන්නෙහී යයි කියා එහි පැසීමට හේතුවූ අකුශල කර්මය ප්‍රකාශ කොට නැවත ඒ යමපල්ලෝ කියන්නාහු:-

''තෙන සංසවකො ලඩො-ගම්භීරො සතපොරිසො,
තත්ථ වස්සසහස්සානි-තුවං පච්චසි රෙවතෙ''ති.

එම්බල රෙවතිය ඒ අකුසල හේතුවෙන් ගැඹුරුවූ ශත පුරුෂ ප්‍රමාණ උස ඇති දහසක් අවුරුදු ආයු ඇති නිතර මල මූත්‍රාදි අශුචි වහනය වන හෙයින් සාසවක නම් වූ ඒ නරකයෙහි පැසේයි. කිට හුදෙක් මේ නරකයෙහි අශුචි වහනය පමණක් ලැබෙන්නේ නොවෙයි. තවත් මෙහි නොයෙක් අවුරුදු දහස් ගණන් මුළුල්ලෙහි පැසී මතුවූ කල්හි අත්සිඳීම් ආදි නොයෙක් දුක් ලැබෙන්නේ යයි දක්වනු පිණිස මේ ගාථාව කීහ:-

''හන්ථෙපි ඡින්දන්ති අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්ති අථොපි නාසං,
අථොපි කාකොලුගණා සමෙච්ච
සංගම්ම ඛාදන්ති විඵන්දමානං''ති.

රෙවතිය නී වනාහී තුන්ගව් උස ඇති ශරීරයෙන් යුක්තව මේ නරකයෙහි නොයෙක් දහස් ගණන් හවුරුදු පැසෙයි, නී

Non-commercial distribution

විසින් කරන ලද අකුශල කර්මය යම් පමණ කල් නොගෙවේද එපමණකල් පැසෙමින් අපමණ දුක්විඳින්නාවූ තිගේ අත් පා කන් නාසා අඟපසඟ තියුණු මුවහත් ඇති ශක්ති තෝමර මුද්ගරාදි නානාවිධ ආයුධ ගෙන කපති පලති ඉරති තළති. නැවත කැපූ කැපූ තන්හි මස් අටගන්නේය, තවද තිගේ තුන්ගව් දිග ශරීරයෙහි නොයෙක් දහස් ගණන් කවුඩෝ තල් කඳසා ගිනිගෙන දිලිසෙන අයොමය තුඩින් මස් විද විද ඉරා කති. නැවත කර්ම බලයෙන් කෑ කෑ නැන් මස් පිරෙයි යනාදීන් එහි දුක් කර්මකටුල් ඒ යමපල්ලන් විසින් කීකල්හි කුසල් කරනු පිණිස නැවත මිනිස් ලොවට යන්නෙමියි යාච්ඤ කරමින් හැඩිය. එහෙයින් කියන ලදී.

''සාධු බො මං පටිනෙථ-කාහාමි කුසලං බහුං,
දනෙන සමචරියාය-සඤ්ඤමෙන දමෙන ච
යං කත්වා සුඛිතා හොන්ති-න ච පච්ඡානුතප්පරෙ''ති.

සත්වයෝ යම් කුසලයක් කොට සුවපත්වෙත්ද, පසුතැවිලි නොවෙත්ද, එබඳුවූ දන ශීල භික්මීම් ඉඳුරන් දමනය කිරීම් ආදියෙන් බොහෝ කුසල් කරන්නෙමි, නැවත මා මිනිස් ලොවට පමුණුවනු මැනවයි කීයේය. එකල නිරයපාලයෝ කියන්නාහු:-

''පුරෙ තුවං පමජ්ජිත්වා-ඉදානි පරිදෙවසි,
සයං කතානං කම්මානං-විපාකං අනුභොස්සසි''ති.

රෙවතිය තී පෙර කුසල් නොකොට ප්‍රමත්තව සිට දැන් කුමක් පිණිස හඬයිද? තී විසින් කළාවූ අකුශලකර්ම විපාකය තීම විඳින්නෙහි යයි කීහු. නැවත රෙවතිය මෙසේ කීය:-

''කොා දෙවලොකතොා මනුස්සලොකං
ගන්ත්වාන පුට්ඨොා මෙ එවං වදෙය්‍යා.
නික්ඛිත්තදණ්ඩෙසු දදාථ දනං
අච්ඡාදනං සයන මථන්නපානං,
නාභිමච්ඡරී රොසකො පාපධම්මො
සග්ගූපගානං ලභති සහව්‍යතං.
සාහං නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහුං,
දනෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච.

Non-commercial distribution

ආරාමානි ච රොපිස්සං දුග්ගෙ සඞ්කමනානි ච,
පපඤ්ච උදපානඤ්ච විප්පසන්නෙන චෙතසා.

චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරිය පක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.

උපොසථං උපවසිස්සං සද සීලෙසු සංවුතා,
න ච දුනෙ පමජ්ජිස්සං සාමං දිට්ඨ මිදං මයා''නි..

මෙසේ මා විසින් විචාරණ ලද්දවූ කවරෙක් දෙව්ලොවින් මිනිස්ලොවට ගොස් බහා තබන ලද දඩු ඇති ගුණවතුන් කෙරෙහි දන්දෙව වස්ත්‍ර සෙනසුන් ආහාරපාන වර්ග දන්දෙවි යයි කියන්නේද කී වැනි මසුරු ස්වභාව ඇති අනුන්ට වෙෂ කරනසිළිවූ ලාමක ස්වභාව ඇති පුද්ගලයා දෙව්ලොවට පැමිණියවුන්ගේ සහ වාසය නොලබාම යයි කියන්නේද, ඒ මම මෙතනින් මිදී ගොස් මිනිසත් බවක් ලබාගෙන යාවකයන් බස්දන්නා සුලුව සීලයෙන් යුක්තව දන් දීමෙන් ද මනා පැවැත්මෙන්ද සීලසංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් යුක්තව එකාන්තයෙන් බොහෝ කුසල් කරන්නෙමි.

පුෂ්පාරාම ඵලාරාමයන් රොපනය කරන්නෙමි, යා නොහැකි තන්හි ඒ දඩු පාලම් දමන්නෙමි, පිරිසිදු සිතින් ලිං පැන් පොකුණු ආදිය කරවන්නෙමි, පක්ෂය සම්බන්ධව අටවක හා කුදුස්වක පසළොස්වක දිනයන්හි අෂ්ටඞ්ගයකින් යුක්තවූ ප්‍රාතිහාර්‍ය පක්ෂය හා උපොසථසීලය සමාදන් වන්නෙමි, නිත්‍ය පඤ්චශීලයෙහි පිහිටන්නෙමි, මා විසින් මේ අපාදුක තෙමේම දක්නා ලදී. එහෙයින් දන්දීමෙහි පමා නොවන්නෙයයි කීයේය.

''ඉච්චෙවං විප්පලපන්තිං–එන්දමානං තතො තතො,
වීපිංසු නිරයෙ සොරෙ–උඩපාදං අවංසිරං''කි.

මෙසේ විකාර බස් කිය කියා ඔබමොබ වැටෙමින් අඬන්–නාවූ රෙවතිය දෙකකුල් ගසා අල්වා පා උඩුකුරුව හිස යටි කුරුව කප ගින්නක්සේ නිතර සලා ගුගුරා දස දිග දුවන ගිනිසිලු ඇති සංසවක නම් ගුථ නරකයෙහි හෙළුහ ඒ රෙවතිය නිරයෙහි දැමූ කල්හි මේ අන්තිම ගාථාව කීයේය:–

''අහං පුරෙ මච්ඡරිනී අහොසිං
පරිභාසිකා සමණබ්‍රාහ්මණානං,
විතථෙන ච සාමිකං වඤ්චයිත්වා
පච්චාමහං නිරයෙ සොරරූපෙ''කි.

Non-commercial distribution

යන්නෙන් මම පෙර මිනිස් ලොවදී තද මසුරු කැනැත්තියක් වීමි, මහණ බමුණන්ට පරිභව කරන්නියක් වීමි, බොරු වෙන් ස්වාමි පුරුෂයා වඤ්චා කෙළෙමි, එසේ දරුණු පව්කම් කොට දරුණු ස්වභාව ඇති සංඝවක නම් නරකයෙහි දැන් මම පැසෙමියි කීයේය.

ඉක්බිති භික්ෂූන් වහන්සේ රෙවතිය යක්ෂයන් ගෙන ගිය බව බුදුරජාණන් වහන්සේට දැන්වූසේක. බුදුරජාණන් වහන්සේ මුල පටන්ම මේ කථා වස්තුව දෙශනා කර වදාරා හෙවත් ඒ රෙවතිය වෙසමුණි රජහුගෙන් නියොගලත් යක්ෂයෝ දෙදෙනෙක් අවුත් අල්වා ගෙන ඒ සා මහත් බරණැස් නුවර වීථියෙන් වීථියෙහි ඇදගෙන ගොස් තවුතිසා දෙවිලොව නන්දිය දෙවිපුත් හුගේ විමානය දක්වා සංඝවක නම් ගුථනරකය සමීපයට ගෙන ගොස් සිටුවා අතුරුදන් වූහ. ඒ නරකයෙහි වසන යමපල්ලෝ දෙදෙනෙක් අවුත් අල්වා ගෙන ගොස් නරකයට දැමූහයි මෙසේ මේ කථා ප්‍රවෘත්තිය විස්තර වශයෙන් වදාරා මත්තෙහි චතුස්-සත්‍යය ප්‍රකාශිතවූ ධර්මය දෙශනා කළ සේක. ඒ දෙශනාවසානයෙහි බොහෝ දෙන සෝවාන් සකෘදගාමී අනාගාමී අර්හත් යන සතර මග සතර ඵලයට පැමිණියාහුය.

මේ වස්තුව වනාහි නන්දිය දිව්‍ය පුත්‍රයාගේ වශයෙන් විමාන වස්තු පාලියෙහි සංග්‍රහයට නහන ලද නමුදු රෙවති පිළිබඳ ගාථාවගේ වශයෙන් රෙවති ප්‍රෙතවස්තුයයි කියා ප්‍රෙත වස්තු පාලියෙහිත් නහන ලදුයි දතයුතු.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි සිව්වෙනි රෙවති ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

4. 5 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහා වර්ගයෙහි පස්වෙනි උච්ඡු ප්‍රෙතවස්තුව කියතු ලැබේ. ඒ උච්ඡු ප්‍රෙතවස්තුහුගේ උත්පත්තිය කවරදයත්-

කරුණානිධාන ප්‍රඥාසාගරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසය කර වදරන කල්හි එක්තරා පුරුෂයෙක් තෙම උක්ගස් මිටියක් කර තබාගන එක් උක්

Non-commercial distribution

දණ්ඩක් කමින් යයි. එකල්හි සිල්වත්වූ යහපත් ගුණධර්ම ඇති එක්තරා උපාසකයෙක් තෙම බාල දරුවෙකු සමඟ ඔහුගේ පිටිපසින් යයි. දරු තෙමේ උක්දඬු දැක උක්දඬු දෙවයි කියා හඬයි. උපාසක තෙම දරුවා උක් ඉල්වා හඬන්නා දැක ඒ පුරුෂයාට සංග්‍රහ කරමින් ඔහු හා සමඟ කථා කෙළේය. ඒ පුරුෂයා වනාහී ඒ උපාසකයා සමඟ කිසිවක් කථා නොකළේය, දරුවාට උක්දඬු කැබැල්ලක්වත් නුදුන්නේය. උපාසක තෙම ඒ දරුවා පෙන්වා ''මේ දරුකතෙම ඉතාමත් හඬයි, මොහුට එක් උක්දඬු කැල්ලක් දෙව''යි කීයේය. ඒ අසා පුරුෂ තෙම නොඉවසමින් අවමන් සිත් උපදවා අනාදර වශයෙන් එක් උක් දඬුවක් පිටි පස්සට දැමීමේය. හෙතෙම මෑත කලෙක මැරී ගොස් බොහෝ කල් පුරුදු කළ ලොභයාගේ වශයෙන් ප්‍රේතයන් විෂයෙහි උපන්නේය. ඒ කර්මයාගේ විපාකය නම් ස්වකීය කර්මයට සමාන වෙයි. අටකිරියක් පමණ තැන් පැතිර පවත්නාවූ අඳුන්වන් මොහොල් දඬු පමණවූ උක් ගස්වලින් ගනව ගැවසී ගත් මහත් උක් වනයක් පහළ වීය. ඒ ප්‍රේතයා උක්දඬු කනු කැමැති බැවින් උක් දණ්ඩක් ගන්නෙමැයි සිතා උක්වනයට ගිය ඇසිල්ලෙහි උක්දඬු ඔහුට ගසා හිංසා කෙරෙත්. ඒ ප්‍රේතයා එයින් මුර්ච්ඡිතවී වැටෙයි. එකල්හි එක් දවසක් ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේ රජගහ නුවරට පිඬු පිණිස වඩිනසේක් අතරමගදී ඒ ප්‍රේතයා දුටු සේක. ඒ ප්‍රේතතෙම තෙරණුවන් දැක තමා විසින් පෙර කරන ලද කර්ම විචාරන්නේ මේ ගාථා සතර කීය:–

143. ඉදං මම උච්ඡුවනං මහන්තං
නිබ්බත්තති පුඤ්ඤඵලං අනප්පකං,
තං දානි මෙ පරිභොගං න උපෙති
ආචික්ඛ භන්තෙ කිස්ස අයං විපාකො.

144. භඤ්ඤමි බජ්ඣාමි ච වායමාමි
පරිසක්කාමි පරිභුඤ්ජිතුං කිඤ්චි,
ස්වාහං ඡින්නථාමො කපණො ලාලපාමි
කිස්ස කම්මස්ස අයං විපාකො.

145. විසාතො වාහං පරිපතාමි ඡමායං
පරිවත්තාමි වාරිචරො ව සම්මෙ,
රුදතො ච මෙ අස්සුකා නිග්ගලන්ති
ආචික්ඛ භන්තෙ කිස්ස අයං විපාකො.

Non-commercial distribution

146. ඡාතො කිලන්තො ච පිපාසිතො ච
සන්තසිතො සාතසුඛං න වින්දෙ,
පුච්ඡාමි තං එතමත්ථං භදන්තෙ
කථන්නු උච්ඡුපරිභොගං ලභෙය්‍යං.

143. භන්තෙ, ස්වාමීනි; අනප්පකං, ස්වල්පනු වූ; පුඤ්ඤඵලං, කුශලවිපාක වූ; මහන්තං, මහත් වූ; ඉදං උච්ඡුවනං, මේ උක්වනය; මම, මට; නිබ්බත්තති, උපදියි; තං, එය; ඉදානි, දැන්; මෙ, මාගේ; පරිභොගං, පරිභොගයට; න උපෙති, නොපැමිණෙයි; කිස්ස, කෙබඳු අකුශලයක්හුගේ; අයං විපාකො, මේ විපාකයදැයි; ආචික්ඛ, කියනු මැනවි.

144. සො අහං, ඒ මම; කිඤ්චි, කිසි උක්රසයක්; පරිභුඤ්ජිතුං, අනුභව කිරීමට; වායාමි, වෑයම් කෙරෙමිද; පරිසක්කාමි, ප්‍රයොග කරමිද; භඤ්ඤමි, වැනසෙමි; ඛජ්ජාමිව, (මම) කපනු ලබමි; ඡින්නථාමොා, සුන්බල ඇතිව; කපණොා, බැපෑපත්ව; ලාලපාමි, අතිශයින් විලාප කියමි; කිස්සකම්මස්ස, කෙබඳු අකුශල කර්මයක්හුගේ; අයං විපාකොා, මේ.විපාකයවේද.

145. භන්තෙ, ස්වාමීනි; අහං, මම; විසතොව, නැසුණු ආසා ඇතිව (නොහොත්) ශක්ති නැතිව; ඡමායං, බිම; පරිපතාමි, වැටෙමි; සම්මෙ, අව්වෙන් රත්වූ ගොඩ; වාරිවරොා ඉව, මත්ස්‍යයෙකු මෙන්; පරිවත්තාමි, පෙරළෙමි; රුදතොව, අඬන්නාවූ; මෙ, මාගේ; අස්සුකා, (නෙත්වලින්) කඳුලු; නිග්ගලන්ති, ගලා බසිත්; කිස්ස, කෙබඳු අකුශලකර්මයක්හුගේ; අයං විපාකොා, මේ විපාකයදැයි; ආචික්ඛ, කියනු මැනවි.

146. භදන්තෙ, ස්වාමීනි; ඡාතොා, ක්ෂුධා ඇත්තේද; සන්තසිතොා, (උගුර තොල් තලු) ඉතාමත් වියලුණේ; සාතසුඛං, සාතසංඛ්‍යාත සැපය; නවින්දෙ, නොවිඳිමි; කථන්නු, කෙසේ නම්; උච්ඡු පරිභොගං, උක්රස අනුභවය; ලභෙය්‍යං, ලබන්–නෙම්දැයි; එතං අත්ථං, මේ කාරණය; තං, ඔබ; පුච්ඡාමි, විචාරමි.

ස්වාමීනි බොහෝ කුසල විපාකයක් වූ මේ මහත් උක්වනයක් මට පහළව තිබේ. එය මගේ පරිභොගයට දැන් නොලැබේ. කවර කර්මයක්හුගේ මේ විපාකය වේදැයි මට කියනු මැනව. ඒ මම උක්රස අනුභව කිරීමට ගිය විට වෙහෙසට

Non-commercial distribution

පැමිණෙමි. විශෙෂයෙන් පෙළෙමි කඩුපත් සටහන් බඳු තියුණු මුවහත් ඇති ආයුධ වලින් කපන්නාසේ උක් කොළවලින් මගේ සිරුර කැපෙයි, උක්දඬු කෑමට වෑයම් කරමි, ප්‍රයොග කරමි එයින් හීන වූ ශක්ති ඇතිව බැගෑපත්ව දුකින් පෙළෙන ලදුව බලවත්සේ හඬමි, ස්වාමීනි කවර කර්මයක්හුගේ මේ විපාකය වේදැයි කියනු මැනවි. ස්වාමීනි මම නැසුණු ආශා ඇතිව නොහොත් ශක්ති නැතිව සිටින්ට නොහැකිව බිම වැටෙමි, අව්වෙන් රත් වූ භූමියෙහි ලූ මත්ස්‍යයෙකුමෙන් පෙරළෙමි, හඬන්නාවූ මගේ නෙත්වලින් කදුලු ගලා බසිත්, ස්වාමීනි මේ විපාකය කවර කර්මයක්හුගේදැයි කියනු මැනව. බඩගිනිව ක්ලාන්තව පැන් පිපාසා ඇතිව වියලුණු උගුර තොල්තලු ඇතිව සානයයි කියන ලද සැපයක් නොලබම්, ස්වාමීනි කෙසේ නම් උක්රස අනුභවය ලබන්නෙමිද යන මේ කාරණය ඔබ වහන්සේගෙන් මම විචාරමි. එකල්හි තෙරණුවන් විසින් වදළ පිළිතුරු ගාථා මෙසේයි:–

147. **පුරෙ තුවං කම්මමකාසි අත්තනා**
මනුස්සභූතො පුරිමාය ජාතියා,
අහං ච කං එතමත්ථං වදමි
සුත්වාන ත්වං එතමත්ථං විජාන.

148. **උච්ඡුං තුවං බාදමානො පයාතො**
පුරිසො ච තෙ පිට්ඨිතො අන්වගච්ඡි,
සො ච තං පච්චාසන්තො කථෙසි
තස්ස තුවං න කිඤ්චි ආලපිත්ථ.

149. **සො ච කං අභණන්තං අයාචි**
දෙහයය උච්ඡුන්ති ච කං අවොච,
තස්ස තුවං පිට්ඨිතො උච්ඡුං අදසි
තස්සෙතං කම්මස්ස අයං විපාකො.

150. **ඉඞ්ඝ තුවං පිට්ඨිතො ගණ්හි උච්ඡුං**
ගහෙත්වාන බාදස්සු යාවදත්ථං,
තෙනෙව ත්වං අත්තමනො භවිස්සසි
හට්ඨා උදග්ගො ච පමොදිතො ච.

Non-commercial distribution

151. **ගන්ත්වාන සො පිටයීතො අග්ගහෙසි**
ගහෙත්වාන තං බාදි යාවදත්ථං,
තෙනෙව සො අත්තමනො අහොසි
හටයො උදග්ගො ච පමොදිතො චා-ති.

147. **ත්වං**, තෝ; **පුරෙ**, පෙර; පුරිමායජාතියා, පූර්ව්ජන්ම යෙහි; මනුස්සභූතො, මනුෂ්‍යවූයේ; අත්තනා, තමා; **කම්මං අකාසි**, අකුශල කර්මයක් කෙළෙහිය; අහංච, මම; **එතං අත්ථං**, මේ කාරණය; තං, තට; වදමි, කියමි; **ත්වං**, තෝ; **එතං අත්ථං**, මේ කාරණය, **සුත්වාන**, අසා; විඥාන, දනුව.

148. **තුවං**, තෝ; **උච්ඡුං**, උක් දණ්ඩක්; බාදමානො, කමින්; පයාතො, ගියේය; තෙ, තාගේ; පිටියීතො, පිටිපසින්; පුරිසොච, පුරුෂයෙක්ද; අනුඅගච්ඡී, ලුහුබැඳ ගියේය; සොච, හෙතෙමේද; තං, එය; පච්චාසන්තො, ප්‍රත්‍යාශංසනය කරමින්; කථෙසි කථා කෙළේය; තුවං, තෝ; **තස්ස**, ඔහට; කිංචි, කිසිවක්; නආලපිත්ථ, නොකීවෙහිය.

149. **සොච**, හෙතෙමේද; අභණන්තං, කථානොකරන්නාවූ; තං, තා; අයාචි, අයදියේය; අය්‍ය, ආර්‍යය; **උච්ඡුං**, උක් දණ්ඩක්; දෙහි ඉති, දෙවයි; තං, තට; අවොච, කීයේය; තුවං, තෝ; තස්ස, ඔහට; පිටියීතො, පිටිපසින්; උච්ඡුං, උක්දඬුවක්; අදසි, දුන්නෙහිය; තස්ස එතං කම්මස්ස, ඒ කර්මයාගේ වනාහි; අයං විපාකො, මේ විපාකය වෙයි.

150. ඉඩස, එබැවින්; තුවං, තෝ; පිටියීතො, පිටිපසින්; උච්ඡුං උක්දඬු; ගණ්හ, ගනුව; ගහෙත්වාන, ගෙන; යාවදත්ථං; යැපෙනතාක්; බාදස්සු, කනු; තෙනෙව, එයින්ම; ත්වං, තෝ; අත්තමනො භවිස්සසි, සතුටුසිත් ඇතිවන්නෙහිය; හටයො, තුටු වූයේද; උදග්ගොච, ඔද වැඩියේද; පමොදිතොච, ප්‍රමුදිත වූයේද වන්නෙහිය.

151. සො, ඒ ප්‍රේතතෙම; ගන්ත්වාන, ගොස්; පිටියී-තො, පිටිපසින්; අග්ගහෙසි, ගත්තේය; තං, එය; ගහෙත්වාන, ගෙන; යාවදත්ථං, යැපෙනතරම්; බාදි, අනුභව කෙළේය. (සෙස්ස කියන ලදී.)

Non-commercial distribution

එකල තෙරුන් වහන්සේ වදරනසේක් ප්‍රෙතය තෝ පෙර ජාතියෙහිදී මනුෂ්‍යයෙක් වූයේ අකුශලකර්මයක් කෙළේය. මම තොපට ඒ කර්මය දැන් කියමි, තෝ ඒ කාරණය අසා දැනගනුව, තෝ එක් උක්දණ්ඩක් කමින් ගියෙහිය, එකල එක් පුරුෂ-යෙක්ද තොපගේ පිටිපසින් ලුහුබැඳ ගියේය. ඒ පුරුෂ තෙමේද නුඹට ළඟාවෙනු කැමැතිව කථා කළේය, තෝ ඔහුට කිසි කථාවක් නොකළෙහිය. ඒ උපාසක තෙමේද කිසිවක් නොකිව් තාගෙන් පින්වත උක්දඩුවක් දෙවයි කියා ඉල්වීය. එවිට පිටිපසින් ඔහුට උක්දණ්ඩක් වීසි කළේය, ඒ අකුශල කර්මයාගේ විපාකය මෙය වේ. එහෙයින් තෝ පිටිපසින් උක්දඩු ගනුව, එසේ ගෙන යපෙන තරම් කාපියව් එයින්ම තෝ සතුටු සිත් ඇති වන්නෙහිය. එවිට තුටුපහටු වූ ඔදවැඩියා වූ ප්‍රමුදිත වූ සිත් ඇති ඒ ප්‍රෙත තෙම ගොස් පිටිපසින් උක්දඩු හැරගෙන යපෙන තරම් කෑවේය, එයින්ම හෙතෙම සතුටුවිය.

මෙසේ තෙරණුවන් ඇණෙව් නියාවෙන් උක්දඩු හැරගෙන රුවිපරිදි කා මහත් උක්මිටියක් හැරගෙනැවිත් තෙරණුවන්ට පැමිණවීය. තෙරුන් වහන්සේ ඔහුට අනුග්‍රහ කරමින් ඔහු ලවාම ඒ උක්දඩු මිටිය ගෙන්වා ගෙන වෙළුවනාරාමයට වැඩමවා බුදුරජාණන් වහන්සේට දුන් සේක. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා හා සමග වළඳ අනුමෝදනා කළ සේක. ප්‍රෙත තෙම පහන් සිත් ඇතිව වැඳ ගියේය. හෙතෙම එතැන් පටන් සුවසේ උක්රස අනුභව කෙළේය. ඒ ප්‍රෙත තෙම මෑත කලෙක මැරී ගොස් තවුතිසා දෙව්ලොව උපන.

ප්‍රෙතයාගේ ඒ මේ පුවත වනාහි මිනිස් ලොව ප්‍රකට විය. ඉක්බිති මනුෂ්‍යයෝ බුදුන් වෙත එළඹ ඒ ප්‍රවෘත්තිය විවරා-ලෝය. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ඒ මිනිසුන්ට ඒ කාරණය විස්තර වශයෙන් දෙශනා කොට ධර්මදෙශනා කළ සේක. මනුෂ්‍යයෝ ඒ ධර්ම කථාව අසා මසුරු මලයෙන් වැළකුණාහුය.

මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි පස්වෙනි උච්ඡු ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවන ලදී.

Non-commercial distribution

4. 6 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහා වගීයෙහි සවෙනි **කුමාර ප්‍රෙතවස්තුව** කවරේදයත්–

අසරණ සරණ කරුණා නිධාන ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දෙවරම් වෙහෙර වැඩ වාසය කරන සේක් ප්‍රෙතයන් දෙදෙනෙකු අරබයා මේ වස්තුව දෙශනා කළ සේක. සැවැත් නුවර කොසොල් රජහුගේ වනාහි ප්‍රසාද ඵලවන පුත්‍රයෝ දෙදෙනෙක් ප්‍රථම වයස්හි සිටියෝ යෞවන මදයෙන් මත්ව පරදර අකුශල කර්මය කොට මැරිගොස් දිය අගලක් මතු පිට ප්‍රෙතයෝව උපන්නාහුය. ඔවුහු රාත්‍රියෙහි භයඩිකාර ශබ්දයකින් මුරගා හැඩුවාහුය. මිනිස්සු ඒ බියකරු ශබ්දය අසා භයින් ත්‍රස්තව ''මෙසේ කළ කල්හි මේ අවමඟුල සන්සිඳේය'' යි කියා බුඩ ප්‍රමුඛ භික්ෂු සඩ්ඝයාහට මහ දන්දී එපවත් බුදුන්ට සැලකළාහුය. භාග්‍යවතුන් වහන්සේ ''උපාසකවරුනි ඒ ශබ්දය ඇසීමෙන් තොපට කිසි අනතුරක් නොවන්නේය'' යි කියා ඊට කාරණය වදරා ඒ මිනිසුන්ට ධර්ම දෙශනා කිරීම පිණිස මේ ගාථාවන් වදළ සේක.

152. සාවත්ථිනාම නගරං – හිමවන්තස්ස පස්සතො,
තත්ථාසුං වෙ කුමාරා – රාජ පුත්තානි මෙ සුතං.

153. පමත්තා රජ නීයෙසු – කාමස්සාදහිනන්දිනො,
පච්චුප්පන්නසුඛෙ ගිඩා – න තෙ පස්සිංසුනාගතං.

154. තෙ චුතා ච මනුස්සත්තා – පරලොකං ඉතො ගතා,
තෙධ සොසෙන්තාදිස්සන්තා-පුබ්බෙ දුක්කටමත්තනො

155. බහූසු වත සන්තෙසු – දෙය්‍යධම්මෙ උපට්ඨිතෙ,
නාසක්ඛිමිහා ච අත්තානං – පරිත්තං කාතුං සුඛාවහං.

156. කිං තතො පාපකං අස්ස – යං නො රාජකුලා චුතා,
උප්පන්නා පෙන්තිවිසයං – ඛුප්පිපාසාසමප්පිතා.

157. සාමිනො ඉධ හුත්වාන – හොන්ති අස්සාමිනො තහිං,
චරන්ති ඛුප්පිපාසාය – මනුස්සා උන්නතොනතා.

158. එවමාදීනවං ඤත්වා – ඉස්සරමදසම්භවං
පාහාය ඉස්සරමදං – භවෙ සග්ගගතො නරො,
කායස්ස භෙද සප්පඤ්ඤා–සග්ගං සො උප්පජ්ජති–ති,

Non-commercial distribution

152. හිමවන්තස්ස, හිමාලය වනයාගේ; පස්සතො, එක්පසකින්; සාවත්ථිනාම, ශ්‍රාවස්ති නම් වූ; නගරං, නුවරක් ඇත්තේය; තත්ථ, එහි; රාජපුත්තා, රජපුත් වූ; වෙ කුමාරා, කුමරු දෙදෙනෙක්; ආසුං ඉති, වූවාහුයයි; මෙ, මා විසින්; සුතං, අසන ලදී.

153. රජනීයෙසු, සිත් ඇලවියයුතු කාමයන්හි; පමත්තා, ප්‍රමත්ත වූ; කාමස්සාදහිතනන්දිනො, කාමගුණාස්වාද වශයෙන් සතුටුවන සුලුවූ; පච්චුප්පන්නසුඛෙ, වර්තමාන සැපමාත්‍රයෙහි; ගිධා, ගිජු වූ; තෙ, ඔවුහුතුමූ; අනාගතං, ආයතිසැපය; නපස්සිංසු, නොබැලුවාහුය.

154. තෙ, ඔවුහු දෙදෙන; ඉතො මනුස්සත්තා, මේ මිනිසත් බැවින්; චුතාව. චුතව; පරලොකං, පරලොව (ප්‍රෙත ලොකය) ට; ගතා, පැමිණියෝ වූහ; ත්ත, ඔවුහුතුමූ; අත්තනො, තමන්ගේ; පුබ්බෙ, පෙර; දුක්කටං, දුශ්චරිතය (දැන); අදිස්සන්තා, අදෘශ්‍යමාන රූප ඇතිව; ඉධ, මේ සැවැත් නුවර සමීපයෙහි; සොසෙන්ති, දැන් කෑගසත්.

155. බහුසු, නොයෙක් දක්ඛිණාර්හයන්; සන්තෙසු, විද්‍යමාන කල්හි; දෙය්‍යධම්මෙ, දනවස්තු; උපට්ඨිතෙ, එළඹ සිටි කල්හි; අත්තානං, තමන්ට; සුඛාවහං, සැප එලවන්නා වූ; පරිත්තංව, ස්වල්ප වූ ද පිනක්; කාතුං, කරන්ට; වත, එකාන්ත-යෙන්; නාසක්ඛිම්හා, නොහැකි වීමු.

156. නො, අපි; යං, යම් පවිකමකින්; රාජකුලා, රජ කුලයෙන්; චුතා, චුතව; පෙත්තිවිසයං, ප්‍රෙත ලොකයෙහි; උප්පන්නා, උපන්නාහු; බුප්පිපාසා සමප්පිතා, සාපිපාසා දුකින් මඩනා ලද්දෝ හැසිරෙමුද; තතො, ඊට වඩා, පාපකං, ලාමක දෙයක් නම්; කිං අස්ස, අන් කුමක් වන්නේද.

157. ඉධ, මෙලොවදී; සාමිනො හුත්වාන, ස්වාමියෝවී; තහිං, එහිම; අස්සාමිනො හොන්ති, අස්වාමිකයෝ වෙත්; උන්නතා, මිනිස් බැවිහි උසස් වූ; මනුස්සා, ඒ මිනිස්සු; ඔනතා, ප්‍රෙත විෂයෙහි පහත්ව; බුප්පිපාසාය, සාපිපාසා දුකින් යුක්තව; චරන්ති, හැසිරෙත්.

158. නරො, මනුෂ්‍ය තෙම; ඉස්සරියමදසම්භවං, ඓශ්-වර්‍ය්‍ය මදයෙන් වූ; ආදීනවං, දොෂය; එවං, මෙසේ; ඤත්වා, දැන;

Non-commercial distribution

ඉස්සරියම්දං, ඉස්සුරුමදය; පහාය, හැරපියා; සග්ගගතො භවෙ, ස්වර්ගයට ගියෙක් වන්නේද; සප්පඤ්ඤෙ, සප්‍රාඥ වූ; සො, ඒ මනුෂ්‍ය තෙම; කායස්සභෙද, ශරීරයාගේ බිඳීමෙන් ; සග්ගං, ස්වර්ගයට; උපගච්ඡති, පැමිණෙයි.

හිමාලය වනයාගේ **එක් පසකින්** ශ්‍රාවස්ති නම් නගරයක් විය. ඒ සැවැත් නුවර රාජ පුත්‍ර වූ කුමරු දෙදෙනෙක් සිටියාහු යයි කියා මා විසින් නුවණින් දක්නා ලද පමණකුත් නොව ලොව ප්‍රකට භාවයෙන්ද මා විසින් අසන ලද්දේය, කුසල ක්‍රියාවෙහි පමා වූ ඔහු දෙදෙන සිත් ඇලවිය යුතු පස්කම් ගුණ විඳීමෙන් සතුටුවන සුලුව වර්තමාන සැපතෙහි ගිජුව දුශ්චරිතය හැර දමා සුචරිතයෙහි හැසිර මතු කාලයෙහි ලැබිය යුතු දිව්‍ය මනුෂ්‍ය සැප නොසිතුවාහුය. ඔහු දෙදෙන මේ මිනිසත් බැවින් චුතව පරලොව ප්‍රෙත අපායේ ඉපදීමට පැමිණියෝය. පෙර රාජ පුත්‍ර වූ ඔහු දෙදෙනා දැන් ප්‍රෙතයෝව මේ සැවැත් නුවර සමීපයෙහි ඉපිද නොදක්නා ලද ශරීර ඇතිව පෙර තමන් කළ දුශ්චරිතය දැන කැගසත් හඬත්. (දැන් ඒ ප්‍රෙතයන්ගේ හැඬීමට කාරණය හේතු වශයෙන් හා ඵල වශයෙනුත් බෙද දැක්වීමට ඔවුන් විසින් මෙසේ කියන ලදී.) නොයෙක් දක්ෂිණාර්හ පුද්ගලයන් ඇති කල්හි තමා සතු දිය යුතු දන වස්තුවත් ළඟ තිබෙද්දී තමන්ට මතු සැප එළවන්නා වූ ස්වල්ප මාත්‍රවූ දානයක් කොට තමන්ට සැපතක් නිරූපද්‍රව භාවයක් කර ගන්ට ඒකාන්තයෙන් නොහැකි වූවෝ වෙමු. යම් පාප කර්මයක් හේතු කොට ගෙන අපි රජ කුලයෙන් චුතව මේ ප්‍රෙත ලොකයෙහි ඉපදී සාපිපාසා දෙකින් මඩනා ලදුව හැසිරෙමුද ඊට වඩා ලාමක දෙයක් නම් තවත් ඇත්තේද නැත්මය, මේ මිනිස් ලොව මනුෂ්‍යයෝ පෙර යම් තැනක ස්වාමියෝව හැසිරෙද්ද පසුව එතනම අභිමියෝ වෙත්, මනුෂ්‍ය කාලයෙහි ස්වාමියෝව සිට මැරී ගොස් කර්ම වශයෙන් සාපිපාසා දුකින් අවනතව ඇවිදිනි. සංසාරයාගේ ප්‍රකෘතියක සැටි බලව. මෙසේ යම් මනුෂ්‍යයෙක් තෙම ඉසුරු මදයෙන් වූ, අපායොත්පත්තියයි කියන ලද දෙෂය දැන ඓශ්වර්‍යමදය හැර දමා පින් රැස් කරන්නේ වේද ඒ යහපත් නුවණැති මනුෂ්‍ය තෙම මැරී ගොස් දෙව්ලොව උපදනේය.

Non-commercial distribution

මෙසේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රෙතයන්ගේ ප්‍රවෘත්තිය වදරා ඒ මිනිසුන් විසින් කරන ලද දනය ප්‍රෙතයන් සඳහා දෙවා සැපත් පිරිසගේ අදහසට අනුකූල වූ ධර්මය දෙශනා කළ සේක. ඒ දෙශනා තොමෝ මහජනයාහට සාර්ත්ථක වූයේය.

මේ ප්‍රෙත වස්තු දෙශනායෙහි මහා වර්ගයෙහි සවෙනි කුමාර ප්‍රෙත වස්තු වර්ණනාව කියා නිමවන ලදී.

4. 7 කථාව

තවද මේ ප්‍රෙත වස්තු දෙශනායෙහි මහා වර්ගයෙහි සත්වෙනි **රාජපුත්‍ර ප්‍රෙත වස්තුව** කවරේදයත්:-

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙර වැඩ වසන සේක් රාජපුත්‍ර ප්‍රෙතයෙකු අරභයා මේ වස්තුව වදළ සේක. එහි අතීත කාලයෙහි කිතව නම් රජහුගේ යම් ඒ පුත්‍රයෙක් තෙම අතීතයෙහි වූ පසේ බුදු කෙනෙකුන්ට අපරාධ කොට බොහෝ අවුරුදු දහස් ගණනක් මුළුල්ලෙහි නරකයෙහි පැසී ඒ අකුශල කර්මයාගේම විපාකාවශෙෂයෙන් ප්‍රෙත ලෝකයෙහි උපන්නේවේද, හෙතෙම මේ කථාවෙහි රාජපුත්‍ර ප්‍රෙතයා යයි අදහස් කරන ලදී. ඔහුගේ කථාව යටකී සානුවාසී ප්‍රෙත වස්තුවෙහි විස්තර වශයෙන් ආයේමය. එහෙයින් විස්තරය එහි කී නයින්ම ඉගෙන ගත යුතුයි. ඒ කථාවෙහිදී සානුවාසී තෙරණුවන් විසින් තමන්ගේ ඥති ප්‍රෙතයන් පිළිබඳ ප්‍රවෘත්තිය කී කල්හි ''හුදෙක් තොපගේ නැයෝ පමණක් ප්‍රෙතයෝව උපන්නෝ නොවෙත්, තවද නුඹත් මෙයින් අනතුරුව ඉක්ම ගිය අත්බැව්හි ප්‍රෙතයෙක්වී මහ දුක් වින්දේය'' යි කියා ශාස්තෘන් වහන්සේ වදරා ඒ තෙරණුවන් විසින් යාච්ඤා කරන ලදුව මේ රාජ පුත්‍ර ප්‍රෙත වස්තුව වදළ සේක:-

159. **පුබ්බෙ කතානං කම්මානං-විපාකො මථයෙ මනං,**
රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ-ඵොට්ඨබ්බෙ ච මනොරමෙ.

160. **නච්චං ගීතං රතිං ක්‍රීඩං-අනුභුත්වා අනප්පකං,**
උය්‍යානෙ පරිවරිත්වාන-පවිසන්තො ගිරිබ්බජං.

161. **ඉසිං සුනෙත්තමද්දක්ඛි-අත්තදන්තං සමාහිතං,**
අප්පිච්ඡං ගිරිසම්පන්නං-උඤ්ඡපත්තගතෙ රතං,

Non-commercial distribution

162. හත්ථික්ඛන්ධතො ඔරුය්හ-ලඩා හන්තෙති අබ්‍රැවි,
තස්ස පත්තං ගහෙත්වාන-උච්චං පග්ගය්හ ඛත්තියො.

163. ථණ්ඩිලෙ පත්තං භින්දිත්වා-හසමානො අපක්කමී,
රඤ්ඤො කිතවස්සාහං-පුත්තො කිං මං හික්ඛුකරිස්සසි.

164. තස්ස කම්මස්ස එරුසස්ස-විපාකො කටුකො අහු,
යං රාජපුත්තො වෙදෙසි-නිරයම්හි සමප්පිතො.

165. ඡළෙව චතුරාසීති-වස්සානි නහුතානි ච,
භුසං දුක්ඛං නිගච්ඡිත්ථො-නිරයෙ කතකිබ්බිසො.

166. උත්තානොපි ච පච්චිත්ථ-නිකුජ්ජො වාමදක්ඛිණෙ,
උද්ධං පාදෙ යීතො වෙව-චිරං බාලො අපච්චථ.

167. බහූනි වස්සසහස්සානි-පූගාති නහුතානි ච,
භුසං දුක්ඛං නිගච්ඡිත්ථො-නිරයෙ කතකිබ්බිසො

168. එතාදිසං ඛො කටුකං-අප්පදුට්ඨපදෙසිනං,
පච්චන්ති පාපකම්මන්තා-ඉසිමාසජ්ජ සුබ්බතං.

169. සො තත්ථ බහුවස්සානි-වෙදයිත්වා බහුං දුඛං,
ඛුප්පිපාසාභතො නාම-පෙතො ආසි තතො චුතො.

170. එතමාදීනවං දිස්වා-ඉස්සරමදසම්භවං,
පහාය ඉස්සරමදං-නිවාතමනුවත්තයෙ.

171. දිට්ඨෙව ධම්මෙ පාසංසො-යො බුඩ්ඩසු සගාරවො,
කායස්ස භෙදා සපඤ්ඤො-සග්ගං සො උප්පජ්ජති-ති.

159. පුබ්බෙ, පූර්ව්‍යජන්මයෙහි; කතානං කම්මානං කරන ලද අකුශලකර්මයන්ගේ; විපාකො, විපාකයතෙම; මනං, (අන්ධ බාලයන්ගේ) සිත; මනොරමෙ, මනොරම්‍ය වූ; රූපෙ, රූප හෙතුවෙන්ද; සද්දෙ, ශබ්දහෙතුවෙන්ද; රසෙ, රසහෙතුවෙන්ද; ගන්ධෙ, ගන්ධහෙතුවෙන්ද; ඵොට්ඨබ්බෙච, ස්පෘෂ්ටව්‍ය හෙතු වෙන්ද; මථයෙ, මැඩලන්නේය.

160-161. අනප්පකං, බොහෝ වූ; නච්චං, නෘත්‍යය; ගීතං, ගීතය; රතිං, කාමරතිය; වික්ඛිං, (මිත්‍රාදීන් හා) ක්‍රීඩාව; අනුභුත්වා, විඳ; උයාානෙ, උයනෙහි; පරිවරිත්වාන, අභිරමණය කොට; ගිරිබ්බජං, රජගහ නුවරට; පවිසන්තො, ප්‍රවිෂ්ටවන්නේ;

Non-commercial distribution

ඉසිං, මහාර්ෂි වූ; අත්තදන්තං, දැමුණු සිත් ඇති; සමාහිතං, අර්හත්ඵල සමාධියෙන් සමාහිත වූ; අප්පිච්ඡං, අල්පෙශ්ච වූ; හිරිසම්පන්නං, ලජ්ජා සහිත වූ; පත්තගතෙ, පාත්‍රපර්‍යාපන්න වූ; උඤ්ඡෙ, ආහාරයෙහි; රතං, සතුටු වූ; සුනෙත්තං, සුනෙත්‍ර නම් පසේ බුදුන්; අද්දක්ඛි, දුටුවේය.

162–163. ඛත්තියො, රාජපුත්‍ර තෙම; හත්ථික්ඛන්ධතො, ඇතුපිටින්; ඔරුය්හ, බැස; හන්තෙ, ස්වාමීනි; ලඩා ඉතිව, (භික්ෂාව) ලබන ලද්දීදැයි; අබ්‍රැවී, ඇසීය; තස්ස, උන්වහන්සේ-ගේ; පත්තං ගහෙත්වාන, පාත්‍රය හැරගෙන; උච්චං පග්ගය්හ, ඉතා උස්කොට ඔසවා; ථණ්ඩිලෙ, තද භූමි ප්‍රදෙශයක; පත්තං, පාත්‍රය (දමා); භින්දිත්වා, බිඳ; හසමානො, සිනාසෙමින්; අපක්කමී, මදක් ඉවත්ව සිටියේය; භික්ඛු, මහණ; අහං, මම; කිතවස්සරඤ්ඤෙ, කිතවරජුගේ; පුත්තො, පුත්‍රයා වෙමි; මං, මට; කිං කරිස්සසි, කුමක් කරන්නෙහිද.

164–165. එරුසස්ස, දරුණු වූ; තස්ස කම්මස්ස, ඒ අකුශල කර්මයාගේ; විපාකො, විපාකය; කටුකො අහු, කටුක විය; කතකිබ්බිසො, කරන ලද දරුණු පව් ඇති; රාජපුත්තො, රාජ පුත්‍ර තෙම; නිරයම්හි, නරකයෙහි; සම්පත්තො, පිහිටියේ; යං, යම් විපාකයක්; වෙදෙසි, විඳිද; චතුරාසිති සහස්සානි, සුවාසූ දහස් වූ; ඡ එව, සයක්ම; නහුතානිව වස්සානි, එහෙයින්ම නහුතගණන් හවුරුදු; නිරයෙ, නරකයෙහි; භුසං දුක්ඛං, ඉතාමත් දුකට; නිගච්ඡිත්ථො, පැමිණියේය.

166. බාලො, අඥන (රාජපුත්‍ර) යා; උත්තානොපිව, උඩුකුරුවද; නිකුජ්ජො, යටිකුරුවද; වාම දක්ඛිණො, වම් ඇලයෙන් හා දකුණු ඇලයෙන් යුක්තවද; උඩංපාදෙ, උඩුකුරු පා ඇතිවද; යීතොචෙව, සිටියේද; චිරං බොහෝකල් මුළුල්ලෙහි; අපච්චථ, (නිරයෙහි) පැසුණේය.

167. කතකිබ්බිසො, කරන ලද දරුණු පව් ඇත්තේ; බහූනි වස්ස සහස්සානි, නොයෙක් අවුරුදු දහස් ගණන් මුළුල්-ලෙහිද; පූගානි, හවුරුදු සමූහ මුළුල්ලෙහිද; නහුතානිව, නහුත ගණන් මුළුල්ලෙහිද; නිරයෙ, නිරයෙහි; භුසං දුක්ඛං, ඉතාමත් දුකට; නිගච්ඡිත්ථො, පැමිණියේය,

Non-commercial distribution

168. අප්පදුට්ඨපදෙසිනං, අපරාධීන් කෙරෙහි මෙත්සිත් ඇති; සුබ්බතං, මනා පැවතුම් ඇති; ඉසිං, සෘෂිහු වෙත; ආසජ්ජ, වරදවා; පාපකම්මන්තා, පව්කම් කරන පුද්ගලයෝ; එතාදිසංඛා, මෙබඳුවූම; කටුකං, ඉතා දුක් ඇතිව; පච්චන්ති, පැසෙත්.

169. සෝ, ඒ රාජ පුත්‍රයා; තත්ථ, ඒ නරකයෙහි; බහුවස්සානි, බොහෝ අවුරුදු මුළුල්ලෙහි; බහුං දුඛං, බොහෝ දුක්; වෙදයිත්වා, විඳ; තතෝ චුතෝ, එයින් චුත වූයේ; ඛුප්පිපාසාභතොනාම, සාපිපාසයෙන් මැඩුණාවූම; පෙතොආසි, ප්‍රේත යෙක් විය.

170-171. යෝ, යමෙක් තෙම; එතං, මේ; ඉස්සරමදසම්භවං, ඓශ්වර්‍යමදයෙන් වූ; ආදීනවං, දෙෂය; දිස්වා, දැක; ඉස්සරමදං, ඉසුරුමදය; පහාය, හැරපියා; නිවාතං, යටහත් පැවැත්මට; අනුවත්තයෙ, අනුව පවත්නේද; බුඩ්ඪසු, බුදුන් කෙරෙහි; සගාරවො, ගරු සහිතවේද; සො සප්පඤ්ඤෙ, ඒ සප්‍රාඥ තෙම; දිට්ඨෙව ධම්මෙ, ඉහතාත්මයෙහිදීම; පාසංසො, පැසසිය යුතුවේ; කායස්සභෙද, මරණින් මතු; සග්ගං, දෙව්ලොවට; උපපජ්ජති ඉති, පැමිණෙයි.

එම්බා සානුවාසිකය පෙර ජාතිවලදී කරන ලද අකුශල කර්මයන්ගේ විපාකය මහත්ව උපදිනු ලබන්නේ අන්ධබාලයන්ගේ සිත රූපය හේතුකොට හෙවත් කැමැති වන ලද ප්‍රියමනාප වූ රූපාලම්බනය ලැබීම නිමිත්තකොට ගෙනද ප්‍රියමනාප වූ ශබ්ද ගන්ධ රස ස්පෘෂ්ටව්‍ය යන අරමුණු ලැබීම නිමිති කොට ගෙනද. කලඹන්නේය, අනුන්ට අවැඩ කිරීම හේතුවෙන් තමන්ට අවැඩ උපදවා ගන්නේය. බොහෝ වූ නැටුම්ද ගී කීම්ද කාම රතියද මිත්‍රාදීන් සමග ක්‍රීඩා ද විඳ උයනේ ඇවිද රජගහ නුවරට යන්නාවූ රාජපුත්‍ර තෙමේ අශෛක්ෂශීලස්කන්ධාදීන් සොයන අර්ත්ථයෙන් සෘෂි වූ උතුම් දමනයෙන් දැමුණු සිත් ඇති අර්හත් ඵල සමාධියෙන් එකඟ සිත් ඇති අල්පෙච්ඡ වූ ලජ්ජා සහිත වූ භික්ෂාචර්‍යාවතෙන් ලත් පාත්‍රගත ආහාරයෙහි සතුටු වූ සුනෙත්ත නම් පසේ බුදුන් දුටුවේය. රජපුත් තෙමේ ඇතා පිටින් බැස කිමෙක්ද ස්වාමීනි භික්ෂාව ලද්දීදැයි කියා විශ්වාස ඉපදවීම පිණිස අසා ඒ පසේ බුදුන් අතින් පාත්‍රය හැරගෙන

Non-commercial distribution

පාත්‍රය ඔසවා තද භූමී ප්‍රදෙශයෙහි ගසා පාත්‍රය බිඳ දමා සිනා සෙමින් මදක් ඇත්ව සිටියේය. මේ අන්ධ බාලයා නිකරුණේ කින්ම තමාට මහත් අනතුරක් සිදු කර ගත්තේ යයි සිතා කරුණා ඉපදවීම වශයෙන් ඔහු දෙස බලා සිටි පසේ බුදුන්ට මෙසේ කීයේය. මහණ මම කිතව රජහුගේ පුත්‍රයා වෙමි, නුඹ මා දෙස බලා කුමක් කරන්නෙහිදැයි කීය. ඒ දරුණු අකුශල කර්මයාගේ විපාකය කටුක වූයේය. කරන ලද දරුණු පාපක්‍රියා ඇති රාජ පුත්‍රයා මැරී ගොස් නරකයෙහි ඉපදී හවුරුදු අසූසාර දහස බැගින් වූ සය වරක්මදැයි මෙසේ නොයෙක් නහුත ගණන් හවුරුදු මුළුල්ලෙහි ඉතා බලවත් නිරා දුකට පැමිණියේය. කෙසේද-උඩුකුරුව සයනය කිරීමෙන් හවුරුදු අසූ සාරදහසක් මුළුල්ලෙහිද යටිකුරුව සයනය කිරීමෙන් එපමණ කලක්ද වම්පසින් එපමණ කලක්ද දකුණු පසිනුත් එපමණ කලක්ද පා උඩුකුරුව එල්බෙමිනුත් එපමණ කලක්ද සිටිමිනුත් හවුරුදු අසූ සාර දහසක් මුළුල්ලෙහිද යන පිළිවෙලින් ඒ අඳුන තෙම ඉතා බොහෝ අවුරුදු දහස් ගණන් නහුත ගණන් මුළුල්ලෙහි ඉතා දරුණු දුක් විඳිමින් නිරයෙහි පැසුණේය. මනා පැවතුම් ඇති වෙෂ සිත් දුරු කළා වූ මහාර්ෂි වූ උතුමෙකු කෙරෙහි තරහ බවට පැමිණ පව්කම් කරන පුද්ගලයෝ මෙබඳු ඉතා කටුක දුක් විඳිත්. ඒ කිතව රාජ පුත්‍රයා ඒ නරකයෙහි බොහෝ අවුරුදු දහස් ගණන් මුළුල්ලෙහි නොයෙක් දුක් විඳ ඒ නිරයෙන් චුතව ප්‍රෙත අපායෙහි ඉපදී සාපිපාසා දුකින් මැඩුණා වූ ප්‍රෙතයෙක් වූයේය. මේ අන්දමින් ඉසුරු මදය නිසා ඇති වූ වැරැද්ද බලා ඉසුරුමදය හැර දමා නුවණැත්තේ යටහත් පැවැත්මෙන් නිතර පවතින්නේය. යමෙක් තෙම බුද්ධාදී උතුමන් කෙරෙහි ගෞරවාදර සහිතව පවතින්නේ වේද ඒ නැණවත් පුද්ගල තෙමේ ඉහතාත්මයෙහිදීත් පැසසුම් ලැබිය යුත්තෙක් වන්නේය. මරණින් මතු දෙවුලොව උපදනේ යයි කියා වදළ සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ රාජපුත්‍ර ප්‍රෙත කථාවෙන් එතැනට රැස් වූ මහජනයාට සංවෙග උපදවා පසුව චතුස්සත්‍යය දෙශනා කොට වදළ සේක. චතුස්සත්‍ය දෙශනාවසානයෙහි බොහෝ ජනයෝ සෝවාන් ඵලාදියට පැමිණියෝය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි සත්වෙනි රාජපුත්‍ර ප්‍රෙතවස්තුව වණ්ණනාව කියා නිමවන ලදී.

Non-commercial distribution

4. 8 කථාව

තවද මේ ප්‍රෙත වස්තු දෙශනායෙහි මහාවගීයෙහි අටවෙනි ගුථඛාදක ප්‍රෙතවස්තුව කෙසේදයත්:–

සුරාසුරනර මකුටායමාන ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දෙවුරම් වෙහෙර වැඩ වසනසේක් එක් අශුචි අනුභව කරන ප්‍රෙතයෙකු අරභයා මේ වස්තුව දෙශනා කළ සේක. සැවැත් නුවරට සමීප වූ එක්තරා ගමක වනාහි එක් කෙළෙඹියෙක් තෙම තමාගේ කුලූපගවූ භික්ෂුනමක් උදෙසා විහාරයක් කරවීය. එහි නොයෙක් ජනපදවලින් භික්ෂූහු වැඩමවා විසුවාහුය. මනුෂ්‍යයෝ ඒ භික්ෂූන්ද දැක පහන් සිත් ඇතිව ප්‍රණීත ප්‍රත්‍ය–යෙන් උපස්ථාන කළෝය. කුලූපග භික්ෂු තෙමේ ඒ උපස්ථානය නොඉවසමින් ඊෂ්‍යාවෙන් මැඩුණු සිත් ඇතිව ඒ භික්ෂූන්ගේ දෙස් කියමින් කෙළෙඹියා ලවා නුගුණ කියවීය. කෙළෙඹි තෙමේ ඒ ආගන්තුක භික්ෂූන්ට හා කුලූපග මහණා–ටත් පරිභව කරමින් නින්ද කෙළේය. පසුව කුලූපග මහණා කලුරිය කොට ඒ පන්සලේම වැසිකිළියේ ප්‍රෙතයෙක්ව උපන. කෙළෙඹි තෙම වනාහි මැරී ගොස් ඒ ප්‍රෙතයාගේම භිස මත්තෙහි ප්‍රෙතයෙක්ව උපන. එකල්හි ආයුෂ්මත් මහා මොග්ද–ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ඒ ප්‍රෙතයා දැක විචාරණ සේක් මේ ගාථාව වදළ සේක:–

172. ගුථකූපතො උග්ගන්ත්වා-කො නු දීනො හී තිට්ඨසි,
නිස්සංසයං පාපකම්මන්තො-කින්නු සද්දහසෙ තුව-න්ති,

172. කො, කවරෙක් තෙම; ගුථකූපතො, අසූචිවලෙන්; උග්ගන්ත්වා, නැඟී; දීනොහි, බැගෑපත්වම; තිට්ඨසිනු, සිටී නෙහිද; පාපකම්මන්තො, පව්කම් ඇති; තුවං, තා; නිස්සංසයං, නිසැකව; කින්නු සද්දහසෙ ඉති, කෙසේ අදහා ගනිම්ද,

වැසිකිළියෙන් මතුවී බැගෑපත්ව සිටින තෝ කවරෙක්ද? පව්කම් ඇති තෝ කවරෙක්දැයි කියා මම නිසැකව කෙසේ අදහා ගනිම්දැයි කියා ඇසුසේක. එය අසා ප්‍රෙතයා ගාථාවකින් තමා පිළිබඳව මෙසේ කීයේය:–

173. *අහං භදන්තෙ පෙතොම්හි-දුග්ගතො යම්ලොකිකො,
පාපකම්මං කරිත්වාන-පෙතලොක මිතො ගතොති.

Non-commercial distribution

ස්වාමීනි මම පව්කම් කොට මේ මිනිස් ලොවින් මැරී ගොස් යමලොකයයි කියන ලද ප්‍රේතලෝකයෙහි ඉපදී දුකට පැමිණි ප්‍රේතයෙක් වෙමියි කීයේය. එකල්හි ඔහුගෙන් තෙරුන් වහන්සේ ඔහු විසින් පෙර කරන ලද කර්මය මේ ගයින් විචාළ සේක.

174. *කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-ඉදං දුක්ඛං නිගච්ඡසි-කිං.

තා විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශලයක් පෙර කරන ලද්දේද? කවර අකුශල කර්මයක්හුගේ විපාක හෙතුවකින් තෝ මෙබදු ප්‍රේතදුකකට පැමිණියේදැයි කියා අසා වදළසේක. එවිට ඒ ප්‍රේතතෙම තමා විසින් කරනලද කර්ම ගාථා දෙකකින් කීයේය:-

175. අහු ආවාසිකෝ මය්හං-ඉස්සුකී කුලමච්ඡරී,
අජ්ඣාසිතෝ මය්හං සරෙ-කදරියෝ පරිභාසකෝ.

176. තස්සාහං වචනං සුත්වා-භික්ඛවෝ පරිභාසිසං,
තස්ස කම්මස්ස විපාකෙන-පෙතලෝක මිකොගතොති.

175. ඉස්සුකී, ඊර්ෂ්‍යාසිත්ඇති; කුලමච්ඡරී, කුලයා කෙරෙහි මසුරුවූ; කදරියෝ, තද මසුරුසිත් ඇති; පරිභාසකෝ, (සිල්වතුන්ට) පරිභවකරන්නාවූ; මය්හං සරෙ, මාගේ ගෙදර; අජ්ඣාසිතෝ, තෘෂ්ණාවෙන් බැඳුනාවූ; මය්හං, මාගේ; ආවාසිකෝ අහු, ආවාසයෙහි නිත්‍යවාසි භික්ෂුවෙක් විය.

176. අහං, මම; තස්ස, ඒ මහණාගේ; වචනා සුත්වා, කීම අසා; භික්ඛවෝ, (ප්‍රියශීලී) භික්ෂූන්ට; පරිභාසිසං, නින්ද කෙළෙමී; (සෙස්ස යටකියනලදී.)

ස්වාමිනි ඊර්ෂ්‍යා සිත්ඇති කුලයා කෙරෙහි මසුරුසිත් ඇති තද මසුරු සිතින් යුක්තවූ ප්‍රියශීලී භික්ෂූන්ට පරිභව කරන්නාවූ කුලූපග භාවයෙන් මාගේ ගෙයි තෘෂ්ණාභිනිවෙස වශයෙන් බැඳුණාවූ මවිසින් කරනලද ආවාසයෙහි නිබඳ වසනා භික්ෂු-වෙක් වූයේය. ඒ භික්ෂුහුගේ කීම අසා මමත් ප්‍රියශීලී භික්ෂූන් වහන්සේලාට ආක්‍රොශ පරිභව කෙළෙමි, ඒ අකුශල කර්මයාගේ විපාක හෙතුවෙන් මිනිස්ලොවින් චුතව ප්‍රේතලොකයට

Non-commercial distribution

පැමිණියේ වෙමියි කීයේය. එය අසා තෙරුන්වහන්සේ අනිකාගේ උත්පත්තිය විචාරණසේක් සේක් මේ ගාථාව වදළසේක:-

177. **අමිත්තො මිත්තවණ්ණෙන- යො තෙ ආසි කුලූපකො,**
කායස්ස භෙදා දුප්පඤ්ඤො-කින්නුපෙච්චගතිංගතො-සි.

177. **තෙ**, තට; **මිත්තවණ්ණෙන**, මිත්‍රස්වරූපයෙන්; **කුලූපකො**, කුලූපගවූ; **අමිත්තො**, (ක්‍රියාවෙන්) අමිත්‍රවූ; **යොආසි**, යම් මහණෙක් වීද; **දුප්පඤ්ඤෙ**, ඒ දුෂ්ප්‍රාඥයා; **කායස්සභෙදා**, මරණින්මතු; **පෙච්ච**, පරලොව; **කින්නුගතිං**, කෙබඳු ගතියකට; **ගතො ඉති**, **පැමිණියේද.**

ප්‍රෙතය තොපට මිත්‍ර ස්වරූපයෙන් කුලූපගවූ ක්‍රියාවෙන් අමිත්‍රවූ යම් මහණෙක්වූයේද ඒ මෝඩ මහණා මැරී පරලොව කිනම් ගතියකට පැමිණියේදැයි කියා ඇසූසේක, නැවත ප්‍රෙතයා, තෙරණුවන්ට එපවත් කියන්නේ මේ ගාථාවය කියේය:—

178. **තස්සෙවාහං පාපකම්මස්ස-සීසෙ තිට්ඨාමි මත්ථකෙ,**
සො ච පරවිසයං පත්තො-මමෙව පරිචාරකො.

179. **යං භදන්තෙ භදන්තඤ්ඤෙ එතං මෙ හොති භොජනං,**
අහං ච ඛො යං භදාමි-එතං සො උපජීවති-සි.

178. **පාපකම්මස්ස**, පව්ටු සමාචාර ඇති; **තස්සෙව**, ඒ ශ්‍රමණප්‍රෙතයාගේ; **සීසෙ මත්ථකෙ**, හිසමුදුනේම; **අහං**, මම; **තිට්ඨාමි**, දැන් සිටිමි; **සොච**, හෙතෙමේද; **පරවිසයං**, ප්‍රෙත ලොකයට; **පත්තො**, පැමිණියේ; **මමෙව**, මාගේම; **පරිචාරකො**, මෙහෙකරුවෙක් විය.

179. **භදන්තෙ**, ස්වාමිනි, **අඤ්ඤෙ**, සෙස්සෝ; **යං**, යම් අශුචියක්; **භදන්ති**, **හෙළත්ද**; **එතං**, ඒ අශුචි; **මෙ**, මාගේ; **භොජනං හොති**, ආහාරය වේ; **අහංචඛො**, මමද වනාහි; **යං**, යම් වර්වසක්; **භදාමි**, පහරමිද; **එතං**, එය; (කෑමෙන්) **සො**, ඒ ශ්‍රමණ ප්‍රෙතයා; **උපජීවති ඉති**, **දිවිපවත්වයි.**

ස්වාමිනි පව්ටු සමාචාර ඇති පෙර මට කුළුපඟ මහණෙක්වූ ඒ ප්‍රෙතයාගේ හිසමත්තේම දැන් මම සිටිමි, හිස්මුදුන කෙලින් අවකාශයෙහි නොවේ, ඔහුද ප්‍රෙත අපායේ ඉපදීම වශයෙන් පැමිණියේ මාගේම මෙහෙකරුවෙක් වූයේය. ස්වාමිනි ඒ වැසි

Non-commercial distribution

කිළියෙහි අන්‍යයෝ යම් අශුචියක් හෙළත්ද ඒ අශුචි දවසක් දවසක් පාසා මට ආහාර වෙයි, මම ඒ අශුචි අනුභව කොට වර්ෂ කෙරෙමිද ඒ මාගේ අශුචි ඒ කුලුපග ප්‍රේතයා දවසක් පාසා කැමි වශයෙන් ජීවත්වෙයයි කීයේය.

ඔවුන් දෙදෙනා අතුරෙන් කෙළෙඹි තෙමේ ''මෙසේ ආහාර අනුභවයට වඩා අශුචි අනුභව කිරීම තොපට උතුමැ''යි කියා ප්‍රියශීලි භික්ෂූන්ට බැණ වැදුනේය. කුලුපග මහණා වනාහි කෙළෙඹියාද එසේ කීමෙහි සමාදන් කරවා තෙමේද එසේම ආක්‍රොශ කළේය. ඒ හෙතුවෙන් ඒ කුලුපග ප්‍රේතයාගේ ජීවිකාව ඒ කෙළෙඹි ප්‍රේතයාගේ ජීවිකාවටත් වඩා ඉතාමත් කිලිටු වූයේය. ආයුෂ්මත් මහමුගලන් තෙරුන් වහන්සේ එපවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොට නින්ද අපහාස කිරීමේ වැරැද්ද පෙන්වා පැමිණි පිරිසට ධර්මදෙශනා කළසේක. ඒ දෙශනා තොමෝ මහ ජනයාහට සාර්ත්ථක වූයේය.

මෙසේ මේ ප්‍රේතවස්තු දෙශනායෙහි මහාවගීයෙහි අටවෙනි ගූථඛාදක ප්‍රේතවස්තු වණ්ණනාව කියා නිමවන ලදී.

4. 9 කථාව.

තවද මේ ප්‍රේතවස්තු දෙශනායෙහි මහාවගීයේ නවවෙනි ගූථඛාදක ප්‍රේතවස්තුව කවරේදයත්:—

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන කල්හි එක්තරා ගූථඛාදක ප්‍රේතියකු අරභයා මේ කථාවස්තුව දෙශනා කළසේක. ඒ ප්‍රේතියගේ කථාව මීට අනතුරුව කී (ගූථඛාදකප්‍රේත) වස්තුව හා සමානවේ. ඒ වස්තුවෙහි උපාසකයා විසින් විහාරය කරවන ලද්දේයයි කියා උපාසකයාගේ වශයෙන් ආයේය. මේ කථාවේ වනාහි උපාසිකාව විසින් විහාරය කරවන ලදැයි යන මෙපමණක්ම වෙනස වේ. ඒ වස්තු දෙක අතුරෙන් මේ කථාවෙහි හා ගාථාවලත් අනතුරුව කී කථාවේ නුවුවක් නැත්තේය.

ගූථඛාදක ප්‍රේතවස්තු වණ්ණනාව කියා නිමවන ලදී.

Non-commercial distribution

4. 10 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහවගීයේ දසවෙනි **ගණ ප්‍රෙතවස්තුව කෙසේදයත්;—**

සර්ව්‍වජගදනන්දකර ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන කල්හි බොහෝ ප්‍රෙතයන් අරභයා මේ වස්තුව දෙශනා කළසේක. සැවැත්නුවර බොහෝ ඔනුෂ්‍යයෝ වනාහි කණ්ඩායමක් වී තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධානැතිව අප්‍ර-සන්නව මසුරුමලයෙන් මැඩුණු සිත් ඇතිව දනාදි සුචරිත ක්‍රියාවන්ට විරුඬව බොහෝකල් ජීවත්ව සිට මරණින්මතු සැවැත්නුවර සමීපයෙහි ප්‍රෙතයොනියෙහි උපන්නාහුය. එකල්හි එක් දවසක් ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස වඩිනාසේක් අතරමගදී ප්‍රෙතයන් දැක මේ ගාථාවෙන් අසා වදළසේක:—

180. **නග්ගා දුබ්බණ්ණරූපාත්ථ-කිසා ධමනි සන්ථතා,**
උප්ඵාසුලිකා කිසිකා-කෙනු තුම්හෙත්ථ මාරිසා-ති.

180. මාරිසා, නිදුකානෙනි; තුම්හෙ, තොපි; කිසා, කෘශවූ; ධමනි සන්ථතා, ඉල්පිගිය නහරවැල් ඇති; උප්ඵාසුලිකා, උස්ව නැඟුණ ඉලඇට ඇති; කිසිකා, ඉතා කෘශවූ; නග්ගා, නග්නවූ; දුබ්බණ්ණරූපා අත්ථ, දුර්ණී ශරීර ඇත්තෝවව්ය; කෙනුඅත්ථ ඉති, (තොපි) කවරහු වව්ද.

නිදුකානෙනි තොපි විලිවැස්මක් නැතිව දුර්ණී ශරීර ඇත්තාහුය, කෘශවූ ඉල්පිගිය නහරවැල් ඇති උස්ව නැඟුණු ඉල ඇට ඇති සම් නහර පමණක් හෙයින් ඉතාම කෘශයහ. තොපි කවරහුදැයි කියා ඇසූසේක. එය අසා ප්‍රෙතයෝ කියන්නාහු—

181. †**මයං භදන්තෙ පෙතම්හා-දුග්ගතා යමලොකිකා,**
පාපකම්මං කරිත්වාන-පෙතලොකමිතො ගතා-ති.

ස්වාමීනි අපි දුකට පත් ප්‍රෙතයෝ වෙමු. මිනිස් ලොවදී අකුශලකම් කොට අපි මිනිස්ලොවින් මැරී ප්‍රෙතලොකයට පැමිණියෝ වෙමුයයි කියා ගාථාවෙන් තමන්ගේ ප්‍රෙතභාවය ප්‍රකාශ කළහ. නැවත තෙරණුවන් විසින්:—

Non-commercial distribution

182. †කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-පෙතලොකමිතො ගතා-ති.

ප්‍රෙතයිනි තොප විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශලයක් කරනලද්දේද කවර අකුශල කර්මයක්හුගේ විපාක හෙතුවකින් මිනිස්ලොවින් චුතව ප්‍රෙතලොකයට පැමිණියෝ දැයි කියා ගාථාවෙන් ඔවුන් පෙර කරනලද කර්ම විචාරණ ලද්දේය, එකල ප්‍රෙතයෝ තමන් පෙරකළ අකුශලකර්ම මේ ගාථාවලින් කීහු:—

183. *අනාවටෙසු තිත්ථෙසු විවිණිම්හඩමාසකං,
සන්තෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකම්හ අත්තනො.

184. *නදිං උපෙම තසිතා-රිත්තකා පරිවත්තති,
ඡායං උපෙම උණ්හෙසු-ආතපො පරිවත්තති.

185. *අග්ගිවණ්ණො ච නො වාතො-දහන්තො උපවායති,
එතඤ්ච හන්තෙ අරහාම-අඤ්ඤඤ්ච පාපකං තතො.

186. අධියොජනානි ගච්ඡාම-ජාතා ආහාරගෙධිනො,
අලඛාව නිවත්තාම-අහො නො අප්පපුඤ්ඤතා.

187. ජාතා පමුච්ඡිතා හත්තා-භූමියං පටිසුම්භිතා,
උත්තානා පතිකිරාම-අවකුජ්ජා පතාමසෙ.

188. තෙ ච තත්ථෙව පතිතා-භූමියං පටිසුම්භිතා,
උරං සීසඤ්ච සටථෙම-අහො නො අප්පපුඤ්ඤතා.

189. එතං ච හන්තෙ අරහාම-අඤ්ඤංච පාපකං තතො,
සන්තෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකම්හ අත්තනො.

190. තෙ හි නූන ඉතො ගන්ත්වා-යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නා-කාහාම කුසලං බහු-න්ති.

186. ජාතා, විරකල් සාදුකින් පිඩිතවූ; ආහාරගෙධිනො, ආහාරයෙහි ගිජුවූ (අපි); අධියොජනානි, නොයෙක් යොදුන් ගණන්; ගච්ඡාම, යමු; අලඛාව, කිසිවක් නොලබාම; නිවත්තාම, නවතිමු; නො, අපගේ; අප්පපුඤ්ඤතා, පින්නැතිබව; අහො, අදෝමයි.

Non-commercial distribution

187. ඡාතා, බඩගිනිවූ; පමුච්ඡිතා, (සාපිපාසා දුකින්) ක්ලාන්තවූ (අපි); හන්තා, බමන්නාහු; භූමියං, බිම; පටිසුම්භිතා, (දූවුම්‌ැටි පිඩක්මෙන්) ඇදවැටෙන්නෝ වෙමු; උත්තානා, උඩුකුරුව වැටුණාහු; පතිකිරාම, විසුරුණු අවයව ඇත්තෝ වෙමු; අවකුජ්ජා, යටිකුරුව; පතාමසෙ, වැටෙමු.

188. තත්ථ එව, ඒ ගියතැනම; පතිතාව, වැටුණාවූද; භූමියං, බිම; පටිසුම්භිතා, (සිටීමට අසමර්ත්ථභාවෙන්) වැටුණාවූද; තෙ, ඒ (අපි); උරං, ලයද; සීසංව, හිසද; සට්ටෙම, ගටාගනිමු; නො, අපගේ; අහො අප්පුඤ්ඤතා, අනේ පින්නැති බවයි.

189. භන්තෙ, ස්වාමීනි; එතංව, මේ දුකටද; තතො, ඊට වඩා; පාපකං, ලාමකවූ; අඤ්ඤංව, අනිකුදු දුකටත්; අරහාම, (අපි) සුදුස්සෝ වෙමු; දෙය්‍යධම්මෙසු, දෙවධර්මය; සන්තසු, විද්‍යමාන කල්හි; අත්තනො, තමහට; දීපං, පිහිටක්; න අකම්හ, නොකෙළෙමු.

190. හි, ඒ එසේමැයි; තෙ, ඒ අපි; ඉතො, මෙයින්; ගන්ත්වා, චුතව ගොස්; මානුසිං යොනිං, මිනිසත්බව; ලඩාන, ලැබ; වදඤ්ඤු, පරිත්‍යාගශීලිව (නොහොත්) යාචකයන්ගේ වදන් දන්නාසුලුව; සීලසම්පන්නා, සිල්වත්ව; බහුං කුසලං, බොහෝ කුසල්; නූන, ඒකාන්තයෙන්; කාහාම ඉති, කරන්නෙමු.

කිසිවකු විසින් නොනවත්වනලද කදීතඩාගාදී මිනිසුන් ජලස්නානාදිය කරන තොටුපොලවල, මිනිසුන් තබා අමතකව ගිය යම්කිසිවක් ලබන්නමු නම් මැනවැයි සිතා ලොභයෙන් මැඩුණු සිත් ඇතිව අඩමසක් පමණකල් ආහාරසොයා ඇවිද්දෙමු, නොහොත් එළඹී කිසිවෙකු විසින් නොවලක්වනලද සත්වයන්ගේ ප්‍රයොගාශය ශුද්ධියට හෙතුභාවයෙන් තීර්ත්ථ නමිවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විද්‍යමාන කල්හි මසුරුමලයෙන් මැඩුණු සිත් ඇතිව අඩමස්සක් පමණකුදු කිසිවෙකුට නොදෙමින් විශෙෂයෙන් වස්තුව රැස් කෙළෙමු. දියයුතු දනවස්තුව ඇති කල්හි තමාට පරලොවදී පිහිටවන පිනක් අපි නොකෙළෙමු. පැන් පවසින් පෙළෙන ලදුව ගහක් ළහට පැමිණියෙමු නම් කවුඩන් විසින් ඉවුරේ සිට පියයුතු තරමට පිරී ගලාබසින ගඟ අපගේ පාපකම් හෙතුවෙන් දියහිස්වී වැලිපමණක්ම වෙයි. උෂ්ණකාලයෙහි සෙවණ ඇති තැනකට පැමිණියෙමු නම්

Non-commercial distribution

එතනට අව්ව වැටෙයි. සිහිල් වාතය ඇඟ වැදීමෙන් ගිනි හා සමානව අපගේ ශරීර දවමින් හමයි, ස්වාමීනි යට කියනලද ඒ පිපාසාදී දුක් හා ඊටත් වඩා ලාමකවූ දරුණුවූ වෙනත් දුක් විඳීමට අපි සුදුස්සෝ වෙමු. නින්දිත පවිකම් කළහෙයිනි. බොහෝකල් බඩගින්නෙන් පීඩිපතව ආහාරයෙහි ගිජුව නොයෙක් යොදුන් ගණන් දුර ගොසිනුත් කිසි ආහාරයක් නොලබාම නවතිමු; අනේ අපගේ පින්නැති කමක හැටි! සාදුක් ඇති අපි ක්ෂුධා පිපාසාදී දුකින් හටගත් ක්ලාන්ත ඇතිව කරකැවී ප්‍රපාතයක වැටුනාක්මෙන් බිම ඇද වැටෙන්නෝ වෙමු, සමහරවිට උඩුකුරුව වැටී කැඩීගිය අත්පා ආදී අවයව ඇත්තවූන්සේ සිටිමු. සමහර කලෙක මුණින් වැටෙමු. එම පොළවේ මුණින් වැටුණ ඒ අපි නැඟී සිටිය නොහැකිව වෙවුලමින් මහත් දුකට පැමිණ තමන් පපුව හා හිසත් ගටා ගනිමු, අපගේ පින් නැතිකම අදෝමයි, ස්වාමීනි මෙකී දුක්රැස විඳීමට හා ඊටවඩා දරුණුවූ ලාමකවූ තවත් දුක් විඳීමටත් අපි සුදුස්සෝ වෙමු. මක්නිසාද යත්— දුනවස්තුව කිබියදී තමාට පරලොවදී පිහිටවන පිනක් අපි නොකළෙමු එහෙයිනි. ස්වාමීනි ඒ අපි මේ ප්‍රෙතඅපායෙන් මිදීගොස් මනුෂ්‍යාත්මය ලබා දන්දෙන සුලුව නොහොත් යාචකයන්ගේ වචන දන්නා සුලුව ශීලයෙන් යුක්තව බොහෝ කුසල් කරන්නෙමුයයි කීවෝය.

තෙරුන් වහන්සේ එපවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළෝය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ කරුණ අර්ත්ථොත්පත්ති කොට ගෙන සම්ප්‍රාප්ත පිරිසට දහම් දෙසූ සේක. ඒ ධර්මය අසා මහජනතෙමේ මසුරුමල පහකොට දානාදී කුශලක්‍රියා කරමින් සුවරිතයෙහි යෙදුණේ විය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි දසවෙනි ගණප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

4. 11 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි එකොළොස්වෙනි පාටලි පුත්‍ර ප්‍රෙතවස්තුව කවරේදයත්:-

ශාක්‍යාකුලතිලකායමාන ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කර වදරන කල්හි එක්තරා

Non-commercial distribution

විමාන ප්‍රේතයෙකු අරභයා මේ වස්තුව දෙශනා කළ සේක. සැවැත් නුවර වාසී වූ ද පැළලුප් නුවර වාසී වූ ද බොහෝ වෙළෙන්දෝ නැවකින් සුවණ්‍ණ භූමියට ගියාහුය. ඒ වෙළඳුන් අතුරෙන් එක් උපාසකයෙක් රෝගාතුර වූයේ මාගම කෙරෙහි පිළිබඳ සිත් ඇතිව කළුරිය කෙළේය. ඒ උපාසක තෙම කළ කුසල් ඇත්තේ වූවත් ස්ත්‍රිය කෙරෙහි පිළිබඳ සිත් ඇති වූ බැවින් දෙව්ලොව නොඉපද මුහුදු මැද විමාන ප්‍රේතයෙක්ව උපන. හෙතෙම යම් ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති වූයේ ද ඒ ස්ත්‍රියත් ස්වණ්‍ණ භූමියට යන ඒ නැවට නැඟී යයි. එකල්හි ඒ ප්‍රේතතෙම ඒ ස්ත්‍රිය ගනු කැමතිව නැවේ ගමන වැළැක් විය. එකල්හි වෙළෙන්දෝ "කවර කාරණයකින් මේ නැව නොයන්නේද" යි කියා විමසමින් කාලකණ්ණි සලකා පරීක්ෂා කළාහුය. ඒ විමාන ප්‍රේතයා යම් තැනැත්තියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති වූයේ ද ඒ ස්ත්‍රියටම තුන්වර දක්වා අමනුෂ්‍යයාගේ සෘඩ්‍යානු භාවයෙන් කාලකණ්ණිපත්‍රය පැමිණියේය. එය දැක වෙළෙන්දෝ හුණු මිටියක් මුහුදට දමා ඊමත්තට ඒ ස්ත්‍රිය බැස්සුවාහුය. ස්ත්‍රිය හුණු දඬු මිටිය උඩට බැස්ස කෙණෙහිම නැව ස්වණ්‍ණ භූමිය දෙස බලා වේගයෙන් ගියේය. විමාන ප්‍රේත තෙම ඒ ස්ත්‍රිය තමාගේ විමානයට නංවාගෙන ඇ හා සමඟ අභිරමණය කෙළේය. ඇ එක් අවුරුද්දක් ඉක්මවා කලකිරුණු සිත් ඇතිව ඒ විමාන ප්‍රේතයාට යාච්ඤ කරමින් මෙසේ කීය. "නිදුකාණෙනි මෙහි වසමින් මාගේ පරලොව වැඩ සිදු කර ගන්ට අවකාශ නොලබමි, එහෙයින් මා පැළලුප් නුවරටම පමුණුවයි කියා මම යාච්ඤ කරමි" යි කීයේය. ඇ විසින් යාච්ඤ කරන ලද ඒ විමාන ප්‍රේත තෙම මේ ගාථාව කීයේය:-

191. දිට්ඨා තයා නිරයා තිරච්ඡානයොනි
පෙතා අසුරා අථවාපි මනුස්සා දෙවා,
සයමද්දස කම්මවිපාකමත්තනෝ
නෙස්සාමි තං පාටලිපුත්තමක්ඛතං
තත්ථ ගන්ත්වා කුසලං කරොහි කම්ම-න්ති.

191. තයා, කී විසින්; නිරයා, නිරයෝද; තිරච්ඡාන-යොනි, මහානුභාව තිරශ්චිතයෝද; පෙතා, ප්‍රේතයෝද; අසුරා, අසුරයෝද; අථවාපි, යළිදු; මනුස්සා, මනුෂ්‍යයෝද; දෙවා, දෙවියෝද; දිට්ඨා, දක්නා ලද්දහුය; අත්තනෝ, තමාගේ; කම්ම

Non-commercial distribution

විපාකං, කම්ම විපාකය; සයං, තෙමේම; අද්දස, දුටුවේය; තං, තී; **අක්ඛතං, (කිසිවෙකු විසින්) නොදක්නා ලදුව; පාටලිපුත්තං, පැළලුප් නුවරට; නෙස්සාමි, පමුණු වන්නෙමි; තත්ථ ගන්ත්වා, එහි ගොස්; කුසලං කම්මං, කුසල කර්මය; කරොහි ඉති, කරව.**

පින්වතිය තී විසින් සමහර ප්‍රත්‍යෙක නිරයෝද මහානුභාව සම්පන්න නාගසුපණ්ණාදි තිරශ්චීන සත්වයෝද ක්ෂුත් පිපාසාදි ප්‍රභෙද ඇති ප්‍රෙතයෝද කාලකඤ්ජකාදි ප්‍රභෙද ඇති අසුරයෝද මනුෂ්‍යයෝද සමහර චාතුම්හාරාජික දෙවියෝද දක්නා ලද්දෝය, ඒ ප්‍රෙත තෙම වනාහි තමාගේ ආනුභාවයෙන් අතර තුර ඒ ස්ත්‍රිය හැරගෙන ගොස් ප්‍රත්‍යෙක (ඔසුපත්) නිරයාදිය පෙන් වමින් ඇවිදියි. එසේ හෙයින් මෙසේ කීය. නිරයාදි තැන්වලට විශෙෂයෙන් ගොස් බලමින් තමන් විසින් කරන ලද කුසලා කුසල කර්මයන්ගේ විපාකය තීම ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවෙහිය. දැන් කිසිවෙකුට නොපෙනියදී මනුෂ්‍ය රූපයෙන් යුක්තවම තී පැළලුප් නුවරට පමුණු වන්නෙමි. තී වනාහි එහි ගොස් කර්ම විපාකය ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටු හෙයින් යුක්තියෙහි පිහිටා කුසලකර්ම කරවයි කියා කීයේය. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ ඒ විමාන ප්‍රෙතයාගේ අවවාද වචනය අසා සතුටු සිත් ඇතිව මේ ගාථා දෙක කීය:–

192. *අත්ථකාමොසි මෙ යක්ඛ–හිතකාමොසි දෙවතෙ,
කරොමි තුය්හං වචනං–ත්වංසි ආචරියො මම.

193. දිට්ඨා මයා නිරයා තිරච්ඡානයොනි
පෙතා අසුරා අථවාපි මනුස්සා දෙවා,
සයමද්දසං කම්මවිපාකමත්තනො
කාහාමි පුඤ්ඤානි අනප්පකානී–ති.

193. අනප්පකානි, බොහෝ වූ; පුඤ්ඤානි, පින්; කාහාමි ඉති කරන්නෙමි (සෙස්ස යට කියන ලදී.)

පින්වත් යක්ෂය නුඹ මට වැඩ කැමැත්තෙක් වෙයි, පින්වත් දෙවිය නුඹ මට හිත කැමැත්තෙක් වෙයි, එහෙයින් මම නුඹගේ අවවාද වචන කරන්නෙමි, නුඹ මාගේ ආචාර්‍ය්‍ය කෙනෙක්ද වූයේය. මා විසින් නිරයෝ දක්නා ලදහ, යට කී පරිදි ප්‍රෙතයෝද අසුරයෝද මනුෂ්‍යයෝද දෙවියෝද දක්නා

Non-commercial distribution

ලදහ, තම තමන් කළ කර්මානුරූප විපාකය ප්‍රත්‍යක්ෂ වශයෙන් මම දුටුවෙමි, එහෙයින් මම බොහෝ කුසල කර්ම කරන්නෙමි'' යි කීය.

එකල්හි ඒ විමාන ප්‍රෙත තෙම ඒ ස්ත්‍රිය හැරගෙන අහසින් ගොස් පැළලුප් නුවර මැද නවත්වා ගියේය. එකල්හි ඇගේ ඥති මිත්‍රාදීහු ඇ දැක ''පින්වත යම් කැනැත්තියක් මුහුදේ දමන ලදුව මළා යයි කියා පෙර අපි ඇසුවෙමුද, ඒ මේ කැනැත්තිය සුවසේ ආවා අප විසින් නිශ්චය වශයෙන් දක්නා ලද්දීය'' යි කියා සතුටු සිත් ඇතිව රාජ්‍යී ඇගේ ප්‍රවෘත්තිය විවාළාහුය. ඇ මුල පටන් තමා විසින් දක්නා ලද්දාවූ ද වින්දවූ ද දේ පිළිබඳ සියලු පුවත ඔවුන්ට කීය. සැවැත් නුවර වාසි වූ ඒ වෙළෙන්:- දෝද පිළිවෙලින් සැවැත් නුවරට පැමිණි කල්හි ශාස්තෘන් වහන්සේ ළඟට පැමිණ වැඳ එකත්පස්ව සිටියෝ එපවත් භාග්‍යවත්හට සැල කළාහුය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්ති කොට ගෙන සිවු පිරිසට ධර්ම දෙශනා කළ සේක. එය අසා මහාජනයා උපන් සංවෙග ඇතිව දානාදී කුශල ධර්මයෙහි ඇලුණේය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි එකොළොස්වන පාටලී පුත්‍ර ප්‍රෙත වස්තු වර්ණනාව කියා නිමවන ලදී.

4. 12 කථාව

තවද මේ ප්‍රෙත වස්තු දෙශනායෙහි මහා වර්ගයෙහි දෙළොස් වන ආමු ප්‍රෙතවස්තුව කෙසේදයත්:-

සර්ව්වලොකෙකෙක ප්‍රදීපායමාන ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වදරන කල්හි ආමු ප්‍රෙතයෙකු අරභයා මේ වස්තුව දෙශනා කළ සේක. සැවැත් නුවර ක්ෂය වූ භොග සම්පත් ඇති එක්තරා ගෘහපතියෙක් වූයේය. ඔහුගේ භාර්ය්‍යාව කළුරිය කළේය. ඔහුට එකම දියණියක් වෙයි. ඒ ගෘහපතියා තමාගේ මිත්‍රයෙකුගේ ගෙදර දියණිය නවත්වා නය වශයෙන් ගත් කහවනු සියයක් දී බඩු රැගෙන වෙළඳ සමූහයා සමග වෙළඳමට ගියේ නොබෝ කලකින් මුදල සමග ලාබ ලැබුණු කහවනු පන්සියයක්ද ලබාගෙන වෙළඳ සමූහයා සමග සිය ගමට

Non-commercial distribution

පෙරළා ආයේය. අතරමගදී සොරු අවුත් වෙළඳ සමූහයා ළඟට පැමිණියෝය. සාත්තුවාහකයෝ ඔබමොබ පලා ගියාහුය. ඒ ගෘහපතියා වනාහි එක්තරා ගසක කහවනු සඟවා තබා ඊට සමීප තැනක සැඟවී සිටියේය. සොරු ඔහු අල්වා ගෙන මැරුවාහුය. එතෙම ධන ලොභය හේතුකොට ගෙන එතනම ප්‍රේතයෙක්ව උපන්නේය. වෙළෙන්දෝ සැවැත් නුවරට ගොස් ඔහුගේ දුවට ඒ ප්‍රවෘත්තිය කීවාහුය. ඈ පියාගේ මරණයෙන් හා මතු ජීවත්වීමේ බියෙනුත් බලවත් ලෙස හටගත් දෙමනස් ඇතිව දඩිකොට හැඩිය. එකල්හි පියාගේ යහළුවෙක් වූ ඒ කෙළෙඹි තෙම ඇට කියන්නේ ''යම්සේ කුඹල්කරු විසින් තනන භාජන සියල්ලම බිඳීම අවසන් කොට ඇත්තේද එපරිද්දෙන්ම සත්වයන්ගේ ජීවිතය බිඳීම අවසන් කොට ඇත්තේය. මරණය නම් සර්වසාධාරණය ඊට පිළියම් නොකට හැකිමය, එහෙයින් තී පියා කෙරෙහි ඉතා දඩිසේ සොක නොකරව, විලාප නොකියව, මම තීගේ පියාවෙමි, තී මගේ දියණිය වෙයි, මම තිට පියා විසින් කටයුතුදේ කරන්නෙමි. තී පියාගේ ගෙදර දී මෙන් මේ ගෙදර අමුතු කොට නොසිතා සිත් අලවා වසව'' යි කියා අවවාද කොට ඇස්වැසිය. ඕතොමෝ ඔහුගේ කීමෙන් පසු සන්සිඳුණු සොක ඇතිව පියා කෙරෙහි මෙන් ඔහු කෙරෙහි උපන් ගරු බුහුමන් ඇතිව තමා දුගී බැවින් ඒ කෙළෙඹියාහට වතාවත් කරන්නියක්ව පවතිමින් පියා උදෙසා මතක දන් දෙනු කැමතිව කැඳ පිස සිරියල් පැහැය ඇති මනාව ඉදුණු මීහිරි අඹගෙඩි කංසතලියක තබා ගෙන කැඳ හා අඹත් වැඩකාරියෙකු ලවා ගෙන්වා ගෙන විහාරයට ගොස් බුදුන් වැඳ මෙසේ කීය. ''භාග්‍යවතුන් වහන්ස මාගේ දක්ෂිණාව පිළිගැනීමෙන් මට අනුග්‍රහ කරන සේක්වා'' යි කීයේය. එකල්හි ශාස්තෘන් වහන්සේ මහා කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව ඇගේ මනඃදෙළ පුරවමින් වැඩ හිඳින ආකාරය දක්වා වදළ සේක. ඕතොමෝ තුටුපහටු සිත් ඇතිව පණවන ලද උතුම් බුදු අස්නෙහි තමා විසින් ගෙනෙන ලද ඉතා පිරිසිදු වස්ත්‍රය අතුට දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ පණවන ලද ආසනයෙහි වැඩහුන් සේක. එකල්හි ඕතොමෝ බුදුන්ට කැඳ පිළිගැන්වීය. භාග්‍යවතුන් වහන්සේ කැඳ පිළිගත් සේක. ඉක්බිති සඩිසයා උදෙසා භික්ෂූන්ටත් කැඳ පිළිගැන්වීය. කැඳ

Non-commercial distribution

පිළිගන්වා නැවත සෝදා ගත් අත් ඇතිව අඹගෙඩි බුදුන්ට පිළිගැන්වීය. බුදුරජාණන් වහන්සේ ඒ අඹ වැලඳූ සේක. ඕතොමෝ භාග්‍යවත්හට වැඳ මෙසේ කීය:- ''ස්වාමීනි පස-තුරුණ හා කැඳ හා අඹත් පිදීම වශයෙන් පැවැති මාගේ යම් දක්ෂිණාවක් වන්නීද ඒ දක්ෂිණාව මාගේ පියාණන්හට පැමිණේවා'' යි කීයේය. භාග්‍යවතුන් වහන්සේ එසේ වේවායි කියා අනුමෝදන් කළ සේක. ඕතොමෝ නැවත බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේය. ඒ දක්ෂිණාව දුන් කෙණෙහිම ඒ ප්‍රෙත තෙම අඹ උයන් විමන් කප්රුක් පොකුණු හා මහත් දිව්‍ය සම්පත්ද ලැබුවේය. ඉන්පසු ඒ වෙළෙන්දෝ මැතකලෙක වෙළඳාම පිණිස යමින් එම මගට පැමිණියෝ පෙර වාසය කළ තැන රැයක් වාසය කෙළෝය. ඒ වෙළෙන්දන් දැක ඒ විමාන ප්‍රෙත තෙම උයන් විමන් ආදිය සමග ඔවුන්ට තමා දැක්වීය. එවිට ඒ වෙළෙන්දෝ ඒ දැක ඔහු විසින් ලබන ලද සම්පත් විචාරමින් මේ ගාථා දෙක කීවාහුය:-

194. අයඤ්ච තෙ පොක්ඛරණී සුරම්මා
සමා සුපතිත්ථා මහොදකා ච,
සුපුප්ඵිතා හමරගණානුකිණ්ණා
කථං තයා ලඛා අයං මනුඤ්ඤා.

195. ඉදඤ්ච තෙ අම්බවනං සුරම්මං
සබ්බොතුකං ධාරයතෙ ඵලානි,
සුපුප්ඵිතං හමරගණානුකිණ්ණං
කථං තයා ලඛ්ධිදං විමාන-න්ති.

194. තෙ, තාගේ; අයංචපොක්ඛරණී, මේ පොකුණද; සුරම්මං, අතිරමණීයවෙයි; සමා, සමතලා වූ; සුපතිත්ථා, මනා තොටු ඇත්තී; මහොදකාච, මහත්දිය ඇත්තීද වෙයි; සුපුප්ඵිතා, මනාව පිපි මල් ඇත්තීද; හමරගණානු කිණ්ණා, බමර සමූහයා ගෙන් ගැවසුණිද වෙයි; තයා, තා විසින්; අයං මනුඤ්ඤා, මේ මනරම් පොකුණ; කථං, කෙසේ; ලඛා, ලබන ලද්දීද.

195. තෙ, තාගේ; ඉදංච අම්බවනං, මේ අඹ උයනද; සුරම්මං, ඉතා මනරම් වෙයි; සබ්බොතුකං, සියලු ඍතුන්හි සැප ඵලවයි; ඵලානි, පලයන්; ධාරයතෙ, දරයි; සුපුප්ඵිතං,

Non-commercial distribution

මනාව පිපිමල් ඇත්තේ; භමරගණානුකිණ්ණං, බමර සමූහයා ගෙන් ගැවසුණේ වෙයි; තයා, තා විසින්; ඉදං විමානං, මේ විමන; කථං ලඩ්ං ඉති, කෙසේ ලබන ලද්දේද.

පින්වත් දිව්‍ය පුත්‍රය සමතලා භූමි ප්‍රදෙශ ඇති රුවන්මුවා ණිනිපෙති ඇති බැවින් මනා තොටුපල ඇති බොහෝ ජලය ඇති මනාව පිපි මල් ඇති බමර සමූහයාගෙන් ගැවසුණා වූ තොපගේ මේ පොකුණ ඉතා රම්‍ය වෙයි, මනොඥ වූ මේ පොකුණ නුඹ විසින් කෙසේ ලබන ලද්දීද? තොපගේ මේ අඹ උයනද ඉතා රම්‍ය වෙයි, සියලු කල්හි මෙහි පිපි මල් හා පල දරයි, භෘඩග සමූහයාගෙන් ගැවසුණේය, මේ අඹ උයන හා විමානයත් නුඹ විසින් කෙසේ ලබන ලද්දේදැයි කියා ඇසූහ. එය අසා ප්‍රෙත තෙම පොකුණු ආදිය ලැබීමට හේතුව කියමින් මේ ගාථාව කීයේය:-

196. අම්බපක්කොදකං යාගු-සීතච්ඡායා මනොරමා,
ධීතාය දින්නදනෙන-තෙන මෙ ඉධ ලබ්භති-ති.

196. මෙ, මාගේ; ධීතාය, දුව විසින්; තෙන දින්නදනෙන, ඒ දෙන ලද දන හේතුවෙන්; අම්බසක්කොදකං, ඉදුණු අඹ හා පැන්ද; යාගු, කැඳද; මනොරමා, සිත්කලු වූ; සීතච්ඡායා, සිහිල් සෙවණද; ඉධ, මෙහිදී; ලබ්භති ඉති, (මට) ලැබෙයි.

මාගේ දියණිය විසින් බුදුන්ට හා භික්ෂූන්ටත් ඉදුණු අඹ හා පැන් හා කැඳත් මා උදෙසා දෙන ලදී. ඒ දෙන ලද දන හේතුවෙන් මේ දිව්‍යමය වූ අඹ උයනෙහි සියලු කල්හි ඉදුණු අඹද මනොඥ වූ මේ දිව්‍ය පොකුණෙන් දිවපැන්ද, කැඳ හා ඇතිරිල්ල දීම හේතුවෙන් උයන් වීමන් කප්රුක් ආදියෙහි මනරම සිහිල් සෙවණද මෙහිදී මට ලැබෙය යි කීයේය.

මෙසේද කියා ඒ ප්‍රෙත තෙම ඒ වෙළඳුන් කැඳවා ගෙන ගොස් ඒ සඟවා තිබුණු කඟවනු පන්සිය ඔවුන්ට පෙන්වා මෙයින් කොටසක් තොපි ගනුව. අනිත් කොටස එකල මා විසින් ගත් නය ගෙවා සුවසේ ජීවත් වේවා කියා මාගේ දුවට දෙනු මැනවයි කීයේය. වෙළෙන්දෝ පිළිවෙලින් සැවැත් නුවරට පැමිණ ඔහුගේ දියණියට එපවත් කියා ඒ ප්‍රෙතයා විසින් තමන්ට දුන් කොටසත් ඇටම දුන්නාහුය. ඕතොමෝ කඟවනු සියක් නය කාරයන්ට දී ඉතිරි කඟවණු තමාගේ යහළු වූ ඒ

Non-commercial distribution

කෙළෙඹියාහට දී තමා වතාවත් කරමින් වෙසෙයි. ඒ කෙළෙඹි තෙමේ ''මේ සියල්ල තිටම චේවා'' යි කියා ඇටම නැවත දී ඇ තමාගේ වැඩිමහල් පුතණුවන්ගේ ගෘහ ස්වාමි දුවක් කෙළේය. ඕතොමෝ කල්ගිය කල්හි එක් පුත්‍රයෙකු ලැබ ඒ පුතා නලවමින් මේ ගාථාව කියයි:-

197. **සන්දිට්ඨිකං කම්මං එවං පස්සථ**
දනස්ස දමස්ස සංයමස්ස විපාකං,
දසි අහං අය්‍යකුලෙසු හුත්වා
සුණිසා හොමි අගාරස්ස ච ඉස්සරා-ති.

197. දනස්ස, දනයාගේද; දමස්ස, දමයාගේද; සංයමස්ස, ශීලසංයමයාගේත්; සන්දිට්ඨිකං, සාන්දෘෂ්ටික වූ; කම්මං විපාකං, කර්මය හා විපාකය; එවං පස්සථ, මෙසේ බලව්; අහං, මම; අය්‍යකුලෙසු, ස්වාමීන්ගේ ගෙදර; දසිහුත්වා, දැසියක්වී; සුණිසා, (නැවත) යෙහෙළිණියක් වී; අගාරස්ස, ගෙදර; ඉස්සරාව හොමි ඉති, සැමිදුවක්ද වීමි.

දෙනලද දනයාගේ හා ඉන්ද්‍රිය දමනයාගේද ශීලසංයමයාගේ ඉහතාත්මභාවයෙහිම කර්මය හා විපාකය මෙසේ බලව, මම පෙර කල මේ ස්වාමිකුලයෙහි වැඩකාරියෙක්ව සිට දැන් ඕහටම යෙහෙළියක් වී ගෙදර සාමිදුවක් වෙමියි කීය. ඉක්බිති එක් දිනක් ශාස්තෘන් වහන්සේ ඇගේ නුවණ මුහුකිරීම බලාවදරා ආලෝකය පතුරුවා ඉදිරියෙහි වැඩසිටියා සේ තමන් වහන්සේ පෙනිසිට ඇට මේ ගය වදළසේක:—

198. **අසාතං සාතරූපෙන-පියරූපෙන අප්පියං,**
දුක්ඛං සුඛස්ස රූපෙන-පමත්තං අතිවත්තකී-ති.

198. සාතරූපෙන, සැප ස්වභාවයෙන්; අසාතං, නොසැපයද; පියරූපෙන, ප්‍රිය ස්වභාවයෙන්; අප්පියං, අප්‍රියයද; සුඛස්සරූපෙන, සුඛස්වභාවයෙන්; දුක්ඛං, දුකද, පමත්තං, ප්‍රමත්තපුද්ගලයා; අතිවත්තති ඉති, යටපත් කෙරෙයි.

සැප ස්වභාවයෙන් නොසැපයද ප්‍රිය ස්වභාවයෙන් අප්‍රියයද සුඛ ස්වභාවයෙන් දුකද ප්‍රමාදී පුද්ගලයා යටපත් කෙරේයයි කියා මේ ගාථාවෙන් ධර්මදේශනා කළ සේක. ගාථාවගේ

Non-commercial distribution

කෙළවර ඕ තොමෝ සෝවාන් පලයෙහි පිහිටියාය. ඕ තොමෝ පසුදින බුඩප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාහට දන් දී එපවත් භාග්‍යවත්හට සැලකළේය. බුදුරජාණන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්-පත්තිකොට ගෙන පැමිණි පිරිසට ධර්ම්දෙශනා කළසේක. ඒ දෙශනා තොමෝ මහජනයාහට සාර්ත්ථක වූයේය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි දෙළොස් වෙනි ආමු ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවනලදී.

4. 13 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි තෙළෙස් වණ අක්ඛදයක ප්‍රෙතවස්තුව කවරේද යත්— මේ අක්ඛදයක ප්‍රෙතවස්තු කථාවේ උත්පත්තිය මෙසේයි.

ශ්‍රී සඩම් චක්‍රවර්ත්ති ස්වාමීවූ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසය කර වදරන කල්හි සැවැත්නුවර වැසි එක්තරා උපාසකයෙක් තෙම ගැල්වල බඩු පුරවාගෙන වෙළඳම පිණිස පිටරට ගොස් එහිදී තමා ගෙනගිය බඩු විකුණා නැවත ගත් බඩු ගැල්වල පටවාගන සැවැත්නුවරට යාම උදෙසා මගට පැමිණියේ ය. ඔහු මග යන විට වනයෙහිදී එක් ගැළක අකුර බිඳුණේය. එකල්හි එක්තරා පුරුෂයෙක් තෙම ගස්කපා ගැනීම සඳහා කෙටෙරිය හා පොරවත් ගෙන්වාගෙන තමාගේ ගමින් නික්ම ගොස් වනයෙහි ඇවිදිමින් එතනට පැමිණ ගැලක අකුර බිඳීමෙන් දෙම්නසට පත්වූ උපාසකයා දැක ''මේ වෙළඳ තෙමේ ගැළේ අකුර බිඳියාමෙන් වනය මැද ක්ලාන්ත වේය''යි සිතා අනුකම්පා උපදවා රුක්දණ්ඩක් කපා දැඩිසේ ගැල් අකුරක් කොට ගැළේ යොදු දුන්නේය. හෙතෙම මෑතකලෙක කළුරිය කොට ඒ කැලෑ පෙදෙස්හිම භූම්‍යස්ථ දෙවියෙක්ව උපන්නේ තමාගේ කර්ම්ය ප්‍රත්‍යවෙක්ෂා කොට රාත්‍රියෙහි ඒ උපාසකයාගේ ගෙදරට ගොස් ගෘහද්වාරය ළඟ සිට මේ ගාථාව කීය:—

199. **යං දදති න තං හොති-දෙථෙව දානංදක්වා උභයංතරති උභයං තෙන දානෙන-චිඝති ගජාගරථ මා පමජ්ජථා-ති.**

199 යං, යම් දානවස්තුවක්; දදති. (දයකතෙම්) දේද; තං, එයම්; නහොති, (විපාකභාවයෙන්) නොවෙයි; දානං දානය;

Non-commercial distribution

දෙථව, දෙන්නේමය; දත්වා, දී; උභයං, දෙලොවදුක; තරති. ඉක්මවයි; තෙන දනෙන, ඒ දනහෙතුවෙන්; උභයං, දෙලොව සැපතට (නොහොත්) (ස්වකීය පරකීය) දෙවදෑරුම් හිතසැපයට; ගච්ඡති, පැමිණෙයි; ජාගරථ, පුබුදුවව්; මාපමජ්ජථ ඉති, පමා නොවව්.

උපාසකය යම් දයකයෙක් යම් දෙයක් දන් වශයෙන් දේද පරලොවදී ඒ දෙයම විපාක වශයෙන් දෙන්නේ නොවෙයි, එතකුදුවුවත් තවත් බොහෝ යහපත් ඉෂ්ටවිපාක දෙන්නේමය, එහෙයින් දන් දිය යුතුමය, ශ්‍රද්ධාවත් තැනැත්තේ දන්දී ඉහතාත්ම යෙහි වූද පරලෙව්හි වූද දුක් හා අවැඩක් දුරුකරයි, ඒ දනය හේතුකොට ගෙන මෙලොව හා පරලොවත් යන දෙක්හිම සැප යට පැමිණෙයි. නොහොත් තමාට හා අනුන්ටත් හිතසැප ගෙනදීම් වශයෙන් උභයාර්ත්ථය ම සිදුකරන්නේය, මෙසේ දෙලොව අවැඩ දුරලන්නාවූ දෙපක්ෂයට හිතසැප සිදුකරන්නාවූ දනය සම්පාදනය කිරීම පිණිස ප්‍රබොධවව්, දනොපකරණයන් පිළියෙළ කොට දීමෙහි පමා නොවව් යයි කීයේය.

වෙළඳතෙමේ තම කටයුතු නිමවා පෙරළා අවුත් පිළිවෙළින් සැවැත්නුවරට පැමිණ දෙවෙනි දිනයෙහි බුදුන්වෙත එළඹ වැඳ එකත්පසෙක සිටියේ ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත්හට සැලකෙළේය. ශාස්තෘන්වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්තිකොටගෙන පැමිණි පිරිසට ධර්මදෙශනා කළසේක. ඒ ධර්ම දෙශනාව මහාජනයාහට සාර්ත්ථක වූයේය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි තෙළෙස්වන අක්ඛදයක ප්‍රෙතවස්තු වණ්නාව කියා නිමවනලදී.

---

4. 14 කාථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි කුදුස්වන භොගසංහරණ ප්‍රෙතවස්තුව කෙසේදයත්:--

සනරාමර ලොක ශිවඩිකර භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවදරන කල්හි රජගහනුවර වැසි ස්ත්‍රීහු සතර දෙනෙක් වනාහි හොර මැණිම් ආදි වශයෙන්

Non-commercial distribution

ගිතෙල් මීතෙල් ධාන්‍යාදිය වෙළඳම් කොට නුනුවණින් වස්තු රැස්කොට ජීවත් වෙමින් සිට මැරිගොස් නුවරින් පිට දිය අගලක් මතුපිට ප්‍රෙතියෝව උපන්නාහුය. ඒ ප්‍රෙතියෝ රාත්‍රියෙහි දුකින් මඩනා ලදුව:-

''මයං හොගෙ සංහරිම්හා-සමෙන විසමෙන ච
තෙ අඤ්ඤෙ පරිභුඤ්ජන්ති-මයං දුක්ඛස්ස භාගිනී''ති.

යන ගාථාව කියා විලාප කියමින් භයානකවූ මහඟින් මුර ගැසුවාහුය. මනුෂ්‍යයෝ ඒ හඬ අසා බියෙන් තැතිගැනී උදය කාලයෙහි බුදුපාමොක් බික්සඟනට මහදන් සරසා බුදුන්ට හා භික්ෂු සඞ්ඝයාටත් ආරාධනා කොට ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යයෙන් වළඳවා වළඳ අවසන්වූ භාග්‍යවතුන් වහන්සේ ළඟ හිඳගන එපවත් කීවාහුය. එවිට භාග්‍යවතුන් වහන්සේ වදරන සේක් ''උපාසකයෙනි තොපට ඒ ශබ්දයෙන් කිසි අනතුරක් නැත්තේය. ප්‍රෙතියෝ සිව්දෙනෙක් දුකින් මඩනා ලදුව තම තමන් විසින් කරනලද අකුශල කර්මයන් කියා හැඩීම වශයෙන් මහඟින් විලාප කියමින් මේ ගාථාව කීවෝය''යි කියා වදළසේක:—

200. මයං හොගෙ සංහරිම්හා-සමෙන විසමෙන ච,
තෙ අඤ්ඤෙ පරිභුඤ්ජන්ති-මයං දුක්ඛස්ස භාගිනී-ති.

200. මයං, අපි; සමෙන, න්‍යායයෙන්ද; විසමෙනව, අන්‍යාය (අයුක්ති) යෙන්ද; හොගෙ, වස්තුසම්පත්; සංහරිම්හා, රැස්කෙළෙමු; තෙ, ඒ වස්තුව; අඤ්ඤෙ, සෙස්සෝ; පරිභුඤ්ජන්ති, පරිභොග කරත්; මයං, අපි; දුක්ඛස්ස, (මහත්) දුකට; භාගිනී ඉති, හිමිවූවෝ වෙමු.

''අපි යුක්තියෙන් හා අයුක්තියෙනුත් පරිභොග කටයුතු අර්ත්ථයෙන් භොගයයි ලද නම් ඇති වස්ත්‍රාභරණාදිවූ වස්තූපකරණ විශෙෂයන් මසුරුමලෙන් බැඳුණ සිත් ඇතිව කිසිවෙකුට කිසිවක් නොදී එකතු කෙළෙමු. ඒ වස්තු දැන් වෙන අය ප්‍රයොජන ගනිත්, අපි වූකලි කිසි සුචරිතයක් නොකළ බැවින් හා දුශ්චරිත කළ බැවිනුත් දැන් ප්‍රෙතයොනියට ඇතුළත් මහත් දුකට හිමියෝ වෙමු. මහත් දුක් විඳිමුය''යි කීහු.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ ප්‍රෙතියන් විසින් කියන ලද ගාථාව වදරා ඔවුන්ගේ ප්‍රවෘත්තියද වදරා එය අර්ත්ථොත්-

Non-commercial distribution

පත්ති කොටගෙන පැමිණි පිරිසට ධර්ම දෙශනා කොට මතු චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍ය දෙශනාවසානයෙහි බෙහෝදෙන සෝවාන්ඵලාදියට පැමිණියාහ.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි තුදුස්වන භොගසංහරණ ප්‍රෙතවස්තු වර්ණනාව කියා නිමවනලදී.

4. 15 කථාව.

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි පස-ළොස්වන **සෙටිධීපුත්ත ප්‍රෙතවස්තුව** කවරේදයත්— මේ සෙටිධී පුත්ත ප්‍රෙතවස්තු කථාවගේ උත්පත්තියයි.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජෙතවනා රාමයේ වැඩ වැසය කර වදරනසේක, එසමයෙහි වනාහි පසේනදි කොසොල් රජතෙම රාජාභරණයෙන් සැරසි උතුම් ඇතා පිට නැඟී මහත් රාජාර්ධියෙන් මහත් රාජානුභාවයෙන් යෙදී නුවර ඇවිදින්නේ එක්තරා ගෙයක මතුපහයෙහි ජනෙල් කවුළු දෙර හැරගෙන ඒ රාජසම්පත් බලමින් සිටියාවූ රූපසම්-පත්තියෙන් දෙවහනක් හා සමානවූ එක් ස්ත්‍රියක් දැක පෙර නොදිටු අරමුණෙහි වහාම උපන්නාවූ ක්ලේශ සමුදාචාරයෙන් වැලඳගත් සිත්ඇතිව කුල රූප ලක්ෂණ ආචාරාදි ගුණ විශෙෂ-යෙන් යුත් අන්තඃපුර ජනයා ඇති කල්හිදු ස්වභාවයෙන් වහා පෙරළෙන්නාවූ දමනය නොකට හැකිවූ චිත්තයාගේ වශයෙන් ඒ ස්ත්‍රිය කෙරෙහි පිළිබඳ සිත් ඇතිව රජුට පසු ආසනයෙහි සිටිය පුරුෂයාට කියන්නේ ''මේ ප්‍රාසාදය හා මේ ස්ත්‍රියත් සිත තබා ගනුව''යි කියා සංඥා කොට රජවාසලට ඇතුල්වූයේය. අනික් සියල්ල අම්බසක්ඛර ප්‍රෙතවස්තුවෙහි ආ පිළිවෙළින් දත යුතුයි. මේ කියනු ලබන්නේ (ඊට වඩා ඇති) වෙනසයි. මෙහිදී පුරුෂතෙමේ භිරු නොබැස්ස කල්හිම අවුත් නුවර දෙර වැසූ කල්හි තමා විසින් ගෙනෙනලද අරුණුවන් මැටි හා උපුල්ද නුවර දෙර කවුළුවෙහි එල්වා නිදා ගැනීමට ජේතවනයට ගියේය. රජ වනාහි සිරියහනෙහි නිදන්නේ මධ්‍යම යාමයෙහි 'ස' යනුද 'න' යනුද 'දු' යනුද 'සො' යනුද මේ අකුරු සතර යටිගුරෙන් කියන ලදුව මහමරහඬ වශයෙන් ඇසුයේය. ඒ අකුරු සතර

Non-commercial distribution

වනාහි අතීත කාලයෙහි සැවැත්නුවර වැසි සම්පත් මදයෙන් මත්වූ සිටුපුත් සිව්දෙනෙකුන් විසින් යෞවන කාලයෙහි පරදර අකුශලකර්ම වශයෙන් බොහෝ පව් රැස් කරගන මෑතකලෙක කළුරිය කොට ඒ සැවැත්නුවරටම සමීපවූ ලොහොකුඹු නිරයෙහි මුවවිටට පැමිණ එක එක ගාථාවක් කියනු කැමැත්තෙන් කියනලද ඒ ඒ ගාථාවන්ගේ මුල අකුරු වෙත්. ඒ සතරදෙන මුල් අකුර පමණක්ම කියා දුක්වේදනාවට පැමිණ ලොහොකුඹු තුළෙහිම ගිලුණාහුය. රජතෙම ඒ ශබ්දය අසා බියෙන් තැති ගැනී කලකිරුණු සිත් ඇතිව ලොමුදැහැගැනීම් ඇතිව ඒ ඉතිරි රැය දුකින් ඉක්මවා උදය කාලයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා කැඳවා ඒ ප්‍රවෘත්තිය කීයේය. එකල පුරෝහිත බ්‍රාහ්මණයා බියෙන් තැතිගත් රජු දැන ලාභයෙහි ගිජුව ''මට හා බමුණන්ටත් මේ ලාභ උපදින උපායක් ඇතිවූයේමය''යි සිතා කියන්නේ ''මහරජ එකාන්තයෙන් මේ මහත් උපද්‍රවයක් ඇතිවන එකකි. එහෙයින් සර්ව චතුෂ්ක යාගයක් කරනු මැනව''යි කීයේය. රජතෙම ඔහුගේ කීම අසා ''සර්වචතුෂ්ක යාගයට උපකරණ සම්පාදනය කරවිය''යි කියා ඇමතියන්ට නියම කෙළේය. එය අසා මල්ලිකාදේවී තොමෝ රජහට මෙසේ කීයේය. ''මහරජ බමුණාගේ කීම අසා කුමක් හෙයින් නොයෙක් ප්‍රාණීන්ට වධ හිංසා කරන කටයුත්තක් කරනු කැමති වූයේද, සියලු තැන්හි නොපැකිලෙන ඥානගතියක් ඇති භාග්‍යවතුන් වහන්සේගෙන් මේ කාරණය විචාරිය යුතු නොවේද? භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් ප්‍රකාශ කරනසේක් නම් එලෙස පිළිපැදිය යුතුය''යි කීයේය. රජතෙම ඇගේ කීම අසා බුදුන් ළඟට ගොස් ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත්හට සැලකෙළේය. භාග්‍යවතුන් වහන්සේ ''මහරජ තොපට ඒ ශබ්ද ශ්‍රවණය හෙතු කොටගෙන කිසියම් අනතුරක් නොවන්නේය''යි කියා ලොහොකුඹු නිරයෙහි උපන් ඒ සත්වයන්ගේ මූලපටන් ප්‍රවෘත්තිය වදරා ඔවුන් විසින් වෙන වෙනම කියන්ට පටන්ගත් ගාථා සතර සම්පූර්ණකොට දෙශනා කළසේක,

201. සට්ඨිවස්ස සහස්සානි-පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං-කදු අන්තො භවිස්සති.

202. නත්ථි අන්තො කුතො අන්තො-න අන්තො පතිදිස්සති,
තථාහි පකතං පාපං-මම තුය්හං ච මාරිස.

Non-commercial distribution

203. දුජ්ජීවිතං අජීවිම්හ-යෙ සන්තෙ න දදම්හසෙ,
සන්තෙසු දෙය්‍යධම්මෙසු-දීපං නාකම්හ අත්තනො.

204. සො හි නූන ඉතො ගන්ත්වා-යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො-කාහාමි කුසලං බහුං-ති.

201. නිරයෙ, ලොහොකුම්භු නිරයෙහි; **පච්චමානානං**, පැසෙන්නාවූ අපට; සට්ඨීවස්ස සහස්සානි, සැටදහසක් හවුරුදු; **සබ්බසො**, සර්ප්‍රකාරයෙන්; පරිපුණ්ණානි, පිරුණාහුය; කද, කවර කලෙක; අන්තො භවිස්සති, කෙළවර වන්නේද.

202 මාරිස, නිදුකානෙනි; මම, මාගේද තුය්හංව, තාගේද; අන්තො නත්ථි, (දුක්විඳීමේ) කෙළවරක් නැත්තේය; අන්තො, අවසානයක්; කුතො, කොයින්ද; අන්තො, අන්තය; නපති දිස්සති, දක්නා නොලැබේ; තථාහි, එපරිද්දෙන්ම; පාපං, පව්කම්; පකතං, (මා හා තා විසිනුත්) කරනලදී.

203. යෙ, යම්බඳු (අපි); සන්තෙ, (දනවස්තු) ඇතිකල්හි; නදදම්හසෙ, (කිසිවක්) නුදුනිමු; දුජ්ජීවිතං, ගර්හිත ජීවිතයක් ඇතිව; අජීවිම්හ, ජීවත්වීමු; දෙය්‍යධම්මෙසු, දනවස්තුව; සන්තෙසු, විද්‍යමාන කල්හි; අත්තනො, තමාට; දීපං, පිහිටක්; න අකම්හ, (අපි) නොකළෙමු.

204. හි, ඒ එසේමැයි; සො, ඒ මම; (සෙස්ස යටකී පරිදියි,) ලොහොකුම්භු නිරයෙහි ඉපිදදුක්විඳින්නාවූ අපට **සර්ප්‍ර**කාරයෙන් සැටදහසක් හවුරුදු සම්පූර්ණවූවාහුය. මේ නිරයෙහි දුක් විඳිමින් පැසෙන අපගේ මේ දුක් කවද කෙළවර වන්නේද? (ඒ ලොහොකුම්භු නිරයෙහි උපන් සත්වතෙමේ යටබසිමින් හවුරුදු **තිස්දහසකින්** යට පතුලට පැමිණෙයි, ඒ පතුලේ සිට උඩට නහිමිනුත් හවුරුදු තිස්දහසකින් මුවවිටට පැමිණෙයි. ඒ සංඥාවෙන් ඒ නිරිසත් තෙමේ ''**සට්ඨීවස්ස** සහස්සානි'' යනාදි ගාථාව කියනු කැමැතිව ''**ස**''යන්න **පමණක්** කියා බලවත් දුක් වෙදනාවට පැමිණියෙක්ව මුව යටිකුරුව වැටුණේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි **ඒ** ගාථාව සම්පූර්ණ කොට රජහට දෙශනා කළසේක. ඉතිරි ගාථාවලත් මේ **පිළිවෙළ** දතයුතුයි.

Non-commercial distribution

නිදුකානෙනි මාගේ හා තොපගේත් මේ නිරයෙහි දුක් විඳීමේ කෙළවරක් නැත්තේය. මේ දුකේ අවසානයක් කොයින්ද දුඃඛයාගේ කෙළවරක් නොපෙනෙයි, ඒ දුක් අවසන් නොවන අන්දමින් මා හා තොප විසිනුත් එකල්හි පව්කම් කරන ලදී. යම් බඳු වූ අපි දනවස්තු තිබියදී කිසිවක් කිසිවෙකුට නොදිනිමුද එහෙයින් නුවණැත්තන් විසින් නින්ද කටයුතුයේ ජීවත්වීමු. දන වස්තු විද්‍යමාන කල්හි තමන්ට පිහිටවන පිනක් නොකෙළෙමු. ඒ මම වනාහි මේ ලොහොකුඹු නිරයෙන් මිදී ගොස් මිනිසත් බවක් ලැබ පරිත්‍යාගශීලීව නොහොත් යාචකයන්ගේ බස් දන්නාසුලුව ශීලාචාර සම්පන්නව බොහෝ පින්කම් කරන්නෙමියි කිය.

ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මේ ගාථා සතර වදරා විස්තර වශයෙන් ධම්දෙශනා කළ සේක. දෙශනාවසානයෙහිදී මැටි හා රතුපුල් ගෙනා පුරුෂ තෙම සෝවාන් පෙලෙහි පිහිටියේය. කොසොල් රජතෙමේ උපන් සංවේග ඇතිව අනුන් අයත් බිරින්ද කෙරෙහි ඇති වූ විෂම ආශාව හැර දමා ස්වකීය ස්ත්‍රියගෙන් සතුටු වූයේය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි පසළොස්වන සෙට්ඨිපුත්ත ප්‍රෙතවස්තු වණ්ණනාව කියා නිමවන ලදී.

4. 16 කථාව

තවද මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි සොළොස්වෙනි සට්ඨිකූටසහස්ස ප්‍රෙතවස්තුව කවරේදයත්:-

ත්‍රිභුවනෙක ප්‍රදීපායමාන ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසය කර වදරන කල්හි එක්තරා ප්‍රෙතයෙකු අරභයා මේ කථාව වදළ සේක. යටගිය දවස බරණැස් නුවර වනාහි එක්තරා පිළෙක් විදීම් ශිල්පයෙහි දක්ෂ වූයේ එසේම ගල්කැට විදීම් ශිල්පයෙහි කෙළ පැමිණියේ නුවර දෙරටුවෙහි නුගරුක මුල හිඳගෙන ගල්කැට විදීමෙන් ඇත් අස් රිය මිනිස් කුළුගෙවල් දද පුන්කළස් ආදී රූපයන් නුග කොළවල පෙන්වයි. නුවර දරුවෝ තමන්ට ක්‍රීඩා පිණිස මස්සක් අඩමස්සක් ආදි ගණනක් දී රුචි පරිදි ඒ හස්ත්‍යාදිරූප

Non-commercial distribution

නුගකොළවල විදීම් ශිල්පයන් කරවත්. ඉක්බිති එක් දවසක් බරණැස් රජ තෙමේ නුවරින් පිටත්ව ඒ නුග ගස ළඟට පැමිණියේ නුගපත්වල හස්තිරූපාදී වශයෙන් වෙන් කරන ලද නානා විධ රූපයන් බොහෝ සෙයින් දැක මිනිසුන්ගෙන් මෙසේ විචාළේය. ''මේ නුගකොළවල මෙසේ නොයෙක් වැදෑරුම් රූප සටහන් කවරෙකු විසින් කරන ලද්දහු දැ'' යි ඇසිය. එවිට මනුෂ්‍යයෝ ''දෙවයන් වහන්ස මොහු විසින් කරන ලදැ'' යි කියා ඒ පිළා පෙන්නුවෝය. රජ තෙම ඒපිළා කැඳවා මෙසේ කීයේය: ''සගය මා විසින් පෙන්වන ලද කථා කරමින් සිටින එක් පුරුෂයෙකුගේ කුස ඔහු නොදන්නාසේම එළු බෙටිවලින් පුරවන්ට හැකිදැ'' යි කියා ඇසූ කල්හි ''දේවයෙනි හැකිය'' යි කීයේය. රජ තෙමේ ඒ පිළා තමාගේ රාජ මන්දිරයට පමුණුවා බොහෝ කොට කථා කරන පුරොහිතයා කෙරෙහි කලකිරුණසිත් ඇතිව පුරොහිතයා කැඳවා ඔහු හා සමග තිරයෙන් වට කරන ලද ජනයාගෙන් හිස් අවකාශ ස්ථානයක හිඳ කථා කරමින් පිළා කැඳවීය. පිළා නැළියක් පමණ එළු බෙටි හැර ගෙන ගොස් රජුගේ අයුරු දැන පුරොහිතයාගේ ඉදිරියෙහි හිඳ ගෙන ඔහු කට ඇරිය කල්හි තිර පවුරු සිදුරෙන් එක එක එළු බෙටිටක් බැගින් විද ඔහුගේ උගුර මුල කැබිය. ඒ පුරොහිත තෙමේ ලජ්ජාවෙන් එළු බෙටි වමාරා දමන්ට නොහැකිව සියල්ලම ගිල්ලේය. එකල්හි රජතෙම කියන්නේ ''බ්‍රාහ්මණය තොප විසින් බොහෝ කොට කථා කිරීමේ විපාකය දැන් ලබන ලදී, එහෙයින් දැන් තෝ යව, ගොස් කුකුරුමාන් ගෙඩි හා පුවහු කොළ ආදියෙන් සකස් කළ පානය බී එළු බේටි වමාරා දමව, එසේ කළ කල්හි තට සුව වන්නේය'' යි කියා එළුලඩවලින් බඩ පිරුණු ඒ පුරොහිතයා පිටත් කර හැරියේය. පිළාගේ ඒ ක්‍රියාවෙන් සතුටු වූ රජ තෙමේ ගම් තුදුසක් ඔහුට දුන්නේය. හෙතෙම ගම් ලැබ තමන් සැපවත් වෙමින් පිනමින් පිරිවර ජනයාත් සැපවත් කරවමින් පිනවමින් මහණ බමුණන්ට සුදුසු පරිද්දෙන් කිසිවක් දෙමින් ඉහතාත්මයෙහි වූ ද පරලෙව්හි වූ ද වැඩ නොපිරි හෙලමින් සුවසේ ජීවත් වෙයි. තමා ළඟට පැමිණ ශිල්ප ඉගෙන ගන්නවුන්ට බත් වැටුප් දෙයි. එකල්හි එක් පුරුෂයෙක් ඔහු ළඟට ගොස් මෙසේ කීයේය. ''ආචාරීන් වහන්ස මම යාච්ඤා කරමි, මටත් මේ ශිල්පය උගන්වනු

Non-commercial distribution

මැනව, මට බත් වැටුප්වලින් වුවමනා නැතැ'' යි කීයේය. හෙතෙම ඒ පුරුෂයාට ඒ ශිල්පය ඉගැන්වීය. ශිල්ප ඉගෙන ගත් ඒ පුරුෂ තෙම ශිල්පය විමසනු කැමැතිව ගොස් ගං තෙර වැඩ හුන් සුනෙත්ත නම් පසේ බුදුන්ගේ හිස ගල් කැටයක් (අතකුරු) ගැසීමෙන් පොඩි කෙළේය. පසේබුදුහු ඒ ගං තෙරදීම පිරිනිවන් පෑසේක. මනුෂ්‍යයෝ එපවත් අසා එතනදීම කැට මුගුරු ආදියෙන් ගසා ඒ පුරුෂයා මැරුවාහුය. ඔහු මැරී ගොස් අවීචි මහා නිරයෙහි ඉපිද බොහෝ අවුරුදු දහස් ගණන් නිරයෙහි පැසී එම අකුශල කර්මයාගේ විපාකාවශෙෂ වශයෙන් මේ බුඩොත්-පාදයෙහි රජගහ නුවරට නුදුරු තන්හි ප්‍රෙතයෙක්ව උපන්නේය. ඔහුගේ අකුශල කර්මය සිහි කරවන විපාකයක් ඇතිවිය යුතු බැවින් අකුශල කර්ම වේගයෙන් ඔසවන ලදුව පෙරවරු කාලයෙහි හා මධ්‍යාහ්න කාලයෙහිද සවස් කාලයෙහිත් යකඩ කුළු සැට දහසක් හිස් මුදුනේ වැටෙති. එවිට හෙතෙම සුන්බුන් හිස ඇතිව ඉතා බලවත් දුක් වේදනාවට පැමිණ බිම වැටෙයි. යකුළු වැටීම නැවතුණු කෙණෙහිම ප්‍රකෘති හිස ඇතිව හෙවත් තුබූ පරිදි හිසින් යුක්තව සිටියි. එකල්හි එක් දවසක් ආයුෂ්මත් මහා මොද්ගල්‍යාන ස්ථවිරයන් වහන්සේ ගිජුකුළු පව්වෙන් බසිමින් ඒ ප්‍රෙතයා දැක මේ ගාථාවෙන් අසා වදළ සේක.

205. කින්නු උම්මත්තරූපොව මිගො හන්තොව ධාවසි,
නිස්සංසයං පාපකම්මං-කින්නු සද්දයසෙ තුව-න්ති.

205. තුවං, තෝ; උම්මත්තරූපො ඉව, උමතු ස්වභාව ඇත්තෙකුමෙන්ද; හන්තො, බියපත් වූ; මිගො ඉව, මුවෙකු මෙන්ද; කින්නුධාවසි, කුමක් හෙයින් (ඔබිමොබ) දුවයි ද; නිස්සංසයං, නිසැකව; පාපකම්මං, පව්කම් ඇත්තෙකි; කින්නු, කුමක් හෙයින්; යද්දයසෙ ඉති, ඉතාම නාද කරමින් හැසිරෙහිද.

තෝ කුමක් නිසා උමතුවට පැමිණියෙකුසේ බිය පත් වූ මුවෙකුසේ ඔබිමොබ දුවයිද, තෝ නිසැකව පව්කම් ඇත්තෙක. (ඒ ප්‍රෙතයා යකුළු හිස් මුදුනේ වැටෙන කල්හිදු ආරක්ෂාවක් නොදකිමින් මේ අන්දමින් යකුළු පහර නොවේදෝයි සිතා එහා මෙහා දුව යයි. අකුශල කර්ම වේගයෙන් ඔසවන ලද ඒ යකුළු වනාහි යම් ඒ කොතනක සිටියත් හිස් මුදුනේම වැටෙත්.) තෝ කුමක් නිසා බලවත්සේ කෑගසමින් ඇවිදිදැයි කියා ඇසූ සේක. එය අසා ප්‍රෙතයා ගාථා දෙකකින් පිළිවදන් දුන්නේය:-

Non-commercial distribution

206. * අහං භදන්තෙ පෙතොම්හි-දුග්ගතො යමලොකිකො,
පාපකම්මං කරිත්වාන-පෙතලොකං ඉතො ගතො.

207. සටයිකූටසහස්සානි-පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ මය්හං නිපතන්ති-තෙ හින්දන්ති ච මත්ථක-න්ති.

207. මය්හං, මාගේ; සීසෙ, හිසෙහි; පරිපුණ්ණානි, අනූන වූ; සටයිකූට සහස්සානි, යකුළු සැටදහසක්; සබ්බසො, සියලු දිශාවෙන්; නිපතන්ති, වැටෙත්; තෙ, ඒ යකුළු; මත්ථකං, (මාගේ) මස්තකය; හින්දන්තිව ඉති, බිඳිත්ය.

ස්වාමීනි මම ප්‍රෙතයෙක් වෙමී, මිනිස් ලොවදී පව්කම් කොට දැන් ප්‍රෙත අපායට පැමිණ දුක් විඳිමි. මාගේ හිස් මුදුනේ නොඅඩුව යකුළු හැට දහසක් හැම ලෙසින්ම වැටෙත්, ඒ යකුළු මාගේ හිස පොඩි කරත් යයි කීයේය. ඒ ප්‍රෙතයා හට වනාහි යකුළු සැට දහසක් වැටීමට පුළුවන් තරම් මහත් වූ පව්ත කූටයක් පමණ හිස ඇති විය. ඔහුගේ ඒ හිස අස්ලොම් අගක් බහා ලන පමණවත් තැනක් ඉතිරි නොකොට ඒ යකුළු වැටෙමින් හිස පොඩි වෙයි. එයින් ඔහු බැගෑහඩි කෙරෙයි, නැවත තෙරුන් වහන්සේ ඔහුගෙන් ඔහු විසින් කරන ලද කර්මය විචාරණ සේක් මේ ගාථා දෙක වදළහ:-

208. * කින්නු කායෙන වාචාය-මනසා දුක්කටං කතං,
කිස්ස කම්මවිපාකෙන-ඉදං දුක්ඛං නිගච්ඡසි.

209. * සටයිකූටසහස්සානි-පරිපුණ්ණානි සබ්බසො,
සීසෙ තුය්හං නිපතන්ති-තෙ හින්දන්ති ච මත්ථක-න්ති.

ප්‍රෙතය තා විසින් කයින් වචසින් මනසින් කිනම් අකුශල යක් පෙර කරන ලද්දේද? කවර අකුශල කර්මයක්හුගේ විපාකයක් හේතු කොට ගෙන මෙබඳු දුකකට පැමිණියෙහිද? සවිප්‍රකාර යෙන් නොඅඩු වූ යකුළු සැට දහසක් තොපගේ හිසේ වැටෙත්, ඒ යකුළු තාගේ හිස පොඩි කෙරෙත් ඒ කිමැයි ඇසූ සේක. එසේ ඇසූ උන්වහන්සේට ප්‍රෙත තෙමේ තමන් පෙර කළ කර්මය කියමින් මේ ගාථාත්‍රය කීයේය:-

Non-commercial distribution

210. අද්දසාසිං සම්බුඩං-සුනෙත්තං භාවිතින්ද්‍රියං,
නිසින්නං රුක්ඛමූලස්මිං-ඣායන්තං අකුතෝ භයා.

211. සාලිත්තකප්පහාරෙන-භින්දිස්සං තස්ස මත්ථකං,
තස්ස කම්ම විපාකෙන-ඉදං දුක්ඛං නිගච්ඡිසං.

212. * සටයීකූටසහස්සානි-පරිපුණ්ණානි සබ්බසෝ,
සිසෙ මය්හං නිපතන්ති-භින්දන්ති ච මත්ථක-න්ති.

210. භාවිතින්ද්‍රියං, වඩනා ලද ශ්‍රඩ්ධාදී ඉන්ද්‍රිය ඇති; රුක්ඛ මූලස්මිං, රුක්මුල; ඣායන්තං, භාවනා කරමින්; නිසින්නං, වැඩ හුන්නා වූ; අකුතෝ භයං, බිය නැත්තා වූ; සුනෙත්තං, සුනෙත්‍ර නම් වූ; සම්බුඩං, පසේබුදුන්; අද්දසාසිං, (මම) දුටුවෙමි.

211. තස්ස, උන්වහන්සේගේ; මත්ථකං, හිස; සාලිත්ත කප්පහාරෙන, ඉල්විදුම් පහරකින්; භින්දිස්සං, පොඩි කෙළෙමි; තස්සකම්ම විපාකෙන, ඒ අකුශල කර්මයාගේ විපාක හේතුවෙන්; ඉදං දුක්ඛං, මේ දුකට; නිගච්ඡිසං, පැමිණියෙමි.

ස්වාමීනි ආර්‍යමාර්ග භාවනාවෙන් වඩනා ලද ශ්‍රඩ්ධාදී ඉන්ද්‍රිය ඇති කිසි භයක් නැතිව රුක්මුල ධ්‍යාන කරමින් වැඩ සිටියා වූ සුනෙත්‍ර නම් පසේ බුදුකෙනෙකුන් වහන්සේ මම මිනිස් ලොවදී දුටුවෙමි. එකල මම සාලිත්තකයයි කියන ලද අතකුරු විදුමෙන් හෙවත් ගලක් ගැසීමෙන් ඒ පසේබුදුන්ගේ හිස පොඩි කෙළෙමි, ඒ අකුශලකර්මයාගේ විපාක හේතුවෙන් මෙබඳු දුකට පැමිණියෙමි. හැම ලෙසින්ම සම්පූර්ණ වූ යකුළු හැට දහසක් මගේ හිසේ වැටෙත්. ඒ යකුළු මගේ හිස පොඩි කරත් යයි කීයේය. එය අසා තෙරණුවෝ තමා පෙර කරන ලද අකුශල කර්මයට සුදුසුවම මේ කාලයෙහි ඒ පුරාණ කර්මයාගේ මේ විපාකය ලබායයි කියා එය දක්වමින් මේ අවසාන ගාථාව වදළ සේක:-

213. ධම්මෙන තෙ කාපුරිස
සටයීකූටසහස්සානි-පරිපුණ්ණානි සබ්බසෝ,
සිසෙ තුය්හං නිපතන්ති-තෙ භින්දන්ති චමත්ථක-න්ති.

213. කාපුරිස, නින්දිත පුරුෂය; තෙ, තට; ධම්මෙන, සුදුසු කරුණෙන්ම; (සෙස්ස යට කියන ලදී.)

Non-commercial distribution

නින්දිත පුරුෂය, තා විසින් ඒ පසේ බුදුන් කෙරෙහි අපරාධ කිරීමෙන් කරන ලද අකුශල කර්මයට සුදුසුවම මේ විපාකය තොපට ලැබිණ සර්ප්‍රකාරයෙන් පරිපූර්ණ වූ යකුළු හැට දහසක් තාගේ හිසේ වැටී තාගේ හිස පොඩි කෙරෙත්. එහෙයින් ඒ දුක් විපාක කිසි දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ එපමණක් නොව සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් හෝ වලක්වාලිය නොහැක්කේමයයි කියා වදළ සේක.

මෙසේද වදරා තෙරුන් වහන්සේ ඉන්පසු පිඬු පිණිස හැසිර කරන ලද බත්කිස ඇතිව සවස් කාලයෙහි බුදුන් වෙත එළඹ ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත්හට සැලකළෝය. භාග්‍යවතුන් වහන්සේ ඒ කාරණය අර්ත්ථොත්පත්ති කොට ගෙන සිව්පිරිසට ධර්මදෙශනා කරනසේක් පසේ බුදුවරයන්ගේ ගුණානුභාවය හා කර්මයන් වද තොවන බවත් ප්‍රකාශ කොට වදළ සේක. මහාජන තෙමේ උපන් කලකිරීම් ඇතිව ශ්‍රද්ධා උපදවාගන අකුසල් හැර දමා දානාදී කුශල ක්‍රියායෙහි ඇලුණේය.

මෙසේ මේ ප්‍රෙතවස්තු දෙශනායෙහි මහාවර්ගයෙහි සොළොස් වෙනි සට්ඨිකූටසහස්ස ප්‍රෙතවස්තු වර්ණනා ව කියා නිමවන ලදී.

කථා වස්තු සොළසකින් ප්‍රතිමණ්ඩිත වූ සකරවෙනි මහාවර්ග වස්තු වර්ණනාව කියා නිමවන ලදී.

ප්‍රෙතවස්තු වර්ණනාව සමාප්තයි.

★ ශිවමස්තු. ★

Non-commercial distribution

Non-commercial distribution